

2009 රාජ්‍ය සාහිත්‍ය සම්මානය සහ
ස්වර්ණ පුස්තක සම්මානය දිනූ විශිෂ්ටතම නවකතාව

පොදු පුරුෂයා

සුනේත්‍රා රාජකරුණානායක

2009 රාජ්‍ය සාහිත්‍ය සම්මානය සහ
ස්වර්ණ පුස්තක සම්මානය දිනූ විශිෂ්ටතම නවකතාව

පොදු පුරුෂයා

සුනේත්‍රා රාජකරුණානායක



කෙතරම් දෙදරුම් ඇති වුවත් මවක හා දූවක අතරැති බැඳීම සම්පූර්ණයෙන් බිඳී යා නො හැක. එය ප්‍රේමයේ අමරණීය සූත්‍රයකි.

ගැඹුරු, බර ඇලීම් බැඳීම් බොහෝ විට හෘද කම්පා උත්පාදනය කරයි. එවිට පොළොව දෙදරයි. අහස ගුගුරයි. භූමිකම්පා මැවෙයි. එයින් ශෝකය හා කෝපය උරුමයක් නොව ස්පර්ශ නො කළ යුතු කර්මයක් [illegible] ගැනීමේත් අසු[illegible] සැකයෙකි.

අප [illegible] දේශපාලන [illegible] ගැන ඇහැම [illegible]. දේශපාලන වශයෙන් ද සමාජීය ගතික තුළ ද වැඩී [illegible] අග්‍ර ඵලය වීම ය. සම්මතය ද සම්මානය ද [illegible] වී ඇත. මේ පසුබිමේදී වෛරාන්විත අභියෝගයත්, [illegible] බියසුළු අනුගත වීමත් යන අන්ත දෙක ම ප්‍රතික්ෂේප කරන සුනේත්‍රා පොදු පුරුෂයා තුළින් ද සොයනුයේ මෛත්‍රී සූත්‍රයකි.

කතුවරිය විවර කරන මෛත්‍රී කරුණා භාවිත පෞද්ගලික හෘද කම්පා සඳහා පමණක් නොව රටක ගැඹුරු වේදනා වන පිළිකා සඳහා ද සුව ඔසුවක් විය හැක.

http://www.sarasavi.lk
Rs 450.00
ISBN 978-955-573-700-5
9 789555 737005
Novel



සරසවි ප්‍රකාශකයෝ
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ, දුරකථන/ෆැක්ස්: 011 2769446 e-mail: publishing@sarasavi.lk

මොපසාන් කෙටිකතා - පරිවර්තන
සකායි - පරිවර්තන
හොරා සහ බිල්ලෝ - පරිවර්තන
අදිසි පවුර - නාට්‍ය
සඳුන්පිර ගිනිගනියි - ඩී. ආර්. විජේවර්ධන නිර්දේශ
පැන්ඩොරායියා
ඩැහිරි නැටියා
බෝනික්කෝ ගෙදර
ප්‍රේම පුරාණය
දිවි බිඳීම
Attaining Age - රාජ්‍ය සාහිත්‍ය සම්මාන
දිදී හිරුගනාව - රාජ්‍ය සාහිත්‍ය සම්මාන
The Golden Bridge
සද්ගුණාකාරය
පියසි මණ්ඩපය
සර්වකාලඥ ප්‍රේමය
නන්දිතය - ප්‍රශස්ත නවකතා - 2004
බිත් තරංග
හර්ද සූත්‍රය - සමන් අතාවුදහෙට්ටි සමඟ
Sambol + - ග්‍රේෂන් සම්මාන සහතිකය
The Chameleon - ඉයන් ගුණතිලක පරිවර්තන සම්මානය
කෙටි පණිවිඩය සහ දිග කතා - ගොඩගේ නිර්දේශ
මතක පොත 1
House of Pirith
මතක පොත 2
සුබෝධාලංකාරය - ස්වර්ණ පුස්තක නිර්දේශ
විචිත්‍ර වීර්ය
සුචිත්‍ර චාරිකා
පූර්ව ජන්ම අපූර්වය
බුද්ධදාසි - ස්වර්ණ පුස්තක නිර්දේශ, විදුදය සම්මාන නිර්දේශ, බෞද්ධ සාහිත්‍ය සම්මානය
කර්ම අත්පොත
කවිකඳුර - ස්වර්ණ පුස්තක සම්මාන 2011
හිමසිර භික්ෂුණිය
අසිරිමත් සියවිම

පොදු පුරුෂයා

සුනේත්‍රා රාජකරුණානායක

සරසවි ප්‍රකාශකයෝ
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

පොදු පුරුෂයා

නවවැනි මුද්‍රණය - 2013 මාර්තු

ISBN 978-955-573-700-5

පරිගණක අක්ෂර සංයෝජනය - සී/ස සරසවි ප්‍රකාශකයෝ

පිටකවරය - සමන් ඉන්දික ලොකුකළුගේ (සී/ස සරසවි ප්‍රකාශකයෝ)

මුද්‍රණය - සී/ස සරසවි ප්‍රකාශකයෝ
1/3, ස්ටැන්ලි තිලකරත්න මාවත
නුගේගොඩ



පොදු පුරුෂයා ලියන සමයේ දීර්ඝ කාලයක් මගේ චරිතවලටත් මටත් පැවති ප්‍රශ්නයකට උත්තර ලැබී තිබිණ. ප්‍රේම පුරාණයේ නිර්මලාගේ මිතුරිය රාධා ඇසූ ප්‍රභාකරන්ටත් ප්‍රේම කළ හැකිද? යන ප්‍රශ්නයට ප්‍රායෝගික උත්තරයක් මට නොතිබිණ. වචන වලින් උත්තර බැඳීම හා තර්ක කිරීම යහ භාවිතයක් නැති ඕනෑම කෙනෙකුට කළ හැක. එහෙත් දන්නා උත්තරය ක්‍රියාවට නැගීමට තරම් මහා මෛත්‍රියක් ඇති කර ගන්නා සූත්‍රයක් නොදත් නිසා ඒ ප්‍රශ්නයේදී රාධාගේ ප්‍රේමය බියෙන් තැති ගෙන පළා යන විට ඇය හැඬුවේ ද ප්‍රේමයෙනි.

පෙරවදන් ලියන්නට අකමැති මා මේ පරණ කතාවද ඇඳා ගත්තේ පොදු පුරුෂයාගේ සමය වන විට රාධාගේ ප්‍රශ්නයට උත්තර ලැබී ඇති හෙයිනි. රිදීතිරංගනාව අහසේ ලියන අලුත් ගාථාවද එයම විය යුතුය.

ප්‍රේමයේ සූත්‍රය දෙදෙනකු අතර ශරීර කුඩු දෙකක ස්පර්ශයට හා මිහිරි ආල නුරා කතාවලට ඇති ආකර්ෂණය ඉක්මවා යා යුතුය. පොදු පුරුෂයා නිර්මාණය කරන විට ද එය කෙතරම් දුෂ්කර ක්‍රියාවක්ද යන්න මට තදින් දැනුණි. එහෙත් රටේ පොදු ප්‍රශ්නයට උත්තර තිබෙන්නේ වෛරාන්විත භාවයේ ගෙහි එකට එක කිරීමේ ඇසට ඇසක්, දතට දතක් න්‍යායේ නොව මහා මෛත්‍රියක් තුළය. බුදුන් නාලාගිරි ඇතා දමනය කළේ ද ඒ මෛත්‍රී ආනුභාවයෙන් විනා අලි මන්තරයකින් නොවේ. අංගුලිමාලට ද බුද්ධ ශාසනයේ ඉඩක් තිබුණේ ඒ මෛත්‍රී පදනම මත ය. වම් කම්මුලට ගැසූ කෙනාට දකුණත් හරවන්නැයි ජේසුන් වදළේ ද අර මෛත්‍රී සූත්‍රයෙන්ම ය.

භූමිකම්පා වැනි හර්ද කම්පාවලින් සුවපත් වීමේ සුභාවිතය තිබෙනුයේ අප තුළම සිටින ප්‍රභාකරන්ලා ජය ගැනීමෙනි. භගවත් ගීතාවේ ඥාති සහෝදරයන් අතර ඇති වන කුරු ක්ෂේත්‍ර යුද්ධයේ සැබෑ අරුත තමන්ගේ සිත ජය ගැනීමය. අපේ යුද්ධය සම්පූර්ණයෙන් සමථයකට පත්වීමේ යතුර තිබෙන්නේද මහ මෛත්‍රී සූත්‍රයක පමණය.

මේ සටහන තබන්නේ 2008 වර්ෂයේ මැයි 16 වන දින නුගේගොඩ පාගොඩ පාරේ පළමුවන හරස් වීදියේ නිවසේ සිටය.

පදනම් කතාව

මනෝරම්‍යා කොළඹ ගෝත්‍රයේ ගැවසෙනවා. ඒත් ඒ ගෝත්‍රික සම්මතයන් එක්ක නොගැලපීම් රාශියක් තියෙනවා.

මේ ඇත්තිගේ දෝණියන්දෑ වර්ණාසිත් නිසි වයසෙදි අම්මා වගේම ප්‍රේමයෙන් ආතුර වුණා.

මනෝරම්‍යාගෙ අම්මා ජිනවතී ඉස්කෝලේ හාමිනේට නං දෝණිව ආන්බාන් කරන්න බැරි වෙච්චි එකේ මිනිබිරී ආණ්ඩුමට්ටු කරන්න උවමනාවක් දැනුණෙත් නැහැ. මනෝරම්‍යා වර්ණාසිගෙ ප්‍රේමයට විරුද්ධ වෙයි කියල උන්දෑ නිකමටවත් හිතුවෙ නැහැනෙ.

ආත්තම්මයි මිනිබිරියි එක පැත්තක් ගත්තා. ඒත් මනෝරම්‍යා දූවගෙ පෙම්වතාව මූණ ගැහෙන්නවත් කැමති වුණේ නැහැ. මනෝරම්‍යත් ලේසියෙන් පසුබහින කෙනෙක් නෙවෙයිනෙ. ගැනි අවසාන උපක්‍රමය හැටියට තමන් ගැනත් විවේචනාත්මක වෙන විදියට කතාවක් ලිව්වා. දූවගෙ ගෞරවයයි, ආදරයයි නැති වෙන්න ඉඩ තියෙන බව දන දනත් ගැනි නෙවන පාර්ශ්වීය ඇසකින් ඒක ලියනකොට පපුවේ තිබුණෙ අහස පොළොව දෙදරන්නත් ඒ එක්කම තමන් කැබලි වී පුපුරා යන්නත් ඉඩ තියෙන විදියෙ ශෝකයක්. ඒක භූමිකම්පාවක් වගෙයි.

අම්මා ලියූ කතාව වර්ණාසි අතින් තවදුරටත් ව්‍යාප්ත වුණා.

කිලිනොච්චියේ රාත්‍රිය

කොළඹ අහසයි කිලනොච්චියේ අහසයි අතර වෙනසක් හිතා ගන්න අසීරුයි. තාරුකා බබලමින් තිබුණේ යුද්ධයකට, සාමයකට, සටන් විරාමයකට ඉහළින් නෙමෙයි, මිනිසුන්ට ඉහළින්. ආපසු හැරිලා බලනකොට ඒ අහසත් තරු කැල්මත් එතරම් හොඳින් මතක තිබුණෙ කොහොමද කියලා පුදුමයි. ඒ තරම් දීර්ඝ රාත්‍රියක් මං අත්විඳලා තිබුණෙ නැහැ. ආනන්දයෙන් ආරම්භවෙලා ආනන්දයෙන්ම ඉවරවෙන රාත්‍රියක් මිසක් ප්‍රශ්න නිමිත්තකින් පිරෙන රාත්‍රියක් මගේ හීනයක් ඇතුළෙ තිබුණු හීනයකවත් තිබුණෙත් නැහැ. ඒ රාත්‍රිය ආරම්භයේ ඉඳලා මැදියම් රැය දක්වා විස්කි හරි ජින් හරි පානය කරමින් හිටිය බ්‍රිතාන්‍ය, ජර්මානු, ස්විස්, නෝර්වේජියානු හා වෙනත් යුරෝපීය මිනිසුන්ටත් ඒක එහෙම වෙන්න ඇති. ඒ හුග දෙනෙක් අප්‍රිකානු රටවලත්, ඇෆ්ගනිස්ථානයේත්, කොසොවෝවලත්, පලස්තීනයෙත්, ඉරාකයෙත් සේවය කළ බව අහලා තිබුණා. ඒ ඇත්තන්ට ඉහළ වැටුප් ලැබෙන වෘත්තීය අවස්ථා ලැබුණෙ යුද්ධය, සාම ප්‍රයත්න හා අර්බුද සමනය කිරීමේ ව්‍යාපෘති තුළයි. ඒ නිසා ඒ ඇත්තො සටන් විරාම පරිසරයක ඉන්නකොටත් අහස් මට්ටමෙන් එතරම් වෙනසක් නැති වුණත් භූ මට්ටමෙන් ලන්ඩනයට, පැරීසියට, නිව්යෝර්කයට, ජිනීවාවලට, බර්ලිනයට වඩා සැහෙන වෙනසක් තියෙනවා. මටත් යුද්ධ කාලයට විතරක් නෙවෙයි සටන් විරාම කාලවලටත් කොළඹ රාත්‍රියක් හා කිලිනොච්චි රාත්‍රියක විශාල වෙනසක් දැනෙනවා. එච්චර දුර එන්න ඕනෑ නෑ අනුරාධපුරය

...ඒක තදින් දැනෙන්න පටන් ගන්නවා. පහුවෙනකොට මහ දවාලෙත් ඒක තදින් දැනෙනවා. වව්නියාවෙ ඕමන්තෙ හමුදා මුරපොළ පහුවෙනකොට ඉතාම ප්‍රසන්න උදෑසනක වුණත් ඒක දැනෙනවා.

තාර පාරෙන් පොඩ්ඩක් එහාට මෙහාට වෙන්න, අතරමඟ දකින අඩිපාරක් දිගේ වනාන්තරයට ඇවිදගෙන යන්න සුදු මිනිස්සුන්ටයි, සිංහල මිනිස්සුන්ටයි විතරක් නෙවෙයි සාමාන්‍ය දෙමළ මිනිස්සුන්ටත් බැහැනෙ. කොළඹ ආ වෙලාවක නුවර ගිය වෙලාවක උනත් කිලිනොච්චියෙ මිනිස්සුන්ට නිකමට ව්‍යායාමෙටවත් ඇවිදින්න අමාරුයිනෙ. කිලිනොච්චියෙ මිනිස්සුන්ට එහෙම රාත්‍රියට හැන්දෑවට ඇවිදින්න පුලුවන් බව අමතක වෙලත් ඇති.

කිලිනොච්චියට ගියාම මං නවතින්නෙ ජාත්‍යන්තර සංවිධාන කීපයක මිනිස්සු නතරවෙලා ඉන්න ගෙදරක. අපිට රාත්‍රිය පුරා ආලෝකය විතරක් නෙවෙයි විදුලිපංකා පවා වැඩ කරන ජෙනරේටරයක් තියෙනවා. ඒ නිසාම පාරෙවත්, අවට ගෙවල්වලටවත් විදුලි ආලෝකය නැති බව කැපී පෙනෙනවා. සාමාන්‍ය මිනිස්සුන්ට රාත්‍රිය ඇරඹෙන්නේ කුප්පි ලාම්පුවක් තියා දේව රූපයක් ඉදිරියෙ පොල්තෙල් පහනක්වත් නැතුව වෙන්න ඇති. යාන්තම් අඳුර වැටෙනකොට මිනිස්සු බිත්ති පුපුරපු ගෙවල්වලට හරි ගාල්වෙලා අවසානයි. කොටි සංවිධානයෙන් පවත්තගෙන යන අවන්හල් දෙකයි, ලැඟුම් හලයි නම් ජෙනරේටර්වලින් ආලෝකමත් වෙනවා. අනිකුත් කඩ සාප්පුවල භූමිතෙල් ලාම්පුවක් තියෙනවා. ඒත් හුඟාක් රෑවෙන තුරු කඩ සාප්පු විවෘත කරගෙන ඉන්නෙ නැහැනෙ.

ජාත්‍යන්තර සංවිධානවලින් කුලියට ගත් නිවාසවල සොර සතුරු බියක් තිබුණෙ නැහැ. සාමාන්‍ය මිනිස්සුන් විශාල සොරකම් කරන්නෙ නැහැ කියලා අහලා තිබුණා. මං නවතින ගෙදරට කිට්ටුව කොටි සංවිධානයේ කාර්යාල සංකීර්ණයක් තිබුණත් රහසිගත යුද කඳවුරු අවට වනයේ තියෙන බව දන සිටියත් මටත් බයක් හිතිලා නැහැ. හුඟාක් වෙලාවට මං නිදගන්නේ හොඳින් තුළං වදින පිටුපස ඉස්තෝප්පු කාල්ලෙ තිබුණු පටු යකඩ ඇඳකයි. දහවල් කාලයට ඒක හැමෝම වාඩිවෙන සෝපාවක් වගේ පාවිච්චි වෙන නිසා

මං ගෙදරින් යනකොට සුදු ඇඳ රෙද්දකුත්, සුදු කොට්ටයකුත් අරගෙන යනවා. කිලිනොච්චියෙදි හොඳට සැවැන්දරා සුවඳ ඇතිරිලි උඩ දිගාවෙනකොට කොළඹදි නොදැනෙන විදියෙ සතුටක් දැනෙනවා. මං පිටරට ගිය වෙලාවට මොන මොන සුවඳ කාරක ගෙනාවත් මගේ බිරිඳ වර්ණාසි අල්මාරිවලට දන්නෙ සැවැන්දරයි, කපුරුයි විතරයි.

කිලිනොච්චියෙ සුදු මිනිස්සුන්ගෙ ගෙවල්වලට විසකුරු සර්පයො ආපු වෙලාවල් ගැන නොයෙකුත් කතා තිබුණා. මීයන් විතරක් නෙවෙයි හූනන් එක්කත් විශාල සටන් තිබුණා. යුද්ධ ගණනාවකට පස්සෙත් මිනිස්සු මිසක් කැරපොත්තො මැරිලා තිබුණෙ නැහැ. ජාත්‍යන්තර සංවිධාන ගණනාවක ප්‍රධාන සම්බන්ධීකාරක වෙච්චි ඇලන් කියන්නෙ කිලිනොච්චියෙ මීයොයි, කැරපොත්තොයි ඉතාම දක්ෂ විදියට ගරිල්ලා සටන් පුහුණුවෙලා තියෙනවා කියලයි. කොච්චර කෘමිනාශක ගහලා තිබුණත් රතු පාසානම් කැට දලා තිබුණත් කොළඹ ගිහින් සුමානයක් හිටියොත් ආපහු එනකොට ඒ දේපාර්ශ්වයම ආක්‍රමණය කරනවා.

"කිලිනොච්චියෙ රෑට නෙවෙයි දවල්ටත් මිනිස්සුන්ටයි සර්පයන්ටයි සමාන අවස්ථා තියෙනවා."

"සර්පයන්ට වගේම සමනළයන්ටත්, කුරුල්ලන්ටත් සිංහල දෙමළ වෙනසක් තියෙන්න බැහැ."

"යුද්ධ කරනකොට නං සර්පයොයි මිනිස්සුයි අතර වෙනසක් නෑ. සමහර විට ඒ වෙලාවට සර්පයො මිනිස්සුන්ට වැඩිය හොඳත් ඇති."

මේ සර්ප කතා කියන්නෙ ඉතාලියෙන් ආ රොසානා තමයි. රෝමයේ හැදී වැඩුණු රොසානා හූනන්ටත්, කටුස්සන්ටත් බයයි. ඒ වෙනකොට ගැනී කිලිනොච්චියෙ හත් මාසයක් ගත කරලා පස්වතාවක් කොළඹ ඇවිත් තිබුණා. එයාගෙ වියදම් බලා ගන්නෙ ස්විස් සංවිධානයකින්. යුද හමුදාවල හරි, සාම හමුදාවල හරි සේවය කිරීමේ පළපුරුද්ද නිසා හරි එහෙමත් නැත්නම් හම සුදු නිසා හරි බිම් බෝම්බ නිෂ්ක්‍රිය කටයුතුවලට ඇවිත් හිටිය අච්චට දුඹුරු පාට වෙච්චි පිරිමි අතර රොසානාගේ හීනි උස රෝසපාට ශරීරය

පෙනුණේ කටු පඳුරු අතර ට්‍යුලිප් රෝස අත්තක් පිදිලා වගෙයි. ගැනී කතා කළේ ශී ගයන කිරිල්ලියක් වගෙයි. ට් අකුර ත විදියටත් ඩී අකුර ද විදියටත් ස අකුර ශ හැටියටත් උච්චාරණය කරන රොසානගේ ඉතාලි - ඉංග්‍රීසියෙ දි බර විය යුතු වචන අග හැලිලා බොහොම මටසිළුටු උච්චාරණයක් මතු වුණත් වෙනත් ගැහැනුන්ට තියෙන ආලිලි කතාවලින් නම් රොසානා නම්මා ගන්න බැරි බවත් මම අත්දැකීමෙන් දැනගෙන හිටියා.

කොළඹින් ප්‍රේමවන්තියක් කැන්දගෙන ආවොත් මිසක් කිලිනොච්චි රාත්‍රියක කාමෝන්මාදයක් අපේක්ෂා කරන්න අසීරුයි. දේශපාලන ව්‍යාපාරයත් වෙනත් ආදායම් මාර්ගත් නිසා පැදුණු සබඳතා අතර මට ස්ත්‍රීන්ගෙ හිඟයක් නං තිබුණෙ නැහැ. මං උපදේශක සේවා සැපයූ යුරෝපීය සංවිධානයෙන් කුලියට ගත්තු ඒ ගෙදරත් අවට වෙනත් ගෙවල්වලත් වරින්වර සුදු ගැනු කීප දෙනෙක්ම නැවතිලා හිටියත් ඒ ඇත්තියන්ට ලැබිය යුතු ගරුත්වයත් ආරක්ෂාවත් නොමදව ලැබුණා. කොළඹට ආ විටෙක මිසක් ගැනු ඇසුරක් නැතුව බිම් බෝම්බ ඉවත් කිරීම වගේ දුෂ්කර රැකියාවල නිරත වෙමින කටුක උණුසුම් පරිසරයක ජීවත් වුණත් ඒ පිරිමින්ට මහා හික්මීමක් තිබුණා. සවස් කාලයට වැඩි දෙනෙක් රැස් වුණේ ඇලන්, රික්, නික් හා ජේම්ස් නැවතිලා හිටි ගෙදරටයි. වෙස් අඳින අයත් හැමදම හවසට ඒ ගෙදරට එකතු වෙනවා. සෙනසුරාදත් වරුවක් වැඩ කරන නිසා හොඳට ඇඟට දැනෙන්න බොන්නෙ සෙනසුරාදටයි. පිටුපස ඉස්තෝප්පුවෙ සුදු බිත්තියට වදින්න එල්ල කරලා කොළඹින් ගෙනෙනා චිත්‍රපට නැරඹීමත් සෙනසුරාදට අනිවාර්යෙන් සිද්ධ වෙනවා. ඉරිදට මුහුදෙ නාන්න යනවා. හඳ තියෙන දවසට නං රෑට වැල්ලෙ ගිනි ගොඩක් ගහලා මස් මාලු පුච්චගෙන කාලා විනෝද වෙනවා. ඉඳහිට දවසක කිලිනොච්චියේ අපේ කාර්යාලයෙ වැඩ කරන දෙමළ ජාතිකයෙකුගෙ ගෙදරක චාම් උත්සවයකට සහභාගි වූ අවස්ථාත් තිබුණා. වතාවක් රොසානා කොළඹ ආ වෙලාවක රතු සාරියක් අරගෙන හැට්ටෙකුත් මස්සවා ගන්න ගියෙ කිලිනොච්චියෙ මඟුල් ගෙදරකට යන්නයි. මං කැමැත්තෙන්ම ඉදිරිපත් වෙලා ඒ වැඩේට උදව් කළත් මං තෝරපු සාරියට එයා කැමති වුණේ නැහැ. එයා ගත්තෙ අපේ වර්ණාසියි එයාගෙ අම්මයි නං කවදාවත් අඳින්නෙ නැති විදියෙ රතුයි, රත්තරං පාටයි.

"කිලිනොච්චියෙ ඉන්නකොට කිලිනොච්චියෙ විදියට අඳින්න ඕන. කොළඹ මිනිස්සුන්ගෙ රුචිකත්වය කිලිනොච්චියට ගැලපෙන්නෙ නෑ." කියලා කිව්වම මං උරහිස් හකුලලා හිනාවෙලා නිකං හිටියා."

ලංකාවෙ ගෑනියෙක් වගේ මං සාරියට සල්ලි ගෙවයි කියලා නං රොසානා බලාපොරොත්තු නොවන බව මම දන්නවා. ගෑනුන්ගෙන් තෑගි ලබන්න මිසක් ගෑනුන්ට තෑගි අරගෙන දෙන්න මං කවදාවත් එච්චර උනන්දුවෙලා නැහැ. ඒ උනත් කිලිනොච්චියෙ කට්ටිය කොළඹ ආ වෙලාවට මටත් නිදහස් දවසක් නම් මං හිතාමතාම ඒ අයට අපේ ගෙදරට ආරාධනා කළා. කොළඹ හිතවතුන් හරි වෘත්තීය සබඳතා තියෙන අයට හරි එන්න කිව්වෙ සැබෑ ශ්‍රී ලාංකික ආගන්තුක සත්කාරයත්, මිනිස් ඇසුරේ උණුසුමත් විඳින්න සලසා දීමේ හැඟීමත් එක්කයි. මගේ නැන්දම්මා මනෝරම්‍යා නම් හිතන්න ඇත්තේ මං සුද්දන්ට පුක දෙන්න හදනවා කියලා වෙන්න ඇති. නැන්දම්මා අපේ ගෙදර උත්සවවලට පය තිබ්බෙ නැතුවට ගෙදර වෙන දේවල් සේරම එයා දන්නවා ඇති. දීර්ඝ කාලයක් සුදු මිනිස්සුත් එක්ක වැඩ කරලා එයාටත් යාළුවෝ කීප දෙනෙක් හරි ඉතුරු වෙන්නත් එපායැ. ගෑනි හැම කෙනෙක්ම, හැම දෙයක්ම සැක කරන නිසා ඒ ඒ කාලෙට වෘත්තීය මට්ටමෙන් ආශ්‍රය කරනවා මිසක් දීර්ඝකාලීන මිත්‍රකම් ඉතුරු කර ගන්නෙ නැතුවත් ඇති. මනෝරම්‍යාගෙ පැත්තෙන් එයාගෙ හැසිරීමට සාධාරණ හේතු තියෙන්න පුළුවන්. ඒ වුණත් අපේ ගෙදර උත්සවවලට එයා සහභාගි වුණා නම් ඒවා වඩාත් රසවත් වෙන්න තිබුණා. ඒත් ඔය අම්මණ්ඩිගෙ තියෙන අහංකාරකමට අපේ උත්සවවලින් යවන කෑම ඉඳුල් කරන්නෙවත් නැති බව මට විශ්වාසයි.

"ලොකු මිස්ට කෑම ගෙනිහින් දීලා එන්ඩ මේ කට්ටිය එන්ඩ කලින්." වතාවක් වර්ණාසි අපිටයි මනෝරම්‍යාටයි වැඩ කළ ලිනට්ට කියනවා මට ඇහුණා.

පාර වැරදිච්ච නෝර්වේකාරයෙකුට ගේ හොයා ගන්න මඟ සලකුණු කියමින් ජංගම දුරකථනයත් අතේ තියාගෙන මං ගේට්ටුව ළඟට ගියෙ ලිනට් කෑම දීලා ආපහු එනකොටයි. ගේට්ටුව අරින්න

කලින් පිටතින් ලිනට්ගෙ කටහඬ ඇහුණා.

"ලොකු මිස්ට කෑම දෙන්ඩ කිව්ව හිංද ගියා. එයා ඒවාට අතවත් තියන එකක් නෑ. පොඩි එවුංට ඉක්මනට ඒ පැත්තෙ යන්න කියන්න."

ලිනට් කතා කළේ කාටද කියලා පෙනුණෙ නැති හින්ද මට ඒ කතාව ඇහුණු බව උන්දෑට දැන ගන්න ඉඩ නොතියා මම වහාම ආපහු හැරිලා මිදුලෙ පොකුණ අද්දර බංකුවෙ වාඩි වුණා. ඊළඟ මොහොතේ පොඩි ගේට්ටුව විවර කරගෙන ලිනට් ආවා. ඊට පිටිපස්සෙන් බයිසිකලය තල්ලුකරගෙන ආවෙ අලුත් ඉස්සො ගේන්න ගිහින් හිටිය ලිනට්ගෙ මනුස්සයයි.

මුවං අතුරු කතා උනත් ඒ පුදුමාකාර කිලිනොච්චි රාත්‍රියෙදි මට මනෝරමාගෙ මුරණ්ඩුකමත් ආඩම්බරයත් සිහි වුණා. ඊට හේතු වුණේ එද ඉංග්‍රීසි පත්තරයක මනෝරමාගෙ ලිපියක් පළ වී තිබීමයි.

උදය වරුවේ දෙමළ පුනරුත්ථාපන සංවිධානයේ නියෝජිතයන් හා යුරෝපීය සංවිධානවල නියෝජිතයන් අතර සාකච්ඡාවකට නිරීක්ෂක මට්ටමින් සහභාගි වීමෙනුත් දෙව්නුව ඇලන්ගේ කාර්යාලයේ පැවති සාකච්ඡාවකටත් දහවල් ආහාරයෙන් පස්සෙ පරන්තන් පාරේ පුනරුත්ථාපන කඳවුරකටත් ගිහින් මං නවාතැනට ආවෙ හොඳටම හෙම්බත් වෙලා. ඒ ගෙදර හිටිය කවුරුවත් ඉදිරිපස දොරෙන් ඇතුළු වුණේ නැති නිසා ඒක වහපු ගමන්මයි. අපි හැමෝම ගෙයි වම් පැත්තෙ බිම් පීරුව දිගේ පිටිපස්සෙ ඉස්තෝප්පුවට යනවා. මං යනකොට රොසානා වේලාසනින් ඇවිත් පටු යහන් ඇඳේ හරහට වාඩිවෙලා බිත්ති කණ්ඩියට හේත්තුවෙලා "සෝ නව් ඩේලි" පත්තරය බලමින් හිටියා.

දණ හිස ළඟට දිග සුදු කලු කලිසමකුයි. බීරළු රේන්ද අල්ලපු සුදු කලු හැට්ට කෑල්ලකුයි ඇඳලා හිටියත් රොසානාගේ සිහින් දිග සිරුර පෙනුණෙ මැඩෝනා ප්‍රතිමාවක් වගෙයි. ඒත් ඒක ප්‍රකාශ කිරීමෙන් සාවද්‍ය සිතුවිලිත් හරි අවතැනපෙන කතාවකින් හරි සංග්‍රහ ලබන්න මට අවශ්‍ය වුණේ නැහැ. නමුත් රොසානා කොදෙක්කා වගේ මගෙ යන්නත් බැරි නිසා බොහොම වැදගත් විදියට හරි ටිකක් කතා කරලා යන්නත් ඕනකම තිබුණා. ඒක

බොහොම අහිංසක පෙරේතකමක්.

"හායි රොසානා"

"හායි සාෂා.... ඔයා ආ එක හොඳයි. කාටද අංගුලිමාල කියන්නෙ. එයාගෙ කතාව මොකක්ද?"

මං උඩ ගිහින් බිම වැටුණා. කිලිනොච්චියෙදි ආකර්ෂණීය සුදු ගෑනියෙක් එක්ක කතා කරන්න ඕනම කාරණයක් හොයා ගන්න පුළුවන්. ඒ උනත් අංගුලිමාල කතාව නං ඒකට එච්චර ගැලපෙන්නෙ නෑ කියලා හිතුණා. නලිනී ජාතකය වගේ දෙයක් ගැනවත් ඇහුවා නං ලස්සනට මවලා කියනවනේ.

"අයියෝ ඔයා කොහෙන්ද අංගුලිමාල නම හොයා ගත්තේ?" මං දන්නෙම නැතුව උනත් කෙටි බිත්ති කණ්ඩියෙ වාඩි වුණේ හීන් මනමාල ගතියකින්ම තමයි. ඒත් යාන්තමට හරි ඒක මූණෙන්වත් පළ වුණොත් ඒ මිත්‍රශීලී ගතිය අතුරුදහන් වෙන්න පුළුවන්. රොසානා ගෙදර ආ ගමන් නාන්න ඇති. ඕඩිකොලොන් සුවඳ වාගෙ සැර නැති ඒත් හුඟාක් වෙලා රැඳෙන ජාතියෙ මිල අධික විලවුන් වර්ගයක හීන් සුවඳ මගේ නාහයෙ දැවටුණා. "ඔයා ළඟ හරි සුවඳයි" කිව්වොත් ඒක පාරටම තපුරු බැල්මකට මාරු වෙන්න පුළුවන් බව මං දැනගෙන හිටියා. කලින් වතාවක ගෑනි මට ඒ අනතුරු සංඥව නිකුත් කරලා තිබුණා. ඒ වුණාට හිතේ කහටක් නැහැ. යහන්ගතවීමේ භාණ්ඩයක් හැටියට නැතුව වෘත්තීය හවුල්කරුවකු හැටියට සලකනවා නං විතරයි එයාගෙ මිත්‍රකම විඳින්න පුළුවන් වෙන්නෙ.

මගේ පෙරේතකම මටවත් තේරුම් ගන්න බැරිකොට ගෑනු කොහොමද ඒක තේරුම් ගන්නෙ? මං ආසයි මම අහිංසක දඩයක්කාරයෙක් කියලා හිතන්න. ඒ අහිංසකයාට තකතීරු බලාපොරොත්තුවක් තියාගෙන මහත්මා රඟපෑමක යෙදෙන්න තහනම් නැහැනෙ. ස්ත්‍රියක් හුදකලා වෙච්චි අසරණ වෙච්චි වෙලාවක හිත දුර්වල වෙන්න පුළුවන්. එහෙම වෙලාවට අර තකතීරු බලාපොරොත්තුව රබර් බෝලයක් වතුරෙ ඔබාගෙන ඉන්නවා වගේ තදකරගෙන ගැනිට අඬන්න උරහිස පාන්න ලේසියිනෙ. ඒ මොහොතෙ මම ඉතාම වැදගත් උගත් මහත්මා

හිතාවකින් එතන රැඳුණ අංගුලිමාල කතාව උනත් ලස්සනට කියන්න කාලා ඇඳුම් මාරු කරගෙන එන්නම් කියන්න හිටියාමිත්.

"මේ බලන්න මේකෙ තියෙන්නෙත්." රොසානා මට පත්තර පිටුව පෑවා.

දෙයි හාමුදුරුවනේ! ඒක ලියල තිබුණෙ මගේ නැන්දම්මා මනෝරමාගෙ. ගැනිගෙ පින්තූරෙත් තියෙන්නෙ. පින්තූරවලට නං තාම නියම වයස පෙනෙන්නෙ නැහැ. මට හිතා ගියා.

"ඇයි හිතා වෙන්නෙ?"

"ඕක ලියලා තියෙන කෙනාව නුඹාත් හොඳට දන්නවා."

"ඒ ඔයාගෙ කෝනද?"

මං මොහොතකට නිහැස්සුණා.

"නෑ ඒ මගේ නැන්දම්මා. විජේපාලසිංහ අම්මිදු." මගේ උත්තරේ පිට වෙන්න විනාඩියක විතර නිහඬතාවක් ගත වුණා. මගේ හිත්වල මැකී ගියේ ඒක නැවතත් කඩිනමින් අල්ලා ගන්න බැරි විදියට.

"ඇත්තට! එහෙනං ලබන පෝයට මං කොළඹ ආවම ඒක අඳුන්නලා දෙන්න. මං ආසයි එයා මේක පටන් අරගෙන තියෙන විදියට. මෙයා හොඳවෙයිනෙ අර අපේ කිලිනොච්චි හම්බන්තොට ගෙවතු මිතුරු ශ්‍රී සොබා වැඩ සටහනේ පොත ලියන්න. ඔයාට වෙලාවක් නෑ කිව්වට තාම කවුරුවත් හොයා ගත්තෙත් නෑනෙ."

"මං හිතන්නෙ නෑ එයා එහෙම වැඩකට කැමති වෙයි කියලා."

"ඔයා අහලා බලන්නකො. මට අඳුනලා දෙන්නකො. මේ අවුරුද්දෙ ඇතුළත ඒක කරන්න ඕනනෙ. බැරි වෙලාවත් සාම ගිවිසුමක් ආවොත් ඒ උළුසුම පිට මේක පිට කරන්නත් පුළුවන්නෙ."

"සාම ගිවිසුමක් නං මෙච්චර ඉක්මනට එන්නෙ නෑ. පුතාලී අනෙක් සටන් විරාමයක් තියෙනකොටනෙ. ඒත් බැරි වුණා. ඊට පස්සෙ ඒ අලුතම මෙතෙ ගෙවල් හදන වැඩවලට එවලා තිබුණු සිංහල මිනිස්සු දෙන්නෙක් ආපහු යවන්න කිව්වා. සිංහල මිනිස්සු

අලුතෙන් එවන්නත් එපා කිව්වා. එතකොට මං දන ගත්තා වැඩේ වැරදෙන්නයි එන්නෙ කියලා. ජනාධිපතිවරණය එතකොටත් ඒ දේවල් වෙලා ඉවරයි. ඊට පස්සෙ අවුරුදු කීයක් අපි යුද්ධ කරාද? දැන් මේ හති අරින විරාම අවුරුදු තුනක්වත් ඇදිලා යන්න වෙයි ගිවිසුම හැදීමේ සැලැස්මවත් හද ගන්න."

රොසානාට ඒ තරම් විස්තරයක් අවශ්‍ය නැතත් මගේ ස්වරය වෙනස්වෙලා හිත ටිකක් නොසන්සුන් වෙමින් තිබුණා.

"ඉතින් ඔයා වගේ අය මේ වැඩේට බැහැලා තියෙන්නෙ ඒක ඊට වඩා ඉක්මන් කරන්න නෙවෙයිද?"

"මං දන්නෙ නෑ රොසානා. දෙපැත්තම පරණ තුවාල සනීප කර ගන්න විදියක් දන්නෙ නැහැ."

මට උවමනා වුණේ සාම ප්‍රයත්න ගැන දේශනාවක් දෙන්න නෙවෙයි. නැන්දම්මා අඳුන්නලා දීම කරන්න බැරි වැඩක් නොකියා ඒකෙන් ගැලවෙන්න කතාව වෙන පැත්තකට ගෙනියන්න වෙනවනෙ. මං උපදේශක කටයුතු කළ සංවිධානවල සුද්දෙ සුද්දියො හිතන්නෙ මට කරන්න බැරි දෙයක් නෑ කියලනෙ. ලංකාවෙ මාධ්‍ය පෙරකදෝරුවොයි, විප්ලව පෙරකදෝරුවොයි, කලාකාරයන්ගෙ ඉඳලා සකල කලාබරයොයි දන්න කියන මං කොහොමද මගේ නැන්දම්මා මගේ නමක් ගැවුණු තැනකට එන්නෙ නෑ කියන්නෙ. අංගුලිමාල ගැන අහපු එකට උත්තර දෙන්නෙ නැතුව වැඩිදුරටත් කතා කරන්න ගිහින් දගත්තු ලෙඩක්නෙ. රොසානා කිට්ටුවෙන් වාඩිවෙලා දෙපා වනන්න පටන් ගන්නකොට මනෝරමා හෙම ආවා නං මං ඒක පාරට ගල් වෙන්න තිබුණා. මොකද ඔය ගැති මටත් කලින් මගේ හිත කියවන්න දන්නවා.

"මම යනවා. කාමරේ අස්කරන්න ඕන. ඔයා ඕක කියවන්නකො." කියාගෙන රොසානා නැගිටලා ගියා.

අංගුලිමාල ගැන දැනගන්න ඕන නැද්ද කියලා අහලා ගැනි තව ටික වෙලාවක් රඳවා ගන්න මට ඕන වුණේ නැහැ. මනෝරමා මොනවද ලියලා තියෙන්නෙ කියලා කියවන්න එපායැ.

කිලිනොච්චියේ ඒකාංගුලි

"වසර 2005 දී පමණ වරක් මා කිලිනොච්චි ගිය විට කොටි නියෝජිතයෙකුට අතට අත දෙන්නට සිදු විය. මා ජාතිවාදියකු නො වූවත් මගේ යටි සිතෙ තිබුණේ ඔහු ගේ අතින් දකුණේ සොල්දාදුවන් කෙසේ වෙතත් අනුරාධපුරයේ එපිට ගම්වල කී දෙනෙකු ඝාතනය වන්නට ඇති ද යි කියාය. එසේ ම ඔහු ගේ පවුලේ අය හා මිත්‍රයන්ට ද යුද්ධයෙන් හානි වන්නට ඇත. එනමුත් ඒ මොහොතේ මා තුළ වැඩ කළේ දකුණේ සිංහල යටි මනසක් නිසා මට ඒ දෙවන කරුණ කල්පනා වූයේ නැත.

ඔහු ගේ අත දෙස නොබලාම අත දිගු කළ නිසා මට හසු වූයේ රළු අතක දබර ඇඟිල්ලක් පමණි. මට වහා ඔහුගේ ඒ තනි ඇඟිල්ල අතහැරුණි.

මධ්‍යම ප්‍රමාණයේ උසකින් ද ලී කකුලක් දමා ඇති ආකාරයේ ගමනකින් ද යුතු වූ ඔහුගේ හතරැස් මුහුණෙන් හෝ දෑසෙන් කිසිවක් කියවා ගත නොහැකි විය. අදට වසර ගණනාවකට පෙර මිය ගිය තමිල් චෙල්වම් හමු වූයේ ඊට මොහොතකට පෙර ය. එහෙත් චෙල්වම් ගේ දෑස් සිනාසුණ නිසා මට ද සිනාවක් නැගුණි. ඡායාරූපවලින් හා කොටි ප්‍රචාරක චිත්‍රපටිවලින් දක්වෙන පරිදි ප්‍රභාකරන් ගේ මුහුණේ තිබෙනුයේ සිනාවකින් තොර සැකමුසු කල්පනාකාරී බැල්මකි. එහෙත් මේ මිනිසා ගේ මුහුණෙහි ඒ කිසිවක්

නො තිබිණි. මට අත දිගු කරන්නට සිදු වූයේ චාරිත්‍රයක් ලෙස ය. ඔහුට එය අනපේක්ෂිත සිද්ධියක් වන්නට ඇත. සාකච්ඡාව අතරතුර ඔහු ගේ අත මගේ නිරීක්ෂණයට හසු නො වුණි. ඔහු අත මේසය උඩ තබාගෙන සිටියා ද නැතහොත් එය දෙපා මත රඳවාගෙන සිටියා ද යි නිශ්චයක් නො තිබිණි. ඔහු එය මේසය මත තබාගෙන සිටියා නම් ඇඟිලි නැති බැව් දන දනම මා අත දිගු කිරීම ගැන පුදුම වන්නට ඇත. වැලි කරදසියක් බඳු මුහුණකින් ද ඔප නොදමූ කාක නිල බඳු දෑසකින් ද යුත් ඔහු වචනයක්වත් නොකියා දණ හිස නො නැමෙන දකුණු කකුලත් ඇදගෙන සාකච්ඡා ශාලාවෙන් පිටතට යනවිට ටී 56ක් අතේ රඳවාගෙන පොලිස් කාන්තාවක සේ අළු පැහැති කමිසයක් හා නිල් දිගු කලිසමක් හැඳ සෙරෙප්පු දමාගෙන සිටි තරුණියක් ද ඔහු පිටුපසින් ගියේ ඇය ඔහු ගේ ආරක්ෂිකාව වූ නිසා ද යි නො දනිමි. එහෙත් කොණ්ඩ කරල් දෙක නවා එක් කරලක අගිස්ස අනෙක් කරලෙහි අගින් සිටින්නට ගැට ගසා සිටි ඇය ද මගේ සිනාවට ප්‍රතිචාර දක්වූයේ නැත. මා සිනාසුණේ පුරුද්දට ය. එහෙත් ඔවුන්ගෙන් එවැනි මිත්‍රකමක් පළ නො වීම ගැන මට සිත රිදුණේ නැත. ඔවුන් ගේ පැත්තෙන් ද කතා රාශියක් තිබෙනවා විය යුතු ය. ඒ කතා අසන්නට මට අවස්ථාව නො ලැබෙන ලෙසම දකුණේ කතා අසන්නට ද ඔවුන්ට අවස්ථාව නො ලැබේ. එහෙත් අපේ පොදු වේදනාවට විසඳුමක් සොයා ගත යුතු බවත් ඔවුන් ගේ ගම් බිම්වල බිත්ති පුපුරා ගිය වහලවල් පාත් වුණු නිවාස පිළිසකර වී යළිත් බිළිඳු කිරි සිනා ඇසෙන පරිසරයක් ඇති විය යුතු බවත් කියා ගන්නට ක්‍රමයක් තිබුණේ නැත. අපි සාම පොරොන්දු මෙන්ම යුද්ධයේ වීර වික්‍රමයන් ද ජය අත ළඟ බව ද දහස් වරක් අසා ඇතිවාක් මෙන්ම ඔවුන් ද ඒ කතා අසා ඇතුවා විය හැක.

දේශපාලන එකඟතාවකින් හෝ යුදමය අඩපණ කිරීමකින් හෝ අළු යට ගිනි ඉතුරුවීම නවතාලීම අසීරු ය. ඒ සඳහා වෙනත් සුවපත්වීමේ මඟක් තිබිය යුතු ය. සිනාවක් නැති මිනිසා ගේ පපුවේ බෝම්බ පමණක් නොව කොන්ක්‍රීට් ද යකඩ ද තිබිය හැකි වුවත් හිස් පතොරම් කොපු ද සතුන්ගේ පමණක් නොව මිනිසුන් ගේ ඇට කටු ද විසිරී තිබිය හැකි වගුරු බිම් ආශ්‍රිත කුඩා විල්වල සුදු නෙළුම් පිපී ඇති ලෙසම ඔහුගේ සිතේ ද දශමයක හෝ තෙතමනයක් ඉතිරි වී තිබිය හැක. මට සිහි වූයේ අංගුලිමාල

කතාව ය. අංගුලිමාලට වහත් වන්නට හැකි වූවා නම් මේ ඒකාංගුලි මිනිසාට ද ඔහු පසුපස ගිය සිනාවක් නැති තරුණ ගිනි අවිධාරිනියට ද තරුණියට ද වෙනස් වන්නට හැකි විය යුතු ය.

කාලය, දීපය, දේශය වෙනස් වූවත් අංගුලිමාල ද මිනිස් පුත්‍රයෙකි. මේ ඒකාංගුලි ද එසේය. මේ පොදු සාධකයට මහා ගුණාකාරය විය හැක්කේ කුමක් ද? අංගුලිමාලට නම් පිහිටට සිටියේ බුදුන් ගේ මෛත්‍රියයි. ඒ මෛත්‍රිය න්‍යායවාදී ලෙසත් රූපවාහිනී හා ගුවන්විදුලි දේශනාවලටත් එපිට සැබෑ ප්‍රායෝගික තලයකට ගෙන එන්නේ කෙසේද කියන අභියෝගය තුළ මේ පොදු වේදනාවට සැනසීමක් තිබිය නො හැකි ද? කිසියම් දිනක අප මේ සටන් විරාමයෙන් එපිටට පිය තබා සාමය ගිවිසුම් ගත කරන්නට ඉඩ තිබේ. එහෙත් ගිවිසුම් පවත්වාගෙන යමින් ජන ජීවිතය සාමාන්‍යකරණය වීමට නම් මෛත්‍රියට ජාති භේදයක් හෝ පරණ තුවාල කැසීමේ අවශ්‍යතාවක් හෝ තිබිය නො හැකි වග වටහා ගත යුතු ය."

මනෝරම්‍යා තව දිගට ලියලා තිබුණා. ඉතුරු කොටස උඩින් පල්ලෙන් බලනකොට බුද්ධ ධර්මයයි, හින්දු ධර්මයයි ගැනත් කතා කරමින් සාමාන්‍ය මිනිසුන් අතර මිත්‍රත්වය වර්ධනය කරන යෝජනා ගණනාවක් සඳහන් කරලා තිබුණු බව පෙනුණා. මුල ටික කියවනකොට ම මට නිකං පපුව පුපුරු ගහනවා වගේ දැනුණා.

කොච්චර අමනාපෙන් හිටියත් මං ඔය ගැනි ලියන දේවල් කියවනවා. මට නං ඔය සාකච්ඡාවක් දෙකක් මිසක් පත්තරවලට ලියන්න වෙලාවක් නැහැ. මනෝරම්‍යා නම් ලියන්නේ මුදල් අවශ්‍යතාවට තමයි. කර්තෘ වෙන කෙනෙක් වුණත් ඔය ගැනි පිටු කීපයක් ගෙදර ඉඳලම සංස්කරණය කරනවා ඇති. මනෝරම්‍යා ගේ අහංකාරකම නිසා කවදාවත් අපෙන් මුදලක් ගන්නෙ නැති බව මට විශ්වාසයි. "අම්මට සනීප නෑ" කියලා වර්ණාසි කවදාවත් කියල නැහැ.

"වයසට යනකොට බැරි නැතෙනකොට හරි අපි ළඟට එන්න වෙයිනෙ. දැනටත් මාත්තෙට නොකිවට ලෙඩ ඇති." දවසක් මට නිකමට කියවුණා.

"අනේ මතක ඇති කාලෙ ඉඳලා උනත් නෙම්බිරිස්සාවකට

වැඩි දෙයක් හැදිලා නැහැ."

වර්ණාසිගෙ උත්තරේ සත්‍ය වුණත් ඒ නිරෝගිකම ජීවිත කාලයම පවතින්න විදියක් නැහැනෙ. වයසට යනකොට මොනවා වෙයිද කියලා කවුද දන්නේ.

අංගුලිමාල ගැන සඳහන් කරලා ජාතික ප්‍රශ්නයකට විසඳුම් යෝජනා කරන මහ ගැනිට බෑ දුවගෙ මිනිහා එක්ක මනුස්සකමට කතා කරන්න. පරණ කෝන්තර පැහැව පැහැවා ඉන්නවා. ආණ්ඩුවටයි, මිනිස්සුන්ටයි බණ කියන්න කලින් ඔය මෛත්‍රිය එයාගෙ ගෙදරින් පටන් ගන්න කියලා ලියුමක් යවන්නයි තියෙන්නෙ. මොකද මාව උල තියන්නයැ. කොළඹ ගියාම ඊ-මේල් එකක් යවන්න ඕන. ගැනි කීයටවත් උත්තර එවන්නෙ නෑ. කොළඹ හිටියා නං පත්තරේ කෑලි කෑලිවලට ඉරලා කවරෙක දලා යවන්න තිබුණා පුච්චලා නළලෙ අළු ගා ගන්න කියලා.

මං උදේ වැලේ දලා ගිය තුවායත් අරගෙන ගෙට යන්න හැරෙනකොට රොසනා ආයෙත් පිටතට ආවා. පුංචි වීදුරු බඳුනකට වතුර දගෙන ඇවිත් පිච්චමල් කඩන්න ගත්තා.

"මොනවට ද?" කියන ප්‍රශ්නෙ පිට වෙන්න කලින් මගේ ඇස් කියවා ගත් රොසානා උත්තරයක් බැන්ද.

"මං ආසයි කාමරේ පිච්ච මල් ටිකක් තියා ගන්න. එතකොට සුවඳයි."

"ඉතින් කඩෙන් මල් මාලයක් අරගෙන ඔළුවෙ ගහ ගත්තම ඉවරනෙ."

"සමහර දවසට එහෙම කරනවා. ඒ උනාට මගේ ඔලුවෙ ඒක හිටින්නෙ නෑ. හැලෙනවා. ආ ඔයා මට අංගුලිමාල ගැන කිව්වෙ නැහැනෙ."

"නාලා එන්නං...."

"හරි...... මං වහල උඩට වෙලා සංගීතේ අහගෙන අහස දිහා බලාගෙන ඉන්නවා. ජේම්ස්වත් අඬ ගහගෙන උඩට එන්න."

ගැනි මට ජේම්ස් එක්ක එන්න කිව්වෙ මං වරදවා හිතයි කියලා වෙන්න ඇති. කලින් දවසක කියලා තිබුණා හොඳට කතා

[illegible] ගෙනාවා, කරාම දකුණේ [illegible] කතාවක්නෙ. කොට් සංවිධානයෙත් අපි කියලා. ඒක යකාගෙ කතාවක්නෙ. කොට් සංවිධානයෙත් අපි වගේ කන බොන මිනිස්සු නෑ කියලා කියන්නෙ කොහොමද? අපිත් එක්ක වගේ ළඟින් වැඩ කරන්න ලැබෙන්නේ නැති හින්ද ඒවා දකින්නෙ නැතුව ඇති.

කිලිනොච්චියෙත් හොඳ හෝටල් තිබුණා නං මට ඒ විදියට සිඟු ගැහු ඉන්න ගෙදරක ඉන්න ලැබෙන්නෙ නැහැ. ඒත් එහෙම ගෙදරක ඉන්නකොට හෝටලේක දී නො දකෙන විදියෙ නිදහසක් දකෙනවා. අපි හිටිය ගෙදර ජාත්‍යන්තර සංවිධාන සංසදයෙන් කුලියට ගත්තෙ ජිනීවාවල හිටිය කෙනෙක් ගෙන්. රේල් පීලි අතුරුදහන් වෙච්චි, පරණ රේල් පාර අද්දර තිබුණු ඒ ගෙදරට ඇලන් මුලින්ම එනකොට බිත්ති පුපුරලා සාලෙ විශාල හුඹහක් බැඳලා තිබුණලු. කන්න නැතුවම මැරෙන්න ඇති බල්ලෙක්ගෙ ඇටසැකිල්ල කුස්සියෙ පෝරණුව යට තිබුණ හැටියට ඇලන්ගෙ හිත සසල වුණාලු. කොළ රොඩු [illegible] අපවිත්‍රවෙලා තිබුණු බොලොක්ක ලිඳ ඉහලා, ගේ අ[illegible] කරලා, දම් පාට [illegible] කරලා, විදුලි ජනකයක් ගෙනියලා, [illegible] රැහැන් ඇදලා, [illegible] පංකාත් ද ගත්තට පස්සෙ තමයි මට යන්න ලැබුණෙ.

'හැබැයි සාෂා ඔය සෙරම පාළුවෙලා තිබුණත් [illegible] එනකොටත් පිච්ච වැලෙයි, රෝස ගස්වලයි මල් පිපිලා තිබුණා.' කියලා ඇලන් ඒ දවස්වල කිව්වා.

[illegible]

පොළකට කියලා ඇඳ පත්ත ගලවලා තව කෑල්ලක් පූට්ටු කරවගෙන තිබුණා. ඇතුළු කොටසෙ පරණ ලී ඇඳක් තිබුණත් ඇලනුත් මං වගේම තමයි එළියෙ නිදා ගන්නයි කැමති. කාමරේ දෙර වහ ගත්තම හුස්ම ගන්න බැරි ගතියක් දැනෙනවලු. මැද කුටියෙ රික් හිටියා. කෙළවර කුටියෙ හිටියෙ සිගාමනී. මගේ රියදුරා නිදා ගත්තෙ සිගාමනී එක්කයි.

ප්‍රධාන නිවසෙ සාලයට විවෘත වෙන කාමර තුනක් තියෙනවා. පළවෙනි කාමරයෙ රොසානා. මැද කාමරයෙ නෝර්වේජියානු නික්. තුන්වෙනි කාමරයෙ හිටියෙ ගැටුම් නිරාකරණය පිළිබඳ ආචාර්ය උපාධියකට සූදනම් වෙමින් හිටිය බෙල්ජියානු සම්භවයක් තිබුණු මාගරීතයි. ඒ දවස්වල මාගරීතාගෙ සහෝදරියක් කෙටි නිවාඩුවකට ඇවිත් කියලා මගේ රියදුරා සරත් කියලා තිබුණා. ඒ වෙනකුරු මං එයාව දැකලා තිබුණෙ නෑ. දුරකථනය [illegible] කිරීමටත්, ඇඳුම් මැදීමටත් ඇරෙන්න සාලය පාවිච්චි වුණේ නෑ. සාලයෙන් විවරවෙන වීදුරු දෙරකින් පටු [illegible] ඇත්තෙ කුස්සිය. අනිත් පැත්තෙ ගබඩා කාමරයක්. ඒකෙත් යකඩ ඇඳක් දලා නිදන කාමරයක් හැටියට පාවිච්චි කළා. මගේ ඇඳුම් පැළඳුම් ඒකෙ තියෙනවා. [illegible] ඒකෙ නිදා ගන්න මං කැමති වුණේ නෑ. ඒක පාවිච්චි කළේ වරින්වර යාපනයෙන් හරි කොළඹින් හරි මාසෙකට දෙකකට වරක් එන අය තමයි.

[illegible]

කුස්සියෙ ජනේලය විවර වෙන්නෙ මිටි බිත්ති සහිත පෙළේ ඉස්තෝප්පුවකටයි. කෑම මේසයකුයි, පුටු හයකුයි, වේවැල් සැටියකුයි, ඇඳි පුටු තුනකුයි තිබුණු ඒ කොටස කෑම කාමරයත්, සාලයත්, හැටියට පාවිච්චි වුණා. ඒ ගෙදර දෙරවල් ඇරගෙන නිදගන්න පුළුවන් ආරක්ෂිත ගතියක් තිබුණත් ඒ කිලිනොච්චිය කියන එකත් අමතක වුණේ නැහැ.

ඒක අවිනිශ්චිත අනාගතය ගැන සැක සංකාවලින් පිරුණු බරක්. වේදනාවක්. මං වගේ මිනිහෙකුට එහෙම ශෝකී මහමෙරක් තියෙන්න පුළුවන් කියලා කවුරු පිළිගත්තත් මනෝරම්‍යා නං පිළිගන්නේ නැතුව ඇති.

"මේ වතාවෙ නං යුද්දෙ ඉවරයි කියලා රබන් ගහන්න, කැවුම් කිරිබත් කන්න වේලාසන වැඩියි. සාම පෙරකදෝරුවන්ම තමයි යුද්ධ පෙරකදෝරුවො වෙලා හිටියෙත්. දැන් සාම මාර්ගය බේර ගන්න වෙන්නෙ ඔය සාම පෙරකදෝරු කාක්කන්ගෙන් තමයි."

වතාවක් මනෝරම්‍යා පත්තරේකට ඔහොම කියලා තිබුණනෙ. උන්දැටත් ඔය කොයි කොයි කටයුතුවලිනුත් ආදායම් මාර්ග පෑදිලා තිබුණනෙ. එහෙම එකේ ඔය වගේ කතා කියන්නෙ මට වෙඩි තියන්නනෙ. මං එච්චර අවංක මිනිහෙක් නොවෙන්න පුළුවන්. ඒත් පාර්ලිමේන්තුවට වඩා පිටකොටුවෙ මාළු කඩේ පරිසරය යහපත් වෙන රටක අවංකකමේ ප්‍රමිතිය මොකද්ද කියලා තේරුම් ගන්න තරම් ප්‍රායෝගික නුවණක් නැති එකනෙ පුදුමෙ.

වර්ණාසි කසාද බැඳපු දවසෙම හිතුවා හැකිතාක් දුරට අවංක මිනිහෙක් වෙන්න. මගේ පුතා හොඳ මිනිහෙක් වෙනවා දකින්න ඕනකම දැනුණා. ඒත් තාම අපට දරු සම්පතක් නෑ. මං ඒ ගැන එච්චර හිතුවෙ නැතත් වර්ණාසි හිටියෙ එක පුතෙක් නෙමෙයි දූරු පුත්තු තුන් හතර දෙනෙක්වත් ලබා ගැනීමෙ බලාපොරොත්තුවෙන්. අවංකවීම ගැන නං කතා කරලා වැඩක් නෑ. ආණ්ඩුවෙන් යාන වාහන ලබන්නයි, පිටරට යන්නයි, වෙනත් ආදායම් මාර්ග පාද ගන්නයි, රජුන් තැනීමට කැපී පෙනෙන දායකත්වයක් දෙන්නයි සිද්ධ වෙනකොට අවංකවීම කොච්චර අමාරුද කියලා දන්නෙ ඒ සඳහා උත්සාහ කළ නර පණුවෙක්ම

විතරයි. ඒ මුකුත්ම නැති කාලෙත් එහෙම උත්සාහ නොකළම නෙවයිනෙ. ඒත් බැරි වෙනවට මොනවා කරන්න ද?

මගේ අවසාන කිලිනොච්චි රාත්‍රිය ආරම්භ වෙන මොහොතක මං නාන කාමරේට වෙලා සිංහල සින්දුවක් සිවුරුහන් කරමින් නෑවා. ඒ නාන කාමරේ ආලේප වර්ග, පිරිසිදු කිරීමේ උපකරණ, දත් බෙහෙත් එහෙම වෙන වෙනම එල්ලලා තිබුණා. ගෑනුන්ගෙ ඒවා අඳුන ගන්න පුළුවන් ඒවයෙ ආලේප වැඩි හින්දයි. ඇලනුයි, ජේම්සුයි දෙන්නම ව්‍යායාමෙටත් එක්ක බොලොක්ක ළිඳෙන් වතුර ඇදගෙන නාන නිසා ඒ දෙන්නගෙ ආලේප එතන තිබුණෙ නැහැ. රොසානා ගාන්නෙ මොනවද කියලා දන ගැනීමෙ තේරුමක් නැති උනත් එද මං එයාගෙයි කියලා හිතුණු රෝස පාට ප්ලාස්ටික් රඳවනයක තිබුණු ටියුබ්, බෝතල් සේරම සුවඳ බැලුවා. මං දන්නවා ඒක මහ බාල වැඩක් කියලා. ඒත් එවෙලෙ මං දන්නෙම නැතුව එහෙම වුණා. සමහර වෙලාවට මට එහෙම වෙනවා. මං කරන දේවල් හරියට වෙන කවුරු හරි කරනවා වගේ දැනෙනවා.

මං නාලා කොළ පාට සරමකුයි ගැලපෙන කහ පාට සැහැල්ලු තුනී කපු කමිසෙකුයි දාගෙන කොණ්ඩෙ අතින් ගසමින් තුවාය වැලට දාන්න යනකොට ජේම්ස්, ඇලන්, රික් එක්ක තව තිප දෙනෙක් විස්කි බොන්න පටන් අරගෙන තිබුණා. මාත් කොළඹින් ගෙනාපු බෝතලෙයි, කල් තියාගන්න පුළුවන් විදියට කරාබු නැටි ඔබලා, සාදික්කයි, ගම්මිරිසුයි දාල හොඳට රෝස් කරපු හීන් මස් පෙති ටින් එකයි අරගෙන ආවා. හැමෝම මං කිලිනොච්චි එනකල් බලා ඉන්නෙ කන බොන ජාති උස්සන් එන හින්දයි කියලා ජේම්ස්ලා විහිළුත් කරනව. ඒවා සේරම වර්ණාසි හින්ද තමයි. රොසානා කොන්ක්‍රීට් වහලෙ උඩ ඉන්නවා දැකපු නිසා මගේ හිත තිබුණෙ එතැනට යන්නයි. ඒත් එක පාරට දුවන්න බැහැනෙ. ඊට සතියකට කලින් වාර්ෂික නිවාඩුවට ලන්ඩනයටත්, ටොරන්ටෝවටත් ගිහින් ඇවිත් සන්තෝෂෙන් හිටිය ජේම්ස් ඒ විස්තර කියමින් පෙම්වතිය ගේ පින්තූර පෙන්නමින් හිටියා.

ඒ පෙම්වතීගෙ කතාව මාස දෙක තුනකට කලින් ජේම්ස් මටත්, රොසානාටත්, බිම් බෝම්බ නිෂ්ක්‍රීය ඉංජිනේරුවෙක් වෙච්චි ජිම් වෝටර්ෆීල්ඩ්ටත්, භූ ගර්භ විද්‍යාඥයෙක් වෙච්චි ස්ටීවන් නයිල්ස්ට්ටත් කිව්වා.

ඒක මහ පුදුම ... කෙල්ලෙක්ගෙ දෙමව්පියන්ට සල්ලි දීලා කෙල්ලව අවුරුදු පහකට ලංකාවට අරගෙන ආපු එක්සත් ජාතීන්ගෙ විශේෂඥයෙක් ගැන කියන්න බැරි වුණේ ඒක එහෙම වෙලා තිබුණා. බොරු වයසක් දාලා කසාද බැඳලා බිරිඳ හැටියට ගෙනත් තියෙන්නෙ. කෙල්ල ගෙදර වැඩට හිටි ගෑනියෙන් සිංහල ඉගෙන ගෙන. ආවට පස්සෙ අම්මගෙන් ලියුමක්වත්, ටෙලිෆෝන් පණිවිඩයක්වත් ලැබුණෙ නැතලු. අවුරුදු පහ ඉවර වෙනකොට ආපහු යන්න ඕන කියලා කෙල්ල රණ්ඩු වෙන්න ගත්තලු. අන්තිමට වැඩට හිටිය ගෑනු කෙනාගෙ නෑදෑ ඉන්ස්පෙක්ටර්යෙක් එක්ක පැනලා ගිහින්. ඒ මිනිහා කෙල්ලගෙ රත්තරං බඩුයි. හොරෙන් ගෙනාපු සල්ලියි ඉවර වුණාට පස්සෙ රණ්ඩු වෙන්න අරගෙන. කෙල්ල ජේම්ස්ට මුණ ගැහෙන්නෙ එතනිනුත් පැනලා ගිහින් කරපරින් කෝච්චියට නැගලා ටිකට් නැතුව කොළඹට එනකොටයි. මිනිහා කෙල්ලගෙ කතාව අහලා එයාව දෙහිවල ... නතර කරලා තිබිලා කටයුතු කරන්න කාන්තා ආයතනෙකට පවරලා ... තියලු. ඒ දවස්වල මිනිහට කොළඹට එන්න පුළුවන් වෙලා තියෙන්නෙ මාසෙකට දවසයි. කෙල්ලගෙ නඩුවට වියදම් කරන්න සල්ලි තිබිලත් නෑ. ඔය නැති වෙච්ච ප්‍රකට කලාකාරිය විනිසියා දුවෙයි හොම එක්සත් ජාතීන්ගෙ සංක්‍රමණික ආයතනයටයි වෙනත් තැන්වලටයි අභියාචනා ලියන්න උදව් කළාලු. නඩුවෙන් එයාට දික්කසාද වෙන්නත් වන්දි ලබා ගන්නත් පුළුවන් වුණා විතරක් නෙවෙයි රතු කුරුස සංවිධානය හරහා අම්මා හොයාගන්නත් පුළුවන් වෙලා තිබුණා. ඒත් කෙල්ල තදින් කියා හිටලා තියෙනවා අහිමි වෙච්ච අධ්‍යාපනය ලබා ගන්න ඕන කියලා. නෑදෑ කෙනෙක් කැනඩාවට පැනගෙන තිබුණු බව අම්මාගෙන් දැන ගත්තු නිසා කෙල්ල ඉල්ලලා තියෙන්නෙ කැනඩාවට යන්නයි. ජේම්ස් බොහොම හිතේ අමාරුවෙන් එයාව කටුනායකට බස්සවලා ඇවිත් පොඩි ළමයෙක් වගේ ඇඬුවලු. මං කලිනුත් කෙල්ලගෙ පින්තූර දැකලා තිබුණා. හරිම ලස්සනයි. ලංකාවෙ හරි ඉන්දියාවෙ හරි කෙල්ලෙක් වගෙයි.

"ඉතිං ඔයා ඔච්චර ආදරේ කරා නං ඇයි එයාට යන්න ඇරියෙ. ඇයි එයා එක්ක ගියෙ නැත්තෙ?" කියලා රොසානා ඇහුවා.

"එහෙ හොඳ රස්සාවක් හොයා ගන්න බැරි බව දන දනම යන්නෙ කොහොමද? එයා වයසින් බාල වුණාට මට වඩා ධෛර්යවන්තයි." කියලා එද කියපු ජේම්ස් මෙද කියමින් හිටියෙ ඒ පෙම්වතිට ටොරොන්ටෝවල පෙම්වතෙක් ලැබිලා ඒ මිනිහගෙන් දරුවෙකුත් ඉන්න කතාවක්.

"එයාට ඔන දරුවෙක් මිසක් අර මිනිහව බඳින්න නෙවෙයිලු." ජේම්ස් දරුවාගෙ පින්තූරත් පෙන්නුවෙ හරියට තමුන්ගෙන් ලැබිච්ච දරුවෙක්ගෙ පින්තූර පෙන්නනවා වගෙයි.

"මාත් ආසයි අන්න එහෙම කෙනෙක් මුණ ගැහෙන්න." ඇලන් හිනාවෙන්න ගත්තා.

"කොහෙද කිලිනොච්චියෙ ඉන්නකොට එහෙම වාසනාවක් නැහැනෙ." රික් චෙස් පුවරුව අරගෙන ඉත්තො සකස් කරන්න ගත්තා. මිනිහා ඒ වැඩේට මට කතා කරන්න කලින් නැගිටලා යන්න ඕන කියලා දැනුණා. ස්ටීවන් හිටිය කාලෙ නං හැමදම චෙස් අදින්නෙ ඒ දෙන්නා තමයි. ඒ වෙනකොට ස්ටීවන් ඉරාකයට ගිහින් තිබුණා. ජිම් ඇෆ්ගනිස්ථානයට ගියා. දෙන්නා වෙනුවෙන්ම කොළඹ තිබුණු සමුගැන්මේ සාදයේදී මං රොසානට අවවාදයක් දුන්නා.

"රොසානා ඔයා මේ රස්සාවෙ දිගටම ඉන්න එපා. ඉක්මනට ආපහු රෝමෙට ගිහින් අඩු පඩියකට හරි සාමාන්‍ය ජීවිතයක් පටන් ගත්තෙ නැත්තං ඔයාටත් වෙන්නෙ මේගොල්ලන්ට වෙන දේමයි. කවදවත් ආපහු සාමාන්‍ය ජීවිතේකට යන්න බැරි වෙනවා."

"කොහෙද සාෂා සාමාන්‍ය ජීවිත කියලා දේවල් තියෙන්නෙ? ස්ටීව් ඉරාකෙට යන්නයි මං කිලිනොච්චියෙ ඉන්නයි වුණේ කොතනදි හරි මනුස්සකමේ වැරදීමක් වෙලා තියෙනවා කියලා නේද?" ටිකක් බීලා හිටිය රොසානා කඩතොළු උච්චාරණයෙන් උනත් බරසාර කතා කියන්න ගත්තා.

එද තමයි මං "ඔයාගෙ සුවඳ දැනෙනවා" කියලා එයාගෙ බෙල්ල හරියට ඉව කරාම "සාෂා බල්ලෙක් වගේ ඉව කරන්න දන්නවා." කියලා ගෑනි මට හිනා වුණේ. ඒ අවස්ථාවෙ මගේ පරණ මිත්‍රයා හා දේශපාලන සගයා චන්දන හිරිකුඹුරයි තව කීප

දෙනෙකුයි හිටිය නිසා මං ඒකට හොඳටම හිනා වුණා. ඒත් මගෙ හිත තරහෙන් පිපිරෙන්න ආවා.

"යකෝ ගෑනුන්ට සෙවල කතා කියලා ඉව කරන්ඩ ගිහින් නිකං බ්ලාස් වෙන්ඩ එපා." කියලා එද චන්දනයා මට කිව්වා.

"හරි හරි ඔයිට වැඩිය කුමාරිකාවො අපිට බ්ලාස්වෙලා තියෙනවා. කවදු හරි ඕකි ලංකාවෙන් ගියාට පස්සෙ හරි අනේ සාෂා මගේ සුවඳ බලන්න කියලා කියවගෙන තමයි නවතින්නෙ. ආරම්භක කතා ඔහොම තමයි." කියලා කිව්වට ඒ වෙනකොටත් මං හිටියෙ ආරම්භක කතා ගැන පවා පරෙස්සමෙන්. ඇත්තටම මට මොකට ද රොසානලා? වර්ණාසි වගේ සුවිනීත භාර්යාවක් ඉන්නකොට මට මොකක්වත් ඕන නෑ තමයි. ඒ වුණාට මං දන්නෙත් නැති මළ පෙරේතයෙක් ඉඳගෙන මගෙ හිත කළඹනවනෙ.

කට්ටිය ගෑනු කතා නවත්තලා පිරිමි දේශපාලනයට මාරු වෙන්න ගත්තා. හැබැයි ඒ ලංකාවෙ දේශපාලනය නෙවෙයි. ඒ අවසරයෙන් මං මස්පෙති තසිමකුත් අරගෙන මිදුලට ගිහින් හෙමින් උඩට නැග්ගා.

"අයියෝ ඔයා මටත් මස් ගෙනාවද? මං දැන් නිර්මාංශ වෙලා ඉවරයි."

"හරි පුදුමයිනෙ. කොහොමද එහෙම වුණේ?"

"මෙහෙට එනකොටත් මාළු විතරයි කෑවෙ. දැං මට ඒකත් ඕන නෑ. මං ආසයි මෙහෙ කෑමට."

"මං හිතුවා උඩට වෙලා තනියෙම වයින් බොනවා ඇති කියලා."

"නෑ මාරිඅම්මත් හැමදම මට එළවළු සුප් හදලා යනවා. ඊට ගන්නෙ ඒකයි අඹයි, කෙසෙල්ලුයි විතරයි."

වතුර ටැංකියේ විදුලි පහනෙන් එළිය වැටුණෙ එයාගෙ මූණෙ පැත්තකට විතරයි. වහලෙ කොන්ක්‍රීට් එකෙන් උඩට මතු වුණු කම්බිකූරු අඩ අඳුරු පසුබිමේ තද කලු පාටට පෙනුණා. ඒ ගේ හදන්න ගන්නකොට උඩ තට්ටුවක් දලා ඒකෙ පදිංචි වෙන හැටි හීන මවපු අය අවුරුදු ගණනාවකින් කිලිනොච්චියට තියා

කොළඹටවත් ඇවිත් නැහැ. ඒ වුණාට ගෙයි මුල් සැලැස්ම ඇලන්ට දීල තිබුණෙ කොළඹ ඉන්න නෑදෑයෙක්. ගෙවල් කුලියෙන් අඩු කරගන්න විදියට උඩ තට්ටුව හදන්න කියලා ජිනීවාවල ඉන්න අයිතිකාරයා කියලා තියෙනවා. ඒක සිද්ධ වෙන්නෙ නැහැ. වෙන ඉඩමක් අරගෙන ජාත්‍යන්තර සංවිධානවල අය සඳහා වෙන වෙනම පුංචි ගෙවල් හදන්නයි ඇලන් බලාපොරොත්තු වෙන්නෙ. ජිනීවා ගිය මිනිස්සුත් පරණ ගෙදර ගැන බලාපොරොත්තු අත ඇරලා නැති එකේ තමිල්නාඩු අනාථ කඳවුරුවල ඉන්න මිනිස්සු ඊට වඩා කොච්චර අසරණ විදියට බලාපොරාත්තු තියාගෙන ඉන්නවා ඇද්ද? ඒත් හිතට එන දේවල් රොසානාට කියන්න ඒ කිට්ටුවෙන් වාඩි වෙන්න ගියොත් ඒක නිකං සෙවල ගතිය කියලා හිතන්න ඉඩ තියෙනවනෙ. වෙන ගෑනු නැතුවටයැ මේ සුද්දියන්ට බාල්දු වෙන්නෙ? ඒ වුණාට ඊට යටින් තිබුණෙ විශාල කැමැත්තක්. ඒක හරි භයානකයි. මං මගේ මදන යක්ෂ දඩයක්කාරයා හොඳට අඳුනනවනෙ.

"බෑග් එකේ කජු පැකට් එකක් ඇති. ඒකත් අරගෙන තව කවුරු හරි ඇඳගෙන එන්නං." කියාගෙන මං පහළට ආවෙ මස් තසිමත් අරගෙනයි.

කෙලින්ම ඇලන්ලා ඉන්න තැනට යන්නෙ නැතුව මගේ රියදුරා සරත් හිටි තැනට ගියා. කවුරු හරි බොලොක්ක ළිඳෙන් ඇදගෙන නානවා ඇහුණා. අරක්කු බොමින් යකඩ ඇඳ උඩ වාඩිවෙලා හිටි සරත් නැගිට්ටා.

"සර් කෑමට යනව ද?"

"තව ටිකකින් හතයි හතළිස් පහට විතර යමු." මං තසිම දුන්නම සරත්ගෙ මූණ ඒකාලෝක වුණා.

"අනේ අම්මපා සර් මේ මූනිච්චාවට කියනවා නෙවෙයි. සර්ටයි මැඩම්ටයි බුදු බව අත් වෙන්න ඕන."

ඒ පාර මට හොඳටම හිනා ගියා.

"ඇයි සරත්ට අරක්කු බොන්ඩ මස් දෙනවට ද?"

"අනේ එහෙම නෙවෙයි. මැඩම් හැමදම කියන්නෙ සරත්ටත් එක්කයි කෑම ජාති දන්නෙ.... සර්ට මතක නැති වුණොත් සර්ටත්

දීලා සරත්ගෙ පංගුවත් ගන්න සිංගෙයි දුන් සර්ට මතු නෑ උඩට වෙලා ඉතාලි මිසී එක්ක කයිය ගහගෙන ඉන්ඩ තිබුණානෙ. ඒත් මෙක මගේ ළඟට අරං ආවෙ මොකට ද? ඒක තමයි සර් මනුස්සකම කියන්නෙ. කොළඹදී නං සර් එහෙම එන්ඩ ඕන නැහැනේ. මේ එන්නෙ කිලිනොච්චිය හින්දනෙ."

"කෝ සිගාමනී?"

"නාන්ඩ ගියා. දැං ඌ ආහම අදත් ඔය මොකක් හරි පෙන්නයි. ඒකනෙ ඔය ලැප් ටොප් එක මෙතන තියලා ගියෙ. මං මේ කල්පනා කරන්නෙ අපිට ගහපු එව්වා සේරම ඔය විදියට වීඩියෝ කර ගන්නෙ කොහොමද කියලයි."

"මෙහෙදි ඕවා කතා කරන්න ඕන නෑ. ඔය සිංහල දන්නෙ නෑ වගේ හිටියට සිගාමනී සිංහල දන්නවා ඇති." මං පහත් හඬින් කිව්වා.

"ඒකත් වෙන්ඩ බැරි නෑ තමා. දැං ඔය මුවක් පොයින්ට් එකේ ඉන්න මිනිස්සුත් එහෙමනෙ. දන්නෙනම නෑ වගේ ඉඳලා පස්සෙ හොඳට කතා කරනවානෙ. සර්ට මතකද අපි 2008 විතර අර වීඩියෝ ටීම් එක ගෙනාපු වෙලාවෙ මාර විදියට ප්‍රශ්න කරානෙ. හොඳ වෙලාවට අපි ඌං ඉන්න තැන සිංහලෙන් බැන්නෙ නෑ."

සරත්ට අමතක වෙලා හඬ ටිකක් උස් වෙනකොට මං මගෑරලා ඇලන්ලා හිටි තැනට ගියා. රික් වෙස් අදින්න ඇලන් අල්ලාගෙන තිබුණා. සිගාමනී කොටින්ගෙ වීර ක්‍රියා අඩංගු කැසට් පටි ඇලන්ලටත් දෙනවා ඇද්ද? නැත්තං ඒ සරත් වගේ පියදුරන් සඳහා කැළඹුම් සහගතව කරන ප්‍රචාරක කටයුත්තක් ද? සිගාමනී කවදාවත් මට ඒවා පෙන්නන්න උත්සාහ කරලා නැහැනෙ. සිගාමනීට තියෙන්නේ බොහොම අහිංසක රවුම් මූහුණක්. හිනා වෙනකොට පොඩි ළමයෙක් වගෙයි. සමහර විට සිගාමනී එතන හාර කරන්න ඇත්තේ සුදු මිනිස්සුන්ගෙ කටයුතු නිරීක්ෂණය කරන්න වෙන්න ඇති. ඇලන්ලා තික්ලා ඒ වගේ දේවල් තේරෙන්නෙ නෑ වගේ ඉන්න දන්නවනෙ. එහෙම නැතුව අනුන්ගෙ රටක සැලුම්කාරී පසුබිමක ජීවත් වෙන්න ලේසි නැහැනෙ. ඇලන්ලට කොටි සංවිධානය එක්කත් අපිත් එක්කත් තියෙන්නෙ වෘත්තීය සබඳතා විතරයි. හෘදයාංගම මිත්‍ර බන්ධන නැහැනෙ. ශ්‍රී

ලංකාවෙ සේවා කාලය ඉවර වුණාම ඒගොල්ලො යන්ඩ යනවා. අපි වගේ තවත් අය වෙනත් රටවලදී මුණ ගැහෙනවා. අනාගත බලාපොරොත්තු සහිතව අපේ උනන්දුව නිසා පවත්වාගෙන යන විද්‍යුත් නැළැලකට වැඩි දෙයක් ඇති වෙන්නෙ කලාතුරකින්. රස්සාවක් කියන දෙය ඉක්මවා ගිය පරම පවිත්‍ර සාම ප්‍රයත්නයක් තියෙන කෙනෙක් මුණ ගැහෙන්න තව කාලයක් බලා ඉන්න වෙයි.

ඇලන් එක්ක රික් ඉතියෝපියාවෙ වැඩ කරලා තියෙනවා. වෙනත් නිවසක පදිංචි ඩයනා ඇලන් එක්ක වියට්නාමෙ එකට වැඩ කළා කියනවා. ඒ දෙන්නම ජේම්ස් එක්ක කාම්බෝජයෙත් වැඩ කරලා තියෙනවා. ඔය විදියට ඒ හැමෝම නොයෙකුත් ආකාරයට එකිනෙකා දැන අඳුනනවා. සමහර විට ඒ අයට අපේ කුවාලයේ වේදනාව දැනෙන්නෙ නැත්තෙ ඒ වගේ කුවාල ගණනාවක් දැකලා තියෙන නිසා වෙන්න ඇති. ඒ ගොල්ලන්ට අපේ ඉතිහාසයේ සුන්දරුවත් අපේ සාඩම්බරය පිළිබඳ හැඟීමවත් අපේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ කීප දෙනෙක් එකතුවෙලා ගනුදෙනු කරලා රජෙක් තැනීමට වැඩි දෙයක් නොවෙයි කියලාවත් දන්නෙ නැහැ.

මං තුන්වෙනි විස්කි වීදුරුවත් වක් කර ගත්තා. ජේම්ස් චිත්‍රපටියක් පෙන්නන්න කටයුතු සූදානම් කරමින් දකුණු පැත්තෙ බිත්තිය ළඟ තිරයක් එල්ලමින් හිටියා. මට හරි පාලුවක් දැනෙන්න ගත්තා. මාගරීතා රාබු අලයක් වගේ පෙරළීගෙන ඇවිත් යකඩ ඇඳ උඩ ඉඳ ගත්තා. ජේම්ස් එයාගෙ කුටිය පැත්තට යනවා පෙනුණා. බිම් බෝම්බ නිෂ්ක්‍රිය අංශයෙ වැඩ කරන සුද්දෙ කීප දෙනෙක් ඇවිත් අපට එකතු වුණා. සෙනසුරාදට කට්ටිය එන්නෙ චිත්‍රපටියක් බලන්න වුණාට රෑ කෑම ගැන සිසි සැලැස්මක් නැහැ. හැම වතාවෙම එහෙමයි. ඒ මිනිස්සුන්ට බඩගිනි වෙන්නෙ රෑ තාමයෙන් පස්සෙයි. මාරි අම්මත් පහ වෙනකොට පිටවෙන හින්ද කලින් ඇනවුම් කළේ නැත්නම් සුප් ටිකක්වත් නෑ. තම තමන්ට ඕන දේවල් හදාගෙන කන්නත් කම්මැලි හින්ද පානුයි, චීසුයි කනවා. පාන්වියත් අවන්හලෙන් රෝස් කරපු මස් හරි මාලු හරි ගෙන්න ගන්නවා. ඒ එක්ක අල බැදපුවත් ලැබෙනවා. අමු තක්කාලිත් එකතු කර ගත්තම ඒ ගොල්ලන්ගෙ රාත්‍රී භෝජනය සම්පූර්ණ වෙනවා.

කුස්සියෙ කවුද ගෑනු පරාණයක් මොනවා හරි කරමින් ඉන්නවා පෙනුණා. ගෑනිගෙ මූණ පෙනුණෙ නැහැ. රත්වන් කොණ්ඩයක් පිටිපස්සට කරලා ගැට ගහලා තිබුණා. හීන් පටි දාපු සුදු හැට්ට කැල්ලක් ඇඳගෙන හිටි ඒ ගෑනිගෙ අත් ගොබ බර ඉසිලීමේ ව්‍යායාම කරන පිරිමියෙක්ගෙ වගේ ඉලිප්පිලා තිබුණා.

"මස් ගන්න. අපේ ගෙදරින් ගෙනාවෙ." මං මාගරීතාට කිව්වා.

"ඔව් මේගොල්ලො ඊයෙ කිව්වා ඔයා එනවා නං අපිට මොනවා හරි ගෙනෙයි කියලා."

එතකොටම කුස්සියෙ හිටි ගෑනිත් පිටතට ආවා. එයා වීස් කැල්ලක් කමින් සුදු වයින් බොමින් අපි ළඟට ආවා.

"සාෂා මේ මගෙ අක්කා පෝලා. මේ සාෂා. මෙයා අඳුනන්නෙ නැති කෙනෙක් ලංකාවෙ නැතුව ඇති." මාගරීතා මං ගැන හිතාගෙන ඉන්නෙ එහෙමයි කියලා මං ඒ වෙනකල් දැනගෙන හිටියෙ නැහැ. ගෑනිට මූණ ගැහෙන්න ඕන වෙච්චි ඇමතිවරු කීප දෙනෙක්, මහාචාර්යවරු දෙතුන් දෙනෙක්, යුද විරෝධී කණ්ඩායම්වල ප්‍රමුඛයන්ගෙ ලැයිස්තුවක් ලබාදීම වගේ වැඩ ටිකක් හැර මගෙන් වෙන කිසි උදව්වක් වෙලා තිබුණෙ නැහැ.

පෝලා අත දිගු කළා. අත්ල සිනිඳු වුණාට අල්ලා ගැනීම දැඩියි. ඇඟිලි දිගයි. පැලැටිග්නම් මුද්දක් දාලා තිබුණා. දකුණු බාහුවෙ පුංචි කලු පච්චයක් කොටලා. අක්කාගෙයි නංගිගෙයි පොදු දෙයකට තිබුණෙ අළු - නිල් ඇස් හා රත්වන් හිසකෙස් විතරයි. පෝලා පුටුවක ඉඳගෙන කකුල්දෙක උඩට ගත්තා. නියපොතුවල සායම් ගාලා තිබුණෙ නෑ. සුදු දිග කලිසම ඇඟට හිරවෙලා තිබුණු නිසා ප්‍රදර්ශනයක තියෙන මූර්තියක් වගේ පෙනුණා.

"ඔය මාගරීතා බොරු කියන්නෙ. මං එච්චර වැදගත් කෙනෙක් නෙවෙයි."

"මේ සාෂාගෙ ගෙදරින් එවපුවා."

"ගන්න" මං තසිම පෑවා.

"ස්තූතියි මිරිස් වැඩිනං මට කන්න බැරි වෙයි." පෝලා තසිම අතටත් අරගෙන දෙගිඩියාවෙන් බලා හිටියා.

"මිරිස් දන්නෙ නෑ මෙහාට ගේන ඒවාට. ගම්මිරිසුත් යාන්තමට දන්නෙ. ගිය මාසෙ අපෙ ගෙදර රෑ කෑමට ඇවිත් මාගරීතලා මූණ රතු කරගෙන පොල් සම්බෝල කාලා බැලුවා."

"ඒක මේ පොල්වලින් හදන කෑමක්" මාගරීතා අක්කට විස්තර කරන්න පටන් අරගෙන හිනාවෙන්න ගත්තා.

"ඉතුරු ටිකත් කියන්න." ඇලන් කතාවට එකතු වුණා.

"මට මූණ රතු වෙලා කඳුළු ආවා. ඒ පාර අයිස්ක්‍රීම් එක්ක ඉඳි ආප්ප කෑවා."

"මෙයා වෙන්නැති ලෝකෙ පළවෙනියාට අයිස්ක්‍රීම් එක්ක ඉඳි ආප්ප කෑවේ." වෙන කතා කරන්න දෙයකුත් නැති නිසා මාත් මාගරීතට විහිළු කරන් ගත්තා. මට ඕන වුණේ "අන්න ඕගොල්ලො එනකල් රොසානා වහලෙ උඩ බලාගෙන ඉන්නවා." කියන්නයි. ඒත් ඇලන්ලා ඉදිරියෙ ඒ ගෑනු දෙන්නත් ඉස්සර කරගෙන උඩට නගින්න උනන්දුවක් පෙන්නන්න නරකයිනෙ.

මං නැගිටලා කාමරේට ගිහින් කජු පැකට් එක අරගෙන ආවා.

"රොසානට කජු ටිකක් දෙන්න පොරොන්දු වුණා. එනවද උඩට යන්න." කියලා මං ඇහුවෙ පොදුවේ කාටත් කියනවා වගෙයි.

"අපි තව ටිකකින් එන්නං" මාගරීතා කිව්වා.

ඒ අවසරයෙන් මං ආයෙත් උඩට ගියා.

"ඔන්න මං මාගරීතලට කතා කරා. තව ටිකකින් එනවා කිව්වා. මං මේ ආවෙ කජු ටිකක් දීලා යන්න."

"ස්තූතියි. මං මේ තරු කියවන්න හදනවා."

මගේ හිත ගිය ලංකාවෙ ගෑනියෙක් එහෙම කිව්වා නං මං උත්තර දෙන්නෙ "කණ්ණාඩියක් ළඟට ගිහින් ඔයාගෙ මූණ බලන්න. එතකොට තාරුකා දෙකක දීප්තිය පෙනෙයිනෙ" කියලයි.

"මාත් තරු කියවන්න ඕන." කියලා මං වහලෙ අනිත් කොණට ගියා. එවෙලෙ මට මොකද්දෝ තරහාවක් මතු වෙන්න ගත්තා. "තොපි හිතනවා නං මං තොපේ සල්ලිවලට යටයි කියලා

ඒක වැරදියි. මට ගෑනු ඕන තරං හොඳ පුරුෂයා දැනටත් මගේ ස්ත්‍රී පුතිපදව දන දැනත් මා එක්ක බුදියන්ඩ කැමති එවුං ඕන තරං. මට ගෑනු ඕනෙත් නෑ. මේ කිසි දෙයක් ඕනෙත් නෑ. මාත් ආසයි සාමාන්‍ය මිනිහෙක් වෙන්න. මගේ ගෑනි මං ගැන හිතන විදියෙම මිනිහෙක් වෙන්න මං කැමතියි. ඒ වුණාට මේ කාලෙ ගමක උප්පත් නොයිරාළ කෙනෙකුටවත් සාමාන්‍ය ජීවිතයක් නෑ. රටේ ජනාධිපතිතුමාත් ශ්‍රීමත් තිරකාරයෙක්. ඉතිං වේසිගෙ පුත්තුමත් මං කොහොමද සාමාන්‍ය මිනිහෙක් වෙන්නෙ. මේ වහලෙ උඩ ගෑනියෙක් තනියෙං ඉන්න එක ගැන තකන්නෙ නැතුව මගේ පාඩුවෙ ඉන්ඩ මට බැරිවෙන්නෙ මාත් මේ සිස්ටම් එකේ හිර වෙච්ච බල්ලෙක් හින්දද? මං අහන්නෙ එච්චරයි වේසිගෙ පුත්තුතේ.... සමාවෙන්ඩ වේසියෙකුට පුත්තු ඉන්ඩ නං වේස මිනිස්සුත් ඉන්ඩ එපායැ. ඒ වුණාට ඒකට පුරුෂලිංග පදයක් නෑ. එහෙමයි කියලා ඒ වැඩේම කරන මිනිස්සු නැද්ද? පාර්ලිමේන්තුවෙ ඉන්න ගෙම්බො ටික කරන්නෙ ඒක නෙවෙයිද මං අහන්නෙ."

මං දන්නෙම නැතුව ශබ්ද නඟලා කතා කරමින් හිටියා. ඒවා අහසෙ තරුවලට මිසක් රොසානාට ඇහෙන්න කියපුවා වෙන්න බැහැනෙ.

"ඔයා දෙමළෙන් ද තරු ගැන කියන්නෙ?"

රොසානා නැගිටලා ළඟට ආවා. වහලෙ පහුකරගෙන යමින් තිබුණු කොහොඹ ගහ හුළඟට නැලවෙන්න ගත්තෙ රොසානගෙ විලවුන්වල හීන් සුවඳත් මා වෙට් ඔතමින්. ඒ දෙමළ නෙවෙයි සිංහල කියලා කියන්න මට හිතුණේ නැහැ. කිලිනොච්චියෙ සුද්දියෙකුට දෙමළයි සිංහලයි අතර වෙනස පහදා දෙන්න තැත් කිරීම නිෂ්ඵලයිනෙ. මං වාංගා, පෝංගා, සාප්පුඩුංග, තන්නි, වේනුම්, උක්කාරුංග වගේ දෙමළ වචන ටිකක් දැනගෙන හිටියා. ඊට වැඩිය දෙමළ ඉගෙන ගන්න බැරි වුණාට සමහර අවස්ථාවල කොළ බලාගෙන දෙමළෙන් කතා පවත්තනවා රොසානා දැකලා තිබුණා. ඒ වගේ අවස්ථාවල මං කරන්නේ ආරම්භක වාක්‍ය දෙකයි අවසාන වාක්‍යයි කට පාඩම් කර ගැනීමයි. මැද කොටසේදි වරින් වර සභාව දිහා බලලා ආංගික අභිනය පෑමයි විතරයි. ඒ ක්‍රමය සෑහෙන්න සාර්ථකයි. මං දෙමළ දන්නෙත් නැති නොදන්නෙමත්

නැති කෙනෙක් බව වටහා ගන්න ඇත්තේ කැඩිච්ච දෙමළ වගේම සිංහලත් කතා කරන ජේම්ස් විතරයි.

"ඔයා දෙමළ දන්නවද රොසානා?"

"මෙහෙ දිගටම ඉන්නවා නං දෙමළ ඉගෙන ගන්න තිබුණා. ලබන අවුරුද්දෙ මං ඇල්ජීරියාවට යන්නයි ඉන්නෙ. ආයෙ කවද ශ්‍රී ලංකාවට එයිද දන්නෙ නෑනෙ."

"මං ඔයාට සිංහල කියලා දෙන්නද ඇල්ජීරියාවට ගියාම කාට හරි බනින්න."

"ඔයාට ටිකක් බීලා වැඩිවෙලා වගෙයි. තව රෑ වෙන්න කලින් කන්න යන්න. වෙනදටත් ඔයා කලින් යනවනෙ."

"පිස්සු. මං ඔය වීදුරු තුනකට මත් වෙන මිනිහෙක් නෙවෙයි. දැන් මට ඇල්ජීරියාවට යන්න උනොත් මගේ හිතේ අමාරුවක් කෑ ගහලා හඳට කියන්න තරුවලට කියන්න සිංහල තමයි තෝර ගන්නෙ. ඇල්ජීරියාවෙ මිනිස්සු සිංහල දන්නෙ නැති වුණාට හඳයි තරුයි සිංහල දන්නවා. එතකොට කොළඹදි කාට හරි බනින්න හිතුණොත් ඇල්ජීරියාවෙ භාෂාවෙන් බනින එක හොඳයි සිංහලෙන් හරි ඉංග්‍රීසියෙන හරි බනිනවට වඩා."

"ඇලජීරියාවෙ මිනිස්සු කතා කරන්නෙ අරාබියි, ප්‍රංශයි." රොසානා මිහිරියට හිනා වුණා.

"අපෝ එහෙනං බෑ. ලංකාවෙ අරාබි භාෂාව දන්න එවුං විතරක් නෙවෙයි තාත්තලා නැති අරාබි ළමයි හිටං ඉන්නවා. මෝස්තරේට ප්‍රංශ ඉගෙන ගන්න එවුනුත් ඉන්නවා. මගේ නැන්දම්මත් එක කාලෙක ප්‍රංශ ඉගෙන ගත්තා. එයා හිතන්නෙ මං මහ එපා කරපු මිනිහෙක් කියලා."

"ඉතිං ඔයා එහෙම නෙවෙයි ද?" රොසානා ලොකු හිනාවකින් ඇහුවා.

ලොකු හිනාව මට පෙනුණෙ නෑ. දැනුණා. ඒ පාර සීරුවෙන් හිට ගන්නට තැත් කරමින් හිටිය යකා පහසුවෙන් හිට ගත්තා. එහෙම වෙලාවට මගේ මොළයට විදුලි දහරක් වැදෙනවා වගේ වෙනවා. එතකොට සේරම අනිත් පැත්ත කැරකෙනවා. එහෙම

මනෝරමෘා තමයි [illegible] උගන්නන්න අහන්න කියලා මනෝරමෘා තමයි කිසි දෙයක් දන්නෙ නෑ වගේ අර ඇත්තේ. ඒක තමයි ගෑනි කිසි දෙයක් දන්නෙ නෑ වගේ අර ඇත්තේ. ඒක තමයි ගෑනි අහම්න් මනෝරමෘාගෙ නම තියෙන පත්තර අංගුලිමාල කතාවක් අහමින් මනෝරමෘාගෙ නම තියෙන පත්තර කෑල්ල පෙන්නුවෙ. ඔය ගෑනු ගෑනු කොහෙදි හරි මූණ ගැහිලා අඳුන ගන්න බැරි නැහැනෙ. පිටතින් බොහොම සන්සුන්ව ඉන්නකොටත් අනංගයාත්, මදනයකාත්, මහ සෝනත් මගේ ශරීරය ග්‍රහණය කර ගන්නෙ එකටමයි කියලා මං අත්දැකීමෙන් දැනගෙන හිටියා. ඒ වෙලාවට වඩාත්ම සුදුසු දේ ගොළුවීමයි. වර්ණාසි තං මං ගොළු වෙච්චි වෙලාවට ප්‍රශ්න අහන්නෙ කරදර කරන්නෙ නැහැ. ඒ හින්දා එයා මගේ යකා දකින්නෙ සරත්ට හරි වෙන කාට හරි කඩා පනින කොට විතරයි.

"ඔහොම කරන්න එපා රත්තරනෙ." මං සන්සුන් වෙලා විහිළු කරන විනෝද කතා කියන තත්ත්වෙට ආවම එයා කියනවා.

"එහෙම වෙන්න මාත් කැමති නෑ. ඒත් එහෙම වෙන එක නවත්ත ගන්න බෑ. ඔයා දන්නෙ නැති ඔයාට තියා ගහකට ගලකටවත් කියන්න බැරි දේවලවලින් මගේ පපුව හිරවෙලා, ලේ දූෂිත වෙලා. එහෙම තියෙද්දිත් මං මේ තරම් සාර්ථක මිනිහෙක් වුණේ හරි අමාරුවෙන්. ඒ අමාරුව-පිට වෙන්න ඕන දුක මං මකලා දලා තියෙන්නෙ. ඒ වෙනුවට විශාල තරහක් එන්නෙ මං දන්නෙත් නැතුවමයි. ඒ තරහව නැතුව මට පවතින්න බෑ."

ඒ වගේ දිග උත්තර හිතට ආවට මං ඒවා පිට කරන්නෙ නෑ.

"එහෙම නොකර පවතින්න බෑ" කියලා විතරයි මං එයාට කියන්නෙ. හිතට තරහක් ආවම නිශ්ශබ්ද වෙන්න කියලා මට ඉගැන්නුවෙත් එයා තමයි.

මාගරීතලා උඩට ආවා.

"මං කන්න යනවා." කියාගෙන පහළට බැස්සා. ඔලුවට විස දුමක් වැදිලා වගේ වෙච්චි වෙලාවට ගෑනු ගොඩේ ඉන්න තරකයි. මගේ අතින් නුසුදුසු දෙයක් කියවෙන්න පුළුවන්. ලංකාවෙ ගෑනු වගේ නෙවෙයිනෙ. සුද්දියො හරි භයානකයි. උන් පැමිණිලි කරන්ඩ ඉඩ තියෙනවා අසභ්‍ය කතා කිව්වය කියලා.

බහින අතරමයි.

මෙන්න යකෝ වැඩක්! අපි පිට වෙන්න හදන කොට පෝලාත් දුවගෙන ආවා.

"විනාඩියක් ඉන්න. මාත් එනවා."

ඉතිං ඒ ගෑනිව දලා යන්ඩයැ. විනාඩිය ඉස්සර කාලෙ ගංවල ගෑනු ගෙදරට අඳින බොඩියක් වගේ වියතේ උඩ ඇඳුම් කෑල්ල වැහෙන්න කහ පාට මල් පිරුණු බ්ලවුස් එකක් ද ගන්න. ඒකෙ බොත්තම් දලා තිබුණේ නෑ. කිලිනොච්චියෙදි එහෙම ඇඟ වහ ගන්න ඕන කියලා මාගරිතා උපදෙස් දෙන්න ඇති.

"මුන්ට කන්ඩ අරං දීලා වැඩක් නෑ. එයාර්පෝර්ට් එකට යන්ඩත් කලින් මුන්ට අපේ නං ගං මතක නැති වෙනවා." මං සරත්ට සිංහලෙන් කිව්වා.

"ඒව නං එහෙම තමයි.... සර්. ඒ වුණාට ඉඳ හිට ඔය බීච් බෝයිස්ලාවත් අරං යන සුද්දෙ සුද්දියො ඉන්නෙ." සරත්ගෙ කතාවට කෝප වෙන්න දෙයක් නැති වුණත් මගේ ඇඟ වෙව්ලන්න ගත්තා. වර්ණාසි කියලා තියෙන්නෙ කාට හරි කඩා පනින්න කලින් එකේ ඉඳල සියයට ගණන් කරන්න කියලයි. මං හයියෙන් දෙමළෙන් ගනින්න ගත්තා.

"ඔයා මොනවද කියන්න?" පෝලාගෙ ප්‍රශ්නෙට උත්තර නොදී මං දිගටම ගණන් කරා.

"සර් දෙමළෙන් ගණන් කරන්න ඉගෙන ගන්නවා." සරත් ඉංග්‍රීසියෙන් කිව්වා.

"මං කවියක් කියනවා කියලනෙ කියන්ඩ තිබුණෙ.... බූරුවා.."

"එහෙනං සර් එහෙම කියන්ඩ ද?"

මං උත්තර දුන්නෙ නෑ. සරත් වහාම නිශ්ශබ්ද වුණා.

වීදි අඳුරෙ තියෙන්නෙ ඇඳිරි නීතිය පනවලා හින්ද නෙවෙයිනෙ. කිලිනොච්චියෙ මිනිස්සු දීර්ඝ කාලයක් ඒ නායින් පාරෙ රාත්‍රී අන්ධකාරයට හුරුවෙලා හින්ද කවද හරි සාමයත් එක්ක විදුලි ආලෝකයත් ආවොත් මිනිස්සු රෑට කානිවල් එකකට

[illegible] එයි. අඳුරු රාත්‍රිවලම හැඳිලා [illegible] එනවා වගේ [illegible] තවදවත් වව්නියාවට ගිහිං හැබෑ [illegible] දෙයක් වෙයි. කොළඹ ළමයෙක් ඩිස්නිලන්තයට ගියා වගේ තියෙයි. කිලිනොච්චියෙ ළමයෙකුට කඩවල්වල තියෙන් එළි දැක්කම. පුරාම කාලෙ අපේ සංවිධානයෙන් හදපු කඳවුරුවල ජෙනරේටර් දලා ලයිට් පත්තු කරාමත් ළමයි විශ්මයෙන් බලා හිටියා කියලා ඇලන් කිව්වා. පාන්ඩියන් අවන්හල නං ජෙනරේටරයෙන් ආලෝකමත් වෙලා තිබුණෙ කොළඹ තෝසෙ කඩයක් වගෙයි. පෝලා ඇතුළුවෙන තැනම වීදුරු පෙට්ටිවල තිබුණු වර්ණවත් මස්කට්, ඉන්දියානු රසකැවිලි. රතට හුරු පැණි වළලු හෙම තරඹත්ත නහර වුණා.

"කාලා ඉවරවෙලා ඕවා බලන්න. දැං ඉක්මනට කෑම ඉල්ලුවෙ නැත්තං ඉවර වෙයි." ඒ වෙලාවෙත් හිත ඇතුළෙ මොකක්දෝ තරහක් තිබුණත් මගේ ස්වරය ළදරු සබන් දැන්වීමකට හඬ කවන සෞම්‍ය ගතියකට මාරුවෙලා තිබුණා. ගෑනු ඒ නැළවිල්ලට ප්‍රියයි. ඒත් රොසානා මට කියලා තිබුණෙ "මොකද, මේ නාට්‍යයක ජූලියට්ට රඟපානවද?" කියලයි. පර බැල්ලියො. රෝමියෝට රඟ පානවද කියලා ඇහුවා නං ඒකත් එකක්. ජූලියට්ට?

නිකං මරියතුමී වගේ ඉඳගෙන එහෙව් කතා කියන එකේ මං මොන දේකට ඒ ගෑනිට කැමතිද කියලා මං දන්නෙ නෑ. ඇල්ජීරියාවට යන්ඩ කලින් රෝමියෝට රඟපාලා පෙන්නන්නංකො. ගියාට පස්සෙ නං බය නැතුව ඊමේල් එකක් යවන්න පුළුවන් "මට ඔයා මතක් වෙනවා. ඔයා ඉන්න තැනකට මාව ගෙන්න ගන්න" කියලා.

මං පෝලාගේ අතින් ඇදගෙන ගිහිං පුටුවකුත් ඇදලා වාඩි කෙරෙව්වා. සරත් වෙනම වාඩි වුණා. පෝලාට මෙනු පත පරීක්ෂා කරන්න ඉඩ ඇරලා මං අත හෝදන්න ගියා. විශාල පේපර් තෝසෙ එකක් අරගෙන ආ චාල්ස් මාව අඳුනගෙන හිනා වුණා. මිනිහා 2004 විතර ඉඳලා පාන්ඩියන් එකේ වැඩ කරනවා. ලී කකුලක් දලා හිටියත් කෑම පිඟන් තියා ගත්තු බන්දේසි උස්සගෙන කඩිසර ගතියෙන් එහාට මෙහාට යනවා.

දිග සායකුත් සැහැල්ලු කමිසයකුත් ඇඳලා හිටි මැදිවියේ

ගෑනියෙක් දහ දෙනෙක්ගෙ විතර පවුල් කණ්ඩායමක් කෑම කනවා වීඩියෝ කරමින් හිටියා. ඇඳුමෙනුත්, හැසිරීමෙනුත්, කොට්ට කැපූ කොණ්ඩයෙනුත් පේන්නෙ පිටරටක පදිංචි බවයි. කිලිනොච්චියෙ පවුලක් එතරම් ලොකු ආහාර වේලක් බුදින්න පාන්ඩියන් එකට එන්නෙ එහෙම සල්ලි තියෙන ඥාතියෙක් ආ වෙලාවට වෙන්න ඇති. කුඹුරුවල බිම් බෝම්බ නිසා හුඟ දෙනෙක් ජීවත් වුණේ කැනඩාවෙන්, යුරෝපයෙන්, ඇමරිකාවෙන්, එංගලන්තෙන්, ඕස්ට්‍රේලියාවෙන් හෙම එන ඩොලර්වලින්. ඒත් ඒ මිනිස්සු වියදම් කළේ අරපරෙස්සමින්. යුද්දෙ මැද උනත් රත්තරං බඩු හද ගැනීම නැවැත්තුවෙ නෑ. ඒ ආභරණ අගයටම නෙවෙයි ඉතුරු කිරීම හැටියට වෙන්න ඇති.

තනි තනිවත් කාණ්ඩ වශයෙනුත් කෑම කාපු පිරිමි හුඟාක් හිටියා. වැඩි දෙනෙක් සුදු ඇඳලා. ඒ මිනිස්සු නං කිලිනොච්චියෙ පදිංචිකාරයොද නැත්නම් කොහෙන් හරි ආවද කියලා හිතා ගන්න බැරි වුණා.

"මේ කෑම තෝරන්න මට දන්නෙ නෑ. වැඩිය මිරිස් නැති දෙයක් තෝරලා දෙන්නකො." පෝලා අනිත් මිනිස්සුන්ට ගෙනෙන දේවල් දැක ගන්න වටපිට බැලුවා.

"අපි පිට්ටු කමු. ඔයාට මාළු කිරි හොඳි. මට මිරිසට උයපු මාළුයි පොල් කිරියි."

"අර සරත්ට ගෙනාවෙ මොනවද?"

"ඒවාට තමයි ඉදිආප්පම් කියන්නෙ. ඔයාට ආසනං ඒවා ගේන්න කියන්නං. හැබැයි මෙහෙ එකක් කොළඹ ඉදිආප්ප පහක් විතර ලොකුයි. බරයි. ඒ හින්ද ඔයාට දෙකක් කෑවොත් පිට්ටු කන්න බැරි වෙයි."

මං පෝලාට පිට්ටු හදන හැටි කියන්න ගත්තා. මගේ භාර්යාව බොහොම රසට කුරක්කන් පිට්ටු හදලා මට කවනවා කියලා කියන්න නං හිත දුන්නෙ නෑ. ඒ වෙලාවෙ වර්ණාසියි, මනෝරම්‍යායි දෙන්නත් රෑට කනවා ඇති. මනෝරම්‍යාත් කුරක්කන් පිට්ටුවලට හාල් පිට්ටුවලට හෙම ආසයිනෙ. මං නැති දවසට නං ගෑනි අපේ ගෙදරින් කනවා ඇති.

කිලිනොච්චියෙ රාත්‍රියකට පෝලා තරක නෑ කියලා හිතෙන්නෙ ගත්තෙ මං ඒ සූප ශාස්ත්‍ර පාඩම දෙන වෙලාවෙ තමයි. ඒත් මෝඩයෙක් වගේ කලබල වෙන්න තරමට පිස්සුවක් තිබුණෙ නෑ.

"මේ යුද්දෙ ඇති වෙන්න කලින් මෙහෙ සිංහල මිනිස්සු හිටියද?"

"මොකද නැත්තෙ... ඉස්සර යාපනේ හිටං සේරම බේකරි තිබුණෙ සිංහල මිනිස්සුන්ට. දෙමළ මිනිස්සුන්ට ලංකාවෙ ඕන තැනක ඉන්න පුළුවන් වගේම සිංහල මිනිස්සුන්ටත් මෙහෙ ඉන්න පුළුවන් වෙන්න ඕන."

"දෙමළ මිනිස්සුන්ට කොළඹ උනත් ප්‍රශ්න තියෙනවනෙ."

"අනේ පෝලා අපි මේ කෑම කන වෙලාව ඔය ජාතියෙ කතා නැතුව මස්කට්, කිරිහොදි වගේ දේවල් ගැන කතා කරමු. එහෙම නැත්තං ඔයාගෙ රට ගැන ඔයාගෙ ගෙදර ගැන කතා කරමු. එහෙමත් නැත්තං රෝසමල් ගැන, කවි ගැන, චොක්ලට් කේක් ගැන, බෝර්ඩෝ - බර්ගන්ඩි ෂැම්පේන් ගැන කතා කරමු."

මං ගෑනිගෙ ඇස් දෙක දිහා එක එල්ලෙ බලලා හිනා වුණා. ඒක මදන යකාගෙ මිසක් වර්ණාසිගෙ ස්වාමි පුරුෂයාට ගැලපෙන හිනාවක් නෙවෙයි. කිසිම වගකීමක් බැඳීමක් නැතුව පාලු කපන්න කවුරු හරි උවමනා වෙන දුර රටකදි ඒ ගතිය වැඩියි. කිලිනොච්චියත් දුර රටක් තමයි.

"ඔයා ලස්සනට කතා කරන්න දන්නවා. ඒ වුණාට මේ වේටර්ලා ඔක්කොම ලී කකුල්වලින් ඇවිදිනවා පේනකොට පාන්ඩියන් එක කොළඹ හිල්ටන් එක වගේ වෙන්න තව කල් යයි."

මට කිසිම බරපතල සාකච්ඡාවකට යන්නවත් උවමනාවක් මගේ උගත්කම පෙන්නා දීමේ උවමනාවක්වත් තිබුණෙ නැහැ.

"ඒක ඉක්මන් කරන්නවත් ප්‍රමාද කරන්නවත් ඔයාටයි මටයි බෑ. ඔයා බ්‍රසල්ස්වල මොනවද කරන්නෙ කියන්න. ඔයාගෙ ජීවිතේ සතුටුම රෑ කෑම ගැන කියන්න. මං අද දවසම ටී. ආර්. ඕ. එකයි ඇලන්ලා එක්කයි කතා කරලා මහන්සිවෙලා ඉන්නෙ."

"මං ඉන්නෙ බ්‍රසල්ස්වල නෙවෙයි. අවුරුදු දහ නමය වෙනකොට මං පැරිසියට ගියා. හෝටලේක පිඟන් හේදුවා. රෑට තියටර් එකක ටිකට් වික්කුණුවා. ඉරිදට හෝටලේක සිංදු කියන කණ්ඩායමකට එකතු වුණා. ඔය අතර ඉගෙන ගන්නත් හැදුවා. අවුරුදු විසි හතර වෙනකොට පින්ලන්තෙට ගියා. එහෙ පුංචි ගමක පුංචි ඉස්කෝලෙක ප්‍රංශ ඉගැන්නුවා. දූං සවුදියේ ප්‍රංශ උගන්නනවා. අවුරුදු පහක්ම එහෙ. දැන් නං ඇති."

"ඔයා දැක්කම මට නිකමටවත් හිතුණෙ නෑ ගුරුවරියක් කියලා."

"තව ටික කලක් හිටියොත් මං කාන්තාරෙක පතොක් ගහක් වගේ වෙයි. ලංකාවෙ මොකක් හරි ලැබුණොත් ලබන අවුරුද්දෙ ආයෙත් අත්සන් කරන්නෙ නැතුව මෙහෙ ඉන්න පුළුවන්. මං ඇලන්ටත් කිව්වා මොනවා හරි බලන්න කියලා."

පෝලාට රස්සාවක් හොයා ගන්න එච්චර අමාරුවක් නැති බව දැනගෙන හිටියත් කොළඹ ගියාට පස්සෙ මං ඒ ගැන කිසි උත්සාහයක් නොගන්න බව විශ්වාස උනත් මදනයකාට පොටක් පෑදිලා තිබුණා.

"මට සී. වී. එකක් දෙන්නකො."

"ඔය ඇත්තම ද? ඔයාට පුළුවන් වෙයිද මොනවා හරි කරන්න."

ගෑනිගෙ ඇස් දීප්තිමත් වුණා.

"උත්සාහ කරලා බලන්නං."

"මාගරීතා කිව්වා ඔයාට නං පුළුවන් වෙයි කියලා."

ඒ රාත්‍රී ආහාරයේ අවශ්‍යතාව ඒ වගේ ව්‍යාපෘතියක උපක්‍රමයක් ද? ඒත් සුදු ගෑනු එහෙම ක්‍රමෝපායන් යොදන්නෙ නෑ. සෘජුව කතා කරනවා. මං කොච්චර තරහෙන් හිටියත් මගේ නැන්දම්මත් එහෙම තමයි. කාටවත් වාටු කතා කියලා ඵල ප්‍රයෝජන ගන්න හදන්නෙ නෑ. මං හිතන්නෙ ඒක එයාගෙ මෝඩකමක් කියලයි. උන්දෑ නං හිතනවා ඇත්තෙ ඒක ප්‍රතිපත්ති ගරුක භාවය කියලයි. කිලිනොච්චියෙදි ගෑනියෙක් එක්ක රෑ කෑම කනකොට

මේසෙට යටින් දෙපාරක්ම මගේ කකුල වැරදීමකින් ඒ ගෑනිගෙ කකුලෙ වැදිලා තියෙන වෙලාවෙත් මනෝරම්‍යා මතක්වීම නං මහ කාලකණ්ණි කමක්. එතකොට මට තරහත් එනවා. නොසන්සුන්කමක් එනවා. ඒ සේරටම යටින් මට ඒ අම්මණ්ඩි ගැන දයාවකුත් නැතුවම නෙවෙයි. මේ කෝපාන්විත නොසන්සුන්කම මගේ ඇඟේ වෙලෙමින්, මුදමින්, නැවතත් වෙලෙමින් ඉන්න සර්පයෙක් වගෙයි. ඒත් ඕවා විග්‍රහ කරමින් ඉන්නෙ නැතුව ජීවිතය විඳින්න ඕන. සියලු ප්‍රස්ථා ග්‍රහනය කර ගන්න ඕන.

"ඔය මාගරීතට පුංචි දෙයක් කරලා දුන්නු හින්ද එයා මං ගැන තරමට වැඩි විශාල ප්‍රතිරූපයක් ඇති කර ගන්න ඇති. මං නිකං පුංචි මිනිහෙක්."

"තමන්ගෙ දක්ෂකම් අවතක්සේරු කරන්න එපා." ඒ වෙනකොට පෝලාගෙ ඇස්වලත් සෙල්ලම් ලීලාවක් ඇඳෙනවා වගේ පෙනුණා.

"ඔහොම කතා කරන්න එපා. එතකොට මටත් නිකං මෝඩ විදියට මගේ දක්ෂකම් පෙන්නන්න හිතිලා මේ මේසෙ උඩ නැගලා සිංදුවක් කියන්න හිතෙයි."

"ඔයාට සිංදු කියන්න පුළුවන් ද?"

"මං දන්නෙ ආදර ගීතයි විරහා ගීතයි විතරයි. කිලිනොච්චියෙදි නං ඒවා කියලම නෑ."

"එහෙනං අද විරහා ගීතයක් කියන්න. ඇලන්ටත් ලස්සනට සිංදු කියන්න පුළුවන් කියලා මාගරීතා කිව්වා."

ගෑනිත් ලේසි නෑ වගෙයි. ආදර ගීතයක් කියන්න කියලා ඉල්ලා හිටියෙ නැහැනෙ.

"අද ඇලන් සිංදු කියන එකක් නෑ. ඒ ගොල්ලො චිත්‍රපටියක් බලන්න යනියි. දැන් තව කට්ටිය ඇවිත් ඇති."

"අපි වහලෙ උඩට ගිහින් සිංදු කියමු. රොසානාත් එයි."

මං හිනා වුණා. එයත් හිනා වුණා. අපි එකිනෙකාට කතා

කරන්න ගත්තෙත් සිංදු කියනවා වගේ තමයි.

"පාන්ඩියන් ස්පෙෂල් අයිස්ක්‍රීම් පැණිරස වැඩියි." මං කිව්වා.

"පැනි රස වැඩි දේවල් ඉක්මනින් එපා වෙනවා." එයා කිව්වා.

"එහෙනං අපි ෆෘට් සැලඩ් කමුද?" මං ඇස් ලොකු කරගෙන බලා හිටියා.

"ඔව්. තහනමක් නැනේ." එයා හිනා වුණා.

අපි පළතුරු සලාද ඇනවුම් කළා. ඒවායෙ හොඳට ඇපල් තිබුණා.

"කොළඹවත් මෙච්චර ඇපල් දන්නෙ නෑ. මේගොල්ලො ඉන්දියාවෙන් ලාබෙට ඇපල් අරගෙන හොරෙන් ගේනවා වෙන්නැති. මෙතු එකට මේක දන්න තියෙන්නෙ තහනම් ගෙඩි ස්පෙෂල් කියලයි."

"සාෂා ඇත්තටම කොහෙන්ද ඔයාට ඔය වගේ කතා එන්නෙ."

"මං සිංදු කියන කුරුල්ලෙක් වගෙයි."

"එහෙනං ඔයා ලස්සනට සිංදු ලියනවත් ඇති."

"ටිකක් ලියලා තියෙනව. දැං වෙලාවක් නැනේ."

ඔය විදියට සින්දු කතා කියාගෙන කියාගෙන ගිහින් ආපහු යන්න වාහනයට නගිනකොට මං පෝලා එක්ක පිටපස්සෙ වාඩි වුණේ රාග තාල ඉගැන්වීමේ පහසුව පිණිසයි. දීර්ඝ කාලයක් මට සේවය කිරීම නිසා මගේ ගායන, වාදන, රාග තාල, ඉගැන්වීම්, ඉගෙනීම් සරත් ඉතා හොඳින් දැනගෙන හිටියා. මට පක්ෂපාතිකම පෙන්නීමට වර්ණාසි ඉදිරියෙ මගේ ගුණ ගායනා කළා. මං කැමැත්තෙන් යමක් කිව්වොත් මිසක් කිසි දෙයක් හාරලා ඇහුවෙ නෑ. අඳ, ගොළු, බිහිරි විදියට ඉන්න හැටි ප්‍රගුණ කරලා තිබුණේ මට කලින් ඇමතිවරුන්ට වැඩ කරලා තිබුණු නිසා වෙන්න ඇති.

අපි යනකොට ඇලන්ලා චිත්‍රපටිය තෝරා ගන්න වාද කරමින් හිටියා. රික් විතරක් තනියම වෙස් පුවරුව දිහා බලාගෙන හිටියා.

පිරිමි කට්ටිය කෑම ගැන තීරණයක් අරගෙන තිබුණෙත් නෑ. මාගරීතා මේද රහිත යෝගට් එකක් කමින් හිටියා. රොසානා පේන්න හිටියෙ නෑ.

ඒ රාත්‍රියෙ මායි පෝලයි චිත්‍රපටිය බැලුවෙ නැහැ. අපි වහලෙ උඩ අඳුරු කොටසෙ වැඩිහිටියන්ට වඩාත් සුදුසු චිත්‍රපටියක ආරම්භක ජවනිකා රඟපාමින් හිටියා. රෑට කට්ටිය නිදා ගත්තට පස්සෙ නැවත හමු වෙන්න ගිවිසගෙන ගෙට ගියෙ වර්ණාසිට කතා කරන්නයි.

"කෑවද? බේත් ගත්තද?" වර්ණාසි මුලින්ම ඇහුවෙ හැමදාම අහන ප්‍රශ්න දෙකයි.

"කෑවා. මේ වාත ගෑනියෙකුත් බලෙන් එල්ලිලා ආවා. බොහොම අමාරුවෙන් ඒ ගෑනිව හලලා නිදා ගන්න ආවට වැඩක් නෑ. මේ කට්ටිය ෆිල්ම් එක බලලා කාලා ඉවර වනකොට තව පැය දෙකකවත් යයි."

"එහෙනං ඔයා වෙනදට නිදා ගන්නවා කියපු තැන නිදාගන්න බැරිවෙයිනෙ."

"ඔව්, එතකල් ජේම්ස්ගෙ පොල්අතු මඩුවෙ දිගාවෙලා ඉන්නවා. අද රස්නෙයි. හවස නෑවා. දැන් දඩියයි. ආයෙත් නාන්න හිතයි. මෙච්චර වෙලා වහලෙ උඩ හිටියෙ."

"එපා. එපා. එහෙනං ඇඟ හෝදා ගන්න. එළියෙ හෙම නිදා ගන්න එපා. පිනි බාලා ලෙඩවෙයි."

මගේ ගෑනි වගේ මව් මාතෘ ගුණය තියෙන වෙන කිසිම ගෑනියෙක් මට මුණ ගැහිලා නැතේ. කවන්න, පොවන්න, නාවන්න, හලවන්න විතරක් නෙවෙයි මං වෙනුවෙන් සල්ලි වියදම් කරන්නත් ඉදිරිපත් වෙච්චි එවුන්ගෙන් වැඩි දෙනෙකුට තියෙන්නෙ මගෙන් මොකක් හරි ලොකු වාසියක් ගන්න යටි බලාපොරොත්තුව තමයි. මං අඳුනවයි ඒවාට.

"එහෙනං මං තියන්නං මැණික. රෑ වෙනකල් ඉන්නෙ නැතුව දෙයියන්ත මගෙ සිද්ධේශ්වරී."

"බේත් අරගන්න අමතක වෙයි. බේත් අරගෙන මට ආයෙ

කෝල් කරන්න."

"බෑ...... මං ගන්නං."

"නෑ දූං ඔයා කතාවකට පැටලුණොත් ඔක අමතක නැති වෙයිනෙ."

"එහෙමයි දේවිය"

ඕනෑම මොහොතක ඒ වගේ කතාවක් කිව්වම එයාට හිනා යනවා. මං බේත් පෙති අරගෙන ආපහු වර්ණාසිට දැනුම් දෙනකොට පෝලා ඇවිත් මගේ කොඳු ඇට පේළිය දිගේ අත යවමින් හිටියා. කවුරු හරි රෙදි මැද ගන්න නං එන්නෙ නැති බව මං දන්නවා. ඒත් ටෙලිෆෝන් කරන්න එන්න ඉඩ තියෙන නිසා මං දෙර පේන පැත්තට හැරුණා.

"ඔයා ලයින් එකේ ඉන්නවද?"

"ඔව්.... ඔව්.. මැණික. ඉතිං කියන්න."

"අම්මා කාල ඇවිත්. අපරාදෙ මං එයාටත් එක්ක ඉදිආප්ප හැදුවා. හෙට උදේට මං මල්පැල ප්‍රදර්ශනේට යනවා. අම්මත් එයි."

"ඕන තැනක යන්න. එහෙනං මං තියන්නං රත්තරනේ."

මට සුවිනීත භාර්යාවක් ඉන්න බව මාගරීතා දැනගෙන හිටියා. ඒත් ඒ කතා කරේ මගේ භාර්යාවටයි කියලා මං පෝලාට කිව්වෙ නැහැ. ආයෙමත් පෝලාගෙ මූණ ඉඹින්න උත්සාහ නොකර මං ඉක්මනට දත් මදින්න ගියා. ඒ රාත්‍රියෙ කොයි මොහොතෙ හරි පෝලා මගේ ළඟට එයි කියලා මං දැනගෙන හිටියා. ඇත්තම කියනවා නං ඒ වෙනකොට මට එහෙම උවමනාවක් නැති වෙමින් තිබුණා.

කට්ටිය නින්දට යන කල් මං ඇලන්ගෙ කුටියෙ විවෘත කොටසෙ යකඩ ඇඳේ නිදා ගත්තා. රෑ දොළහට විතර ඇලන්ලා ළිඳෙන් වතුර ඇදලා ඇඟ සිසිල් කර ගන්නවා ඇහුණා. විදුලි පංකාව නො තිබුණා නං මාත් දඩියෙන් නෑවෙන්න තිබුණා. අවට වාතයේ දැඩි උණුසුමත් කැරකෙන්න ගත්තෙ කවදාවත් නැති

විදියකටයි. ඒ තත්වය යටතෙ පෝලා මගේ ඇඳට නාවොත් හොඳයි කියලා හිතමින් මං පිටිපස්සෙ ඉස්තෝප්පුවෙ පුරුදු තැන මගෙ සුදු රෙදි කොට්ට උර දගෙන නිදි ගන්නකොට දෙළහයි විස්සයි.

මං හිතන්නෙ මට එතන පැයකට වැඩිය නිදි ගන්න ලැබුණෙ නෑ. පෝලා ඇවිත් මාව හෙල්ලුවා. මං බොරුවට නිදි වගේ හිටියා. ගැනි කොළඹ එන දවසක හොඳ සනීපෙට කොහෙ හරි යන්න පුළුවන් කම තියෙද්දි කිලිනොච්චියෙ උණුසුම් රාත්‍රියක තව දඩිය දගන්නෙ මොකට ද?

"සාෂා නිකං පොළොව හෙල්ලෙනවා වාගේ. මට බයයි."

"පිස්සුනෙ. නිදි ගන්න."

"නෑ ඇත්ත."

"හීනයක් දකින්න ඇති."

"මේ ඇත්තමයි."

ඒ පටු ඇඳ අපි දෙන්නෙකුට ඉඩ මද නිසා සුදු රෙද්ද බිම එළාගන්න හිතාගෙන හිටියත් මට ඒකට හිතක් නැතුව ගිහින් තිබුණා.

"පිස්සු නෙවෙයි. ඔයා එක්ක නිදි ගන්න ඕන නං ඒක කෙලින්ම කියනවා මිසක් බොරුවට පොළොව හෙල්ලෙනවා කියනවද?"

එයාගෙ ස්වරයෙ කෝපයක් තිබුණා. මටත් යකා වැහෙන්න ගත්තා. ඒත් මට උත්තර බඳින්න ලැබුණෙ නැහැ. එක පාරට මිදුලෙ පොල් ගහක් කඩාගෙන වැටුණා. අපි හිටිය තැන දෙදරන්න ගත්තා. පෝලා වෙව්ලමින් මාව බදා ගත්තා.

ආයෙමත් යුද්දෙ පටන් අරගෙන ද? ඒක වෙන්නෙ කොහොමද? එහෙම වුණා නං ඒ වෙනකොට මට ආපහු එන්න කියලා කොළඹින් දනුම් නො දුන්නත් මට වහාම යන්න කියලා කොටි සංවිධානෙන් අනතුරු අඟවන්න ඉඩ තිබුණා.

"ලයිට් දාන්න" කිව්වත් පෝලා හෙල්ලුණේ නෑ.

මගේ දෙදරන්න ගත්තා.

අපි ඇලන්ගෙ කුටියට දිව්වා. ඇලන් කටත් ඇරගෙන ගොරවනවා. වතුර ටැංකියෙ කුලුණත් එක්කම මාළු ටැංකිය බිමට වැටුණා. ප්‍රධාන ගෙයි පැත්තක් ඇලවුණා.

"ඇලන් නැගිටින්න. ආයෙත් යුද්දෙ පටන් අරගෙන වගෙයි." කියලා පෝලා කෑ ගැහුවා. ඒත් කිසිම වෙඩි හඬක් ඇහුණෙ නැහැ. කොහේ හරි කිට්ටු තැනක හංගපු බෝම්බ පුපුරලා ගියාද? ප්‍රධාන නිවස කඩා වැටුණෙ අපි බලාගෙන ඉන්දැද්දිමයි. අපිට කිසි දෙයක් හිතා ගන්න බැරි වුණා. ඇලන් නැගිටලා හිට ගන්නකොටම අපි තුන්දෙනාවම විශාල වළකට ගිලා බහිනවා වගේ දෙයක් වුණා. වහලෙ කඩා වැටෙන්න ඇති. පෝලා කෙඳිරි ගානවා ඇහුණා. ඇලන්ගෙන් කිසිම සද්දයක් නැතුව ගියා. මගේ අත් කකුල් කොහේ හරි හිරවෙලා තිබුණා. මං කෑ ගැහුවා. ඒත් කවුරුවත් ආවෙ නෑ.

කිලිනොච්චියෙ රාත්‍රියක සිද්ධ වෙන්න පුළුවන් භයංකාරම දෙය යුද්ධයක්නෙ. ඒත් ඒක යුද්ධයක් නෙවෙයි. ඇලන් හිටිය කුටිය යට එක පාරට වළක් හැදුණෙ කොහොමද? අපිට තේරුණේ නැතුවට බෝම්බයක් වැටුණ ද?

ඊට පස්සෙ මොනව වුණාද දන්නෙ නැතුව ගියා. මට දැනුණෙ මං මීයෙක් වගේ ගුලක හිරවෙලා ඉන්නවා වගෙයි. කොච්චර වෙලාවක් එහෙම හිටියද දන්නෙ නෑ. සමහර විට දවස් ගණනාවක් වෙන්න ඇති.

මං කොහෙද ඉන්නෙ, මට මොනවද වුණේ කියලා හිතාගන්න බැරුව භයානක හීනයක අතරමං වෙලා වගේ දැනෙන්න ගත්තා. ඒ එක්කම උහුලන්න බැරි ගඳක් ආවා. උගුර කට වේලිලා තිබුණා. ඔලුව පුපුරන අමාරුවක් දැනුණා. බර අඩි තියන ශබ්දයක් ඇහුණෙ මං හිටිය තැනට ඉහළින් වගෙයි. කවුරු හරි ඇමරිකානු උච්චාරණයෙන් කතා කරනවා ඇහුණා. ඒත් වචන පැහැදිලි වෙන්න ටිකක් වෙලා ගියා.

"මේවා කඩාගෙන ගිහින් තියෙන්නෙ. මේ ගොල්ලො දැනගෙන ඉන්න නැතුව ඇති. එල්. ටී. ටී. එක මේ ගෙවල් තුන යට හොඳට බංකර් හදලා ආයුධ තැන්පත් කරන්න ඇති."

"ඔය අල්ලපු වත්තෙන් තමයි හාරගෙන ඇවිත් තියෙන්නෙ.

ඔය ජේනවද ලයින් එක."

"තාම කවුරු හරි ඉතුරුවෙලා ඉන්න බැරි නෑ."

"මේ ගඳ එන්නෙ. බොඩි බෑග්ස් ගේන්න."

මට කෑ ගසන්න ඕන වුණා. ඒත් කෙඳිරියක්වත් පිට කර ගන්න බැරි වුණා. එච්චර ගඳක් තියෙද්දිත් අත් කකුල් නැතුව වගේ දැනෙද්දිත් කල්පනාව නිරවුල් වෙන්න ගත්තා.

තැන් තැන්වලින් හිරු එළිය පතිත වෙන්නත් ගත්තා. කවුරු හරි කට්ටියක් සුන් බුන් අහක් කරන බවත් තේරුණා. ඒත් සිහි නැතුවම හිටියා නං ඊට වඩා හොඳයි. පොල් අතු කුටි තුන යට ආයුධ විතරක් නෙවෙයි බෝම්බත් තැන්පත් කරලා නං කියන බය දැනෙන්න ගත්තා. බෝම්බ නෙවෙයි පතරොම් පෙට්ටි ඇති කියලා හිතන්න උත්සාහ කළා.

ඔය වැඩේ කරන්න ඇත්තෙ සටන් විරාමයට පස්සෙද? එතන පොල් අතු මඩු හදනකොට එහෙම දේවල් තිබුණා නං ඇලන්ට තේරෙනවනෙ.

මං හිරවෙලා හිටියෙ බාල්කෙකට වෙන්න ඇති. මට ඔලුව හොලවන්න පුළුවන් උනත් පුදුම වේදනාවක් දැනුණා. ඒ දුගඳ සුනාමි සමූහ වළකට මළකඳන් එකතු කළ අවස්ථාව සිහි කළා. එයින් පස්සෙ මාස ගණනාවක් යනතුරු ඒ ගඳ ඇඟටම ඇලිලා තිබුණා වගේ වුණානෙ. මං මළවුන් අතර ද? එහෙම නං ගඳක් දැනෙනවයැ. ධෛර්ය උපදවාගෙන හීන් කෙඳිරියක් හරි පිට කරන්න ඕන. සුනාමියෙදි ගල් අතර හිර වෙච්චි ගෑනු කෙනෙක් දවස් 21ක් සිහි නැතුව ඉඳලා තියෙනවා. එයාගෙ මිණිය හොයා ගන්න පුළුවන් වුණේ කුණු වෙන්න ගත්තට පස්සෙයි. මරණ පරීක්ෂණයෙදි වෛද්‍යවරයා කියලා තිබුණෙ මරණය සිද්ධ වෙන්න ඇත්තෙ දවස් දෙකකට කලින් කියලයි. ඒ වගේ අඳුරු ගුලක හිරවෙලා වාතාශ්‍රය නැතිකමින් නෙවෙයි දුගඳ උහුලා ගන්න බැරුව මැරෙන්න ඉඩ තියෙද්දිත් මට ඒ සුනාමි කතාව සිහිවීම පුදුමාකාරයි.

මගේ ජීවිතේ බේරුණොත් ජීවිතේ තියෙන තුරාවට වර්ණසිට බොරු කියන්නෙ නෑ කියලා මං හිතා ගත්තා. බේරගන්න මිනිස්සු ඇවිල්ලා ඉන්දද්දිත් හොඳට කල්පනාව තියෙද්දිත් කෙඳිරි

ගාන්න බැරිකම නිසා මැරෙනවට වඩා හොඳයි සිහිය නැති වෙලාවක මැරෙනවා.

ඒත් මරණය ළඟට ආවම ජීවත් වෙන්න පුදුම උවමනාවක් ඇති වෙනවා. පිදුරු ගහෙත් එල්ලෙනවා කියන කතාව හරියටම තේරෙන්නෙ එහෙම දේකට මූණ දුන් කෙනෙකුට තමයි.

ඒ වෙලාවට පපුව ගැහෙනවා කියලා කියන කතාව බොරුවක්නෙ. මට නං පපුව නැවතිලා තිබුණා. කිසිම දෙයක් හිතට එන්නෙම නැතුවත් ගියා. ඒක හරියට කල්පනාව සම්පූර්ණයෙන්ම නැති වෙලා ආයෙමත් කල්පනාව එන විදියෙ අතරමැදි තත්වයක්. ආයෙමත් එන්නෙ ජීවිතේ බේර ගන්න ඕන කියන සංඥාව මිසක් වචන නෙවෙයි. ටික වෙලාවකින් ඒ සංඥාව විශාල වෙන්න ගත්තම තමයි කෑ ගහන්න ඕන. එතන හිරවෙලා එක් දවසකට වැඩි වෙන්න ඇති වගේ වාක්‍ය එන්නෙ මතකය පැහැදිලි වෙනකොටනෙ. මිනිස්සුන්ගෙ අඩි හඬවල්, කතා බහ ඇහෙන්න ගත්තම සුනාමියෙන් ජීවිතේ ගැලවුණත් කෑ ගහන්න හයියක් නොතිබීමෙන් මැරිච්ච ගෑනු කෙනාගෙ කතාවෙන් හිත පිරුණා. ඒ කියන්නෙ නිකම්ම වචනෙට පිරුණය කීමක් නෙවෙයි. ඒක හරියට දකුණෙ මුහුදු වෙරළක මැරුණ නාඳුනන ගෑනු කෙනාගෙ කෙඳුරුම් ස්වරයකින් මගේ පපුවයි ඔලුවයි පිරිලා මම කවුද කියලා මට හොයා ගන්න බැරිවීමේ අවස්ථාවක්. ඒක කොයි තරම් ප්‍රබල විදියට දැනුණද කිව්වොත් ඒ ගෑනු මනුස්සයත් මමයි කියන හැඟීම දැනෙන්න ගත්තා.

එතකොට සාෂා කියන්නෙ කවුද? ඒ මම නෙවෙයි වගේ වුණා. සාෂාට පිටකොටුවෙ මාළු කඩේ වැසිකිලි වළක බලු කුණක් එක්ක හිර වෙලා ඉන්නවා වගේ දෙයක් වෙන්න බැහැනෙ. එතන හිර වලා හිටිය කෙනාට "කෙඳිරි ගාන්න.... කෙඳිරි ගාන්න. නැත්තං මඟ ඇරෙයි." කියන දේ මන්ත්‍රයක් වගෙ කියනවා ඇහුණෙ ගෑනු ස්වරයකින්. ඒ ගෑනු ස්වරය හිරවෙලා හිටි මනුස්සයාගෙ පපුවෙන් එන්නෙ කොහොම ද? සාෂා මැරුණ ද? එහෙනං ඇමරිකානු උච්චාරණයෙ ඉංග්‍රීසි කතා කරනව ඇහෙන්නෙ කාට ද? සාෂා කෝ? සාෂා කියන්නෙ කාට ද? එයා කාගෙ කවු ද?

මං දන්නෙ නෑ. මට උත්තර එන්නෙම නැති වෙමින් තිබුණා.

ආයෙමත් පපුව නැවතීගෙන එනව ද? සිහිය නැති වෙන්නෙ එක පාරට ද? මං ඔළුව එහාට මෙහාට හෙල්ලුවා. මනුස්සයෙකුට තමන්ගෙ ඔළුව හොල්ලන්න එච්චර අමාරු වෙන්නෙ කොහොමද? හරිම හෙමින් ඔළුව හරවන්න සිද්ධ වුණා. දශමයකට වැඩිය හැරෙව්වොත් ඔළුව ගැලවෙන්ඩ වගේ එනවා. තැන් තැන්වලින් හිරු එළිය කාන්දුවෙලා තිබුණා. ඒ වගේ දුගඳ වළකට හරි හිරු එළිය කාන්දු වෙනකොට මැරෙන්න හිතෙන්නෙ නෑ. කුඹියෙක් වෙලා හරි හිරු එළියෙ වැලි කැට දිගේ එහාට මෙහාට යන එක කොයි තරම් විශාල සතුටක් ද? ආලෝකය දිගේ උඩට යන්න බැරිද? ඒ මොහොතෙ මට ඕන වුණේ මගේ මූණටත් හිරු එළිය වැටෙන්න විතරයි. එතකොට මට කෙඳිරියක් පිට වුණේ නැත්තං හිතා වෙන්න පුළුවන් වෙයි. හිනා වෙනකොට මැරිලා නැති බව පෙනෙයිනෙ.

පිටත වෙනත් තැනකින් පොළොව හාරනව ඇහුණා. හරියට මම පොළොව බවට පත් වෙලා වගේ ඒ හැම උදලු පාරක්ම මට තිගැස්මක් ගෙනාවා. කොතනින් හරි පටන් අරගෙන මං ඉන්න තැනටත් එයිනෙ කියන බලාපොරොත්තුව සතුටක් ඇති කළ යුතු වුණත් ඒ වෙලාවෙ අවටින් ඇහුණ හැම හඬකින්ම ම ගැස්සෙනවා වගේ වුණා. පොළොවට වැදෙන බර සපත්තු හඬවල් මගේ පපුවට වදින පා පහරවල් වගේ දැනුණා. කවුරු හරි යකඩ කූරුවලින් පොළොවට අනින්න ඇති. මගේ ඇඟට අනිනවා වගේ දැනුණෙ ඒ ශබ්ද ක්ෂණයකින් ඝන වස්තු බවට පත් වෙනවා වගෙයි. හැම හඬක්ම තියුණු ආයුධ වෙනවා වගේ දෙයක්. එක පාරට විශාල ආලෝක පදසයක් වැටුණෙ මං හතරවෙනි වතාවටත් දශමයෙන් දශමය ඔලුව හැරවීමේ දුෂ්කර ව්‍යායාමයෙ යෙදෙන කොට වෙන්න ඇති. ගණන් කිරීම් එහෙ මෙහෙ වෙන්න පුළුවන් වුණත් මං ගණන් කරමින් හිටියා.

එක පාරටම හිරු එළිය පතිත වුණේ මස් දියවෙමින් පැවතුණු මුහුණකටයි. ඇස් පිටතට නෙරලා. දිව එළියට ඇදිලා. ඒ ඉදිමිලා නිල් පැල්ලං හැදිච්චි මූණ අර ගෑනිගෙ ද? ඒ රාත්‍රියෙ ඒ ගෑනි ඇඳගෙන හිටියෙ මොකද්ද? ඒ ගෑනි මාගරීතාගෙ අක්කා කියන එක මතක් වුණාට ගෑනිගෙ නම මතක් වුණේම නැහැ.

මගේ මූණ ඉඹපු ගෑනිගෙ තොල් ඒ තරම් විශාල වෙලා පුපුරලා වැගිරෙන තරමට එන්න මං එතන හිර වෙලා කොච්චර කල් ඉඳල ද? සමහර විට මගේ මූණත් එහෙම වෙලා ද?

මං ඉන්නව ද?

මැරිල ද?

පෙරේත ආත්මයක් ලබලා ද?

ඊට පස්සෙ මොනවා වුණාද දන්නෙ නෑ. සිහිය එනකොට මං හිටියෙ කොහෙද කියලා හිතා ගන්න බැරි වුණා. අර ගඳ නැති වෙලා තිබුණා. අපහැදිලි කට හඬවල් ඇහුණා. මල් සුවඳක් දැනෙන්න ගත්තා. ඒ මොන මල් ද කියලා හිතා ගන්න බැරි වුණා. මං ඇස් අරින්න උත්සාහ කළා. ඇස් පියන් යකඩ පියන් වගේ වෙන්නෙ කොහොමද?

මල් සුවඳ එක්ක කවුරු හරි මගේ තොල් තෙත් කරනවා දැනුණා.

මං දිව්‍ය ආත්මයක් ලබල ද?

මං මැරිලා නැද්ද?

ඇස් දෙක විවර වුණා. කවුද මූණට එබිලා බලාගෙන හිටියා.

"සිහිය ඇවිත්" ඒ රෝසපාට මූණ කිව්වා.

මූණ ගෑනු කෙනෙක්ගෙ. ලස්සන තරුණ මූණක්. තොල් රෝස පාටයි. හිනාවක්. කම්මුල් වළ ගැහුණා.

"මේ කොහෙද?" කියලා අහන්න ඕන වුණා. වචන උගුරෙ හිර වෙලා.

අත් පා හොලවන්න ඕන වුණා. ඒවාත් හිරවෙලා.

"බය වෙන්න එපා." රෝස මල් මුහුණ ඉංග්‍රීසියෙන් කිව්වා.

රෝස මල හිනා වෙනවා.

රෝස මල විශාල වෙන්න ගත්තා. තොල් ඉදිමුණා. ඇස් එළියට පැන්නා. මස් දියවෙනවා.

කෑ ගහන්න කට ඇරියා. ඇස් පිය වුණාට ඒ භයානක රූපය ඇස් ඇතුළට ඇවිත් මගේ මූණටත් ආවා වගේ වුණා. මගෙත් මස් දියවෙනව ද? කවුරු හරි මගේ කටට වතුර ටිකක් දැම්මා.

වතුර බිංදුවකින් උනත් කොච්චර සැනසීමක් දැනෙනව ද?

"මැරිලා නැද්ද?"

මං ඒ ප්‍රශ්නෙ ඇහුවා. ඒත් ඒක පිට වෙන්න නැතුව ඇති.

"මොනවා හරි කියන්න හදනවා."

මිහිරි ගෑනු හඬකින් කිව්වා. ඒ ගෑනි ඉංග්‍රීසියෙන් කතා කරන්නෙ මොකද? මාත් සුද්දෙක් කියලා හිතල ද?

ඇත්තටම මොකද වුණේ?

ආයෙමත් යුද්ධයක් ද?

ඒක වෙන්න බෑ.

දෙදහෙ පළවෙනි දශකය ඉවර වෙනකලුත් යුද්ධ කළ හින්ද ඒක වෙන්න බෑ කියන්නෙ කොහොම ද? සාමය ආවත් යුද්ධය ආයෙත් එන්නෙම නෑ කියන්න පුළුවන් මොන ජගතා ද?

නෑ ඒක වෙන්න බෑ.

ආයෙත් යුද්ධ කරන්න අමාරුයි. දෙපැත්තටම අමාරුයි.

එහෙනං මේ මොකද්ද වුණේ?

අහස පොළොව දෙදරීම

රාස්සයෙක් ඇඳ එහාට මෙහාට අද්දා. යුගල ඇඳේ තනියම නිදාගෙන හිටි වර්ණාසි හිතුවෙ ඒක අමුතු හීනයක් කියලයි. රාස්සයා පෙනුණෙ නැති වුණාට යටි හිත සංඥා කළේ රාස්සයා කියන හැඟීමයි. රාස්සයෙක් කියන්නෙ මොන වගේ කෙනෙක්ද කියලා දැකලා නැති වුණාට පුංචි කාලෙ කතන්දරවල හිටියෙ ඇස් ඉදිරියට නෙරපු තල දත් දෙකක් ඉදිරියට නෙරපු භයානක කෙනෙක්නෙ. රිදී ඇල ගමේ මහ ගෙදරට ආ ගිය ගෑනු කිව්වෙ රාස්ස ගණයෙ අයට හොල්මන් පේන්නෙ නෑ කියලනෙ. ඒ හින්ද භූතයොත් රාස්සයන්ට බයයි කියන හැඟීමත් යටි හිතේ තියෙන්න ඇති.

"යක්කුන්ගෙයි රාස්සයන්ගෙයි වෙනස මොකක්ද?" වර්ණාසි පුංචි කාලෙ රබර් වත්තෙ කිරි කපමින් හිටි පාක්‍යම්ගෙ පස්සෙන් යන ගමන් ඇහුවා."

"යක්කු කලු පාටයි. රාස්සයො රතු පාටයි." පාක්‍යම් කිරි පිහිය සීරුවට කැපුම වටේ යවන ගමන් බොහොම විශ්වාසයෙන් දීපු උත්තරෙත් වර්ණාසිගෙ හිතේ රැඳිලා තිබුණා. ඒ පරණ යක්ෂ රාක්ෂ කතා සිදුවීම් හැටියට හිතට නාවත් ඇඳ හෙලවෙනකොට, ඇඳ ළඟ පුංචි කනප්පුව උඩ තිබුණු ජංගම දුරකතනයත්, නිශ්චිත හැඩයකින් තෝර ලා කොළ පේඩි ගලක් මැද රවුමක් කොටලා හදලා තිබුණු ඔරලෝසුවත්, චූටි මුතු කැට අල්ලපු අත් රේන්ද වැස්මෙන් සැරසුණු වතුර වීදුරුවත් බිම මඩ පාට ටයිල් උඩට වැටිලා බිඳෙන විසිරෙන හඬත්, ගස් අඹරවමින් කැරකුණු හුළඟක වියරුවත් වර්ණාසිට දැනුණෙ යක්කු රාස්සයො දඟලනව වගේ තමයි.

එක ඇණයක්වත් නැතුව සම්පූර්ණයෙන්ම ලී පුරුද්දලා හැදූ මිදුලක් තරමට ලොකුවට විශේෂයෙන් හදවපු කලු පුළුත් පුරවලා කොහොඹ කොළ තට්ටුවක් අතුරපු මෙට්ටයට උඩින් තෙළඹු මල් රටා වියවාපු හීන් පත් පැදුරක් අතුරපු ඒ ඇඳ හොල්ලන්න හතර හතුරෙකුට නං බැහැ. ඉහ තියන පැත්තෙ උස් ඇඳ පත්තෙ වීතෙයෙන් ගෙන්වපු ලී කැටයම් චිත්‍රයක් හිල්වලා තියෙනවා. ඒ චිත්‍රයෙ හිමහාත මණ්ඩප, ආරුක්කු පාලම්, ජලම් මල් විසිරුණු මාවත්, විලෝ ගස් නැමී වැටෙන උයන් තෙරක් සහිත පසුබිම පුරා පුංචි ළමයි සියයක් ඉන්නවා. වර්ණාසිට දැනුණෙ බාගෙට තට්ටෙ ගාලා කොණ්ඩෙ ගොතපු දුවන පනින ළමයි ටිකයි. රොනල්ඩෝ පාපන්දු ඉරයාට අවුරුදු සිය දහස් ගණනකට කලින් ඒ මෝස්තරේට සම්පූර්ණයෙන් තට්ටෙ ගාලා නළලට වැටෙන බුරුසු කෙස් ගොත්තක් ඉතුරු කළ විත ළමයි රංචුවයි ඇඳ පත්තෙන් එළියට ඇවිත් ඇඳ උඩ ගුලිවෙලා තමන්ටත් හුස්ම ගන්න බැරි තරමට තෙරපෙනවා වගෙයි.

ඒ හීනයක් ද? සැබෑවක් ද?

තමන් නිදි ද? අවදියෙන් ද?

ඔය පැද්දෙන ගැස්සෙන දෙදරණ හැඟීම දැනීමට කලින් වර්ණාසි හීනයක් දකිමින් හිටියා. එයාගෙ අම්මා මනෝරමා එයා වඩාගෙන දුවන්න හැදුවා. අම්මා කරේ තියාගෙන හිටි බිළිඳිය කවුද කියලා හීනෙ කොතනකවත් සඳහන් වුණේ නැති වුණාට හීනෙ දකිමින් හිටි කෙනාට ඒ තමන් බව දැනුණා. බිළිඳියට හය හත් මාසයක් ඇති. ඒ පරණ ඇල්බම්වල හිටිය බිළිඳිය ද කියලා බලා ගන්න තරමට මූණ පැහැදිලි නැති උනත් අම්මගෙ මූණ නං එක කෙස් ගහකවත් අඩුවක් නැතුව හුස්ම වැටෙන ගතිය පවා දැනෙන තරමට පැහැදිලියි. හැබැයි වර්ණාසි පුංචි කාලෙ හිටිය අම්මා නෙවෙයි. ඒ හිටියෙ ඒ රාත්‍රියෙ වර්ණාසිලගෙ ගෙදර පහළ තට්ටුවෙ අමුත්තන්ගෙ කාමරයක නිදාගෙන හිටි කෙස් එක දෙක රිදීයට හැරෙමින් තිබුණු අම්මාමයි.

අම්මා දුවන්න හැදුවෙ දුව පපුවට හිර කරගෙන නිසා වර්ණාසිගෙ පපුවත් හීනෙන්ම ගැහුණා. අම්මට දරුවා ගෙනියන්න නොදී අඩි දහයක් විතර උස ගිහින් සාමාන්‍යයෙන් ඉන්නවට වඩා දස ගුණයකින් මහත් වෙලා යෝධයෙක් වගේ දෙරකඩ හිටගෙන

හිටියෙ වර්ණාසිගෙ කසාද පුරුෂයා සාෂා.

"මට මගෙ දෙයියො දීලා උඹ ඕක හැනක මකබෑවියං ගෑනියේ."

සාෂා කවදාවත් නැති විදියට අම්මට සැරෙන් කතා කරමින් හිටියා.

"මට මගෙ දරුවා දීලා උඹ ඕක තුත්තුකුඩියක පලයං මිනිහෝ."

අම්මා අඬමින් කෑ ගහමින් දුවන්න හැදුවට කකුල් පණ නැතුව වැටුණා. හීනෙ පටන් ගත්තෙ ගෙයි මැද මිදුලෙන් උනාට දෙවෙනි රූප රාමුව පහළ වෙන්න තප්පර බාගයක්වත් යන්න නැතුව ඇති. එතකොට අම්මයි දරුවයි උඩු මහලෙ සඳළු තලයෙන් විසිවෙලා මිදුලෙ හීන් නාරං ගහ උඩට වැටුණා. අම්මා නැගිට්ටෙ නෑ. ගහේ ඇමිනිලා හිටියා. බිළිඳිය ඇඬුවෙ නෑ. කටුවලට හිරිලත් රිදුණෙ නැහැ. නාරං ගෙඩි නං කහ පාටට මිල පුරා විසිරුණා. බිළිඳිය අම්මාගෙ පපුවෙන් එහාට මෙහාට වෙන්න බයේ අම්මා බදාගෙන හිටියා. සාෂා නිදන කාමරේ සඳළුතලයෙ තිරුවතින් හිටගෙන වැට්ච්ච දෙන්නා බේර ගන්න උත්සාහ නොකර පහළ තණ පලසට මුත්‍රා කරමින් හිටියා. සමහර දවසට බීලා වැඩිවුණාම සාෂා එහෙම කරනවා. ඒත් ඒ සේරම පෙනුණෙ නාරං ගහේ වහන පැණි කුරුල්ලෙක් වගේ හිටිය බිළිඳියට පෙනිය යුතු විදියට නෙවෙයි. නාරං විසිරුණු තණ පලසත් අහුවෙන්න ගෙදර වහළයටත් ඉහළින් තියෙන කැමරාවක් ක්‍රමයෙන් පහත් වෙනවා වගේ වුණේ හීනෙ දකිමින් හිටිය කෙනා හීනයේ පාත්‍ර වර්ගයාට අයත් නොවන තෙවන පාර්ශ්වයක් විදියටයි. ඒක මහ දවල් දැකපු සමීප දර්ශනයක් වගේ පැහැදිලියි. සාෂාගෙ ලිංගේන්ද්‍රියෙ තියෙන කලු උපන් ලපය පවා පෙනුණතෙ. බිළිඳිය ඇඳුමක් ඇඳලා හිටියෙ නෑ. කලු නූලක අමුණපු රන් පංචායුධය දිළිසුණා. අම්මා ඇඳලා හිටියෙ ඉරුණු සුදු නිදි ගවුමක්. ඒක ඉරුණෙ දුවන්න කලින්ද කියලා පැහැදිලි නෑ. රාත්‍රී අඳුරකින් පටන් ගත් හීනෙ අවසන් වෙනකොට සැහෙන ආලෝකයක් තිබුණා. රාත්‍රී අඳුරෙන් පස්සෙ උදයක් නෙවෙයි හැන්දෑවක් එනවා වගේ දෙයක්.

ඒ හී[illegible] උඩ ඉඳන් බිම වැටිලා වගේ [illegible] අවදිවීමකට මුහු[illegible] මෙතරම් කියලත් දැනුණෙ කොහොමද? උඩ ඉඳලා දැක්කෙ කාගෙ ඇහෙන්ද?

වර්ණාසි ඒ ප්‍රශ්න අහන්නෙ හොඳ සිහියෙන් ද?

ප්‍රශ්නත් හීනෙ දකපු කෙනා වගේම තෙවන පාර්ශ්වයකින් ද?

ප්‍රශ්න අහන කෙනා උත්තර සපයන්නෙ නැතුවට උත්තර දන්නවා වගේ දැනෙන්නෙ කොහොම ද?

ඒ උත්තර දන්න කෙනා ප්‍රශ්න අහන්නෙ හීනෙ දකපු කෙනා වෙනුවෙන් ද?

නිදන කාමරයට යාබද බුදු කුටියෙ තියෙන පන්සලක තරම් විශාල බුදු පිළිමයක් බිම වැටිලා කැඩෙනවා වගේ ඇහෙන්නෙ කොහොම ද? වර්ණාසි ඇස් ඇරියෙ නැත්තෙ අර හීනෙ ඉතුරු දර්ශන අපේක්ෂාවෙන් හිටි නිසයි. ඒක ත්‍රාසජනක දර්ශනයක් අපේක්ෂාවෙන් ඉන්නකොට වගේ [illegible] රහිතව සතුටට දැනෙන හැඟීමක්.

ඊළඟ මොහොතෙ බිම වැටුණු දේවල් නැවත උඩ [illegible] වැටිලා තව තවත් කුඩා කෑලිවලට බිඳෙනවා වගේ දෙයක් මුළු වහලෙ ඉගිල්ලෙන්න හැදුවා. ඒ කාමරේ තියෙන්නෙ විශාල ඇඳයි. ඇඳ ඉදිරිපිට බිත්තියටම සිල්ලපු විශාල කණ්ණාඩියයි. තාන්ත්‍රික භාවනා ඉරියව්වකින් කාමයේ ඇලීම හා නොඇලී සිටීම සොයා ගන්න තැත් කරන පිත්තල බෝසත් යුවතිපතින් වඩා හිඳවපු [illegible] කහප්පුවයි විතරයි. දකුණු චීනයෙන් ගෙනාපු ඒ ඇඳේ රන් ලාච්චු ගොඩක් තියෙන නිසා කාමරේ හැඩි වෙන්නෙ නෑ. ඇඳේ අල්මාරිත්, සපත්තු රාක්කත්, ආලේප, විලවුන්, පනා, බුරුසු හැම දෙයක්ම පිළිවෙලට අසුරපු කැටයම් රාක්කෙකුත්, පටු බිත්තියක් වැසෙන්න කණ්ණාඩියකුත් තියෙන පුංචි කාමරය මැදිනුයි ළඟ කොළ පාට නාන කාමරයට යන්නෙ. පුංචි කාමරෙනුත් සද්ද බද්ද ඇහුණා. කහප්පුවෙ වැඩ හිටි බෝසත් යුවතිපතින් බිමට වැටුණෙ නැතුවට ඇඳට වැටුණු බව තේරුණේ ඒ දෙන්නාට පය වැදුණු නිසයි.

පිටත ගස් කඩාගෙන වැටෙන්නෙ කොහොමද?

මහ හුළඟකින් පොළොව උගුල්ලගෙන යන්න හදන්නෙ මොකද?

වර්ණාසි ඇස් ඇරියෙත් විදුලි කෙටුමෙන් එකටමයි. ලොකු වීදුරු ජනේල වැහුවා කියලා හොඳට මතක තිබුණට ඒවා නෑ වගේ පෙනුණා.

ඊ ළඟට ආයෙමත් අඳුර. මහ හුළඟ.

බෝම්බයක් ද?

බෝම්බ පිපිරුවමත් වීදුරු බිඳෙන්න පුළුවන්නෙ.

ඒ වෙලාවෙ සාෂා හිටියෙ කිලිනොච්චියෙ. එයා ගෙදර හිටියා නං බෝම්බයක් පිපුරුවත්, භූකම්පයක් ආවත්, කුණාටුවක් ආවත් "බය වෙන්න එපා රත්තරං. මං බලන්නං." කියලා කළ යුතු දේවල් කර[illegible] පොලීසියට ටෙලිෆෝන් කරන ගමන්ම රහසා [illegible] ඇහෙනවා. එයා කිලිනොච්චි ගියෙ වැදගත් වැඩකට [illegible] නිසා. වර්ණාසි කවදාවත් එයාගෙ රාජකාරි වැඩ ගැන හෙව්වෙ බැලුවෙ නෑ. සාෂා ඒක අගය කළා. කාමරේ දෙදරුවා. ඇඳ පැද්දෙන්න ගත්තා. බෝම්බෙක හඬක් නැතුව විනාඩි දෙක තුනක් ඒ දෙදරිල්ල තිබුණා. ඒ පාර නං හීනයක් නොවෙයි කියලා හොඳටම විශ්වාසයි.

"බේබි.... වර්ණි.... පුතේ.... ඔයා ඇහැරල ද?"

ඒ ගේ හදපු දවසෙ ඉඳලා කවදාවත් උඩට නැග්ගෙ නැති මනෝරමාගෙ හඬ ඇහුණෙ පඩි පේළියෙ උඩම හරියෙන්.

"බේබි ඉක්මනට එළියට එන්න. භූමිකම්පාවක් ද කොහෙද?"

මනෝරමා එහෙම කියනකොටත් ආයෙත් දෙදරීම පටන් ගත්තා. එද නින්දට යන වෙලාවෙ සැහෙන රස්නයක් තිබුණු නිසා වර්ණාසි නිදාගෙන හිටියෙ හෙලුවෙන්නෙ. ඒ වෙලාවෙ ඒක මතක් වුණෙත් නැහැ. වර්ණාසි ඇඳෙන් පැන්නා කහප්පුව උඩ තිබුණු වතුර වීදුරුව බිම විසිරිලා තිබුණ නිසා ගැති ලිස්සලා ගිහින් වීදුරු කට්ටක් තළලෙ වැදෙන වැටිල්ලක් වැටුණා.

ගේ දෙදරුවා. කාමරවල දොරවල් හයියෙන් ඇරුණා, වැහුණා.

"පුතේ බඩගාගෙන හරි එන්න." මනෝරම්‍යාගේ කටහඬ ඇහුණෙ කලින් ඇහුණ හයියෙන්මයි.

වර්ණාසි නැගිටලා බිත්ති අල්ලගෙන බීලා මත්වෙච්ච කෙනෙක් වගේ පඩිපෙළ ළඟට ආවා. අම්මා පඩිපෙළේ වැටිල වගෙ පඩි දෙක තුනක දිගාවෙලා.

අම්මයි දුවයි බඩගාගෙන වගේ පහළට ආවා.

"බයවෙන්න එපා." කියලා කිව්වට ඒ වගේ අවස්ථාවක මොනවා කරන්නද කියලා එක පාරට හිතා ගන්න මනෝරම්‍යාටත් බැරි වුණා. ගැනි ආපද කළමනාකරණය ගැන පොතක් සංස්කරණය කළේ ඊට සුමානෙකට කලින්. ඒකෙ එක එක රටවල භූමිකම්පාවලදී මිනිස්සු ජීවිත බේරා ගත්තු හැටිත් තිබුණා. ඒ මොහොතෙ ඒ කිසිම දෙයක් මතකෙට ආවෙ නැති හැටි.

මිදුලට දුවනව ද? ඒත් ගස් තියෙනවා. පාරේ ලයිට් කණු කොයි අතට වැටෙයි ද දන්නෙ නැහැනෙ. වැස්සයි හුළඟයි තියෙන්නෙ කුණාටුවක් ද? ඉරානයෙ භූමිකම්පාවකදි ලොකු මේසයක් යට රිංගලා හිටි ළමයෙක්ගෙ ගෙදර කඩා වැටිලත් ළමයා බේරුණු කතාවක් වර්ණාසිට මතක් වුණා. ඒ මොහොතෙම මනෝරම්‍යාටත් හිතුණා කෑම මේසෙ යටට රිංගන්න ඕන කියලා.

"මේසෙ යටට...... මේසෙ යටට යං මේ අර්ත්කුවෙක් එකක්" අම්මා කෙඳිරුවා. දුවගෙ ඇගේ ඇඳුමක් නැති බව අම්මට තේරුණා. දුව මේසෙ යටට වෙච්චි ගමන් අම්මා ආයෙමත් පඩි පේළිය ළඟ කාමරේට ගියා. අම්මා නිදගෙන හිටි ඒ කාමරෙත් බඩු එහෙ මෙහෙ විසිරිලා. කොට්ටෙ යට තිබුණු විදුලි පන්දම හොයා ගන්න ඇඳ යට අත ගාන්න වුණා.

අම්මා ආපහු මේසෙ යටට ආවෙ විදුලි පන්දමත් අරගෙනයි. තමන් ඊට නිදා ගන්න දුවගෙ ගෙදරට එනකොට ඇඳගෙන ආ සායයි, හැට්ටෙයි, ඇඳ රෙද්දයි, කොට්ටෙයි සේරම උස්සගෙනයි. එනකොට දෙදරීම නැවතිලා.

අම්මා මේසෙ යට රෙද්ද එලුවා. මේසෙ වටේ තිබුණු පුටු

පෙරළිලා හිස්ද එවා තලප්පු කළා.

"හදිස්සියක් උනොත් දුවන්නවත් ඇඳුමක් දගන්න." අම්මා දුවට තමන් හවස ඇඳගෙන හිටි ඇඳුම් ඇන්දුවෙ පුංචි ළමයෙකුට වගෙයි. ඒ දුව කසාද බැන්දට පස්සෙ අම්මා දුවගෙ ඇඟට අත තිබ්බාමයි. හරියටම අවුරුදු හතකුත් මාස හතකුත් දින හතකුත් ගෙවිලා. ඒත් පැය හතක්ද කියලා හරියටම හිතා ගන්න බැරි වුණා. දෙන්නම වෙලාව බැලුවෙ නැහැ. දුවට ඇඳුමක් ගේන්න ගිය වෙලාවෙ දෙදරීමක් තිබුණෙ නැති වුණාට පොඩි කම්පනයක් ඉතුරුවෙලා තිබුණා. මැරෙනවා නං එකට මැරෙන්නත් බේරෙනවා නං දුව බේරිලා තමන් ගියත් කමක් නෑ කියලත් මනෝරම්‍යාට හිතුණා.

මැද මිදුලෙ විශාල කොන්ක්‍රීට් රීප්ප අතරින් වතුර වැටුණා. ඒ හරියෙ හෙවිල්ලලා තිබුණු මැලේසියාවෙන් ගෙනාපු පිරමිඩ හැඩයෙ වීදුරු කුඩුවත් පුපුරන්න ඇති. වැස්සට එකතු වෙච්චි හුළඟ පොළොවත් අරගෙන ලොකු හදිස්සියකින් දුවන්න හදපු නිසා මහ ගස් විලාප නැගුවා.

"සාෂා කොහෙද ගියේ?" කියලා අම්මා ඇහුවෙ නෑ. වර්ණාසිට ඕන වුණේ ඒ වගේ මරණය ජීවිතයත් එක්ක සෙල්ලම් කරන වෙලාවක හරි මනෝරම්‍යා අම්මා කෙනෙක් හැටියට දුවගෙ ස්වාමිපුරුෂයා ගැන බයක් ඇති කර ගන්නවා දකින්නයි. ඒත් භූමිකම්පාවකින් කෙසේ වෙතත් එයා රට යන හැම වතාවකම ගුවන් අනතුරකින් හරි එයා නැතිවෙලා ගිහින් තමුන්ගෙ බෝනික්කා ආපහු ලැබෙනවා නං හොඳයි කියලා හිතෙනවා ඇති. සමහරවිට හැම උදයකම ඒ ප්‍රාර්ථනාව කරනවා ඇති කියන හිතුවිල්ල ක්ෂණයකින් දුව අම්මගෙන් ඈත් කරා.

අම්මට දැනුණා දුවගෙ යටි හිතේ එක පාරටම ගිනි පුපුරක් රතු පාටට උඩට මතුවෙලා තමයි කියලා. පුංචි කාලෙ ඉඳන් වර්ණාසිගෙ උඩු හිතට යමක් දැනෙන්නත් කලින් අම්මා එයාගෙ හිත අඳුන ගත්තා. අම්මා නිතර ගමේ නාවත් ඒ ඉව අම්මට තිබුණා. වර්ණාසි ඒ ඉවට ප්‍රිය වෙච්චි කාලෙ නං "හා හොඳයි දූං මං හිතන්නෙ මොනවද කියන්න" කියලා අහනවා. ඒක සැහෙන්න ලොකු වෙනකල් අම්මයි දුවයි කළ සෙල්ලමක්. අනිත් සෙල්ලම

තමයි ඇත් [illegible] පෙනුණෙ ලස්සන වර්ණ [illegible] කියන
අම්මට [illegible] පෙනුණ [illegible]
දුවට එහෙම පැහැදිලි [illegible]

"අම්මා බොරු කියන්නෙ. අම්මා ෆිල්ම්ස් බලනවා වගේ හිත හිතා කියනවා ඇති." දුව කෑ ගහනවා.

"නෑ ඇත්තටම එක එක දේවල් පේනවා. ඔයා වෙන වෙන දේවල් හිතන්නෙ නැතුව හිටියොත් ඔයාටත් පෙනෙයි."

ඒ භූමිකම්පාව දවසෙ අම්මටයි දුවටයි දෙන්නටම ඒ පරණ කතා මැවුණා. ඇහුණා. රිදුණා. දැනුණා. ඒත් දෙන්නම ඒ ගැන එකිනෙකාට කියන්න උත්සාහ කරේ නෑ. වර්ණාසි නං අම්මාගෙ කාලෙට වක්කඩ කැඩුවා වගේ කතා කරන කෙනෙක් නෙවෙයිනෙ.

"ඔගොල්ලන්ගෙ අම්මා ඔයා එක්ක කතා අඩු කරාට වෙන මිනිස්සු එක්ක ඉස්සර වගේම කියවනවා ඇතිනෙ." දවසක් සාෂා කිව්වා.

"නෑ..... මං හිතන්නෙ අම්මා දැන් වැඩිය කොහෙවත් යන්නෙත් නෑ. ඉස්සර හිඤකසයා වගේනෙ. මං හිතන්නෙ යාළුවන්ට ඊ-මේල් යවන්නෙත් යලට මහට වෙන්නැති." සාෂා එක්ක කතා කරනකොට දුව හැම වෙලාවෙම අම්මාගෙ පැත්ත ගත්තා. දුවයි අම්මා එක්ක විශාල තරහාවකුත් තිබුණා. ඒ තරහව නිසා තියෙන වෙන කතාවල් අස්සෙන් ඇනුම් පදත් කිව්වා. අම්මා බලාගෙන ඉන්නෙ තමුන්ට වැරදිලා අඬාගෙන එනකල් කියලයි දුවට හැම වෙලාවෙම හිතුණෙ. කවද හරි එහෙම තත්ත්වයක් උද වුණත් අම්මට අහවන්නෙ නෑ කියලා දුව අධිෂ්ඨාන කරගෙනයි හිටියෙ ඒ සතුට අම්මට විඳින්න දෙන්නෙ නෑ නැමයි.

"මං කිව්වෙ ඔය ටික තමයි. කෝ ඔයා ඔය මිනිස්සු අත්ටවෙලානෙ හිටියෙ." කියලා කියන්න ඉඩ දෙන්නෙ නැත්තෙ අම්මාගෙ මුරණ්ඩු හිත හින්ද තමයි. උදේ හවා එයාගෙ අහංකාර හරි යන්න කියලා ප්‍රාර්ථනා කරනවා ඇති කියලයි සාෂා කියන්නෙ.

ඒ මොහොතෙ අම්මා හිතමින් හිටියෙ සාෂා ගැන නෙවෙයි. දුවගෙ ගෙදර හිතේ හැටියට ඉන්න ඉඩ තියෙද්දිත් මනෝරමා හිටියෙ ඒ කිට්ටුව විශාල පරණ ගෙදරකින් පොඩි කොටසක

කුලියට අරගෙනයි.

"දුව වුණත් බැන්දට පස්සෙ තනියම නිදහසේ ඉන්න ඉඩදෙන්න ඕන." කියලයි මනෝරමාගෙ ගෙවල් අයිති මායා සේනානායකට කියලා තිබුණෙ.

මනෝරමා දුවගෙ ගෙදරට ආවෙ සාෂා නැති වෙලාවට විතරයි. රට ගිය කාලෙට තමයි ඊ ගත කරන්න එන්නෙ. එහෙම නැත්නම් දනයක්, උත්සවයක් තිබුණත් මනෝරමා නෙවෙයි ඒ පැත්තෙ එන්නෙ. වර්ණාසිගෙ ගෙදරත් මනෝරමාගෙ ගෙදරත් වැඩ කරේ මැදිවියේ ලිනට් තමයි. ඒ නිසා වර්ණාසි නොකිව්වත් උත්සව දවසට මනෝරමාට කෑම පෙට්ටි ටිකක් යවන වැඩේ ලිනට් අතපසු කළේ නැහැ. හැබැයි බෑනාගෙ උපන්දිනේ දවසට නං "මට එපා මං කෑවා" කියලා බොරුවට හරි කියන බවත් ලිනට් දැනගෙන හිටියා. ලිනට්ට වැඩිය සලකන්නෙ දුව නෙවෙයි අම්මයි. ඒ නිසා නොදැනුවත්වම වගේ ලිනට් ගත්තෙත් අම්මගෙ පැත්ත. ඒ අම්මයි දුවයි කවදවත් එකිනෙකාට විරුද්ධව ලිනට් එක්ක කිසි දෙයක් කිව්වෙ නැහැ. ඒත් ලිනට් මනෝරමාගෙ ගේ අතුගාලා, දූවිලි පිහලා, අස්කරන අතරතුර රෙදි හෝදලා මදින අතරතුර එහෙමත් නැත්තං සිංහල පත්තර උඩින් පල්ලෙන් බලන අතරත් වර්ණාසිලගෙ ගෙදර වෙන හැම දෙයක්ම කියනවා.

"අද මහත්තයා කෑම ගෙනියන්නෙ නෑ කියලා කිව්වා."

"මේ ටිකේම මහත්තයා ඊ කෑමට නෑ කිව්වෙ."

"ඔන්න අද මහත්තයා ගෙදර. මං යනකොට අපේ මිස්ව කරේ තියන් මිදුලට අරගෙන යනවා. මට බය හිතුණා පඩියෙන් පහළට වැටෙයි කියලාවත්."

"ලොකු මිස් වගේ තමයි අහරෙ මිසුත්..... හැමදම මැල්ලුම් ඕනමයි."

ලිනට්ගෙ කතාවලට හූමිටි තිබ්බෙ නැති උනත් අවධෛර්ය කිරීමක් සිද්ධ වුණෙත් නැහැ. ඒ නිසා දුවගෙ ගෙදර සිද්ධ වෙන දේවල් අම්මාටත් යම් ප්‍රමාණයකට දැනගන්න ලැබුණා.

අම්මාගෙ ගෙදර ලොකු රවුම් කුලුණු තියෙන පළල

ඉස්තෝප්පුවෙන් සාලයක් බවට පත් කළ දිග නිදන කාමරයක් කලකට ඉස්සර තිබ්බ ගෙයක්ව තිබිලා පසුව නිදන කාමරයක් බවට පත් කරමින් කුඩා ජනේලය කඩලා විශාල වීදුරු ජනේලයක් එකතු කළ යාබද නාන කාමරයක් තියෙන නිදන කාමරයත් එක්ක ගබඩා කාමරයක් කුස්සියක් කරල තියෙනවා. ඒ නිදන කාමරවල මැදපු ගඩොල් බිම කඩලා ටයිල් අල්ලලා දෙන්න ඇහුවම මනෝරම්‍යා එකහෙලා ප්‍රතික්ෂේප කළා. පළල බිත්තිත්, ජනෙල් දෙරවල් උඩින් මිදි පොකුරු කැටයම් කළ අර්ධ කවාකාර වා කවුළුත් විශාල වීදුරු දෙරවල් ලී දෙරවල්වලට පරිවාරෙට තියෙන නිසා ආරක්ෂාවත්, ආලෝකයත් ලැබුණු ඒ ගේ කැල්ලට මනෝරම්‍යා හුඟාක් පුරුදුවෙලා හිටියා. ප්‍රධාන ගෙය පැත්තකින් චූටි දම්පාට මල් පිපෙන වැටකින් මිදුල වෙන්කරලා වෙනම ගේට්ටුවක් දලා තියෙන නිසා මාසෙකට වතාවක් ගෙවල් අයිතිකාර මායා නෝනා බැහැ දැකීම හොඳටම ප්‍රමාණවත් වුණා. මිදුලෙ කොණක තිබුණු පරණ බොලොක්ක ළිඳෙන් වතුර ඇදගෙන නෑම මනෝරම්‍යාට ප්‍රීතිමත් ව්‍යායාමයක් වුණාට ලිනට් නං හිතුවෙ සැප තිබුණත් විඳින්නෙ නැති මෝඩකමක් හැටියටයි. ඒ ගෙදර තිබුණු එකම ප්‍රශ්නෙ කොච්චර හැදුවත් සිංහල උළු වහලෙ තැනින් තැන තෙමීමයි. සමහර දවස්වලට නොහිතන තැන්වලින් තෙමෙනවා. එද දූවගෙ ගෙදරට එනකොට මනෝරම්‍යා නිතර තෙමෙන තැන්වලට බේසම් තියලයි ආවෙ. ඒ උනත් භූමිකම්පාව ඒ පරණ ගෙදරට කොයි විදියට බලපාල ද කියලා ගැනිට හිතා ගන්න බැරි වුණා. ඒත් ඒ ගෙදර කඩා වැටුණත් කරන්න දෙයක් නැහැනෙ. ඒ වගේ අවස්ථාවක දූව තනිකරලා යන්නෙ මොන අම්මද?

"පොත් තෙමෙනවා ඇති. රුචිරානියි මිනිස්ටරුයි බයේ ඇති" මනෝරම්‍යාට නිකම්ම කියවුණා. රුචිරානි කියන්නෙ මනෝරම්‍යාගෙ බැළලිට. එක සුදු ළපයක් තියෙන ඒ බැළලි මනෝරම්‍යා ළඟට අහම්බෙන් ආපු කෙනෙක්. ඇස් ඇරපු ගමන් කව්ද මිදුළට දලා ගිහින් තිබුණා. මුලදි නං බළල් පැටියව කාගෙ හරි ඇගේ ගහන්න හිතුවත් පස්සෙ පස්සෙ මනෝරම්‍යා උගෙ හුරු වුණා. පැටියා බැළලියක් කියලා කිව්වෙ ලිනට්.

"බැළලියෙක්ව ගන්න කවුරුවත් කැමති වෙන්නෙ නෑ මිසී." ලිනට්ගෙ ප්‍රකාශය මනෝරම්‍යාගෙ පපුවට පිහිපාරක් වගේ වැදුණා. ලිනට් කිව්වෙ ඕනම කෙනෙක් කියන දෙයක් වුණත් මනෝරම්‍යා ඒක උරා ගත්තෙ ස්ත්‍රී වර්ගයාට විරුද්ධ ප්‍රකාශයක් හැටියටයි. දික්කසාද වීමෙන්, වැන්දඹු වීමෙන්, බරපතල රැවටීමකට අහුවීමෙන්, දූෂණයට ලක්වීමෙන්, දෑවැද්දක් නැති වීමෙන්, රූප සම්පත්තියක් නැති කමින්, දෙමාපියො නැති වීමෙන් වගේ මොකක් හරි හේතුවකින් තමුන්ගෙ පවුල විසිනුත් සමාජයෙනුත් කොන්වෙන ගෑනියෙකුයි ඒ අනාථ බැළලියි අතර වෙනසක් නෑ කියලා මනෝරම්‍යා ඒ දවස්වල කාට හරි ලියලත් යැව්වා. මුලින් නිකම්ම "පූස්" වෙච්චි බැළලි ටිකක් ලොකු වෙනකොට ඇවිද්දෙ මෝස්තර නිරූපිකාවක් රූප රාජිනී තරගයකට වේදිකාවක ඇවිදිනවා වගේ කියලා කිව්වෙත් ලිනට් තමයි.

"එහෙනං මෙයාට රුචිරානි කියලා කියමු." ලොකු මිසී තියපු නම භාවිතයෙන් සම්මත වුණෙත් ලිනට් නිසයි.

"අපේ රුචිරානිට ගෙනියන්න මං වැලිහාල්මැස්සො දෙතුන් දෙනෙක් ගන්නවා" කියලා ලිනට් ඊට පහුවෙනිදම පොඩි මිසීට කිව්වෙ වැලිහාල්මැස්සො ඕනෑවටම නෙවෙයි. පොඩි මිසීගෙ ප්‍රතිචාර බලන්නත් එක්කයි.

"රුචිරානි?" අපේක්ෂිත ප්‍රශ්නය මතු වුණා.

"අපේ ලොකු මිසීගෙ අලුත්ම බබා."

ඒ කතාව කෑම කමින් හිටිය සාෂාටත් ඇහෙන්න ඇති බවත් මිනිහා මනෝරම්‍යා දෝණියන්දත් එක්ක තරහට කවුරු හරි කෙල්ලෙක් හද ගන්න අරගෙන ඇති කියලා හිතන වගත් ලිනට්ට හිතුණා. මනෝරම්‍යා කියන්නෙත් එහෙම දෙයක් කරන්න බැරි ගෑනියෙක් නෙවෙයිනෙ. මිනිහා දන්නෙම නැතුව කන ගමන් කියවමින් හිටි සැගරාව මේසෙට පාත් වෙලා කන්දෙක කුස්සියෙ කතාවට තදින් යොමු වෙන්න ඇති කියලා වර්ණාසිට හිතුණෙ නැතුවට ලිනට්ට දැනුණා.

"හා හොඳයි පොඩි මිසී හිතන්නෙ කවුරු කියල ද?" ලිනට් ඒ කතාව රස විඳින්න පටන් අරගෙන තිබුණා.

ඉස්තෝප්පුවෙත් සාලයක් බවට පත් කළ දිග නිදන කාමරයක් කලකට ඉස්සර තිබිරි ගෙයක්ව තිබිලා පසුව නිදන කාමරයක් බවට පත් කරමින් කුඩා ජනේලය කඩලා විශාල වීදුරු ජනේලයක් එකතු කළ යාබද නාන කාමරයක් තියෙන නිදන කාමරයත් එක්ක ගබඩා කාමරයක් කුස්සියක් කරල තියෙනවා. ඒ නිදන කාමරයෙ මැදපු ගඩොල් බිම කඩලා ටයිල් අල්ලලා දෙන්න ඇහුවම මනෝරම්‍යා එකහෙලා ප්‍රතික්ෂේප කළා. පළල බිත්තිත්, ජනෙල් දොරවල් උඩින් මිදි පොකුරු කැටයම් කළ අර්ධ කවාකාර වා කවුළුත් විශාල වීදුරු දොරවල් ලී දොරවල්වලට පරිවාරෙට තියෙන නිසා ආරක්ෂාවත්, ආලෝකයත් ලැබුණු ඒ ගේ කැල්ලට මනෝරම්‍යා හුඟාක් පුරුදුවෙලා හිටියා. ප්‍රධාන ගෙය පැත්තකින් චූටි දම්පාට මල් පිපෙන වැටකින් මිදුල වෙන්කරලා වෙනම ගේට්ටුවක් දලා තියෙන නිසා මාසෙකට වතාවක් ගෙවල් අයිතිකාර මායා නෝනා බැහැ දකීම හොඳටම ප්‍රමාණවත් වුණා. මිදුලෙ කොණක තිබුණු පරණ බොලොක්ක ළිඳෙන් වතුර ඇදගෙන නෑමත් මනෝරම්‍යාට ප්‍රීතිමත් ව්‍යායාමයක් වුණාට ලිනට් නං හිතුවෙ සැප තිබුණත් විඳින්නෙ නැති මෝඩකමක් හැටියටයි. ඒ ගෙදර තිබුණු එකම ප්‍රශ්නෙ කොච්චර හැදුවත් සිංහල උළු වහලෙ තැනින් තැන තෙමීමයි. සමහර දවස්වලට නොහිතන තැන්වලින් තෙමෙනවා. එදා දුවගෙ ගෙදරට එනකොට මනෝරම්‍යා නිතර තෙමෙන තැන්වලට බේසම් තියලයි ආවෙ. ඒ උනත් භූමිකම්පාව ඒ පරණ ගෙදරට කොයි විදියට බලපාල ද කියලා ගැනීට හිතා ගන්න බැරි වුණා. ඒත් ඒ ගෙදර කඩා වැටුණත් කරන්න දෙයක් නැහැනෙ. ඒ වගේ අවස්ථාවක දුව තනිකරලා යන්නෙ මොන අම්මද?

"පොත් තෙමෙනවා ඇති. රුවිරානියි මිනිස්ටරුයි බයේ ඇති" මනෝරම්‍යාට නිකම්ම කියවුණා. රුවිරානි කියන්නෙ මනෝරම්‍යාගෙ බැළලිට. එක සුදු ළපයක් තියෙන ඒ බැළලි මනෝරම්‍යා ළඟට අහම්බෙන් ආපු කෙනෙක්. ඇස් ඇරපු ගමන් කවිද මිදුලට දලා ගිහින් තිබුණා. මුලදි නං බළල් පැටියව කාගෙ හරි ඇඟේ ගහන්න හිතුවත් පස්සෙ පස්සෙ මනෝරම්‍යා ඌට හුරු වුණා. පැටියා බැළලියක් කියලා කිව්වෙ ලිනට්.

"බැළලියෙක්ව ගන්න කවුරුවත් කැමති වෙන්නෙ නෑ මිසී." ලිනට්ගෙ ප්‍රකාශය මනෝරම්‍යාගෙ පපුවට පිහිපාරක් වගේ වැදුණා. ලිනට් කිව්වෙ ඔනම කෙනෙක් කියන දෙයක් වුණත් මනෝරම්‍යා ඒක උරා ගත්තෙ ස්ත්‍රී වර්ගයාට විරුද්ධ ප්‍රකාශයක් හැටියටයි. දික්කසාද වීමෙන්, වැන්දඹු වීමෙන්, බරපතල රැවටීමකට අහුවීමෙන්, දූෂණයට ලක්වීමෙන්, දෑවැද්දක් නැති වීමෙන්, රූප සම්පත්තියක් නැති කමින්, දෙමාපියො නැති වීමෙන් වගේ මොකක් හරි හේතුවකින් තමුන්ගෙ පවුල විසිනුත් සමාජයෙනුත් කොන්වෙන ගෑනියෙකුයි ඒ අනාථ බැළලියි අතර වෙනසක් නෑ කියලා මනෝරම්‍යා ඒ දවස්වල කාට හරි ලියලත් යැව්වා. මුලින් නිකම්ම "පූස්" වෙච්ච බැළලි ටිකක් ලොකු වෙනකොට ඇවිද්දෙ මෝස්තර නිරූපිකාවක් රූප රාජිනී තරඟයකට වේදිකාවක ඇවිදිනවා වගේ කියලා කිව්වෙත් ලිනට් තමයි.

"එහෙනං මෙයාට රුවිරානි කියලා කියමු." ලොකු මිසී තියපු නම භාවිතයෙන් සම්මත වුණෙත් ලිනට් නිසයි.

"අපේ රුවිරානිට ගෙනියන්න මං වැලිහාල්මැස්සො දෙතුන් දෙනෙක් ගන්නවා" කියලා ලිනට් ඊට පහුවෙනිදම පොඩි මිසීට කිව්වෙ වැලිහාල්මැස්සො ඕනෑවටම නෙවෙයි. පොඩි මිසීගෙ ප්‍රතිචාර බලන්නත් එක්කයි.

"රුවිරානි?" අපේක්ෂිත ප්‍රශ්නය මතු වුණා.

"අපේ ලොකු මිසීගෙ අලුත්ම බබා."

ඒ කතාව කෑම කමින් හිටිය සාෂාටත් ඇහෙන්න ඇති බවත් මිනිහා මනෝරම්‍යා දෝණියන්දත් එක්ක තරහට කවුරු හරි කෙල්ලෙක් හදා ගන්න අරගෙන ඇති කියලා හිතන වගත් ලිනට්ට හිතුණා. මනෝරම්‍යා කියන්නේ එහෙම දෙයක් කරන්න බැරි ගෑනියෙක් නෙවෙයිනෙ. මිනිහා දන්නෙම නැතුව කන ගමන් කියවමින් හිටි සඟරාව මේසෙට පාත් වෙලා කන්දෙක කුස්සියෙ කතාවට තදින් යොමු වෙන්න ඇති කියලා වර්ණාසිට හිතුණෙ නැතුවට ලිනට්ට දැනුණා.

"හා හොඳයි පොඩි මිසී හිතන්නෙ කවුරු කියල ද?" ලිනට් ඒ කතාව රස විඳින්න පටන් අරගෙන තිබුණා.

"අනේ මං ඔය අම්මගෙ වැඩ හොයන්නෙ නෑනේ." පොඩි මිසී නිශ්ශබ්ද වුණා.

අන්තිමට විනාඩි පහක දහයක නිශ්ශබ්දතාවකට පස්සෙ ලිනට් රුචිරානි ගැන හැඳින්වීමක් කළා. ඒකට පොඩි මිසී කිසි දෙයක් කිව්වෙ නෑ.

"ඕගොල්ලන්ගෙ අම්මට කවුරු හරි හරකෙක් තෑගි දුන්නොත් උගට මහෞෂධ කියලා දන්නත් බැරි නෑ." එදා රෑ නිදා ගන්න ගියාම සාෂාට නැන්දම්මගෙ රුචිරානි මතක් වෙලා උපන් හිනාව පිට වුණේ එහෙමයි.

"ඇයි අම්මා ගැන කියන්නෙ ඔයත් එහෙමනේ. ඔයත් ඔය හැමෝටම එක එක නං පටබඳින්නෙ. ඔයාටයි අම්මාටයි තියෙන්නෙ හුගාක් එක වගේ කතා තමයි." වර්ණාසිගෙ සුසුම් ස්වරයෙ තිබුණෙ එච්චර හොඳට පැහෙන බැණාව පිළිගන්න බැරි තරම් නපුරු, මුරණ්ඩු, ආත්මාර්ථකාමී හිතක් අම්මට කොහෙන් ආවද කියන ප්‍රශ්නය එක්ලක්ෂ හැත්තෑ හත්වෙනි වාරයටත් දුනුණු නිසයි.

"ඕගොල්ලන්ගෙ අම්මාගෙ විදියට බැල්ලියෙකුට උනත් වර්ණාසි කියලා දන්න බැරි නෑ ඔයාට රිද්දන්න." සාෂා එහෙම කියනකොටම වර්ණාසිගෙ ඇස් දෙක වෙනස් වුණා. එච්චර වෙලා අම්මා ගැන අප්‍රසාදයෙන් වගේ පෙනුණු ඇස් එකපාරටම අම්මාගෙ පැත්ත ගත්තා.

"නෑ.... අම්මා කවදාවත් මට රිද්දන්න එහෙම දෙයක් කරන්නෙ නෑ. ඔය නාම තනියම වෙනම ඉඳගෙන සතීප කර ගන්න හදන්නෙ එයාට රිදිච්ච එකයි."

ඒ කතාව එක එක විදියට කී පාරක් නං කතා කරලා තියෙනව ද? කොච්චර මඩේ දද හේදුවත් එච්චරයි කියලා සාෂාත් නිතර කියනවා. ඒත් ඒ මාතෘකාවෙන් දෙන්නම නිදහස් වෙන්නෙත් නෑ. වෙලාවකට අම්මා ගැන යමක් කියවෙන්න ආවම වර්ණාසි හිතාමතාම ඒක පාලනය කර ගන්නවා.

මේසෙ යටදි එක පාරටම අම්මාගෙන් ඈත් වෙච්චි දුවට අම්මා ගැන දුක හිතුණා.

"රුචිරානි කොහේ හරි බේරිලා ඇති. මිනිස්ටර්ව දම්වැලෙන් බැඳලද එන්නෙ?"

"ඔව්.... නැත්තං මගෙ පස්සෙන් එනවනෙ. බැරි වෙලාවත් ඉස්සරහ වහලෙ කඩා වැටිල නං මිනිස්ටර්ට පැන ගන්නවත් විදියක් නෑනේ. අනිත් එක මෙහෙම දේවල් වෙනකොට සත්තුන්ට දැනෙන්නෙ මිනිස්සුන්ටත් කලින්නෙ. ඉතිං මිනිස්ටර් සෑහෙන වෙලාවක් උඩු බුරන්න ඇති."

"එළිය වැටුණම ගිහිං බලන්න."

"එළිය වැටෙනකල් ආයෙත් දෙදරන්න ගත්තෙ නැත්තං ඇති."

"මට කලබලෙට ෆෝන් එක ගේන්නත් බැරි වුණා."

"මගේ එකත් බිමට වැටෙන්ඩ ඇති." අම්මා එහෙම කියනකොටම දනගෙන හිටියා දුවට උවමනා වෙලා තියෙන්නෙ සාෂාට කතා කරන්න කියලා. බෑනා ගියෙ කොහාටද කියලා අහන්නවත් අම්මා උනන්දු වුණේ නෑ.

මුලදි නං සාෂා රට ගිහින් එනකොට අම්මාටත් ඒවා මේවා ගෙනාවා. ඒත් අම්මා ඒ තෑගි අතටවත් අරගෙන නොබලනකොට දුවගෙ හිත රිදුණා. අන්තිමට දුව අම්මගෙ උපන් දිනයටවත් සිංහල අවුරුද්දකටවත් තෑගි නොදී හිටියා. ඒත් අම්මා නං කොහේ ගියත් දුවට මොනවා හරි ගෙනාවා. දුව ඒවා ප්‍රතික්ෂේප කරේ නැහැ. ඒත් ඉඳහිටලා අම්මට ඇනුම්පද කිව්වා.

"මොකටද ඒවා මේවා උස්සන් එන්නෙ. සාෂා මට හැම දේම ගෙනත් දෙනවනේ."

දුවගෙ බැල්මෙ තියෙන්නෙ "ඇයි මගෙ සාෂාට මොනවා හරි ගේන්නෙ නැත්තෙ.... ඔහොම මිනිහෙක් දහකින්වත් හොයා ගන්න පුළුවන්ද?" කියන එකයි.

අම්මා ඒ බැල්ම කියවන්න දන්නෙ නැහැ වගේ හැසිරුණාට දුව දන්නවා අම්මා යටි හිතේ තියෙන දෙයක් උනත් කියවයි කියලා. ඒ වගේ වෙලාවට අම්මගෙ බැල්ම හිස් වෙනවා. දුවට අම්මගෙ මූණ කියවන්න බැරි වෙන නිසා පුපුවෙ ඉඳලා කුඩා

කණ්ණාඩියට හිත් දුමත් නැතිනම් වගේ දැනෙනවා. උඩුරු හිරවෙනවා. නෑ ගහලා අඩින්න ඕන වෙනවා. ඒත් ඔච්චමයක් උඩට නැගල ගියපු පුංචි කෑ ගහට බැරිලා ඇස් පියාගෙන ඉඳීමෙන් හෝ හාත කාමරයට බැදිලා වැටුමක් ඔතුරෙ දිගාවෙලා ඉඳීමෙන් හෝ ගින සිසිල් කර ගන්නවා මිසක් දුව ඒ කෝපය ශෝකය හැඩිය පෙන්නන්නෙ නැහැ. අම්මා නං එහෙම නොවෙයි. ශෝකය සඳහා හැඩියට වගුරලා වගුරලා තමයි එයා සන්සුන් වෙන්නෙ. ඒ වගින්වර රග දක්වන නාට්‍යයක් වගේ උනාත් දෙන්නම දන්නෙ නැහැ මේ නාට්‍ය නවත්ත ගන්නෙ කොහොමද කියලා.

"දැ සේරම නැවතිලා වගෙයි. අපි මොකටද මේසෙ යට වෙලා ඉන්නෙ?" වර්ණාසි එකපාරටම මේසෙ යටින් එළියට ගියේ පුංචි එකෙක් වගේ තමුන් බයවෙලා ඉන්නවා දකින්න අම්මා කැමති ඇති කියලා හිතිච්ච වේගෙටයි. පුපුරා හැලුණු වීදුරු ජනේලවලින් සිතිඳු සුදු කිර රෙදි පිටතට ඇදිලා හුළඟත් එක්ක දුවන්න හදලා වැස්සෙන් තෙත බරියං වෙලා පරාජය වෙලා ඇඹරෙන හැටි අම්මයි දුවයි දෙන්නම දක්කා. ඒ ඇස් අඳුරා හුරුවීමෙන් ද නැත්නම් වරින්වර විදුලි කොටපු නිසාද නැත්නම් තරු එළියෙන් ද කියලා දෙන්නටම තේරුම් ගන්න බැරි වුණා.

"මං උඩට යනවා. ඇඳ යට ෆ්ලෑෂ් ලයිට් දෙකක් තියෙනවනෙ. ඒවාත් අරගෙන මගෙ සෙල් එකත් හොයාගෙන එනවා. මොකක් හරි ඇඳුමකුත් හොයා ගන්න ඕන.... එළිය වැටෙනකොට පිටට ගිහින් බලන්න ඕන."

අම්මා දුව නවත්තන්න උත්සාහ කළේ නැහැ. ඒත් දුවගෙ පස්සෙන් උඩට නැග්ගා.

"මං කොයි වෙලාවෙ හරි මැරෙයි. එතකොට මේ ළමයා අර මිනිහා එක්ක තනි වෙනවා. කවදා හරි මේ ළමයත් මං වගේ තනි වෙයි. එතකොට මට වගේ නෙවෙයි මෙයාට කවුරුවත් නැති වෙයි. රස්සාවක්වත් නැතුව මෙයා තනි වෙයි... හිතේ තියෙන දෙයක් කාටවත් කියන්නෙත් නැති හින්ද හුගාක් අමාරු වෙයි."

මනෝරම්‍යාට දවසට සිය වතාවක් හිතෙන දේ ඒ වෙලාවේ සිහිවක් ගෙනාවා.

මොහොතකට කලින් අම්මාගෙ ගුණාංගයක් මිදෙන්න ඕන වෙච්ච අම්මාගෙ ආදරයට ඉඩ දෙන්න බැරි මුරණ්ඩුකමක් පහළ වෙච්ච දෝණියන්ද එක පාරට පඩි දෙක දෙක උඩට නගින කොට ඒ ආවේගයත් දිය වෙන්න ගත්තා.

"ඩබා මහොම ඉන්න. තෙමින් යන්න. ඔයා වැටෙයි." අම්මා ඒ කිසිම දෙයක් නොකීවට අම්මගෙ පපුවෙ තිබුණු වචන දුවට ඇහුණා. දුව දන්නෙම නැතුව නැවතිලා පස්ස බැලුවා. ඒ මොහොතෙ විදුලි කෙටුවා. ආයෙමත් පොළොව දෙදරුවා. අම්මා වැටුණා. දුව උඩට නගින අත්වාරුව තදින් බදා ගත්තා.

"පුතේ හැන්ඩ් රේලිං එකට හෙම එල්ලෙන්න එපා. ඒක ගැලවිලා විසිවෙන්න පුළුවන්..... බඩගාගෙන හරි පහළට එන්න." අම්මා කෑ ගැහුවා.

ඔන්න එතකොට දුවට තමන් උඩට නැග්ගෙ මොකටද කියන එකත් අමතක වෙන තරමට පපුව පිරිලා ඉතිරිලා පිටාර ගලන ආදරයක් දැනුණා. ඒකත් හුස්ම හිරවෙනවා වගේ හැඟීමක් වෙන්නෙ කොහොමද? අම්මාට තියෙන ගැඹුරු ආදරේ තරම දැනෙන්කොට ඒක පිළිගන්න බැරි තරම් පුදුමයක් එනවා. සාෂාට තියෙන ආදරෙත් ඒ වගේම පපුවෙ පිරෙන්න එන ස්වභාවයකින් දැනෙන වෙලාවල් තියෙනවනේ. ඒත් ඒ එකිනෙකට වෙනස් හැඟීම එකම විදියට දැනෙන්නෙ කොහොමද? වර්ණාසිට ඒක තෝරා බේරා ගන්න දන්නෙ නැති උනාට ඒ හැඟීම හොඳට පුරුදුයි. වෙනසකට තියෙන්නෙ ඒක සාෂාට පෙන්නනවා. අම්මාට පෙන්නන්න කැමති නෑ.

"වැටුණා නේද? තුවාල වුණාද?" දුව අම්මව බදා ගත්තා.

"මේසෙ යටට යං... බිම දිගේම යං...."

ඒ වෙනකොටත් බිමට වැටිලා තිබුණු පිත්තල බඩු බිම දිගේ පෙරළෙනවා ඇහුණා. අම්මයි දුවයි මේසෙ යට ගුලි වුණා. දෙන්නම එකට හුස්ම ගත්තා. අම්මාගෙ තුරුළෙ ආරක්ෂිත සුවයට දුවට කඳුළු බේරුණා. පුංචි කාලෙ සිකුරාද රෑට අම්මා එනකල් ආතම්මගෙ ඇඳේ හිටියත් කීයට හරි අම්මා ඇවිත් තුරුළු කර ගත්තම හීනෙත් වගේ දැනෙනවනේ. ආතම්මා රෑට ඇඟ හොඳන්නෙ නෑ. ආතම්මා

ළඟින් එන්නෙ බේත් තෙල්, හඳුන්කූරු, සැවැන්දරා වගේ සුවඳවල් මිශ්‍ර වෙච්ච උණුසුමක්. අම්මා එහෙම නෙවෙයි. කොළඹ ඉඳලා රෑ කීයට ආවත් නාලා, ඇඟපුරාම බේබි පියරු ගාලා, කන් පිටිපස්සෙ ඕඩිකොලොන් ගාලා මූණෙත් රෑට ගාන ක්‍රීම් ජාතියක් ගාලා තමයි නිදා ගන්න එන්නෙ. අම්මා ඒ කාලෙ ඔලුවට ගෑවෙ සුවඳ කවුදු තෙල් ජාතියක්. හුම්කම්පාවක් මැද කාටවත් කල්පනා වෙන්න බැරි අවැදගත් ප්‍රශ්නයක් දූගෙ හිතට ආවා.

"අම්මා ඒ කාලෙ ගාපු සුවඳ තෙල් දැං හොයා ගන්න නැද්ද?" ඒ ප්‍රශ්නෙත් දූව අහුවෙ නැහැ.

"ඔයා ඇයි මං වගේ විවෘතව කතා කරන්නෙ නැත්තෙ. හැමදේම ගිලගෙන ඉන්නෙ ඇයි?"

අම්මා අනන්තවත් එහෙම අහලා තියෙනවා. තමන්ගෙ කුසෙන් හැල්ලු වුණාට හොඳ නරක තෝරා බේරා ගන්න පුළුවන් ස්වාධීන ගැහැනියෙක් කියලා අම්මා තේරුම් ගන්නෙ නැත්තෙ ඇයි? එයාට රටේ ලෝකෙ හැම වැදගත් දෙයක් ගැනම ගැඹුරු විග්‍රහ ඉදිරිපත් කරමින් ලියන්න කතා පවත්වන්න දන්නවා. ඒත් තමන්ගෙ දෝණියන්දූගෙ හර්ද ස්පන්දනයෙ අහිංසක ගී තනුව ඇහෙන්නෙ නෑ. දැනෙන්නෙ නෑ. ආදරේ කියන්නෙ හුස්ම හිරවෙන තරමට දූ බදගෙන ඉඳීම ද? දම්වැලකින් ගැටගහගෙන යන හොඳට බූල් පීරලා, නියපොතු කපලා, මැක්කො අරන් දලා, නැම්පො කරලා, පියරු දලා, සුවඳ ගල්වලා කාර් එකේ දගෙන යන බැල්ලියෙක් ද? වර්ණාසි ඒ හිතුවිල්ල කවදාවත් වචන බවට පත් කළේ නැහැනෙ.

හුම් කම්පාව විනාඩි හතර පහකට වඩා තියෙන්න නැතුව ඇති. අම්මාට ඕන වුණා දූව තුරුළු කරගෙන ඉන්න. දූවගෙ හිතේ අර තරම් විශාල චෝදනා කඳු ගැහෙද්දිත් දූවටත් ඒ උණුසුම ඕන බව දැනුණා. ඒත් ඒ ළවමනාවත් එක්ක දූව කෝප වෙන්න ගත්තා. සාණා ගෙදර හිටියා නං දූවලා ගිහින් එයාගෙ ඇඟේ එතිලා ඒ කෝපය නිවා ගන්න තිබුණා.

"බලන්ඩකො අපේ මෑණියන්වහන්සෙට පුදුමාකාර මාතෘ ප්‍රේමයක් පහළ වෙලා මාව තුරුළුකරගෙන ඉන්න හදනවා."

"ඉතින් ඉව දෙන්නකො... ඔය ඉතිං තනි වෙච්ච ලෝකෙත් එක්ක තරහා වෙච්ච ගැහැනියෙක්නෙ. එයාට අනුකම්පා කරන්න." තැන්දම්මා කොයි තරම් තරහ විදියට සාණාව නොතකා හිටියත් සාණාගෙ මනුස්සකම එහෙමයි.

"එයා කවදා හරි මාව තුරුළු කර ගන්නවා වගේ ආදරෙන් ඔයාගෙ අත් දෙකෙන් හරි අල්ලලා මගේ දුව ඔයාට බාරයි කියලා කරුණාවෙන් කියන්න ඉගෙන ගන්න ඕන. එතකොට මාත් වෙනස් වෙනවා." ඒ ජවනිකාව රඟ දක්වුණු එක දවසක වර්ණාසි සාණාට එහෙම කිව්වා.

"වයසක ගැහැනියෙක්ගෙ තපුරුකං ගණන් ගන්න එපා. දැං මං බලන්න.... එයා ඔයාගෙ අම්මා හින්ද එයා මගේ මූණ බලන්නෙවත් නෑ කියල වෛරයක් නැතේ. ඉතිං ඒ වගේ සද්භාවයෙන් ඉන්න."

"මං කිසිම දේකින් ඔයාගෙයි අම්මාගෙයි තරමට කිට්ටු වෙන්න බැරි වෙච්ච සාමාන්‍ය ගැහැනියෙක්. ඒ හින්ද මට අම්මා තරං ආත්මාර්ථකාමී වෙන්නවත් ඔයා වගේ ලෝකෙටම ආදරේ කරන්නවත් බැහැ."

"මං ආදරේ වුණේ ඒ සාමාන්‍ය ගැනිටයි කියලා ඔහොල්ලන්ගෙ මෑණියෝවහන්සෙට තේරෙන්නෙ නැති එකනෙ වැඩේ. මං ඒ සාමාන්‍ය ගැනිට උදේ හවා ස්තෝත්‍ර කියලා දිව්‍යාංගනාවක් වගේ ගෞරවයෙන් පුද පූජා කරනවා කියලා තේරෙන්නෙ නැත්තෙ මං එයාගෙ තරහකාරයා හින්දයි. එයාගෙ බෝතික්කා උදුර ගත්තු තපුරු ළමයා මමයි. එයා ඒකට පැහැව පැහැව ඒකට එක කරන පොඩි ළමයෙක්. ඕක එක විදියක මානසික රෝගයක්. ඒ වගේ අයට අපි අනුකම්පා කරන්න ඕනි වර්ණාසි."

ඒ දීර්ඝ උත්තරය ඉවර වෙනකොට වර්ණාසි අම්මගෙ පැත්ත ගනිමින් හිටියා.

"අම්මට මානසික රෝගයක් නෑ. එයාට හම්බ වෙච්ච පිරිමි සේරම බොරුකාරයො හින්ද එයා කිසිම පිරිමියෙක් විශ්වාස කරන්නෙ නෑ. ඔයත් එහෙමයි කියලා හිතනවද දන්නෙ නෑ. දැං ඉතිං අපි මෙච්චර කල් හොඳට හිටියනෙ... ඒකම ඇතිනෙ එයා

වැරදියි කියලා තේරුං ගන්න."

"ඕගොල්ලන්ගෙ අම්මා හරි ආඩම්බරයි. එයාට වැරදුණා කියලා පිළිගන්න බැරි තරං අහංකාරයි."

"අනේ මං දන්නෙ නෑ... අපි වෙන දෙයක් කතා කරමු."

සාෂා දනගෙන හිටියා දුව අම්මට කොච්චර බැන්නත් තමන්ට දක්වන ආදරේට සමාන හරි ඊට ටිකක් වැඩියෙන් හරි අම්මාටත් ආදරෙයි කියලා. ඒකනෙ දුව දෙස් කිය කියා ඉඳලා හිටි ගමන් අනිත් පැත්ත ගහන්නෙ. අම්මගෙ මෝඩ මුරණ්ඩුකම හින්ද කවදහරි දුවගෙ හිතත් ගල් වෙන්න බැරි නෑ කියලත් මිනිහට වෙලාවකට හිතෙනවා. ඒත් එහෙම වෙච්චි දවසකට ඒ හිතුවිල්ලට යටින් එන සියුම් කෝපය තමන්ට එල්ල වෙන්න බැරි නැති බවත් සාෂාට තේරුණා. මනුස්ස හිත් වැඩ කරන්නෙ එහෙම පුදුමාකාර විදියකටනෙ. ඒත් දරුවො දෙන්නෙක් විතර හිටියොත් වර්ණාසි අම්මට තියෙන බැඳීම දරුවන්ට හරවන්න ඉඩ තියෙනවා. එතකොට අම්මාටත් බැනා ඉන්න වෙලාවට නැවිත් ඉන්න බැරි වෙනවා. ඒත් වර්ණාසිට දරුවෙක් පිළිසිඳෙන්න කල් යනවනේ. දොස්තරලා නං කියන්නෙ දෙන්නාගෙම කිසි ප්‍රශ්නයක් නෑ කියලයි.

"ඕගොල්ලන්ගෙ අම්මා කවද හරි අපි වෙන්වෙයි කියලා ඔට්ටු අල්ලලා ඉන්න එකේ දරුවෙක් ලැබෙන්න එපා කියලා උඩේ හවා ප්‍රාර්ථනා කරනවද දන්නෙ නෑ." මෙදා පාර ගෙදරින් පිට වෙන්න ලෑස්ති වෙනකොට සාෂා එහෙම කිව්වෙ වර්ණාසිගෙ කුස ඉඹින අතරයි.

"අනේ අපේ අම්මා නං කවදාවත් එහෙම හිතන්නෙ නෑ. එයාට ඕන නං මාව නැති කර ගන්න තිබුණානෙ. ඒත් එයා මිනිහෙක් නැතුව ළමයෙක් හදන්න බය වුණේ නැනේ. එහෙම එකේ දැං එහෙම හිතයි ද?"

වර්ණාසි සාෂාට එහෙම කිව්වට දැනුම් තේරුම් ඇති වෙනකොට තාත්තෙක් නැති වීම ගැන අම්මා එක්ක තරහක් ඇති කර ගත්තා.

වර්ණාසි පුංචි කාලෙ ආතම්මා ගමේ හැමෝටම කිව්වෙ රමණී මැණිකෙගෙ මහත්තයා පිටරටදි මැරුණා කියලයි.

මනෝරමාහට ගෙදරට කිව්වෙ රමණී කියලනෙ. ඒ ගමේ වෙන කවුරුවත් මනෝරමාහා කියලා දනවට බයටයි. ඒ දවස්වල පුංචි වර්ණාසි දනගෙන හිටියෙ නෑ අම්මගෙ ඇත්ත නම මොකද්ද කියලාවත්. තමුන්ගෙ නමත් බේබි කියලා හිතාගෙන හිටිය හින්ද ඉස්කෝලෙ ගිය අලුත කවුරුහරි නම ඇහුවම කියවුණේ බේබි කියලයි.

ආතම්මා හිටියෙ දෙහිඔවිට ඉඳලා දරණියගලට යන පාරෙ අක්කර පනස් ගණනක රබර්වත්තකයි. වලව්කාරයො නෙවෙයි. නමුත් ඒ වගේ පෙන්නගෙන ඉන්න පුළුවන් වුණේ ඒ කිට්ටුව හිටියෙ දුප්පත් නූගත් මිනිස්සු හින්දයි. ඒක සොයිසා පවුලට අයිති වෙලා තිබිලා පස්සෙ ආතාට ලියල දීපු ඉඩමක්. ඒ ඉඩමෙ එක මායිමක ආණ්ඩුවෙ කැලෑව. ඒ පැත්තත් කන්ද අනිත් පැත්තත් පොඩි කන්දක්. මැද්දෙන් වැටුණු පාර දිගේ වෙන වතුවල මිනිස්සුත් පයින් ගියා. පොඩි කන්දෙන් පාරට මායිම් වෙන අක්කර කාලකට ටිකක් වැඩි හරිය තරමකට සමතලා වෙලා. අත්තාසි පඳුරු කීපයකුත් තැඹිලි පාට මල් පිපෙන කෝමාරිකා වගේ හීතියට දිගට පිරුණු පත්‍ර තියෙන පඳුරු ගොන්නකිනුත් වැහුණු විශාල ගල් තලාවක් ගේ පිටිපස්සෙ තිබුණා. ආතම්මා වර්ණාසිට ඒකට නගින්න දෙන්නෙ නෑ නයි ඉන්නවා කියලා. ඒ හරිය පුරාණ යෝධයෙක් ගලක් උඩ ගලක් තියලා වහපු රවුම් ගල් පෙට්ටියක් වගේ හින්ද ගමේ හුඟ දෙනා විශ්වාස කරේ නිධානයක් තියෙන තැනක් කියලයි. ගම කිව්වට ගෙවල් මණ්ඩි තිබුණෙ ඇල ඉවුරත් තාර පාරත් අද්දර ඉඩම්වලයි වතුවලට ඉහළින් කැලේ කපා ගත්තු ඉඩම්වලයි විතරයි. අතරින් පතර පරණ ගම්කාරයන්ගෙ ගෙවල් තිබුණෙ විශාල වතුවලට මැදිවෙලා. මනෝරමාහා කියන්නෙ ඒ ගෙවල් උනත් හැදෙන්න ඇත්තෙ සුද්දෙ වතු වවන්න කැලෑ එළිකරනකොට පාතරටින් ආ මිනිස්සුන්ගෙන් වෙන්න ඇති කියලයි.

මනෝරමාහාගෙ තාත්තට ලැබිච්ච ගේ හදලා තිබුණෙ වත්තට ආ වෙලාවට අයිතිකාරයට දවස් දෙකක් ගත කරන්නයි. අනික් දවස්වලට ඒ ගෙදර ඉඳලා තියෙන්නෙ තාත්තගෙ අම්මයි, මාමයි, එක්ක තම තමන්ගෙ පවුල්වල ඉතිහාසයත්, රටේ පොදු නීතියත්, සමාජ කණ්ඩායම්වල නීතිය ඒ ඒ පවුල්වලට බල පෑ ආකාරයත්

ගැන ඉංග්‍රීසියෙන් පොතක් ලියලා තිබුණා. ඒක සිංහලයටත් නැඟුවේ "අවනීතියේ අවිනීත නීතිය" කියලයි.

ජිනවතී ඉස්කෝලෙ හාමිනේ ඒ පොත බලලා ඇඩුවෙ "ඉංග්‍රීසියෙන් මොනවා ලිව්වත් මොකද.... මේ කතා සිංහලෙන් ලිව්වම එයාටත් අවනම්බුයි නේද? අපි පාරෙ බැහැල යන්නෙ කොහොම ද?" කියමිනුයි.

වර්ණාසි නං පවුලේ ඉතිහාසය කියෙව්වෙ පුදුමයෙන්.

"මගේ ආතම්මා වතු අයිතිකාරයාගෙ අනියම් බිරිඳක් නොවේ යයි සිතන්නට මා ද සතුටු ය. මගේ තාත්තා ගේ තාත්තා මැරුණ යයි කියනවා විනා ඒ මැරණ මිනිහා ගේ ඡායාරූපයක් පමණක් නොව වෙනත් ලියවිල්ලක් හෝ නෑදෑයෙක් හෝ නැති නිසා මට ඒ තිත්ත ඇත්ත පිළිගන්නට සිදු වේ. එය තිත්ත වන්නේ රූමතියක් වූ ආතම්මා අනියම් බිරියක් වීම මදිපුංචිකමක් ලෙස සලකමින් නොවේ. එය තිත්ත වන්නේ තාත්තා තම පියාට මහත්තයා කියා අමතන්නට ඇති නිසා ය. කොළඹ සිටි නීත්‍යානුකූල විවාහයේ දරුවන්ට සහෝදරකම් නො තිබූ නිසා ය. ඔවුන් ශාන්ත තෝමස් විද්‍යාලයට හා ත්‍රිත්ව විදුහලට යන විට තාත්තා තල්දූවේ පාසලකින් කනිෂ්ඨය සමත් වී අවිස්සාවේල්ලෙන් ජ්‍යේෂ්ඨයෙන් එතෙර වෙමින් පේරාදෙණියෙ ගුරු විදුහලට ඇතුළත් වුණි. ඔක්ස්ෆර්ඩ් ගිය කොළඹ දරුවෝ දේපළ නැති නාස්ති කොට අකලට මිය ගිය පසු ද ඉතිරිව තිබූ කොළඹ, නුවර හා කුරුණෑගල දේපළ මහාභාරකාරයා යටතට පත්වන විට ඒවාට උරුම කියන්නට මේ අවජාතකයාට හැකියාවක් නො තිබිණ.

ඔහු තමාගේ ඉතිහාසය වටහා ගන්නට ඇත. එහෙත් එය කතා කරන්නට නම් කිසිදු ධෛර්යක් නො තිබිණි. මා කුඩා කාලයේදිත් ආතම්මා මගේ අම්මාට වඩා රූමත්ව සිටියා ය. අපේ අම්මා විශාල හදවතක් ඇති කලු මහත ගැහැනියකි. ගුරුවරියක වූ ඇය සැර පරුෂ පෙනුමක් තිබුණත් කුඩා ළමයෙකු තරම් අහිංසක ය. අවංක ය. අපේ තාත්තා තළවෙක් මෙන් කඩවසම් පැහැපත් උස මිනිසෙකි. ඔහු ඇතැම් අවස්ථාවල එතරම් අවංක නො වන්නට ද ඇත. අහිංසකයෙක් වූවා නම් ඒ තම මව ඉදිරියේ හා එසම දෝණියන්දෑ ඉදිරියේ පමණ ය."

"මේ ළමයට තේරෙන්නෙ නැද්ද මේවා මෙහෙම ලිව්වම තමුන්ගෙ දුවටත් ලජ්ජයි කියල. මං කොහොමද මගේ නෑයන්ට දන්න කියන අයට මූණ දෙන්නෙ?"

ආතම්මා ඒ සතිය පුරාම කියෙව්වා. ඒ සති අන්තයෙ අම්මා ගෙදර ආවෙ කිසි වගක් නැතිවයි. ආතම්මා අර පොත ගැන වචනයක්වත් කතා නොකර වෙනද වගේම "රමණී මැණිකෙට ගෙනියන්නත් එක්ක පොලොස් කඩහංකො සේදිරිස්" කියලා කිව්වා. වර්ණාසිත් අම්මට කිසි දෙයක් කිව්වෙ නැහැ. එහෙම ලියපු මනෝරම්‍යා තමන්ගෙ දුවගෙ ප්‍රේමයට ඔය තරම් විශාල විරෝධයක් එල්ල කරයි කියලා කව්ද හිතන්නෙ. එහෙම බලනකොට මනෝරම්‍යා එයාගෙ අම්මා ජිනවතී ඉස්කෝලෙ හාමිනේටත් වඩා සාම්ප්‍රදායිකයිනෙ. පසුගාමියිනෙ.

මනෝරම්‍යා ව කෑගල්ල කන්‍යාරාමයේ නවත්තලා උගන්නන්න ඕන වෙලා තියෙන්නෙ එයාගෙ තාත්තා ඩේවිඩ්සන් පෙරේරා ඉස්කෝලෙ මහත්තයාටයි. තුනේ පන්තියෙ ඉඳලා කෑගල්ලෙ කන්‍යාරාමයේ ඉගෙන ගත්තු මනෝරම්‍යාට පියානෝ ගහන්නත් උගන්නන්න කියලා ලොකු සිස්ටර්ට කිව්වෙත් ඩේවිඩ්සන් උන්නැහේමයි.

"සිස්ටර් මට මෙයාව හොඳට ඉංග්‍රීසි දන්න හොඳට පියානෝ ගහන, හොඳට මැහුම් ගෙතුම් දන්න කෙනෙක් කරලා දෙන්න." කියලා තාත්තා කියනවා මනෝරම්‍යාට හොඳට මතකයි.

මනෝරම්‍යා ඒ කතා දුවට විස්තර කරලා තියෙන හින්ද දුව ඒවා බැනාටත් කියලා තියෙනවා.

"අපේ අම්මා ඉංග්‍රීසියි, පියානෝ ගැහිල්ලයි නැතුව මැහුම් ගෙතුම් විතරක් ඉගෙන ගත්තා නං හොඳයි කියලා ආතම්මා ඒ කාලෙ කියනවා. එහෙම වුණා නං එයාටත් මේ මං වගේ අපේ ආතම්මා වගේ හොඳ සන්සුන් ජීවිතයක් ගත කරන්න තිබුණා." වර්ණාසි අම්මා එක්ක හොඳටම තරහා ගිය වෙලාවක සාෂාට එහෙම කිව්වා.

"පිස්සුද බේබි.... ඕගොල්ලන්ගෙ අම්මා ඔයාගෙවත් ආතම්මාගෙවත් මොඩල් එකේ නෙවෙයි. සමහර විට එයාට

ඇත්තෙ අර නෑකම් නොදන්න පොහොසත් පවුලෙ ජාත වෙන්නැති." සාෂා කියන කතාවෙත් ඇත්තක් ඇති.

භූමිකම්පාවක් වෙලාවට මරණ බය දැනෙන්න ඕනනෙ. ඒත් වර්ණාසිටයි මනෝරම්‍යාටයි දෙන්නාටම පරණ සිදුවීම් මැවිලා පෙනුණා මිසක මැරෙයි කියලා නං හිතුණෙ නැහැ. මනෝරම්‍යා නං හිතුවෙ මැරුණත් දුවත් එක්කම මැරෙන හින්ද ඒක සහනයක් කියලයි. බැරි වෙලාවත් වහළ කඩා වැටුණොත් දුවට තුවාලයක් නොවෙන්න දුවව වහගෙන ඉන්න ඕන කියල අම්මා හිතුවා.

"එක අතකට මං මෙච්චර බය වෙන්නෙ මොකට ද? කවද හරි මං එයාට ඉස්සෙල්ලා මැරෙන්න එපායැ. එයාට සාෂාගෙන් වෙනස්කමක් උනොත් එයා ඔය ඉන්න හීන ලෝකෙන් නැගිටලා වට පිට බලයි. දං මේ ඉන්නෙ තමුන්ගේම හැංගිච්ච සුවච කීකරු භාර්යාවක්නෙ." ඊට කලිත් අනන්තවත් ඒ හිතුවිල්ල පහළ වෙලා තිබුණට මනෝරම්‍යාට දුව අත ඇරලා යන්න හිත හදා ගන්න අමාරු වුණා.

"ඕගොල්ලන්ගෙ අම්මා කුලී ගේ කැල්ලකට වෙලා දුවව ආරක්ෂා කරන්න හදන්නෙ හරියට මුළු ජීවිතේම දුව ළඟට වෙලා හිටිය කෙනෙක් වගේනේ." සාෂා වෙලාවකට එහෙම කියනවා.

"අම්මා කැමැත්තෙන් උවමනාවෙන් දුරස් වෙලා හිටියා නෙවෙයිනෙ. අම්මාට ඕන වුණේ තාත්තෙක් නැති අඩුව නොදනෙන විදියට මට උගන්නන්න සල්ලි හොයන්න." වර්ණාසි සාෂාට එහෙම කිව්වට අම්මාට කියන්නෙ එහෙම නෙවෙයි.

"අම්මා හදන්නෙ තමුන්ට ඉවර කර ගන්න බැරි වෙච්චි හීන මට කියලා සම්පූර්ණ කර ගන්න." දිගටම ඉගෙන ගන්න බෑ කියලා අම්මා එක්ක ලොකුම අමනාපය ඇති වෙච්චි දවසෙ වර්ණාසි පුරුදු සන්සුන් ස්වරයෙන්ම එහෙම කිව්වම අම්මා ඉකි ගහ ගහා ඇඩුවා.

"අඬන්නෙ මොකටද? මං කැමති නෑ ඔය එක එක තැන්වල රස්සාවල් කරන්න. මට ඕන කසාද බැඳලා හොඳ ගෙදරක් පවත්තගෙන යන හොඳ ගෑනියෙක් වෙන්න විතරයි."

ඒ කතාවට මනෝරම්‍යා පිස්සුවෙන් වගේ හිනා වුණා. ජීනවති

ඉස්කෝලේ හාමිනේ මිනිබිරීගෙ කටට අත තියලා වැහුවා. දුව ඇදගෙන මිදුලට ගියා. ඒ සති අන්තයෙ අම්මයි දුවයි කතා කරේ නැහැ. ඒ වුණාට අම්මා දුකෙන් ඇඳට වැටිලා හිටියෙ නැහැ. මහ ගෙදර පින්තූර ගත්තා, ආතම්මගෙ පින්තූර, කිරි කපන ගෑනුන්ගෙ පින්තූර ගන්නවත් පෙනුණා. උඩහා කැලෙ පැත්තටත් ගියා. "දිය බල්ලො ඉන්නවා ද බලන්න සියදෝරිස්ලගෙ තොටුපළට යනවා" කියනවත් ඇහුණා.

දුව කොයි තරම් නිශ්ශබ්ද වුණාද කිව්වොත් ආතම්මාටවත් කතා කරේ නෑ.

"හිතට තරහක් ආහම වචනයක් පිට කරන්ඩ කලියෙං හිතෙන් සීයට ගනින්න ඕන පුතේ." ආතම්මා පුංචි කාලෙ ඉඳලා මිනිබිරීට එහෙම කියලා දීලා තිබුණා. අපරාදෙ කියන්න බැහැ මිනිබිරිත් ඒක පිළිපැද්ද. කිසිම පදනමක් නැතිව අම්මා සාෂාට අකමැති වුණාම විතරයි ඒ පුහුණුව දෙදරලා ගියේ. ඒත් වර්ණාසිට පුළුවන් වුණා විසිරුණු සිතුවිලි එකතු කරගෙන පිටතින් සන්සුන් වෙන්න. තමුන් අම්මට එහෙම කතා කරපු එක වැරදි බව දුවට දැනුණා. අම්මා දිය බල්ලන්ගෙ පින්තූර ගන්න යනකොට එකතු වෙන්න උවමනාව තිබුණා. උඩහා කැලේට යන කොට වෙනද වගේ අලුවා ටිකක්, නාරං ගෙඩි හත අටක්, චොක්ලට් එකක් හෙම රෙදි මල්ලක දගෙන අම්මා එක්ක කතා කර කර යන්න ඕන කමත් දැනුණා. ඒත් සාෂාගෙ ආදරේ යට කරගෙන නැගී හිටින්න අම්මට ඉඩ දෙන්නෙ නෑ කියන මුරණ්ඩුවත් ආවා. අම්මට රිද්දවන්නෙත් නැතුව තමුන්ට රිද්ද ගන්නෙත් නැතුව ආතම්මගෙ ඔලුව අවුල් කරන්නෙත් නැතුව ඉන්න නං පූර්ණ නිශ්ශබ්දතාව ඇරෙන්න වෙන උපක්‍රමයක් දහ නව හැවිරිදි ගෑනු ළමයට හිතා ගන්න බැරි වුණා.

"ඔයා සද්ද නැතුව ඉන්න එක හොඳයි. කතා කරලා නං ඕගොල්ලන්ගෙ අම්මා එක්ක දිනන්න කවදාවත් බැරි වෙයි. අන්තිමට එයා කතාවෙන්ම ඔයාගෙ හිත වෙනස් කරයි." සාෂා කිව්වා.

"නෑ.... අම්මා නෙවෙයි මෙච්චර කාලයක් කොහේ හරි ඉඳලා කොහොම හරි එයි කියලා බලාගෙන හිටිය තාත්තා ඇවිත් කිව්වත්

මං වෙනස් වෙන්නෙ නෑ."

ඒ පාර සාෂා හිනාවෙලා එයාගෙ විශාල ඇස්දෙකෙන් වර්ණාසිව මන්මත් කරවමින් මූණ ගෑවෙන තරමට කිට්ටු කරගෙන උරහිස් මිරිකගෙන විනාඩි පහක් විතර නොසෙල් වී හිටියා. හැමදාමත් වෙනවා වගේ වර්ණාසි ඒ බැල්මට පරාද වෙලා සාෂාගෙ පපුවෙ ඔළුව තියාගෙන එයාගෙ හර්ද ස්පන්දනය අහගෙන හිටියා. ඒක කොයි වෙලාවකවත් වෙනස් වෙන්න නැහැනෙ. හරියට පපුව ඇතුළෙ ඉන්නෙ සාෂා නෙමෙයි වගෙයි.

"ඔයා නොලැබුණත් ඒකට මූණ දෙන්න හිත පදම්කරගෙනයි මෙක පටන් ගත්තෙ. ඒක හින්ද මොන තත්ත්වෙකදි උනත් මං ඇතුළෙන් සන්සුන්" කියලයි සාෂා කියන්නෙ. එච්චර හොඳ මිනිහවෙන මනෝරමාට පිළිගන්න බැරි වුණේ.

මේසෙ යටට වෙලා ඉන්න ඕන නෑ කියන තරමට දෙදෙනා නැවතුණා. වැස්සත් අඩු වෙගන ගියා. ඒත් ඇස් පියාගෙන හිටිය වර්ණාසි යාන්තමට නින්දට වැටෙමින් හිටි නිසා මනෝරමාත් දුව ළඟින් ඇලවෙලා හිටියා. තමුත් එකනින් අහක් වුණොත් උණුසුම වෙනස්වීමෙන් දුවත් නැගිට ගනියි කියන බයට මනෝරමා ඇඳ රෙද්ද විදගෙන එන ටයිල්වල සීතලත් ඉවසාගෙන හිටියා. ඒ මේසෙ පුටුවල කුෂන් නැහැනෙ. ඒක සාෂා විශේෂයෙන් හදවපු රට තේක්ක මේස පුටු කට්ටලයක්. ඒ පුටුවල ලී මැදලා සිනිඳු කරලා යාන්තමට බොකු ගස්සවලා තියෙන සුවදායක විදියට කුෂන් පුටු පරාදයි.

"ඇත්තටම ඇයි මං මේ මිනිහට ළමයා එක්ක නිදහසේ ජීවත් වෙන්න ඉඩ දීලා වෙන කොහාට හරි යන්නෙ නැත්තේ? අංගුලිමාලත් රහත් වෙච්ච එකේ සාෂාත් වෙනස් වෙන්න ඇතිනෙ. දුවට කරදරයක් වුණොත් කොයි ලෝකෙන් හරි එන්න බැරියා..."

මනෝරමාගෙ හිතත් වේගයෙන් වැඩ කරමින් තිබුණා. ජීනවතී ඉස්කෝලෙ හාමිනේ උඩ ඉඳන් ඇවිත් පඩි පේළියේ බලාගෙන ඉන්නවා වගේ දැනුණා.

"අම්මා මැරෙනකල්ම මට අම්මව අඳුන ගන්න බැරි වුණ ඒ වගේ තමයි [illegible]

මනෝරමා සුසුම් හෙළුවා.

ජීනවතී ඉස්කෝලේ හාමිනේ අවතාරයක් හැටියට හරි එනවා නං බදාගෙන අඬලා කියා ගන්න බැරිව හිටිය අමාරු කාරණා සේරම කියලා "මං මොකද කරන්නෙ මගෙ අම්මෙ?" කියලා අහන්න පුළුවන්.

මහ ගෙදර දිග ඉස්තෝප්පුවෙන් ගෙට ඇතුළු වෙන්න මහ දොරවල් තුනක් තිබුණා. දොරකඩවල්වලට රාමු වෙච්ච පින්තූර දොරවල් තුනක් තිබුණා. දොරකඩවල්වලට රාමු වෙච්ච පින්තූර වගේ ජීනවතී ඉස්කෝලෙ හාමිනෙයි තමනුයි දුවයි පේළියට හිටගෙන ඉන්නවා මනෝරමාට මැවිලා පෙනුණා විශාල තෙල් සායම් චිත්‍ර තුනක් වගෙයි. ජීනවතී ඉස්කෝලෙ හාමිනේ තීන් නිල් මල් විසිරිච්ච ඔසරියක් ඇඳගෙන. මිටියි, කලුයි, මහතයි කිව්වම ලස්සන කියන වචනෙ පාහෙන්නෙ නැති වුණාට මනෝරමාට තමුන්ගෙ අම්මා ලස්සනට පෙනුණා. අම්මගෙ ඇස් විශාලයි. දිගටියි. ගැඹුරුයි. පැය විසි හතරම උතුර උතුර යන පැහැදිලි පොකුණක් වගේ කරුණාව උතුරනවා. අම්මාට තරහා ගිය දවසක් මතක් කරන්නවත් බැහැ. මනෝරමා හිතාගෙන හිටියෙ අම්මා තරහව අඳුනන්නෙ නැහැ කියලයි. අම්මා මැරුණාට පස්සෙ තමයි තරහවට තමන් යට කර ගන්න නොදී ඉන්න කොයි තරම් උත්සාහ කළා කෙනෙක්ද කියන එක් දැන ගත්තෙ.

ඒ මහගෙදර ඉස්තෝප්පුවෙ වම් පැත්තෙ දොරටුවෙන් ඇතුළු වුණාම තියෙන්නෙ කන්තෝරු කාමරයක්. ඒකෙ බරපතල පරණ මේසයකුත්, ඒකට ගැලපෙන මිදි පොකුරු කැටයම් කළ පුටුවකුත් ගෙදර හදපු කුෂන් එකක් දාපු ඇඳි පුටුවකුත් පොත් රාක්ක, වීදුරු අල්මාරි මැද වැඩ හිටින ඩේවිඩ්සන් ඉස්කෝලෙ මහත්තයාගෙ කලු සුදු ඡායාරූපයකුත් තියෙනවා. මනෝරමාට මතක ඇති කාලෙ ඉඳන් බිත්තියෙ තිබුණේ වික්ටෝරියා රැජනගෙ පින්තූරයක්. එයා තරුණ වයසෙදි ඒක ගලවලා වීසි කරන්නත් හැදුවා. ඒත් පස්සෙ හිතුණා අම්මා ඉන්නකල් තාත්තාගෙ කන්තෝරු කාමරය පරණ විදියටම තිබිච්චාවෙ කියලා. අම්මා නැතිවෙන කාලෙ වෙනකොට ඒ වගේ පරණ පින්තූරවලට කොතුක වටිනාකමක් ඇවිත්. දැන් ඒ පින්තූරෙ සාෂාගෙ පුස්තකාලෙ කාමරේ ගාම්භීරව වැඩ හිටින බව දැන ගන්නෙ [illegible] ලිනවිත්තුත්.

"මේ ගෙදර හිටියෙ වෙන පවුලක් ඉන්න මිනිහෙක් හොරෙන් තියාගෙන හිටි ගෑනියෙක් කියල දන්නවා නං වික්ටෝරියා රැජින මේ පින්තූරෙන් පැනලා එළියට ඇවිත් සාය උස්සගෙන කොළඹට දුවනවා." විශ්ව විද්‍යාලෙට ගිය අලුත එන විචාර ජවයෙන් මනෝරම්‍යා කිසි කෙනෙක් ඉලක්ක නොකර ඒ විදියෙ ප්‍රකාශ කරන්න පෙළඹිලා හිටියා.

"පුතේ කට තිබුණට හැම දේටම හිනාවෙන්න අවතීර්ණ කරන්න එපා. දූං කවුරුවත් කියනවද කුවේනි නැදෑ සනුහරේ පාවා දීලා විජය කුමාරයට රට අල්ලල දීලත් විජය කුමාරයා කළේ වැරදි වැඩක්ය අපි පටන් ගත්තෙම එහෙම එපා කරපු මිනිහෙක්ගෙන්ය කියලා. කවුරුවත් කියනවද උන්මාද චිත්‍රා කසාද නොබැඳ දරුවෙක් වැදුවා කියලා. විනිස්සු ඒ වැරදිවච්චි තැන් පෙන්න පෙන්නා ඉන්නෙ නැතුව ඉතිහාසෙ ගැන ආඩම්බර වෙනවා. තමුන්ගෙ පවුලෙ පරණ කතා හරියකට දන්නෙත් නැතුව උඩ බලාගෙන කෙල ගහ ගන්නෙ මොටද පුතේ."

ජිනවතී ඉස්කෝලේ හාමිනේ බොහොම ශාන්තව අවවාද දුන්නෙ දුව හිතන හැටි තේරුම් ගන්න බැරුවයි.

"මං කියන්නෙ නෑ ඒ වෙච්චි දේවල් මට ලැජ්ජාවක් කියලා. මේ ගේයි වත්තයි හොර ගෑනියෙ පුතාට දුන්නා නං ඒ මිනිහා තරකම මිනිහෙක් නොවෙයිනෙ. ඒ පුතාත් මගේ පුතා කියලා කඳුක්කලා දෙන්න බැරි සමාජයනෙ මේ රැජනගෙ මේ කැටයම් ලී රාමුවට රිංගලා ඉන්නෙ. ඒ රාමුවෙ ඉඳගෙන සුද්දන්ගෙ කලිසම්වලට බැඳගෙන සුද්දෙ වගේ ජීවත් වෙන්න උත්සාහ කරන [illegible] සංස්කෘතියයි සභ්‍යත්වයයි ගැන කතා කරන්නෙ" මනෝරම්‍යාගෙ තරුණ හිනාව රබර් වත්තෙ ඈතට පැතිරුණා.

මහ ගෙදර සත්තෝරු කාමරෙන් සාලෙට ඇරෙන තිබුණ් දොරවල් දෙකක් තිබුණා. එකක් වීදුරු. අනික කැටයම් තේක්ක. ඒ දීක්ක දොරටුවට එළිය වැටුණෙ සාලෙන් මැද මිදුල පැත්තට විවර වුණු විශාල ජනේලවලින්. එතනට හැමදාම ඉර එළිය අල්ලියක් වැටිලා අහසයි පොළොවයි එක් කරන දූවිලි අංශු නටන, හිටි ගමන් හැඩ වර්ණ වෙන ආලෝක දහර මනෝරම්‍යාගෙ හිතේ වගේම වර්ණාවලියක් [illegible] තිබුණා. ඒ [illegible] ගෙදර

ගත කරපු තිවුණු ජීවිතේට කිසිම සෘජු සම්බන්ධයක් නැති වුණාට මහ ගෙදර මතක චිත්‍රය සම්පූර්ණ වෙන්නෙ සිංහල උළු අතරිනුයි ජනේලවලිනුයි ගෙට පැනපු ඒ ආලෝක අල්ලිත් එක්කයි.

වර්ණාසියි සාෂයි මේ ගේ හදනකොට ඒ පරණ විශාල දොර ජනේල, ඒවාට උඩින් තිබුණු උල් හැඩයේ දිග කොළ අතර පිපුණු නිල් මල් සහිත වීදුරු, වා කවුළු පියන්, මහ බාල්ක වගේ දේවල් ගලවලා ගේන්න පුළුවන් හැම දෙයක්ම ගෙනාවා. කොයි දොර කොතැනට දම්මද කියලා මනෝරම්‍යා කවදාවත් දුවගෙන් ඇහුවෙ නැහැ.

ඒ මහගෙදර සාලෙ උස සුදු බිත්තිවල කවුද කියලා නම ගම නොදන්න විශාල උඩු රැවුලක් සහිත රබ්බඩ පුවකක් වගේ මූණක් තියෙන කඩු කස්ථාන පැළඳපු කෙනෙක්ගෙ පින්තූරයක් ගහලා තිබුණා.

"ඒ තාත්තාගෙ නෑයෙක්" කියලයි ජිනවතී ඉස්කෝලෙ හාමිනේ දුවට කිව්වෙ.

නෑකම මොකද්ද කියලා නොදන්න ඒ රබ්බඩයාවත් සාෂා අලුත් ගෙදරට ගෙනත් තිබුණා. සමහර විට ඒ වත්ත අයිතිකාරයාගෙ පපා ද දන්නෙත් නැහැ.

"දට් ඊස් මයි වයිෆ්ස් ග්‍රේට් ග්‍රෑන්ඩ් ෆාදර්ස් ෆාදර්" කියලා සාෂා එක එකාට කියනවත් ඇති.

"මැරෙන්න කලින් මට කියා ගන්න ඕන දේවල් එකක්වත් කියා ගන්න බැරි වෙයි." කියන හිතුවිල්ලෙන් මනෝරම්‍යා එක පාරටම දත්මිටි කෑවා.

"මැරෙන්න තව මොහොතයි ද කියලා කවුද දන්නෙ? මැරුණට පස්සෙ මේ කිසි දෙයක් වැදගත් වෙන්නෙ නෑනේ." අර කෝපාවේගයත් එක්කම ගෑනිට තමන් ගැන හිනාවක් ආවා.

"දූං ඉතිං සේරම තරහා මරහා ඉවර කර ගත්තා නං හොඳ නේද ළමයො. මනුස්ස ජීවිතේ මොකද්ද කියලා හිතන්ඩ ඔය භූමි කම්පාවම මදෑ ළමයො."

ජිනවතී ඉස්කෝලෙ හාමිනේ බොහොම ශාන්තව කතා

කරනවා වගේ ඇහුණෙ කුස්සියෙ පැත්තෙ ඉඳලා කෑම මේසෙ දිහාවට ඇවිදගෙන එනවා වගේ හැඟීමකින්. ඒ ඉන්නෙ අලුත් ගෙදර නෙවෙයි වගේ දැනෙන්න ගත්තා. ගමේ මහ ගෙදරින් ගෙනාපු දොර ජනේල, බාල්ක සේරම ආපහු හිටිය හැටියටම ඉන්න තීරණය කරලා අලුත් ගේ පරණ ගේ බවට පත් කර ගත්තා වගේ විකල් හිතකින් මනෝරම්‍යාගෙ ඇස් බාගෙට පියවුණා.

පරණ පුරුදු මහ ගෙදර සාලෙ තිබුණෙ කවිච්චියකුයි, කනප්පු දෙකකුයි, රවුම හැඩයෙ පුටු කට්ටලෙකුයි, බීරළු රේන්ද රෙද්දක් දාපු රවුම් ටීපෝවකුයි, නිල් පාටින් ආරුක්කු ගෙවල්, පාලම් හෙම ඇඳපු ලොකු සුදු පිඟන් මැටි මල්පොච්චි දෙකකුයි, බිත්තියට හේත්තු කළ රාක්ක තට්ටු තුනේ වට්නොට් එකයි විතරයි. ඒ පෝච්චි දෙකෙන් එකක් වර්ණාසි පොඩි කලේ බිඳුණා. අනිත් එක මනෝරම්‍යා ළඟ. අනිත් බඩු වර්ණාසි ගත්තා. වට්නොට් එකේ උඩම තට්ටුවෙ ඩේවිඩ්සන් ඉස්කෝලෙ මහත්තයයි ජිනවතී ඉස්කෝලේ හාමිනෙයි ඉන්න පින්තූරේ රාමු කරලා තිබ්බෙ මනෝරම්‍යා තරුණකාලෙදියි. ඒකෙ මනෝරම්‍යා අවුරුද්දක් විතර වයස කාලෙ පින්තූරෙකුත් තිබුණා. පහු කාලෙක වර්ණාසිගෙ ළදරු පින්තූරත්, ළමා පින්තූරත්, යෞවන පින්තූරත් එතනට එකතු වුණා. අනිත් තට්ටු දෙකේ පිත්තල ඉබ්බො, ඉලත් තට්ටු, පහන්, වීදුරු සත්තු වගෙ නොයෙක් දේවල් තිබුණා. ජිනවතී ඉස්කෝලෙ හාමිනේ හොඳට ක්‍රේප් මල් හදන්න දන්න නිසා මනෝරම්‍යා පොඩි කාලේ සාලෙ කනප්පුවලත්, රවුම් ටීපෝව උඩත් කරදහි මල්පොකුරු වැරදුණේ නැහැ. මනෝරම්‍යාට ඒවා උගන්නන්න හැදුවට බැරි වෙච්චි නිසා ජිනවතී හාමිනේ ඒ අත්කම් සේරම වර්ණාසිට ඉගැන්නුවා.

අහක දන ලොකු රෙදි කෑලි මූට්ටු කරලා කොට්ටවලට යට උර හදන්නත් පොඩි රෙදි කෑලි රැළි කරලා පාපිසි මහන්නත් ජිනවතී ඉස්කෝලේ හාමිනේ මිනිබිරිව හවුල් කර ගත්තෙ හෝඩියෙ පන්තියෙදිමයි.

"මේං බලන්න පොඩි කමට මේ ළමයා ප්‍රංශ මූට්ටුව මහලා තියෙන සීරුව. කෝ ඔයාට නං තාම හරියකට සාරි හැට්ටයක්වත් මහගන්න බෑනේ."

ඒ කාලෙ ගෙදර ගියාම අම්මා දුවට කියන්නෙ හරියට වර්ණාසි වෙන කාගෙ හරි දරුවෙක් වගෙයි. අම්මා මොනවා කිව්වත් මනෝරම්‍යා තරහා ගත්තෙ නැහැනෙ. ඒත් වර්ණාසි එහෙම නෙවෙයි. ආතම්මා එක්ක වගේ නෙවෙයි අම්මා එක්ක පුංචි දෙයකට විශාල ඇදයක් අල්ල ගන්නවා. කටින් නෙවෙයි. මූණ එල්ලා ගත් නිශ්ශබ්දතාවකින්.

මේසෙ යට නින්දකට වැටිල හිටිය වර්ණාසි හීනෙන් දකිමින් හිටියෙ මහ ගෙදර සාලෙන් දකුණු පැත්තට විවර වෙන එක දොරකින් දිග කෑම කාමරේට ගිහින් කවදාවත් නොකපපු උපන් කොණ්ඩෙ දිගට දිගේ කරල් දෙකට වන වනා දළොස් දෙනෙකුට වාඩි වන්න පුළුවන් බිත්තර හැඩේ කලු මේසේ වටේ දුවන පුංචි ගෑනු ළමයෙක්වයි. ඒ ළමයා ඇඳලා හිටියෙ රෝස රිබන් පටිවලින් උරහිසේ මල් ගැට ගහපු රෝස මල් විසිරිච්ච චීත්ත ගවුමක්. ඒ මූණ හොඳට පුරුදු වුණාට ඒ තමන්ය කියන හැඟීම නං හීනෙත් දැනුණෙ නෑ. මේසෙ උඩ නිල් පාටින් චීන ගෑනු මිනිස්සු ඉන්න විදියක් පෙන්නුම් වෙන ලොකු මැටි බූජමක් තිබුණා. ඒක අතුළෙ අලුවා, අග්ගලා, තාරං කැවුම්, වෙන වෙනම තෙල් කරදසිවල ඔතලා ඇති කියලා හීනෙත් දුවන ගෑනු ළමයා දැනගෙන හිටියා. ඒ ළමයාට ඒව කන්න ඕන කමක් තිබුණෙ නෑ. හීනෙකදි උනත් ළමයට එහෙම පෙරේතකමක් නොදැනෙන තරමට ඒ ළමයගෙ ආතම්ම ළමයට හිතේ හැටියට පැණි රස කන්න නිදහස දීලා තිබුණා. කෑම කාමරේ මේසෙයි, ඒ වටේ තිබුණු බීරළු අල්ලපු, කැටයම් මල් පිපිච්ච පුටුයි කලු වුණාට ආතම්මා "සයිබෝට්ටුව" කියපු බාග අල්මාරිය පැරණි පාටයි. ඒක ඇතුළෙ වීදුරු බෝතල්වල කිරි ටොපි, රට ඉඳි, පැණි, කිතුල් පිටි, අරළු පිටි, සව්, රැලං, නිල් මල් වැටිච්ච ජොන්සන් පීරිසි කෝප්ප, රෝසමල් වැටුණු සුදු තසිං, වීදුරු කට්ට ත්‍රිකෝණ හැඩයට මතු වෙච්චි වීදුරු ගුරුලේත්තුවක්, අත හෝදන වීදුරු භාජන හෙම තිබුණා. ඒකේ ලොකු ලාච්චු දෙකක් අතර මැද පුංචි ලාච්චුවක් තියෙනවා. එකක රවුම් බොකුටු රිදී පාට සුප් හැඳියි, දිගටි මේස හැඳියි, බත් බෙදන හැඳියි, කාටවත් උවමනා නොවන ගෑරුප්පුයි, පුංචි ලාච්චුවෙ එක එක ජාතියෙ තේ හැඳි ගොඩක් තිබුණා. අනිත් ලාච්චුවෙ ආතම්මා එක එක විදියට මහපු පාට පා අත් පිස්නා. කඩබ් එක උඩ ආතම්මා

හතරැස් රෙදි කෑලි මුට්ටු කරලා ඇතුළට පුළුන් පුරවලා සත මෙ පෝරුවක් දාලා මහපු ටී කෝසියෙන් දීර්ඝ වෙලාවක් උණුසුම් රැක ගත්තු ජපන් ගෑනු ඉන්න තේ පෝච්චිය තියෙනවා. ආතම්මා උණු වතුර දාලා තියන පිත්තර සරනේරුවකින් පිත්තල පියානේ හයි කරපු. පිත්තල දම්වැලක් එල්ලෙන සෙම්බුවක් නිතරම තිබුණෙ එතනයි. පිට කෙනෙක් ආවම පාවිච්චි කරන පිඟන්, දිසි, බත් බෙදන පලංගාන් තිබුණෙත් කෑම කාමරේ තියෙන පෙට්ටගමේ. හීනෙත් ඒ සේරම පෙන්නුම් නොකළත් දූවමින් හිටපු ළමයා එතන තිබුණු හැම දෙයක් ගැනම හොඳට දන්න හැඟීම හීනෙ තුළ පවා දැනුණා. කෑම කාමරේ කොණක ලී තරප්පු පේළියක් තියෙන්නේ කෑම කාමරේ විතරක් තීමා වෙච්ච ලෑලි සොල්දරේට නගින්නයි. පොඩි ළමයා එකට නගින්න බයයි. ඒක උඩ අඩ අඳුරක් තියෙනවා. බිත්තර වීත්, දේව දානෙට පන්සලට සලාක දානෙට හෙම දෙන හාල් හද ගන්න වී ගෝනි දෙකත්, තව පරණ පෙට්ටි වගයකුත්, මළ කාපු කඩු දෙකකුත් ඒ සොල්දරේ තියෙනවා. හීනෙත් දූවමින් හිටි ගෑනු ළමයා කිසි හේතුවක් නැතිව සොල්දරේට නැගලා ගන්නවා. හීනෙ දකිමින් හිටිය කෙනා තමන් ඉන්නෙ උඩුමහලේ පූසල ඇඳේ නෙවෙයි අර පරණ මේසෙ යටයි කියලා දන්න නැති වුණාට උඩුමහලේ කඩු දෙක ගැන දන්නවා. ඒ ළමයා යන්නෙ කඩු දෙක අරගෙන එන්න කියලත් දන්නවා. හීනෙතුත් පඩි ගැහෙද්දී උඩට නගින එක නවත්තන්න ඕන වෙද්දී ඒක නවත්ත ගන්න බැරි අසරණ බියගුළු ගතියකින් වර්ණාසි හීනේ ප්‍රේක්ෂකයා වෙලා හිටියා. මළ කාපු කඩු දෙක නට නටා තරප්පුවෙන් බහින්න ගත්තා. ඒ වෙලාවෙ අර දැරියට ඕන වුණා ඒ දෙක අරගෙන ගලක අතුල්ලලා මලකඩ යවලා කඩු දෙක එකට අතුල්ලලා ගින්දර පිටවෙන හැටි බලන්න. නමුත් ඒ වගේම බලගතු විදියට ඒවා අල්ලන්නවත් එපා කියන අනතුරු ඇඟවීමකුත් දැනෙන්න ගත්තා. එතකොට තරප්පු පේළිය හෙලවෙන්න ගත්තා. ළමයා බිමට වැටුණා. කඩු දෙකත් ළමයගෙ ඇඟ උඩට වැටිලා පපුවෙ ඇමිනිලා කෙලින් හිටියා. ළමයාට තුවාලයක් නැති උනත් මහගෙදර කෑම මේසෙ හෙල්ලෙමින් තිබුණා. තරප්පුවෙ ලෑලිත් සොල්දරේ ලෑලිත් ගැලවිලා එල්ලුණා. කෑම කාමරෙන් විවර වෙන දොරටු දෙකෙන් එකක් ආතම්මගෙ කාමරේට. අනික අම්මගෙ කාමරේට. ඔන්න ඒ පාර

ජිනවති ඉස්කෝලෙ හාමිනේ එයාගෙ දොරටුවෙනුත් අනික් දොරටුවෙන් මනෝරමාත් මතු වුණා.

“ලෝකෙ කණපිට හැරුණත් කලබල වෙන්න එපා බබී... භූමිකම්පාවක් වුණත් ඒ තමන්ට නෙවෙයි කියල බලාගෙන ඉන්න. ඔයා දන්නම මැරෙන්නෙ නෑ.” ආතම්මා බොහොම සන්සුන්ව කතා කළේ වැටිලා හිටි ළමයා උස්සන්න දුවගෙන එන්නෙත් නැතුවයි.

“ඉන්න මං කැමරාව ගේන්නං..... මේ කඩු දෙක තියෙන ලස්සන..” මනෝරමා කියපු කතාවට වැටිලා හිටිය ළමයාට තරහා ගියා.

“එපා... එපා....” ළමයා කෑ ගැහුවා.

“ඇයි බේබි බය වුණාද..... මේ මං ඔයා ළඟම ඉන්නවා.” අම්මගෙ කටහඬ හැබැහින්ම ඇහුණෙ හීනෙත් කෑ ගහපු ළමයෙකුට නෙවෙයි. හිතුවක්කාර විවාහයක් කරගෙන හිටිය වර්ණාසිටයි.

“ඔයා බයවෙලා නේද... මේ ඇඟ සීතල වෙලා..”

මනෝරමා දුවගෙ ඔළුව අතගානකොට තමුන් හැබැහින්ම භූමිකම්පාවකට බයෙන් මේසෙ යට හිටියය කියන කාරණය දුවට සිහි වුණා.

“මේක නං ලෝක විනාසෙ වගේ මහ විශාල අනතුරක් වෙන්න ඕන.... ලංකාවෙ කවදාවත් මේ වගේ භූමිකම්පා වෙලා නැතේ.” මනෝරමා දන්නෙම නැතුව කියවුණේ කියන්න හිතපු දේ නෙවෙයි. ඒ වෙලාවෙ මනෝරමා හිත හිත හිටියෙ මේසෙ යටට වඩා ආරක්ෂිත ස්ථානයක් ගැනයි. කොහොම හරි මිදුලට පැනගෙන පාරට ගිහින් අඩි සියයක් විතර ගියොත් කෝට්ටෙ නගර සභාවට අයිති පිට්ටනියට යා ගන්න පුළුවනි. එතකොට ගස් කඩා වැටීමෙන්, වහල කඩා වැටීමෙන් අනතුරක් වෙන එක වැලකෙනවා. ඒත් එතනට එන පිම්මට දුවන්නයැ. මග ගස් වැටිලා, ලයිට් කණු වැටිලා තියෙන්න ඉඩ තියෙනවා. එහෙම නැත්නම් මගදී ගහක් ඇඟට වැටෙන්න බැරිත් නෑ. හුළඟ නිසා වහලේක ටකරමක් ඇවිත් ඇඟේ හැපෙන්නත් ඉඩ තියෙනවා. ඒ වෙනකොට විදුලි කෙටීම නං නැවතිලා චුරු චුරු වැස්සත් නැවතෙමින් තිබුණා. බල්ලො උඩු බුරනවා ඇහුණා. ආයෙත් විදුලි කොටන්න ගත්තොත්

පිට්ටනියක ඉඳීමත් අවදානම්.

"මැරෙන්නෙ එක පාරයිනෙ. මං මැරෙන්න බය නෑ. ඒ වුණාට මගේ දුවට අම්මෙක් ඉන්න ඕන. ඒ හින්ද එයාට තනියම වැඩ කර ගන්න පුළුවන් වෙනකල් හිටියොත් ඇති." වර්ණාසි පුංචි කාලේ ඉන්දියාවෙදි කෝච්චි අනතුරකට මූණ පාලා ජීවිතේ බේරුණාම මනෝරම්‍යා හින්දු පත්තරේ වාර්තාකාරියකට එහෙම කිව්වා. ඒත් දූන් නැවතත් මරණය සෙල්ලම්කරන වෙලාවෙ දුව රැක බලා ගන්න හයි හත්තිය තියෙන මිනිහෙක් ඉන්දැද්දිත් මනෝරම්‍යාට ඒ උත්තරේම හිතට එන්න ගත්තා.

"කිසිම දේකට තණ්හාවක් නැති එකේ මේ ළමයා දාලා යන්න මෙච්චර බය වෙන්නෙ මොකටද?" ඒ ප්‍රශ්නය තමන්ගෙන් අහන්න ඕන වුණාට ඒක අහන්න හිත මැලි වුණා. ජීනවතී ඉස්කෝලේ හාමිනේ ඒ මොහොතෙ මළවුන්ගෙන් නැගිටලා ආවා නං "පුතේ ඔය දරුවා බල ගනිං... උඹට වෙච්චි දේවල් එයාට වෙන්න දෙන්න එපා." කිලා කියන්න ඉඩ තියෙන බව මනෝරම්‍යාට හිතුණා.

"මැරිච්ච මිනිස්සුන්ට ආයෙ එන්න බැහැනෙ. එතනින් සේරම ඉවරයි." තරුණ කාලෙ තමන් අම්මත් එක්ක එහෙම වාද කරත් වයසට යනකොට මරණය කියන්නෙ අවසානයක් නෙවෙයි එක දෙරකින් ඇතුළු වෙලා තව දෙරකින් පිටවෙන වැඩක් කියලා හිතෙන්නෙ ඇයි? එහෙමනම් වර්ණාසි වෙනුවෙන් ජීවත් වෙන්න ඕන කියලා හිතෙන එකේ තේරුමක් නැහැනෙ. එයාටත් වැටිලා, හීරිලා, තුවාලවෙලා, හොඳට පදම්වෙලා නව දෙරටුවකින් පිට වෙන්න ඉඩ අරිනවා මිසක් වැටෙනකොට අල්ලන්න, තුවාලවලට බේත් දන්න බලාගෙන ඉඳීමෙ තේරුමක් නැහැනෙ.

අම්මා ළඟ ඉඳීම සැනසීමක් උනත් ඒක කටින් කියන්න දුවට හිත දුන්නෙ නැහැ. නැවතත් පොළොව දෙදරුවා. අම්මා දුව බදාගෙන ඇඬුවා. දුවට ඇඬෙන තරමටත් වැඩි දුකක් පපුවෙ තෙරපිලා තිබුණට දුව ඇඬුවෙත් නැහැ. කිසි දෙයක් කතා කරෙත් නැහැ. ගල් රූපයක් වගේ හිටියා. සාෂා ගෙදර හිටියා නං දෙන්නා බදාගෙන මැරෙන්න තිබුණා. එහෙම නං වර්ණාසිට ඇඬෙනවා. ඒ මරණයට බයෙන් නෙවෙයි සාෂා එක්ක එකට මැරෙන කොට

බයවෙන්නෙ මොකට ද? ඒත් අම්මා අර පරණ ගේ කඩාගෙන වැටිලා ඒකට යටවෙලා දුව ගැන හිතමින් වතුර උගුරක්වත් දෙන්න කෙනෙක් නැතුව පණ අදිනවා ඇති කියන හැඟීමෙන් කඳුළු උල්පතක් හැදෙයි.

"මං මැරුණොත් ඔයා ආයෙ බඳිනවද?" දවසක කාර් එක හැප්පෙන්න ගිහින් බේරිලා පැය ගණනාවකට පස්සෙ නින්දට යනකොට ඒ සිද්ධියෙදි නිහඬව සිටි වර්ණාසි එක පාරට එහෙම ඇහුවම සාෂා පුදුම වුණා. එවෙලෙ ඒ දෙන්නා කතා කරමින් හිටියෙ අගමැති මැදුරෙ උත්සවයකට යන්න දෙන්නම එකම පාටින් අලුත් ඇඳුම් හදගැනීමක් ගැනයි. ඒක අස්සෙ මරණය ගැන කතා කිරීම අසුභ දෙයක්නෙ.

"ඔයා මොකද මේ එක පාරට මේ කතා කරන දේට කිසි සම්බන්ධයක් නැති දේවල් කියන්නෙ? බය වෙන්න එපා අරලිය ගහ මැදුරට කොටි ගහන්නෙ නැහැ." සාෂා බිරිඳගෙ ඔලුව අත ගෑවේ අවසාන වාක්‍යයට "මෝඩ කෙල්ල" කියන කෑල්ලත් එකතු කරමින්.

"නෑ... මේ මෝඩ කෙල්ලට අද දවල් කාර් එක හැප්පෙන්න යනකොට හිතුණා එයා මැරුණොත් සාෂා මොනවා කරයි ද කියලා." වර්ණාසි හුරතල් වුණා.

"එතකොට මාත් මැරෙනවා කියලා අහන්න මෝඩ කෙල්ල නං කැමති ඇති." සාෂා හිනා වුණා.

"නෑ..... කොච්චර මෝඩ උනත් ඒ කෙල්ල එහෙම හිතන්න පතන්න තරං නං මෝඩ නෑ. සති පූජාවට සමාන පූජාවක් පිරිමි කරලත් නෑනේ."

"ඒ වුණාට ටජ්මහලක් හදලා තියෙන්නෙ පිරිමියෙක්නෙ."

"අපේ අම්මා නං කියන්නෙ නූර් ජෙහාන් වෙනුවෙන් හැදුවද නැත්තං තමන්ගෙ ලොකුකම පෙන්නන්න හැදුවද කියලා දන්නෙත් නූර් ජෙහාන් විතරක් වෙන්නැති කියලයි."

"ඕගොල්ලන්ගෙ අම්මට ඉතිං හැම අහිංසක ආදරයක්ම අරහංනෙ. ඔයත් අම්මා වගේ වෙන්නෙ නෑ කියල කොච්චර

කිව්වත් වෙලාවකට ඔයාටත් තියෙන්නෙ අම්මගෙ හිතමයි."

"නෑ..... මං එයාගෙ අනිත් පැත්ත. කෝ ඉතිං මං අහපු දේට උත්තර දුන්නයැ."

"මාත් ඔයා වෙනුවෙන් මොකක් හරි හොඳ දෙයක් හදනවා."

"වජ්මහලක් නං එපා. ඉස්පිරිතාලයක් හදන්න."

"අසුභ කතා කියන්න එපා සිද්ධේශ්වරී" සාෂා බිරිඳගෙ පපුවට ඔලුව තියාගෙන එයාගෙ පපුව ගැහෙන හැටි අහගෙන හිටියා. සිද්ධේශ්වරී කියන්නෙ ඉන්දියානු දෙවඟනක්. ඒක සාෂාට කොහෙදි හරි කියවන්න ලැබෙන්න ඇති. සාෂා බිරිඳට හුඟාක් ආදරේ ප්‍රකශ කරන්න ඕන වුණාම ඒ නම කියන්නෙ සිද්ධි බලයේ ඊශ්වර දෙවියොත් වර්ණාසිම තමයි කියන අර්ථයෙන්. කිසිම පිරිමියෙක් ගැනුන්ට එහෙම ආමන්ත්‍රණ හොයා ගන්න දන්නෙ නැතුව ඇති. සාෂා කියන කතා මතක් වෙලා භූමිකම්පාවක් මැද උනත් වර්ණාසිගෙ මූණට හිනාවක් නැගුණා. මනෝරමා සාෂා එක්ක වෛරයෙන් ඉන්නෙ ඒ කිසි දෙයක් දන්නෙ නැතුවනෙ.

"ඔය කසාදෙ වැඩි කල් තියෙන්නෙ නෑ බබා. ඔය මිනිහට එක ගැනියෙකුට බැඳිලා ඉන්ඩ බෑ." මනෝරමාගෙ අනාවැකි පුස්සක් වුණානෙ කියලා වර්ණාසිට හිනා ගියා. මැරෙන්න කලින් අම්මට ඒක මතක් කරලා දෙන්න ඕන කියලා හිතුණත් වර්ණාසිට කට අරින්න බැරි වුණා.

මැරුණම මුලු ජීවිතේම කළ තී දේවල් චිත්‍රපටියක් වගේ පෙනෙනවා කියනවනෙ. සමහරුන්ට මරණ මොහොතෙත් එහෙම වෙනවා කියලා මනෝරමායි වර්ණාසියි දෙන්නම කියවලා තිබුණා. භූමිකම්පාවක් කියලා හිතුවට කොටි උඩින් ඇවිත් හිතන්න බැරි විදියෙ ප්‍රහාරයක් ඒ කියන්නෙ ඇමරිකාව ඇෆ්ගනිස්ථානයට ඉරාකයට එල්ල කළා වගේ ප්‍රහාරයක් එල්ල වෙනවද කියලා දන්නෙ නැති ඒ අවස්ථාවෙ මනෝරමයාට එහෙම එක දිගටම පරණ සිද්ධි මැවිලා පේන්න ගත්තා. මැවෙනවා කියන්නෙ නිකං කුඩා ආලෝක තිත් එකතු වෙනවා දිය වෙනවා වගේ අමුතු අත්දැකීමක් මිසක් චිත්‍රපටියක් වගේත් නෙවෙයි. ඒක මෙහෙමයි කියලා කාටවත් කියන්න බැරි ප්‍රබල හැඟීම් දැනීම් සහිතව මතකයේ

හැම දෙයක්ම කැවිලා තියෙනවා වගෙයි. ඒ ආලෝකය තිත් ශරීරයෙ හැම සෛලයක්ම අත්පත් කර ගනිමින් තිබුණා.

වර්ණාසිට නං එහෙම ආලෝක ග්‍රහණයකට යටත්වෙන විදියෙ දෙයක් දැනුණෙ නැහැ. ඒත් හුස්ම ගන්න අමාරුයි වගේ දෙයක් සිද්ධ වුණා. අම්මා එක්ක විශාල තරහාවකුත් ඊට යටින් තරහවේ ප්‍රමාණය පිදුරු තලාගල තරම් නම් හිමාලය තරමට විශාල වගේම වන්දනීය සුන්දර ආදරයකුත් දැනුණා. ඒ ජාතියෙ ආදරේකුයි, වෛරයකුයි තියෙන්න පුළුවන් අම්මෙකුයි දරුවෙකුයි අතර විතර ද? සමහර විට ජිනවතී ඉස්කෝලෙ හාමිනෙයි මනෝරමාායි අතර තිබුණෙත් ඒ විදියෙ දෙයක් ද?

වර්ණාසිට මැවිලා පෙනුණෙ ඩේවිඩ්සන් ඉස්කෝලේ මහත්තයගෙ කලු සුදු පින්තූරේ. වර්ණාසි උපදිනකොටත් ආතා මැරිලනෙ. ආතම්මා කවදාවත් ආතගෙ වරදක් වර්ණාසිට කියලා නැහැ. ගමේ මිනිස්සු එක්කත් "අපේ ඉස්කෝලෙ මහත්තයා" කියලා මැරිච්ච ස්වාමි පුරුෂයාගෙ හොඳක් මිසක් නරකක් කියන්නෙ නැහැ. ඒත් ජිනවතී ඉස්කෝලෙ හාමිනේ කවදාවත් ආතාගෙ රූපෙට දුම් අල්ලන්නෙ නැති බව වර්ණාසිට තේරුණේ දවසක් මනෝරමාා කිව්වට පස්සෙයි.

"ඔය මෝඩ වැඩේ කරන්න එපා. ඔයා හොඳට ඉගෙන ගන්න. ඊට පස්සෙ ඔයාට හිතුණොත් ගෙදර ඉන්න පත්තිනි මෑණි කෙනෙක් වෙන්න ඕන කියලා ඒකට යට වෙන්න. ඒත් ඕනම වෙලාවක තමන්ගෙ බත් පත තමන්ට හොයා ගන්න පුළුවන් පසුබිමක් එක්කයි ඒක තියෙන්න ඕන."

ඒ කතාවට වර්ණාසි හිනා වුණා. ඒක සිද්ධ වුණේ රිදී ඇලේ මහ ගෙදර කෑම කාමරයත් ගබඩා කාමර දෙකයි, කුස්සියයි යා කරමින් මැද මිදුලෙ වම් පැත්තෙ තිබුණ රවුම් කුලුණු පහක් සහිත බරාඳයෙදියි. වර්ණාසි වාඩි වෙලා හිටියෙ මැද මිදුලට වැටෙන පඩි තුනෙන් උඩම පඩියෙයි. ජිනවතී ඉස්කෝලෙ හාමිනේ සුදුරු, කොත්තමල්ලි හෝදලා ගරලා වේලෙන්න ඇතුළපතක තුනී කරමින් මැද මිදුලෙ හිටියා. මනෝරමාාගෙ කතාවට ආතම්මගෙ රිදී හවඩියෙ එල්ලගෙන ඉන්න යතුරු කැරැල්ල හෙල්ලුනෙ එක පාරට ආතම්මා කෙලින් වෙච්චි නිසයි. ආතම්මා අම්මට රවනවා වර්ණාසි

දක්කා. අම්මා ඒ රැවිල්ල දකින්න නැතුව ඇති.

"ඔයා මොනවද මේ නොදරුවට කියන්නෙ? මං අහන්නෙ හරි හමං අම්මෙක් කියන කතාද ඔය?"

ජිනවතී ඉස්කෝලෙ හාමිනේගෙ කතාවට එයාගෙ දුව හිත වෙන්න ගත්තු නිසා එයාගෙ මිනිබිරීගේ හිනාව වහාම නැවතුණා.

"ඔය තමුන්ගෙ ජීවිතේ අවුල් කරගෙන මට උහුලන්න බැරි තරම් ගින්දර දීලා දැං මේ ළමයාවත් විකාර කරවන්න හදනවද? ඉගෙන ගන්න කියන එක හරි. ඒ වුණාට වෙන වෙන ආරළු බූරළු ඕන නෑ නෙව."

ජිනවතී ඉස්කෝලෙ හාමිනේ කෝප ස්වරයකින් තොරව දුවට බැන බැන මැද මිදුලෙන්ම එළියට බැහැලා දවල්ට කලවං මැල්ලුමකට පලා ටිකක් හොයන්න ගියා. යතුරු කැරැල්ල සිලිං සිලිං ගෑවා. දුඹුරු බල්ලා උක්කුං වර්ණාසි ළඟට ඇවිත් නැටුම් වනලා අවසර ගනිමින් ආතම්මා පස්සෙන් දිව්වා.

වර්ණාසි පඩියෙ වාඩි වෙලා සුදු දුහුල් රෙද්දක මල් මහමින් හිටියෙ සාෂාට ලෝකෙ කොහේ ගියත් අරගෙන යන්න කියලා තෑගි දෙන්න පොරෝනයක් හරි ඇඳ රෙද්දක් හරි හැටියට පාවිච්චි කරන්න පුළුවන් තෑග්ගක් හදමිනුයි. ඒ බව දැනගෙන හිටියා නං මනෝරම්‍යා ඒක කීතු කීතුවලට ඉරලා දන්නත් තිබුණා. ආතම්මා නොදරුවා කිව්වෙ මිනිබිරිය කසාද බැඳලා ගෘහනියක් වෙන්න ලෝකයෙ හොඳම භාර්යාව වෙන්න පෙරුම් පුරමින් පොරෝනයකට මල්කම් කරමින් හිටි බව නොදැන නෙවෙයි. සාෂා මිනිබිරියට වඩා අවුරුදු පහළොවක් වැඩුමල් වීම ඇරෙන්න වෙන වරදක් නැහැ කියලයි ජිනවතී ඉස්කෝලෙ හාමිනේට හිතුණෙ. මනෝරම්‍යාට තිබුණු සැක සංකා ආතම්මටත් නැති වෙන්න බැහැනෙ. ඒත් ආතම්මා කැමති වුණේ මිනිබිරිය දුව වගේ වෙනවට නෙවෙයි. මනෝරම්‍යාට දැනුණෙ අම්මා මිනිබිරිය හරහා දුවට පාඩමක් උගන්නන්න හදනවා වගෙයි.

"අම්මා විශාල බොරුවක් ඇතුළෙ ඉඳලා ඔයාටත් ඒක හරි කියලා - සනීපයි කියලා ඔලුවට දලා. ඒකයි ඔයා මේ විනාශෙ කරගන්න යන්නෙ."

කාකි පාට කබල් දිග කලිසමක් ඇඳලා හිටිය මනෝරම්‍යා කකුල් දෙකත් හාන්සි පුටුව උඩට අරගෙන තනියෙම කියෙව්වා.

"ඔයා හොඳට බලන්න අපේ අම්මා කවදාවත් තාත්තගෙ පින්තූරෙට දැං අල්ලනවද කියලා. හැබැයි තාත්තා මැරුණ වෙලාවෙ නං ටිකක් ඇඬුවා. ඒ අඬන්න ඇත්තෙ මැරිච්ච මිනිහට නෙවෙයි. කසාද බඳිනකොට හිටිය මිනිහට වෙන්නැති."

වර්ණාසි අම්මට උත්තර බැන්දෙ නැහැ. ඔහේ කියවන්න ඇරියම අම්මගෙ කෝපය දියවෙන බව දුව අත්දැකීමෙන් දැනගෙන හිටියා.

"අපේ තාත්තා අම්මාව කසාද බැන්දෙ ඒ කාලෙ මේ ගේ වත්ත උගස් කරලා තිබුණෙ අම්මගෙ අප්පච්චිට හින්දයි. වත්ත අයිති මහත්තයා මේක ලියලා දුන්නට පස්සෙ තාත්තාගෙ මාමා මිනිමැරුම් නඩුවකට අහුවෙලා තියෙනවා. එයාව බේරගන්න ඇල්ලුවෙ ලොකුම වාමාංශික සහෝදරයොනෙ. ඉතිං මාමා එල්ලුං ගහට ගියෙ නැතුව බේරුණා. හැබැයි ඉඩම උගසෙ. ඒ වෙනකොට තාත්තා මනමාලියො ගණනාවක් බලලා ඉඳලා තියෙන්නෙ. තාත්තාට හිතට අල්ලපු ඉටිරූප වගේ ගෑනුන්ගෙ පවුල්වලින් කුල මල හොයලා තාත්තාට කැමති වෙලා නෑ. ඒ හින්ද තාත්තා ලස්සන ගෑනුන්ටයි, පොහොසත් මිනිස්සුන්ටයි, මිනිමැරුමට අහුවෙච්ච මාමාටයි වෛර කර කර මේ අහිංසක ජිනවතී නෝනාට කැමති වුණා. ඒ වුණාට මට මතක කාලෙ ඉඳලා තාත්තා බොහෝම දක්ෂ ඒකාධිපතියෙක්. සිංහල අවුරුද්දට තාත්තාගෙ ගුරු මණ්ඩලේ කට්ටියට කෑමක් දෙනවනෙ. එදට නං තාත්තා අම්මට විහිළු කරනවා. මං හිතන්නෙ ඒ තාත්තාගෙ යටි හිතින් හොඳටම දැනගෙන හිටිය විදියෙ සැබෑ ස්වාමි පුරුෂයා තමයි ඒ වෙලාවට එළියට එන්නෙ. අනිත් වෙලාවට හිටියෙ පොඩි දේටත් කෑ ගහන කරුණාවෙන් කතා කරන්න දන්නෙ නැති මිනිහෙක්. ඒ මිනිහා ඉස්සරහා කාමරේ ජෝතිෂ පොතුයි, කවි පොතුයි, ඉංග්‍රීසි නවකතායි, සිංහල පත්තර සඟරායි කියව කියව වෙනම ලෝකෙක හිටියෙ. වර්ණි මගේ පුතේ ඔයාටත් ඕන ඒ වගේ ජීවිතයක් ද? ඔයා හිතන්නෙ ඔයාගෙ අම්මා වැරදියි.... අම්මා වගේ නං වෙන්නෙ නෑ. මං ආතම්මා වගේ වෙනවා කියල ද?"

මනෝරමා කොච්චර තදට කතා කළත් තමන්ගෙ පවුලෙ ඉතිහාසය දරුණු විදියට විවේචනය කළත් දුවට තියෙන හැඟීම් ඉදිරියෙ හරිම අසරණ වෙනවා. ඔය සේරම කියලා අත්හැරලා ඇඬුවෙ ඒකනෙ. ඒත් වර්ණාසිගෙ හිත උණු වුණේ නැහැ. තමන් තාත්තෙක් අහිමි කිරීම ගැන අම්මා එක්ක සිදුම් කෝපයක් තියෙන නිසා අම්මාටත් වෙව්ඩිසන් ඉස්කෝලෙ මහත්තයා ගැන තරහක් තියෙන්නෙ හොඳ තාත්තෙක් නොවීම ගැන වුණා නං වර්ණාසිට ඒක තේරුම් ගන්න තිබුණා. ඒත් මනෝරමා ජීනට්ටි ඉස්කෝලෙ හාමිනේට හොඳ ස්වාමිපුරුෂයෙක් වුණේ නෑ කියලා මිසක් හොඳ තාත්තෙක් වුණේ නෑ කියලා වෙව්ඩිසන් ඉස්කෝලෙ මහත්තයාට දෙස් කිව්වෙ නෑ.

"වර්ණ පුතේ ඔයා හිතන්න එපා මං අපේ තාත්ත එච්චර නරකයි කියලා. අම්මාට සලකපු විදිය හරි නැති වුණාට එයා මට හොඳට සැලකුවා. සැරවෙලා ගහලා තියෙනවා. ඒ වුණාට තාත්තා මට හුඟක් ආදරේ කරන්න ඇති. ඒක මට දැනුණා. ඒත් තාත්තා හොඳට හිනා වෙවී ඉඳල එක පාරට යකෙක් වගේ [illegible] මොකද කියලා ඒ දවස්වල මට තේරුණේ නෑ."

මනෝරමා කොච්චර ඉගෙනගෙන තිබුණත් දුව එක්ක කතා කරන්න වඩාත්ම සුදුසු ක්‍රමය හිතා ගන්න බැරි වුණා. ඊ[illegible] කියපු කිසිම දෙයක් තමන්ගෙයි සාෂාගෙයි සම්බන්ධෙට අදාළ වෙන්නෙ නෑ කියලා අම්මට තේරුම් කරන්න වර්ණාසි උත්සාහ කරෙත් නැහැ.

"ඔයාගෙ අම්මා කියවන වෙලාවට ඔයා සද්ද නැතුව ඉන්න. එතකොට එයාට හිතට සහනයක් එයිනෙ. අපි බැඳලා ටික දවසක් යනකොට එයා ඔයාව හොයාගෙන එයි. එයා මොනවා කිව්වත් අපි බඳිනවා කියල කියන්න යන්න එපා. එයා එක්ක එකට එක නොකියා ඔයාගෙ පාඩුවෙ ඉන්න." සාෂා උපදෙස් දීලා තිබුණෙත් එහෙමයි.

මනෝරමා කියවලා කියවලා දිය ඇල්ලට ගිහින් නාගෙන එමු කියලා නැගිට්ට වෙලාවෙ වර්ණාසිත් නැගිට්ටා. ඒ වෙනකොට වර්ණාසි හිතුවෙ සාෂා මුණ ගැහුණු දවසට අම්මා කැමති වෙයි කියලයි. තාත්තා ගියාම දිය ඇල්ල වැටෙන තැන වල වගේ

පීනලා සතුටු වෙච්ච මනෝරමා අර දේශනා සේරම මතක නැති වෙලා වගේ හැසිරුණා. දුවගෙ පිට ඇතිල්ලුවා. පුංචි කාලෙ පීනන්න පුරුදු කරෙත් වෙව්ඩිසන් ඉස්කෝලෙ මහත්තයයි කියලා කියමින් දුවට පීනන්න ධෛර්ය දුන්නා. අම්මයි දුවයි නාලා එනකොට ජීනට්ටි ඉස්කෝලෙ හාමිනේ කොච්චි මිරිස් කරල් පිටින් දාලා තාල් මැස්සො තෙල් දාලා කොස් ඇට කලුපොල් මාළුව හදලා, හීන් මැකරල් කොළ පාට රැඳෙන විදියට කිරි හිඳෙන්න උයලා, කලවම් මැල්ලුම් හදලා අලුත් හාලෙ බත් උයලා තිබුණා. කෑම සුවඳට මහදිම බඩගිනි දැනුණා. ආතම්මයි, දුවයි, මිනිබිරියි පරණ බොකු පිගන්වලට බත් බෙදාගෙන උදය වරුවෙ මනෝරමා ආතටත් දෙස් කියමින් දේශනාවක් පවත්තපු තැන ඉඳගෙන බත් කැවා. ආතම්මා වාඩි වුණේ හාන්සි පුටු දෙක අතර උස ඇඳි පුටුවෙ. අම්මයි දුවයි අත් ඇදීත් තියෙන කොළ පාට ලී බංකුවෙ. හිරවටත් බතුයි, මිරිසුයි, කෙසෙල් කැල්ලකුයි දාලා නිසා හිරවා "බත් කැවා - බබී බත් කැවා" කියලා කෑ ගහමින් කූඩුවෙ පැද්දුණා. උක්කුං බලු නයිදෙ ආතම්මගෙ පුටුව යට. කලු බැළලී බිජ්ජි කණ්ඩියක් උඩ දිගාවෙලා බලා හිටියා. ඒක කොච්චර ලස්සන සාමකාමී දර්ශනයක් ද? කිසිම පිරිමියෙක් නැතුව ඒ සතුට සම්පූර්ණවෙලා තිබුණා. සාෂා ගැන කිසිම සඳහනක් මතු වුණේ නැති වුණාට තුන්දෙනාම එයා ගැනත් හිතමින් හිටියා.

"මේ දරුවගෙ හිත තලන්නෙ නැතුව ඕක කරලා දීපුවම ඉවරනෙ. මේ ළමයා අම්මට වඩා කොච්චර හොඳද?" කියලා ආතම්මා හිතන බව වර්ණාසි දැනගෙන හිටියා.

"සාෂා හිටියා නං එයත් මේ බංකුවෙ හරි ඉඳගෙන අපිත් එක්ක වැටිලා ආතම්මට හරි අම්මට හරි කියලා බත් කවා ගනීවි." කියලා වර්ණාසිට හිතුණා.

මනෝරමා සාෂා ගැන තියෙන අහේතුක අවිශ්වාසයත්, පමණ ඉක්මවා තමන්ගෙ දුව ආරක්ෂා කිරීමේ චේතනාවත් හැර වෙන මොනවා හිතමින් හිටියාද කියලා වර්ණාසිට හිතා ගන්න බැරි වුණා.

සාෂා මුණ ගැහෙන කල් ඒ තුන්දෙනාගෙ ජීවිත හැල හැප්පීමක් නැතුව ඔහේ ගලාගෙන ගියානෙ.

වර්ණාසි පුංචි කාලේ ආතම්මා කිව්වෙ තාත්තා නැතිවෙලා කියලයි. ඒත් තාත්තාගෙ පින්තූරයක්වත් ගෙදර නැති එක වර්ණාසිට ප්‍රශ්නයක් වුණේ තුනේ පන්තියේදියි. ඒ දවස්වල වර්ණාසි ජිනවතී ඉස්කෝලෙ හාමිනෙත් එක්ක අටළුගම මායාදුන්නෙ මහා විද්‍යාලයට ගියා. මනෝරම්‍යා හිටියෙ ඇමරිකාවෙ පශ්චාත් උපාධියට සූදානම් වෙමින්. අම්මා ලස්සන තැපැල්පත් එවනකල් වර්ණාසි බලාගෙන හිටියා. ඒ කාලෙ ගෙදරට ටෙලිෆෝන් නැති නිසා අම්මා එක්ක කතා කරන්න ලැබුණේ මාසෙකට වතාවක් දෙහිඹිවිට තැපැල් මහත්තයලගෙ ගෙදර යාමෙනුයි. තැපැල් මහත්තයා ආතම්මගෙ මාමාගෙ පුතා.

"අනේ පව්...... නිකං මුරණ්ඩුකමට මේ ළමයට තාත්තෙක් නැති කර ගත්තනෙ. දූං ඔය සුද්දෙක්වත් බැඳගෙන පිළිවෙළක් උනොත් හොඳයි." තැපැල් සීයා එහෙම කිව්වෙ අම්ම කතා කරනකල් බලා ඉඳලා වර්ණාසිට නින්ද ගිහින් කියලා හිතලයි. ඇස් පියාගෙන නිදිමතේ හිටියට වර්ණාසිට ඒ කතාව ඇහුණා.

"එයා කියන දෙයක් අහන කෙනෙක් නෙමෙයිනෙ මල්ලියෙ. එයත් මහ මිනිහා වගේ තමයි. ආඩම්බරයි. කිව්වොත් කිව්වා. තමුන් වැරදියි කියලා පිළිගන්ඩ කැමති නෑ." ජිනවතී ඉස්කෝලෙ හාමිනේ තැපැල් සීයලගෙ රතු ඩිවාන් එකේ දිගාවෙලා හිටි වර්ණාසිගෙ ඔළුව අත ගෑවා.

"දූං ඒ මිනිහත් කාව හරි බැඳලා ඇති." තැපැල් සීයාගෙ නෝනා කිව්වා. හරි නං එයා තැපැල් ආච්චි විය යුතු වුණත් එයා වර්ණාසිට උගන්නලා තිබුණෙ සුදු මම්මා කියන්නයි. සුදු මම්මා ඒ මිනිහා කිව්වෙ කාටද කියලා වර්ණාසිට එක පාරට තේරුණේ නැහැ.

"ඒ මිනිහා ඒ කාලෙම රට ගියා කිව්වනේ. දූං එයාට ළමයි ඉන්නවා නං මේ ළමයගෙත් නංගිලා මල්ලිලා වගේනෙ. ඔය චිත්‍රපටිවල තියෙනවා වගේ ලොකුවෙලා හොයාගෙන එන්නත් බැරි නෑ." බයිස්කෝප් පිස්සෙක් වෙච්චි තැපැල් සීයා කිව්වා.

"මෙයාට කවදහරි ඇත්ත කියනවා කියලයි රමණී මැණිකෙ කියන්නෙ." ආතම්මා කියපු කතාවෙන් වර්ණාසි තාත්තා ගැන දනගත්තා.

ඒත් වර්ණාසි පුංචි කාලෙත් කලබල වෙන ළමයෙක් නෙවෙයිනෙ. ඒක ආතම්මාගෙන් ඇහුවෙ නෑ. ඒත් තාත්තා මැරිලා නැත්තං එයා කව්ද මොන වගේද කියලා දැන ගන්න ඕනකම නං තදින් දැනුණා. සුමාන දෙකක් විතර කල්පනා කරලා තමයි ආතම්මාගෙන් ප්‍රශ්නයක් ඇහුවෙ.

"ආතම්මෙ මගේ තාත්තාගෙ පින්තූර නැද්ද? අම්මගෙ මගුල් පින්තූරෙ කෝ?"

ජිනවතී ඉස්කෝලෙ හාමිනේට උත්තර දෙන්න බැරුව ගියා. ඒක නෑහුනා වගේ හාල්වල වී ඇහිඳිමින් හිටියා. ආතම්මා වර්ණාසිටත් අනිත් ළමයින්ටත් ඉගැන්නුවෙ බොරු කියන්න නරකය කියලයි. ඉතින් ආතම්මා බොරු කියලා අහුවුණු වෙලාවෙ ඒක මූණටම කියන්න මිනිබිරීට දුක හිතුණා. පහු කාලෙක ඒ කතාව සාෂාට කිව්වම සාෂා "ඔයා ඒ වයසෙදිත් පුදුම මව් ගුණයක් තිබ්බච ළමයෙක් වෙන්න ඇති. ඒකනෙ ඒක ආයෙ ආයෙ අහලා ආතම්මට කරදර කරේ නැත්තෙ. මං ආදරේ උනෙත් ඔයාගෙ ඒ ගුණේට තමයි මගේ සිද්ධේශ්වරී" කියලා නළල ඉම්බා.

වර්ණාසි කොළඹ බෝඩිං කරන්න ආතම්මා කැමති වුණේ නෑ. මනෝරම්‍යා හිතුවෙත් ගමේ ජීවිතය දැනගෙන ලොකු වෙලා කොළඹට හරි නුවරට හරි යන්න පුළුවන් කියලයි. පහේ ශිෂ්‍යත්වය සමර්ථ වුණාම තමයි කොළඹ යනවද කියන ප්‍රශ්නය ආවෙ.

"අම්මත් මා එක්ක යං. එතකොට අපිට නුගේගොඩ පැත්තෙන් ගෙයක් කුලියට අරගෙන ඉන්න පුළුවන්. එතකල් දූං ඉන්න කාමර කෑල්ලෙත් ඉන්න බැරියැ." මනෝරම්‍යා යෝජනා කළා.

"අනේ මට නං බෑ ඔය පැතිවල ගිහිං ඉන්න. ඔයාට බැරියැ මෙයාව සෙන්ට් බ්‍රිජට් එක වගේ හොඳ තැනක බෝඩිං කරන්න. නැත්තං නුවර හිල්වුඩ් එක වගේ තැනකට දාන්න." ජිනවතී ඉස්කෝලෙ හාමිනේ යෝජනා කළා.

මනෝරම්‍යාට නිතර පිටරට යන වැඩත් කොළඹින් පිට මඩකලපුවට යාපෙනේට පවා යන වැඩත් තිබුණා. ඉතින් ආතම්මා නැතුව අම්මා එක්ක කොළඹ ඉන්නත් විදියක් නෑ කියලා වර්ණාසි

දැනගෙන හිටියා. ඒත් ඇමරිකාවෙ ඉඳලා ආපු අලුත මනෝරම්‍යා හැමදේටම පවුලේ සාකච්ඡා පවත්වන්නත් උත්සාහ කළා.

"එන්න අපි ඔය ගැන කතා කරමු." කියලා මනෝරම්‍යා අම්මාවයි දුවවයි තල්ලු කරගෙන ගිහින් පිටිපස්සෙ බංකුවෙ ඉඳ ගත්තා.

"පුතේ වර්ෂි ඔයා කැමති කොහාට යන්න ද?"

"මං දන්නෙ නෑ. මට ආතම්මා දලා නං යන්න බෑ." වර්ෂාසි ආතම්මා වාඩි වෙච්චි හාන්සි පුටුවෙ පත්තෙ ඉඳ ගත්තා.

ඔයාගෙ ලකුණු හැටියට ඔයාට ලැබිලා තියෙන්නෙ කෑගල්ලෙ ඉස්කෝලයක්නෙ. මං ඔයාව ඒකටත් ගෙනියලා, තව කොළඹ ඉස්කෝල දෙක තුනකටත් ගෙනියලා පෙන්නන්නං. නුවර ගෙනියලත් පෙන්නන්නං. ඔයා කැමති එක කියන්න. ඒ කැමති එකකට දගන්න මං බලන්නං."

"මේ දරුවට තේරෙනවද ඉස්කෝලෙ තෝරන්න. එයා එළියෙං දැක්කම ලස්සනට පේන එකට කැමති වෙයි. අනිත් එක එයා කැමති වෙන එකටම දගන්න ඇහැක් වෙනවා කියලයැ."

වර්ෂාසි කැමති වුණා අම්මා එක්ක රවුමක් ගහන්න. ඒ සාකච්ඡාව දවසෙම රෑ අම්මා ආතම්මගෙ කාමරේට ඇවිත් දුව එක්කත් ගියා කතාවක් කියන්න තියෙනවා කියලා. ඒත් ඒක දුව හිතපු විදියෙ කථාන්දරයක් නෙවෙයි.

"පුතේ මං ඔයාගෙන් සමාව ඉල්ලන්න ඕන මෙච්චර දවසක් ඔයාට බොරුවක් කිව්වට."

වර්ෂාසි පුදුමවෙලා බලාගෙන හිටියා. මනෝරම්‍යා කොණ්ඩෙ දිගට ගොතාගෙන සුදු නිදි ගවුමක් ඇඳගෙන හිටිය නිසා කතන්දර පොතක ඉන්න සුරංගනාවියක් වගේ පෙනුණා. ඇඳ ළඟ පුංචි චිමිනි ලාම්පුවෙ එළිය විතරක් තිබුණත් හඳ එළිය කාමරේට වැටිලා තිබුණා. රුක් අත්තන, අරලිය මල්වල සුවඳ ලොකු ජනේලවලින් ඇතුළට පැන්නෙ සීතල හුළඟක දෑවටිලයි. වර්ෂාසි දුව ඇඳේ වාඩි කරවගෙන දුවගෙ ඔළුව ඉම්බා. දුව සිරිගරුඬ බෝනික්කෙක් වගේ බලාගෙන හිටියා.

"පුතේ ඔයාගෙ තාත්තා මැරුණා කියල කිව්වෙ බොරුවට. එහෙම කියන්න වුණේ පොඩි ළමයෙකුට ඒක තේරුම් කරන්න අමාරු හින්දයි."

වර්ෂාසි කට තද කරගෙන හිටියා. "මං ඕක නොදැන හිටියා කියලද හිතන්නෙ?" කියලා අහන්න තිබුණත් එහෙම අහන එක තේරුමක් නැහැනෙ. ලොකු මිනිස්සු කැමති ළමයින්ට කිසි දෙයක් දැන ගන්න තරමට ඉවක් නෑ කියලා හිතන්න නං ඒක එහෙම වෙන්න අරින්න එපායැ. අනිත් එක තැපැල් සීයලගෙ ගෙදරදි අහම්බෙන් ඇහිච්ච කතාව නො වුණා නං තමුන් ඔය ගැන දැන ගන්න විදියක් තිබුණෙත් නැහැනෙ.

"ඔයාගෙ තාත්තායි මායි කසාද බඳින්න කතා වුණේ ඉන්දියාවෙ බරණැස් නුවරදි. මං ඒකයි ඔයාට වර්ණාසි කියල දැම්මෙ."

දැරියගෙ ඇස් දීප්තිමත් වුණා. අම්මා කොහොමටත් කතා සාගරයක්නෙ. ඒත් තමුන්ගෙ උපත බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගෙ නුවරදි පටන් ගැනීම කොච්චර ලස්සන ද?

"අනේ ඒ කතාව කියන්න." දුව අම්මාගෙ දැත් තදින් මිරිකා ගත්තා.

"ඒ කාලෙ ලංකාවෙන් පිටරටට සල්ලි ගෙනියන්න බෑ. මමයි ප්‍රියා ආන්ටියි ඉස්කෝලෙ යන කාලෙ ඉඳලා කැට එකතු කරේ කවද හරි ඉන්දියාවෙ යන්නයි. තැපැල් කන්තෝරුවෙ පොතටත් සල්ලි දැම්මෙ එහෙම හිතාගෙනයි. ඉස්සර අපේ වත්තෙ ඔට්ටුපාල විකුණන සල්ලි මං ඉල්ල ගන්නවා. ඒවා පොතේ දනවා කියලා දන්න හින්ද අම්මත් බය නැතුව දෙනවා. ඒ කාලෙ ප්‍රියාගෙ අයියා සුනන්දට දිල්ලියට ශිෂ්‍යත්වයක් ලැබිලා තිබුණා. ඒ නිසා එයාගෙ යාළුවා සුජම්පතිත් එක්ක අපිට දිල්ලි එන්න කිව්වා. සුජම්පති හිටියෙ මදුරාසියෙ එම්බසියෙ. එයා දෙමළ, හින්දි, තෙළිඟු, මලයාලම්, සංස්කෘත හෙම ඉගෙන ගත්තු කෙනෙක්. ඉතින් අපි කෝච්චියෙන් තලෙයි මන්නාරමට ගිහින් එතනින් නැවෙන් රාමේශ්වරම්වලට ගියා. සුජම්පති අරංතලාව මං මුලින්ම දැක්කෙ රාමේශ්වරම්වල රේගු පරීක්ෂාවෙන් එළියට එනකොට. ඇතින් පෙනුණා විශාල කෝවිලක උඩට මතුවෙන ගෝපුරම් එක. සුජම්පති

හිටගෙන හිටිය තැන කඳුවක් උඩ විශාල දුඹුරු කුරුල්ලෙක් හිටියා. අන්තු වත්තෙදිවත් ඒ ජාතියෙ කුරුල්ලෙක් දැකලා තිබුණෙ නෑ. මං එයාගෙන් මුලින්ම ඇහුවෙ අනේ මේ කුරුල්ලාගෙ නම මොකද්ද කියලයි. සුජම්පති කිව්වා ඒ කුරුල්ලගෙ විද්‍යාත්මක නම නං දන්නෙ නෑ ඒ වුණාට ඒ පැත්තෙ මිනිස්සු කියන්නෙ ක්‍රිෂ්ණ කුරුල්ලා කියලලු. ඒ අර පිහාටුවල ගුරු පාට ගතිය හින්ද හින්දු සාමිලා අඳින වෙට්ටියක් වගේ නිසා. ඒ කුරුල්ලා දැකීම බොහොම සුභ ලකුණක් හැටියට සලකනවලු."

"කුරුල්ලා ගැන නෙවෙයි මගේ තාත්තා සුජම්පති ගැන කියන්න." තාත්තාගෙ නම ලිවිය යුතු තැන්වල ඒක ලියන නිසා වර්ණාසි ඒ නම දැනගෙන හිටියා. තමන්ගෙ වාසගම අම්මාගෙයි ආතම්මාගෙයි වාසගම්වලට වඩා වෙනස් නිසා අරංතලාව කියන්නෙ තාත්තාගෙන් ලැබුණු දෙයක් බවත් තේරුම් අරගෙන තිබුණා.

"සුජම්පති ගැන අපි කලින් අහලා තිබුණා. ප්‍රියාට නං එයා මුණ ගැහිලත් තිබුණා. එයා කාලයක් මහණවෙලා ඉඳලා සිවුරු ඇරිය කෙනෙක් බවත් දැනගෙන හිටියා. ඒත් සුජම්පති කියන නමට හිනා වෙච්චි තමයි අපි නැවෙන් ගොඩ බැස්සෙ."

"අනේ ඇයි හරි නරකයිනෙ. ආතම්මා මට නං කියන්නෙ කාගෙවත් නමකට ගමකට හිනා වෙන්න එපා කියලයි. අම්මා පුංචි කාලෙ එහෙම කිව්වෙ නැද්ද?"

මනෝරම්‍යාට මොහොතකට කතා නැති වුණා.

"අපි නරකකට හිනා වුණා නෙවෙයි පුතේ. සුජම්පති කියන්නෙ ශක්‍රයටනෙ. ඉතින් අපි හිනා වුණේ ශක්‍ර දේවේන්ද්‍රයා මනුස්ස දූවරුන් එක්කන් යන්න දිව්‍යලෝකෙ ඉඳලා රාමේශ්වරම්වලට ඇවිල්ලද දන්නෙ නෑ කියලයි."

"අනේ මං ඒක දැනගෙන හිටියෙ නෑනේ." දූරිය ආතම්මාගෙන් ශක්‍රයා ගැන කොච්චරවත් කතා අහලා තිබුණාට කවදාවත් ඒ නම කියලා දීලා තිබුණෙ නැහැනෙ. පුංචිකමට වර්ණාසිට තේරුණා ඒ ආතම්මා නම නොදන්නවට නෙවෙයි තාත්තා ගැන මොනවා හරි අහයි කියන බයට වෙන්නැති කියලා.

කවුරුවත් කියලා දීලා නැති වුණත් තාත්තා ගැන කතා කිරීම ආතම්මාටත් අම්මාටත් දුක හිතෙන දෙයක් බව වර්ණාසි දැනගෙන හිටියා.

"අම්මා කොහොමද දන්නෙ ඒ ශක්‍රයට කියන නමක් කියලා."

"ශක්‍රයාගෙ බිරිඳ සුජා කියලා සංයුක්ත නිකයෙ තියෙනවා. ඔය ආතගෙ පොත් රාක්කෙ ඇති කියවලා බලන්න."

"අනේ මට බෑ. මට ආතගෙ පොත් තේරෙන්නෙ නෑ. පිටුවක් දෙකක් හයියෙන් කියවනකොටත් නිදිමත හැදෙනවා."

"දැං ලොකු ළමයෙක්නෙ. මං ඔයාගෙ වයසෙදි ආතගෙ පොත් සේරම කියෙව්වා. තේරෙන්නෙම නැති ඒවත් කියෙව්වා."

"ඉතිං මගේ තාත්තාගෙ කතාව කියන්නකෝ."

"හරි. සුජම්පතිත් එක්ක ගිය ගමන හරි විනෝදයි. බරණැස් කියලා අපි හිතාගෙන හිටිය නුවර තිබුණෙ නැති වුණත් ශක්‍රයා එක්ක ඇවිදින්න ලැබීමත් ලොකු දෙයක් කියලා අපි හිතා වුණා. එයාට ලස්සනට හින්දි සිංදු කියන්න පුළුවන්. හරියට නෞෂාද් වගෙයි. එයාගෙ තාත්තා නුවර පැත්තෙ වත්තක කොන්දෙස්තර කෙනෙක්. පුංචි කාලෙ ඉඳලා දෙමළ දැනගෙන ඉඳලා තියෙන්නෙ එයාගෙ අම්මා දෙමළ හින්ද. අම්මයි තාත්තායි මැරිලා තියෙන්නෙ කඩුගන්නාවෙදි බස් එකක් පෙරළිලා. ඒ හින්ද ආච්චිට මේ ළමයා හද ගන්න බැරිකමට මහණ කරලා තියෙනවා. ඒත් උපාධිය ගන්නත් කලින් එයා සිවුරු ඇරියලු."

"ඉතිං බරණැස් නුවර ගැන කියන්නෙ නැද්ද?"

"බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජමාලිගාව කියන එක ඔය ජාතක කතාවල තියෙන එක නෙවෙයි. දැං ඉන්න රජ පවුලත් අර පරණ බ්‍රහ්මදත්ත පරම්පරාවෙන් පැවතෙන අය නෙවෙයි. ඒ වුණාට බ්‍රහ්මදත්ත මාලිගාවෙ පහළටම ගිහින් ගංගානම් ගඟට බහින පඩි පෙළ ළඟදි සුජම්පති ඇහුවා එයාව කසාද බඳින්න කැමතිද කියලා. තරුණ වයසනෙ පුතේ. වැඩි දුර හිතුවෙ නෑ. කැමති වුණා."

"ආතම්මාගෙන්වත් අහන්නෙ නැතුව?"

"ඔව්..... දූං තමයි තේරෙන්නෙ ඒකට කලබල වෙන්නෙ නැතුව ඉවසන්න තිබුණා කියලා. ඒත් පස්සෙ අපේ අදහස් ගැලපෙන්නෙ නැතුව ලොකු ප්‍රශ්න ඇති වුණා. මං එයාගෙන් වෙන්වෙලා එනකොට ඔයා හම්බ වෙන්න ඇවිත් කියලා දන්නෙ නෑ. එයා ඒ දවස්වලම ප්‍රංශෙට ගියා. ප්‍රියාලගෙ අයියාත් ප්‍රංශෙට ගියා. ඉතිං ඔයා උපදින්න ආවම ප්‍රියායි අනික් යාළුවොයි කිව්වා මොන ප්‍රශ්න තිබුණත් සුජම්පති එක්ක එකතු වෙන්න කියලා. ප්‍රියා බැඳලා දකුණු අප්‍රිකාවට ගියා. ඔයාගෙ තාත්තා අපි ගැන හෙව්වෙත් නැහැ. මං එයා හොයාගෙන යන්න හිතුවෙත් නැහැ. එයාට ප්‍රංශෙදි මොකක් හරි ප්‍රශ්නයක් ඇති වෙලා රස්සාව නැති වුණාලු. ඊට පස්සෙ කොහේ ගියාද කියලා කවුරුවත් දන්නෙ නෑ. ලංකාවට නං ආවෙ නෑ."

"ඉතිං සුනන්ද අංකල්ට කියලා හොයන්න තිබුණනෙ." කියන එක හිතට ආවත් වර්ණාසි ඒක පිට කරේ නැහැ. අම්මට දුක හිතෙයිනෙ.

"මං ඔයාට කිසිදෙයක් අඩු කරේ නෑනෙ මගේ පුතේ. කවදහරි කොහේ හරි ඉඳලා එයා ආවොත් මෙහාට එක්කන් ඇවිත් ඔයා පෙන්නනවා කියල නං හිතුණා. ඒත් එයාට වෙච්ච දෙයක් කවුරුවත් දන්නෙ නැති වුණානෙ."

"ඉතිං සුනන්ද අංකල්ගෙ යාළුවො කවුරු හරි මගේ තාත්තා ගැන දන්නවා ඇතිනෙ."

"සුනන්ද අංකල් බැඳලා හිටියෙත් නෑ. පපුවෙ අමාරුවකින් එක පාරටම මැරුණා. කාගෙන් කියලා අහන්ඩ ද? ප්‍රියා දන්නෙත් නෑනෙ අයියාගෙ යාළුවො කොහේ කොහේ ඉන්නව ද කියලා."

අම්මයි දූවයි ටික වෙලාවක් කතා නැතුව හිටියා. උක්කුං පාරෙ යන බල්ලෙකුට බුරණවත් ආතම්මා උක්කුංට කෑ ගහනවත් ඇහුණා.

"ප්‍රියා කිව්වා ප්‍රංශෙදි සුජම්පතියි සුනන්දයි මොනවා හරි දේකට තරහාවෙලා හිටි බව නං දන්නවා කියලා."

"ඉතිං මගෙ තාත්තාගෙ නෑදෑයො කවුරු හරි ලංකාවෙ නැද්ද?" වර්ණාසි වෙන කිසිම කාරණයක් ගැන පෙන්නුම් නො

කළ විදියෙ දැඩි උවමනාවකින් ඇහුවා.

"එයාගෙ ආච්චි මැරුණෙ පිරිවෙන් ඉන්නකොටලු. ඒ ඇරෙන්න වෙන කිසිම දෙයක් මං දන්නෙ නෑ. එයා කැමති වුණේ නෑ ඒ කාලෙ විස්තර කියන්න. මාත් හාර හාර අහුවෙ නෑ. ඔයාගෙ ආතම්මා මට කියල තියෙන්නෙ කවුරු හරි මොනව හරි කියන්න අකමැති නං හාරලා අහන්න එපා කියලනේ."

ඒ වෙලාවෙ ආතම්මා දෙඩම් ජෝඩුවක් හදාගෙන කාමරේට ආවෙ "ඔව්... ඔව්.... ඔයාගෙ අම්මා මං කියන විදියටම වැඩ කරන ළමයනේ" කියලා හිනාවෙමින්. වර්ණාසි දනගෙන හිටියා අම්මා තමන් තරමට හොඳ ළමයෙක් වෙලා ඉන්න නැතුව ඇති කියලා. ආතම්මා නිතර කියන්නෙ "මුරණ්ඩු ළමයා" කියලනෙ. ඒත් ආතම්මා මිනිබිරි ගැන කියන්නෙ "අම්මා වගෙ නෙවෙයි හරි නිවිච්ච ළමයා" කියලයි.

එදයින් පස්සෙ අම්මයි දූවයි තාත්තා ගැන කතා කරේ සාෂාගෙ ප්‍රශ්නෙත් මතු වුණාට පස්සෙයි. ඒ කතාවෙන් පස්සෙ වර්ණාසිට කෑගල්ලෙ ද කොළඹ ද නුවර ද කියන ඉස්කෝල ප්‍රශ්නෙට අම්මා එක්ක රණ්ඩු ගහන්නත් උනන්දුව නැති වුණා.

"කොහේ හරි අම්මට මාව බලන්න පුළුවන් තැනක ඉස්කෝලෙකට දන්න." කියලා වර්ණාසි කිව්වා. නැපැල් සීයලා නුගේගොඩට මාරු වුණා. ඒ නිසා වර්ණාසියි මනෝරමායි නුගේගොඩ පදිංචියට ගියා. වර්ණාසි ශාන්ත ජෝසප් බාලිකාවට ඇතුළු වුණා. මනෝරමා කොළඹින් පිට යනකොටයි පිටරට යනකොටයි වර්ණාසි නැපැල් සීයලගෙ ගෙදර හිටියා. සතියකට වැඩිය එහෙ නවතින්න වෙනවා නං ජිනවතී ඉස්කෝලේ හාමිනේ ඇවිත් නැවතුණා. නිවාඩු දීපු ගමන් වර්ණාසි මහගෙදරට ගියා. මනෝරමා හුඟාක් උත්සාහ කළා දූවත් එක්ක ඉන්න. ඒත් එයාගෙ ජීවිතේ හැඩ ගැහිලා තිබුණෙ විශාල සාමාජික ජීවිතයක් එක්කයි. එයා කොළඹ උසාවියෙ වැඩ කිරීම නවත්තලා නානාපති කාර්යාලෙක රස්සාවක් හොයා ගත්තා. ඒත් පැය අටේ රස්සාව කරලා දූවත් එක්ක ගෙදර ඉන්න පුළුවන්කම තියෙද්දිත් නාට්‍ය හදන්න, චිත්‍රපටි හදන්න උත්සාහ කළා. වර්ණාසි මුරණ්ඩුකම් පාන ළමයෙක් නොවුණත් ඒ අමතර වැඩවලට යාම තරයේ ප්‍රතික්ෂේප

කළා. වර්ෂාසිට ගෙදරකින්ගේ හිලූ කියනවත් කිසිම උනන්දුවක් තිබුණෙ නෑ. ඔය එක එක ශක එළේකිහගෙයා පවත්වන ලේඛන ගැන්වත් සම්මුලී තිබුණා. වර්ෂාසිගෙ ඉස්කෝලෙ මොකක් හරි ලන්ඩෝසිනේ තිබෙන ලොකුගම තමයි මනෝරම්‍යාගෙ අමතර වැඩිත් පෙනුනේතෙ.

"අපි මේ නිවාඩුවට නුවරඑළියෙ යං"

"අපි ඉගෙම්මවත් ගෙන්නගෙන කතරගම යං" වගෙ දෙවල් යෝජනා කරලා ක්‍රියාත්මක කරත් මනෝරම්‍යා එහෙම ගමන් යනකොට මොකක් හරි පොතක් දෙකක් උස්සගෙන තමා. එහෙම තමන්ට මහ විශාල තොරතුරුමක් ඇති වුණේ ඇයි කියලා වර්ෂාසි දැනගෙන හිටියෙත් නෑ. ඒ කාලෙ වර්ෂාසිට නිතරම සිතුවෙ කැක්කුම, පපුවෙ හතිය. ඔබේ අමාරු වගේ අසනීප තිබුණා. සාෂා එක්ක ඔය හැමදේම කියන්න පුළුවන් වුණොත් එයා තමයි ඒ රෝග නිධාන දෙන්නුම් කළේ.

"ඔය සේරම හිතේ ලෙඩ. ඔයා දන්නෙම නැතුව අම්මා එක්ක විශාල තරහාවක් ගොඩ ගැහෙන්න ඇති. අම්මාගෙ අවධානය ගන්න තමයි ඔයා ලෙඩ වෙන්න ඇත්තෙ."

"අනේ මට ඒක තේරුණේ නෑ. මට ලෙඩ වෙන්න ඕනකමක් තිබුණෙ නෑ. හැබැයි ලොකු වෙනකොට තාත්තා නැති අඩුව දැනෙන්න ගත්තා. අම්මා නුගාක් පොඩි දේකට කලබලවෙලා තාත්තාව අතාරින්න ඇති. ඒත් අම්මාගෙ ආඩම්බරකමේ තරම කියන්නෙ කවදාවත් ඒ ගැන දුක් වුණේ නැහැනෙ. එයා හිතන්නේ එයා ලොකු දෙයක් කරන්න ශක්තියක් තිබුණු කෙනෙක් කියලා."

සාෂා ජීවිතේට එනතුරු කිසි කෙනෙකුට බැරි වුණානෙ වර්ෂාසිව ඒ තරම් හොඳට කතා කරවන්න. හොඳම යාළුවා හැටියට සලකන්න පුළුවන් භාග්‍යා එක්කවත් ඒ තරම් විවෘතව කතා කරන්න බැරි වුණා. භාග්‍යා එක්කත් එච්චර යාළුවෙන්න හේතු වුණේ එයා මනෝරම්‍යාගෙ යාළුවා ප්‍රියාගෙ ඥාති සහෝදරියකගෙ දුවෙක් වෙච්චි නිසයි. භාග්‍යාලා හිටියෙත් නුගේගොඩ කන්දවත්ත පාරෙයි. ඒත් සාෂා ජීවිතේට එකතු වුණාට පස්සෙ තමයි භාග්‍යා එක්කත් වැඩි වැඩිය පෞද්ගලික දේවල් කතා කරන්න පුළුවන් වුණේ.

"අම්මා කොහෙකුට වඩා හොඳට දුවෙක් ගැන දන්නෙ නැද්ද?" කියලයි මනෝරම්‍යා නං කියන්නේ. ඒ වුණත් එහෙදී ගෑණු අම්මෙ පරාද කළා කියලයි වර්ෂාසි හිතුවෙ. එහෙම මිනිහාටයි අම්මා ඔච්චර හපුරු වෙන්නෙ. භාග්‍යාලගෙ අම්මා නං වැඩි දුරට ඉගෙන ගත්තෙ නැති ගෑණියක්. ඒත් වර්ෂාසිගෙ අම්මා එහෙම නෙවෙයිනෙ. එයා ඊනයේ ඉස්කෝලේ හාමිනේගෙ දුවෙක් කියන්න බැරි විදියට වැඩ කරපු. කාලයට ඉදිරියෙන් ඉන්න කෙනෙක් වගේ හැසිරෙන, තමන්ට ඕන දේ කරන, සමාජයට බය නැති කෙනෙක්නෙ. ඒ ජාතියෙ අම්මෙක් මොකටද දුවෙක් කසාද බැඳලා හොඳට ඉන්දැද්දී බැනාව පිළිගන්න මැළිවෙන්නෙ? ඒක කුහකකම, හපුරුකම, තණ්හාව නෙවෙයි නං වෙන මොකද්ද?

"මිගෙල්ලන්ගෙ මැණියන්වහන්සෙ මාත් එක්ක කතා කරන්නෙ නැති එක ඔයා ඔච්චර හිතට ගන්න එපා. මට ගාණක් නැත්තං ඔයා මොකටද ඒකට හිත තරක් කර ගන්නෙ." කියලයි සාෂා නිතර කියන්නෙ.

"එයා මොනවා කරත් මං තරහා නෑ" කියල සාෂා කියනකොට වර්ෂාසිට අම්මා එක්ක තරහා එනවා. ඒත් අම්මෙක්ගෙයි දුවෙකුගෙයි බැඳීම ඒ කිසිම තරහවකින් නැතිවෙන දෙයකුත් නෙවෙයිනෙ.

වර්ෂාසි කැමති වුණේ අම්මා වගේ ගමේ ගුරුවරියක් වෙලා සාමාන්‍ය ජීවිතයක් ගෙවන්නයි. විශ්ව විද්‍යාලෙ යන්නත් ලකුණු මදි වෙච්චි නිසා ඒකට හොඳටම ඉඩ තිබුණා.

"ඔයා ගමේ ගුරුවරියක් වෙන්න ඕන නං ඒකට කිසිම ප්‍රශ්නයක් නෑ. ඊට කලින් පිටරටක ඇවිදලා බලලා ලෝකෙ මොන වගේද කියලා දැනගෙන එන්න."

මනෝරම්‍යා බලකරලා කැලිෆෝනියාවේ බර්ක්ලි විශ්ව විද්‍යාලයේ ගිම්හාන පාඨමාලාවකට යැව්වා. ඒ දවස්වල ප්‍රියා ආන්ටිලත් මනෝරම්‍යාගෙ තව යාළුවොත් එහෙ හිටියා. භාග්‍යාත් ශිෂ්‍යත්වයක් ලැබිලා එහාට ගිය හින්ද මිසක් නැත්තං වර්ෂාසි අකමැත්තෙන් හරි ඒකට එකඟ වෙන්නෙ නැහැ.

එහෙදි තමයි සාෂා මුණ ගැහුණෙ. සාෂා එහාට ඇවිත්

හිටියෙ ගේල් කියලා සුද්දියෙක් බැඳපු නිසයි. ඒ වෙනකොට දෙන්නා දික්කසාද වෙලා නැති උනත් කසාදය ඉවරවෙලා එක ගෙදරක හිටියා. සාෂා බර්ක්ලි විශ්ව විද්‍යාලෙ තැපැල් කන්තෝරුවෙ ලියුම් තෝරන පොඩි රස්සාවක් කළා. ඊට බැන්ක්‍රොෆ්ට් මාවතේ ඉන්දියානු අවන්හලේ කම්ලා ගැහුවා. සති අන්තයට නාට්‍ය කණ්ඩායමක් එක්ක වැඩ කරා. විශ්ව විද්‍යාලෙට තොම් වොම්බ්ලි ආපු දවසෙ සෙනඟ පිරිලා ඉතිරිලා හිටියා. එද සාෂාගෙ බල හිරිමට ගියා සංගම් ශාලාවෙ පිටත අංගනයෙ සීතලේ වාඩිවෙලා වොම්බ්ලි කියන දේවල් අහගෙන හිටියට ඒ කවුද කියලාවත් වර්ණාලි දැනගෙන හිටියෙ නෑ. ඒ කියපු කිසිම දෙයක් වර්ණාලිට තේරුණෙත් නෑ. ඒත් ඒ දෙන්නා සිංහලෙන් කතා කරනවා අහගෙන හිටි කෙනෙක් "ඔයගොල්ලො ලංකාවෙන්ද?" කියලා සිංහලෙන් ඇහුවා. එතනදී ඇඳින ගත්තු සාෂා ඊට පස්සෙ ඉඩ ලැබෙන හැම වෙලාවකම වර්ණාලි මුණ ගැහුණා. වර්ණාලිව විශ්ව විද්‍යාලය පිටිපස්සෙ කැලේ මැදින් "ඉන්ස්පිරේෂන් පොයින්ට්" එකට එක්කන් ගියෙත් සාෂා තමයි. එතන පුංචි නිල් කඳු පෙළයි නිල් ජලාශයත් සහිත චිත්‍රයක් වගේ භූමි දර්ශනයක් පෙනෙන තැනක්. එතනට යන මිනිස්සු නොසෙල්වී බලාගෙන ඉන්නවා. එතකොට තමනුත් ඒ චිත්‍රයෙ කොටසක් වෙනවා.

"වර්ණි අපි මෙතනදි මේ කඳුවල මේ කැලෑවෙ කොටසක් වෙනවා ඔයාට දැනෙනවද? සාෂා ඇහුවා.

"ඔව්"

සාෂා හිටියෙ වර්ණිට පිටිපස්සෙන්. සාෂාගෙ හුස්ම වර්ණිගෙ බෙල්ලට වැදුණා. සාෂාගෙ ඇඟේ උණුසුම පිටට දැනුණා. වර්ණිට මතක් වුණේ අම්මාවයි. මනෝරමාත් ඒ වගේ කතා කියන කෙනෙක්නෙ. ඒත් වර්ණි එහෙදි මුණ ගැහුණ ලංකාවෙ අයට තමන් කාගෙ කවුද කියලා කිව්වෙ නෑ. ඒ කාලෙ මනෝරමා වාර්තා චිත්‍රපටි කීපයක් හදලා තිබුණා. ප්‍රකට මාතෘ භූමිකාවකට පෙනී හිටියා. ඉතින් නම කිව්වම කොළඹ මිනිස්සු දන්නවා. ඒ නිසා වර්ණාලි කැමති වුණේ නෑ කිසි කෙනෙක් තමන්ට මනෝරමාගේ දුව හැටියට සලකනවට.

"මං කැමති නෑ අම්මගෙ කොඩියෙන් බැබළෙන්න. මං

මනෝරමාගෙ දුව කියලා දැන ගත්තම මිනිස්සු මාත් එක්ක කතා කරන්න හදන්නෙ එයා එක්ක කතා කරන දේවල්මයි. එතකොට මට කියන්න වෙනවා මං අම්මා වගේ නෙවෙයි නිකම්ම වර්ණවතී කෙනෙක් කියලා. මෙහෙ ඉන්න කළු සුද්දන්ට නං කියන්න වෙන්නෙ මං ප්ලේන් ජේන් කෙනෙක් කියලා තමයි. නැත්තං තේරෙන එකක් නෑ." වර්ණාලි සාෂාට කිව්වා.

සාෂා ඒක ප්‍රියා ආස්ටිවත් කිව්වා. සාමාන්‍යයෙන් පිටරටකදී මුණ ගැහුණම ලංකාවෙ මිනිස්සු කාගෙ කවුද කියලා අහනවනෙ. ඒත් වර්ණාලිගෙන් කවුරුවත් වැඩි විස්තර ඇහුවෙත් නෑ. අනික් එක වර්ණාලිගෙ සම්පූර්ණ නම කියවුණෙත් නැහැනෙ. හැමෝම කතා කළේ වර්ණි කියලයි.

"ඔයා ලංකාවට ගියාම මට පාළුවක් දැනෙයි." සාෂා ඉන්ස්පිරේෂන් පොයින්ට් එකෙ ඉඳන් කැලේ මැදින් එනකොට වර්ණිගේ අත අල්ලලා අදිමින් කිව්වා.

"එහෙම වෙන්නෙ කොහොමද, මෙහෙ ඔයාට රස්සාවල් දෙක තුනක් තියෙනවා. ගේල්ගෙ ගෙදර ඔයාට කරදරයක් නැහැනෙ. ඉතිං මං වගේ අය ඇවිත් ගියාට කිසි වෙනසක් නෑ. අර පහළ තියෙන නිල්පාට කඳුයි ජලාශයි වගේ ඔහේ ලස්සනට බැලුවට ඉඳියි."

"ඔයා ඒක කියපු විදියට මං ආසයි. ඔය ජලාශෙ ළඟට ගිහින් බැලුවොත් ඒක ඔහොම නිකං පේන්ටිං එකක් වගේ නෑනෙ. එතකොට ඉවුරෙ හැපෙන පුංචි රැළි පෙනෙයි. මාළු ඉඳියි. අතට අරගෙන බැලුවම නිල්පාට තියෙන්නෙ වතුරෙ නෙවෙයි අහසෙයි කඳුවලයි කියලා දැනෙයි. ඈතින් බලනකොට පෙනෙන දේ නෙවෙයි ළඟට බලනකොට. මාත් ඒ වගේ තමයි." සාෂා නැවතිලා කඳු බෑවුම පහළින් ගලාගෙන ගිය පොඩි දිය පාරක් වක්කලමකදි ස්වාභාවික තටාකයක් වෙලා තියෙන තැනක් දිහා බැලුවා. වර්ණි කතා කළේ කලින් දැකපු ජලාශ දෙක ගැන මිසක් ඒ ගස් අතරින් කොළ පාටට බැබලිච්ච තැන ගැන නෙවෙයි. වර්ණාලිට හිතුණා අම්මා හිටියා නං පහළට දුවලා වතුරට පැනලා පීනයි කියලා.

"මගේ මිනිබිරී දුව වගෙයි. දුව මිනිබිරී වගෙයි. දුවට එයා අම්මෙක් කියලා මතකත් නෑ. තාමත් සෙල්ලං ගතිය... ඔය ජේන්නෙ

නැද්ද මංඩිලි නදින හැටි. මිනිබිරී එයාගෙ අම්මගෙ වැඩ දිහා බලාගෙන ඉන්නෙ පොඩි ළමයෙක් දිහා බලාගෙන ඉන්නවා වගෙයි." සිංහල අවුරුදු දවසක ජීනවතී ඉස්කෝලෙ හාමිනේ කෙනෙකුට කිව්ව වචන මතක් වෙලා වර්ණිට හිනා ගියා.

"ඇයි ඔයා තනියම හිනාවෙන්නෙ."

"මං හිනාවුණා ද?"

"කට වහගෙන හිටිය ඇස්වලට හිනාවක් ආවා. ඒක හරියට මොකක් හරි පුංචි කාලෙ දෙයක් මතක් වෙලා වගේ, තමුන් හුඟක් ආදර් කෙනෙක් මතක්වෙලා වගේ හිනාවක්."

වර්ණි ඇස් ලොකු කරගෙන මඳ හිනාවකින් බල හිටියා මිසක් 'ඔයා කොහොමද මගේ හිත ඔච්චර හොඳට කියෙව්වෙ' කියලා ඇහුවෙ නැහැ.

"ඔයා ළඟ තියෙන්නෙ ගැඹුරු තිස්වල සතුවක්. හරියට සඳුන් සුවඳයි පිච්චමල් සුවඳයි මිශ්‍රවෙලා හැදිච්ච දෙයක් වගෙයි. ඔයා ළඟ අමුතු සන්තෝසෙකුයි, අමුතු තැන්පත්කමකුයි තියෙනවා. සමහර විට ඊට යටින් මේ මං වගේ දඟ කෙනෙකුත් නිදගෙන ඉන්නවා ඇති. ඉඳිකට්ට අතේ ඇනිලා නිදගෙන හිටිය කුමාරි වගේ වෙන්නත් බැරි නෑ."

වර්ණාසි ඒකට උත්තර බඳින්න කලබල වුණේ නෑ. එහෙම කතා පසුවට උරා ගන්න අරිනවා මිසක් කතා කරලා ඒ වචනවල අමෘත මන්ත්‍ර බල බිඳින්නෙ මොකට ද? අම්මා හිටියා නං 'ඔය පිරිමින්ගෙ චාටු කතා' කියලා කියයි. ඒක එහෙම වෙන්නත් ඇති. ඒත් සාෂා කතා කරපු විදියට සතුටක් දැනුණෙ ඊට කලින් කිසිම පිරිමියෙක් එහෙම කියලා නැති හින්ද ද නැත්තං එහෙම ආදරේ ප්‍රකාශ කරන්නෙ අම්මා විතරක් හින්ද මොකක් හරි සමීප ගතියක් දැනෙන හින්ද ද? අම්මා මහගෙදරට එනකොට වර්ණාසි ඇහැරගෙන හිටියත් බොරුවට නිදි වගේ ඉන්න වෙලාවල් තිබුණා. එතකොට අම්මා ඇඳ උඩ වාඩි නොවී බිම දන ගහගෙන දුවගෙ දිග කොණ්ඩ කරල ඉඹිනවා.

"කෝ මගේ නිදිකුමාරි නිදි නං කකුල හොල්ලයි. මේ

කොණ්ඩෙන් පිච්චමල් සුවඳ එනවා. මේ නිදිකුමාරිගෙන් සඳුන් සුවඳ දැනෙනවා. මේ නිදිකුමාරිට සුදු චොක්ලට් ගෙනාවා."

අවුරුදු කුමෙන්දියි විස්සෙදියි කියල වෙනසක් නෑ. අම්මා දිගටම එහෙම කිව්වා. දුවත් දිගටම කකුල හෙල්ලුවා. ඒත් අම්මයි දුවයි හරි වෙනස්. වර්ණි ඒ චොක්ලට් පරෙස්සමින් අරන් තියලා පහුවෙනිද දවල්ට බතුත් කාලයි දිග අරින්නෙ. මනෝරමාට කවුරු හරි එහෙම සුරතලේට චොක්ලට් දුන්නා නං එවෙලෙම කාලා චොක්ලට් දවටනයෙ ඇතුළ පත්තෙ හිනායන ස්තුති කිරීමකුත් ලියලා ඒක දීපු කෙනාගෙ ඇඳ ළඟ තියනවා. වර්ණිට සාෂාවයි අම්මාවයි සසඳමින් වැඩි වෙලාවක් ඉන්න ලැබුණෙ නැහැ.

"අපි නාමුද?" සාෂා වර්ණිවත් ඇදගෙන පහළට දිව්වා.

වර්ණිට හිතන්න වෙලාවක් තිබුණෙ නෑ. පල්ලම පහලට දුවලා දෙළ අද්දර නැවතුණාම වර්ණි හති දැම්මා. නුවරඑළියට යනකොට මනෝරමාත් එකපාරටම අතරමඟදි දිය ඇල්ලක් ළඟ වාහනෙ නවත්තලා නාපු දවස් තිබුණා. එතකොට ජීනවතී ඉස්කෝලෙ හාමිනෙයි මිනිබිරියි හෙවණකට වෙලා බලා ඉන්නවා. වතාවක් හපුතලේ ගනකොට බෙලිහුල්ඔය නානායමේ කෑමට නැවැත්තුවම මනෝරමාට පිස්සුවක් හැදුණා ඒ දෙළපාර දිගේ උඩහට යන්න.

"දැං මේ යන ගමන පරක්කු වෙනවනේ. මට නං බෑ ඔය පිස්සු ගමන් යන්න" ජීනවතී ඉස්කෝලෙ හාමිනේ උරහිස් හකුළා ගත්තා. "මටත් බෑ" කියමින් වර්ණාසි ආතම්මා ළඟට වුණා. මනෝරමායි එයා එක්ක ඇවිත් හිටිය කොරියානු ගෑනියෙකුයි කෑම පාර්සල් දෙකකුත් හදාගෙන කැලේ උඩහට ගියා. අම්මටයි දුවටයි කාලා නිද ගන්න කියලා කාමරයක් අරන් දුන්නා.

"මේ විදියට හපුතලේ යන්න දවස් දෙකක් යාවි." ජීනවතී ඉස්කෝලෙ හාමිනේ නින්දකුත් නිදගෙන නැගිටලා තේ බොන ගමන් කිව්වා.

"අම්මට මාත් එක්ක වැඩිය ඉන්න ලැබෙන්නෙ නෑ කියලා ආපු ගමන වුණාට මොකද දැං ඒක මතක නෑ... කැලේ කාගෙ හරි පැළක් හම්බවුණොත් ඒකෙ ඉඳලා හෙට දවල්ට පහළ බහින්නත්

බැරි නෑ. අපේ අම්මට නං පිස්සු." වර්ණාසි එහෙම පැමිණිලි කරාට මොකද තරහක් තිබුණෙ නැහැ. මනෝරමායි යාළුවයි තාලා ගලක් උඩ ඉඳගෙන බත් කාලා ගමේ ගෙදරකින් හකුරුත් අරගෙන වංගෙඩි තේත් බීලා හතර වෙනකොට පහළට ආවෙ ප්‍රීතිමත් වෙහෙසකින් හිනාවෙමින්.

"සුනේ ජීවිතේ විඳින්නත් වාසනාව තියෙන්න ඕන." මනෝරමා යාළුවට තේරෙන්නත් එක්ක ඉංග්‍රීසියෙන් කිව්වා.

"ජීවිතේ විඳිනවා කියන්න කුඩැල්ලන්ට ලේ පරිත්‍යාග කරන එකයි, කඳු නැගලා කකුල් රිදව ගන්න එකයි නං ඒ විඳවිල්ල නැති වුණාට කමක් නෑ" කියලා කියන්න ඕන වුණත් වර්ණාසි උත්තර නොබැඳ හිතා වුණේ "ඔයා ඉතිං පොඩි ළමයෙක්" කියන විදිහේ බැල්මකින්. වර්ණාසි හිතෙන් ලංකාවෙ දිය ඇල්ල ළඟට යන අතර සාෂා ටීෂර්ට් එක ගලවලා, ඩෙනිම් දිග කලිසමත් ගලවලා යටට ඇඳපු කොට කලිසම පිටින් ඇමරිකාවෙ වතුරට පැන්නා. වර්ණාසි පිටේ එල්ලන් හිටිය බෑග් එක සීරුවට ගලවලා මක් ගහක් පාමුල තියලා බෑග් එක ඇතුළෙ තිබුණු බෙ ගාඩියත් සත්තරේ ගහ මුල එලුවා. බොහොම ශාන්තව වාඩිවෙලා ඒ හරියෙ වැවිලා තිබුණු බෝඹු ගස් දිහා පුදුමෙන් බැලුවා. ලංකාවට වඩා මල් ලොකු එක විතරයි වෙනස.

ස්වභාවික තටාගයේ ආරක්ෂිත කොටුවක් වගේ ලණු ඇඳපු කොටසක් තිබුණත් සාෂා ඒක නොතකා මාළුවෙක් වගේ නිදහසේ පීනුවා. උඩ පනින වතුර බින්දුවලට ඉර එළිය වැටිලා දේදුනු පාටට දිලිසුණා.

"එන්න..... පීනන්න කියලා දෙන්නං." සාෂා කෑගැහුවා. එයාගෙ හඬ දෝංකාර දුන්නා. දෙළ පාර මනමාළ දඟලිල්ලකින් වක් වෙමින් දිග ඇරෙමින් පොඩි හදිස්සියකින් වගේ දිව්වා.

"සීතල ඇති." කිව්වා මිසක් "මමත් ටිකක් පීනාන්න දන්නවා" කියන්න වර්ණිට ඕන වුණේ නෑ.

"මේ ජූලි අගෝස්තු මාසවල මිසක් ඉස්සරහට කොහොමටත් මෙහෙ නාන්න බැරුව ඇති. ඔයා හිටියෙ නැත්තං මං නිකම්ම පැනලා නානවා." සාෂා ගොඩට ඇවිත් අත දික් කළා.

"ඉතිං මං හිටියට මොකද වෙනදා පුරුදු විදියට නාන්න."

කියන බැල්ම ඇස් දෙකේ පුරවගෙනත් කට අරින්නෙ නැතුව ඉන්න වර්ණිට පුළුවන් වුණා.

"දැන් නං ඔයාගෙ ඇස් දකියි." සාෂා සෙල්ලම් ස්වරයෙන් කිව්වා.

වර්ණි ඇස් පියා ගත්තා. එතකොට තළලට ආවෙ සාෂාගෙ දිය බේරෙන උඩුකය විතරයි. ඇස් පියා ගත්තට මොකද පණ පිටින් ඉළුව ඇඟුළට රිංගන්න හදන මායාකාරයා වර්ණාසිගෙ ළමැද නියස්සන්න සමර්ථ වුණා.

"මෙහෙම ඉන්න මං ඔයාගෙ පින්තූරයක් ගන්න ඕන." සාෂාගෙ ගැඹුරු හඬ විධානයක්. එහෙම විධානයකට යටත්වීමේ කැමැත්තකුත් දනෙන්න ගත්තම තමන්ට ඉතා වේගයෙන් මොකක් හරි සිද්ධවෙමින් පවතින බවත්, ඒකට යටත් නොවී පැනලා දුවන්න ඕන බවත් දැනෙන්න ගත්තා.

"අනේ මේ ළමයා ඕය දෙළු ගෑවට වෙලා පිටස්තර පිරිමියෙක් නාන තැනක මොනවද කරන්නෙ." ඒ කැලිෆෝනියාවෙ කියලා අමතක වෙලා ආතම්මගෙ කටහඬ පාර පැත්තෙන් ඇහෙනවා නං හොඳයි වගෙත් හැඟුණා.

ඒ අතර සාෂා පින්තූර ගන්න "ක්ලික්" හඬත්, සීතලම සීතල ඇඟිලි තුඩුවලින් මූණට වැටිච්ච කෙස් රොදක් පැත්තකට කරණවත් දනුණා.

"ඉතිං ඇස් අරින්න." මෘදු රහස් ස්වරය ඇහුණෙ තළලටත් කිට්ටුවෙන්.

වර්ණාසි නෙවෙයි ඇස් ඇරියෙ. පත්තරවල පළවෙන කවිවල, මනෝරමා ගෙනත් දුන් නවකතාවල තියෙන්නෙ උණුසුම් හාදු ගැන උනාට වර්ණාසිට ලැබුණු ප්‍රථම හාදුව හරිම සීතලයි.

"ඇයි ඇස් අරින්නෙ නැත්තෙ. මට ඔයාගෙ ඇස් දෙකෙන් මාව බලන්න ඕන." සාෂා මිමිනුවා.

"මන්" වර්ණාසි ඔළුව හෙලෙව්වා.

ප්‍රේම සම්බන්ධයක් නැතුව පිරිමියෙක් මූණ ඉඹිමොත් තරහ යන්න එපායැ. ඒත් තරහා ගියෙ නැත්තෙ මොකද? ඒ ජීනවති ඉස්කෝලෙ හාමිනේගෙ මිතිබිරි කියා මනෝරම්‍යගෙ දූ වෙන්නවත් බෑ. අම්මා නං ඒ මිනිහව තල්ලු කරලා දාලා "මූ ඔවට එන්න එපා. ඔයා යාළුවෙක් විතරයි" කියයිනෙ.

යාළුකම ඊට වැඩි සම්බන්ධයක් බවට පත් වෙන්නෙ කොහොමද? මිනිහෙක් තලලත්, ඉඹල තොල් දෙකත් ඉඹිනකල් ඉට්රූපෙ වගෙ ඉන්නවා කියන්නෙ ඒ මිනිහට කැමතියි කියන එකනෙ. ඒ වුණාට පිරිමියෙකුට ඒක ප්‍රේමයක් නෙවෙයි තියෙ සිල්ලර සෙල්ලමක් වෙන්නත් ඇතිනෙ.

"එන්න මං ඔයාව බෞතිස්ම කරන්නං" සාෂා කතා කරන්නෙ අම්මා වගේම තමයි.

"සීතලයිනෙ." වර්ණාසි ඇස් අරින්නෙ නැතුවම උත්තර බැන්ද.

"ඔයා බයිබලේ කියවලා තියෙනව ද?"

"නෑ" වර්ණාසි ඇස් ඇරියා. සාෂා ඕක් ගහ ළඟ බිම දිගා වුණා. එයාගෙ ඇඟට ඉර එළිය වැටිලා රෝස පාටට පෙනුණ කලු කොට කලිසම ඇඟට ඇලිලා විශාල ආශාවක් පිටතට පතින්න තනන බව දැනුණා.

"බයිබලේ තියෙන හැටියට ජෝර්දන් ගඟේ ගිල්වලා අරගෙන තමයි පරණ පව් හෝදලා අලුත් ජීවිතයක් පටන් ගන්න සලස්සන්නෙ. සමහර විට එහෙම යුදෙව් සම්ප්‍රදයකුත් තියෙන්න ඇති."

සාෂා සැහැල්ලුවෙන් දිගා වෙලා අර සිප ගැනීම සිද්ධ නොවුණා වගේ බෞතිස්ම කතාවක් කියන්න ගත්තම වර්ණාසි පුදුම වුණා. ඒ එක්කම ඊටත් වැඩිය පුදුම වුණේ තමත් ගැනයි.

"ඔය කෙහෙම්මල් බෞතිස්ම කතාව එපා. සීතල වුණාට කමක් නෑ මාව ආයෙත් ඉඹින්න." කියලා කෑගහන්න හිතුණෙ ඇයි? ඒ නං තමන් දන්න වර්ණාසි වෙන්න බෑ.

"යේසුස් වහන්සෙව බෞතිස්ම කරනකොට ශුද්ධාත්මයෙන්

හඬක් ආවා කියනවනෙ." සාෂා පල්ලියක දහම් පාසලක පාඩමක් කරන්න හදනවද?

"දං ඔය ඇඟේ වතුර පිටින් සීත හුළඟ වැදෙන්න හොඳ නෑ. එතකොට නිව්මෝනියාව හැදෙනවා. ඔයා පීතලා එන්න." ඒ පාර වර්ණාසි කතා කරේ ජීනවතී ඉස්කෝලෙ හාමිනේගෙ ස්වරයෙන්.

"මට ඔහොම දේවල් කියලා දෙන්න අම්මෙක් නෑනේ."

සාෂා බලාපොරොත්තු වෙන්න ඇත්තෙ අම්මා ගැන විස්තර අහන්න වෙන්න ඇති. ඒත් එයාගෙ අම්මා ගැන අහලා තමුන්ගෙ අම්මා ගැනත් කියන්න වර්ණාසිට ඕන වුණේ නෑ.

"කිව්වම අහලා හුළං වැදි වැදී පොඩි ළමයෙක් වගේ වෙන්නෙ නැතුව වතුරට බැහැලා එක පාරකට නාලා එන්න. දං මේ විදියට යාන්තමට තෙමුණම හෙම්බිරිස්සාව හැදෙනවනෙ."

සාෂා හිනා වුණා.

"මං ආසයි ගෑනියෙක් ළඟ පොඩි ළමයෙක් වෙන්න. ඒ උනාට ඔයාව බෞතිස්ම කරන්නත් ආසයි."

"ශුද්ධාත්මය කතා කරලා පිස්සු නැතුව නානවා ළමයෝ කියයි." වර්ණාසි වෙන කිසිම දවසක කා එක්කවත් නැති විදියට නිදහසේ කතා කළා.

සාෂා එක පාරටම නැගිටලා වර්ණාසිව බෝනික්කෙක් වගේ උස්සලා ගත්තා.

"ඔයාට බබෙක් වගේ හුරතල් වෙන්නත් දන්නවා. අම්මෙක් වගේ ආදරෙන් බනින්නත් පුළුවන්. මිනිහෙක්ව හිනස්සවන්නත් දන්නවා. මේ නම නොදන්න දෙළට මං නමක් දෙනවා බර්ක්ලි ආදර දෙළ කියලා. සමහර විට පහළ රෝස උයනට ගලන වතුර පාරත් මේකෙන් යන එකක් වෙන්නැති. මං ඔයාව මේකෙන් බෞතිස්ම කරාම අපි ආයෙ හම්බ වුණේ නැතත් අපි මැරෙනකල්ම ආදරේ කරයි."

සාෂා වර්ණාසිව උස්සගෙන ගිහිං දෑණහිස ළඟට විතර වතුරෙ ඔබලා ආයෙත් ගොඩින් තියලා එයා වතුරට පැනලා පීනුවා. වර්ණාසි සීකුවින්ස් අල්ලපු දිග ළා දම් පාට සායෙ වතුර මිරිකමින්

හිනා වෙවී හිටියෙ වතුර බේරි බේරි කැලේ මැදින් [illegible] නිසා මිසක් බෑග් එකේ ඇඳුමක් තිබුණා නං පීනන්න තිබුණා බැරි කියලා හිතමින්.

"කොහේ හරි බිම වාඩි වෙන්න ඕන වුණොත් කියලා මං ලොකු ශෝල් එකක් ගෙනාවා. ඔයාට ඕන නං ඒක ඇඳගෙන එන්න."

වර්ණාසි දන්නෙ නෑ ඒ මොහොතෙ තමන් ඒකට අවනත වුණේ ඇයි කියලා. ඕක් ගහේ අනිත් පැත්තට ගිහින් සාෂාගෙ තැඹිලි පාට සාළුව ඇඳගෙන තෙත සායත් සුදු මල් පිපුණු පඳුරක් උඩ වනලා වර්ණාසි සාෂාට එකතු වුණා.

"ඔයාට පීනන්න දන්නවනෙ." සාෂා සතුටෙන් කෑ ගැහුවා.

"නුවරඑළියෙ වගේ සීතලයිනෙ මේ වතුර" වර්ණාසි රතු නයිලෝන් ලණුවලින් කොටු කළ සීමාව වටේ පීනුවා.

වතුර කරවටක් තියෙන හරියෙදි සාෂා ආයෙමත් වර්ණාසිව සිප ගත්තාම ගහ යටදි වගේ පිළිමයක් නොවී වර්ණාසිත් සාෂාගෙ පපුවට තද වුණා.

"මට දැනෙන්නෙ ජීවිත කාලෙම හොයපු දෙයක් ලැබුණා වගෙයි." සාෂා කෙඳිරුවා.

"මං ආපහු ගියාම ඔයාට මාව අමතක වෙයි."

"ඔයාට තමයි එහෙම වෙන්න ඉඩ තියෙන්නෙ. ලංකාවෙ ඔයා එනකල් කවුරු හරි බලාගෙන ඇතිනෙ."

"ආතම්මයි, අම්මයි විතරයි. තාත්තා නෑ. පවුලෙ වෙන කවුරුවත් නෑ."

"පවුලෙ අය නෙවෙයි. බෝයි ෆ්‍රෙන්ඩ් බලාගෙන ඇතිනෙ." වර්ණාසි දැනගෙන හිටියෙ නෑ තමන්ට එච්චර තරහා යන්න පුළුවන් වග. ගැති හීනි පුංචි අත් දෙකෙන් සාෂාව තල්ලු කළ වේගයට සාෂා වතුරට නොවැටී බේරුණේ අමාරුවෙන්.

"ඔයා හිතන්නෙ බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්න කෙල්ලෙක් මේ විදියට ඉඳියි කියල ද? ඇමරිකන් කෙල්ලො උනත් එහෙම

නැතුව ඇති. ඔයා විශ්වාස කරන්නෙ නැති වෙයි. ඒත් මීට කලින් කිසිම මිනිහෙක් මගේ මූණ ඉඹලා නෑ."

වර්ණාසිට කඳුළුත් පැන්නා. සාෂා පුදුමවෙලා බලා හිටියා. වර්ණාසි කඩිනමින් ගොඩවෙලා තෙත වෙලිලාත් නැති සායත් අරගෙන ඕක් ගහ පිටිපස්සට ගිහින් ඇඳුම් ඇඳ ගත්තා. ඒ වෙලාවෙ නං වර්ණාසිට දැනුණා තමන්ට ආතම්මාගෙයි අම්මාගෙයි ජාන තියෙන බව.

සාෂා හිනා හිතකින් පීනුවෙ කෙල්ල ඇඳුම් ඇඳගෙන ගහ යට වාඩිවෙලා ඉඳියි කියලයි. ඒ නිසා මිනිහා හැඳුවෙ කතාත් නැතුව ඒ පැත්ත බලන්නෙත් නැතුව හොඳට පීනලා ගිහින් "අයියෝ ඔයාට විහිළුවක්වත් තේරෙන්නෙ නෑනේ." කියලා කියන්නයි. ඒත් සාෂා හොරැහින් ඒ පැත්ත බලනකොට කෙල්ල කන්ද උඩට නගිනවා. ඒ පාර මිනිහා ගලවපු ඇඳුම් ටිකත් බෑග් එකේ ඔබාගෙන තෙත පිටින්ම දුවලා ගිහින් වර්ණාසිව පහු කරලා පාරටත් ගොඩ වෙලා හිනා වෙවී බලාගෙන හිටියා.

වර්ණාසිගෙ ඇස්වල කඳුළු පිරිලා. සාෂා ඇහුවෙ නෑ ඇයි අඬන්නෙ කියලා. කලින් හිතපු දේ කිව්වෙත් නෑ.

"මට සමාවෙන්න රත්තරං. ඔයා කියපු දේ ඇත්ත. මං පුරුදුවෙලා තියෙන්නෙ ඔයා වගේ ගෑනුන්ට නෙවෙයි. මීට පස්සෙ කවදාවත් මං එහෙම කතා කියන්නෙ නෑ."

එවෙලෙ වර්ණී අඬමින් හිනා වුණා. සාෂා වහාම පින්තූර ගත්තා. එයින් එක පින්තූරයක් ලොකු කරලා සාෂාගෙ පොත් රාක්කවලට උඩින් බිත්තියක තියෙනවා. ඊට කාලෙකට පස්සෙ දවසක සාෂා වර්ණීව කසාද බඳින්න අහපු දවසෙ ඒ සිද්ධිය මතක් කරා.

"ඒ වෙලාවෙ මට මතක් වුණා ඉස්සර මා එක්ක යාළුවෙලා හිටිය ගෑනියෙක්ව. ඒ ගෑනි මගෙ කතාවකට තරහා වෙලා ගියා. එයා පස්සෙ දවසක කිව්වා ඔයාට තිබුණෙ ඔයා මට බොරුවක් කිව්වා කියලා පිළිගන්න බැරි නං අඩුම ගානේ හිත රිද්දුවට සමාවෙන්න කියලාවත් කියන්නයි කියලා. ඒ කාලෙ මං හිතාගෙන හිටියෙ ගෑනු කියන්නෙ මට හිතුණ වෙලාවට සෙල්ලම් කරන්න

පුළුවන් බෝනික්කො කියලයි. ඉතිං මගේ ආඩම්බර හිතට ඒ සමාවෙන්න කියන වචනෙට ඉඩ දෙන්න බැරි වුණා. එදා ඔයා උඩට නගිනවා දක්කම මට හිතුණා ඔයාට එහෙම කියන්න ඕන කියලා."

"එහෙනං ඔයා මට නෙවෙයි එයාටයි මං ඉස්සරහා සමාවෙන්න කිව්වෙ." වර්ණාසි එහෙම කිව්වෙ කිසිම තරහාකින් නෙවෙයි.

"වෙන්න ඇති. ඒත් මං හිතා ගත්තා ඔයාගෙ ජීවිතේත් එක්ක සෙල්ලම් කරන්න පව් කියලා. මට තේරුණා ඔයා වගේ ගෑනුන්ට එකම එක හාදුවකින් හරි කට වචනෙ පොරොන්දුවකින් හරි ඇති වෙන බැඳීමක් වෙනුවෙන් සති පූජාවක් කරන්නත් පුළුවන් බව. මං ඒකට බය වුණා."

සාෂා එද සිද්ධියෙන් පස්සෙ වර්ණාසිත් එක්ක කැලේ මැදින් යන අතරම අදුම් මාරු කර ගත්තෙ වර්ණාසිට ටිකක් ඉස්සර වෙන්න ඇරලයි. එතන ඉඳලා පයින් යනකොට අතරින් පතර කඳු බෑවුම්වල හදපු ගෙවල් තිබුණා. ඒවයෙ පිටතට තෙරපු ලී අට්ටාල සඳළුතලවල ලී මේස පුටු පෙනුණා. එක ගෙදරක තිරුවතින් මුනිත්තලා වෙච්ච් ගෑනියෙකුයි මිනිහෙකුයි අව්ව තපිමින් හිටියා. ඒ ගෙදර වටේටම රෝස මල් වැල්වල කහ, සුදු, රතු, තැඹිලි, ලා පාට රෝස මල් පිපිලා. සැබෑ ජීවිතේ වෙන්න බැරි විදියෙ පරිසරයක්නෙ.

"මං ඔය ගෙදරට ගිහිං තියෙනවා. ඔය ගේල්ගෙ යාළුවෙක්." සාෂා කිව්වා.

"ඒගොල්ලන්ට මෙහෙ ඉඳලා වැඩට යන්න දුර ඇතිනෙ."

"නෑ. දෙන්නම වැඩ කරන්නෙ කැම්පස් එකේ. තරුණ කාලෙ ඒ ගොල්ලො රටවල් හැට හතරකට ගිහින් තියෙනවා. ඔය බර්ක්ලිවල මුල් හිපි කට්ටිවල හැදිච්ච ළමයි. හැබැයි ඒගොල්ලො දැන් නම් ටයි කෝට් ඇඳලා රස්සාවට යනවා. හරි නිදහස් ළමා කාලයක් තියෙන්න ඇති."

"මට ආසයි මේ වගේ තැනක මේ වගේ ලස්සනට පින්තූර පොත්වල තියෙන විදියෙ ගෙදරක ඉන්න." වර්ණාසි බොහොම අහිංසකව කිව්වා.

"වෙන කෙනෙක් ඔහොම කිව්වා නං මං කියනවා ඉතිං අපි එහෙම ඉමුකො. අපි මෙහෙන් ගෙයක් ගමුකො කියලා. ඒත් මට ඔයාට එහෙම කියන්න හිතෙන්නෙ නැහැ."

වර්ණාසි ඇයි කියලා ඇහුවෙ ඇස් දෙකෙන්. ඒ නිසා සාෂාට ඒ ප්‍රශ්නෙ බාර නොගෙන ඉන්න පුළුවන් වුණා. පහු කාලෙක තමයි ඒකට උත්තර දුන්නෙ.

"එදා මං ඔයාට කිසි දෙයක් කිව්වෙ නැත්තෙ හිත රිදෙයි කියලයි. පිරිමි එහෙම වෙලාවල්වලදි ඒ වගේ කතා කියන්නෙ ඒව කවදවත් නොකෙරෙන බව දැනගෙනමයි. ඒ වුණාට ඔයාගෙ ජාතියෙ ගෑනුන්ට එහෙම වචනයක් ඇති හීනයක් හද ගන්න. එවෙලෙ මට දුක හිතුණා ඔයාට එහෙම හීනෙකට ඉඩ තියන්න. පස්සෙ ඔයා ලංකාවට ගියාට පස්සෙත් මට මං ගැන පුදුම හිතුණා. මං ඇයි කියලා එහෙම දුකක් බරක් වගකීමක් හිතට ගත්තෙ. ඔයා මූණ ගැහෙනකල් මං හිතාගෙන හිටියෙ එහෙම වගකීම් ගන්න සම්පූර්ණ ඇත්තම කතා කරන්න ඕන නෑ කියලා. මං කියන්නෙ පිරිමියෙක් විතරක් නෙවෙයි ගෑනියෙක් උනත් එහෙම නිදහසේ කිසිම බැඳීමක් බරක් කර ගන්නෙ නැතුව ඉන්න ඕන කියලයි මට හිතුණෙ. ඔයාට මතකද එද ඉන්ස්පිරේෂන් පොයින්ට් එකට යනකොට මං ඔයාට කිව්වා මාත් මල් ළමයෙක් කියලා."

"ම...... එහෙම දෙයක් කිව්වා නං තමයි. ඒ වුණාට මං හිතුවෙ හැමතැනම හීනයක් වගේ ලස්සනට මල් පිපිලා තින්ද ඔයා මලක් වගෙයි පුංචි ළමයෙක් වගෙයි කියන්න හැදුවා කියලා."

එද ආපහු එන ගමන් සාෂා කැලේ මැද මෙරිගෝරවුන්ඩ් එකක් තියෙන තැනකට ගියා. ඒ කැලේ මැද එහෙම දෙයක් තියෙයි කියලා හිතන්නවත් බැහැනෙ. මෙරිගො රවුමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය විතරක් එළි කරලා නිසා වටේටම ගස් තිබුණා. ඒවායෙ නම් දන්නෙ නැති නින්ද වර්ණාසිට දැනුණෙ දිග ලස්සන චිත්‍රපටියක රූපරාමා හීනෙන් දකිනවා වගෙයි. අම්මා හිටියා නං ඒ ගස්වල නම් අහලා ලියා ගන්නවා. ඒත් දුව නිශ්ශබ්දව හිටියෙ සාෂාට විස්තර කරනයට ඉඩ දෙන්නයි. සාෂාගෙත් කට නැවතිලා තිබුණා. කැලේ මැදින් කන්ද වටේට හොඳට තාර පාරක් හදලා තියෙන්නෙ ඉන්ස්පිරේෂන් පොයින්ට් එකටයි උද්භිද විද්‍යා

[illegible]

"අවින් යං. ඔයාට ආපහු ලංකාවට ගියාම මේ ළමයි වගේ සතුටු වුණා කියලා මතක තියෙයිනෙ." සාෂා මෙරිගෝල්ඩ්ගේ ඊළඟ වාරයට ප්‍රවේශපත් අරගෙන ආවා.

වර්ණාසිට ඕන වුණේ ළමයෙක් වෙන්න නෙමෙයි ගැහියෙක් වෙන්නයි. දෙළ ලැහදි උඩහට දුවපු විදියට සාෂා වහාම තමන්ව පහළ ළමා ශ්‍රේණියකට දන්න ඇති කියලා හිතුණත්, ඒක වෙනස් කර ගන්න ඕනකමක් දැනුණත් මොනවා කරන්න ද මොනවා කියන්න ද කියලා තේරුමක් තිබුණෙ නැහැනෙ. බෙල්ලෙ එල්ලෙන්න යෑ.

"මේ අම්මලා තාත්තලා දරුවො එක්ක ඇවිත් ඉන්න විදියයි මට හිතෙන්නෙ ලෝකෙ කොහේ උනත් පවුලක් හැටියට තුළ ගැහිලා ඉන්න තියෙන උවමනාව එක සමානයි කියලයි."

[illegible] වැඩිහිටියෙක් වගේ වෙන්න ගත්තෙ මොකටද කියලයි.

සාෂා වර්ණාසි ව ගිහිං නිවාසෙ ළඟට බස්සවලා පහළට ගියේ කෝච්චියෙන් ගෙදර යනවා කියලයි. ඊට පස්සෙ එයාගෙන් එතකල් මිනිහා කැරිත් කැරේ ටෙලිෆෝන් කරා. ඊත් මූණ ගැහෙන්න වෙලාවක් තිබුණෙ නැහැ.

"සමහරවිට මේ අවුරුද්දෙ ඉලෙක්ෂන් එකක් ආවොත් මං ලංකාවට එනවා. එතකොට ඔයාට කතා කරන්නංකො."

භාග්‍යාටවත් අර සිද්ධිය කියන්න බැරි ගතියක් දැනුණා. ප්‍රේමයක් කියලා හිතපු දේ නිකම්ම මෝඩ බාල වැඩක් වෙච්චි එක ගැන ලැජ්ජාවක් මදිපුංචිකමක් වගේ හැඟීමක් තිබුණා.

"පිරිමි මේ ගෑනු අපි වගේ නෙවෙයි. පුතේ ඔයා හොඳ කෙනෙක් එක්ක සම්බන්ධයක් ඇති කර ගත්තට කමක් නෑ. හැබැයි ඇත්තට ආදරේ මිනිහෙක් නං ගෑනියෙකුට ගෞරව කරනවා. ඒ ගෞරවේ ලැබෙන්නෙ නැත්තං ඒ කියන්නෙ ඒ මිනිහව විශ්වාස කරන්න එපා." ඇමරිකාවෙ එන්න කිට්ටු වෙනකොට මනෝරමා කියපු කතාව වර්ණාසිගෙ හිතේ දෝංකාර දුන්නා.

වර්ණාසි අම්මගෙ කතාවට යටි හිතින් හිනා වුණේ "අම්මා සේරම වරද්දගෙන මට අවවාද දෙනවා." කියන හැඟීමෙන්. ඒත් සාෂාගෙ සිද්ධියෙන් ඒ අවඥා සහගත හිනාව මැකුණා. අම්මට ජීවිතේ වැරදිච්ච හින්ද මටත් එහෙම වෙයි කියලා බය ඇති කියලා හිතෙන්න ගත්තා.

හයේ පන්තියට සමර්ප් වෙච්චි කාලෙ අම්මා කියපු කතාවේ හැටියට වර්ණාසි හිතාගෙන හිටියෙ අම්මයි තාත්තායි කසාද බැඳලා ඉන්න ඇති කියලයි. ඒත් ඇමරිකාවෙ එන්න කිට්ටුව ඉස්කෝලෙන් අස්වීමේ සහතිකේ ගන්න ගියාම තමයි වර්ණාසි පළවෙනි වතාවට තමන්ගෙ උප්පැන්නෙ දැක්කෙ. ඒකෙ තිබුණෙ දෙමාපියන් අවිවාහකයි කියලයි.

"ආතම්මෙ ඇයි අම්මා මගේ තාත්තාව බැඳලා හිටියෙ නැත්තෙ?"

ආතම්මා කතා කරේ නෑ.

"කියන්ඩකෝ....... දූං මං බබෙක් නෙවෙයිනෙ." වර්ණාසි ආතම්මාගෙ උරහිස් දෙක තදින් අල්ලගෙන හෙල්ලුවා.

"දූං ඕවා අහලා වැඩක් නෑනේ පුතේ."

"නැත්තෙ මොකද මං හිතුවෙ අදහස් ගැලපෙන්නෙ නෑ කියලා අම්මා වෙන්වෙලා ඇවිත් කියලයි."

"එහෙම තමයි වුණේ. කසාද බඳින්නෙ නැතුව දෙන්නා ගෙයක් අරගෙන හිටියා. සුජම්පතිට බඳින්න ඕන වුණා. ඔයාගෙ

අම්මා තමයි කිව්වෙ අවුරුදු දෙකක් එක ගෙදරක සමාදානෙන් හිටියොත් බඳින්න උනත් පුළුවන් කියලා."

"ඉතිං ආතම්මා බැන්නෙ නැද්ද?"

"මුලදී මං දන්නෙ නෑ එකට ඉන්නෙ කියලා. දවසක් මං හදිස්සියෙ කොළඹ ගියා අපිත් එක්ක හිටපු ටීචර් කෙනෙක් බලන්න ඉස්පිරිතාලෙ යන්නත් එක්ක. වෙනදට කලින් දන්නලනෙ යන්නෙ. එද මං පාන්දරින් ගිහිං දොරට ගහනකොට සුජම්පති සරමත් බාගෙට ඇඳ ඇඳ ඇවිත් දොර ඇරියා. ඊට පස්සෙ මං බැන්නා රවට්ටු හිනස්සවන්නෙ නැතුව කසාද බඳින්න කියලා. එද මං එයාගෙ කමරේටවත් ගියෙ නෑ. ඒත් මට තේරුණා දෙන්නා එකට ඉන්න බව."

"ඉතිං මගේ තාත්තා මොකද කිව්වෙ?"

"මං නං අද උනත් කැමතියි..... ඒත් මෙයාගෙ කොන්දේසිය අවුරුදු දෙකක් යහපත් කල්ක්‍රියාව ඔප්පු කරන්නනෙ" කියලා මිනිහා හිනා වුණා. ඔයාගෙ ආතා හිටිය කාලෙක නං එදම කසාදෙ කරවනවා. මං තනි ගෑනි මොනවා කරන්න ද? එකා යකා වුණා කියලා ඉවසගෙන හිටියා."

"ඉතිං අම්මා මොනවත්ම කිව්වෙ නැද්ද?"

"එයාගෙ හැටි දන්නවනෙ. මං බනිනකොට හිනාවෙවී හිටියා. අන්තිමට ඔයා හම්බවෙන්න ඇවිත් කියලා දැන දැනත් මෙයා තරහාවෙලා ආවනෙ. සුජම්පති මෙයාව අතඇරලා ගියෙ නෑ. මෙයයි මුරණ්ඩුකමට ආවෙ."

"අම්මට මං වෙනුවෙන් හරි ඉන්න තිබුණා. ඒකෙන් වුණේ මගේ තාත්තා කවුද කියලාවත් අඳුන ගන්න නැති වෙච්ච එකයි."

"සේරම පින්තූරත් පුච්චලා දැම්මානෙ. ඒ දවස්වල මං කිව්වා කවද හරි ඔය දරුවා ලොකු උනාම තාත්තා ගැන ඇහැව්වොත් පෙන්නන්නවත් පින්තූරයක් තියා ගන්න කියලා. ඒ වුණාට පුතේ අම්මා ගැන අහිතක් තියා ගන්න එපා. එයා මා එක්කවත් නොකීවට මොකක් හරි දරා ගන්න බැරි දෙයක් වෙන්න ඇති."

ආතම්මා එහෙම කීවට වර්ණාසිට තමුන්ගෙ තාත්තා මොන

වගේද, කියලා දැන ගන්න ලොකු උවමනාවක් ඇති වුණා. පුතා ආච්චිගෙ අයියා සුනන්ද, අංකල්, ඉන්න තැනක, අපි ආච්චිගෙන් කියලා දන්නේ, අපි ගේන සිත්තුවම් තාත්තා ඉන්නවා කියලා සිත්තුවම් වගේ ... එයා වෙනම සිත්තුවම් ... කිව්වේ එයා කොහෙන්ද, කියලාවත් දන්නෙ නෑ. කියලා ඒක් ගේන අම්මා ලග හිටියා සුරම්පතිව, පුතාට ඉන්න ලියවිල්ල වෙනම සිත්තුවම් ලැබුණා. ඒ පුතාට ඉන්න තැනක එයාට වගේ ... ඇති. ... කරන්නේ ... ලැබුණු ... එකක් එකක් දන්නෙ සුනන්ද, අංකල් කට් ... දන්නෙ හිටිය ... සත්තුරුන්ගෙ ... ආසාවක් දැනුණා. එත් ඒ සිත්තුවම් ... මීට ... ඒ සිත ... හිටිය ... බොහොම තියෙන්න ඇද්ද?

"පුතා ආච්චිට මගෙ ... මතක ... අම්මිලාගෙදි පුතාලගෙ ... වර්ණනි ... පුතාට එක ... දන්නවා ... වුණා.

"දා වැඩි දෙයක් මතක නෑ. ... කතාකරයා. ... දෙයක් ගැන දැන් කතා කරයි."

"අම්මයි තාත්තයි එකට ඉන්නකොට පුතා ආච්චි ඒ ගෙදර ගියා ද?"

"නෑ මං අක්කාව බැඳලා අලිතැරීට ගියාම. වෙන් වුණේ ඇයි කියලා මතෝරම්යා අප්පච්චිත් කිව්වේ නෑ, මට පෝස්ට් කාඩ් එකක් එවල තිබුණා අපි හමුවුණා - අපි වෙන්වුණා - මට දරුවෙක් ලැබෙනවා කියලා. මං හිතන්නෙ ඔයාගෙ අම්මට විතරයි එහෙම දෙයක් ඒ විදියට කියන්න පුළුවන්."

"ඇයිං මගේ තාත්තා පුංචෙදි සුනන්ද අංකල්ට මොනවද කියලා තියෙන්නෙ?"

"අපේ අයියා කවදාවත් සුරම්පති කියන දේවල් අපිට ලිව්වේ නෑ. එයා කොහොමටත් දින ලියුං ලියන කෙනෙකුත් නෙවෙයිනෙ. එයා ජීවත්ව හිටියා නං ඔයාටම අහගන්න තිබුණා."

වර්ණනී උනන්දුවට අපිට පත්තෙක් අම්මාගෙන් ඒ ගැන ... අහුවෙ නෑ. එත් ආනම්මා එක්ක ඒ ගැන කතා කළා.

"පුතේ දා මග ගැන කෙනෙක්ට කියවුණේ වැඩක් නෑ. එයාට ... එයා වෙන දෙයක් වෙන්න ඇතිනෙ. තාත්තා ... ඔයාට දැන් ... ඒ මිනිහා ... ... මිනිහා මොකට එයා කියලා නොකෙරුවේනෙ. ... අම්මා ... ... තියෙන්නෙ. ඉතිං එයාට ... අම්මාවත් ... කියන්න බැරි දෙයක් වෙන්න ඇති." ... හිත ගත්තා.

"ඒ වුණාට එයා ... ඒ ... තාත්තා ගැන කියන්න පුළුවන් තියෙනවා කියලා එයා ... මට ... ඇයි මොනවා සැමියාගෙවිලිත් ... ... කාරුණ්ද?" වර්ණනීගෙ ඇස්වලට ... ආවා.

"දරුවෙක් ... කරනකොට මට ... පොඩි කාලෙ ඉඳලා මගේ ... දුර්ලභ ... එයා කෙනෙක්වත් මයා අම්මාගෙම දුව ... සියල්ලයි." ආනම්මා කරුණාවෙන් සිනහ වුණා.

"නෑ... මං කවදාවත් එයා වගේ වෙන්නෙ නෑ. මං කසාද බැන්දොත් මගේ මනුස්සයාට දෙයියන්ට වගේ සලකනෙන ලස්සනට ගේ කියාගෙන ළමයි හතර දෙනෙක්වත් හදාගෙන හොඳ අම්මා කෙනෙක් වෙලා සන්තෝසෙන් ඉන්නවා."

ආනම්මා සිනි දෙයක් කිව්වෙ නෑ. ආනම්මගෙ ඇස්වලට කඳුළු ආපුවෙ ඇයි කියලා මිනිබිරිට තේරුණෙත් නැහැ. මිනිබිරිට සැක මතක් වුණා. එයාව අතය කවදාවත් මුණ ගැහෙන එකක් නෑ කියන හැඟීම පුහුණක් වෙලා පපුව මැද හින් හින්දරක් මතු කළා.

"මොනවා උනත් එයා මාව රවැට්ටුවෙ නැතේ. එයාට මිත නං ලෙසියෙන්ම මට බොරු පොරොන්දු දීලා මාව මුලාකරන්න තිබුණා" කියන හිත තමයි ඒ හින්දර උපද්දවන්න හේතු වුණේ.

ඒ කතාව ආයෙට කියන්න හිත දුන්නෙ නැති එක ගැන නං සැනසීමක් දැනුණා. ඒගෙ කියන්න දෙයක් ඉතුරු වුණේ නැහැනෙ. ඊට පස්සෙ දිගට පවතින සම්බන්ධයක් ඇති වුණා නං

අර ප්‍රථම හාදුවට එන කල් අතරමගදී හුස්ම ගත්තු හැටි පයට පෑගුණු වැලි කැට, තණකොළ ගැන පවා කියාගෙන ඇවිත් උච්ච ස්ථානයකදී මුකුත්ම නොකියා ඇස් දෙකෙන් හිනා වෙන්න තිබුණා. භාග්‍යා නං ප්‍රේම කතා කියන්නෙ එහෙමයි.

"ඔන්න ඉතිං ඌ මා දිහා බලනවා වගේ දැනුණා. ඇත්තටම මං ඌ දිහා නොබැලුවට එතනට පය තියපු වෙලාවෙ ඉඳලා මට දැනුණා මොකක් හරි වෙන්න පුළුවන් කියලා." භාග්‍යා කතා පටන් ගන්නෙ ටෙලි නාට්‍යයක චිත්‍රපටියක සිද්ධියට කලින් සංගීතය ඒක කියලා ඉවර කරලා දන විදියටයි.

"අයියෝ දූං ඉතිං මං අවසානෙ දන්නවනෙ. ඊට තරකෙද අපේ අම්මා වගේ ඔක්කොම පසුබිම් දර්ශනත් කියාගෙන ආවා නං."

"මනෝ ආන්ටි ඉතිං ඩොකියුමන්ට්‍රීස් හදන විදියට පසුබිම් දර්ශන වගේම සංස්කරණයත් කරලානෙ ඔයාට කතා කියනවා ඇත්තෙ. මං එහෙම නෙමෙයි.... කෙලින්ම කැමරාව කෙල්ලගෙ ඇස් දෙකට. කෙල්ලට ඒක දැනෙන්නෙ ඒ වගේ කොල්ලෙක්. කෙල්ලො ගොඩාක් ලස්සනට ඇඳලා ඉන්න මඟුල් ගෙදරක ශෘංගාරය නිකං ගෑස් එකක් වගේ හැමදෙන නිසා වෙන්නැති. උබට තේරෙනවද ඒක ආශ්වාස කරන්න පුළුවන් හැඟීමක්."

භාග්‍යා උඹ බං කියලා කතා කරාට වර්ණාසි කතා කරන්නෙ ඔයා මෙයා කියලයි. භාග්‍යාත් මනෝරම්‍යා වගේ තමයි. ඒ හින්ද දෙන්නට දෙන්නා මහ මුහුදයි, අනෝතත්ත විලයි වගේ කියලා ඉස්කෝලෙදී ළමයි පුදුම වුණා. ඒත් භාග්‍යා දැනගෙන හිටියා දඟලිලි ගතියක් නැති වුණාට වර්ණාසි අනිත් අයගෙ දඟ වැඩ පස්ස කරලා බැලුවෙ නැහැ කියලා. වැඩි කලබලයක් නැති වුණාට වර්ණාසි හිටි ගමන් භාග්‍යාට හිනා ගන්නත් බැරි උපහාස කතා කිව්වා. ඉස්කෝලෙදී කලබලයකුත්, වැඩි කතාවකුත් නැති නිසා සමහර ළමයි හිතුවෙ වර්ණාසි ආඩම්බරයි කියලයි.

"එයා මං තරමටවත් ආඩම්බර නෑ. එයා උඹලා වගේ වල් කතා කියන්න නං දන්නෙ නෑ. ඒවාට හිනා වෙන්නත් ලැජ්ජයි. එක අතකට වර්ණාසි වගේ කෙනෙක් අපිත් එක්ක ඉන්න හින්ද තමයි අපේ අස්ස කුලප්පුව පාලනය වෙන්නෙ."

භාග්‍යා තමන් වෙනුවෙන් ළමයින්ට කියන දේවල් අහලා වර්ණාසි තමන් ඇත්තටම ශාන්තයි කියන හැඟීමෙන් හිටියා. ඇමරිකාවෙදි සාෂාගෙ සිද්ධිය කියා ගන්න හොඳටම උවමනාව තිබ්බත් තමුන් එහෙම මිනිහෙකුට අවනත වුණා විතරක් නෙවෙයි ඒ මිනිහා ආයෙමත් එයි කියන බලාපොරොත්තුවත් ඇති වුණා කියන එක අදහන්න බැරි වුණා. ඒ "මම වෙන්නෙ කොහොමද?" කියන ප්‍රශ්නෙට උත්තර තිබුණෙත් නැහැ.

ඒක කිව්වා නං "මෝඩ ගහ ඔක ඉතිං මැරෙනකල් ලැජ්ජාවෙ ඉන්ඩ තරං දෙයක් නෙවේ." කියලා භාග්‍යා හොඳටම හිනා වෙන බවත් වර්ණාසි දැනගෙන හිටියා.

පහුකාලෙක ඒ කතාව කිව්වම "මෝඩ ගහ. ඇයි මට කියන්න ලැජ්ජා වුණේ. උඹ ලෝකෙ තියෙන භයානකම කාම අපරාදයෙ කොටස්කාරියක් වුණා කියලා මං හිතන්නෙ නැති බව උඹ දන්නවනෙ. මට දවසක් ලොස් ඇන්ජලීස්වලදී අහම්බෙන් මුණ ගැහුණ වෙලාවක මිනිහා කිව්වා උඹ හම්බවුණා කියලා. ඒත් මං එච්චර දුරට හිතුවෙ නෑ." කියලයි භාග්‍යා කිව්වෙ.

වර්ණාසි ඒ ආරම්භක කතාව භාග්‍යාට කිව්වෙ ලංකාවට ඇවිත් අවුරුද්දකුත් මාස දෙකකට පසසෙයි. සාෂා එක්ක හොර රහසෙම කසාද බඳින්න තීරණය කළ හන්දයි ඒක භාග්‍යාට කියන්න පුළුවන් වුණේ.

වර්ණාසි ලංකාවට ඇවිත් තුන් මාසයක්වත් ගියේ නෑ රටේ දේශපාලනේ වෙනස් වෙනකොට. ඒ පාර ඡන්දෙට වැඩ කරන්න සාෂාත් ලංකාවට ඇවිත් තිබුණා. ඒත් සාෂා වර්ණාසි හොයා ගන්න උත්සාහ කරේ නෑ. වර්ණාසි දේශපාලනේ ගැන කිසිම උනන්දුවක් නැති වුණත් සාෂා රූපවාහිනියෙන් කතා කරනවා දැක්කා. ඒ වෙනකොට ආණ්ඩුවෙ ගුරු පත්වීම් දෙන වැඩ සටහන් තිබුණෙ නැති නිසා කොළඹ රාජ්‍ය නොවන සංවිධානෙක පොඩි රස්සාවකට ඉල්ලුම් පත්‍ර දලා තිබුණා.

"මං කියන්නෙ ඉන්දියාවෙ හරි ගිහින් ඩිග්‍රි එකක් ගන්න කියලයි. ඔයා ඉස්කෝලෙක උගන්නන්න ගියත් ඒක ඕන වෙනවනෙ. දූං ඇමරිකාවෙ ගියායින් මොකක් හරි හොඳක් වෙනසක් වුණේ නැද්ද?" මනෝරම්‍යාට ඕන වුණේ කොහොම

හරි ආචාර්ය උපාධියක් දක්වා දෝණියන්දූ හල්පු කරගෙන යන්නයි. ඒත් ඒක දූවටවත් නොදැනෙන විදියට කළ යුතු බව එයා දැනගෙන හිටියා. ඒත් අම්මගෙ බලාපොරොත්තුව දැනගෙන හිටි නිසා දූවට ඒකට උනන්දුවක් දැනුණෙ නැහැ.

"මට පාඩං කරන්න බෑ. මේ ඇති... පොඩි ඉස්කෝලෙක පොඩි පන්තිවලට උගන්නලා ආතම්ම වගේ හිටියම හොඳටම ඇති." වර්ණාසි කථා කරේ සැර ගතියකින් නොවුණත් ඒ මතයෙම ඉඳීමේ දැඩි අධිෂ්ඨානයෙන්.

ඒ දවස්වල මනෝරම්‍යාට කාම්බෝජයෙ එක්සත් ජාතීන්ගෙ ව්‍යාපෘතියක රස්සාවක් ලැබිලා තිබුණා. ඒ නිසා ටික දවසකට දූව එහෙ ගෙනියන්නයි සිංගප්පූරුවෙ විශ්ව විද්‍යාලයකට යවන්නයි මනෝරම්‍යා උත්සාහ කළා.

"මට බෑ.... මං සිංගප්පූරුවට ආසා නෑ."

"මං කියනවට ගිහින් එක වාරයක් දෙකක් ඉඳලා බලන්න. නිවාඩුවට කාම්බෝජෙට එන්න."

"මට ඔය රටවල් ගානෙ යන පිස්සුවක් නෑ. මේ පරණ ගෙදර පරණ ඇඳේ ආතම්මා එක්ක නිදගෙන මේ විදියට වැටිලා ඉන්න ඕන."

මනෝරම්‍යා ආදරෙන් කිව්වත් අඬලා කිව්වත් දූව ශාන්තව බිරළ් රේන්ද ගෙතුවා. ඇමරිකාවෙදි රේන්ද ප්‍රදර්ශනයක් නරඹලා තිබුණු නිසා වර්ණාසිට රේන්ද ගොතන්න ආසාවක් ඇතිවෙලා තිබුණා. ජිනවතී ඉස්කෝලේ හාමිනේ වර්ණාසිට පත්තෑයා ගොතන්න කියලා දීලා තිබුණෙ පොඩි කාලෙදිමයි.

"මං හිතුවෙ ඇමරිකාවෙ ගියාමවත් මෙයාට භාග්‍යා වගේ ඉගෙන ගන්න හිතක් එයි කියලයි." මනෝරම්‍යා හිතේ අමාරුවෙන් අම්මට කිව්වා.

"ඉතිං එහෙම නං ඔය පිටරටක ඔය වගේ දේවල් උගන්නන තැනකට යවන්න බැරිද? දැං ඔය ඉන්දියාවෙ තියෙනවලු නේද ජේෂකර්ම මෝස්තර උගන්නන තැං හෙම. ඒවායෙත් උපාධි ඇතිනෙ. ඔය අපේ මැණිකෙ මිස්ගෙ මිනිබිරියෙක් ඔය ඒ වගේ

දේකට ගියානෙ." ජිනවතී ඉස්කෝලෙ හාමිනෙත් කැමති වුණේ නෑ දරුවා ගමේ ගුරුවරියක් වෙනවට. ඒත් තමුන්ගෙ දූව වගේ වෙනවට කැමැත්තක් තිබුණෙත් නැහැ.

"පුතේ ඔයාට ආර්ට් පුළුවන් හිංද මං ඔයාව ශාන්ති නිකේතන් යවන්න ද? නැත්තං නිකමට යං මාත් එක්ක පූනා ෆිල්ම් සකුල් එක බලන්න. ඔයාට ඔය ෆිල්ම් එඩිටිං වගේ දෙයක් ඉගෙන ගන්න ආස නැද්ද?"

"මම ඔය ලංකාවෙ ඉඳන් කරන්න පුළුවන් දෙයක් කරන්නං."

අන්තිමට මනෝරම්‍යා කාම්බෝජයෙ රස්සාවකට යන්න කලින් දෝණියන්දූව සති අන්ත චිත්‍ර කලා පන්තියකටයි ආභරණ මෝස්තර නිර්මාණ පන්තියකටයි ඇතුළු කළා. සිකුරාද හවසට නුගේගොඩ තැපැල් සීයලගෙ ගෙදර ගිහින් සඳුද උදේට ආපහු ගමේ එන්න තීන්දු වුණා. පළවෙනි පන්තියට දූව එක්කගෙන යන්න හිතාගෙන හිටියත් ඊට කලින් මනෝරම්‍යාට පිට වෙන්න තිබුණා.

ඒ කාලෙ ආයෙමත් මැතිවරණ උණුසුමක් ඇති වුණත් වර්ණාසිට දේශපාලනේ ගැන කිසිම උනන්දුවක් දැනුණෙ නැහැ. චිත්‍ර කලා පන්තියට නං කැමැත්තක් ඇති වුණා. ඒකෙ චිත්‍ර කලා ඉතිහාසත් උගන්නපු නිසා වර්ණාසිට එක එක රටවල පැරණි ගුහා චිත්‍රවල, නටබුන් ගොඩනැගිලිවලින් හමුවුණ චිත්‍රවල තියෙන ආභරණ ගැන උනන්දුවක් දැනුණා. ඒවා ආතම්මා එක්කත් කතා කළා. ආභරණ මෝස්තර පන්තියටත් ප්‍රයෝජනවත් වුණා. තැපැල් ඇන්ටි දන්න තැනක ඉන්දියානු නෝනා කෙනෙක් ස්වභාවික වර්ණ හදගෙන රෙදි සායම් දන පාඨමාලාවක් පවත්තපු නිසා වර්ණාසි ඒකටත් බැඳුණා. අම්මා වගේ විභාගවලටයි, පොත් කන්දකටයි යට නොවී වෙන මාර්ගයක යන්න ඕන කියන හැඟීම හින්ද නිකම් ඉවෙන් වගේ ඒ දේවල්වලට කැමති උනත් නිශ්චිත අනාගත සැලසුමක් හැටියට තිබුණෙ සාමාන්‍ය ගෘහ ජීවිතයක් - ප්‍රීතිමත් පවුලක් කියන අදහස විතරයි.

එක සඳුදවක වර්ණාසි උදේ හයට නුගේගොඩ බස් නැවතුම්පළක හිටගෙන හිටියෙ අවිස්සාවේල්ලට යන්නයි. වර්ණාසිව පහු කරගෙන ගිය වාහනයක් නැවතුණා. ඒක එළවගෙන

ගිය කෙනා [illegible] වුලා කවුද කියලා එක පාරට ඔලුවට වැදුණෙ නැහැ. කවුරු හරි පුරුදු මූණක් කියලා එක විතරයි දැනුණෙ. ඒත් ඒ රතුපාට කාර් එකෙන් බැහැලා ආවෙ සුදු කුර්තාවකුයි සුදු කලු කලිසමකුත් ඇඳලා කොණ්ඩෙත් බැඳලා හිටිය සාෂා. දෙන්නාගෙන් කවුරු ඉස්සර වුණාද කියලා දෙන්නටම මතක නෑ. ඒත් නුගේගොඩ බස් නැවතුම්පළක වෙන්න බැරි දෙයක් සිද්ධ වුණා. සාෂා වර්ණාසිගෙ දෑතින් අල්ලගෙන නළල ඉම්බා.

"යං කොහෙද යන්නෙ... මං ගිහිං දාන්නං."

වර්ණාසි කීකරු වුණා. ඒ වෙලාවෙ වර්ණාසි හිතමින් හිටියෙ කවද හරි වෙන මිනිහෙක් බැන්දත් ජීවිතේ පළවෙනි හාදුවෙ අහිංසක සතුට මතක්වෙයි කියලයි. ඒ එක්කම අම්මා පිටට නොපෙන්නුවට අම්මාටත් සුජම්පති කියන මිනිහව මතක් වෙනවා ඇති කියලා හිතුණා. ලෝකෙ කොහෙදි හරි අම්මට සුජම්පතිව මුණ ගැහිලා එයා එක්ක ඇවිත් "මෙන්න පුතේ ඔයාගෙ තාත්තව හොයාගෙන ආවා" කිව්වොත් අම්ම කියන ඕනම විශ්ව විද්‍යාලයකට යන්නත් කැමති වෙනවා කියලා හිතමින් ඉන්නකොට තමයි අර වෙන්න බැරි දේ වුණේ.

"ඉතිං කොහොමද... මට ඔයාව හැම වෙලාවෙම මතක් වුණා. ඔයාව හොයා ගන්න ඕන කියලත් හිතුණා. භාග්‍යාගෙනුත් ඇහුවා. එයා හරියකට කිව්වෙ නෑ. ඒ ළමයා අහිංසකයි. එයා අමාරුවෙ දාන්න එපා කියලා කිව්ව." සාෂා හිනා වෙන්න ගත්තා. වර්ණාසිට හිතුණෙ ඒ විදියෙ අහම්බයකින් තමන්ගෙ තාත්තවත් හම්බවෙන්න බැරි නෑ කියලයි. ගෑනි කැමති වුණේ නෑ මොහොතකට කලින් හිතපු දේ අඟවන්න. කොහොමටත් කතා කරන්න බැරි ගතියක් දැනුණා. අමුතු සන්තෝසයකින් පපුව පිරිලා මූණ කට හිරි වැටිලා ගියා.

"ඉතිං ඔයා මගෙන් අහන්නෙ නැද්ද මං කවදද ආවෙ - ඇයි ආවෙ - මොනවද කරන්නෙ කියලා." සාෂා වර්ණාසිගෙ අත උකුල උඩින් තියා ගත්තා.

වර්ණාසි යාන්තමට ඔළුව හෙල්ලුවා.

"ඔය ශීර්ෂ භාෂාව මට දැනෙන්නෙ නෑ. මං දන්නෙ හර්ද

භාෂා විතරයි. ඒවාත් ඔයාට කියන්න බයයි. භාග්‍යා කියන විදියටයි මට දැනිච්ච විදියටයි ඔයා හුඟාක් අහිංසකයි තමයි. මං අහිංසක නැති වුණාට මට ඕනෙ ඔයාගෙ වගේ අහිංසකකමක් තුරුළු කරගෙන මාත් වෙනස් වෙන්නයි. ඒත් මට දුකයි. ඔයාට දුකක් දෙන්න නං දුකයි. ඒ හින්ද අහම්බෙන් හම්බවුණොත් මිසක් හොයන්නෙ නෑ කියලා හිතාගෙන හිටියා."

වර්ණාසි හොඳටම ගොළු වුණා.

"මේ ටික කාලෙට ඔයාට කතා කරන්න බැරි වෙන ලෙඩක් හෙම හැදුණෙ නෑ නේද?"

වර්ණාසි විශාල ඇස්වලින් හිනාවෙමින් ඔළුව හෙල්ලුවා.

"ශීර්ෂ භාෂාව ඔට්ටු නෑ. කෝ ඔයා තාම පිටරටක ඉඳල එන කෙනෙක්ගෙන් ලංකාවෙ ඕනම කෙනෙක් අහන ප්‍රශ්න ටික ඇහුවෙ නෑනේ."

"මං අහන්නෙ මොකටද ඔයාම ඒවා ඇහුවනෙ. දැං ඔයා ඒවට උත්තරත් දෙයි." වර්ණාසි තිවුණු සිහින් හඬින් උත්තර බැන්ද.

"ඔයා ළඟ තියෙනවා මට නැති දෙයක්. ලේසියෙන් හොයා ගන්න බැරි දෙයක්."

වර්ණාසි ප්‍රශ්නාර්ථයෙන් බැලුවා. විනාඩි පහක් විතර නිශ්ශබ්දතාවක් පැතිරුණා. ඒත් "ඇයි" කියන හඬ නා නිසා සාෂාට කතා කරන්න සිද්ධ වුණා."

"මං ආවෙ චන්දිම ගිරිකුඹුරට ඉලෙක්ෂන් එකට උදව් කරන්න. එයා ජනාධිපතිවරණෙට ඉල්ලන්න යනවා කියලා පත්තරවල තිබුණා දකින්න ඇතිනෙ."

වර්ණාසි ඒ කව්ද කියලා දැනගෙන හිටියෙවත් ඒ ගැන කිසිම දෙයක් කියවලාවත් තිබුණෙ නැහැ.

"චන්දිම මට කිව්වා මචං උඹ ඇවිත් මේක ගොඩ දාලා දීපං කියලා."

ඒ වගේ වෙලාවක ඔය දෙන්න එකට ඉස්කෝලෙ හිටියද කොහොමද යාළු වුණේ වගේ ප්‍රශ්නයක් මතු වෙන්න ඕනනෙ.

ඒත් එහෙම වුණේ නැහැ.

"ඉතිං මටත් එහෙ එපා වෙලා හිටියෙ. ඒත් මෙක නොවුණා නං මෙච්චර ඉක්මනට එන්න වෙන්නෙ නෑ. එනකොට එයාර්පෝට් එකටම මේ කාර් එකත් එව්වා. මට වැඩ කරන්නයි ඉන්නයි නුගේගොඩින් ගෙයක් දුන්නා. දැං මෙ යන්නෙත් ඇහැලියගොඩ වැඩකට. මැණික්කාරයො වගයක් හම්බවෙන්න තියෙනවා. ඒක ඉවරවෙලා රුවන්වැල්ලෙ කෙනෙක් හම්බ වෙන්න ඕන. ඊට පස්සෙ නුවර යනවා."

"අනේ මං දන්නෙ නෑ. මට දේශපාලනේ ගැන කිසිම උනන්දුවක් නෑ. මං ඕවා කියවන්නෙත් නෑ."

"ඒක හොඳයි. ගෑනු ඕවාට උනන්දු වෙච්චි තරමට කරදරයි. මගේ ජීවිතේ හැම ගෑනියෙක්ම ඕනවට වඩා දුර ගිහින් අතරමං වෙච්චි කට්ටිය."

"ඔව්, මොළේ වැඩි උනහම සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න බෑ කියල අපේ ආතම්මත් කියනවා." වර්ණාසිගෙ හඬේ පොඩි ප්‍රාණවත් බවක් ඇති වෙච්ච බව සාකාට දැනුණා.

"ඔයා මට ඔයාගෙ විස්තර කිව්වෙත් නැහැනෙ. ආතම්මා එක්ක ඉන්නවා කිව්වා. ගෙවල් කොහෙද ඇහුවම නුගේගොඩ කිව්වා."

"ඉතිං හරිනෙ."

"දැන් මේ උදේම කොහෙද යන්නෙ?"

"ඔයත් යන්නෙ මං යන පැත්තට හින්ද මගදි බහින්න පුළුවන්."

"තරුණියක් පැහැරගෙන ගියා කියලා චෝදනාවක් ආවොත්?"

"තරුණිය කිසිම ප්‍රශ්නයක් අහන්නෙ නැතුව කාර් එකට නැග්ගා කියනවා. තරුණිය කැලිෆෝර්නියාවෙදි කවුද චොම්ස්කි කියලා මහා පණ්ඩිතයෙක්ගෙ දේශනයක් අහන්න ගියා. තරුණියට මෙලෝ හසරක් තේරුණේ නැතුව විතරක් නෙවෙයි එහෙම මිනිහෙක් ඉන්නවා කියලා දැනගෙන හිටියෙත් නැහැ. ඉතිං තරුණිය එයාගෙ යාළුවාගෙන් මෝඩ ප්‍රශ්න ඇහුවෙ සිංහලෙන්." වර්ණාසි හිනා වෙන්න ගත්තා.

"ඉතුරු ටික මෙහෙමයි. එතන සිංහල මිනිහෙක් හිටියා. ඒ මිනිහා කැමති වුණා නොදන්න බව හංගන්නෙ නැතුව භාග්‍යාගෙන් ප්‍රශ්න අහපු තරුණියට. චොම්ස්කි ගියාට පස්සෙ මිනිහා අර දෙන්නට කෝපි බොන්න කතා කරා. ඊට පස්සෙ දවසක මිනිහා අර මෝඩ ප්‍රශ්න අහපු කෙල්ල බලන්න මෝඩ ගමනක් ගියා. ඒ කෙල්ල එක්ක කැලේ මැදින් ගියා. ඉතුරු ටික ඒ කෙල්ල සම්පූර්ණ කරයි."

දෙන්නම ටික වෙලාවක් හිනා වුණා. වර්ණාසි හිනාව මැදින්ම කතාව පටන් ගත්තා.

"ඒ මෝඩ තරුණිය ඉන්ස්පිරේශන් පොයින්ට් එක ගැන කියවලා තිබුණට කවුරුවත් එයාට එහෙම ගමනකට ආරාධනා කලේ නෑ. භාග්‍යාටත් වැඩ වැඩියි. ඉතිං ඒ තරුණියත් මෝඩ හින්ද මෝඩ ගමනක් ආ මෝඩ මිනිහෙක් එක්ක මෝඩ ඇවිදිල්ලක් ඇවිදගෙන ගියේ ඥානවන්තයො ඉන්න පරිසරයත් මැදින්." වර්ණාසි පුදුම වුණා තමන් කවදාවත් නැති විදිහට දිගටම ලස්සනට කතා කරේ කොහොමද කියලා.

"ඔය හොඳට කතා කරන්නෙ. මෙච්චර වෙලා නිකං භාෂාව අමතක වෙගන යනවා වගේනෙ හිටියෙ."

වර්ණාසි ආයෙත් ගොළු වුණා. ගෑනියෙක් ප්‍රථම හාදුවට ඉඩ දිය යුත්තෙ මිනිහෙක්ව හොඳින් දැන ගත්තට පස්සෙයි කියලා භාග්‍යාට දෙස් කියපු කෙනා ඒ වරද ඊට වඩා නරක විදියට කරා කියන හැඟීමෙන් හිත බර වුණා. භාග්‍යා නං ඒ අත්දැකීමට මූණ දීලා තිබුණෙ දීර්ඝ ටෙලිෆෝන් සංවාදයි කෙටි හමුවීම් ගණනාවකටයි පස්සෙයි. ඒත් තමන්ට එද මොකද වුණේ කියලා වර්ණාසිවත් දැනගෙන හිටියෙ නෑ. කැලිෆෝර්නියාවෙ සුරංගනා ලෝක පරිසරයෙ නිදහසයි සතුටයි සම්පූර්ණ වෙන්න අඩු වෙලා තිබුණෙ හර්දවස්තුවට ප්‍රේම ගීතයකට මුසු වෙච්චි රාග නිශ්‍රිත තිගැස්මක් ගෙනෙන පුරුෂ ආලිංගනයක් විතර ද? කිරි කපන පාක්‍යම්ගෙයි ගුණසේනගෙයි දුව මෝටර් බයිසිකල්කාරයෙක් එක්ක පදුරක් අස්සෙ ඉඳලා අහු වෙච්චි දවසෙ ආතම්මා බැන්න හැටි

වර්ණාසිට මතක් වුණා.

"ප්‍රාකෘම් ඔකට ඔය වම්ලට බැනලා වැඩක් නෑ. දූං ඒකිට මද කිපෙන වයස. සත්තු සරුපයො උනත් ඇගේ ලේ ගිනියම් වෙන කාලෙට ඉව කර කරා යනවා. ගෙදරක බැඳලා ඉන්න බැල්ලියෙක් උනත් අමුතු විදියට බුරලා දඩාවතේ යන බල්ලෙක් ගෙන්න ගන්නවා. දූං ඒකිට තිහ පනිනකල් කටයුත්තක් කරලා දෙන්ඩ බැරි වෙච්චි එකේ ඕක පුදුම වෙන්ඩ දෙයක් නෙවෙයි."

තමුන් එද මේ සාෂා කියන මිනිහට ඉඩ දුන්නෙ අවුරුදු දහ නමයෙන්ම එහෙම මද කිපිච්ච වෙලාවක ද? වර්ණාසිගෙ මූණ රතු වුණා. ඒත් හීන් හිනාවකුත් තිබුණා.

"කෝ ඉතිං එක පාරට ආයෙත් කතා නැති වුණානෙ." සාෂා වර්ණාසිගෙ අත තොල්දෙකට තියාගෙන තනි අතින් සුක්කානම එහාට මෙහාට කරා.

වර්ණාසි ඇස් පියාගෙන හිටියා.

"එහෙනං මං කියන්නද ඔයාට හිතෙන දේවල්," සාෂා වර්ණාසිගෙ අත පරෙස්සමෙන් තමන්ගෙ වම් කකුල උඩ තියලා වංගුවක් ගත්තා.

"හ්ම්"

"ඔයා හොඳ අහිංසක කෙල්ලෙක්. ඔයාට දූන් හිතා ගන්න බෑ එද බර්ක්ලිවලදි ඇයි ඔයා මට ඉඩ දුන්නෙ කියලා. ඔයාට ඒ ගැන පුංචි ලැජ්ජාවක් තියෙනවා. ඔයා ආතම්මා එක්කනෙ හැදුණා කිව්වෙ. ඉතින් එයාගෙ හිතට පුංචි කාලෙ ඉඳලා හොඳ ගෑනියෙක් නං මෙහෙමයි, හොඳ මිනිහෙක් නං මෙහෙමයි කියලා පිළිගත්ත සාරධර්ම කාවැදිලා ඇති. ඒවයෙ අර වගේ ලස්සන සිද්ධියකට ඉඩක් නෑ. කුවේණිට, උන්මාද චිත්‍රාට, අශෝකමාලාට වගේ හිතට යට වෙන්න තරුණකමට යට වෙන්න ඉඩ නෑ. ඒක විශාල වරදක් කියලා ඔයා මූණ රතු කර ගන්නවා. සමහරවිට ඒක වරදක් වෙන්නෙ මං ඔයා එක්ක ගැඹුරු සම්බන්ධයක් ඇති කර ගත්තෙ නැතුව එහෙම දෙයක් වෙච්චි හින්ද වෙන්න ඇති. ඒත් ගෙවල්වලින් කතා කරපු මගුලකට කලින් එහෙම වුණා නං ඒක ගැන ඔහොම හිතෙන්නෙ නැති වෙයි. ඒ මිනිහා බැඳලා මාසෙන් දලා ගියත්

එතකොට ප්‍රශ්නයක් නෑ. ගෑනිගෙ ගෞරවය කුල සිරිත්වලින් ආරක්ෂා වෙලා. ඔයා එක දවසක හදිස්සියෙ වෙච්චි දේකට ඔච්චර හිත කරදර කර ගන්න එපා."

සාෂා කොහොමද එච්චර හොදට තමන්ගෙ හිත කියෙව්වෙ. වර්ණාසිට හිතුණා ඒ මිනිහව කොහොම හරි කසාද බඳින්න ඕන කියලා. ජිනවතී ඉස්කෝලෙ හාමිනෙටවත්, මනෝරමාටවත් භාග්‍යාටවත් එච්චර හොඳට තමන්ගෙ හිත කියවන්න බැරුව ඇති කියල වර්ණාසිට හිතෙන්න ගත්තා. ඒත් "මං ඔයාව කසාද බඳින්න කැමතියි" කියන්න ගෑනියෙකුට අමාරුයිනෙ.

සාෂා ගේල්ගෙන් වෙන්වෙලා බව කියලා තිබුණත් එහෙම කසාද බඳින විදියෙ සම්බන්ධකම් පවත්වන්නෙ නැති කෙනෙක් වෙන්නත් ඇතිනෙ. පිටරටවල ඉන්නකොට එහෙම නිදහස් ජීවිතේකට පුරුදු වෙනවනෙ. අනිත් එක එයා ගැන වැඩිය දන්නෙත් නැතුම එහෙම හිතෙන එක කොච්චර මෝඩ ද? අවිස්සාවේල්ලෙන් බැහැලා අත වනාගෙන ස්තුති කරලා ගියාම ඉවරයිනෙ. ඒත් එහෙම ඉවර කරන්න බැරි තණ්හාවක් දූනෙන්න ගත්තා.

"ඔයා අවිස්සාවේල්ලෙන් බැහැලා කොහෙද යන්නෙ?"

"මහ ගෙදරට."

"ගෙදර ඉන්නෙ කව්ද?"

"ආතම්මා"

"අම්මයි තාත්තයි?"

"ලංකාවෙ නෑනේ"

වර්ණාසිට ඕන වුණේ නෑ අම්මයි තාත්තයි ගැන විස්තර කරන්න. කැලිෆෝර්නියාවෙදිත් ඒ ගැන කිව්වෙ නැහැනෙ. එතකොට නං එයා ඇහුවෙත් නැහැනෙ. පවුලෙ එකම දරුවා කියන එක නං කියවුණා ද කොහෙද. ඒත් සාෂා අම්මා තාත්තා ගැන විස්තර අහන්න කලින් කතාව මරු කරන්න වර්ණාසිට ඕන වුණා.

"මං වීක්එන්ඩ් එකට නුගේගොඩ නැදෑ ගෙදරක ඉන්නවා. අනිත් දවස්වල ආතම්මා එක්ක ගමේ ඉන්නවා. මං ආසා ගමේ

ඉස්කෝලෙත් උගන්නලා ආතම්මා අත්ත ඉන්නවා. දැන් මේ පන්ති යන්න ගන්නෙත් මගේ උවමනාවටම නෙවෙයි. ගෙදරින් බල කරන හින්දයි. ඒ වුණාට දැන් නං මට ඒවාට ආසයි. මොනවා උනත් මං ආසා කලබල නැති සන්සුන් ජීවිතේකට."

සති අන්තයෙ ඉගෙන ගන්න දේවල් ගැන සාෂා ප්‍රශ්න කළා. වර්ණාසි බොහාම කැමැත්තෙන් ඒ ගැන විස්තර කිව්වා.

"ලෝකෙ හැම තැනම මිනිස්සු ශරීර ලස්සන කර ගන්න හැ ගත්තු ආභරණවල සමානකමක් තියෙනවා. මට ඒක හරියටම කියන්න තේරෙන්නෙ නෑ. ඒත් මිනිස්සු ඇයි කන්පෙති සරසන්න හිතුවෙ? කරට මාල දන්න හිතුවෙ? මට හිතෙන දෙවල් කතා කරන්න ඉන්නෙ අම්මා විතරයි. ආතම්මා ගුරුවරියක් වෙලා හිටියට හැමදම හෝඩියෙ පන්තියට අකුරු ඉලක්කම් උගන්නලා ලොකු පන්තිවලට මැහුම් ගෙතුම් උගන්නපු හින්ද ඕවා වැඩි දුර හිතලා නැහැ."

"ඉතිං දැං මං ඉන්නවනෙ. ඔයාට හිතෙන දේවල් මට කියන්න. මං ඔයාට ආභරණ ඉතිහාසය ගැන පොත් හොයලා දෙන්නං."

"අපි ආයෙ කවද හම්බවෙයිද දන්නවයැ. ඔයා ඉමලක්ෂන් ඉවර වුණාම ඇමරිකාවට යයි."

"චන්දන ගිරිකුඹුර පොට්ට චාන්ස් එකකින් හරි දිනුවොත් මට යන්න බැරි වෙනවා. එයා මට යන්න දෙන එකකුත් නෑ. දිනනවා වගේ නෙවෙයි දිනුම රැක ගන්න හිතවත් මිනිස්සු, ඔළුව තියෙන මිනිස්සු ඕන."

"ඔයාට ඔළුවක් තියෙනව ද?" වර්ණාසිට එච්චරම පුරුදු නැති දඟ හිතාවක් ආවා."

"අද උදේ නං තිබුණා. දැං නං ඔළුව නැතුව හර්ද වස්තුව තමයි වැඩ කරන්නෙ."

"මටත් එහෙමයි." වර්ණාසි දන්නෙම නැතුව එයාගෙ හර්ද වස්තුවත් පිටට පැන්නා.

සාෂා වාහනය පාර අයිනෙ නතර කළා. ඒ හරියෙ රබර් වත්තක් තිබුණු නිසා හෙවන ගතියයි. නැමිලා වර්ණාසිගෙ නළල් ඉම්බා.

"වර්ණී මට හිතෙනවා ඔයා මං හොයපු ගෑනි කියලා."

වර්ණාසි කතා කළේ නෑ. සාෂාගෙ කමිසෙ පෙගෙන්න ඇඬුවා. ඒ ඇයි කියලා කියන්න දැනගෙන හිටියෙත් නෑ.

"ඔයා එකම ළමයා හින්ද ඔයාගෙ ගෙදරින් මට කැමති වෙන එකක් නෑ. ඒ වුණාට මං මැරෙනකල් ඔයාට ආදරේ කරන්නං."

ඒ කතාවෙ කසාද බැඳිල්ලක් ගැන කිසිම සඳහනක් නැති වුණාට වර්ණාසි හිතුවෙ ඒ විවාහ ගිවිස ගැනීමක් කියලයි.

"අපෙ අම්මා හරි හොඳයි මං කැමති දේකට ගෙදරින් කැමති වෙයි. අපේ අම්මා මගේ වයසෙදි මට වඩා හුඟාක් ඉස්සරහින් හිටි කෙනෙක් හන්ද ආතම්මා නං මං ගෙදරින් අවසර ඉල්ලන පමාවට කැමති වෙයි."

වර්ණාසිගෙ බාල වයසට ඇති වෙන ගෞරවනීය නීතිමය පේරු මස්තක අපේක්ෂාව සාෂාට තේරුණත් ඒක එච්චර වැදගත් දෙයක් නෙවෙයි කියලා ගෑනු දරුවා බය කරන්නෙ මොකට ද? ගෑනු දරුවො අම්මලාගෙ ග්‍රහණයෙන් මිදිලා පිරිමියෙක්ගෙ ස්පර්ශයට හුරු වුණාට පස්සෙ පිරිමියාට වෙන කෙනෙක් බඳින්න සිද්ධ වුණත් ආදරේ වෙනස් වෙන්නෙ නෑ කියලා කියන තරමට විශාල හදවත් ඇති කර ගන්නවනෙ. වර්ණාසිගෙ කතාවෙත් ඉරියව්වලත් තැන්පත් ගතියක් තිබුණාට එහෙම ගෑනු බොහොම පහසුවෙන් ඒ තත්ත්වෙට පත්වෙන බව සාෂා අත්දැකීමෙන් දනගෙන හිටියා. වර්ණාසි රැවටීමේ උවමනාවක් නැති වුණත් අත හැරීමේ ලෝබ කමකුත් දනෙමින් තිබුණු නිසා ඉටු කරන්න බැරි පොරොන්දු නොදී ඉදිමින් උනත් සම්බන්ධයක් පවත්වාගෙන යන්න බාධාවක් නැති බව සාෂාට දැනුණා.

එදයින් පස්සෙ සාෂාට කොච්චර වැඩ තිබුණත් වර්ණාසිට ටෙලිෆෝන් කිරීමෙන් ජංගමයට හුරතල් කෙටි පණිවිඩ යැවීමෙන් සාෂාත් සතුටක් ලැබුවා. පන්ති යනවා කියලා තැපැල් සීයාට කියලා සාෂා එක්ක චිත්‍රපටි බලන්න නාට්‍ය බලන්න ගිය අවස්ථාත් දෙක තුනක් උද වුණා. රෑ වෙලා ගෙදර ගියාම ආතම්මා දොරකඩ බලාගෙන ඉඳලා "ඇයි පුතේ රෑ වුණේ?" කියලා ඇහුවම

ඇමරිකාවෙදි අඳුන ගත්තු යාළුවෙක් මුණ ගැහිලා කතා කර කර හිටියා කියාගෙන ගෙට ගියේ ආතම්මගෙ මූණ දිහා බලන්නෙ නැතුවයි.

සාෂා නැවතිලා හිටිය ගෙදර පහළ තට්ටුවෙ මැතිවරණ වැඩට එක එක්කෙනා ආවා ගියා. උඩ තට්ටුවෙ සාෂා එක කාමරයකුත් අනෙක් කාමරය ජනාධිපති අපේක්ෂක චන්ද්‍රකට අවශ්‍ය වෙලාවට ගිමන් නිවන්නත් පාවිච්චි වුණා. සාෂා උවමනාවෙන්ම උඩට යන එන අය පාලනය වෙන විදියට ගේ ඇතුළෙන් උඩට එන දොර අගුලු දැම්මා. පඩි පේළිය දිගට පෝස්ටර් මිටි ගොඩ ගැහුණා. පිට පඩි පේළිය කෙලින්ම ගැරේජ් එක පැත්තෙන් එන්න පුළුවන් විදියට හදලා නිසා පහළ තට්ටුවෙ ඉන්න අයට නොදැනෙන්න උඩට යන්න පුළුවන් වුණා.

වර්ණාසි සාෂාගෙ කාමරේට ගියේ කිසිම බලු කිසිකින් තොරවයි. සාෂාට උණ ගැහිලා තිබ්බා. වර්ණාසි [illegible] ආපහු ඉක්මනට ආපහු යන්න [illegible]. [illegible] උඩ තට්ටුවෙ [illegible] කිරීමත්, මෙහිලගෙ රෙදි පිළි [illegible] කිරීමත්, ඉතුරු [illegible] තම්බලා දීමත් ඉවර වෙනකොට ඇය මදක නුතාත් ගියා.

"හොඳට රෙද්ද පොරවගෙන කොත්තමල්ලි බූං අල්ල [illegible] බිල්ල උණු කොත්තමල්ලි මුට්ටිය කාමරේට ගෙනත් අතට දීලා මැතිවරණ පෝස්ටර් දෙකක් උඩ තියලා පොඩි ළමයෙක්ව වගේ සාෂාව හැතිරෙව්වා. ඒ වතාවෙ යාමේ තියාට වර්ණාසිට ආපසු එන්නමයි හිත තිබුණේ.

"හොඳ යාළුවෙක් ලෙඩ වෙලා. බලන්න කවුරුවත් නෑ."

"කවුද පුතේ යාළුවා." ආතම්මා ඇහුවා.

"අර ඇමරිකාවෙ යාළුවා. බලන්න කොහොමත් නෑ. හරි වෙ."

"මොකද්ද පුතේ අමාරුව?"

"උණ කොම්බිරිස්සාව. මං හිතන්නෙ ඇල්වතුර නානවත් ඇති."

"නිව්මෝනියාවට හැරෙයිනෙ. ඒ ළමයට කියන්න මෙහෙ එන්න කියලා. හතුරෙක් හරි ලෙඩ වුණොත් බේත් උගුරක් කැඳ

උගුරක් දෙන එකේ යාළුවෙකුට බලන්න එපායැ."

"ඒක තමා. මං ගිහිං බලලා එන්න ද? ටෙලිෆෝන් කරලා එන්න කිව්වට එන එකක් නෑ."

"එහෙනං ඉන්න මං ආඩතෝඩා පස් පංගුව කොළපතක වළලලා තියලා ඒකෙ තමා දුමත් තිබ්බෙ. ඒකත් අරන් යන්න. ඒ ළමයට පොල් පුච්චපු කළු සම්බෝලෙකුත් ගෙනිහිං දෙන්න. බය වෙනි, කරල් ගිල්ලට ඒ ගමන් ගොඩ වෙදකං කරාට අහක යන්නෙ නෑ."

ආතම්මා උවමනා දේවල් සකස් කරනකල් වර්ණාසි අල්මාරියෙ තිබුණු මල් මහපු කොට්ට උර දෙකකුයි, ගැලපෙන ඇඳ රෙද්දකුයි ගමන් මල්ලට දා ගත්තා. වර්ණාසි [illegible] යනකොට සාෂා දුකගෙන හිටියෙ නැහැ. [illegible] කොළ [illegible] ලොන්ඩරියෙ [illegible] ඇඳ රෙදි කොහෙවත් එකලා තිබුණා. [illegible] ඇවිදගෙන යන විදිහට [illegible] තිබුණා. මුලින්ම සාෂා හිටිය ගෙදරට ගියෙ සාෂාත් එක්කම නෑ එකෙනන්නෙ. ඊද ඒ [illegible] අනේ පටු තීම [illegible] තිබුණෙ [illegible] කොළ පාට රෙදි.

"මෙහෙන් යනකොට මට හිතෙන්නෙ ෆිල්ම් එකක් හදන්න මෙතන රෙදි වැල පාවිච්චි කරන්න පුළුවන් කියලයි."

වර්ණාසි ප්‍රශ්නයක් අහයි කියලා සාෂා බලාපොරොත්තු වෙච්ච බව පෙනුණා. වර්ණාසිට ඒ වගේ දේවල් තේරෙන්න විදියක් නැහැනෙ. ඒත් වර්ණාසි හිතමින් හිටියෙ අම්මාත් ඒ අදහසම කියලා තිබුණා නේද කියන එකයි. අම්මා කියලා තිබුණෙ ප්‍රධාන චරිතයේ හැඟීම් වෙනස් වෙනකොට රෙදි වැලේ පාටත් වෙනස් වෙනවා කියලයි. වර්ණාසි සාෂා එක්ක අම්මා ගැනවත් පවුලේ විස්තරවත් කතා කරන්න උනන්දු වුණේ නැති වුණාට කවදා හරි අම්මයි සාෂායි අඳුන ගත්තාම දෙන්නාම කතා කරන විදියෙ හිතන විදියෙ සමානකම් දැකලා පුදුම වෙයි. නෑන්දම්මයි බෑනයි කොහොද වගෙයි කියන බලාපොරොත්තුව තිබුණා. ඒ විශ්මිත කතාව සාෂාට ලොකුදෙන තුරු විස්තර කරන අනවශ්‍යයි කියලා වර්ණාසි හානයක්

ඊ-මේල් එකක් යැව්වා. රෙදි වැලට පණ දෙන්න අම්මාටත් හිතිලා හුඟාක් කල් කියලා නොකියා වර්ණාසි දැසින් හිනාවෙමින් සාෂාගෙ කකුල උඩින් අත තියා ගත්තා.

"කොහොමද රෙදි වැල පාවිච්චි කරන්නෙ කියලා කියන්ඩ ද?" වර්ණාසි නැඟූ ප්‍රශ්නය සාෂාම මතු කළේ ඒ නිහඬ ගතියටත් කැමැත්තෙන්. මුළු ජීවිතේම සාෂා ආශ්‍රය කරලා තිබුණෙ ප්‍රශ්නයක් පවා නැවත ප්‍රශ්න කරන යටි අරුත් විග්‍රහ කරන පණ්ඩිත අම්මණ්ඩිලටනෙ. වර්ණාසි ඒකෙ අනිත් පැත්තනෙ. පිරිමියෙකුට අධිරාජයෙක් වගේ බලගතු හැඟීමක් එන්නෙ එහෙම ස්ත්‍රියාවක් ඉදිරියෙදිනෙ. වර්ණාසි ඒ ප්‍රශ්නෙට උත්තර දුන්නෙත් යාන්තමට ඔළුව වනලා "හ්ම්" කියමින්.

"මට ඕන රෙදි වැලයි, කෝච්චියයි පාවිච්චි කරන්න. කෝච්චියෙ රස්සාවට යන මිනිහෙක් හැමදම දකිනවා මේ හරියෙ පොඩි ලැලි ගෙදරක ගෑනු ළමයෙක් එක එක වැඩ කරනවා. ඔයා දකලා තියෙනවාද රෙදි වැල් පහුවෙලා තව ටිකක් ඉස්සරහට යනකොටත් නාන ළිඳක් තියෙනවා. ඉස්සර මේ රෙදිවැල් තියෙන හරියෙත් ළිඳක් තිබුණා. තාම ඒක තියෙනවද දන්නෙ නෑ. මේ ගෑනු ළමයා නානවා, රෙදි හෝදනවා පවා මේ මිනිහා දකිනවා. ඒ නිසා මිනිහට දැනෙන්නෙ ඒ ගෑනු ළමයාව හොඳට අඳුරනවා කියලයි. හැමදම දකලා දෙන්නා හිනාවෙන තැනට එනවා. ඔය අස්සෙ දවසක් සිග්නල් නැතුව කෝච්චිය මේ හරියෙ නැවැත්තුවම මිනිහා බහිනවා. ඒ ගෙදර පොඩි කඩයක් තියෙනවා. මිනිහා සිගරට් බොන්නෙත් නැති නිසා ඒ කඩෙන් පැනඩෝල් ගන්නවා. ගෑනු ළමයා එක්ක කතා කරන්න බැරි වෙනවා. මදව් පෙනුම තියෙන මිනිහෙක් ගේ ඇතුළෙන් එළියට එනවා."

සාෂාට කතාව කියන්න ලැබුණෙ වාහන තදබද වෙලා [illegible] ලිවක හිටිය හින්දයි. ඊළඟට වාහන ඉදිරියට ඇදෙන්න ගත්තා [illegible] නිසා.

[illegible] ද වෙන්නෙ?" වර්ණාසි පොඩි ළමයෙක්

"දන්නෙ නෑ. [illegible] වරයි."

"ඊළඟ කොටසෙදි ඒ දෙන්නාට කතා කරන්න ඉඩ දෙන්න."

"එහෙනං නිකං වට්ටෝරු ප්‍රේම කතාවක් වෙයි."

"ඒකට කමක් නෑ. ප්‍රේම කතාවලට කවුරුත් කැමතියිනෙ. මේ පැත්තෙ පොඩි ලැලි ගෙවල් හුඟාක් තිබුණා. දැන් ඒවා එකයි දෙකයිනෙ තියෙන්නෙ. ඒ මිනිස්සු ගෙවල් වෙනස් කරගෙන ජීවිතත් වෙනස් කරගෙන ඇති. අර කෝච්චියෙ ගිය මිනිහටත් මේ ඔයාට වගේ කාර් එකක් ලැබෙන්න පුළුවන්."

"ඒ මිනිහා වෘත්තීය සංගමේක සභාපති කෙනෙක් කරල රස්සාව නැති වෙලා මේ පාරෙම කරෝල කඩයක් කරන තැනට ගේන්න ඕන. එතකොට වෙන වෙන බිස්නස් අහුවෙලා කාර් එකක් ගනියි. මට ඕන දිගටම රෙදි වැලයි, කෝච්චියයි, බයිසිකලුයි, ත්‍රීවිලර්ස් හෙම එක එක වාහනායි චරිත වගේම පාවිච්චි වෙන අමුතු වැඩක්."

වර්ණාසි හිතා ගත්තා සාෂා ගැන අම්මට කියන දවසට ඒ කතාව කියලා අම්මා ඒක සම්පූර්ණ කරන හැටි බලන්න.

"ඔයා අමුතු විදියට හිනාවෙන්නෙ ඇයි?"

"ඔයාගෙ ඔය කතා අහපුවම අපේ ගෙදර අය හරි ආසා වෙයි. අපේ ගෙදරත් වෙලාවකට කතා සාගරයක්. ආතම්මා ගම කතා, බණ කතා කියනවා. අම්මා ඒවා එයාට හිතෙන හිතෙන හැටියට වෙනස් කරලා කියන්නෙ ආතම්මාගෙන් බැනුං අහන්නත් බලාගෙනමයි."

එද ඒ කතාව අතරමග නතර වුණේ සාෂා හිටිය ගෙදරට වාහනය දලා වර්ණාසිට නිහඬව උඩට යන්න සන් කළ නිසයි. ඉතින් ලෙඩ බලන්න යනකොට වර්ණාසිට හිතුණෙ රෝස පාට තෙත රෙදි වැල්වල එල්ලිලා හුළඟට වැනුණෙ ප්‍රේමයට පසුබිම් දර්ශනයක් සපයමින් කියලයි.

"මේ මං ලෙඩා බලන්න එනවා. පාර රෝස පාටයි." වර්ණාසි සාෂාගෙ ජංගමයට කතා කළේ ඒ වෙලාවෙයි.

"කරදර වෙන්න එපා. දං අඩුයි. හෙට නුවරත් යනවා."

"දූං ඉතිං ළඟටම ඇවිත් ඉන්නෙ."

"කොහෙද?"

"රේල්වේ ඇවනිව් එකේ."

"පිස්සු වැඩනෙ."

සාෂා එහෙම කිව්වෙ තමන් කරදර වෙනවට දුකෙන් කියලයි වර්ණාසිට හිතුණෙ. එද සාෂා වැඩි කතාවක් නැතුව අසහනයෙන් හිටියෙ.

"මීට පස්සෙ ඔහොම නොකියා එන්න එපා. මෙතනට එක එක ජාතියෙ මිනිස්සු එනවා. ඔයාට තේරෙන්නෙ නැතුවත් ඇති... ඉලෙක්ෂන් කියන්නෙ සාධුලා හිටං චණ්ඩියො වෙන අවස්ථාවල්නෙ."

"ඉතිං මං එනකොට සාධුලයි. චණ්ඩියොයි, චණ්ඩි සාධුලයි කවුරුවත් හිටියෙ නැනේ."

"මොකද නැත්තෙ? සාධුලා දෙතුන් දෙනෙක් දුනුත් පෑද ඇති. මං මේ නෑනා එනවයි කියලා ඒ ගොල්ලො පහළට ... ගත්තෙ."

"මං ඉක්මනට යන්නං. මීට පස්සෙ එහෙම කියන්නෙ නැතුව එන්නෙ නෑ හොඳේ." වර්ණාසි උණ රෝගියගෙ නළල ඉම්බා.

"අනේ අනේ ගිනිකබල වගේ. ඔහොම නුවර ගියොත් හොඳට හිටියි."

"හරි හරි.... මං රෙස්ට් කරන්නං."

"කොත්තමල්ලි දුං අල්ලලා කැඳ ටිකකුත් පොවලා මිසක් යන්නෙ නෑ. මං ගෙදරින් හදගෙන ආවෙ. බීලා බලන්නකො. අපේ ගෙදර කැඳ හදන්නෙ ඉඟුරු, සුදුළූණු, බැදපු කොත්තමල්ලි. දූනෙන නොදැනෙන තරමට පෙරුම්කායම් ඇබින්දක් හෙම දලා."

"වෙද හාමිනේ දූන් තව ටිකකින් මීටිමක් තියෙනවා."

වර්ණාසි ඒක නෑහුණා වගේ සියලු සප්පායම් කළා.

"ඉලෙක්ෂන් ඉවර වුණාම ඔයා අපේ ගෙදර එන්න." වර්ණාසි

යන්න හැරුණෙ එහෙම කියාගෙන.

"ඔයාට පස්සෙ දුක හිතෙයි." සාෂා කල්පනාකාරීව කිව්වා. ඒත් ඒ කෙල්ල ගිලිහෙන්න ඇරලා ඔහේ බලාගෙන ඉන්නවද කියන ප්‍රශ්නය බරපතල විදියට දැනෙන්න ගත්තා.

"දූං ඉතිං ඔය සුද්දියොයි, පිලිපීන් ගෑනුයි, තායි අම්මණ්ඩිලයි, චීන බෝනික්කොයි, ඉන්දියන් කිරි අලුවායි රස බැලුවා මදෑ. දූන් ඔය කෙල්ල බැඳගෙන මිනිහෙක් වෙයං. එක කෙල්ල නං, අම්මලා රට නං සෑහෙන බරකුත් ඇතිනෙ." චන්දන ගිරිකුඹුරත් කිව්වා.

"යකෝ උඹ මීටින්ස්වල දෑවැදි තහනම් කරන්න ඕනයි කියන්නෙ මට දෑවැදි ගන්න කියන ගමන් ද?"

"කැමත්තෙන් දෙන දෙවල්නෙ. එකම ළමයට දෙමව්පියන්ගෙ දේපළ අයිති නොවී ඒවා රාජසන්තක කරලා හැම කෙනක්ම බුල් පොටේ ඉඳලා තනියම හද ගන්න ඕන කියන්නයැ. ඉන්දිරා ගාන්ධිටවත් බැරි වුණා ඒක හරියකට කරන්න."

"මං දන්නෑ මචං... හරි නිවිච්ච අහිංසක කෙල්ල."

"ඒක තමයි ඔය ජාතියෙ කෙනෙක් ආයෙ හම්බ වෙනවා බොරු පුතේ."

ඒ තමන්ට දෛවයෙන් නියම වෙච්චි මිනිහය කියන විශ්වාසයෙන් වර්ණාසි සාෂා වටේට සිහින ගොඩ ගැහුවා. සාෂා වර්ණාසිට පෙම්වතියකට වගේ හාදු දුන්නා. බිරිඳකට වගේ එදිනෙද ප්‍රශ්නත් එහෙන් මෙහෙන් කිව්වා. පොඩි ළමයෙක්ව හුරතල් කරනවා වගේ හුරතල් කළා. කොණ්ඩෙ පීරලා දිගට ගොතලා හැඩ බැලුවා.

"මේ මගේ ජීවිතේ පළවෙනි වතාවට කන්‍යා ශරීරයක් දකිනවා. ඒ හින්ද මං ඔයාව බඳිනකල්ම මේ විදියටම ඉන්න අරිනවා." කියලා සාෂා කිව්ව දවසෙ වර්ණාසිට හිතුණා ඒක ආතම්මට කියන්න ඇත්නම් කියලා.

මැතිවරණය කිට්ටු වෙනකොට සාෂාට වැඩ වැඩි වුණා. ඒත් කොහේ හිටියත් හැමදම කතා කරා. ලස්සන කෙටි පණිවිඩ එව්වා. වර්ණාසි ආතම්මාගෙන් අහගෙන මේස රෙද්දකට අල්ලන්න පුළුවන් අමාරු බීරළු රේන්දයක් ගෙතුවා. ඉරු එළියෙන් නැවුණු

රෝසමල් විතු ඇන්ද. තණ කොළත් වල් ගහුත් අතර සැඟවුණු, දිය පාරවල් ළඟ නැලවුණු පුංචි වනමල් පින්සලට හසු කර ගත්තා. ඒවා ගෙනියලා සාෂාගෙ කාමරේ සැරසුවා.

"රටේ මෙච්චර කලබල තියෙද්දි බෝම්බ පුපුරද්දි ඔයාට ඒ කිසි දෙයක් දැනෙන්නෙ නෑ.... ඔයාට පේන්නෙ මල් විතර ද?" විතු කලා ගුරුවරු ඇහුවා. අනිත් කට්ටිය සොල්දාදු බූට් සපත්තු පේළි ඇඳලා කැන්වස් පුරවලා වැඩි ලකුණු ගනිද්දි වර්ෂාසි පිඬු පැවරුණු මල්වලින් කැන්වස් පිරෙව්වා.

"ඒගොල්ලො මොනවා කිව්වත් ඔයා කැමති දේවල් විතරක් අඳින්න." කියලා සාෂා කිව්වා.

වර්ෂාසිට කරන්න හුඟාක් වැඩ තිබුණා. ස්වාභාවික වර්ණ හදා ගැනීම හරිම ප්‍රීතිමත් පර්යේෂණාත්මක කටයුත්තක් බව දැනුණා. තමන් හදපු ශාඛ වර්ණ දල සාෂාට සරමකුත් හැදුවා. කවුරුවත් සරමකට නොකරන වැඩක් කරන්න හිතුණ හින්ද ඒකෙ මැටියට දම්වැල් මැස්මෙන් කාර් පේළියක් මැහුවා.

"පිස්සු කෙල්ල මෙච්චර කරදර වුණෙ මොකද?" කියලා සාෂා වර්ෂාසිව උස්සලා වටයක් කැරකෙව්වා.

ජනාධිපතිවරණයෙදි චන්දිමට ඡන්දෙ දන්න ආතම්මව පොළඹව ගන්න වර්ෂාසිට පුළුවන් වුණා. ඒත් චන්දිම දිනුවෙ නෑ.

"ඒකට කමක් නෑ. මං ඔයා දාලා යන්නෙ නෑ. මට හොඳ ඔෆර් එකක් ඇවිත් තියෙනවා. මං ඒක ගන්නවා." කියලා සාෂා ටෙලිෆෝන් එකෙන් කිව්වා."

ජනාධිපතිවරණයෙන් දවස් දෙකකට පස්සෙ සාෂා වර්ෂාසිට කතා කරා ගාල්ලෙ ගිහින් දවස් දෙකක් නවතින්න.

"එහෙම නෙවෙයි දූං මං මේක ආතම්මටයි අම්මාටයි කියන්න ඕන. අම්මා ලබන සුමානෙ එනවා. දවස් පහයි නිවාඩු තියෙන්නෙ. ඒ අතරතුර ඔයා ගෙදර එන්න. එතකොට ඒ දවස් පහේ අපේ ගෙදර ඉන්න පුළුවන්."

"දූං මේ ගේ පාළුවෙලා. මං විතරයි ඉන්නෙ. එහෙනං ඔයා

මෙහෙ එන්න. අම්මා එනකොට අපි එයාර්පෝට් එකට ගිහින් එක්කන් එමු." කියලා සාෂා කිව්වා.

වර්ෂාසි පුංචිකාලෙ ඉඳලා ගත්තු පින්තූර ඇල්බම් දෙකකුත් අරගෙන නුගේගොඩ ගියා. ඒ හැම පින්තූරයකටම සම්බන්ධ කතා කියන්න ඒවයෙ ඉන්න අය ගැන විස්තර කරන්න වර්ෂාසිට ඕන වුණා. ඡන්ද වැඩ ඉවර වෙනකල් වර්ෂාසි බලාගෙන හිටියෙ එහෙම විවේකිව මුළු දවසක්ම ළඟ ඉඳගෙන ජීවිතේ හැම හිනාවක් හැම කඳුළක් ගැනම කියන්නයි. පුංචි කාලෙ ඉඳලා සාෂාගෙ ජීවිතේ හැම දෙයක්ම දැන ගන්නත් ඕන වුණා. ඒ වෙනකොට සාෂා කියලා තිබුණෙ උපදිනකොටම අම්මා මැරිලා නිසා පොඩි කාලෙ ඉඳලා හැදුණෙ මාමා ළඟ කියලයි. තාත්තා වෙන කසාදයක් කර ගත්තු නිසා සාෂා ගැන බලලා නෑ. මාමා හරි සැර හින්ද ඉගෙන ගත්තලු. හැබැයි විශ්ව විද්‍යාලෙට ගියාට පස්සෙ මාමා සාෂාව අත ඇරියලු.

"මාමාට දරුවෝ හිටියෙත් නෑ. ඒ වුණාට පස්සෙ ඔළුව හොඳ නැති වෙලා නැන්දව සැක කරන්න ගත්තා. පාරෙ යන මිනිහෙක් ගේ දිහා බලුවත් නැන්දට බැන්නා. ඒ හින්ද ම කැම්පස් යන කාලෙ ඉඳලම අතට අහුවෙන හැම වැඩක්ම කරා. පුදුම දුක් වින්ද. ඒ සේරම කතා පස්සෙ දවසක කියන්නං. ඔය ගේල් හම්බු වුණේ එයා රිසර්ච් එකකට ලංකාවට ඇවිත් ඉන්නකොටයි."

සාෂාගෙ පෞද්ගලික තොරතුරු කියලා ඊට වැඩිය දෙයක් දැන ගන්න කාලයක් ලැබුණෙ නැහැනෙ. වර්ෂාසිගෙ හිතේ ප්‍රශ්නාවලියක් තිබුණා.

"ඔයාට පුංචි කාලෙ මතක දේවල් මොනව ද?"

"ඔයා පුංචි කාලෙ කන්න ආසා මොනව ද?"

"ඒ කාලෙ ගිය ගමන් ගැන කියන්න."

"ඉස්සරවෙලාම ගෑනු ළමයි ගැන හිතන්න ගත්තෙ කොයි කාලෙද? ඒ කව්ද?"

"එක එක කාලවල ඔයාගෙ හොඳ යාළුවො වෙලා හිටියෙ කව්ද?"

"ඔයාගෙ මාමා මොන වගේ ද? තාත්ත මොන වගේ ද?"

"මට ඔයාගෙ අම්මාගෙ පින්තූරයක් බලන්න බැරි ද?"

ඔය වගේ ප්‍රශ්න සීයක් විතර ඔළුවෙ තිබුණා.

"මට ඔයාව හොඳටම දන්නවා කියන හිත ඇති කර ගන්නයි මේවා ඔක්කොම අහන්න ඕන. මට දැනෙන්නෙ මගෙ අම්මාවයි තාත්තවයි දන්නෙ නෑ කියලයි. ආතම්මා ගැන මං දන්නවා වගේම නොදන්න දේවලුත් ඇති. ඒ වුණාට මට ඕන මගේ යටි හිතේ තිබුණ දේවල් හිටං මට යාන්තමට හරි දැනෙන හැමදේම ඔයාට කියන්න. අපි දෙන්නා මැරෙනකල් එකට ඉන්න ඕන දෙන්නෙක් වගේ නෙවෙයි. එක්කෙනෙක් වගෙයි."

වර්ණාසි ප්‍රශ්න අහන්න කලින් කියන්න ඕන දේත් නාටකයක් වගේ පුරුදු වුණා.

"මොකද මේ ඇල්බම් එකතුත් උස්සගෙන" තුරේගෙට යන්න ලෑස්ති වෙනකොට ආතම්මය ඇහුවා.

"අර ඇමරිකාවෙ ඉඳලා ආපු සාජ්වට පෙන්නන්න ඒ එනෙත් යනවා."

"අද පන්ති නෑ නේද?"

"නෑ.... මිස්ට නම්ඩ වෙන්න තිනෙවා. එයා ප්‍රදර්ශනෙකට ලෑස්ති වෙනවනෙ." වර්ණාසිට කටේ තොලේ නොගෑවී බොරුත් කියවුණා. ඒත් වරදකාරී හැඟීමක් දැනුණෙ නෑ. ආතම්මා විසත් වැඩිපුර ප්‍රශ්න කරා නං ඇත්ත කියවෙන්නත් තිබුණා.

වර්ණාසි ලොකු බත් මුලකුත් අරගෙන යනකොට සාෂා කලින් දවසෙ හොඳට බීලා ජනේලත් ඇරගෙන නිදි. වර්ණාසි සද්ද නොකර සඳළු තලේ ජනේලෙන් ගෙට රිංගලා ඇල්බම් ටිකයි බත් මුලයි මේසෙ උඩින් තිබ්බා. ලී බඩුවල චිත්‍ර අඳින්න පුළුවන් තරමට දූවිලි ගතියයි. කුස්සියෙ ඉඳුල් පිඟන්, විස්කි බීපු වීදුරු, නොසේදූ කෝපි කෝප්ප පිරිලා. වර්ණාසි ඒවා හෝදලා දූවිලි පිහලා ගේ අතුගානකොට සාෂා නැගිටලා ආවා.

"ඇයි චූටි මට ඇහැරෙව්වෙ නැත්තෙ?"

ඇඳුම් නැතුව නිද ගන්න සාෂා ඇඳුම් නැතුවමයි සාලෙට ආවෙ. වර්ණාසි දුවලා ගිහින් සඳළු තලේට විවර වෙන දොරයි මැතිවරණය දවසෙ විවෘත කරලා තිබුණු පහළින් උඩට එන දොරයි වැහුවා.

"බය වෙන්න එපා කවුරුවත් එන්නෙ නෑ."

"ඒ වුණාට කවුරු හරි ආවොත් මටයි ලැජ්ජාව."

"මං කියනවා මං ඔයාව බැඳලා ඉන්නෙ කියලා."

"දැං ගිහිං නාගෙන එන්න. ඇඟත් විස්කි ගඳයි."

"එහෙමයි මැණිකෙ. ඒ වුණාට නාන්න කලිං හොඳ කිරි තේ එකක් ඕන. නාලා ආවම හාදු පන්සිය පනස් එකක් ඕන."

"බෑ පන්සියයි. පනස් එක දෙන්නෙ හෙට."

"එහෙනං අද පනස් එකයි. හෙට පන්සියයි."

"පිස්සුම පිස්සු මිනිහෙකුටයි මාත් පැටලුණේ." කියමින් වර්ණාසි තේ හදන්න ගියා. සාෂා තුවාය පිටින් පැද්දෙන පුටුවක වාඩි වෙලා උඩින් පල්ලෙන් පත්තර බැලුවා.

සාෂා තේ බොන අතර වර්ණාසි කාමරේට ගිහින් ඇඳේ රෙදි අස්කරලා අලුත් කොට්ට උර හෙම දාන්න ගත්තා. වර්ණාසි නාවොත් ඒවා අහක් වෙන්න නැහැනෙ.

ටෙලිෆෝන් එක ගලවලා තියලයි නිදගෙන තියෙන්නෙ. ඒක හයි කරන්නෙ නැතුව ඉන්න එක හොඳයි. ජන්මෙ පැරදුණා කියලා නෙවෙයි ඉවරයක් නැතිවෙයි. සාෂා සද්දයක් නැති හින්ද, වර්ණාසි එබිලා බලනකොට එයා කෑම මේසෙ ළඟ හිටගෙන හිටියා. ඇල්බම් එකත් පෙරළගෙන බලනවා.

"හා..... හා....... දැංම බලන්න තහනම්. නාලා ඇවිත් ඇඳේ ඉඳගෙන එකට බලන්න ඕන." වර්ණාසි හුරතල් හඬින් කිව්වා.

සාෂා ඇහුණෙ නෑ වගේ ඇල්බම් එක දිහා බලාගෙන හිටියා මිසක් හෙල්ලුනෙවත් නෑ. තේ කෝප්පෙ අතේ තියාගෙන හිටියා මිසක් බිව්වෙත් නෑ. මේසෙ උඩින් තිබ්බෙත් නෑ.

"මං පෙනෙන්නෙ වගේ නේද? වීස් බෝලයක් වගේ කියලා ආතම්මා කියන්නෙ."

සාෂා ඒකට උත්තර නොදීම නාන කාමරේට ගිහින් නාලා ද ගත්තා. වෙනදට දොර වහන්නෙත නැ.

"මගේ පිටේ සබන් ගාන්න. මලුව ඇම්බෙලා කරන්න." වගේ ඉල්ලීමකට ඉඩ තියාගෙනයි රෝස පාට කිරි ගවුම වගේ බැතැමගෙන ඉන්නෙ.

"වතුරට පෙමගෙන්න ඕන. ඇස් පියාගෙන ඉන්න ඕන. කාලයක් මැද ස්වභාවික පොකුණක් මවා ගන්න ඕන. ජනාත සන්තෘප්තිය විඳින්න ඕන." කියලයි සාෂා කියන්නෙ.

ඒ කතාවට ඒ සෙල්ලම් ගතියට තමයි ගේල් ආසා වෙන්න ඇත්තෙත්. මුලින්ම සාෂා මුණ ගැහුණු වෙලාවෙ ගේල් එතන හිටියා. කොල්ලෙක් වගේ කොට්ට කපපු කොණ්ඩෙ මුදු නිල් ඇස් තියෙන, පත් ගහක් වගේ හීනි, තල් ගහක් වගේ උස පිට්ටනියක් වගේ පැතලි ළැමක් තිබුණත් ඇඟට සාමන්තව පිරුණු උකුලක් තියෙන, කොළ සේද පසබිමක රත් මකරු රඟන චීන කබායක් අඳලා හිටිය ගේල්ව වර්ණාසිට මතක තිබුණා. ඒ දෙන්න අඹු සැමි භාවය අත ඇරලා මිත්‍ර බන්ධනයකට එළඹුණ හැටි සාෂා විස්තරාත්මකව කියලා තිබුණෙත් නැහැනෙ.

සාෂා කල්පනාවක් නැතුව දෙර වහ ගන්න ඇති කියලා හිතලා වර්ණාසි ගේ පුරාම තිබුණු විස්කි බෝතල් සෝඩා බෝතල් එකතු කරලා කුස්සියෙ හිස් කබඩ් එකකින් තිබ්බා. කුණු ලොරිය කෑ ගහනවා ඇහිලා කළුපාට කුණු බෑග් එකත් අරගෙන පහළට බැහැලා ඒක එළියෙන් තිබ්බා. ඒ ගෙදර කලින් හිටපු මිනිස්සු වවලා තිබුණු පිච්ච වැලක මල් පිරිලා. ඇන්තූරියම් පාත්තිවල, රෝස පාත්තිවල මල් ඉර එළිය එක්කයි, වර්ණාසි එක්කයි, උඩ සඳළු තලේ ඉඳලා කොසු මිටකින් ගෙඩි කඩන්න පුළුවන් ගස්ලබු ගහේ හිටිය පැණි කුරුල්ලො එක්කයි හිනා වුණා. පොඩි තාරං ගහෙත් ඉදුණු ගෙඩි තිබුණා. මැතිවරණ පෝස්ටර්, ප්‍රතිපත්ති ප්‍රකාශන, ලොකු පින්තූර ෆයිල් ගොඩවල් අරක්කු බෝතල්, සිගරට් කොට තිබුණු පහළ තට්ටුව හරියට හිටි ගමන් අත ඇරලා ගිය හමුදා කාර්යාලයක් වගේ කියලා වර්ණාසිට හිනාවක් පහළ වුණා.

ගෙට ලැව්වුවත් ඇරලා යතුරත් හොයා ගත්තු වර්ණාසි රෝස මල්, ඇන්තූරියම් මල්, ෆර්න් අතු ටිකක් කපාගෙන කැණිලත් මල් පිච්ච මල් තෙලාගෙන උඩට ගියේ ඒවා මේසයක් උඩින් තියලා පහළ දොරට යතුරත් දාලා.

පිච්චමල් වීදුරු දීසියකට දාලා ඇඳ ළඟින් තිබ්බා. කුස්සියට ගිහින් රෝස කෝලන් එක්ක මල් බඳුනක් හදන්න පැතලි දීසියක් හොයා ගත්තා. ආයෙමත් පහළට ගිහින් මිදුලෙ පැත්තක අතුරලා තිබුණු ගොඩකින් ගෙනාව ගල් ටිකක් අරගෙන ආවේ තණකොළ, කලාදුරු පාළ ටිකකුත් එක්කයි. ඇන්තූරියම් ටික මලාකු වීදුරුවකට දාලා කෑම කාමරේ වට්නට් එක උඩ තිබ්බා. පැතලි දීසියට වතුර දාලා ගල් තියලා තණකොළ පඳුරු ඒ අතර හැන්පත් කරමින් රෝස මල් ගල් අතර හිරවෙලා කෙලින් හිටින්න හැදුවා. ඒක බොහොම සිත්මතේ කරමින් හැඩ බැලුවා. සමහර තණකොළ කතුරෙන් කොට කළේ සාෂා ඇවිත් කියලා දැනුණෙ එයාගෙ සඳුන් තෙල් සුවඳින්. එයා ඇඟේ නාලා ඉන්දියානු සඳුන් තෙල් ජාතියක් කණ පිටිපස්සෙ තවරනවා. ඒක එයාටම විශේෂ සුවඳක්. ඒ සුවඳෙ පුරුදු ආදරණීය ගතියක් තියෙනවා.

"හොඳද?"

"ලස්සනයි ඔයාට මය වගේ වැඩ පිහිටලා තියෙනවා."

වර්ණාසිට ඕන වුණේ සාෂා ඇවිත් බදාගෙන ඉඹින්නයි. ඒත් එයා ස්වභාවික වර්ණ යොදපු සරම ඇඳගෙන දෙරකඩ පිරෙන්න හිටගෙන හිටියෙ වෙන කල්පනාවකින්.

"චන්දිම පැරදුණාට දුක් වෙන්න එපා. ඔයා කරන්න පුළුවන් හැමදේම කරානේ."

සාෂා කතා නැතුව බලාගෙන හිටියා.

"මට තේරෙනවා. අද ඔයාට කතා කරන්නත් ආසා නැතුව ඇති. එහෙම නං එන්න මං බත් කවන්නං. ඊට පස්සෙ ඔයා ආයෙමත් දෙයියන්න. මං ළඟට වෙලා කකුල් දෙක උකුලෙ තියාගෙන ඉන්නං."

සාෂා කතා නැතුව කෑම කන්න වාඩි වුණේ බඩ අතගාමින්

බඩගිනි බව ඉඟි කරමින්. වර්ණාසි රෝස මල් බඳුන කෑම මේසෙ උඩින් තිබ්බා. බත් එක පිඟානක් උඩින් තියාගෙන සීරුවට දිග ඇරලා සාෂාට කවන්න ගත්තා.

"මේ කොට්ටපොල් සම්බෝලෙ හදව ගත්තෙ චමිලට කියලයි. මේ දවස්වල චමිලා කා එක්කවත් කතා නෑ. අර මෝටර් බයිසිකල්කාරයගෙ කේස් එකට ගෙදරත් එක්ක තරහයි. අපේ ගෙදර ඇවිත් මාත් එක්ක විතරයි කතා කරන්නෙ. ආතම්මා දිහා බලන්නෙවත් නෑ බයයි. මං කිව්වා ආතම්මා පාක්‍යම්ටත් බැන්නා කියලා."

චමිලා ගැන පාක්‍යම් ගුණසේනව කසාද බැඳපු හැටි, වත්තෙ වැඩ කරන අනිත් ගෑනු ගැන හෙම වර්ණාසි වරින් වර කියලා තිබුණා.

"ඔය චමිලාව අඳුන ගන්න මටත් ආසයි." කියලා එක් දවසක් සාෂා විහිළුත් කළා. ඒත් එවෙලෙ නං සාෂා බත් කෑවේ ඒ කතා ඇහෙන්නෙ නෑ වගෙයි. වෙනදට වැඩි කතා කාරයා එයාමනෙ. වෙනදට බත් කවනකොට නොරිදෙන්න ඇඟිලි විකලා "ඌයි" කියලා වර්ණාසි බොරුවට කෑ ගැහුවම "එහෙනං දඬුවං දෙන්න" කියලා එයාගෙ ඇඟිලි පහම පානවා.

"මේ පොළොස් ඊයේ රෑ එළිවෙනකල් අඟුරු උඩ තිබුණු හින්ද හොඳට තෙල් පැදිලා. මං තැපැල් සීයලටත් බෝතලයක් ගෙනාවා. හවස යනකොට මතක් කරන්න ඒක ගෙනියන්න."

සාෂා ගැඹුරු කල්පනාවෙන්ම ඔළුව හෙලෙව්වා.

"ඔයාට මේ වෙච්ච දේට දුක නං ආපහු කැලිෆෝර්නියා යන්න. නැබැයි මාව අතාරින්න එපා. කවද හරි ඔයා එනකං මං බලාගෙන ඉන්නවා. අපිට ගමේ ගෙදර ඉන්න පුළුවන්. රස්සාවක් නැතත් සාමාන්‍ය විදියකට කාලා ඉන්න බැරියැ."

සාෂා ඇස් පියාගෙන බත් කෑවා. වර්ණාසිත් කතාව නැවැත්තුවේ ඒක සාෂාට කරදරයක් වෙයි කියලා. කාලා ඉවර උනාම වතුර වීදුරුව අතට දීලා කුස්සියට ගියා.

"මේ ගහේම ඉදිච්ච කෙසෙල්. ආතම්මා දන්නෙත් නෑ

කුරුල්ලො කොටනකං. ආතම්මා කියනවා ගෙදර පිරිමියෙක් නැති උනහම කෙසෙල් කැනක් කපා ගන්නත් ගුණසේන හරි කවුරු හරි එනකල් ඉන්න ඕනලු. අපේ අම්මා ඉන්නවා නං කොල්ලා වගේ ඕවා කරනවනේ. මං කිව්වා වැඩි දවස් යන්නෙ නැතුව මං ඔය නුගේගොඩ පැත්තෙන් පිරිමියෙක් එක්ක එන්නං කියලා. ආතම්මගෙ හිතේ විහිළු කරනවා කියලයි.

වර්ණාසි කෙසෙල් ගෙඩි දෙකක් කපලා දීසියකට දාලා කොළ පාට මින්ට් රස අයිස් ක්‍රීම් දාලා ගෙනත් දුන්නා.

"කවන්න." සාෂා කිව්වා.

"අද නං පුදුම බබෙක් වෙලා."

වර්ණාසි මේසෙ උඩ වාඩිවෙලා අයිස්ක්‍රීම් කැව්වා. ඊට පස්ස සාෂා පැද්දෙන පුටුවෙ වාඩි වෙලා රූපවාහිනිය දැම්මා. නව ජනාධිපතිගෙ දිවුරුම්දීම දිහා ටිකක් වෙලා බලා ඉඳල කාමරේට ගියා. වර්ණාසි නාලා, කාලා, දතුත් මැදගෙන සාෂා ළඟට යනකොට එයා නිදි. ඒ පාර ගෑනි තනියම ඇල්බම් බල බලා හිටියා.

පළවෙනි පිටේ තියෙන්නෙ මනෝරම්‍යායි, ජිනවතී ඉස්කෝලෙ හාමිනෙයි, ඩේවිඩ්සන් ඉස්කෝලෙ මහත්තයයි ඉන්න පින්තූරෙ. ඊළඟට ජිනවතී ඉස්කෝලෙ හාමිනේ තරුණ කාලෙ වැලමිට හරියෙන් ඔරලෝසුව බැඳගෙන මල්වැලක් ළඟ ඉන්න එක. ඊට පස්සෙ මනෝරම්‍යා දණ ගාන කාලේ. පළවෙනි පිටේ අම්මයි තාත්තයි මැද්දෙන් සාරියක් ඇඳගෙන ඉන්නෙ ඒ බබාමයි කියන්නත් බැරි තරම්. ඊළඟට මනෝරම්‍යා ඉස්කෝලෙ යන කාලේ. ක්‍රීඩා තරඟවලින් දිනලා කුසලාන, පලිහ දරාගෙන ආඩම්බරෙන් ඉන්න ගෑනු ළමයා ක්‍රීඩාවට උනන්දු නොවිච්ච තමන්ට වඩා කොච්චර වෙනස් ද කියලා වර්ණාසිට හිතුණා. ඊළඟට අම්මා උපාධිය ගන්නවා. යාළුවොත් එක්ක ඉන්නවා. ප්‍රියා ආන්ටිත් එක්ක හිනාවෙවී උඩ පනිනවා. ඒ ඇල්බම් එකේ තිබුණෙ වර්ණාසි තෝරලා බේරලා අලවපුවා විතරයි. ගෙදර තව කොච්චර පින්තූර තියෙනව ද? ඒත් පුජම්පති ඉන්න එකක්වත් ඉතුරු කර ගත්තෙ නැති එක කොච්චර නරක ද?

වර්ණාසිගෙ ඇස් බර වුණා. ඒ පාර සාෂා ළඟ ගුලි වුණේ

අවුරුදු ගණනාවක් [illegible] ඇත්තටම මගේ ආරක්ෂිත ගුහයකින්.

ඉර එළිය මළානික වෙගෙන යනකොට වර්ණාසි ඇස් ඇරියා, සාෂා ඇල්ලම බලමින් හිටියා. හිතාගෙන ආ විදියට විස්තර කරන්න, ආතා ගැන අම්මා කියන කතා කියන්න හැම පින්තූරයකටම පසුබිම සටහනක් සපයන්න ලැබුණේ නැහැ.

"ඔයා මනෝරමාගෙ දුව කියලා ඇයි මට කිව්වෙ නැත්තෙ? ඔයා කිව්වෙ අම්මයි තාත්තයි රට කියලනෙ." සාෂා ඇහුවෙ හිතියෙන් බලාපොරොත්තු නොවෙච්ච ප්‍රශ්නයක්.

"ඔයා අපෙ අම්මව දන්නව ද?" වර්ණාසි නැගිටල ඇඳ පන්නට හේත්තු වෙලා ඉඳ ගත්තා. සාෂාගෙ මූණේ එච්චර සතුටක් තිබුණෙ නැහැ.

"ටිකක් දන්නවා. එයා ආයෙත් බැන්ද ද?"

"නෑ. මගේ තාත්තා කොහේ හරි පිටරටක ඇති. මං ඔයාට ඒ විස්තර කියන්නයි හිටියෙ. ඒත් තාත්ත ගැන කතා කරන එක හරි අමාරු දෙයක් හින්ද ඔයා අපේ ගෙදර ආ දවසට කියන්නයි හිටියෙ. තාත්තෙක් නෑ කියලා ඔයා මාව කොන් කරන්නෙ නැති බව මං දැනගෙන හිටියා."

වර්ණාසිගෙ ඇස්වලින් කඳුළු බේරුණා.

"අඬන්න එපා. මනෝරමා මං ගැන එච්චර හොඳට හිතන එකක් නෑ."

"ඔයා කොහොම ද අම්මා අඳුනන්නෙ?"

"හුඟාක් ඉස්සර අපි එක තැන වැඩ කරා. මනෝරමා හිතන්නෙ මං එයාට විරුද්ධව කුමන්ත්‍රණය කරා කියලයි."

"ඒ කොහොම ද?"

"හුඟාක් ඉස්සර අපි ෆිල්ම් එකක් හදන්න කතා වුණා. ඒත් ඒකට සල්ලි දන්න කැමති වෙලා හිටිය මගේ යාළුවා පස්ස ගැහුවා. ඔයාගෙ අම්මා හිතුවෙ මං ඒක තනියම කරන්න හිතාගෙන එයාගෙ අදහසුත් අරගෙන අර මිනිහව ඈත් කරා කියලයි. ඉතිං මනෝරමා

මට බැන්නා. එයින් පස්සෙ දෙතුන් පාරක් දැක්කා. තරහෙන් අහක බැලුවා. ඉතිං ඒක මතක ඇතිනෙ. ඒ හින්ද මේකට කැමති වෙන එකක් නෑ." සාෂා මූණ මිර කර ගත්තා.

වර්ණාසි හිනා වුණා.

"ඔයා අම්මගෙ හැටි දන්නෙම නෑ. එයා තරහා වෙලා හිටිය හැම කෙනෙක් එක්කම ආයෙත් කතා කරනවා. හැම තරහ මිනිහෙකුටම හොඳ කෙනෙක් වෙන්න ඉඩක් දෙන්න ඕන කියලා මොරු කියනවා කොටවනවා කියලා දන්න ගැහියෙක් එක්ක ඉන්දියාවෙ යන්නත් ලෑස්ති වුණා. ආතම්මා බැන්නා අහක යන තයි රෙද්ද අස්සෙ ද ගන්නෙ මොකටද කියලා."

"මං හිතන්නෙ නෑ ඒ විදියට මාවත් පිළිගනියි කියලා. ඕනම අම්මෙක් තමන්ගෙ දුව ගැන තීරණ ගන්නකොට සෑහෙන්න ආත්මාර්ථකාමියි. සාම්ප්‍රදායිකයි."

"ඔයා බලන්නකෝ අපේ අම්මා එහෙම වෙන්නෙ නෑ."

"ඒ වුණාට මට නං එන්න බෑ එයාගෙන් බැනුං අහන්න."

"නැන්දම්මට ඔච්චරම බය වෙන්නෙ මොකට ද? ඔයා අපේ අම්මා ගැන හරියටම දන්නවා නං පුදුම වෙයි."

"අපි ඔය කතාව නවත්තමු. මට ඔළුව රිදෙනවා."

"ඔයා කිව්වට අහන්නෙ නෑ. තෙල් ටිකක්වත් දනවයැ."

සාෂා ඇස් පියා ගත්තා. වර්ණාසි ඔළුව අත ගෑවා. වර්ණාසි කලින් දවසක ගෙනත් එල්ලලා තිබුණ පිත්තල සීනු නුළගට හෙලවිලා සංගීත රටා මතු කළා.

"අම්මා අකැමැති උනත් අපි නොබැඳ ඉන්නෙ නැහේ. මං හෙට බැඳලා අනිද්දා අම්මට ටෙලිෆෝන් කරලා කිව්වත් අම්මා ඒක තේරුම් ගනීවි. ආතම්මට නං දුක හිතෙයි."

"ඔයාට එහෙම දෙයක් කරන්න පුළුවන් ද?"

"මොකද බැරි?"

"ඔය ඇත්තටම ද?"

"ඔව්..... අම්මා හිතයි මං එයාගෙ දුව කියලා. අම්මත් මගේ තාත්තා එක්ක එක ගෙදරක ඉඳලා තියෙන්නෙ කසාද බඳින්නෙත් නැතුවනෙ. ඉතිං එයා කොහොමද මට එපා කියන්නෙ."

"එහෙනං අපි හෙට බඳිමු." සාෂා ඇස් පියාගෙනම කිව්වා.

"නෑ..... අම්මට කියලා අම්මා අකමැති උනොත් බඳිමු. මට ආසයි ආතම්මා එයාට හිතවත් අයට කියලා සන්තෝෂ වෙනවා බලන්න."

"ඔහොම ගියොත් නං මේක කෙරෙන්නෙ නෑ. අම්මා ඔයාවත් අරගෙන යයි."

"එහෙම කොහොමද? ඔයා බඳින්න බැරි උනොත් මං වෙන කාවත් බඳින්නෙ නෑ. ආයෙ අම්මා එක්ක කතා කරන්නෙත් නෑ."

"එච්චරට හිත තද කර ගන්න එපා. අපි හෙට බඳිමු. අම්මා ආවම ඒක කියන්නෙ නැතුව අවසර ඉල්ලලා බලන්න. එයා කැමති උනොත් ආතම්මගෙ මගුල් මේසෙ අද ගන්න ලැබෙයි. අකමැති උනොත් ඔයා මෙහෙ ඇවිත් මාත් එක්ක ඉන්නවා. අම්මා ගියාට පස්සෙ අපි එහෙ ගිහිං ටික දවසක් ඉමු."

පොළොව දෙදරද්දී අම්මා එක්ක මේසෙ යට ඉන්න අතර වර්ණාසිට ඒ සේරම මතක් වෙලා අම්මා එක්ක තරහව වැඩි වෙන්න ගත්තා. සාෂා කියපු දේ හරිනෙ. අම්මා ලංකාවට ආ දවසෙම ආතම්මයි අම්මයි රෑ කෑම කාලා ආ ගිය තොරතුරු කතා කරමින් පිටිපස්සෙ ඉස්තෝප්පුවෙ බංකුවෙ වැඩිවෙලා හිටියා. වර්ණාසි කිතුල් පිටි තලප පිඟානකුත් ගෙනත් තියලා කෝපි ජෝගු දෙකකුත් ගෙනාවා. ආතම්මා කෝපි බොන්නෙ නැති හින්ද ආතම්මට උණු වතුර ගෙනත් තිබ්බා.

"පුතේ දූං ඉතිං ඔයා ආසා දේවල් කරානෙ. මං ඕස්ට්‍රේලියාවෙ යුනිවර්සිටි එකක් බැලුවා....."

වර්ණාසි අම්මාගෙ ඔළුව ඉඹලා පොඩි බංකුවක් තියාගෙන ආතම්මා ළඟ වාඩි වුණා.

"එහෙනං කැමතියි නේද?..... ඇති යන්තං" මනෝරමා සැනසුම් සුසුමක් හෙලුවා.

"නෑ අම්මෙ..... මං කලිනුත් කිව්වෙ.... මට පාඩං කරන්න බෑ. මට ඕන කසාද බැඳලා හොඳ ලස්සනට ගෙයක් තියාගෙන ළමයි ගොඩක් හදගෙන ඉන්න."

"ඔයා ඉගෙන ගෙන ඉවරවෙලා එහෙම ඉන්න."

"කවද හරි ළමයි බලාගෙන ගෙදර ඉන්න හිතාගෙන ඉන්න එකේ නිකං අම්මගෙ සල්ලිත් නාස්ති කරලා මගේ ඔළුවත් තරක් කර ගන්නෙ මොකට ද?"

ඒ පෙබරවාරි මාසයක් හින්ද ඉපල් ගැහිච්ච රබර් ගස් අතරෙන් හද පායමින් තිබුණා. ඒත් වර්ණාසිට අම්මගෙ මූණ පැහැදිලිව පෙනුණෙ නැහැ. අම්මා ආසා නැහැ ලයිට් දගෙන ඉන්න. එළිය වගේම අඳුරත් වින්දෙ නැත්තං රෑට දනෙන විවේක ගතිය හරියටම දනෙන්නෙ නෑ කියලයි එයා කියන්නෙ.

"හරි..... ඉතිං මගේ සල්ලි ඔයාට නැතුව කාට ද? එහෙම ඉගෙන ගන්නකොට ඔයාට ගැලපෙන කෙනෙකුත් මුණ ගැහෙයි.

"එහෙම කෙනෙක් මුණ ගැහිලා ඉන්නෙ."

මනෝරමාට විදුලි සැරයක් වැදුණා වගේ වුණා. දුම් දන කෝපි ටිකක් සුදු නිදි ගවුමටත් හැලුණා. ඒත් ජිනවතී ඉස්කෝලෙ හාමිනේ කලබල වුණේ නෑ. ටෙලිෆෝන් කතා වැඩි වෙනකොට පොඩි සැකයක් ඇති වෙලා තිබුණා. බත් මුල් හදගෙන කැවිලි හදගෙන යන එකත් කල්පනාවට නොගන්න ඉස්කෝලෙ හාමිනේගෙ කෙස් පැහුණෙ අකලට යැ. ඒත් මනෝරමා වගේ නෙවෙයි වර්ණාසි හොඳ කෙනෙක් හොයා ගනියි කියන විශ්වාසෙ හින්ද කලබල වුණේ නෑ. අනිත් එක මනෝරමා කිය කියා හිටියෙ කසාද බඳින්න ඕන කියලා නීතියක් නැහැනෙ කියලයි. ඒ හින්ද එයා නං කවදවත් දෝණියැන්දූට මගුලක් හොයන්නෙ නැති බව සීයට දෙසීයක් විශ්වාසයිනෙ. නමුත් එහෙම දෙයක් කතා කරනවටත් කැමති නොවෙන හින්ද ඔය පන්තිවලට යන එනකොට කවුරු හරි හැදිච්ච ඉගෙන ගත්තු කෙනෙක් මුණ ගැහුණොත් හොඳයි කියන ප්‍රාර්ථනාවත් ඉස්කෝලෙ හාමිනේගෙ හිතේ හැංගිලා තිබුණා. උපාධිධාරී ගුරුවරයෙක්, බැංකු නිලධාරියෙක් වගේ ගමට මාරුවක් අරගෙන රබර් වත්තත් බලාගෙන බිත්ත බහින්න පුළුවන්

කෙනෙක් ගැන [illegible] ඒක [illegible] පෙරේමට වගේ කියලත් තිබුණා.

"මොනවා කරන කෙනෙක් ද පුතේ?" ජීනවතී ඉස්කෝලෙ හාමිනේ ඇහුවා.

"අම්මා වගේ කෙනෙක්"

"ඒ කිව්වෙ?" ඒ ප්‍රශ්නෙත් ආතම්මාගෙන්

"එයත් උසාවි යන්නෙ නැති ලෝයර් කෙනෙක්. ඇමරිකාවෙදි භාග්‍යා එක්ක ගිය ගමනකදි අඳුන ගත්තෙ. දැං එයා ලංකාවට ඇවිත්."

"අනේ ඉතිං මෙච්චර දවස් අපිට කිව්වෙ නැත්තෙ ඇයි? එයා ඉගෙන ගත්තු මිනිහෙක් නං ඔයා ඉගෙන ගන්නවට කැමති ඇතිනෙ" මනෝරමා කතා කරේ අසතුටකින් නෙවෙයි.

"අම්මලාට කියන්න කලින් එයා මාව බඳින්න කැමතිද කියලා දැනගෙන එන්න එපායැ. එයා අහනකං හිටියා."

"දැං ඒ ළමයා ආපහු යන්න ද ඉන්නෙ?"

"නෑ..... ඉලෙක්ෂන් එකට වන්දිමට උදව් කරන්න ආවෙ. ඒ වුණාට දැං යන්නෙ නෑ. බැඳලා මෙහෙ ඉන්න කැමතියි."

"කොහේ කෙනෙක් ද පුතේ?" ජීනවතී ඉස්කෝලෙ හාමිනේ මිනිබිරිගෙ ඔළුව අත ගෑවා.

"එයාට කාත් කවුරුවත් නෑ. මාමා ළඟ හැදිලා තියෙන්නෙ. ඒ ගොල්ලො මැරිලා."

"ඉතිං කෝ පින්තූරයක්වත් නැද්ද අපිට බලන්න. එයාට හෙට මෙහෙ එන්න කියන්ඩකො." ජීනවතී ඉස්කෝලෙ හාමිනේ කිව්වා.

"යං කාමරේට.... පින්තූරයක් පෙන්නන්න."

ආතම්මයි අම්මයි කාමරේ ඇඳ උඩ ඉඳ ගත්තාම වර්ණයි අල්මාරිය ඇරලා සාෂා ලස්සනට හිනාවේගෙන ඉන්න ලොකු පින්තූරෙ අරගෙන ඇඳ උඩට දැම්මා. ඒක දැක්කම සාෂාගෙ නියම වයස පේන්නෙ නෑ.

"හොඳ පෙනුම තියෙන ළමයෙක්නෙ." ආතම්මා කණ්ණාඩි රාමුව දකුණු අතින් අල්ලගෙන පින්තූරෙට එබිලා බැලුවා.

මනෝරමා කතා නොකර හිටියා. පින්තූරෙ හොඳට දක්කත් අතට ගත්තෙ නැහැ.

"මේ ළමයගෙ නම මොකද්ද පුතේ?" ආතම්මා පින්තූරෙ අතටත් ගත්තා.

"නැමෝම කියන්නෙ සාෂා කියලයි. ඒ වුණාට එයාගෙ උප්පැන්නෙ තියෙන්නෙ සරත් ශාන්ත අතුරලිය කියලලු. මේ ළඟදි ඒක කිව්වෙ. මෙච්චර දවස් මං හිතාගෙන හිටියෙ ඇත්තම නම සාෂා කියලයි."

මනෝරමා වේගයෙන් නැගිට්ටා.

"පුතේ ඔය මිනිහා බොරුකරයෙක්. ඕක හරියන්නෙ නෑ." මනෝරමාගෙ ස්වරය හැඩුම්බර වෙලා තිබුණා.

"ඔව් එයා කිව්වා අම්මා කැමති වෙන එකක් නෑ කියලා." මනෝරමාගෙ ඇස් ලොකු වුණා. තොල් වෙව්ලුවා.

"ඒ ළමයව ඔයා දන්නවද?" ආතම්මා සන්සුන්ව ඇහුවා. මනෝරමා කතා කරේ නෑ.

"එයා කිව්වා එයාගෙ යාළුවෙක් කරපු දේකට අම්ම එයා ගැන වැරදියට හිතලා තරහෙන් හිටියෙ කියලා. මං කිව්වා අපේ අම්මා ඔය පරණ තරහාවල් හිතේ තියාගෙන ඉන්නෙ නෑ කියලා."

මනෝරමා කතා නොකර වහලා තිබුණු දොරත් ඇරගෙන ඉස්තෝප්පුවට ගියා.

"අම්මා අකමැතියි වගේනෙ." ආතම්මා පුදුමෙන් වගේ කිව්වා.

"හුඟාක් ඉස්සර එක තැනක වැඩ කරලා තියෙනවලු. එයා දැනගෙන හිටියෙ නෑ මං මනෝරමාගෙ දුව කියලා. මේ ළඟදියි මං කිව්වෙ."

"මේ පින්තූරෙ හැටියට වයස පේන්නෙ නෑ. ඒ උනාට හුඟාක් ඉස්සර ඔයාගෙ අම්මා පොඩි ළමයෙක් එක්ක තරහා වඳින්න විදියක් නැහැනෙ. දැං ඔය ළමයට වයස කීයක් විතර ඇද්ද?"

"හිස් ගාණේ... ඒකට කමක් නෑ. මං කැමති මට වැඩිය වයස මාව හොඳට බලාගන්න පුළුවන් කෙනෙකුට තමයි."

වර්ණසි උවමනාවෙන්ම වයස හරියට නොකියා මඟ ඇරිය බව ආතම්මට නොතේරෙන්න විදියක් නැහැනෙ. ඒත් ආතම්මා ඒක බල කරලා ඇහුවෙ නෑ. වර්ණසි ආයෙත් අම්මට කතා කරන්න ගියෙ නෑ. සානට "දෙයියන්න යමි." කියලා කෙටි පණිවිඩයක් යැව්වා. "දෙයියන්න මගෙ පැටියෝ" කියලා උත්තර ලැබුණා. උදේ වෙනකොට අම්මා හිනාවෙලා "කෝ ඔයාගෙ ආලවන්ත පුරුෂ රත්නෙට එන්න කියන්න." කියයි කියන බලාපොරොත්තුවෙන් වර්ණසි ඇඳට වැටුණා. අම්මා අකමැතියි කියන එක දන්වන්න ඉක්මන් වෙන්නෙ මොකට ද?

ඒත් පහුවෙනිද උදෙත් අම්මගෙ මූණෙ හිනාවක් තිබුණෙ නෑ. අම්මා නිදි වගේ හිටියට නිදි නැති බව තේරුණා. ආතම්මා වණ්ඩු ආප්ප හදමින් හිටියා. වර්ණසි හිමින් ඒ වැඹට [illegible]

"ඔන්න ගොටුකොළ [illegible] අම්මාටත් [illegible] තං" ආතම්මා ඉදල අරගෙන මිදුලට බහින ගමන් කිව්වා.

"අම්මා හොර නිදි. මැනා ගැන තාම හිත හද ගන්න බැරුව වගේ. දවල් වෙනකොට හරි යයි."

වර්ණසි වණ්ඩු ආප්ප හදන ගමන් හිතුවෙ සානා කම්මැලිකමට පාන්යි, බටරුයි, බිත්තරයි කනවා ඇති කියලයි. නිදි ගවුමට උඩින් අඳින ගවුම් සාක්කුවෙ ජංගමයා සින්දු කියන්න ගත්තා.

"සුබ උදෑසනක්. රෑට කතා කරමු." සානා පණිවිඩයක් එවලා.

"වණ්ඩු ආප්ප හදනවා. ඔයා මේ පැත්තෙන් යනවා නං දෙහිමිට [illegible] එකට අරගෙන එන්න ද?" උත්තරේ එහෙමයි.

"[illegible] අනිත් පැත්තෙන් [illegible] එන්න [illegible]"

"[illegible]

[illegible]"

"[illegible]

නැහැනෙ."

"ඔයාගෙ හිත [illegible] මලක් වගේ [illegible] ඉන්නෙ."

ඒකට සානා උත්තර බැන්දෙ ජංගමයෙ තිරේ වැටෙන්න ඉංග්‍රීසි එම් අකුරු ගොඩක් එවලයි. වර්ණසි තනියම හිනා වෙවී නැන්ද කොළේ කට තුණ්ඩ හරිවීයෙ කියලා ආප්ප මිලුණය දම්මා. ඊළඟට අම්මගෙ කෑද ජෝඩුවයි, හකුරුයි, වතුර වීදුරුවයි අරන් [illegible] මන්දේසියෙ තියාගෙන කාමරේට ගියා.

මනෝරම්මා කතා නැතුව කට හෝදලා කෑද බොන්න ගත්තෙ දුව දිහා බලන්නෙ නැතුවයි. දුව හිනාවෙවී කුස්සියට යන ගමන් ගබඩා කාමරේට එබිලා බැලුවා. දවස් දෙකකට කලින් යාන්තමට ඉදිලා තිබුණු පොඩි කෝලිකුට්ටු කැණ හොඳට කහපාට වෙලා. හැමදාම [illegible] එන මයිනෙක් වගේට ඇවිද ඇවිද හිටියා. ආතම්මා ඇවිත් [illegible] කියන කල් ඌ කැරකෙනවා.

ආතම්මයි [illegible] හිටියෙ මනෝරම්මා සානා ගැන කතා කරනකල්. ඒත් ඒක සිද්ධ වුණේ නැහැ. [illegible] යන්න ලෑස්ති වෙලා "මගේ පුතේ [illegible] ඔයාට ගැලපෙන්නෙ නෑ. [illegible] දන්න. මං දන්නවා ඔයා [illegible]. එකත් එයා ඔයාට වයස වැඩියි. අනිත් එක [illegible] දෙතුන් පාරක් බැඳලා ඇති." කියමින් හොඳටම ඇඬුවා. වර්ණසිට ඇඬුණේ නෑ. [illegible] කතා කරමින් [illegible] ආයාචනා කරද කියලා මතක් වෙවී [illegible] කියලා දුව [illegible] හිටියා.

"[illegible] බැඳලා හිටියෙ. [illegible] බැඳලා හිටිය [illegible]. [illegible] හිටියෙ නැති [illegible]. ඒත් මං දන්නවා [illegible]" [illegible] ආතම්මට [illegible] හිටියා.

වර්ණසි [illegible] මනෝරම්මා [illegible]

[illegible]

"අම්මෙ මට මේ අවුරුද්ද ඉවර වෙනකොට තමයි [illegible] වෙන්නෙ. ඊත් මේ ළමයා නිසා මට [illegible] යන්න තියෙයි."

"මං හිතන්නෙ, එයා දැං ඔය කරන්නෙයි කියලා. [illegible] කියලා බලන්නෙ. [illegible] කොහොමද?"

"අම්මා [illegible] ඉන්නෙ මං [illegible] කරනෙනත්. මං [illegible]"

"ඉතිං [illegible] කරන්නෙ නැත්ත?"

[illegible] අම්මාගෙයි [illegible] ඊත් [illegible] අම්මා උත්තර දුන්නෙ නෑ. ඇඳුරු අම්මා ඔය වගේ දේකට අඩන්න තිහිම හේතුවක් නැහැනෙ. [illegible] කරනවා නං අකැමැත්ත දියවෙලා යයි කියලා වර්ණසිටත් හිතුණා.

මහනුවරකට [illegible] යන්න වාහනෙත් ආවා. එයා නැම්දැම තනියමනෙ යන්නෙ. වර්ණසිට හොඳටම මීන වුණෙ අම්මා එක්ක [illegible] යන්න. යන ගමන් තැපැල් සියලෙට [illegible] යන්නයි කතාවෙලා තිබ්බෙ. එහෙකොටත් අම්මා එයාට [illegible] දිලයි ආවෙ. ඊත් ඒ වාහනේ [illegible] යන්න එන්නම් කියන්න වර්ණසිට හිත දුන්නෙ නෑ.

"මගේ පුතේ හදිස්සි වෙන්න එපා. ඔයාට අවුරුදු විසිපහක් වෙනකල් ඉවසන්න. එහෙකොට ඔයාට දැනට වඩා හොඳ තරහ හෝරනවනෙ. ඔය මිනිහා ඔයාට කැමති නං එයා එච්චර කල්

නරි මලාගෙන ඉඳිවිනෙ."

වර්ණසෙයි කිසි දෙයක් කිව්වෙ නැහැ. [illegible]

"ඔයා කිව්වා නරි... අපේ අම්මා [illegible] තැම්දෙම හොඳයි... මටයි තරහ. [illegible]"

"මං නරි [illegible] ඉන්නෙ. ඔයා තව ටිකක් හිතලා බලන්න. ඔයාට මං කියලා [illegible] මං කරනා වෙන්නෙ නෑ."

"ඔයා ඔය [illegible]"

"මං එහෙම කියන්නෙ ඔයාට තියෙන ආදරේට. මං ආසා නෑ කවද හරි ඔයාගෙ අම්මා මං ඔයාව රවට්ටලා ගත්තා කියනවට."

"අපි මැන්ද කියල දන ගත්තම අම්මා වෙනස් වෙයි. එයා ඔය ඇති මං අමාරුවෙ වැටෙයි කියලා."

"ඔයා අම්මට කිව්වද මං කවිද කියලා. මගෙ නම කිව්ව ද?"

"නමත් කියලා පින්තූරෙත් පෙන්නුවා."

"එතකොට මාව මතකයි කිව්ව ද?"

"ඔය මොනා මොනවද කිව්වා. කවිද ඔය පරණ කතා අහගෙන ඉන්නෙ. එයා අකමැති නං මට වෙන කරන්න දෙයක් නෑනෙ."

"අපි තව මාසයක් දෙකක් බලමු. ඔයා තව පාරක් කියන්නකො. මං ආසා නෑ මං නිසා ඔයාට අම්මාගෙ ආදරේ නැති වෙනවට."

"මං යම රජ්ජුරුවන්ට කතාද බැන්දත් එයා මට ආදරේ කරයි. කොහොමහරි උපාධියක් ගන්න මාව තල්ලු කරන්නත්

හදයි. අපිට කරදරයක් උනොත් සල්ලිත් දෙයි.

සාෂා මාස දෙකක් නෙවෙයි තුනක්ම බලාගෙන හිටියා. වර්ණාසි අම්මට දිග ඊමේල් එකකුත් යැව්වා. ඒත් අම්මා කිව්වෙ අවුරුදු විසි පහක් වෙනකල් ඉවසන්න කියලයි. අන්තිමට දෙන්නා බැන්ද, ආතම්මයි, තැපල් සීයලයි, සාෂාගෙ යාළුවො ටික දෙනෙකුයි ආවා. චන්දිම ගිරිගුඹුරයි සාෂාගෙ යාළු මන්ත්‍රී කෙනෙකුයි සාක්ෂියට අත්සන් කළා. අම්මට යවපු ඊ-මේල් එකට උත්තර ලැබුණා.

"ඕනැම වෙලාවක ඕනැම කරදරයකදි අම්මා ඔයා වෙනුවෙන් ඉන්නවා. ඔයාට ඉක්මණට හරි ප්‍රමාද වෙලා හරි ආයෙමත් ඉඟෙන ගන්න තනියම නැගී හිටින්න ඕන වෙයි. අම්මෙකුයි දුවෙකුයි අතර ගැඹුරු ආදරයක් මිසක් ලැජ්ජාවල් මදිපුංචිකම් නෑ."

සාෂා ගැන වචනයක්වත් සඳහන් නොකර ඒ කියලා තිබුණෙ මගුල කඩාගෙන එන කල් බලා ඉන්නවා කියන එක ද? වර්ණාසි අම්මට උත්තර යැව්වෙ නැහැ. ඒ අතින් ආතම්මා කොච්චර හොඳ ද? චන්දිමලා මුල්වෙල පටන් ගත්තු රාජ්‍ය නොවන සංවිධානයක් සාෂාට අධ්‍යක්ෂ තනතුරක් දුන්නා. එයාගෙ පඩිය කීයද කියලා වර්ණාසි ඇහුවෙ නෑ. ඒත් ඒ ගොල්ලන්ට බැනපු පත්තරේක තිබුණා ලක්ෂ එකහමාරක පඩියකුත් කාර් එකකුත් තව දීමනාත් ලැබෙනවා කියලා.

"ඔයාගෙ වාසනාව තමයි. ඔයා ආසා විදියටම ගෙදරට වෙලා දරුවො හදගෙන ඉන්න පුළුවනි." කියලා ආතම්මා කිව්වා.

සාෂාට හුඟාක් වැඩ තිබුණු හින්ද හැම සුමානෙම ආතම්මා බලන්න යන්න එයාට බැරි වුණත් වර්ණාසිට කාර් එකයි රියදුරයි ලැබුණා හිතුණ ගමන් ගමේ යන්න. ආතම්මට යන්න ආසා තැන්වලටත් එක්කන් ගියා.

සාෂා ගෙදරින් පිට වුණාට පස්සෙ මොනවා කරනවද කියලා දැන ගන්න වර්ණාසිට ඕන වුණේ නෑ. උදේට මූණ ඉඹලා "ඔයා මගේ ජීවිතේට සැනසිල්ල දුන්නා. චන්දිමටවත් ගෙදරින් මට වගේ සහනයක් නෑ. මං රෑට ගෙදර එන්නෙ ආශ්‍රමයකට එනවා වගේ හිතකින්." කියලා කියන මිනිහා ගැනනෙ මනෝරම්‍යා සැක හිතුවෙ.

පිටරට යනකොට ඇඳුම් ටික අහුරලා සුදුසු තැගි බෝග දලා

දුන්නම "මේකෙ බෝම්බ හෙම නෑ නේද? බේත් ගුලි අරවා මේවගෙ ගංජා තිබුණොත් හෙම ඔන්න මං ඉවරයි." කියලා විහිළු කරනවා.

ගුවන් තොටුපළේ දි "දං වෙලාව හරි මැණික. පරිස්සමින් ඉන්න." කියලා කතා කරලා තමයි යන්නෙ. ගිය තැනකදි ඉස්සෙල්ලම කරන්නෙ "මං කරදරයක් නැතුව ආවා" කියන එකයි. කොයි තරම් ලොකු වැඩකට ගියත් රෑට කතා කරන්නෙ නැතුව නිදා ගන්නෙ නෑ.

ඒ සේරම අම්මට ඇහෙන්න දකින්න ලැබුණම අම්මත් ආතම්මා වගේම "මෙහෙම බෑනා කෙනෙක් ලබන්න පින් කරන්න ඕන" කියලා කියන තුරු වර්ණාසි බලාගෙන හිටියා.

ඒත් අම්මා ලංකාවට එනකොට කලින් දැනුම් දුන්නෙ නෑ. කර් එකක් එවන්නං කියලා කියද්දිත් කටුනායකට කොටි ප්‍රහාරයක් එල්ල වෙලා තියෙද්දිත් මනෝරම්‍යා නෙවෙයි දුවගෙන් උදව් ඉල්ලුවෙ. තැපැල් සීයලගෙ ගෙදරට ගිහින් පිටපාරෙම ගමේ ගියා. සමහර වෙලාවට ආතම්මා එක්ක නුවර හරි අනුරාධපුරේ හරි හොඳ හෝටලෙක නවතින්න යන්න වර්ණාසිටත් කතා කළා.

"මට සාෂා දාලා එන්න බෑ. එයා නං මට ඕන තැනක යන්න දෙනවා. ඒ උනාට ශ්‍රී මහා බෝධියට යන්න ඕන එයා එක්කනෙ." වර්ණාසි අම්මට රිද්දනවා.

"කමක් නෑ පුතේ. මගේ අම්මා තව කොච්චර කල් ඉදියි ද දන්නවයැ. මට පුළුවන් වෙලාවට මගෙ අම්මව සන්තෝසෙන් තියන්න ඕන. අම්මට ඉතිං එයාගෙ දුවයි මිනිබිරියි එක්ක වන්දනාවෙ යනවා වගේ සතුටක් කොහෙන් ද?"

මනෝරම්‍යා දුවට රිද්දනවා.

ඒ කතාවලින් පස්සෙ අම්මා අඬනවා කියලා ආතම්මා වර්ණාසිට කිව්වා. ඒත් වර්ණාසි ඇඬුවෙ නෑ. හිත තද කර ගත්තා. කවද හරි දරුවෙක් ලැබුණු දවසට මනෝරම්‍යා වෙනස් වෙයි කියලා තැපැල් සීයලයි, ආතම්මයි, සාෂායි කිව්වා.

එද පොළොව දෙදරන වෙලාවෙ වර්ණාසිට හිතුණෙ සාෂාට දරුවෙක් දීලා මැරුණත් කමක් නෑ කියලයි. ඊට වැඩිය ලොකු තෑග්ගක් නැහැනෙ.

"ඔයාගෙ දරු පැටියෙක්ගෙ මූණ බලලා මැරෙන්න ඕන" කියලා ආතම්මා කිය කියා හිටියෙ.

ඒ වුණාට ආතම්මා නැති වුණේ සිල් අරගෙන ඉන්නකොට පන්සලේදිමයි. හොඳ වෙලාවට මනෝරම්‍යා තිවාඩුවට ඇවිත් හිටියා.

"ජිනවති ඉස්කෝලෙ හාමිනේට වගේ වාසනාවන්ත මරණයක් ලැබෙන්න පිනක් තියෙන්නෙ එහෙමත් කෙනෙකුටයි." කියලා ගමේ හැමෝම කිව්වා.

සාෂා තෝර්වේ ගිහින් හිටියෙ. දන්නපු ගමන් එයා වහාම ආපහු එනවා කිව්වා. ඒත් ඒ වෙනුවෙන් දවස් දෙකක් තුනක් මිනිය තියා ගන්න මනෝරම්‍යා කැමති වුණේ නෑ.

"මැරුණට පස්සෙ පැය විසි හතරක්වත් තියා ගන්න ඕන නෑ. මරණ පරීක්ෂණේ ඉවර වෙච්ච ගමන් ආදාහනේ කරන්න ඕන. මේ ඊයෙ පෙරේද අඳුන ගත්තු මිනිහෙක් එන කල් මේක පරක්කු කරන්න මොන පිස්සුවකට ද? චිතකෙට පැනලා ආතම්ම වෙනුවෙන් ජීවිතේ පූජා කරන්න තෙම කවුරුවත් නෑනේ."

මනෝරම්‍යා තැපැල් සීයාට කියපු දේ වර්ෂාසිට ඇහුණා. සාෂා එනකල් ඉමු කියලා අම්මට කියන්න කියලා තැපැල් සීයට කිව්වෙත් වර්ෂාසිමයි.

"ඔයා ගිය වැඩේ ඉවර කරගෙන එන්න. මහ රජන කියනවා වහාම ආදාහනය කරනවා කියලා." වර්ෂාසි ස්වාමි පුරුෂයාට කෙටි පණිවිඩයක් යැව්වා.

"දුකයි. ආතම්මා මට නොලැබුණු අම්මයි ආතම්මයි දෙන්නම වගෙයි." සාෂා උත්තර එව්වා.

සාෂා එනකොට හත් දවසෙ බණත් ඉවරයි. හැමෝම ඇහුවා "කෝ මහත්තයා" කියලා. හොඳ වෙලාවට එයා නෝර්වේ ගිය බව පත්තරවලත් තිබුණා. ගම්වල මිනිස්සුනෙ. මහත්තයා තරහාවෙලා කියලානෙ හිතන්නෙ.

එද ඉඳලා භූමිකම්පාව වෙනකල් කොච්චර කාලයක් ගියා ද? පිටත මහ ගස් වැටෙනකොට හොඳට හයියට හදපු ගේ

දෙදරනකොටවත් මනෝරම්‍යාගෙ හිත වෙනස් වෙයි කියලා වර්ෂාසිට හිතුණා.

මරණය අත ළඟටම ආ නිසා සේරම තරහාවල් ඉවර කර ගන්න ඕන කියන එක කල්පනා නොවී තියෙන්න බැහැනෙ. ඒත් මනෝරම්‍යාගෙ හිතේ මොනවා තියෙනවද කියලා කව්ද දන්නෙ?

"මනෝරම්‍යා මැඩම් නං මැරුණට පස්සෙත් අපේ ගේට්ටුව ළඟ බලාගෙන ඉඳියි මං ඔයාව අත අරිනකල්" කියලා දවසක් සාෂා කිව්වා.

වර්ෂාසිටත් ඕන වුණා "ඇත්තටම ඇයි අම්මෙ තාමත් සාෂාව පිළිගන්න බැරි? කියලා අහන්න. ඒත් ඒක අම්මයි දුවයි අතර තහනම් වචනෙ බවට පත්වෙලා තියෙද්දි භූමිකම්පාවකදිවත් ඒ මාතෘකාව මතු කරන්නෙ කොහොම ද?

වර්ෂාසි හිතට ධෛර්ය ගත්තා.

"අම්මෙ"

"ආ..... මං හිතුවෙ බබාව නින්ද ගිහින් කියලා."

"මං බබෙක් නෙවෙයිනෙ."

"ඔයාට අවුරුදු පනහක් වුණත් මට ඔයා බබා තමයි. ආතම්මා හිටියා නං එයත් අපි දෙන්නා ගැනම එහෙම හිතයි."

රහස් ස්වරයෙන් කතා කිරීමේ උවමනාවක් තිබුණෙ නැතත් දෙන්නම කතා කළේ ගෙට හෝරු ඇවිත් වගේ රහසෙන්. භූමිකම්පාව ඇති කරවන මහා භූතයෙක් ගෙට රිංගලා "කෝ මේ ගෙදර මනුස්ස ගඳයි...." කිය කියා ගේ හොල්ලලා බිම දන්න හදනකොට හැංගිලා ඉන්න ළමයි දෙන්නෙක් වගේ හැඟුණේ ඇයි කියලා දෙන්නම දැනගෙන හිටියෙ නෑ. වර්ෂාසි පුංචි කාලෙ මනෝරම්‍යා එහෙම කතාවක් නං කියලා දීලා තිබුණා. ඒත් සැරින් සැරේ පොළොව කම්පා වෙන හින්ද පළවෙනි චලනයේදි දැනුණට වඩා බයක් ගේ ඇතුළෙ කැරකෙන්න ගත්තා.

"මේක තව කොච්චර වෙලා තියෙයි ද?"

"මේක ටිකක් තද එකක් වගෙයි. නැත්තං ටික වෙලාවකින්

ඉවරයිනෙ. සමහර විට එළියෙ ගෙවල් කැඩිලා, ලයිට් කනු වැටිලා ඇති. මට හිතෙනවා පිටිපස්සෙ තාප්පෙ වැටෙන්න ඇති කියලා.

"එහෙනං ඉස්සරහා තාප්පෙත් වැටිලා ද දන්නෙ නෑ." වර්ණාසිට ඕන වුණා පුංචි කාලෙ වගේ කතා කරන්න. එතකොටනෙ අම්මාටත් විවෘත වෙන්න පුළුවන්.

මනෝරම්‍යාටත් ඕන වුණා දුව එක්ක ගමේ මහ ගෙදරදි වගේ සාෂා කඩා වැදෙන්න කලින් වගේ කතා කරන්න. සමහර විට ආඩම්බරකමට එච්චර කල් නොකියා හිටිය දුකක් බෙද ගන්න දුවට හිතෙන්නත් ඉඩ තියෙනවා. ලෝකෙ හොඳම මිනිහා ලැබුණා වගේ හිටියට සුරංගනා කතා වගේ "ඊට පස්සෙ ඒ දෙන්නා හැමදම සන්තෝසෙන් හිටියා." කියලා අවසාන වෙන කතා කොහෙත්ද හැබෑ ජීවිතේට? එක පාරක් සුනාමියක් ඇවිත් අහිංසක මිනිස්සුන්ගෙ වගේම ධනිය ගෝපාලලා කී දෙනෙක්ගෙ ජීවිත වෙනස් කරා ද? මනෝරම්‍යාට හිතුණා දුවත් එක්ක මිදුලට ගිහින් බලන්න.

"අපි එළියට යමු ද? දැං වැස්ස ඉවරයි වගේ"

"යං..... දැං හෙල්ලෙන්නෙත් නැතේ."

අම්මයි දුවයි මේසේ යටින් පිටතට ආවම දූවිලි නැවුණා. බිත්ති පුපුරල ද නැත්තං වීදුරු කැඩුණ ජනේල වලින් ආ දූවිලිද කියලා දෙන්නටම හිතා ගන්න බැරි වුණා. ඒත් ඉක්මනින් එළිමහන් තැනකට යන්න ඕන කියන එක තදින් දැනුණා. සීතල හුළඟ ගෙට පැන්නෙ ජනේලවලින් විතරක් නෙවෙයි ඉස්සරහා දොරත් කඩාගෙන කියලා තේරුණේ ඒ වෙලාවෙයි.

අම්මයි දුවයි මේසෙ යටින් එළියට ආවෙ බිමට එළපු රෙද්දවත් ගන්නෙ නැතුවයි. මනෝරම්‍යාට නං ගන්න තිබුණෙ එයාගෙ ගෙදර යතුරයි, සල්ලි ටිකකුයි, හැඳුනුම්පතයි විතරක් වුණත් ඒක හොයා ගන්න පරක්කු වෙන්න බැරි ගතියක් දැනෙන්න ගත්තා. ඇගේ හරි ඇඳුමක් නෑ නේද කියන එක වර්ණාසිට මතක් නොවුණත් මනෝරම්‍යාට ඒකත් කල්පනා වුණා. මේසෙ යට ඉන්නවට වඩා අනාරක්ෂිත ගතියක් දැනෙමින් හැම සද්දයක්ම, හැම හුළං පොදක්ම විලාපයක් වගේ දැනුණා. කවුරු හරි විලාප තියනවත්, බල්ලො උඩු බුරණවත්, ළමයි අඩනවත් ඇත්තට ම

ඇහුණ ද නැත්තං හුළඟ ඒ සද්ද මවලා ද කියලා හිතා ගන්න බැරි වුණා.

මනෝරම්‍යා ආපහු හැරිලා මේසෙ යටින් බිම අතුරපු ඇද රෙද්ද ගන්න හැදුවෙ හරියට ඇඳුම් නැතුව අම්මගෙ සායකුයි හැට්ටෙකුයි ඇඳගෙන හිටි දුවගෙ ඇඟ වැහෙන්න දන්නයි. තමන් හිටියෙත් නිදි ගවුම පිටින් බව නං අමතක වුණා. මනෝරම්‍යා නැවුණම බිමට ලිස්සලා තිබුණු බිරලු රේන්ද අල්ලපු සුදු මේස රෙද්ද අහු වුණා. ඒක වර්ණාසිගෙ ඇඟට දනකොටත් ගේ ඇතුළෙ කිරි කිරි ගෑවා. අම්මයි දුවයි කැඩිලා වැටිලා තිබුණු දොර පලුව උඩින් මිදුලට පැන ගත්තෙ සෙරෙප්පුත් නැතුවයි.

මිදුලෙන් කොහාටවත් යන්න බැරි විදියට හැම අතටම ගස් වැටිලා. කුරුළු කූඩුවක් තිබුණු ගෙඩි පිරුණු දෙහි ගහත් බිම. මනෝරම්‍යාගෙ නිදි ගවුම දෙහි කටුවල පැටලුණා. ඒක ගලව ගන්න හදනකොට අත් හීරුණා.

"අනේ ගවුම දෙහි අත්තක පැටලිලා... මං ගැන බලන්න එපා. ඔයා කොහොම හරි පිට්ටනියට යන්න. එතකොට කවුරු හරි බේර ගනියි." කියලා අම්මා කිව්වට දුව අම්මා අත ඇරලා දිව්වෙ නෑ.

"මැරුණත් මං අම්මා දලා යන්නෙ නෑ." කියලා වර්ණාසි අම්මගෙ නිදි ගවුමෙ පැත්තක් ඉරලා අම්මාවත් අල්ලගෙන ගස් අතු අතරින් ගේට්ටුව ළඟට යන්න හැදුවා. ආයෙමත් පොළොව දෙදරුවා. ඒ පාර කලින්ට වඩා සැර දෙදරීමක්. දෙන්නම බිම වැටුණු අඹ ගහේ අතු අතරට වැටුණා. හරියට කවුරු හරි පද්දනවා වගේ බිම වැටුණු අඹ අතු උස් පාත් වෙනකොට අම්මයි දුවයි උස් පාත් වුණා. අත් කකුල් හීරුණත් ඒ වෙලාවෙ හැටියට ඒවා දැනුණෙ නැහැ. හරියට මහ කැලේක අතරමං වෙලා වගෙයි.

ගෙවල් කඩා වැටෙන සද්ද ඇහුණෙ ගල් බෝර දලා පුපුරනවා වගෙයි. කලාගාරයක් වගේ තරු පන්තියෙ හෝටලයක කොටසක් වගේ සාෂා ලස්සනට හදවපු තට්ටු දෙකේ ගේ කඩාගෙන වැටුණෙ අම්මයි දුවයි හිටිය තැනටත් ගඩොල්, කළු ගල්, බිත්ති පදස විසි වෙද්දියි. අම්මා දුවව පුංචි කාලෙ වගේ තුරුළු කරගෙන අඹ අතු

අතර හැංගෙන්න හැදුවා. අඹ අතු නිසා එක විදියක ආරක්ෂාවක් තිබුණා. එහෙත් මෙහෙන් වැටෙන දේවල් අතුවල වැදිලා ඒවයෙ වේගය බාල වුණා.

ගස් අතුත් පොළොවත් තෙත් වෙලා තිබුණට අඹ ගහේ තෙත කඳ බදාගෙන මඩවෙලා තිබුණු පොළොවෙ එරිලා ඉන්නවා ඇර වෙන කරන්න දෙයක් නෑ කියලා වර්ණාසිට හිතුණා.

"මගේ පුතේ මං ඔයාව උස්සගෙන හරි පිට්ටනියට යනවා. ඔයා බය වෙන්න එපා." මනෝරමා එහෙම කිව්වට පිට්ටනියක් පාරක් ඉතුරුවෙලා තියෙනවද කියන ප්‍රශ්නෙත් හිතට ආවා.

කාගෙද දන්නෙ නැති බල්ලෙක් බුරමින් හිටියෙ ගේට්ටුව හරියෙද කොහෙද. දිශාවල් හොයා ගන්න බැරි තරමට මහ විශාල ගෙවල් බිමට පාත් වෙද්දි බල්ලා බේරිලා එන්න ඇති. අම්මයි දූවයි ලෙස්සමින්, බඩ ගාමින් ගේට්ටුව තිබුණු පැත්තට ගියාට ගේට්ටුවක්වත් ගල් තාප්පෙවත් ඉතුරුවෙලා තිබුණෙ නැහැ. කාගෙ හරි ඇස්බැස්ටෝස් වහලයක් තාර පාර තිබිය යුතු තැන තිබුණා. හැමතැනම වතුර තිබුණෙ බටයක් පුපුරලද වැහි වතුර එකතුවෙලා ද කියලා හිතා ගන්න බෑ. කවුරු හරි ටෝච් එළියක් විහිදෙව්වා අම්මයි දූවයි ගල්වෙලා නැවතුණා. පපුව ළඟට සරමක් ඇඳපු මිනිහෙක් කැඩිච්ච ගෙයක් ළඟින් මතු වුණා.

"ඔහොම පරෙස්සමෙන් අඩිය තියලා මෙහාට එන්න."

මිනිහා ඒ අහල පහළ කෙනෙක් ද කියල දන්න නැහැනෙ. කඩේ මුදලාලිත්, උදේම පාරේ ඇවිදින දූවන අයත් ඇර අනික් මිනිස්සු ගැන දෙන්නට ම කල්පනාවක් තිබුණෙ නෑ. ඉස්සරහා ගෙදර බලකොටුවක් වගේ තාප්ප මැද තියෙන හින්ද කවුරුවත් කාව්වත් අඳුනනවයෑ.

"බයවෙන්න එපා... මං හමුදාවෙ හිටිය කෙනෙක්. මගේ එක කකුලක් නෑ. නැත්තං තුවාල කාරයෙක් උස්සන් යන්න හරි තිබුණා." හාදුරණ මිනිහා හයියෙන් කතා කරේ වටේටම විදුලි පන්දම එල්ල කරමින්.

මනෝරමාට බය හිතුණෙ සුනාමියෙ දී වෙච්චි දේවල් මතක් වෙලා. පොළොව තෙත උනත් හුළඟත් එක්ක දූවිලි

වළාකුලක් ආවා.

"ඔය චේන් එක ගලවලා සායේ පොකට් එකට දා ගන්න." මනෝරමා රහසෙන් කිව්වා.

ඒ වෙනකොට මඩ ගෑවිලා පෙඟිලා තිබිච්ච මේස රෙද්දට දූවගෙ ඔළුව හොඳට වැහිලද කියලා බලලා තමයි මනෝරමා කතා කරේ.

"පිට්ටනියට යා ගන්න විදියක් නැද්ද?"

"ඒක තමයි මාත් බැලුවෙ. වටෙන් යන්නෙ නැතුව ඉස්සරහා ගෙදර වත්තෙන් ගිහින් පැන ගත්තොත් ලේසියි. ඒ පැත්තෙ තාප්පෙත් කැඩිලා ඇති."

තවත් කොට කලිසංකාරයෙක් කොහෙන්ද මතු වුණා. දම්වැලක් පිටින්ම ආපු බල්ලෙක් වර්ණාසි ළඟට ඇවිත් කෙඳිරි ගෑවා. තමුන්ගෙ ගේ කැඩිලා නං මිනිස්සරුයි රුව්රාතියි බයවෙලා ඇති කියලා කියවුණා වගේ දැනුණත් මනෝරමාට වචන පිට කරන්න බැරිවෙන තරමට තනියට දූවිලි ගියා. අම්මයි දූවයි කහින්න ගත්තා.

"කවුරුවත් ඉන්නවා නං එන්ඩෝ" කකුලකුත් නෑ කියපු මිනිහා හයියෙන් කෑ ගැහුවා.

"ඔය දෙන්නා ටෝච් එක අරං ඉස්සර වෙනව ද... අපිත් ඒ පස්සෙන් එන්නං." මනෝරමා කිව්වා.

ගේ කඩා වැටුණත් ඉතිරි වෙච්චි පෝටිකෝවක් යට කාර් එකක් තිබුණා. හමුදාවෙ හිටිය මිනිහා ඒ කාර් එකට මොකකින් හරි ගහලා දොර ඇර ගත්තා. හැම පැත්තෙන්ම සුන්බුන් හින්ද කාර් එකකින් මොනවා කරන්ඩ ද? මනෝරමාගෙ ඇඟ සීතල වුණේ සුනාමි කතන්දර ඔලුවට එන්න ගත්තු නිසයි.

"මේ සරම්ප ලෙඩෙකුත් එක්කයි ඉන්නෙ."

අම්මා මොනවා කියනව ද කියලා වර්ණාසිට තේරුණේ නෑ. සරම්ප ලෙඩෙක් ගැන කියවන්නේ වෙලා තියෙන දේ දකලා අම්මගෙ ඔලුව නරක් වෙලා ද?

"අම්මේ... මේ මං ළඟ ඉන්නවා." වර්ණාසි අම්මගෙ අත තද කරලා අල්ල ගත්තා.

"ඔයාට බෝවෙන ලෙඩක් වගේ ඉන්ඩ." අම්මා රහසෙන් කිව්වා. තව ගැනු මිනිස්සු එහෙන් මෙහෙන් මතු වුණා. දෙර ඇර ගත්තු කාර් එකේ ලයිට් පත්තු වුණා. එක යායට සුන්බුන් විතරයි. ළමයි අඬනවා ඇහුණා.

"පුතේ ඔයාව පිට්ටනියට දලා මං ආපහු එන්ඩ ඕන. මේ ළමයි අඬනවා." මනෝරමාට කියවුණා.

"මේක මේ පැත්තට විතර නං දැං ආමි එකෙන් එයාර් ෆෝර්ස් එකෙන් එයි. හැම තැනට ම පැතිරිලා නං ඉන්දියාවෙන් හරි කොහෙන් හරි එනකල් ඉන්ඩ වෙයි." සරම්කාරයා කිව්වා.

"දැං පිට්ටනියට ගියත් එතන වල වගේ හින්ද වතුර පිරිලා ද දන්නෙ නෑ." කවුරු හරි ගෑනු මනුෙනක් ඉංග්‍රීසියෙන් කියනවා ඇහුණා.

හැමෝම සුන්බුන් අතරින් පිට්ටනිය පැත්තට යන්න බැලුවා. කතුලක් නෑ කිව්වට හමුදවෙ හිටිය කෙනා ඉස්සර වුණා.

වර්ණාසිලගෙ ගෙදරට ඉස්සරහා ගෙදර පැත්තක් කඩා වැටිලා කොළපාට ටයිල් අල්ලපු නාන කාමරයක් නිරාවරණය වෙලා. ඒ ගෙදර මිනිස්සු යට වෙලා ද? කවුරු හරි කෙඳිරි ගානවා ඇහුණා.

"අනේ මේ කවුරු හරි කෙඳිරි ගානවා. පොඩ්ඩක් බැලුවා නං" වර්ණාසි කෑ ගැහුවා.

කාටත් එහෙම නැවති නැවති බලන්න ඉස්පාසුවක් තිබුණෙ නෑ. ආයෙත් පොළොව දෙදරලා බිත්තියකට, තාප්පෙකට යට වෙයි කියන බය හැමෝටම තිබුණා.

මිනිස්සු, ගෑණු, ළමයි, බල්ලො, බළල්ලු හැමෝම හොඳටම මඩවෙලා තිබුණු පිට්ටනියට එකතු වුණා. පිරිමි කැඩුණු ගස් දෙකකට පෙට්‍රල් දලා ගිනි ගොඩක් ගැහුවා.

"මම කර්නල් සුභාෂ්. දැං කවුරුවත් කලබල වෙන්ඩ එපා. එළිය වැටෙන්න ළඟයිනෙ. ඉක්මනට කොහෙන් හරි උදව් ලැබෙයි. දැං මේ වටේට තියෙන ගෙවල්වලින් බේරිච්ච අය එන්න. ඉටිරෙදි,

සුණන්, පුටු, මෙට්ට ඔය ගේන්න පුළුවන් දේවල් හොයාගෙන ඇවිත් ළමයි, වයස අය වාඩි කරවන්න ඕන. මෙතන ඉන්න අය මෙ ගින්න පැතිරෙන්න දෙන්න එපා."

මුලින්ම දැකපු මිනිහා නායකත්වය අරගෙන තිබුණා. මනෝරමාායි වර්ණාසියි බදාගෙන හිටියා. ගිනිගොඩේ එළිය හොඳට විහිදිච්ච නිසා දූහුල් නිදි ගවුම පිටින් හිටිය ගෑනු කළුවරට මුවා වෙන්න බැලුවා.

නැගෙනහිර පැත්තෙන් ඊතලයක් විද්ද වගේ අළු පාට අහස පළාගෙන රන්වන් ආලෝක ඉරක් මතු වුණා. ඒක හැම තැනම පැතිරෙන්න වැඩි වෙලාවක් ගියෙ නෑ. පිරිමි මඩ කඩිති අතරින් ඇවිදිමින් මෙට්ට, කැඩිච්ච දෙරවල්, බේරිච්ච පුටු කෑලි හෙම පිට්ටනියට ගෙනත් දපු නිසා ගෑනු උදවිය වාඩි වුණා.

"ගෙවල්වල හිර වෙච්චි අය බේරගන්න ඕන. මෙතන ඉඳගෙන ඉඳලා හරියනවයැ." කැඩුණු සිමෙන්ති පඩියක් උඩ කැඩිච්ච ලී පුටුවක පත්තක් දාගෙන වාඩි වෙලා හිටි මනෝරමාට එහෙම නිකං බලාගෙන ඉන්න බැරි වුණා.

"පිස්සුද ..... මෙ ගවුමත් ඉරිලා." වර්ණාසි අම්මගෙ අත තද කරලා නැවැත්තුවා.

"මේ වෙලාවෙ කවුද මගේ ගවුම ඉරිල ද මඩ ගෑවිල ද බලන්නෙ? මනුස්ස ජීවිතයක් කියන්නෙ එහෙමයැ."

"එහෙනං මාත් එනවා. නැත්තං ඔය කොහේ හරි බිත්තියකට යට වුණත් මං දන්නෙ නැතෙ."

"නෑ.... නෑ.... ඔයාට ඕවාට හයියක් නෑ බබා."

"එහෙම වෙන්නෙ කොහොමද.... මං මනෝරමාාගෙ දුව නෙවෙයි ද?" අම්මයි දුවයි වාද කරන අතර ඉන්දියානු හෙලිකොප්ටර් අහසෙ රවුම ගැහුවා. රතු තලප්පා බැඳපු සීක් ජාතික සෙබළු වතුර බෝතලයි, විස්කෝතු පෙට්ටියි බිමට දැම්මා."

"දැං කවුරුත් පොර කන්න එපා. හැමෝටම හැම දෙයක්ම සමානව බෙදනවා" කියලා කර්නල් සුභාෂ් කෑ ගැහුවා. එයා ඉන්දියානු සෙබළුන්ට අතින් සංඥා කළා.

"කුමාලකාරයො ඉන්නවා කියනවා වෙන්න ඇති." කියලා මනෝරමා කිව්වා.

හොඳටම නියඟෙත් තිබ්බත් මනෝරමා වතුර බෙදන්න බුද්ධිමත් වුණේ ඒ ගැන කතාවෙන නැතුවයි. අන්තිමට තමන්ටත් වතුර බෝතලයක් ගන්න පුළුවන් තැනට ආවාම මූඩිය ගලවලා බෝතලේ දුවට පෑවා.

"මං බිව්වා. අම්මා බීලා ඉන්න."

වර්ණාසිට ගෙයින් පිටව ආවට පස්සෙ සාපා මතක් වුණේ ඒ වෙලාවෙ තමයි. ගෙවුණු අවුරුදු හතටම එහෙම දෙයක් වෙලා තිබුණෙ නෑ. වචන වලින් නොකිවුවත් හැම මොහොතෙම සාපා හිතේ හිටියා. හැමදේම සිද්ධ වුණේ එයා වෙනුවෙන් මිසක් තමන් වෙනුවෙන් නොවෙයිනෙ. ඒත් මිදුලෙ ඉඳලා පිට්ටනියට එන අතරතුර අම්මා එක්ක තිබුණු කතාවල් සේරම පොළොවට බිඳිලා ගියා වගේ වුණා. වර්ණාසිට කතා කරන්න බැරුව ගියා.

මනෝරමා සාගෙද කිරි දෙන්නෙක් හොයාගෙන ඇවිත් වර්ණාසිට දුන්නා උණුසුමට තුරුළු කරගෙන ඉන්න කියලා.

"කිරිදෙන අම්මා කෙනෙක් ඉන්නවා නං මේ දරුවට කිරි ටිකක් දෙන්න" කියලා හයියෙන් කිව්වා.

ඒත් එහෙම කෙනෙක් හිටියෙ නෑ. දරුවා කට උල් කරගෙන වර්ණාසිගෙ තන පුඩු හෙව්වා. වර්ණාසි බෝතල් මූඩියෙන් දරුවට වතුර පෙව්වා. සමහරු ආපහු තමන්ගෙ ගෙවල් ඉසව්වට ගිහින් පවුල්වල අය හොයන්න ගත්තා. සමහරු ඇස් ලොකු කරගෙන සුසුම් හෙලමින් කෙඳිරි ගාමින් හිටියා. තම තමන්ගෙ පවුල්වල අය එක්කවත් කතා කරන්න බැරි තරමට ගොළු වෙච්ච ගතියක් තිබුණා.

"මෙහෙම නිකං වාඩිවෙලා ඉන්නෙ නැතුව මොනවා හරි කරන්න ඕන." මනෝරමා නං තනියම කියවමින් වට පිට බැලුවා.

ඒත් මොනවා කියලා කරන්න ද? දවල් වෙනකොට අව්ව සැරවෙයි කියලා හෙවනට ඉන්න තැන් හදන්න යෑ. කලින් රාත්‍රියෙ පොළොව කම්පා වෙනකොට දෝරෙ ගලන්න අඬපු අහස වළාකුළු

නැති වෙලා තිලට තිලේ බැබලෙන්න ගත්තා.

"අපි ගිහිං බලමු මගේ ගේවත් ඉතුරු වෙලා ද කියලා. මායාත් පේන්න නැත්තෙ එයා ගෙදර වෙන්නැති."

මනෝරමා පිට්ටනිය අද්දර තාප්පයක් කැඩුණු තැනකින් ඇත්තා. වර්ණාසිත් අම්මා පස්සෙන් වැටුණා. දරුවා ඇඹිලි උරමින් හිටියා. එක ගෙදරක තිල්පාට ගාපු වහලයක් පාර හරහා වැටුණු කොස් ගහක් උඩට පාත්වෙලා. කිර රෙදිත් එක්කම ජනේල ඉතුරු වුණු තනි සුදු බිත්තියක් සුන්බුන් අතර තනිවෙලා හිටියෙ ගෝසි ගතියකින් නොවෙයි. මොකද්දෝ නිදහසකින් සැහැල්ලුවකින් වගෙයි. දුහුළු කිර රෙදි හුළඟෙ නැලවෙමින් හිටියෙ 'සේරම ඇති වෙනවා. නැති වෙනවා. හුළඟක් මේ හිටියා මේ නෑ. වැස්සත් එනවා. යනවා. මිනිස්සුත් ආවා. ගියා. පොළොවෙන් මතුවූ දේ ආයෙමත් පොළොවට ගියා. මං ජනේල රෙද්දක් වෙන්න හුගාක් ඉස්සර කපු මලක් වෙලා හිටියා." කියනවා වගෙයි. මනෝරමා මොහොතක් නැවතිලා බලා හිටියා. සුන්බුන් අතර පොඩි ළමයෙක්ගෙ රතු බයිසිකලයක් පේනුණා.

වර්ණාසිගෙ අතේ හිටිය දරුවගෙ අම්මා මඩ ගෑවුණු ඉරුණු නිදි ගවුමත් පිටින් දුවගෙන ඇවිත් දරුවා උදුර ගත්තෙ හරියට වර්ණාසි ළමයා හොරකං කරගෙන යන්න හැදුවා වගෙයි. මනෝරමායි වර්ණාසියි ගල් ගැහිලා හිටියා. අම්මා දරුවා තුරුළු කරගෙන ඇඬුවා. දරුවත් අඬන්න ගත්තා.

"අපි යං" මනෝරමා දුවවත් ඇදගෙන පාර හරහා වැටුණු ගහක් මග ඇරලා තාප්ප කැඩුණු වතු දිගේ ගියා. සීරුණු තුවාල වුණු තැන් රිදුම් කන වග දැනෙන්න පටන් ගනිමින් තිබුණා.

මනෝරමා කුලියට ගත් ගේ කෑල්ලත් මහ ගෙදරත් වහලෙ උළු බිඳිලා විසිරිලා බිත්ති ඉතුරුවෙලා තිබුණෙ පුදුම විදියටයි. ඒ හරියෙ පරණ ගෙවල් කීපයක්ම ඒ විදියට බේරිලා තිබුණාට බිත්ති ඉරිතලලා දොර ජනේල ගැලවිලා තිබුණා. සමහර කබොක් තාප්ප කවුරු හරි පිහියකින් කපපු කේක් කෑලි වගේ වැටිලා. අලංකාරයට වවන මිටි තල්ගහක් මනෝරමාගෙ කුලී ගෙදර වහලට ඇවිත්. ඉස්සරහා දොර නං බිමට වැටිලා පඩිපෙළත් බැහැගෙන මිදුල

මනෝරමාට බය [illegible] පිටිපස්සෙන් ආවෙ [illegible] කියලයි. ඒත් ඒක කියලා වර්ණාසිව බය කරන්නෙ මොකට ද?

"ඔයා එහෙ මෙහෙ ඇවිදින්න එපා. ඔකට විසබීජ යයි. මෙච්චර වෙලා දැනුණෙ නැති එකනෙ පුදුමෙ."

"නෑ කකුලෙ රිදිල්ලක් දැනුණා. මං හිතුවෙ සෙරෙප්පු නැතුව ගඩොල් ගොඩවලුයි ගස් අස්සෙනුයි ඇවිදපු හින්ද කියලා."

අම්මා වියන් ඇඳේ තෙමුණ පැදුර ගෙනියලා බිම වැටුණු මල් පඳුරක් උඩට දලා තනියම මෙට්ටෙ උස්සන්න දඟලන හැටි දුව බලා හිටියා. අම්මා නිදා ගන්නෙත් ඇඳට පැදුරක් දලා කියලා ලිනට් දැනුම් දීලා තිබුණා. ඒ වගේ පළල පන්පැදුරු කොහෙත්වත් ගන්න නැහැ. අම්මා ඒවා වියවන්නෙත් සාෂා ඒවා ගන්න තැනටම කියලා වෙන්නත් ඇති. ඒත් ඒ ප්‍රශ්නෙ වෙලාවෙ හැටියට විතරක් නෙවෙයි කොහොමත්ම අනුචිතයි. පැදුරක් සම්බන්ධයෙන්වත් සාෂා ගැන සඳහන් කරොත් අම්මට කන් ඇහෙන්නෙ නැති වෙන්න පුළුවන්නෙ. කාලයක් තිස්සෙ සාෂා සම්බන්ධයෙන් අම්මා එහෙම බිහිරි වෙන්නත් දුව ගොළු වෙන්නත් හොඳට ඉගෙනගෙන තිබුණා. අප්‍රසන්න නිශ්ශබ්දතාවක් එන්නෙ වැරදීමකින් හරි සාෂාගෙ නම කියවුණාමනෙ. ඒ නිශ්ශබ්දතාව යට තියෙන්නෙ රාත්‍රි අන්ධකාරයෙ දි දිය ඇල්ලක් ළඟදි දැනෙන විදියෙ සියුම් බයක් මිශ්‍ර වෙච්චි විලාපයක්. ඒත් උදේට දිය ඇල්ල ලස්සනට රිදීයට ගලා හැලෙනවා. ඉර එළිය එක්ක සෙල්ලම් කරමින් දේදුනු මවනවා. ඒක එහෙම දේදුනු පායන මොහොතක් නිසා මනෝරමා තනියම මෙට්ටෙත් උස්සගෙන එළියට ගියා. ඇඳේ ලෑලිවල තැනක් දෙකක් තෙත් නොවී බේරිලා.

"ඔය තෙත නැති තැනක වාඩි වෙන්න." අම්මා එළියෙ පඩි උඩ මෙට්ටෙ දලා පොඩි කාලෙදි වගේ ආදරණීය අණක් නිකුත් කළා.

දුව ඇඳ උඩ වාඩි වෙලා යටිපතුලෙත් අනිත් තැන්වලත් සීරීම් පැලීම් නිරීක්ෂණය කළා.

මනෝරමා කුස්සියෙ බිඳුණු පිඟන්, කෝප්ප, උඩ රාක්කෙන් බිමට පැනපු සාස්පාන්, වහලෙනුත්, කැඩුණු දෙරෙනුත් එක

සරමණ්රුවකින් එල්ලෙන විදියට විවර වෙච්චි තිල්පාට ජනෙල් පියන් තියෙන ජනේලෙනුත් ගෙට පැනපු කොළ රොඩු, දූවිලි අතර හිටගෙන පරීක්ෂාකාරීව වටපිට බැලුවා. ලෑන්ර්වලින් කහ පාටයි කොළපාටයි අඹ ගෙඩි ඇඳලා තිබුණු මැටි මුට්ටි සහිත රාක්කය පිටින්ම බිම වැටිලා. මුට්ටි ඇතුළෙ ලූනු, ගොරකා, සියඹලා හෙම දලා තිබුණෙ ඇලුමිනියම් ෆොයිල් කවරවල දවටලා හින්ද ඒවා ආරක්ෂා වෙලා තිබුණා. බිම වැටුණු ප්ලාස්ටික් බෝතලේක තිබුණු වතුර ටිකක් රත් කර ගන්න තරමට ගෑස් කැන් එක බේරිලා තිබ්බව එකත් පුදුමයක්. කහ දපු සුදු ප්ලාස්ටික් බෝතලේ කකුලෙ වැදුණා. මනෝරමා කහ දපු වතුර ටිකක් උණු කරගෙන ගිහින් දුවගෙ කකුලෙ අඟල් දෙකක විතර පැල්ම හෝදලා සියඹලා ගෑවා.

"වෙලාවෙ හැටියට තුවාලෙ සුද්ද කරලා ඉන්න එපායැ." කියමින් ඊළඟට කරන දේ කල්පනා කළා.

"ඔහොම ඉන්න" අම්මා කෙනෙකුට විතරක් හිමිවන කඩිසරකමකින් මනෝරමා උදුරා වැටුණු අන්දර වැටට උඩින් පැනගෙන මායා ඉන්න පැත්තට ගියා.

"අනේ මොනවා හරි බේතක් නැද්ද? මේ ළමයගෙ කකුල බෝතල් කට්ටකට හරි මොකකට හරි කැපිලා. වෙනිවැල්ගැට කෑල්ලකුත් ඕන."

මායාගෙ පරණ සේප්පුව බිම වැටිලා පැලිලා සිංහල බෙහෙත් ජාති විසිරිලා. මායා ළඟ දින පැනපු බෙහෙත් ටියුබ් එකකුත් තිබුණා. ඒවා අරගෙන මිදුලටත් ගිහින් මනෝරමා ආපහු හැරෙනකොට මායාත් පස්සෙන් එමින් හිටියා.

"මේ තියෙන කොත්තමල්ලියි, ගැලවිච්ච පඳුරුවල ඉඟුරුයි, වෙනිවැල්ගැටයි දලා ඔයාගෙ ලොකු සාස්පානක උණු කරමු ද? පාරෙ වැටිලා තියෙන ගස් අතු කෑලියි ටයර් එකක් වගේ දෙයකුයි දැම්මොත් නිකම්ම උණු වෙයි. ඔයාගෙ කුස්සිය පැත්තෙ පොල්කටුත් ඇතිනෙ."

"ඇත්ත තමයි" මායාගෙ මහලු ඇස් දිලිසුණා.

"මං වර්ණීට බේත් ගාලා අනිත් අතට එන්නං."

ඇඳේ වාඩිවෙලා හිටිය වර්ණාසි වහලෙ අතරින් පතර පුපුරු උළු ඉතුරු වුණ තැන්වලින් බිමට ගලන ආලෝක කැදම්බවල නටන දූවිලි අංශු දිහා බලා හිටියා. ගමේ මහගෙදර එහෙම ආලෝක අල්ලි වැටෙන තැන් දිහා පුංචි කාලෙ කොච්චර නං බලා ඉඳලා තියෙනව ද? ඒ දවස්වල වර්ණාසිට දැනුණෙ ඒ අහසත් පොළොවත් යා කරන දෙයක් කියලයි. ආලෝකයෙ නටන්නෙ දූවිලි අංශු කියලා දැනගෙන හිටියෙත් නැති නිසා ඒකෙ මොකද්දෝ මායාමය සෞන්දර්යයක් තිබුණා. කකුල කැපිලා කියලා වගක් නැතුව සෙරෙප්පුත් නැතුව සුන්බුන් අතරින් ඇවිදගෙන ආ ගැනිව අම්මා නැවතත් ළමයෙක් කළ බව දැනුණත් ඒකෙන් මිදෙන්න තැත් නොකර වර්ණාසි බලා හිටියා.

අම්මා දුවට බේත් ගාලා, වෙනිවැල්ගැට, කොත්තමල්ලි තම්බලා දීලා, අම්මත් ජෝගුවක් බොමින් මායාටත් එකක් අරගෙන යනකොට දුව සන්සුන්ව හිටියෙ, ගෙවුණු රාත්‍රියෙ භූමිකම්පාවක් ඇති වුණේ හීනෙන් ද කියලා හිතමින්, ඒ වෙනකොටත් තමන් ඉන්නෙ හීනෙක වෙන්න බැහැනෙ. එතනට අඩුවෙලා තිබුණ ජීනවතී ඉස්කෝලෙ හාමිනේ විතරමනෙ. ඒ සුන්බුන් මැද එතන් එක පාරට ආතම්මා ඇවිත් "ඒයෙ රෑ නිදිමරලා තෙමිලා ඔයා මේ දඟලන්නෙ උණ හදා ගන්න ද? මන්න ඔය ඇඳට වැටිලා ඔය දරුවා එක්ක නිදා ගන්න එකයි." කියලා අම්මට අණ කරොත් විහුය ලක්කා වෙනවා. ඊළඟට සාමා බේත් ජාතිත්, තෑමත්, වතුර බෝතලුත් අරගෙන ආවොත් මරණය ඉස්සරහා අම්මගෙ අඩම්බරය දියවෙලා තිබුණොත් වර්ණාසිට වෙන කිසි දෙයක් ඕන නැහැ. ආයෙමත් ලස්සන ගෙදරක් නැති වුණත් මොකද? ඊට පස්සෙ දරුවෙකුත් ඉපදුණොත් ජීවිතේ හොඳටම සම්පූර්ණයි. භූමිකම්පාවක් වුණාට පස්සෙවත් අම්මගෙ හිතේ කරුණාවක් පහළ වුණොත් ඇති.

මායාගෙ බේත් පෙට්ටියෙ වර්ණ වීත් එකක ඉඟිනි ඇට තිබුණා. ඒක පෙරළිවෙලා බිමින් මිදුලට වැටිලා තිබ්බේ නිසා ඇති නිකමටයි ඒක ඇරලා බැලුවෙ. ඒවා අඩුවැඩි දහයකට වැඩිය ඉස්සර කවුරු හරි අනුරාධපුර පැත්තෙ ගමකින් ගෙනත් දීලා කියලා මායාටත් මතක් වුණේ එතකොටයි. මහෝර්මතාව මායෙයි ලොකු ටිකු බැඳ්දියකට මහ වතුර දාලා ඉඟිනි ඇට දැම්මා. මහ සට්ටුව පහළට බැහැලා වතුර පැහැදිලි වෙනකල් දෙන්නා

තාප්පෙ කමොක් ගල්වලින් පාර අයිනෙ ලිපක් හැදුවා.

මිනිස්සු ට්‍රාන්සිස්ටර් රේඩියෝ කනේ ගහගෙන පිට්ටනිය පැත්තට යමින් හිටියා. රේඩියෝ තියෙන මිනිස්සු වටේට අනිත් අයත් එකතු වුණා. ඒත් රේඩියෝකාරයොත් එක දිගට ඒවා ක්‍රියාත්මක කරන්න කැමති වුණේ නෑ.

"බැටරි බැස්සොත් සේරම ඉවරයි." කියමින් ඇවිද්දද, බී.බී.සී. වොයිස් ඔෆ් ඇමරිකා විතරයි අතරින් පතර ඇහුණෙ.

"කොළඹ පැත්තම ඉවරයිලු. ලංකාව සම්පූර්ණයෙන් වෙනස්වෙලාලු. මූදෙන් දූපත්, කඳු මතු වෙලාලු. රාමේශ්වරම මන්නාරම තව දුරස්වෙලාලු."

"ත්‍රිකුණාමලේ මඩකලපු පැත්තෙන් ලංකාව දික් වෙලාලු. යාපනේ පළල් වෙලාලු."

මිනිස්සු එක එක විදියෙ කතා කියමින් ගියා. නාඳුනන මිනිස්සු ළඟ නැවති නැවති ප්‍රවෘත්ති බෙද හැරියා. ඒ ඒ අයගෙ විස්තර එකතු කළා. සමහරු තුවාලකාරයො උස්සන් ගියෙ පිට්ටනියට හෙලිකොප්ටර් එයි කියන බලාපොරොත්තුවෙන්.

"දෙන්නරලා තර්ස්ලා ඉන්නවා නං පිට්ටනියට ඇවිත් උදව් වෙන්න." කියමින් තරුණයො හතර දෙනෙක් සුන්බුන් අතරින් ඇවිද්දා.

"ඇන්ටිලට දර ටිකක් හොයලා දෙන්න ද?" කියලා අසල්ලු තරුණයෙක් මායාගෙ පොරොවෙන් ගහක අතු ටිකක් කපලා දුන්නා. නැලිවිල කාර් එකක ටයර් එකකුත් ගෙනත් දුන්නට ගිනි අවුලවා ගන්න බූමිතෙල් ටිකක් තිබුණේ නෑ. වෙදගෙවරු හොයන කණ්ඩායමේ කෙනෙක් කොහේ හරි පෙරළුණු කාර් එකකින් පෙට්‍රල් ටිකක් ගෙනැල්ලා ලිප පත්තු කළා.

"කොත්තමල්ලි ඉවර උනත් වෙනිවැල් ගැට හරි තම්බලා දෙමු. එතකල් මිගෙල්ලා බිහි බලන්න කෝප්පෙවිට් එකෙක් මොනවා හරි බෙරිල ද කියලා." මහෝර්මා කිව්වා.

"ඒකට කට්ටියක් ගියා. අර කඩුලක් නැති කර්නල් ඒවා මිගහට්ටින් කරනවා. සමහර ගෙවල්වල මොන මොනව හරි වලං

පිහාත් ඉතුරුවෙලා ඇතිනෙ. මෙක හරියට යුද්ධයක් වුණා වගේ තමයි." තොත්තමල්ලි උගුරක් බීලා යන්න නැවතුණු තරුණයෙක් වතුර බෝතලය ගේන්නත් උදව් කළා.

නැමෙන්ගෙම තනයවල් බරවෙලා. නැමෙන්ම නිවිහුම් අරිමින් හිටියා. ගෙවල්වලට යට වෙච්චි අය ගොඩයන තැන්වලට තොත්තමල්ලි ගෙනියන්න ලමයි ඉදිරිපත් වුණා. හෙලිකොප්ටරයක් පිට්ටනිය පැත්තට ගිය නිසා සුහ දෙනෙක් ඒ පැත්තට යන්න පටන් ගත්තා.

මනෝරමා විශාලයක් නැති කුස්සියෙ වර්ණාසිට බටිලක් එකක් හදලා දුන්නා. බිමට වැටුණු සීතකරණයෙ තිබුණ බටර් කෑල්ලයි, මාළු පෙත්තකුයි, එළවළුයි විතරයි.

"කවද ලයිට් එයිද දන්නෙ නෑ" කියමින් මනෝරමා ඒ පේටීම එළියට ගත්තා. සාලේ සෝෆාවෙ වෙච්චලේ [illegible] ගේන්න ඒක විසදලා දුවට නිදි ගන්න ඇරලා අම්මා [illegible] ගත්තෙ පේනානායක [illegible] ගත්තා.

"මෙච්චර හරියක් වෙලා අපි මෙමගෙමවත් බේරුණා [illegible]" කියලා තනියම කියවමින් මනෝරමා උයනකොට පේන්නැති කෝපයක් ආවා. ඊට කලින් එයා කවදාවත් ඒ විදියට කුස්සියෙ ඉඳගෙන ඉඳලා නෑ.

"හෙලිකොප්ටර්ස්වලින් කෑම ගෙනත් දනවා කිව්වලු. මීගමුවෙ ඉඳලා හම්බන්තොටට යනකල් මුළු කෝස්ටල් ලයින් එකම වෙනස් වෙලාලු. මෙච්චර දෙයක් වෙලා තියෙද්දි මිනිස්සු ඒක බලන්ඩ යනවා. හෙට අනිද්දට මොනවා වෙයිද දන්නෙ නෑ.

"කව්ද කිව්වෙ?" මනෝරමා ඇහුවා.

"ඔය බී.බී.සී. එකේ කිව්වලුනෙ. කොහෙද රේඩියෝ එකක් නෑනේ. මෙ ටී.වී. කවද වැඩ කරයි ද දන්නෙ නෑ."

"නුවරඑළියෙ කඳු නාය ගිහින්ලු. ටී.වී. ටවර්ස් කඩා වැටිලලු."

මනෝරමාට එක පාරට ඔලුව කැරකෙන්න ගත්තා. එහෙම වෙන්නෙ කොහොම ද? ඒ තරං දෙයක් වෙලා තියෙද්දි තුන් දෙනෙකුට කන්න බත් උයාගෙන මොකට ද?

මනෝරමාට වාඩි වෙන්න තැනක් කුස්සියෙ තිබුණෙ නෑ. මනෝරමා එළියට ගිහින් වමනෙ කරා.

"ඔයාට සනීප නෑ වගේ නේද? ඔයත් කාලම පුටුවෙ නිදි ගන්න. මාත් ගිහිං සෝපාවක වැටිලා ඉන්නවා. මෙච්චරක් කාම ගෙන ගෙනියයි. ගේ මඩවෙලා."

මනෝරමා මළව තෙල්ලුවා. මාළුයි, කාලුයි එකටම දාලා ඒකට අඹු කුඩුපොතුයි, කහයි, තම්බිලිපුයි, ලුණුයි දැම්මා. ඊට වැඩිය දෙයක් කරන්න බැරි තරමට අප්‍රාණික ගතියක් දැනුණා. මුළු යම නිදි මරපු අමාරුව එච්චර වෙලා යටපත් වෙලා තිබිලා එළියට ආවා වගේ ඇය විඳෑන්න ගත්තා. වර්ණාසි කොච්චි නං බත් උයනකොත් නැතුව මගේ වැටිලා ඉන්න තිබුණා.

මනෝරමා ගොතෙම් තිබුණු කුඩෙ එකකුයි, අල්මාරියෙන් ඇඳ රෙද්දකුයි හිටියට ඇඳගෙන ගිහින් ඉස්කෝලේදුරුවෙ වෙලිලා තිබුණු තැනක [illegible]. බැද්දවෙලා යන්න කලින් ඉර එළිය කළුව [illegible] ගත්තා. මනෝරමා නැගිටලා යනකොට බත් එක රෝස් වෙනවිටත් ඒක අමතක වෙලා නිදා ගත්තා නං තමයි වැඩේ. ගෙදර කවද ගෑස් ලැබෙයි ද දන්නවයැ.

වර්ණාසිට නින්ද ගිහින්. ඒත් ඉර එළිය ඇගට වැටිලා. මනෝරමා ලා නිල්පාට පරණ සාරියක් ඉරලා ඇඳ රෙද්දක කොන් හතරක ගැට ගහලා සාරි තැලි ජනේල පොලුවල බැඳලා දුවට ආවරණයක් හැදුවා. පුංචි කාලෙ සෙල්ලම් ගෙවල් හදනවා වගෙයි. වර්ණාසි පොඩි කාලෙ ඒ වගේ නිල්පාට සාරියකට කිව්වෙ මුහුද කියලයි. ආතම්මා ඒ සාරිය අඳින දවසට මිනිහිටි ගිහින් "අද මුහුද" කියලා ඒකෙ එතෙනවා. ඒක හෝදලා වැලේ වනලා තියෙනකොට මුහුදෙ නානවා කියලා සාරියෙ තෙත මූණෙයි අත්වලයි ගා ගන්නවා.

නිල් සාරියකින් මුහුද දක්ක කෙල්ලට තිබුණෙ චිත්‍ර ශිල්පිනී ඇහැක් වෙන්නැති. ඒත් ළමයා ඒකෙන්වත් ප්‍රයෝජනයක් ගත්තා යැ. මනෝරමාට ඕන වුණා නිදගෙන ඉන්න දුවගෙ මූණ ඉඹින්න. භූමිකම්පාව එනකල් හත් අවුරුද්දක්ම අම්මටයි දුවටයි බදගෙන ඉඹින්න බැරි වුණානෙ. ඒක තමන්ට වගේම වර්ණාසිටත් දුකක්

වෙන්න ඇද්ද?

මනෝරමා දුව ළඟින් බිම වෙලිච්ච තැනක ඇඳ රෙද්ද එළාගෙන දිගා වුණා. වහලක් නැති ගෙදර දෙර ජනේලත් ගැලවිලා තියෙද්දි මනෝරමාටත් නින්ද ගියා. තාප්ප නැති වෙලා යුධ පිටියක් වගේ වෙච්චි පරිසරයක හෙලිකොප්ටර් සද්ද මැදත් ඒ වෙලාවෙ ඊට වැඩිය වෙන කිසි දෙයක් ඕන වුණේ නෑ. ඔහේ වැටිලා නිද ගැනීම කොයි තරම් සම්පතක් ද? ගෙයි තියෙන දේවල් කවුරු හරි උස්සන් ගියත් කරන්න දෙයක් නෑ කියලා මනෝරමාට හිතුණා.

වර්ණාසි ඇහැරෙනකොටත් අම්මා නිදි. වර්ණාසිට එක පාරට හිතා ගන්න බැරි වුණා තමන්ට ඉහළින් නිල්පාට කොටු කොටු රෙද්දක් තියෙන්නෙ කොහොමද කියලා. ඒ ඉන්නෙ අම්මා කුලියට ගත්තු ගෙදර කියන එකත් කල්පනා වුණේ නෑ. දිග නරක හීනෙක භූමිකම්පාවක් තිබුණ ද? මේ ඉන්නෙ කොහෙද?

අම්මා බිම නිදාගෙන හිටියා. අම්මගෙ කෙස් සුදු වෙගන එනවා. එහෙනං මේ රෙදි ආවරණය අම්මගෙ වැඩක්. අම්මට ඇහැරෙන්නෙ නැති වෙන්න වර්ණාසි පරෙස්සමින් නැගිටලා පිටතට ගියා. මිනිස්සු වතුර බෝතල් කෑම පාර්සල් උස්සගෙන පාරේ වැටිලා තිබුණු ගස්වලට උඩින් පනිමින් ගියා. සුද්දෙ කට්ටියක් කැඩුණු ගෙවල්වලට යමින් හිටියා. තුවාලකාරයො උස්ස ගත්තු අයත් පිට්ටනිය පැත්තට ගියා. නාඳුරණ මිනිහෙක් ඇවිත් ළිඳට එබිලා බැලුවා.

"වතුර බොර උනාට මෙහෙමවත් ළිඳක් තිබ්බ්ච එක දෙයක්නෙ. කන්න බෑ උදේ ඉඳන් තුවාලකාරයොයි මැරිච්ච මිනිස්සුයි ඇදලා. නා ගන්න ඕන. කමක් නෑනේ." කියලා නාන්න ගත්තා.

භූමිකම්පාවෙන් පස්සෙ ළිඳක් තියා ඇඳක් පුටුවක්වත් තමන්ගෙ කියලා කාටද කියන්න පුළුවන්. සාෂා ආවම ගේ දැක්කම පපුව පැලෙයි. එයා පිහිනුම් තටාකයකුත් හදන්නයි හිතාගෙන හිටියෙ.

නාඳුරණ මිනිහට නාන්න සබනුයි, තුවායකුයි ඕනද කියලා අහන්න ඕන වුණත් එතනට යන්න බැරි ගතියක් දැනුණා. ඒ මිනිහට නාලා ඇඳ ගන්නවත් දෙයක් නොදී කොහොම ද? වර්ණාසි බිමට වැටුණු අල්මාරියෙන් ටී ෂර්ට් එකකුයි ඇඳ රෙද්දකුයි හොයා ගත්තා. එච්චර දෙයක් වෙලා තියෙද්දි බොරු ලැජ්ජාවක් මොකට ද? වර්ණාසි සබනුයි, රෙදියි තුවායකුයි අරගෙන ළිඳ ළඟට ගියා.

"සරං නං නෑ. මෙහෙ හිටියෙ අම්මා විතරනෙ. මේවාවත් ඇඳ ගන්න" කියලා කිව්වා.

"මේ ගේ බිමටම සමතලා වුණා මිස්. මායි අම්මයි බේරුණේ පුදුම විදියට."

"නාලා එන්න.... මං තේ ටිකක් හදලා තියන්නං."

අම්මා බත් උයලා තිබුණු නිසා බත් දෙන්න හැදුවත් පාර්සල් ලැබුණා කියලා ඒ මනුස්සයා ගියා අම්මා ඉන්න තැනට යන්න ඕන කියලා. හැමෝම තම තමන් බේරිච්ච හැටි ඕනම කෙනෙකුට කියන්න සූදානමින් පාරෙ ගියා.

"කැඩුණු ගෙවල්වල අවදානම් සහගත බිත්ති, තාප්ප, වහලවල් තියෙන තැන්වල ඉන්නෙ නැතුව එළිමහන් ස්ථානවලම ඉන්න. පිට්ටනියට ඇවිත් තම තමන්ගෙ ගෙවල්වල අයගෙ විස්තර ලියාපදිංචි කරන්න. ටෙන්ට්, පැදුරු, වතුර, ආහාර පාර්සල් ලබා ගන්න. වෛද්‍ය කඳවුරක් ආරම්භ වෙනවා. ගස් ඉවත් කරල පාර පාදන්නත් අනිත් කටයුතුවලටත් ස්වේච්ඡාවෙන් සහභාගි වෙන්නත් කැමති අය එන්න. ඉතුරු වුණු ගෙවල්වල කඹ, පිහි, කැති, පොරෝ, උදලු තියෙනවා නං අරගෙන එන්න."

මෙසපෝනයක් ගත්තු දෙන්නෙක් වැටුණු ගස් අතරින් පාර සීමාවෙ යමින් හිටියා. මායා සේනානායකත් පිටතට එනවා වර්ණාසි දැක්කා.

"කෝ අම්මා? මං හිතන්නෙ අපිත් ගියොත් හොඳයි. නැත්තං බොන්න වතුරත් නැති වෙයි. වතුර ටැංකිත් පුපුරලලු."

"අම්මා නිදි. ඇහැරවන්න පව්. යං ආන්ටි අපි දෙන්නා යං." වර්ණාසි ඇඳගෙන හිටිය ලොකු ගවුම පිටින් රබර් සෙරෙප්පු දෙකත් දාගෙන සේනානායක නෝනාත් එක්ක ගස් උඩින් අඩු

අතරින් ඇවිදින්න ගත්තා. ඇඳුම් ගැලවෙනවනෙ නෑ කියලවත් කොණ්ඩෙ අවුල්වෙලා කියන එකවත් වැදගත් වුණේ නෑ. මිනිස්සු තම තමන්ගෙ ගෙවල්වල සුන්බුන් අතරින් ගන්න පුළුවන් දේවල් එකතු කරමින් හිටියා. එක ගෙදරක කැඩිලා ඉතුරු වෙච්ච තාප්පයක් බිම දමින් හිටියෙ වයසක ගෑනු දෙන්නෙක්.

"චන්ද්‍රා මේ මොකද?" සේනානායක නෝනා එතන නැවතුණා.

"මේක කොයි වෙලේ හරි වැටෙන්න කලින් බිම දන්න ඕන. එතකොට රෑට මෙතන ටෙන්ට් එකක් ගහගෙන මේ ගස් අතුවලින් ගිනි ගොඩකුත් ගහගෙන ඉන්න පුළුවන්."

"ඒ කාලේ ගයිඩිං කරනකොට හිතුවෙ නැතෙ කවදාවත් ටෙන්ට් එකක ඉන්න වෙයි කියලා. මායාට මතකද අපි ටෙන්ට් එකක හිටියා."

ඒ වෙනකොටත් නිදි ඇඳුම පිටින් හිටි චන්ද්‍රා උඩිල්ලෙන් උස්සගෙන ඇහුවා.

එතන තිබුණෙ රතු ගඩොල්වලින් හදපු ගෙයි රට උළු වහලක් එක්ක එක පැත්තක් බිම. අනිත් පැත්තෙ වහලෙ නෑ. ඒ දෙන්න රෑට ඉන්න සූදනම් කර ගන්න හදන්නෙ ගේ නෙවෙයි තාප්පෙ ළඟ තණ ගොල්ල කියලා තේරුණේ එතකොටයි. ඒ ගෙදර ඇත්තන්ගෙ විස්තර දැනගෙන හිටියෙ නැති උනත් පාට පාට මල් පිරුණු ඒ ගෙවත්ත දිහා වර්ණාසි අනන්තවත් බලල තියෙනවනෙ. ඒ වයසක නෝනා කහපාට වතුර බටයක් අල්ලගෙන ඉන්නවා හැන්දෑවට ඒ පැත්තෙන් යනකොට දැකලා තිබුණානෙ.

"ග්‍රවුන්ඩ් එකට යන්නෙ නැද්ද රෙජිස්ටර් වෙන්න."

"අපි ඒවා කරලා ආවෙ. කොළඹත් නැලු. කොච්චර දවස් මෙහෙ ඉන්න වෙයිද දන්නෙ නෑ."

"එහෙනං අපි යනවා."

මිනිස්සු දෙන්නෙක් පාර මැදට වැටිලා තිබුණු කොස් ගහක් කියතකින් ඉරමින් හිටියා. පොඩි ළමයි දෙන්නෙක් වහලයක් නැති පරණ ගෙදරකට නගින පඩි පේළියක වාඩි වෙලා හිටියෙ නිල්

පාට ඉරිච්චුණු පිජාමා ඇඳුම්වලින්.

"කෝ බබා අම්මලා."

මායා සේනානායක ඇහුවා.

"රෙජිස්ටර් වෙන්න ගියා."

"එහෙනං අම්මලා එනකං නෙල්ලෙන්නෙ නැතුව ඉන්න." කියලා ඒ වත්තෙ සුන්බුන් අතරින් යන්න වුණේ පාර හරහට ඇස්බැස්ටෝස් වහලක් පාත් වෙලා තිබුණු හින්දයි.

"මං මේ කල්පනා කළේ දෙවෙනි ලෝක යුද්ධෙදි ජර්මනියෙ හෙම මේ වගේ වෙන්න ඇති කියලයි." මායා සේනානායක කිව්වා.

"ඇයි යාපනේ කිලිනොච්චියෙත් මෙහෙම වෙන්නැති."

"නෑ... මේ තරමටම විනාසයක් වෙන්න නං නෑ. ඔයා දන්නවද අර බිත්ති කඩා කඩා හිටිය ඉස්සර හොඳට ස්පෝර්ට්ස් කරපු ගයිඩිංවලට කුවීන්ස් මෙඩ්ල් ගහපු කෙනෙක්. ඔයාගෙ අම්මයි එයයි ඒ කාලෙ කරට කර."

"මං හිතුවා ඒ ආන්ටි අම්මට වඩා වයසයි කියලා."

"නෑ.... මය අකලට කෙස් සුදු වෙලා. ඉස්කෝලෙ යන කාලෙමයි සුදු වෙන්න ගත්තෙ. එයා කවදාවත් ඩයි කරේ නෑ."

"මං මෙහෙ හිටියට කාවවත් අඳුරන්නෙ නෑ ආන්ටි."

"අපිත් මය කුලියට ඉන්න මිනිස්සු අඳුරන්නෙ නෑ. දැං පරණ ගං කාරයො ටික දෙනයි ඉතුරුවෙලා ඉන්නෙ."

එක ගෙදරක වහලෙ කැඩිලා, බිත්ති වැටිලා තිබුණෙ අලුත් ප්‍රාඩෝ එකක් උඩට. ඒ මදිවට දෙල් ගහකුත් වාහනේ උඩට වැටිලා.

"අපි මෙහෙමවත් ඉතුරු වෙච්චි එක ඇති." මායා සේනානායක සාරි පොටෙන් කඳුළු පිහදැම්මා.

වර්ණාසි ඔළුව හෙල්ලුවා.

පිට්ටනියෙ ගස් අහක් කරලා සුන්බුන් ඇදලා දලා වෛද්‍ය කඳවුරක් පටන් අරගෙන තිබුණා. රතු කුරුස ටෙන්ට් එකක තුවාලකාරයො ප්ලාස්ටික් පැදුරු උඩ වාඩිවෙලා දිගාවෙලා හිටියා.

සුදු දෙස්තරලා අතර නිදි ඇඳුම්න්ම ලෙඩ්ඩු බලපු ලංකාවෙ දෙස්තර නෝනා කෙනෙකුත් හිටියා. කර්නල් සුභාෂ් මුලින්ම දකිනකොට ඇඳගෙන හිටි සරම පිටින්ම පෝලිමක් හදනවා. එයාග ඇඟ පුරාම මඩ. ඒ හරියෙ පිට්ටනිය දිගට මළමිනී පේළියක්.

"අනේ මං මේ එහෙ ගිහිං බලලා ආවෙ." කොන්දේදෝ ඉඳලා ලිනට් දුවගෙන ඇවිත් බඳ ගත්තා. "කෝ ලොකු මිස්?"

"කරදරයක් නෑ. පොඩ්ඩක් හිරිලා විතරයි."

"අපි ගෙදර හිටියා නං ඉවරයි. අපේ හරියෙ ගෙවල් තිබුණු තැන්වත් හොයා ගන්න බෑ. ඊයෙ අපි අරයගෙ කත්තෝරුවෙ ලොක්කගෙ ගෙදර පාටියකට උදව්වට ගියා. මේක පටං ගන්නකොටත් පාටියෙ ජයට නටනවා. එක පාරට ලයිට් ගියාම මං හිතුවෙ ඕනකමින් නිවලයි කියලයි. මේං වහලෙත් කඩාගෙන අඹ ගහකුත් පාත් වුණා හරියටම නටන කට්ටිය මැදට. වැස්සකුත් පාත් වුණානෙ. එතන කී දෙනෙක් ද කියලා තාම දන්නෙ නෑ." ලිනට් ඇඬුවෙ නෑ. ඒත් සෑහෙන වෙලාවක් අඬමින් ඉන්න ඇති කියලා පෙනුණා. උගුර බැරැඬි වෙලා. ඇස් ඉදිමිලා. රතුවෙලා. කකුල් ඉදිමිලා. වර්ණාසිටත් උගුර රිදුණා. කැස්සක් ආවා. ඇස් කෙවෙමින් තිබුණා.

"රෙජිස්ටර්වෙලා එන්න. මොනවා හරි බේතකුත් අරගෙන දෙන දේකුත් අරගෙන යං. මිස්ට ඔවා සේරම උස්සන් යන්නත් බැහැනෙ. මාත් එන්නං. ලොකු මිස් බලන්නත් ඕනනෙ."

වර්ණාසි දිග පෝලිමක හිට ගත්තා. උදේට බීපු මයිලෝ එකට පස්සෙ නාන්න ආපු මිනිහට තේ හදන ගමන් බීපු තේ ටික විතරක්නෙ කියලා මතක් වුණේ ඒ වෙලාවෙයි. වර්ණාසිට අව්වෙ සැරත් ඔරොත්තු දුන්න නෑ. හෙලිකොප්ටරයක් පාත් කරලා ගුවන් භටයො බිමට පනිමින් හිටියා.

මේ හීනයක් ද ඇත්තක් ද චිත්‍රපටියක් ද කියන එක හැමෝටම දැනෙනවා ඇති කියලා වර්ණාසිට හිතුණා. රතු කුරුස සංවිධානෙට කියලා තමන් ජීවත්ව ඉන්නවා කියලා සාෂාට දැනුම් දෙන්න පුළුවන් ද කියලා අහන්න හිතුණත් එතන තිබුණෙ ඊට වඩා ප්‍රශ්නනෙ. අහිත් අයටත් ඒ වගේ දැනුම් දිය යුතු අය ජීවත් වෙනවද

කියලා හොයා ගත යුතු අය කොච්චර ඇති ද?

වර්ණාසිගෙ ඔළුව කැරකෙන්න ගත්තා. හෙලිකොප්ටරය ඔළුවට පාත් වුණා වගේ සද්දෙකුත් එක්ක හැමතැනම අඳුරු වුණා. "අම්මේ අම්මේ" කියවුණා. අම්මා කැඩුණු ගෙදර තිදගෙන හිටි බවත් අමතක වුණා. වැඩි වෙලාවක් ගියෙ නෑ. වර්ණාසිට හුස්ම වැටෙනවා දැනෙන්න ගත්තා. කවුරු හරි පවන් ගහමින් හිටියා. මූණට වතුර ඉස්සා. අත අල්ලගෙන හිටියෙ කවුද? ඇඟ පණ නැති උනත් ඇස් දෙක විවර කර ගන්න අමාරු උනත් අත අල්ලගෙන හිටියෙ අම්මා නං නෙවෙයි කියලා වර්ණාසිට දැනුණා. අම්මගෙ අතේ උණුසුම හිතෙන් උනත් අඳුන ගන්න පුළුවන්.

ඒ මොහොතෙ වර්ණාසිට උවමනා වෙච්චි එකම දේ පුංචි කාලෙ වගේ අම්මට ගුලි වෙන්නයි. පුංචි කාලෙයි ගෙවුණු රාත්‍රියෙ භූමි කම්පාවයි අතර සිද්ධ වෙච්චි හැම දේම නිකං හීනයක් වගේ දැනෙමින් තිබුණා.

වර්ණාසි ඇස් ඇරියා. නිල් ඇස්, රන් කෙස් තියෙන සුදු දෙස්තර නෝනා කෙනෙක් නාඩි බලමින් හිටියා.

"දැන් හරි නේද? කැම නැතුව හිටිය ද?" එයා ඉංග්‍රීසියෙන් අහුවා.

"මං කොහෙද ඉන්නෙ?" වර්ණාසි වටපිට බැලුවා. විශාල කූඩාරමක ඇතුළත ඇඳන් දහයක් විතර තිබුණා. ඒවායෙ හිටියෙ අත් කකුල්වල සුදු වෙළුම් පටි දාපු උදවිය. වර්ණාසි ළඟින්ම දකුණු පැත්තෙන් කෙඳිරියක් ඇහුණා.

"බය වෙන්න එපා." කියලා වෛද්‍යවරිය එතනට පැන්නා. මොහොතකින් දරුවෙක් අඬනවා ඇහුණා. වර්ණාසිට පෙනුණෙ දරුවා බිහි කළ අම්මාගෙ මූණ විතරයි. ඒ මූණෙ කඳුළු අතරින් හිනාවක් ඇඳුණා. වර්ණාසිත් හිනා වුණා.

මනෝරමාට ඇහැරුණේ වර්ණාසි පිට්ටනිය පැත්තට ගිහින් විනාඩි දහයකට විතර පස්සෙයි. ඇස් අරින්නෙ නැතුව ටික වෙලාවක් ඉඳලා හෙමිහිට අත දික් කරලා සෝපාව අල්ලලා බැලුවා.

"පුතේ ඔයා කොහෙද?"

නුපුරුදු කටහඬවල්, හෙලිකොප්ටරයක හඬ, ගහක් කපනවා වගේ හඬක් මිස වර්ණාසිගෙ හඬ ඇහුණෙ නෑ. මනෝරම්‍යා නැගිටලා සෝපාවෙ ඉඳ ගත්තා. නහය බර වෙලා. සිරිච්ච තැන් රිදුම් කෑවා. කකුල් ඉදිමිලා. උදේ ගේ හෝදනකොට තිබුණු හයියත් නැලිලා පොඩිවෙලා ඇකිලිලා ගිහින්. උයා ගත්තු බත් ටික කන්න ඕන කියන හිතක් පහළ වුණත් බඩ ගින්නට වඩා තිබහක් දැනුණා.

වර්ණාසි කොහේ ගිහින් ද? කාට හරි තේ හදපු ලකුණු පෙනුණා. පෝච්චියෙ තිවුණු තේ තිබුණා. මනෝරම්‍යා තිව්ච්ච තේ උගුරු දෙක තුනක් බීලා වතුර බෝතල් බාගයක් විතර බිව්වා. මිනිස්සු වතුර බෝතල්, ප්ලාස්ටික් බෑග් උස්සන් යමින් හිටියා. මායා ගැලව්ච්ච දෙරත් හේත්තු කරලා තිබුණෙ දෙන්නම පිට්ටනියට යන්න ඇති. සමහර විට කැඩුණු ගේ බලන්න ගියා වෙන්නත් බැරි නැහැනෙ. මනෝරම්‍යාට උණ ගතියකින් දණහිස් වෙව්ලනවා වගේ දැනුණා.

වර්ණාසි බත් කාපු වගක් පෙනුණෙත් නෑ. මනෝරම්‍යා බත් හැඳි දෙකක් විතර දාගෙන හැන්දෙන්ම කන්න ගත්තත් පිරියක් දැනුණෙ නෑ. කිසිම රහක් නැති වුණේ කොහොම ද? පිඟාන වහලා තියලා ප්ලාස්ටික් වතුර බෝතලේ අන්තිම වතුර උගුරු දෙක තුනත් කටට හලාගෙන මනෝරම්‍යා සෝපාවෙ දිගා වුණා. මහ ගෙදර බඩුවලින් තමන්ටය කියලා ඉතුරු කර ගත්තෙ ඒ සෝපාවයි, වියන් ඇඳයි, අල්මාරියයි විතරයිනෙ. ජිනවතී ඉස්කෝලෙ හාමිනේ මහ ගෙදර ලියලා තිබුණෙ වර්ණාසිටයි. ඒක දැන ගත්තු වෙලාවෙ මනෝරම්‍යාගෙ ඔළුවට ගිනි දැල්ලක් වැදුණා වාගෙ වුණා. ඒ දේපළ තණ්හාවට නං නෙවෙයි. කාරණය දැන ගත්තෙ මරණෙ වැඩ ඉවර වුණාමනෙ. ගෙදර ඉන්න නීතිඥවරියට නොකියා අම්මා ඒ වැඩේ කරගෙන තිබුණෙ කරවනැල්ලෙ නොතාරිස් මහත්තයට කියලයි.

"අම්මට ලිව්වත් මොකද එකම දෝණිට මිස වෙන කාට දෙන්ඩද? කියලා නොතාරිස් මහත්තයාත් කිව්වා. මනෝරම්‍යාට ප්‍රශ්නෙ වෙන්නෙ දේපළ දූවට යන එකට නෙවෙයි සාෂා එක්ක කතා කරන්න කිසිම කැමැත්තක් නැති වෙච්චි එකයි.

මනෝරම්‍යා හිතාගෙන හිටියෙ ගමේ ගෙදරට වෙලා විවේකිව ඉන්නයි. මනෝරම්‍යාට විවේකය කියන්නෙත් ගෙදර

ඉඳන් කරන්න පුළුවන් වැඩ කිරීමයි. ගෙදර හිටියත් නීතිමය ලේඛන සංස්කරණය කිරීම වගේ වැඩ ලැබෙනවානේ. ඉතින් මැරෙනකම් ඒ හීල් හෙවනෙ සීතල වතුර නාලා, වත්තෙන් එළවළු පලතුරු කාලා, ගෙයයි වත්තයි ආරක්ෂා කරගෙන ඉන්න තිබුණා. බැරි ගැහෙනකොට බලන්නත් ගමෙන් ගෑනියෙක් දෙන්නෙක් හොයා ගන්නත් පුළුවනිනෙ. ජිනවතී ඉස්කෝලෙ හාමිනේට ලේසියට උණු වතුර නාන්න හීටරයකුත් දාපු නාන කාමරයක් හදලා දීලානෙ තිබුණෙ.

"පුතේ ඔයාට ඕන වෙලාවට ගෙදර එන්න, කවද හරි මේක ඔයාටනෙ." කියන්න මනෝරම්‍යා බලාගෙන හිටියා. ඒ ආරාධනයෙ සාෂා කෙනෙක් නැති බව දූව තේරුම් ගනියි. ජිනවතී ඉස්කෝලෙ හාමිනේ කරලා තිබුණෙ තරුණ කාලෙ පටන් කියන දේ නාහපු කෙනාට පාඩමක් උගන්නන්න වගේ දෙයක්නෙ. ඒත් ඒ කටයුත්ත සිද්ධ වෙන්න ඇත්තෙ ඒ අර්ථයෙන් නෙවෙයි කියන එකත් මනෝරම්‍යාට තේරුණා.

මනෝරම්‍යා ගමේ ගෙදර වැටිලා ඉඳියි. රබර් වත්ත බලා ගනියි කියලා උන්දෑ කවදාවත් විශ්වාස කරේ නැහැනෙ. සාෂා නං වත්තයි ගේයි හොඳට නඩත්තු කරයි. පවුලෙ තුන්දෙනා සමගි වෙයි. මනෝරම්‍යාට මැරෙනකල් වැටිලා ඉන්න ලැබෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි ඔය තීරණය ගන්න ඇත්තෙ.

"අම්මා ගේ ඒගොල්ලන්ට ලියපු හින්ද මට ඉන්න බැහැනෙ. මං නුගේගොඩ පැත්තෙන් ගෙයක් කුලියට ගන්නවා." මනෝරම්‍යා කියපු දේ තැපැල් මාමාටවත් තේරුණේ නෑ. එයා තමයි ඔප්පු ලියනකොට සාක්ෂියට අත්සන් කරලා තිබුණෙ.

"ඉතිං ඔයාට මෙහෙ ඉන්න බාධාවක් නෑනේ. ඒ ගොල්ලො කවදාවත් ඔයාට යන්න කියනවයැ. ඒගොල්ල ඕන නං පෝයකට හෙම ඇවිත් යයි."

"මට බෑ මාමේ, දූවට උනත් බාල්දු වෙන්න බෑ. මට අයිති නැති තැනක ඉන්නෙ මොකට ද?"

"ඉස්කෝලෙ අක්කා ඔප්පු ලියන දවසෙත් කීවෙ ඔයාගෙ යහපත ගැන හිතලා ඔය තීරණෙ ගත්තා කියලයි. සාෂා පවුලට

එකතු වෙච්චි දවසෙ ඉඳලා අක්කට විතරක් නෙවෙ අපටත් බොහොම ගරු සරු ඇතුව වැඩ කරානෙ."

තැපැල් මාමලත් සාෂාගෙ කතාවට රැවටිලා කියලා කෑ ගහන්න තරම් ආවේගයක් ආවත් මනෝරම්‍යා වේගයෙන් හුස්ම ගනිමින් නිහඬ වුණා.

"ඒක තමයි. දූං ඉතිං ඔය තරහා මරහා ඉවර කරලා දන්න. දෙන්නා බොහොම හොඳට ඉන්නවනෙ. තාත්තා කෙනෙක් වගේ බලා ගන්නවනෙ. කිසි අඩුවක් නැහැනෙ. ඔයාට කියන්න ඇතිනෙ. මේ පාර වෙඩිං ඇනිවසරි එකට සෑහෙන වියදමක් කරලා රෝම් ගෙනිච්චනෙ. කවුද ඔහොම කරන්නෙ. ඔන්න මිනිස්සු. ගෑනියෙකුට ආදරේ කරන්න රැක බලා ගන්න දන්නවා."

තැපැල් ඇන්ටි ඒක කිව්වෙ මනෝරම්‍යාට විතරක් නෙවෙයි එයාගෙ මහත්තයාටත් එක්කයි.

"සල්ලි තියෙනවනං අපිටත් බැරියැ ලන්ඩන්, රෝම්, පැරිස්, බර්ලින්, ඔක්කොම ගෙනියන්න. ඒක වර්ණාසිගෙත් ලැබීම."

මනෝරම්‍යා කිසි දෙයක් කිව්ව නැහැ. දුව ඒ ගමන් විස්තර දන්නුවෙත් නෑ. සාෂා බල කරලා ගෙනියනවා කියලා කාම්බෝජයට ඊ-මේල් එකක් එවලා තිබුණා.

"ඔය මිනිහා මේ ළමයව රවට්ටලා ඕවා විකුණයි." කියලා කිව්වත් කිසි කෙනෙක් පිළිගන්නෙ නැති තැනටනෙ ඇවිත් තිබුණෙ.

අන්තිමට මිනිහා වත්ත විකුණලා පරණ ගේත් කඩලා හදපු මාලිගාව එක රැයෙන් විනාශ වුණානෙ.

"අම්මා එහෙ පදිංචිත් නැති එකේ ඕක බලන්න යන්න සාෂාට වෙලාවකුත් නැති එකේ පරණ රබර් උදුරවලා අලුතෙන් පැල දන වැඩට ඇරෙනවට වැඩිය ඒක විකුණන එක හොඳයිනෙ. අනිත් එක අපි නිකං කුලී ගෙවල්වල ඉන්නෙ මොකට ද?"

වර්ණාසි ඒක කිව්වෙ ටෙලිෆෝන් එකෙන්. මනෝරම්‍යා උත්තර නොබැඳ ටෙලිෆෝන් එක තිබ්බා. අනිත් අතට තැපැල් මාමාට කතා කළා.

"... දේ. අම්මා ඕක

ලියනකොට බලාපොරොත්තු වෙන්න ඇත්තෙ වර්ණාසිගෙ දරුවොත් ඒ වත්තෙ ගස්වල ගෙඩි කඩාගෙන කයි කියලයි."

"මේක නං මාත් හිතුවෙ නැති දෙයක්."

"ඉතිං මාමාත් සාක්කියට අත්සන් කරපු එකේ ඒ ගොල්ලන්ට කියන්න මේක මේ ආතම්මට කරන ලොකුම ද්‍රෝහිකම කියලා."

"මං හුඟාක් කරුණු කාරණා කිව්වා. ඒ ගොල්ලො කියන්නෙ කෝට්ටෙ පැත්තෙන් ලොකු ගෙයක් හදලා ඔයාටත් ඇනෙක්ස් එකක් හදනවා කියලනෙ."

"මං මහලු මඩමක මැරුණත් ඒ ඇනෙක්ස් එකට යන්නෙ නෑ කියලා කවුරු කවුරුත් දන්නවනෙ."

ඒ අවස්ථාවෙදි මනෝරම්‍යාට ඉඩම් විකිණීම නතර කරන්න ඕනැම දෙයක් කරන්න හයියක් ආවත් නීත්‍යානුකූලව කරන්න දෙයක් තිබුණෙ නැහැ.

ගෙවුණු රාත්‍රියෙ මනෝරම්‍යා තමන්ගෙ ජීවතේට මොනවා උනත් දුවගෙ ජීවිතය ආරක්ෂා කිරීමේ වගකීම දරාගෙන මේසෙ යට හිටිය මුළු වෙලාවෙම ඒ පරණ සිද්ධි උඩ යට පෙරළමින් හිතුවා.

දුවට කියන්න බැරි ඒ කතාව පටන් ගත්තෙ දුවට අවුරුදු තුනක් විතර වෙනකොටයි. ඒ කාලෙ මනෝරම්‍යා වැඩ කළේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයටයි. සාෂාට නිශ්චිත රස්සාවක් තිබුණෙ නැහැ. එක එක තැන්වල එක එක ජාතියෙ වැඩ කරා. එක තැනක සමීක්ෂණයක්. තව තැනක කම්කරු අයිතීන් ගැන දැනුවත් කිරීමේ ව්‍යාපාරයක්. තව තැනක නාට්‍යයක්. තවත් තැනක සිනමා පත්තරයක්. සිනමා පත්තරේ හුඟාක් සීනිබෝල නිසා මිනිහා නම පාවිච්චි කළේ නෑ. තවත් තැනක විකල්ප දේශපාලන පත්තර පිටුවක් කළා. සිනමා පත්තරේට දිලිප් කුමාර් වෙච්චි මිනිහා විකල්ප පත්තරේට ලියෝන් රංවල වුණා. ඒ දවස්වල ලියෝන් රංවල කියලා මාධ්‍ය හැඳිනුම් පතකුත් තිබුණා.

ඒ කාලේ වාර්තාකරු, විශේෂාංග ලේඛක, මාණ්ඩලික වාර්තාකරු, උප කර්තෘ, සංස්කාරක, ප්‍රධාන උප කර්තෘ, ප්‍රවෘත්ති

කර්තෘ, නියෝජ්‍ය කර්තෘ, කර්තෘ කියලා ක්‍රමයෙන් ඉහළ නැගෙන ක්‍රමයක් මිසක් මාධ්‍යවේදියො කියලා කට්ටියක් හිටියෙත් නෑ. ලියෝන් රංවල නොහොත් සරත් සාන්ත නොහොත් දිලීප් කුමාර් විශේෂාංග ලේඛකයෙක් වුණා.

මනෝරම්‍යාට උවමනා වෙලා තිබුණා කම්කරු අයිතිවාසිකම් ගැන කවුරුවත් නොකරපු විදියෙ වැඩ කරන්න. ඒ ඒවා ගැන ජීවිතේ පූජා කරන තරම් උණකින් හිටිය නිසා තං නෙවෙයි කියලා ගැති ප්‍රසිද්ධියෙම කිව්වා. ඒ කාලෙ ලියෝන් විතරක් නෙවෙයි පොදුවේ ලංකාවෙ පත්තරකාරයො කවුරුත් සම්පත් අහේනියකින් හිටියනෙ. කාටත් පොදුවේ තිබුණේ ප්‍රසිද්ධ සඟරාවලින්, රොයිටර්ගෙන්, හෙම ලැබෙන තොරතුරු විතරයි. වෙනත් හුඟ දෙනෙකුට වගේ ලියෝන් රංවලටත් ටෙලිෆෝන් එකක්වත් කොළඹ කිට්ටුව ගෙයක්වත් තිබුණෙ නැහැ. ඒ නිසා මනෝරම්‍යා හරහා ලැබුණු තොරතුරු මිනිහට පිටුවක් පුරව ගන්න ප්‍රමාණවත් වීම විශේෂ වාසියක් වුණා. ඒ අඳුනා ගැනීම සිද්ධ වුණේ සම්මන්ත්‍රණයකින්. හොඳ උසකුත්, කඩවසම් පෙනුමකුත්, වයසට වැඩි කටකාරකමකුත් තිබුණු මේ ඉලන්දාරියාව මනෝරම්‍යාගෙ මතකයෙ රැඳුණා.

"මං නාට්‍යයක් කරනවා. රිහසල් එකක් බලන්න එන්න." කියලා දවසක් ලියෝන් කිව්වා.

"මගේ හිතෙත් පොඩි වැඩක් තියෙනවා. ඒ හින්ද එන්නං" කියලා මනෝරම්‍යා කිව්වා.

ඒ නාට්‍යයෙ රස්සාවක් හොයා ගන්න බැරුව, ඉන්න තැනකුත් නැතුව, කොළඹ රස්තියාදු වෙන උපාධිධාරීන් දෙන්නෙක් කොළඹ රැඳිලා ඉන්නයි, රස්සාවක් හොයා ගන්නයි ගන්න උත්සාහය පමණට වැඩිය දේශපාලන සටන්පාඨ ස්වරූපයක් තියෙනවා කියලා මනෝරම්‍යාට හිතුණා. පිළියන්දල පැත්තෙ පොඩි පන්සලක බණ මඩුවක පුහුණුවීම් කරන්න කතා කරගෙන තිබුණෙත් සල්ලි හොයාගන තිබුණෙත් චන්දිම ගිරිකුඹුරයි. මිනිහා තමයි ප්‍රධාන චරිතයත්. ලියෝන්ටත් ඒ හා සමාන වැදගත් චරිතයක් තිබුණා. රඟපාන්න බැරි උනත් බොහාම සියුමැලි පෙනුමක් තිබුණු ගෑනු ළමයකුයි පිරිමි ළමයෙකුයි දෙන්නකුත් හිටියා. ඒ චන්දිමගෙ

පෙම්වතියි එයාගෙ මල්ලියි. මේ පෙම්වතී නාට්‍යයෙත් පෙම්වතීමයි.

"අපි ඉක්මනට බඳිමු. සම්බෝලයි බතුයි කාලා ඉන්න වුණාට කමක් නෑ." පෙම්වතී කියනවා.

පෙම්වතා සම්බෝල හදන්න වියදම, බත්වල වියදම ගණන් හදලා පෙන්නනවා රස්සාවක් නැති මිනිහෙකුට තියා රස්සාවක් තියෙන මිනිහෙකුටත් පොල් සුඛෝපභෝගී ආහාරයක් බවට පත් වෙමින් තියෙනවා කියලා.

"ඔයා ගෙනත් දෙන බත් එක තමයි අපි දවල්ට කන්නෙ. රෑට නුගේගොඩ හිඟන්නො ගොඩේ සරම් ඇඳගෙන ඉන්නවා. එතකොට මැරිච්ච මිනිස්සුන්ට පින් දෙන්න ඕන නෝනලා ඇවිත් බත් මුල් දෙන දවස් තියෙනවා. නැත්තං රෑට පන්සලට පයින් යනවා. උදේට පන්සලෙන් හීල් දනෙ ලැබෙනවා."

පෙම්වතිට කතා කරන්න බැරි වෙනවා.

"ඉතිං ඔය විදියට අපිට කවදාවත් කසාද බඳින්න බැරි වෙයි ද කියලා අහන්නවත් බෑ නේද? ඔයා ඕගොල්ලන්ගෙ ගෙදරින් කතා කරන තඩි ඇමතියා බැඳ ගන්න. අපිට රස්සාවල් අරන් දෙන්නත් පුළුවන් වෙයි. හැමදම හොඳ බත් මුල් දෙකක් එවන්නත් ලැබෙයි." උප ප්‍රධාන චරිතය කියනවා.

"ඊට පස්සෙ අපිට බඳින්න පුළුවන් වෙයි ද?"

"ඇත්තට මේ ගෑනුන්ට කසාද බඳින එක ජාතික ප්‍රශ්නෙකට වඩා ලොකුයිනෙ. ඔයාට තියෙන්නෙ කසාද බැඳීම වගේ බොහොම චූල පෞද්ගලික වැඩකට වඩා විශාල කටයුත්තක්."

"තඩි ඇමතියෙකුට යට වෙන එක ද?" පෙම්වතී අහනවා.

"නෑ තඩි ඇමතියාව යට කරන එක."

"නංගි මේකයි වැඩේ..... ඔයා ඌට පුළුවන් තරං හොරකං කරන්න ධෛර්ය දෙන්න ඕන. ඌට ඌරෙකුට වැඩිය මොලයක් තියෙනවාය කවද හරි ජනාධිපති වෙන්න වරම් තියෙනවාය කියලා නිතර දෙවෙලේ කියන්න ඕන." උප ප්‍රධාන චරිතය කියනවා.

"එතකොට මොකද වෙන්නෙ?"

"ඔය ඉන්න ඇමතියො කාටවත් කියන්න බැරි ප්‍රඥාවන්ත කතා විප්ලවකාරි කතා ඌ ලව්වා කියවන්න ඕන. අපි ඔයාට ඒවා හදලා දෙනවා. ඔයා ඌට ඒවා දෙනවා. ඔයාගෙ පෙනුම සියුමැලි උනාට ඔයාගෙ දේශපාලන දැනුම තියුණුයි කියලා ඔය තඩියට හිතෙන්න අරින්න ඕන."

"ඉතිං එයා මං කියන ඒවා අහයි ද?"

"මගේ වස්තුව ඔයා මාව කසාද බඳින්න සුදුසු වෙන්න නං එහෙම තඩි ඇමතියෙක්ව ගොන්තඩියෙක් කරලා ආණ්ඩුව දෙකට බෙදලා ඒ දක්ෂකමින් විපක්ෂෙත් හතරට පළලා එන්න ඕන. ළද බොළඳ කතා බිත්තර ආප්ප වගේ කවන්න ඕන."

"ඌංට තේරිලා මාව මැරුවොත්."

"ඌං ලස්සන ගෑනු මරන්නෙත් නෑ. ලස්සන ඉලන්දරි උනත් මරලා තියා ගන්නවා. බෝනික්කො වගේ හුරතල් කරනවා. කාර් බාර් දෙනවා." උප ප්‍රධාන චරිතය කියනවා.

"මරන්නෙ කාවද?"

"කාවවත් මරන්නෙ නෑ. රට ජාතිය වෙනුවෙන් දිවි පුදන්න කැමති අයට සහාය දෙනවා විතරයි. වීරයො වෙන්න සහාය දෙනවා."

නාට්‍යයෙ තැන්තැන්වල ලියොන්ගේ පිටපතේ දක්ෂකම් මතු වුණත් සිද්ධීන් හරියට ඇමිනිලා තිබුණෙ නෑ. ඒත් මනෝරම්‍යාට හිත උණු වුණා.

පුහුණුවීම් ඉවරවෙලා චන්දිමයි පෙම්වතියයි මෝටර් බයිසිකලේම නැගලා ගියා. අනික් අයත් විසිරුණා. ලියෝනුයි මනෝරම්‍යායි පිළියන්දල හන්දියට ඇවිදගෙන ආවෙ නාට්‍යයෙ අඩුපාඩු කතා කරමින්.

"ඔයා කියන ඒවා මට තේරෙනවා. ඒත් ඉතිං මේක පෙන්න ගන්නවත් ලැබෙයි ද දන්නෙ නෑ." ලියෝන්ගෙ අසරණ අහිංසක අවංක කලාකාර ස්වරයට මනෝරම්‍යාගෙ තරුණ ළමැද උණු වුණා.

"අධෛර්ය වෙන්න එපා. මං ඕකට මොකක් හරි කරන්න බලන්නං."

"කරන්න බැරි උනත් ඔයා ඔහොම කිව්වම හිතට හයියක් එනවා."

"මං හිතාගෙන ඉන්නවා වෘත්තිය අයිතිවාසිකම් ගැන කෙටි නාට්‍ය ටිකක් කරලා ෆෝරම් තියටර් එකක් කරන්න. ඒක එක එක කන්තෝරුවල ෆැක්ටරිවල පෙන්නන්න පුළුවන් වෙන්න ඕන. ප්‍රපෝසල් එක දැම්මා. අපේ ලොක්කා බ්‍රෙන්ඩන් මැක්ලියොඩ් කැමතියි. ඔයා කැමති නං ලබන සුමානෙ මීටිං එකක් දන්න පුළුවන්. ඒකෙන් සල්ලි ආවම මේක ගොඩ දන්න පුළුවං."

"මේ බස් හෝල්ට් එක නොවුණා නං මං ඔයාව උස්සලා වටයක් කරකවලා ඊට පස්සෙ ඔයාව කරේ තියාගෙන සින්දුවක් කිය කියා නටනවා."

"හොඳටම ෂුවර් ද ඔය දුෂ්කර ක්‍රියා කරා වගේ තියෙන කෝටු ශරීරයට මාව උස්සගෙන එච්චර හරියක් කරලා බිම වැටෙන්නෙ කොන්ද කඩා ගන්නෙ නැතුව තෙල් පත්තු ගාන්න නොවී අර මීටිමට එන්න පුළුවන් වෙයි ද කියලා." මනෝරම්‍යා හිනා වුණා.

"දුෂ්කර ක්‍රියා උපාධියක් ගන්න පුළුවන් වුණා. දන් තීති උපාධියකුයි, සමාජ විද්‍යා, එම්. ඒ. කෑල්ලකුයි හිමි කර ගනිමින් තීරු ගාණට, කෑලි ගාණට ආත්මය උගස් කරමින් ඒක නිදහස් කර ගන්න විරේක කර ගන්න නාට්‍යයක් කරන්න හදන නර පතුවෙක් විතරයි උනාට දිව්‍ය පුත්‍රයෙක්ගෙ හයිය මේ කෙසඟ ඉලන්දරියාගෙ පපුවෙ තියෙනවා."

මනෝරම්‍යාට දැනුණා තමන් මේ මිනිහා එක්ක නාට්‍යයක් පටන් ගන්න ඉඩ තියෙන බව. ඒත් ඒකට ඉතිමං බඳින්නෙ නැතුව වෘත්තීය වශයෙන් වැඩ කළ යුතු බවටත් රතු සංඥ දැල්වෙන්න ගත්තා.

"එහෙනං දිව්‍ය පුත්‍රයා මං ඊළඟ බස් එකේ නුගේගොඩ යනවා."

මනෝරම්‍යා ලියෝන් එක්ක කෑමට යන අදහස වෙනස් කරලා බස් එකට ගොඩ වුණා. ලියොන් යන්නෙත් බත්තරමුල්ලටය කියලා ඒ බස් එකට නැග්ගා. ඒත් හිටගෙන ගිය නිසා කතා

කරන්න බැරි වුණා. මනෝරම්‍යාට මතක් වුණේ සුජම්පතිවයි. එයත් කොච්චර කතා කාරයෙක් ද?

සුජම්පතිව කසාද බඳින්නෙ නැතුව එක ගෙදරක හිටිය එක ඒ කාලෙ හැටියට රාජ අපරාධයක් වගේ තමයි. සුජම්පතිත් කොච්චර කවි සින්දු කිව්ව ද?

"රාජ නීතිය නො තකන
මනෝරම්‍යාවෙනි
හදවතේ නීතියට
තවමත් සැක සංකා ද?
මට ඔබ හැර
අන් ළඳුන් නැත
ළඳක ගේ ප්‍රේමයට
මා ආගන්තුක ය
එහෙත් පෙම්වතකු
ස්වාමි පුරුෂයෙකු
සැබෑ සුජම්පතියකු
වන සිහිනය
බොහෝ පරණය"

ඒ කාලේ සුජම්පතිත් ඔය වගේ පිස්සු විකාර කිය කියා දඟලුවා. සුජම්පතිට රසට උයන්න දැනගෙන හිටියා. ඒ හින්ද නිවාඩු දවසට එයා රසට කෑම හැදුවා. පෝය දවසට ගල්කිස්සෙ හරි දෙහිවල හරි වැල්ලට ගියේ එයාම හදපු දඟර ගැහුණු බස්තමක් අරගෙනයි. බස්තම වැල්ලෙ කවි ලියන්නයි. ඒවා එකතු කරා නං පොතක් ගහන්න උනත් තිබුණා.

"සැරයටිය අත් වාරුවක් නෙවෙයි
මේ මගේ පෑනයි
මේ මගේ ලිංගේන්ද්‍රියයි
රළ පහරින් සුළඟින්
මිනිස් පා පහසින්
මැකී යන වැල්ලේ

කවි ලියන්නේ මොට ද?
මේ කවි ලියනවා නො වෙයි
මේ මගේ රමණයයි
පෘතුවිය ද මුහුද ද
මේ වැලි තලා ද
අර පුන්සඳ ද
අඳුරේ දිලෙන තාරකා ද
මනෝරම්‍යා සේ ම
මා බිරියෝ වෙත්
කියව සොඳුරිය
උන් හා උරණ නෑ නො වෙද
උඹට වාගේ ම
උන්ට පෙම් බැන්දට?"

සුජම්පතිගෙ හුළඟවත් එපා කියලා අවුරුදු ගණනාවක් ගත වුණාට පස්සෙත් අර කවිවලට කොච්චර අඬලා ඇද්ද? ඇයි සුජම්පතිට ඒ කවි වෙන්න බැරි වුණේ? තමුන් එයාට අත්වාරු දුන්නා මදි ද? එයාගෙ ප්‍රශ්නෙ තේරුම් අරගෙන ඉවසිලිවන්තව බලා ඉන්න බැරි වුණා ද? ඒ ප්‍රශ්නවලට උත්තර තිබුණෙ නෑ.

මනෝරම්‍යා ලියොන්ට තමන්ගෙ ව්‍යාපෘතියක් ආදයම් මගක් හදලා දීලා ජාත්‍යන්තර සම්බන්ධීකාරක තෝමස් මරේටත් අඳුන්නලා දුන්නා. දක්ෂ මිනිහෙකුට ජීවත් වෙන්න නැගිටින්න අත දෙන්න ඕන කියන හැඟීම ආවෙ සුජම්පතිට අවස්ථාවක් නො දීම ගැන කනගාටුදයක හැඟීමක් ඉතුරු වෙලා තිබුණු නිසයි. ඒක පසුතැවිල්ලක් ම නෙවෙයි. ඒත් මිනිස්සු සර්ව සම්පූර්ණ නැහැ කියන හැඟීමත් ඇති වෙමින් නැති වෙමින් තිබුණා.

"මනරම් මට පිරිමියෙක් වෙන්න ඉඩ දෙන්න. මනුස්සකම කියන්නෙ ඒකයි. මට වෙච්ච් කිසි දෙයක් මගේ උවමනාවට වෙච්ච් දේවල් නෙවෙයි. මාවත් ඔහේ පාවෙලා ආවා. මට පාරෙ හිඟන්නෙක් නොවී ඉගෙනගෙන මිනිහෙක් වෙන්න ඕන වුණා. ඒ ගමනෙදි වෙච්ච දේවල්වලට මාත් කැමති නෑ. ඒත් එක

වැරැද්දකුට මරණ දඬුවමක් පනවලා අපායට යවන එක වැරදියි."

සුජම්පති මනෝරම්‍යාට කතා කළේ මතරම් කියලයි. ඒ වගේ තව නම් ගොඩක් පට බැඳලා තිබුණා. ලියෝන් කතා කරෙත් සුජම්පති වගේ හිත්ද ආකර්ෂණයකුත්, බයකුත්, සැකයකුත් තිබුණා.

ඒ බය තමන්ට රිදෙනවට යි. සැකය ලස්සන වචන දන්න මුබරි පුරුෂයො ගෑනු රවටන්න දක්ෂයි කියන අත්දැකීමයි. ආකර්ෂණය පුරුෂයෙක් නැති ස්ත්‍රියකගෙ හුදකලාවෙ හිස් භූමිය නිරන්තරයෙන් රෝස මල් අපේක්ෂා ඉතිරිව තිබීමයි.

ලියෝන්ට නාට්‍ය මාලාව කරන්න ලැබුණා. යාන වාහන පහසුකම් එක්ක ප්‍රමාණවත් ගෙවීම් හිමි වුණා. එක දවසක් අනුරාධපුරේ වැඩ මුළුවකට ගිහින් රෑ දෙකක් මිරිදිය හෝටලයේ නවාතැන් ගත් දවසක රෑ කෑමෙන් පස්සෙ තිසා වැව ඉවුරෙ ඇවිදිමින් ඉන්න අතර ලියෝන් එක පාරටම මනෝරම්‍යා සිප ගත්තා.

"මේ මොකද පිස්සුද?" කියලා ආපහු හෝටලේට දුවගෙන ඇවිත් කාමරේට රිංගලා දොර අගුලා ද ගත යුතුයි කියලා මනෝරම්‍යාට හිතුණා. ඒත් මනෝරම්‍යා ගල් ගැහිලා බලාගෙන හිටියා.

"දැං ඔයාගෙ හිත මගෙන් මිදිලා දුවන්න කියලා ඔයාට යෝජනා කරනවා ඇති. ඒ ඔයාගෙම හිත නෙවෙයි ඔයයි මමයි හැදුණෙ සුද්දන්ගෙ සුචරිතයෙන් එක ගෙයි කෑම හිටං නූගත් ගෝත්‍රික වැඩක් බවට පත්කරපු පරිසරයකනෙ. මිනිස්සුන්ගෙ කෑම, බීම, අඳුම්, පැළඳුම්, ආගම්, කතා කරන භාෂාව විරක් නෙමෙයි හීන පවා යටත් විජිතකරණයට අහුවෙලානෙ. දැන් ඔයාට ඔයාගෙ පපුවෙ හඬ වගේ ඇහෙන්නෙ ආන්න ඒ අඬ ඇඬියාවයි."

"මං දන්නෙ නෑ. මං යනවා." මනෝරම්‍යා වේගයෙන් ආපහු හැරුණා. ලියොන් ඒ හැරීම බලාපොරොත්තු වෙච්චි කරාටෙ ශිල්පියෙක් වගේ මනෝරම්‍යාගෙ අත තද කරලා නවත්ත ගත්තා.

"අර හඳත් මුවා වුණා අනේ මං ඕවාට නෑ උඹලා කරන්නෙ මේ අනුරාධපුරේ රජවරු බිසෝවරු කුමාරිකාවො කරපු දේ මිසක් අමුතු දෙයක් නෙවෙයි කියලා. මේ වැවත් සාක්කි කියයි සාලිය කුමාරයා විතරක් නෙවෙයි එයාගෙ තාත්තත් ආදරේ කරන්න දැනගෙන හිටියා කියලා." ලියොන් මනෝරම්‍යාගෙ හිස් මුදුන සිපගත්තා.

මනෝරම්‍යාත් කතා සාගරයක් වුණාට ඒ කතාවටත් ගොළු වුණේ සුජම්පතිත් ඒ ජීවිතයට ආවෙ ඒ විදියටම නිසයි. වෙනසකට තිබුණේ ඒක මහ දවාලෙ ගංගා නම් ගඟ ළඟදිත් මේක හඳ පළුවකුත් තරු යායකුත් එක්ක තිසා වැව් කණ්ඩියේ සිද්ධ වීමත් විතරයි. සුජම්පතිව දලා එනකොට දරුවෙක් පිළිසිඳගෙන බව හරියටම දැනගෙන හිටියෙත් නැහැ. ඒත් ඒක දැන ගත්තම ආපහු එයා එක්ක එකතු වෙන්න හිතුවෙත් නැහැ. සුජම්පතිගෙන් වෙන්වීම ගැන වගක් නෑ වගේ හිටියට ගැති ඒ එපා කරපු මිනිහට ආදරේ කරා. කාටවත් කියා ගන්න බැරි විදියෙ විශාල ආදරයකුයි ඒ තරම්ම විශාල කෝපයකුයි මැදයි දරු ගැබ දරාගෙන හිටියෙ. ඒ ආදරේ කරේ අර ලස්සනට මෘදු හඬින් කතා කරපු කවියක් වගේ මිනිහටයි. කුසේ හිටිය දරුවගෙ තාත්තා එයා තමයි. වෛර කරේ සුජම්පතිටත් හඳුරවන්න බැරි විදියට එයා ඇතුළෙ හිටිය වෙන මිනිහෙකුටයි. වෙන්වෙලා ආවෙ තමන් නාඳුරණ ඒ මිනිහාගෙන් විතරයි. ඒක ප්‍රියාටවත් කිව්වෙ නෑ. එයාගෙ අයියා සුනන්දත් ඒ කතාවට ගෑවිලා හිටියනෙ. සුනන්දටත් ප්‍රියාලා දන්න පිළිගත් රාමුවක වැඩ හිටින අයියා බවට පත්වෙලා ඉඳීමෙත් ඒ අයියා නොවන වෙන නර පනුවෙක් වීමෙත් ප්‍රශ්නයක් තියෙන්න ඇති කියන පුළුල් වැටහීමක් මනෝරම්‍යාට නොතිබුණා ම නෙවෙයි. ඒත් කොයි තරම් කරුණු කාරණා අවබෝධ වුණත් රැවටීම, වැරදීම, මෝඩවීම වගේ එක එක වචනවලින් හඳුන්වා ගත් ආත්මානුකම්පාවෙනුත් ගැලවෙන්න බැරි වුණා.

ඒ ආත්මානුකම්පාව හුඟාක් අසරණ දුර්වල හැඟීමක් උනත් ඒක තමයි ඒ රාත්‍රියෙ ලියොන් එක්ක එක යහනක නිද නොගන්න ප්‍රබල බලපෑමක් කරන්න සමර්ථ වුණේ. ලියොන්ගෙ ලස්සන වචනවල මොකක් හරි ව්‍යාජයක් දෙබිඩි තෙබිඩි ස්වභාවයක් ඇති කියල කිව්වෙත් සුජම්පතිගෙන් තුවාල වෙච්චි හිතයි.

එද ඒක එහෙම වුණා කියලා ලියොන් ඇත් වුණේ නැහැ. තමන් ගැන හැමදේම කියන්නත් ඕන නෑ කියලා මනෝරම්‍යාට

හිතුණෙ ඒකට සුදුසු කාලයක් එන තුරු සිටිය යුතුයි කියන හැඟීමෙන් මිසක් ලියොන්ට කිට්ටු වෙන්න උවමනා නොවූ නිසා නොවෙයි. අවිශ්වාස කරාට විශ්වාස කරන්න උවමනාව තිබුණා. ආදරේ කරන බව කටින් නොකීවට ආදරේ කරන්න කැමැත්තක් දුනුණා. සිප ගැනීමට උන්මාදනීය ප්‍රතිචාරයක් නොදැක්කුවට නැවතත් එහෙම දවසක් උදා වෙන්න ඉඩ ඇරලා බලා හිටියා.

සති අන්තයට ගමේ යනවා, දරුවෙක් ඉන්නවා, නීතිමය විවාහයක් නෑ කියලා තමන් ගැන කිව්වෙ නැතත් ලියොන් එක්ක නාට්‍ය බැලීම, පොත් හුවමාරු කිරීම, නාට්‍ය ව්‍යාපෘතිය කරගෙන යාමට අමතරව ලියොන්ට ඉංග්‍රීසියෙන් තීරු ලිපියක් ලියන්න උදව් කිරීමත් සිද්ධ වුණා. ඒක සිනමාව, නාට්‍ය කලාව, පොත්පත් ගැන තීරු ලිපියක්.

"වෙන නමකින් ලියන්න ඕන. නැත්තං මිනිස්සු තරහා වෙනවා." ලියොන් කිව්වා.

"මං ඔයාට නමක් දෙන්නං........ සාෂා කියලා ලියන්න." මනෝරම්‍යා කිව්වා.

"සාෂා.... හරියට රුසියන් කාරයෙක් වගෙයි. ඒක තරක නෑ." කියලා ලියොන් සාෂා වුණා. සාමාන්‍යයෙන් ඉංග්‍රීසි පත්තරවල පළ නොවෙන විදියට සිංහල නාට්‍ය ගැන චිත්‍රපටි ගැන කලාකාරයො ගැන වගේම දේශපාලන කතාත් ඒකෙ පළ වුණා. හැම සතියෙම සඳුදා හවසට මිනිහා මනෝරම්‍යාගෙ කන්තෝරුවට ආවා. සිංහලෙන් ලියාගෙන එන ලිපිය දිහා බලාගෙන මනෝරම්‍යා ඒක ඉංග්‍රීසියෙන් කියාගෙන යනකොට සාෂා ලියා ගත්තා. ඒක ඉවරවෙලා ග්‍රීන්ලන්ඩ්ස් එකට ගිහින් තෝසෙ කාලා නාට්‍යයක් චිත්‍රපටියක් බලලා යන පුරුද්දක් ඇති වුණා.

ඔය කාලෙ තෝමස් මරේ පවත්වපු කොක්ටේල්වලට, රාත්‍රී කෑමවලට එහෙම සාෂාටත් ආරාධනා ලැබෙන්න ගත්තා. මිනිහා තමන්ව සාෂා කියලා අඳුන්වන්න පටන් ගත්තෙ ඒ ඉංග්‍රීසි කතා කරන සමාජයටයි. මරේ හරහා නාට්‍ය වැඩමුළුවලට විතරක් නෙවෙයි වෙනත් සම්මන්ත්‍රණවලටත් ජර්මනියටයි ඉන්දියාවටයි යන්නත් ලැබුණා. ඒ දවස්වල මනෝරම්‍යා හිටියෙ කොහුවල ගේ කෑල්ලක් අරගෙනයි. සමහර දවසට සාෂා ඒ ගෙදර නැවතෙන්නත්

පටන් ගත්තා. ඒත් මනෝරම්‍යා සාෂාට නිදා ගන්න දුන්නෙ සාලෙ ඩිවාන් එකේ මිසක් තමන්ගෙ කාමරේ නෙවෙයි. ඒක ඩිවානයටයි, තව පුටු දෙකකටයි පොත් රාක්කෙටයි විතරක් ඉඩ තිබුණු ලේන්සුවක් තරං පුංචි සාලයක්. කාමරෙත් අල්මාරියයි, ඇඳයි, පොත් මේසෙයි තිබ්බට පස්සෙ හැරෙන්න ඉඩ මදි. කුස්සියෙ නං ඉඩ තිබුණා.

"මාව ඔයාගෙ කාමරේ නිදි කරවගන්න බය ද?" සාෂා විහිළුවට වගේ විහිළුවකුත් නොවෙන ප්‍රශ්නයක් ඇහුවා.

"ඊ වෙච්චි හින්ද නවතින්න කිව්වට ඇඳේ නිදි කරවගන්න හිතුවෙ නෑ හලෝ." කියලා මනෝරම්‍යාත් සැරකුත් නැති විහිළුවක්මත් නොවන උත්තරයක් දුන්නා.

මනෝරම්‍යා දැනගෙන හිටියා කිසියම් අවස්ථාවක තමන්ගෙ හිත දුර්වල වෙන්න පුළුවන් බව. සාෂාගෙ ඇසුරෙ ප්‍රිය ගතිය විඳින්න උවමනා වෙච්චි මහ පාළුවකුත් තිබුණානෙ. ඒත් ඒක ප්‍රේම සම්බන්ධයක් නොවිය යුතුයි කියන සිහි කල්පනාවත් පවත්වාගෙන යන්න ගැනී ධෛර්ය ගත්තා.

චන්ද්‍රිම ගිරිකුඹුර පවා හිතුවෙ මොකක් හරි විශේෂ ඇලීමක් බැඳීමක් ඇති කියලයි. එහෙම දෙයක් ඇති කර ගන්න සාෂාගෙ නං සූදානමක් තිබුණා. මනෝරම්‍යා ඒකට පසුබෑවත් මිත්‍රකම අත අරින්න ලෝබ හිතුණා. ඔය විදියට අවුරුද්දක් විතර ගෙවුණා. සාෂාගෙ නාට්‍ය නං දිව්වෙ නැහැ. ඒත් මනෝරම්‍යලගෙ ආයතනයට වාර්තා වැඩ සටහන් හදන වැඩේ දිගටම ගියා. මනෝරම්‍යා ඒවාට අදහස් දුන්නා. තිර රචනය නැවත සකස් කළා. සංස්කරණ ශිල්පියා ළඟට වෙලා නිදි මරමින් තමන්ට අවශ්‍ය රූප රාමු තේරුවා. ඒත් ඒවාට තමන්ගෙ නම ද ගන්න උනන්දුවක් තිබුණෙ නෑ. ඒක රාජකාරියෙ කොටසක් හැටියටයි සැලකුවෙ. මරේ දැනගෙන හිටියා මනෝරම්‍යා විශාල වැඩ කොටසක් කරනවා කියලා. නමුත් සාෂාට තමයි නම්බුව ලැබුණෙ. එක වාර්තා චිත්‍රපටියකට ජාත්‍යන්තර සම්මානෙකුත් ලැබුණා.

"මහ මුහුද අපි හැමදම මේවගේ ඉමු. අපි දෙන්නට කවද හරි ලස්සන ෆිල්ම් එකක් හදන්න පුළුවනි." සාෂා මනෝරම්‍යාව ඇතින් උස්සගෙන වටයක් කරකවමින් උද්දාම වුණා. ඒ දවස්වල

මිනිහා මනෝරම[illegible] කියලයි. ඒ නොසිතූ නිර්මාණ උල්පතක් තියන අදහසින්.

මනෝරමය සාෂාගේ කතාවට ඇසුරට ප්‍රිය වුණාට සම්පූර්ණ විශ්වාසය තියලා නැමදෙම තියන්න ගියේ නැහැ.

"මගේ ජීවිතේ පැත්තක් කඩා වැටුණා. හැබැයි ඒ ගැන අහන්න එපා." කියලා විතරයි කිව්වෙ.

සාෂාටත් ලෝකෙ හිටිය එකම ස්ත්‍රී රත්නය මනෝරමයා විතරක් නොවන නිසා ඒ අනවශ්‍ය කුතුහලවලින් හිත කරදර කර ගත්තෙ නැහැ.

"මය ගැනි තියම ධන යෝගයක්නෙ." කියලයි චන්ද්‍ර ගිරිකුඹුරත් කිව්වෙ.

ඔය කාලෙ මනෝරමයාට ආරාධනා ලැබුණා ඉන්දියාවෙ ඉඳලා වගා දේශ සීමාව හරහා පකිස්ථානයට යන සාම යාත්‍රාවකට එකතු වෙන්න. ගෙවල් අයිතිකාරයොත් පිටරට ගිහින් නිසා සාෂාට යතුර දීලා ගියා රෑට නවතින්න කියලා. මනෝරමයා ගිය ගමන නොසිතූ විදියට අවලංගු වුණා. ඒ නිසා කලින් ආවා. කටුනායක ඉඳලා ටෙලිෆෝන් කරෙත් නෑ. සාෂා නිද ගන්නෙ හොඳටම ර වෙලානෙ.

නිදන කාමරේ ආලෝකය තාප්පෙ අයිනෙ බිම් තීරුවට වැටිලා තිබුණා. මනෝරමයා බෑග් එකත් පිටේ එල්ලගෙන තාප්පෙ අයිනෙ පටු බිම් තීරුව දිගේ ගෙට යන්න ගියෙ ඇත්තෙන්ම සාෂා පුදුමයට පත් කරන්න ද නැත්නම් පූර්ව අත්දකීමකින් උරුම වෙච්චි සැක සංකාවලින් අත් වුණු මෙහෙයුමකින් ද කියලා ඒ භූමිකම්පා රාත්‍රියෙදිවත් මනෝරමයාට හිතා ගන්න බැරි වුණා.

ඒ පැත්තෙන් විශාල තාප්පයක් තියෙන නිසා කාමරය ඇතුළත කාටවත් පේන්නෙ නෑ. ඒ නිසා මනෝරමයාත් රස්නෙ දවසට ජනේල ඇරගෙන නිද ගත්තු අවස්ථා තිබුණා. සාෂා නං ජනේලෙ ඇරගෙන ජනෙල් කණ්ඩියට පයකුත් තියාගෙන අඳේ දිගාවෙලා පොතක් කියවනවා ඇති කියන හිතුවිල්ලත් නො තිබුණාම නෙවෙයි.

ඒත් ජනෙල් කණ්ඩිය උඩ තියෙන පයේ ඇඟිල්ල අල්ලලා

සාෂා බය කරවන්න ලැබුණෙ නැහැ. මනෝරමයාටයි බය වෙන්න සිද්ධ වුණේ.

ඇඳ උඩ නිරුවතින් හිටියෙ සාෂයි මැදි වියේ ගැනියෙකුයි. ඒ කවුද කියලා එක පාරට අඳුනා ගන්න බැරි වුණා. මනෝරමයා නිහඬව පස්සෙන් පස්සට ගිහින් පොඩි ගේට්ටුවෙ අගුලත් පන්න ගත්තෙ යාන්තමටවත් සද්ද නොවෙන්නයි. මනෝරමයා ඒ විදියෙ අත්දකීමකට මුහුණ දීපු පළවෙනි වතාව නෙවෙයිනෙ. පළවෙනි වතාවෙ නං මනෝරමයා ඇඬුවා. බැන්නා. කලබල කළා. සුජම්පතිගෙයි සුනන්දගෙයි ඇඳුම් විසි කරා. ඒත් මේ දර්ශනයෙන් පස්සෙත් පස්සට ගිය ගැනි නිහඬව ඉස්සරහා දෙර ළඟට ගිහින් පඩිය උඩ වාඩි වුණා.

සුජම්පති එක්ක කෝප වෙන්න අයිතියක් තිබුණාට සාෂා එක්ක කෝප වෙන්න අයිතියක් නැහැනෙ. විවාහ ගිවිසුමක් තිබුණෙත් නෑ. හරි හමන් ප්‍රේම සම්බන්ධයක් තිබුණෙත් නැහැ. පුරුෂ ලිංගික ආකර්ෂණයක් නැත්තෙමත් නැති ඇත්තෙත් නැති අමුතු යාළුකමක්නෙ තිබුණෙ. තනිකඩයෙකුට ගේ බාර දෙනකොට ඒ මිනිහා එක රැයකට ගෑනියෙක් එක්කත් එන්න ඉඩ තියෙන බව තේරුම් ගන්න ඕනනෙ.

මනෝරමයා පිටේ එල්ලන් හිටිය බෑග් එක මල් පඳුරක් යට හංගලා හඬ නොනැගෙන්න ගේට්ටුව විවර කරගෙන ගිහින් කොහුවල හන්දියෙ කඩේකින් ගෙදරට ටෙලිෆෝන් කරා. ඒ කාලෙ හැම මිනිහම ජංගම දුරකතන පාවිච්චියක් තිබුණෙ නැහැනෙ.

"මං මග ඉන්නෙ දූං ගෙදර එනවා."

"ඔයා අද නෙවෙයිනෙ එනවා කිව්වෙ."

"මං දූං එනවා. මේ කොහුවල ඉන්නෙ. " කියලා මනෝරමයා ටෙලිෆෝන් එක තිබ්බා.

සාෂා ගේට්ටුව ළඟ හිටියා. කිසි අමුත්තක් නැතුව හිනාවෙමින් ඉඳියි කියලා මනෝරමයා බලාපොරොත්තු වුණේ නෑ. ගෑනි පේන්න හිටියෙ නෑ. "කාමරේ හිටිය ඇන්ටි කෝ?" කියලා අහන්න යෑ.

"මේ මොකද? කෝ ඔයාගෙ බැක් පැක් එක?" ගෑනි නිහඬව

ගෙට ගියා. ඇඳ රෙද්ද ගුලිකරලා බිමට විසි කරා. කොට්ට උර දෙකත් ගැලෙව්වා. සාෂා පුදුමවෙලා බලාගෙන හිටියා. එයාට එහෙම ඉන්න ඇරලා පිටි පස්සෙ දෙර ඇරගෙන ගිහින් මල් පඳුර යට හංගලා ගිය බෑග් එක ගෙට ගෙනාවා. සාෂා මෝඩයෙක් නෙවෙයිනෙ. ඕනවටත් වඩා මොලේ තියෙන එකනෙ ප්‍රශ්නෙ එයා සද්ද නැතුව ඇඳ ගත්තා.

"මං හිතුවෙ නෑ ඔයා මේ වගේ පල් ගෑනියෙක් කියලා."

මනෝරම්‍යාගෙ ඇඟ වෙව්ලන්න ගත්තා. ඒත් ගෑනි හයියෙන් හිනා වුණා.

"ඔයා මට බොරු කියලා කලින් ආවෙ මගේ හොර අල්ලන්න ද? කෝ අල්ල ගත්ත ද? අල්ලපු ගෙදරත් එක්කලා බලා ගත්තට ස්තුති කරන හැටි හරිම අශෝභනයි."

ගෑනි කලින්ටත් වඩා හයියෙන් හිනාවෙන්න ගත්තෙ ඉතා ඉක්මනින් ඇඬෙන්න ඉඩ තියෙන බවත් දැන දැනමයි. ඒත් සාෂා නොහොත් ලියොන් නොහොත් සරත් ශාන්තට ඒ සතුට විඳින්න ඉඩ දෙන්නෙ මොකට ද? තමුන් දැකපු දේ කිව්වත් "ඔයාට විශාල වැරදීමක්. එහෙනං ඔයාට තිබුණෙ එවෙලෙම අපිට කතා කරන්න." වගේ දෙයක් කියන්න ඉඩ තියෙන බවත් දැනුණා. සාෂා එක්ක කතා කරන්න දෙයක් ඉතුරුවෙලා නැහැනෙ. ඒත් ඒ ඊ එළියට බහින්න කියන්න යෑ. සාෂාටත් තමන්ට පාලනය කර ගන්න බැරි මානසික ආවේගයක් දරුණු හුදකලාවක් තියෙනවා වෙන්න බැරි ද? මනෝරම්‍යාට හිතුණා ටික වෙලාවක් නිහඬව ඉඳලා හිත සන්සුන් වුණාම කතා කරන්න.

"ඔයා ඇඳ ගත්තෙ යන්න ද?"

"නැතුව ඔයා ළඟ දණ ගහලා පාපොච්චාරණය කරයි කියල හිතුව ද?"

මනෝරම්‍යා ඉන්දියාවෙ යන්න කලින් සාෂා කියලා තිබුණෙ

"ඔයා මට ගේ බාර දෙන්න තරං විශ්වාස කරාට ජීවිතේ බාර දෙන්න තරං විශ්වාස කරන්නෙ නැත්තෙ ඇයි? මේ පාර ඔයා ආවම අපි තව ටිකක් අපි ගැන කතා කරමු." කියලයි.

එහෙම කියන්න හේතු වුණේ මනෝරම්‍යා කොළඹ කිට්ටු නිවාසයක් සල්ලිවලට ගන්න හිතමින් හිටි නිසයි. සාෂා කිව්වා ඒ ගෙදර කාමරයක් එයාට වෙන් කරන්න කියලා. ඒත් මනෝරම්‍යා ඒකට හරි උත්තරයක් දුන්නෙ නැති හින්ද "ඔයාට මං ගැන විශ්වාස නෑ. හැම වෙලාවෙම මාව කොන්කරන්න හදනවා." කියලා චෝදනා කරමින් හිටියා. මිනිහා එහෙම කොළඹ පසුබිමක් හද ගන්න ගැලපෙන අය හොයමින් හිටියා වෙන්න බැරි ද?

"ඉන්න මං කැබ් එකකට කෝල් කරන්නං." මනෝරම්‍යා සන්සුන් ස්වරයෙන් කතා කළා.

"ඕන නෑ. පාරේ ත්‍රීවිලර් තියෙනවා. පාරේ පයිප්ප තියෙනවා. අගුපිල් තියෙනවා. මට ඇස් පේනවා."

හොඳටම තරහෙන් වගේ හයියෙන් කතා කරාට ඒක ලැජ්ජාව මකා ගැනීමේ ක්‍රමෝපායක් වග මනෝරම්‍යාට දැනෙන්න ගත්තා. ඒ නිසා කෝපයට කෝපයෙන් ප්‍රතිචාර නොදක්වා ශෝකී සිනාවකින් සාලෙ මැද හිටගෙන බලා ඉන්න මනෝරම්‍යාට පුළුවන් වුණා. සාෂා කොයිතරම් නිරවුල් මනසින් හිටිය ද කිව්වොත් ඇඳුම් පැළඳුම් අහුර ගත්තෙ ඇඳ උඩ දිග ඇරලා ක්‍රමානුකූලව නවලයි. නාන කාමෙරේ තිබුණු කොළ පාට මිටක සුදු දත් දෙකක් පෙන්නගෙන ඉන්න හා පැටියා සහිත දත් බුරුසුව පවා ගත්තට පස්සෙ මිනිහා දෙවෙනි වතාවටත් නාන කාමරේට ගියා තව මොනවා හරි අමතක වෙලා ද බලන්න.

සාෂා ආපහු හැරී නො බලා පිට වුණා. මනෝරම්‍යා පස්සෙන් ගිහින් ගේට්ටුවෙ අගුල දැම්මා.

"ගුඩ්නයිට්" කියන්න යෑ.

"තැන්ක් යූ" කියන්න යෑ.

ගෑනි ගෙට ඇවිත් ඇඳ රෙද්දයි කොට්ට උරයි බිමට දල ඒවා කොස්සෙන් තල්ලු කරගෙන ගිහින් ගෙයින් පිටත සිමෙන්තියට දැම්මා. ටික වෙලාවක් බලා ඉඳලා ඒවා ගේට්ටුවෙන් පිටට වීසි කළා. ඒ වෙනකොට කඳුළු උනමින් තිබුණා. ඒත් ගෑනි හිත තද කරගෙන ගේ අස්කරන්න ගත්තා.

කුස්සියෙ පොඩි මේසෙ උඩ සාෂා තේ බොන තිල් ඉරි ජෝගුවයි, මනෝරමා විතාවක් සිංගප්පූරුවෙන් ගෙනාපු චිත්‍ර භූමි දර්ශනයක් සහිත සුදු ජෝගුවයි තිබුණා. ඒකෙ චීන කවියකුත් තියෙනවා. චීනෙ යාළුවෙකුට ඒක පිටපත් කරලා යවලා තේරුම දැන ගන්න ඕන කියලා සාෂාටත් කියලයි තිබුණෙ. ඒ ජෝගුවෙ දුඹුරට හුරු රතු තොල් සායම් පැල්ලමක්. මේසෙ උඩ පිඟානකුත් තිබුණෙ දෙන්නා මොනවා හරි එක පිඟානෙ කාලා වගෙයි. මනෝරමා කුණු බාල්දිය ඇරලා බැලුවා. "ෆුඩ් වේව්ස්" ඉටි කවරත් කාඩ් බෝඩ් පෙට්ටිත් තිබුණා.

ගැනි සෑහෙන ගණනක් දීලා ගත්තු සිංගප්පූරු ජෝගුවයි, තිල් ඉරි ජෝගුවයි දෙකම ගෙනියලා පිටත ගේට්ටු කණුව උඩින් තිබ්බා. එන එන දවසට සාෂා ජෝගුවෙ කවිය කියවනවා කියලා විකාර කියවලා මනෝරමාව කොච්චර හිනස්සලා තියෙනව ද?

"මෙකෙ තියෙනවා ඇත්තෙ මේ කන්දට නගින්න බැරි වුණා ට ගඟ කන්දත් අරගෙන මුදට යනවා කියලා වෙන්නැති. කන්ද දන්නෙත් නැතුව ගඟත් එක්ක යනවා."

සාෂා එහෙම කියපු දවසක මනෝරමා ජෝගුව උදුරලා ඒක සාෂාට වඩා හොඳට කියන්න උත්සාහ කළා.

"නෑ...... නෑ..... මේකෙ ඇත්තෙ මේ කන්දෙ තේ පඳුරුය - දිය කඳුරුය - කන්ද සීතලය - කන්දෙ තේ සීත මකනවය කියලා වෙන්නැති."

"නෑ.... නෑ..... මේකෙ තියෙන්නෙ ගඟ රෑ තිස්සෙ අඬන්නෙ කන්ද නගින්න පාර පේන්නෙ නෑ කියලයි. ඉර පෑව්වම ගඟට කන්ද පහුකරලා අහසටම යන්න පුළුවන් කියල කන්ද කියනවා." සාෂා ජෝගුව උදුරගෙන තවත් අර්ථකථනයක් සැපයුවා.

ඒ ජෝගුවෙ අර ගෑනිට තේ බොන්න දුන්නෙ මොකට ද කියලා අහන්න ලබුණෙ නැහැනෙ. ඇහුවත් වැඩක් තියෙනව යැ. ඔයාට පිස්සුද මොන ගෑනියෙක්වත් හිටියෙ නෑ - හිතෙන් මවා ගත්තු දේවල් කියලා කියන්න පුළුවන් මිනිහෙක්නෙ.

මනෝරමා ජෝගු දෙකම අඬුවලින් අල්ලගෙන ගේට්ටු කණුව උඩින් තිබ්බෙ මැරිච්ච මීයො දෙන්නෙක් ගිහින් දනවා

වගෙයි. ඒත් පහුවෙනිද හවස් වෙනකොටවත් කවුරුවත් ඒවා අරගෙන තිබුණෙ නැහැ. කුණු ලොරිය ආවම මනෝරමා කෑ ගහලා කිව්වා ජෝගු දෙකත් ගන්න කියලා. ඒත් ඒවා ගන්නවා බලන්න රැඳුණෙ නැහැ.

සාෂා ගැන අම්මට කියන්නවත් වෙනත් යාළුවො වගේ මිනිහව ගමේ ගෙනියන්නවත් කටයුතු නො කිරීම ගැන නං මනෝරමාට සැනසීමක් දැනුණා. ඒකට කලබල නො වුණෙ සුජම්පතිගෙ සිද්ධියෙන් හුඟාක් කම්පාවෙලා කිසි කෙනෙක් විශ්වාස කරන්න බැරි මනසකින් හිටි නිසයි. නමුත් තව දෙතුන් මාසයක් ගෙවුණා නං ඒකත් සිද්ධ වෙනවා. මනෝරමාගෙ හිතේ පසුබෑමක් තිබුණානෙ. සාෂාට කොච්චර ප්‍රිය වුණත් එයා ඒ පෙන්නුම් කරන මිනිහම නෙවෙයි කියන හැඟීම් මාත්‍රයකුත් හැම වෙලාවෙම තිබුණා.

"මිනිස්සු විශ්වාස කරන්න පුරුදු වෙන්න. මිනිහෙකුට ආදරේ කරනවා කියන්නෙ සද් භාවයෙන් කටයුතු කිරීමයි." සාෂා නිතරම කිව්වා.

"මං සද් භාවයෙන් තමයි මං රස්සාව කරන තැනටත් ඔයාව එක්කන් ගිහින් අඳුන්නලා දුන්නෙ."

"ඒ සේරම හරි. ඒ උනාට ඔයාගෙ යටි හිතේ සැකයක් තියෙනවා. ඒ මං ගැන නෙවෙයි. ඔයාගෙ ජීවිතේ අවසාන පුරුෂයා ගැන වෙන්නැති. ඒත් එක මිනිහෙක් කළ වරදකට තව මිනිහෙකුට දඬුම් දීම වැරදියි."

"බහු වචනයෙන් කියන්න එපා. නාම එකම එක මිනිහයි ළඟින් ආශ්‍රය කරේ. ඒ කතාව කියන්න අමාරුයි. ඒ ඉතිහාස කතාවලින් දැන් වැඩක් නෑ."

සාෂා ඒ උත්තරෙන් සෑහීමකට පත්වෙලා හිටියා මිසක් ඒ මිනිහා කව්ද කියලා කවදාවත් හරස් ප්‍රශ්න ඇහුවෙ නැහැ. වර්ණසිංගෙ ළදරු පින්තූරත්, අම්මගෙයි, තාත්තගෙයි පින්තූරත් තිබුණු නිසා ඒ පවුලෙ අය කියන එක දැනගෙන හිටියට ඒ ගැනත් ඇහුවෙ නැත්තෙ ඒ කතා කියන දවසක් එයි කියන විශ්වාසය නිසා ද නැත්නම් ඒවා එයාට වැදගත් නැති නිසා ද කියලා නං මනෝරමාට හිතා ගන්න බැරි වුණා. සාෂාත් තමන්ගෙ ඉතිහාසය කියන්න උනන්දු

වුණේ නැති නිසා මිනිහට අනිත් එක්කෙනාගෙ විස්තරත් ගැඹුරට හොයන්න ප්‍රස්ථාවක් ලැබුණෙ නැහැ.

සාෂා නැවත ටෙලිෆෝන් කරෙත් නැහැ. මනෝරම්‍යා ගමේ ගිහින් අම්මයි දුවයි එක්ක විවේකිව හිටියා. උණ හැදුණා කියලා කන්තෝරුවට කිව්වා. ඒ කාලෙ ගමේ ගෙදරට ටෙලිෆෝන් තිබුණෙත් නැහැ. ලංකාවෙ සාමාන්‍ය මිනිස්සු ජංගම දුරකථන භාවිතයක් තිබුණෙත් නැහැ.

සාෂාගෙ පැත්තෙන් වැරැද්දක් වෙලා නැහැ කියන එකත් මනෝරම්‍යාට හිතෙන්න ගත්තා. තමන්ට ඒ තරම් ශෝකයක් කම්පනයක් ඇති වුණේ තමන් සාෂාට ප්‍රතිචාර දක්වන්න සැරසෙමින් හිටිය හින්දයි කියන ලැජ්ජාව දැනෙන්න ගත්තා.

මනෝරම්‍යා ආපහු කන්තෝරුවට ගියෙ සුමානෙකට පස්සෙයි. මරේ කිව්වා සාෂාව පූර්ණකාලීනව වැඩට ගමු කියලා. එතෙක් දවස් වර්ණනා කළ මිනිහා එක්ක වැඩ කරන්න කැමැත්තක් නෑ කියන්න යෑ.

ඒ දවස්වල එංගලන්තෙන් පර්යේෂණ ව්‍යාපෘතියකට ආපු බ්ලොසම් ඇඩම්ස් එක්කත් සාෂා ළඟින් සම්බන්ධයක් තියෙනවා කියලා ආරංචි වුණා. නමේ අර්ථයටම ගැලපෙන මල් පොහොට්ටුවක් වගේ කෙල්ලෙක්. එද රෑ දැකපු කෙනා කවුද කියලා මනෝරම්‍යා කවදාවත් දැනගත්තෙ නැහැ.

"කොලම් එක ලියන්න එනව ද?" කියලා මනෝරම්‍යා ඇහුවෙ නෑ. ඒ වෙනකොට සාෂාට කැඩිච්ච ඉංග්‍රීසියෙන් ලියලා ඒක බ්ලොසම්ට කියලා සකස් කරගන්න පුළුවන්කමක් තියෙන්න ඇතිනෙ.

සාෂා කිසි අමුත්තක් නැතුව වගේ වෘත්තීය මට්ටමෙන් කතා කළාට තනි වුණාම දෙන්නාම ගොළු වුණා. කෑම කාමරේදිවත් තනි නොවන්න මනෝරම්‍යා උත්සාහ කළා.

"අපි මේ නාට්‍ය ව්‍යාපෘති රේඩියෝ ප්‍රෝග්‍රෑම්ස් සේරම සාෂාට දෙමු නේද?" කියලා මරේ කිව්වෙ මාසික රැස්වීමෙදියි. මනෝරම්‍යාට දැනුණෙ ඒක තමන් ආසාවෙනුත් ඉතාම සාර්ථකවත් කළ වැඩක් උදුරා ගැනීමක් හැටියටයි. ඒත් රැස්වීමෙදි මනෝරම්‍යා

විරෝධය පළ කළේ නෑ.

"මං ඒ කමිටියෙන් අහක් වෙනවා." කියලා මනෝරම්‍යා සතියකට පස්සෙ කිව්වා.

"ඔයා නැතුව කොහොම ද? සාෂාට ඒකෙ වාර්තා හදන්න අරමුදල් හොයන්න තේරෙනවා මදි." කියලා මරේ කිව්වා.

"එයා ඒවා ඉගෙන ගනියි." කියලා මනෝරම්‍යා දැඩි තීරණයක හිටියා.

ඊට පස්සෙ සාෂා ව්‍යාපෘතියට යෙදවිය යුතු මුදල් වෙනත් නාට්‍යවලට දනවා කියන චෝදනාව නැගෙන්න ගත්තාම මනෝරම්‍යා මැදිහත් වුණේ නෑ. සාෂායි මරෙයි අතරත් අමුතු විදියක සම්බන්ධයක් තියෙනවා කියලා ආරංචි වුණා. මනෝරම්‍යා ඒක විශ්වාස කරන්න කැමති නො වුණත් අවිශ්වාස කරන්නත් බැරි තමට සාෂා බලවත් වෙන්න ගත්තා.

"මරේ සාෂාගෙ තේලම් අහනවා."

"මරේ වැඩ කරන්නෙ සාෂාගෙ උපදෙස් හැටියටයි." කියලා කෑම කාමරේදි ඇහෙන්න ගත්තා.

වෙනත් කෙනෙක් යා යුතු ජාත්‍යන්තර වැඩමුළුවකට සාෂා යවන්න මරේ තීරණය කළ වෙලාවෙ නං මනෝරම්‍යා ප්‍රසිද්ධියෙම විරෝධය පෑවා. ඒ පාර අනිත් අයත් ඒ මතයෙම හිටිය නිසා සාෂාට ඒකට යන්න බැරි වුණා

"කිඹුලා කනවා ඉවසතැකි. කොහිල කටු ඇනෙනකොටයි අමාරු" සාෂා මිත්‍රශීලී විදියට මනෝරම්‍යාට කිට්ටුවෙලා රහස් ස්වරයෙන් එහෙම කිව්වෙ පුපුරු ගහන කෝපයෙන් වග මනෝරම්‍යාට දැනුණා.

"නිවැරදි දේ වෙනුවෙන් පෙනී හිටින කොට යාළු මිත්‍රකම් බලන්න බෑ." මනෝරම්‍යා සාෂාගෙ ඇස් දිහා කෙලින් බැලුවා.

"ඔයාගෙ ඇස්වල ගින්දර" සාෂා හිනා වෙන්න උත්සාහ කළා.

"මතුපිට ගින්දර සුන්දර - දිය යට ගින්දර අසුන්දර"

මනෝරමා [illegible] හිතාවකින් [illegible].

"ඔයා නරක මූඩ් එකක ඉන්නෙ. පසුබසිමි. වෙද්දනා ප්‍රතික්ෂේප කරමි." කියාගෙන සාෂා මරේගෙ කාමරය පැත්තට ගියා.

මනෝරමා පත්තරේ බලන්න ගත්තෙ වෙන රස්සාවක් හොයා ගන්න හිතමින්.

ඒ දවස්වල සාෂායි චන්දන ගිරිකුඹුරයි නාට්‍යයක් කරමින් හිටියා. ඒකෙ සාෂා රඟපෑවෙ ඇමතියකුගෙ උපදේශක චරිතයක්.

"මට මාව එපා වෙලා තුඟක් කල්. ඒ වුණාට මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන අටම්පහුර පදින වැඩේ අතාරින්න බෑ මාවත් ගිලෙනවා." උපදේශක චරිතය පත්තරකාරයෙකුට කියනවා.

"ඉතිං ඕක අතෑරලා ගොඩට පීනලා පයින් යනවකො." පත්තරකාරයා උපදෙස් දෙනවා.

"පයින් යන්න බෑ. මං ආපු පාර දිගටම අසූචියි ගූඩාලුයි වැටිලා. දිය වත්තාවෙම පීනනවා මිසක් වෙන ක්‍රමේකට ජීවත්වෙන හැටි දැන් මතකත් නෑ."

"පයින් යන්නෙ මොකට ද බස්වල කෝච්චිවල යනවකො."

"අපේ ඇමතිතුමා දියවත්තාවට ආවත් හරි අපිට ආසාවට බස්වල කෝච්චිවල යන්න බැරි වුණානෙ." උපදේශකයා කියනවා.

ඒ නාට්‍ය බලපු කන්තෝරුවෙ මිනිස්සු කියන්න ගත්තා නාට්‍යයකදි හරි සාෂා ඇත්ත කියනවා කියලා. ආරාධනයක් තිබිලත් මංගල දර්ශනයට නොගිය මනෝරම්‍යාටත් ඒක බලන්න හිතුණා.

ඒකෙ එක දේශනයක සාෂා මල් මල් අමුඩයක් ඇඳගෙන රෝස පාට ටයි එකකුත් බැඳගෙන වේදිකාව මැද ලී අට්ටාලයක පැද්දි පැද්දි කෑ ගහනවා.

"මට මේ රෝසමල් අමුඩෙ එපාවෙලා තියෙන්නෙ. මට ඕන හරි හමන් පිරිමියෙක් වෙන්න. සේනාධිපතියෙක් වෙලා ඇතෙක් පිටේ යන්න. මට ඕනෑ හර්ද සාක්ෂියයි ඔළුවයි විතරක් පාවිච්චි කරන සැබෑ වීරයෙක් වෙන්න."

ඒ දර්ශනය මැදදි මනෝරම්‍යා නැගිටලා ආවා. ඒ මොහොතෙ එයාට මතක් වුණේ සුජම්පතිගෙ අවසාන ආයාචනයයි.

"ආයෙ කවදාවත් ඒ වගේ දෙයක් වෙන්නෙ නෑ. මට පිරිමියෙක් වෙලා සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න ඉඩ දෙන්න." කියලා සුජම්පති කියද්දිත් ඒක අහන්න බැරි තරහාවකින් පුපුරපු හැටි භූමිකම්පාව සිද්ධ වෙච්චි රාත්‍රිය දක්වාම මනෝරම්‍යාට අමතක වුණේ නෑ.

"ඔයාගෙ දරුවා බලන්න එන්න." කියලා ප්‍රංශෙට ලියුමක් දන්න හිත දුන්නෙ නැත්තෙත් ඒ රිදීම සමනය වෙලා නො තිබුණු හින්දයි. සාෂාගෙ නාට්‍ය බලලා ඇවිත් මනෝරම්‍යා ඇඬුවෙ සුජම්පති වෙනුවෙන්. ඒත් මිනිහා ඉන්න තැනක් හොයාගෙන එකතු වෙන්න ඕන කියන හැඟීම නං ඇතිවුණේ නෑ. තමුන් නාට්‍ය බලන්න ආවා කියලා මනෝරම්‍යා සාෂාට කිව්වෙ නෑ.

වෘත්තීය අවශ්‍යතාවලදි හැර වෙනත් කතා නැති වෙන තරමට සාෂායි මනෝරම්‍යායි ආගන්තුක වෙමින් හිටියා. ඔය අතර සාෂා ජර්මන් සංවිධානයකින් සල්ලි අරගෙන ජන ඇදහිලි ගැ සමීක්ෂණයක් කරන බව ආරංචි වුණා. මනෝරම්‍යා තමයි ඕ සමීක්ෂණයෙ අදහස සාෂාට මුලින්ම කිව්වෙ. දෙන්නා එකට කරන්න හිටිය වැඩේට යෝජනාව ලියලා තිබුණෙත් නම් දෙකම දලායි. ඒත් සාෂා ඒක තමන්ගෙ තනි අදහසක් හැටියට යවපු බව මනෝරම්‍යා දැන ගත්තෙ හංසිනි මාලගමුවෙගෙන්. හංසිනී ඒක කිව්වේ සාෂා ගැන වර්ණනා කරමින්.

එදයින් පස්සෙ මනෝරම්‍යා සාෂාගෙ මූණ බැලීමත් අත් ඇරියා. "අපි මැරෙනකල් මේ විදියට ඉමු. ඔයාගෙ ජීවිතේ මට බාර දෙන්න බය නං අපි දුක සැප බෙදගෙන එක ගෙදරක ඉමු." කිය කියා හිටිය මිනිහා සමීක්ෂණයක් වගේ දෙයකට එහෙම වංචා කළාම කෝපවෙලා කලබල කරන එක නිෂ්ඵලයිනෙ. ප්‍රියා නිවාඩුවකට ලංකාවට ආවම මනෝරම්‍යා ඒ විස්තර ප්‍රියාට කිව්වා.

"වෙන රස්සාවක් නැතුව හරි ඔය මිනිහාට ඕන නාඩගමක් නටන්න දීලා ඔයා අයින් වෙන්න." කියලයි ප්‍රියා කිව්වෙ.

"මේක හරියට ඔටුවා කූඩාරමට රිංගුවා වගේ වැඩක්නෙ."

"ඒවා එහෙම තමයි. යූ. එන්. එකේ පවා වැඩ සිද්ධ වෙන්නෙ එහෙමයි. සමහර විට ඔය මිනිහා මරේගේ පෙම්වතියි හංසිනිගෙ පෙම්වතායි බිලොසම්ගෙ යහන් ගබඩා නිලමෙකමයි කියන චරිත දෙකම සාර්ථකව රඟපානව ද දන්න නැහැනෙ."

ප්‍රියා ගමකට හිනා වෙවී සැහැල්ලුවෙන් කතා කරාට මනෝරම්‍යාට හිතුණෙ සාෂා ඉන්නෙ ඒ විදියෙ අවුලක නං ඒකෙන් ගොඩ එන්න උදව් කරන්න බැරි ද කියලයි. ඒත් සාෂාගෙ විදියට කා එක්කවත් විවෘතව කතා කරන්න බැරුව ඇති කියලත් මනෝරම්‍යාට දැනුණා. සාෂාගෙ ළමා කාලය ගැනවත් තරුණ කාලෙ මාමාගෙ ගෙදර හිටිය විස්තරවත් මනෝරම්‍යාට කියන්න මිනිහා උනන්දු වුණේ නැත්තෙ එච්චර දුරක් ආවෙ හැම බත් වේලකටම හැම විභාගෙකටම ශරීරයෙන් ගෙවීම් කරන්න සිද්ධ වෙච්චි හින්ද ද කියලා කවුද දන්නෙ.

"මෙ මිනිහා කොච්චර නරක උනත් ඒ සේරටම යටින් එයාටත් විසඳ ගන්න බැරි අවුලක් ඇති කියලා හිතෙනවා. හැමෝම එයාව පාවිච්චි කරන්න ඇති. එතකොට මිනිහෙක් ඒක තමන්ගෙ වාසියට යොදා ගන්නයි පාදඩ මහත්තයෙක් වෙලා හිතක් පපුවක් නැතුව අනුන් කපාගෙන යන්නයි ඉගෙන ගන්නවා ඇති." මනෝරම්‍යා සාෂාට විරුද්ධව ප්‍රියාට පැමිණිලි කළ කටින්ම විත්තිය වෙනුවෙන් පෙනී හිටින්නත් හැදුවා.

"ඔව් ඔයා හරි ඇති. ඔයත් ඔය කියපු කට්ටියෙන්ම කෙනෙක් වගේ එයාට දැනෙන්න ඇති."

ප්‍රියාගෙ උත්තරේට මනෝරම්‍යාගෙ හිත තවත් රිදුණා. ඒත් සාෂා කියපු එක කතාවක් මතක් වුණා.

"ඔයා වගේ නෙවෙයි මං කැම්පස් ආ දවසෙ ඉඳලම සල්ලි හොයන ක්‍රමයක් හෙව්වා. මට පාට් ටයිම් වැඩක් ලැබුණා. ප්ලාස්ටික් වතුර ටැංකි විකුණන්න. ඇමතියෙක් ළඟටත් ගියා. මිනිහා වතුර ටැංකි දෙකක් ගත්තා. තව ආණ්ඩුවෙ තැන් දහයකට වතුර ටැංකි විකුණන්න හම්බ වෙන්න ඕන අය කිව්වා. ඒ මිනිස්සුන්ට කතා කරලා මේ ළමයට උදව් කරන්න කියලත් කිව්වා. හැබැයි ඒවායෙ ගාණ කිව්වෙ වැඩියෙන්. ඒකෙන් මිනිහගෙ ටැංකි දෙකත් නිකම්ම ලැබුණා වගේ වුණා. පළවෙනි ටැංකි දෙකට එවෙලෙම සල්ලිත්

දීලා තමයි ඒ වැඩේ කළේ. කවුද හිතන්නෙ ඇමති කෙනෙක් ඔය වගේ සුළු දේකින් එහෙම ලාභයක් ගනියි කියලා. ඒත් කොල්ලෙක් මිනිහෙක් වෙන්න හදනකොට ලැබෙන්නෙ ඔහොම අත්දැකීම තමයි."

ඒ කතාව කියපු වෙලාවෙ මනෝරම්‍යා කිව්වෙ "කොච්චර නරක කෙනෙක් එක්ක වැඩ කරත් ඔයා නරක් වෙන්න එපා. ඒ උනාට එහෙම කෙනෙක් එක්ක වැඩ කිරීමෙන් තමන්ගෙ ආත්මයත් මැරනවා කියලා දැනුණොත් කොච්චර සල්ලි ලැබෙන, බලය ලැබෙන, ප්‍රසිද්ධිය ලැබෙන දෙයක් උනත් අතෑරලා අයින් වෙන්න ශක්තිය ඉතුරු වෙන තරමට තමුන් තමුන්ට අවංක වෙන්න ඕන" කියලයි.

එහෙම දේවල් මනෝරම්‍යා අමුතුවෙන් නො කීවත් එයාගෙ නාට්‍යවලින් ඒ අදහස පිළිබිඹු වුණා. ඒත් නාට්‍ය ලියන්න ඇත්තෙ එයාට පත්වෙන්න උවමනා කෙනාගෙ අදහස්වලින් මිසක් කොළඹ සමාජයෙ කැපී පෙනෙන සිවිල් චරිතයක් වෙන්න තැත් කිරීමෙන් කොන්ද කඩා ගත්තු කෙනා නෙමෙයි වෙන්න ඇතිනෙ.

මනෝරම්‍යා දැනගෙන හිටියා හැම දෙයක් ම හැම කෙනෙක්ම අන්වීක්ෂයකට දලා බලන්න ගියාම සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න බැරි බව. සුජම්පති ජීවිතේට එන්නත් කලින් ඉඳලා ඒ ගතිය තිබුණනෙ. ඒක උපතින් ගෙනාපු දෙයක් ද? ඒත් වර්ණාසි ඒකෙ අනිත් පැත්තනෙ. ඒකනෙ අම්මට විශාල ප්‍රහේලිකාවක් වෙච්චි මිනිහාට දෙවියෙකුට වගේ සලකගෙන ඉන්නෙ. තමුන් හරිද දුව හරිද කියන එක හිතා ගන්න බැරි තරමට හැමදේම ව්‍යාකූල වෙන්න ගත්තෙ භූමිකම්පාවත් එක්කයි. එච්චර දවස් බලාගෙන හිටියෙ දුවටත් අම්මාගෙ මනස ලැබෙන තුරු ද?

හොඳම දේ දුවට සාෂා එක්ක නෙවෙයි යම රජ්ජුරුවො එක්ක හරි එයා කැමති විදියට ඉන්න ඇරලා මේ ආරක්ෂක සේවාවෙන් අහක්වෙලා වෙන කොහාට හරි යන එකනෙ. ගමේ ගේ තිබුණා නං එහෙම වෙනවනේ. ගමේ ගෙදරදි දුව සාෂාගෙ පින්තූරෙ ඇඳ උඩට දපු වෙලාවෙ මනෝරම්‍යාගෙ ඔළුව පිපිරුවෙ නැතුවා විතරයි. ඒ වෙනකොට මනෝරම්‍යා හිතාගෙන හිටියෙ සාෂා ඇමරිකාවෙ කියලයි. ප්‍රියාට එහෙදි අඳුන ගන්න ලැබුණෙ

හිතුවට වඩා හොඳ මිනිහෙක් කියලා කිව්වා වගෙත් මතකයක් තිබුණා. ඒත් සාෂා ලංකාවෙන් යන්නත් කලින්නෙ එයා ජීවිතෙන් මැකිලා ගියේ. ඒ මිනිහා දීර්ඝ කාලයකට පස්සෙ හෙනහුරෙක් වෙයි කියලා කව්ද හිතන්නෙ?

දූව හොයා ගත්තු මිනිහට අකමැති වෙන්න හේතුව කියන්නෙ කොහොම ද? මනෝරම්‍යා ප්‍රියාට ටෙලිෆෝන් කරලා කිව්වා. එයා දූනගෙන ඉඳලා නැහැ වර්ණාසි සාෂා එක්ක එච්චර සම්බන්ධයක් ඇති වුණා කියලා.

"මං ගේල්ව දන්නවා. එයා කියන්නෙ කසාද බැඳලා එක විදියකට ඉන්නවත් තමන්ගෙ ළමයිගෙ තාත්තා වෙන්නවත් ගැලපෙන්නෙ නැති වුණාට එක පාරටම මිනිහෙක් පාරට දන්න බැරි හින්ද තැනක් හොයා ගන්න කල් ඉන්න දූන්නා කියලයි. ගේල් කොන්දේසියක් දම්මලු වෙන ගෑනුවත් පිරිමිවත් ගෙදරට ගේන්න බෑ කියලා. ඒත් ඒක කැඩෙන බව දැනුණත් විශාල රණ්ඩුවක් ඇතිවෙන හින්ද මෙයාව යවන්න තැන් හොයමින් ඉන්නකොටලු ලංකාවට යන්න තීරණය කළේ. ගේල් බොහොම සතුටෙන් ගුවන් තොටුපළටත් බැස්සුවලු. දූන් එයා ගේ මාරු කරලා සැන් ජෝස්වල ඉන්නෙ. මෙයා ආපහු ආවත් එයාගෙ ගෙට නං ගන්න එකක් නෑ. වර්ණාසියි භාග්‍යායි මූණ ගැහුණු බවත් කිව්වා. සාෂා ගේල්ට ලියලා යවලා වර්ණාසි එයාට පිස්සු වැටිලා ඉන්නවා කියලා."

ප්‍රියාට මේ ප්‍රශ්නය ලියලා යැව්වම ලැබුණු උත්තරේට මනෝරම්‍යා තවත් නොසන්සුන් වුණා. ඒ දවස්වල මනෝරම්‍යා වැඩ කළේ ගයි රෝඩ්ස් කියලා සුද්දෙක් එක්කයි. ඉතිං දවසක් මනෝරම්‍යාගෙ ඇස්වල කඳුළු දැකලා ගයි ඇහුවා කරදරයක් ද කියල. ඒ පාර එයාට කතාව කිව්වා. ඒක කියන්න පුළුවන් වුණේ ගයි සුද්දෙක් හින්දයි. ලංකාවෙ මිනිහෙක් එක්ක එච්චර ලෙසියෙන් විවෘත වෙන්න බැහැනෙ.

"ඉතිං මොකද ඇයි දූවට ඇත්ත කියන්නෙ නැත්තෙ?"

"ඔයාට තේරෙන්නෙ නෑ. අපේ රටේ අම්මලා තාත්තලා ළමයි එක්ක කතා කරන විදියක් තියෙනවා."

"ඔයාගෙ දූව දහ අටට වැඩියිනෙ. වැඩිහිටියෙක් හැටියට

සලකලා එයාට පැහැදිලි කරන්න ඔයා අකමැති ඇයි කියලා."

ඒත් මනෝරම්‍යා කියන දේවල් අහන්න සූදානමක් දූවට තිබුණෙ නැහැ. තරුණ කාලෙ සාෂා නිසා එක රස්සාවක් අත ඇරපු මනෝරම්‍යා මැදි විය ගෙවෙද්දි සාෂාගෙන් දූව බේරා ගන්න තවත් රස්සාවක් අත ඇරලා ලංකාවෙ නවතින්න හිතාගෙන සතියකට නේපාලෙ ගිය අවස්ථාවක කසාද බැඳලා හිටියා.

"අම්මට බැරි වුණාද ඕක නවත්තන්න." මනෝරම්‍යා ජිනවතී ඉස්කෝලෙ හාමිනේගෙන් ඇහුවා.

"මට ඔයාව හරියකට හඳන්න බැරි වෙච්චි එකේ මං කොහොමද ඔයාගෙ දූවට නීති දන්නෙ,"

"අම්මා හදන්නෙ මගේ දූවට උල්පන්දම් දීලා මට රිද්දන්න."

"අම්මෙක්ගෙ හිතක තියෙන බරයි වේදනාවයි තේරෙන්න දූවෙකුත් අම්මා කෙනෙක්ම වෙන්න ඕන. ඒත් දැං අපි ඔය දරුවට නපුරු වෙන්නෙ නැතුව උදව් කරන්න ඕන. වයස ටිකක් වැඩි මිසක් වෙන වරදක් අඩුවක් පේන්නෙ නෑ. ඔය කුරුළු ජෝඩුව වගේ ඉන්නෙ."

මනෝරම්‍යා එතනින් එහාට කතා කළේ නෑ.

"තැපැල් මාමලත් මං නැති වෙලාවෙ මඟුල්ගෙවල් ගත්තු එකයි මට දූක." මනෝරම්‍යා තැපැල් මාමටත් නෝක්කඩු කිව්වා.

"කාත් කවුරුත් නෑ වගේ තනියම ගිහිං කසාද බඳින්න ලෑස්ති වුණාම මමයි කිව්වෙ මෙහෙ කිරිබතක්වත් හදලා නැකතකට පිට වෙන්න කියලා. ඉස්කෝලෙ අක්කත් ආවෙ ඒකයි. දැං ඔයා හිත හද ගන්න. එයාව තනි කරන්න නරකයි. හිතේ අමාරුවක් ඇති උනත් ඇවිත් කියන්න කෙනෙක් ඉන්න එපායැ."

"හරි.... හරි.... හැමෝම එකතුවෙලා එයාගෙ දීගෙ සාර්ථක කරලා දෙන එකයි. මං අදටත් නෑ. හෙටටත් නෑ." කියලා මනෝරම්‍යා එළියට බැහැලා ගියා.

මහගෙදර විකුණන බව දැන ගත්තම මනෝරම්‍යා ඒ ආඩම්බරයත් ශෝකයත් තද කරගෙන සාෂාගෙ කන්තෝරුවට යන්න තීරණය කළා. දූව එක්ක කතා නොකර ඉන්න බැරි උනත්

දුවගෙ ගෙදරට පය නො තියපු ගෑනියෙකුට ඒක පහසු තීරණයක් වෙන්නෙ නැහැනෙ. සාෂා ගැන දුව මොනවා කිව්වත් නෑහුණා වගේ කතාව වෙනතකට හරවපු ගෑනී කොහොමද සාෂාගෙ දෙපතුළ ළඟට යන්නෙ.

කොළඹ හතේ විශාල ගෙදරක තිබුණු සාෂාගෙ කන්තෝරුවට ගියෙ කලින් දනුම් දීලා වෙලාවක් ඉල්ලා ගන්නෙ නැතුවයි. සාෂා රැස්වීමක කියලා ලේකම්වරිය කාරණය ඇහුවා.

"මනෝරමා ඇවිත් කියන්න." කිව්වා මිසක් නැදෑකම සඳහන් කරන්න හිත දුන්නෙ නැහැ. ඒක තමන්ගෙ කටින් කියන්නෙ කොහොමද? රැස්වීම අතරමග නැවැත්තුවා වෙන්න බැහැනෙ. ඒක කාටත් කියන බොරුවක් වෙන්න ඇති. මනෝරමාට වහාම කැඳවුමක් ලැබුණා.

උඩ තට්ටුවෙ විශාල කාමරයක ටෙලිෆෝන් දෙකකුයි ඉන්ටර්කොම් එකකුයි විතරක් තිබුණු බිලියඩ් මේසයක් තරම් ලොකු මේසයක කෙළවර සාෂා වාඩි වෙලා හිටියා. සමහර විට ඒ සාකච්ඡා පවත්වන තැන මිසක් එයාගෙ කාර්යාල කාමරය නොවෙන්නත් ඇති. මේසය පිටුපසින් සුදු බිත්තියේ තිබුණෙ වර්ණාලි තෙල් සායමින් ඇඳපු බුද්ධ රූපයක්. ඒක තරමක් දුරට මුතියංගන රජ මහා විහාරයෙ පැරණි විහාර ගෙයි වැඩ හිටින බුදු පිළිමයට සමානයි. ඒ නිසා බුදුන් ඕන දෙයක් කියන්න පුළුවන් විහිළුවකට හිනාවෙන, කුඹුරකට, හේනකට උනත් පාද යාත්‍රාවෙන් වඩින මනුෂ්‍යයෙක්ය කියන හැඟීම ඇති වෙනවා. සාෂා ඒ රූපය පාවිච්චි කරනවා ඇත්තෙ අමුත්තන්ගෙ හිත්වල තමන් ධර්මකාමී යුක්ති ගරුක පුරුෂ රත්නයක්ය කියන හැඟීම ඇති කරන්නයි.

"මං හිතුවා ඔයා කවද හරි කොයි වෙලාවෙ හරි මාව බලන්න එයි කියලා." සාෂා දෑත් විහිදමින් නැගිටලා ඉස්සරහට ආවෙ ඒවගේ නාට්‍යමය අවස්ථාවකට මහා පුහුණුවකින් හිටියා වගෙයි.

මිනිහාගෙ පෙනුම තරුණ කාලෙට වඩා වැඩි වෙනසක් නැහැ. වර්ණාසි අහුවෙච්ච එක පුදුමයක් නෙවෙයි. මනෝරමා දැකපු සැණින් සාෂා වළකමින් පස්සට වුණා. ඇස්වල තරහයි, දුකයි, පිළිකුලයි ඉතිරුණා. සාෂාට ඒක නොදැනෙන්න විදියක් නැහැ. ඒත් මිනිහා හිතා වුණෙ අවසාන ජයග්‍රාහකයා තමන්ය කියන

ආඩම්බරයෙන්.

"මය වෙන්න එපා. මං ඔයාව ගෑනියෙක් විදියට බඳ ගන්න ආවා නෙවෙයි. නෑදෑයෙක් විදියට මනුස්සකමට පිළිගන්න හැදුවා විතරයි."

මිනිහා වාඩි වෙන්න සන් කරමින් අත දිගු කළේ රෝස මල් පොහොට්ටු විසිරුණු කුෂන් දාලා තිබුණු මැලේසියානු වේවැල් පුටු කට්ටලයකටයි. ඒකෙ රවුම් කොළ පේද කුෂන් කොට්ට විසුරුවලා. වීදුරු මුහුණතක් තිබුණු රවුම් කෝපි කාපට්ටුවෙ අලුත් රෝස මල් සැරසිල්ලක්. ඒක උඩ කොළ පාට පේව් අච් බඳුනකුත්, ලංකාවෙ පක්ෂල් චිත්‍ර අඩංගු පොතකුත් තිබුණා. සෙටිය කෙලින් බිත්තියෙ සරණාගත කඳවුරක ළමයින් බිම වැල්ලෙ ඉඳගෙන කෑම කන කළු සුදු ඡායාරූපයක්. ඒ අනර්ඝ පුටු කට්ටලය ගත්තෙ ඒ ළමයින් සඳහා ලැබුණු සල්ලිවලින් ද කියලා අහන්න හිතුණත් තමුන් ආවෙ තුහුරට කතා කරන්න නොවන බව මනෝරමාට මතක් වුණා.

"මං මේ මේසෙන් වාඩි වෙන්නං." මනෝරමා සෙටිය ප්‍රතික්ෂේප කරමින් මේසයෙ දකුණු කොණේ වාඩි වුණා.

සාෂා තමන් හිටිය තැනටම දිසින් වම් කොණේ වාඩි වුණේ "මයාට ඕන ආරක්ෂිත පරතරයක් තිය ගන්න නං ඒක එහෙම වෙච්චාවෙ" කියමින්. මනෝරමා ඒකට ප්‍රතිචාර නොදක්වා හිත සන්සුන් කර ගන්න හැදුවා.

"බුද්ධ රූපෙ ලස්සනයි නේද?" සාෂා ඇහුවා.

"හ්ම්. හැත්තෑ හතේ ජේ. ආර්. දිනනකොටත් දිගටම පාවිච්චි කරේ දන්නෝ බුදුන්ගෙ ශ්‍රී ධර්මස්කන්ද සංගීතයනෙ."

"ඉතිං තාමත් ඔච්චර තරහෙන් පුපුරන්නෙ මොකද?"

මනෝරමා උත්තර නොදී නිහඬ වුණා. මිනිහගෙ මූණෙ උකුරපු හිනාවටයි, ඇස්වල දිදුලන ගතියටයි තමන් එච්චර කෝප වෙන්නෙ මොකට ද? මනෝරමා සාෂාගෙ මූණ මග ඇරලා අවතැන් වෙච්චි ළමයින්ගෙ පින්තූරේ දිහා බලා හිටියා. තමනුත් අවතැන් වෙච්චි ගෑනියෙක් වගේ අසරණ හැඟීමක් මතු වෙන්න

ගත්තා.

"මං ඕක ගත්තෙ මන්නාරමේ, පේසාලෙයි කෑම්ප් එකකදි. ඕක නෝර්වේ, ස්වීඩන්, බෙල්ජියම්, ජර්මන් එක්සිබිෂන්ස්වලටත් ගියා." සාෂා වෙනත් තැනකින් කතාව පටන් ගන්න හැදුවා.

ඒ පින්තූරෙ හොඳයි කියන්නවත් එයාග රස්සාවෙ කයිවාරු අහන්නවත් සතුටු සාමිචියකටවත් උවමනාවක් නැහැනෙ.

"ඇයි මගේ දුව රවට්ට ගත්තා මදිවට මගේ අම්මාගෙ දේපළත් තමන්ගෙ අතට එන්න වැඩ කරේ" කියලා අහන්න යෑ.

"මං ඉපදුණු මං හැදුණු වැඩුණු ගේත් මට නැති කරන්න හදන්නෙ ඇයි? අම්ම ඕක වර්ණාසිට ලිව්වෙ රැක ගන්න මිසක් විකුණන්න නෙවෙයිනෙ." කියලා කෑ ගහන්න තරමට ආවේගයක් තිබුණත් ඒකට යටවෙන එකත් නිෂ්ඵලයි.

"මගේ දුවත් නැති කරලා මං උපන් ගේත් නැති කරන්න හදන්නෙ අද මේ ඉන්න ලොකු කාමරේට එන්න මුලින්ම පාර කපලා දුන්නට ස්තුති කරන්න ද?" ටී 56කින් උණ්ඩ නිකුත් වෙනවා වගේ පැනපු ප්‍රශ්න පපුව ඇතුළෙම පුපුරලා ලේ ගමන වේගවත් වුණේ කට පියාගෙන ඉන්දද්දිමයි. හැඟීම්බර නොවී නඩුවක් කතා කරනකොට වගේ නිශ්චිත ඉලක්කයකට කල්පනාවෙන් ප්‍රශ්න අහනවා, කරුණු ගොනු කරනවා මිසක් අතීත කතාවෙ තුවාලය එතැනට අදාළ නැහැ කියන සිහි නුවණ රැක ගන්න ගැනි උත්සාහ කළා.

"ඇයි ගේ විකුණන්නෙ?" ප්‍රශ්නය පිට වුණා.

"බිත්ති වේයො කනවා. ගුණසේනලත් හොරකං කරනවා."

"ඒ වුණාට වර්ණාසිට සදහටම ආදායමක් එන්නයි අම්මා ඕක දුන්නෙ." මනෝරම්‍යාගෙ ස්වරය වියළියි.

"වර්ණාසිට මං හම්බකරන දේවල් ඇති." සාෂාත් මනෝරම්‍යාගෙ ස්වරයෙන්ම කතා කළා.

"එයාට ස්වාධීන ආදායමක් තියෙන්න ඕන."

"එයාට මං ලස්සන ගෙයක් හදලා දෙනවා. එයාගෙ දරුවන්ට

හිතේ හැටියට දඟලන්න හුරතල් වෙන්න හොඳ පරිසරයක් ඕන."

"ඒකයි ගමේ ගේ විකිණීමයි දෙකක්"

දෙන්නම කතා කරේ එකිනෙකාගෙ ඇස් මග හරිමින්.

"ඉතිං ඇයි දුවට කියන්නෙ නැත්තෙ? එයා කිව්වොත් අපි ගමේ ගේ තියා ගමු කියලා වේයො කාලා වැටිලා යනකල් තියෙන්න අරිමු. ඔයාගෙ ඔය ආඩම්බරකම නැතුව දුවට කියන්න ඔයා ඒ ගෙදර ඉන්නම් කියලා. එතකොට අපිටත් ඇවිත් යන්න පුළුවන්." සාෂා අන්තිම වාක්‍යයෙදි මුදු ස්වරයකට මාරු වුණා.

"මට මහලු මඩමක හරි ඉන්න පුළුවන්. මං කියන්නෙ මේ ළමයට ඒක තියෙන්න ඕන කියලයි. අම්මා බලාපොරොත්තු වුණේ වත්ත තව දියුණු කරයි කියලයි."

"අපි හදන ගෙයි ඔයාට වෙනම ඇනෙක්ස් එකක් හදනවා."

"එපා මං කවදාවත් ඒ ගෙදර පදිංචියට එන්නෙ නෑ."

"ඔයාට ඕන දෙයක් කියන්න. හිතේ හැටියට බනින්න. මං අහගෙන ඉන්නං. එතකොට ඔයාගෙ හිතට සැනීපයක් දැනෙයිනෙ."

"මට කියන්න දෙයක් ඉතුරුවෙලා නෑ. ගේ විකුණනවට මං කැමති නෑ කියන්නයි ආවෙ. වර්ණාසිට කියන්නෙ නෑ මං ආවා කියලා. මොකද මගෙ දරුවට පරණ කතා කියලා හිත තලන්න බෑ."

"අපි ඉස්සර ඉඳලා දන්න බව එයාට කියලනෙ තියෙන්නෙ."

"එච්චරයි. ඊට වැඩි දෙයක් කියල නෑ. ඒක එහෙමම තියෙන්න ඕන. ඇත්ත කතාව දැන ගත්තොත් එයාගෙ පපුව පැලෙයි."

"ඔයා කියන්න එපා කියනවා නං මට ඒකට ගරු කරන්න වෙනවා. ඔයා තරහෙන් හරි මා ළඟට ආ එකටත් සතුටුයි. යුද්ධ කරන මිනිස්සුත් සමාදාන වෙනවනෙ. කවද හරි අපිට ඒක ගෙදරක හොඳින් ඉන්න පුළුවන් වෙයි කියලා මං හිතනවා."

"මගෙ බල්ලාවත් එන්නෙ නෑ තමුසෙත් එක්ක ඒක ගෙදරක ඉන්න" කියලා කියන්න ඕන වුණත් මනෝරම්‍යා ඒක තද කර

ගත්තා. මොහොතක නිශ්ශබ්දතාවක් ඇති වුණා.

"මනෝ ඔයා තාමත් ඉන්නෙ මාත් එක්ක අර පරණ තරහව තියාගෙන නේද?" කියන ප්‍රශ්නෙ අහයි කියලා මනෝරම්‍යා බය වුණා. ඒ දවස්වල රස්සාව අත ඇරලා ගියෙත් සාෂා එක්ක විශාල තරහාවකුයි ඊට යටින් අමුතු ආකර්ෂණයකුයි දෙකම තිබුණු හින්දනෙ. ඒක මනෝරම්‍යාටවත් තේරුම් ගන්න බැරි වෙච්චි ද්විත්ව ස්වභාවයක්.

"පරණ දේවල් අමතක කරලා අපි යාළුවො වෙන්න ඕන මනෝ. මං දන්නවා ඔයාටයි මටයි කවදාවත් මේ නෑදෑකම පිළිගන්න බැරි බව. ඔයාගෙ දුව කියලා දැන ගන්නකොට හුඟාක් පරක්කුයි. ඒක හින්ද මං ඈත් වුණා නං වර්ණාසිට පිස්සු හැදෙන්න තිබුණා. එයා මට හරිම ආදරේ වුණා. මං නිකං ඔහේ පා වෙවී හිටිය බෝට්ටුවක් වගේනෙ. එයා මගේ ජීවිතේ පිරෙව්වා. එයා දේශපාලනේ දන්නෙත් නෑ. මං දන්න හුඟාක් දේවල් දන්නෙත් නෑ. ඒත් ගෙදර ගියාම මිනිහෙකුට රජෙක් වගේ දැනෙන්නෙ ඒ වගේ ගෑනියෙක්ගෙ අහිංසකකම හින්දයි. මං කවදාවත් එයාට නරකක් කරන්නෙ නෑ."

මනෝරම්‍යා කතා නැතුව නැගිට්ටා.

"ඔයා චුට්ටක් මහත්වෙලා විතරයි. කණ්ණාඩි නැත්තං තාම ඒ වගේමයි. ඔයා තනියම ඉන්නෙ නැතුව කාව හරි බැන්ද නං ඔයාගෙ ජීවිතෙත් වෙනස් වෙයි." සාෂාගෙ ස්වරයෙ තිබුණෙ මිත්‍රශීලි ගතියක්.

"බොහොම ස්තුතියි. තමන්ගෙ වාසියට ඕනම කෙනෙක් එක්ක බුදියන ජාතියෙ එවුං මිසක් හරි පිරිමියෙක් මුණ ගැහුණෙ නෑ. මේ තනිජීවිතේ සම්පතක්. කවදා හරි කොයි වෙලේ හරි මගේ දුවට මාව ඕන වෙන්න ඉඩ තියෙනවා." මනෝරම්‍යා රළු ස්වරයෙන් කතා කළා.

"දැනුත් එයාටයි මටයි ඔයා ඕන. තනියම ඉන්නෙ නැතුව අපි හදන ගෙදරට එන්න. මා එක්ක කතා නොකරට කමක් නෑ. ඔයා සතුටෙන් ඉන්නවා නං මටත් සතුටක්." සාෂා මුදු ස්වරයකට මාරු වුණා.

"මගේ සතුට අසතුට ගැන හිතනවා නං ඔය මහ ගේ විකුණන්නෙ නැහැනෙ."

"ඔයා තාම මා එක්ක තරහෙන් ඉන්නෙ. ඒක අමතක කරලා මේ ප්‍රශ්නෙ ගැන මැදහත්ව හිතන්න. එතකොට ඔයාට දැනෙයි අපේ තීරණය හරි කියලා. ඔයා ඉස්සරත් තනියම හිතලා තනියම විත්‍ර මවා ගන්නවා. විත්තිකාරයාට නිදහසට කාරණා කියන්න ඉඩ දෙන්නෙ නැහැ. තාමත් එහෙමයි."

"මට කියන්න තියෙන්නෙ ඔච්චරයි. මං යනවා."

"තාමත් මහමුහුද වගේ තමයි. කමක් නෑ මෙහෙම හරි ඔයා ආවනෙ. ඉඳහිටලා හරි මට කතා කරන්න. අපි තරහාවෙලා ඉන්නෙ මොකට ද?"

මනෝරම්‍යා වේගයෙන් පඩිපෙළ බැස්සෙ ඒකට උත්තර බඳින්න ගියා නං "උඹත් එක්ක කතා කරන්න දෙයක් ඉතුරුවෙලා නෑ" කියලා ඒ විශාල ගේ දෙදරන්න ගුවන් විදුලි සංස්ථාව තරම් දුරට ඇහෙන්න කෑ ගහන්න උවමනා වෙච්චි හිතට යටත් වෙන්නෙ නැතුවයි. එච්චර කෝපාවේගයක් ආවෙ සාෂාගෙ කතාවෙ මදව් මදන හැඟීමක් තැවරිලා තිබුණු නිසයි.

මනෝරම්‍යා එද දවල්ට කන්න තිඹිරිගස්යායෙ හිටිය ගයි රෝඩ්ස්ගෙ ගෙදරට එනවා කියලා තිබුණා. ඒ නිසා ත්‍රීරෝද රියකට නැගලා එහාට ගියෙත් අර තරහවත් එක්කමයි. කෑම හදන්නයි ගේ බලාගන්නයි හිටියෙ මනෝරම්‍යාම හොයලා දීපු වතු බංගලාවක වැඩ කරලා පුරුදු ජේසුදසන්. මිනිහා දෙහි වීදුරුවක් හදලා දුන්නා.

"මිසී නිකං සනීප නෑ වගේනෙ."

"ඔව් ජේසුදසන්. මේ ගයි මහත්තයාට කලින් කිව්ව හින්ද ආවා. මට හිතෙන්නෙ කන්නත් බෑ වගෙයි."

"මිසී ඔය ඉස්සරහා කාමරේ කවුරුත් නෑ ඉතාලි මිස් කෙනක් ඉඳලා කිලිනොච්චි ගියා. ඒ කාමරේට ගිහිං ඇඟ හෝදගෙන නිදා ගන්න. මහත්තයා ආවම කතා කරන්නං."

මනෝරම්‍යාට මතක කාමරේට ගිහිං වායු සමීකරණය ක්‍රියාත්මක කරලා ඇඳේ වැටෙනවා විතරයි. එතකොට වෙලාව

එකොළහට විතර ඇති. ගයි ඇවිත් එක හමාරට විතර කතා කරනකොට මනෝරම්‍යාට බඩ රිදෙනවා වගේ දැනුණා.

"ඔයා කන්න. මං ජේසුදසන්ට කියලා රසම් ටිකක් හද ගන්නං." කියලා මනෝරම්‍යා මූණ හෝදගෙන ගිහින් මේසෙට වාඩි වුණා.

වායුසමීකරණය කරලා තියෙද්දිත් මනෝරම්‍යාට දඩිය දැම්මා. වම් අතත් රිදෙන්න ගත්තා. ගයි කෑම කනකං මනෝරම්‍යා ඉවසගෙන හිටියා.

"ඔයාට සනීප නෑ වගෙයි. බලාගෙන ඉන්න හොඳ නෑ." කියලා ගයි තමයි ආසිරි එකට එක්කන් ගියෙ.

මනෝරම්‍යා ව වහාම දැඩි සත්කාර ඒකකයට ගත්තා.

"ගෙදරට කියන්න ඕනනෙ." කියලා ගයි දුවගෙ ටෙලිෆෝන් නොම්බරය ඉල්ලුවා.

"ඔයා දන්නවනෙ මං තනියම්නෙ ඉන්නෙ. මට කරන ලොකුම උදව්ව කාටවත් නොකියන එක."

"එහෙම හරි නෑනේ. මාත් තව ටිකකින් වච්නියා යනවා. මං ජේසුදසන්ට කියන්නං ඔයා බලන්න එන්න කියලා."

"හරි... හරි... ඔයා යන්නකො. මං ගෙදරට කියන්නං." කිව්වට මනෝරම්‍යා කාටවත් කිව්වෙ නෑ.

හර්දයාබාධයක් හැදිලා නිසා ඉතාම විවේකිව ඉන්න කියලා දොස්තර කොන්ස්ටන්ස් කිව්වා. මනෝරම්‍යා තැපැල් මාමාටත් දැනුම් දුන්නෙ නැත්තෙ එතකොට වර්ණාසියි සාෂායි ලෙඩ බලන්න එන නිසයි. මනෝරම්‍යා බලන්න ආවෙ ජේසුදසන් විතරයි.

"ජේසුදසන් නංගිට මේ ලිස්ට් එක දීලා මට මේ ඇඳුම් ගෙනත් දෙන්න" කියලා කිව්වා.

කොළඹ සුදු නෝනා කෙනෙක් ළඟ වැඩ කරන නිසා ජේසුදසන්ගෙ නංගි දනගෙන හිටියා මනෝරම්‍යාට ගැළපෙන වාම් කපු ඇඳුම් හොයා ගන්න.

ඒ සතියම ආසිරි එකේ ගත කරනකොට මනෝරම්‍යාට

දැනුණෙ තමන් මනෝරම්‍යා කියන කෙනාත් නොවන වෙන කවුරු හරි වගෙයි. සියලුම වැදගත් සිදුවීම් අවැදගත් විදියට දැනෙන්න ගත්තා. සාෂා එක්ක තියෙන කෝපයත් දුවට තියෙන ආදරයත් තමන්ගෙන් පරිබාහිර හැඟීමක් වුණා. එතකොට එතන ඇඳක වැතිරිලා හිටියෙ, එක එක පර්යේෂණවලට මූණ දුන්නෙ, හෙදියො ඇවිත් බෙත් පෙති කටට දැම්මෙ, උණ බැලුවෙ, නාඩි බැලුවෙ කාගෙ ද? ඒ ශරීරයට අයිති හැම දේම අත ඇරලා යන්න වෙනවා නං ඒ යන්නෙ කව්ද? සිහිය තිබුණත් හුස්ම වැටෙන්නෙ නැති තරමට අමාරුවෙන් ඉන්නකොටත් ඒ ගැන හැඟීම් මාත්‍රයක් තිබුණා. හැබැයි ඒ වෙනත් කාගෙ හරි සිරුරකට අයිති ප්‍රශ්නයක් වගේ දුරස්ථ ගතියකින්. වර්ණාසි අත ඇරලා යාමත් එච්චර අමාරුවක් වෙන්නෙ නැති බව දැනෙන්න ගත්තා. මේ ලෝකෙට එනකොට වර්ණාසි කෙනෙක් හිටියෙ නැහැනෙ. එහෙනං එයාගෙ ආරක්ෂාව ගැන එයාගෙ අනාගතය ගැන දුක් ගන්නෙ මොකට ද? තමන්ට රිදුම් ඇති වුණාම ඒවාට මූණ දුන්නා මිසක් දිවි නසා ගත්තෙ නැහැනෙ. එහෙනං දුවත් ඒ ඒ වෙලාවට සුදුසු දේ කරයිනෙ.

සතියකට පස්සෙ මනෝරම්‍යා ගෙදර ගියෙ ගයි එක්කයි. ඒ ගිහිනුත් පැය තුනකට විතර පස්සෙ තමයි දුවට ටෙලිෆෝන් කරලා "මං ගෙදර ආවා ලිනට්ව එවන්න." කිව්වෙ.

"කොහෙද ගියෙ? ලිනට් ගේ සුද්ද කරන්න ඇවිත් හැරිලා ගිහින් තිබුණා."

"ගමනක් ගියා."

"තැපැල් සීයලා දන්නෙත් නෑ. මං මේ පසුව පත්තුවෙලා හිටියෙ. වෙනදට යනකොට කියනවනෙ."

"ගණන් ගන්න එපා. මං එච්චර හිතුවෙ නෑ. මැරුණත් එක පාරයිනෙ."

"ඔහොම වුණාම මැරුණත් අපි දනගන්නෙ නැති වෙයි."

දුව අම්මට බනිනකොට අම්මා හිනා වෙවී හිටියා. වර්ණාසි එදා හවසම අම්මා බලන්න ආවා. අම්මා ඉක්මනට සේලයින් දීපු තැන නොපෙනෙන්න අත් දිග කුර්තාවක් ඇඳ ගත්තා.

වර්ණාසි ආ වෙලාවට සාමාන්‍ය විදියට ප්‍රියා ගැන, භාග්‍යා ගැන, කැපැල් මාමලගෙ විස්තර, කෑම බීම ගැන, ඇඳුම් මෝස්තර, දෙන්නම දන්න අඳුනන අය ගැන හෙම කතා කරනවා. ඒත් දෙන්නාටම කතා කරන්න ඕන ඒවා නොවන වග දෙන්නම දැනගෙන හිටියා. අම්මා දුවට අහු නොවෙන්න බේත් ජාති ලාච්චුවකට දලා තිබ්බා. ඒ දවස්වල මනෝරම්‍යාට හිතුණා තමන් හදිසියෙ මරුණොත් සාෂා ගැන ඔය තරම් අප්‍රසාදයෙන් හිටියෙ ඇයි කියන ප්‍රහේලිකාව ඉතුරු වෙයි කියලා. කවද හරි දුව සාෂා අත ඇරලා ආවොත් ඒක දැන ගත්තට කමක් නෑ. එතකොට ආයෙත් හිත වෙනස්වෙලා එයා ළඟට යන්නෙ නැති වෙන්න නං සාෂා පෙන්නගෙන ඉන්න මිනිහා නෙවෙයි කියලා දැන ගන්න ඕනනෙ. තමුන් මැරුණාට පස්සෙ දුව හැමදේම දැන ගත්තොත් සාෂා ළඟ අන්ධවෙලා ඉන්නෙ නැතිවෙයිනෙ. එතකොට එයා එක්ක හිටියත් හැම දේටම 'එසේය ස්වාමීනි' කිය කියා ඉන්නෙ නැතිවෙයිනෙ.

ඒ දවස්වල මනෝරම්‍යා කිසිම වැඩක් නොකර ගෙදරට වෙලා විවේක ගත්තා. කාලයක් තිස්සෙ කියවන්න බැරි වෙච්චි නවකතා පොත් කවි පොත් කියෙව්වා. සුජම්පතිගෙ ඉඳලා හැම දෙයක්ම ඉංග්‍රීසියෙන් ලියලා තියන්න ගත්තා. සිංහලෙන් නොලිව්වෙ බැරි වෙලාවත් ලිනට් දැක්කොත් කියලයි. ඒ ලියන දේවල්වලට මොනවා කරන්න ද කියලා දැනගෙන හිටියෙත් නැති වුණාට එහෙම ලිවීමෙන් සහනයක් දැනුණා. කවද හරි ඒ අත් පිටපත් දුවට දෙන්න කියලා භාග්‍යාට දෙන්නත් බැහැනෙ. තමන් මැරුණට පස්සෙ ඒවා දුවගෙ ඇහැ ගැහෙන විදියට වැදගත් ලියකියවිලිත් එක්ක තිබ්බම හරිනෙ. මනෝරම්‍යා දුවගෙ නමට සෑහෙන මුදලක් ඉතුරු කරලා තිබුණා. කවද හරි දුවට තනියම ජීවිතේ පටන් ගන්න උනොත් ඒ මුදල ප්‍රයෝජනවත් වෙයිනෙ කියන හිතුවිල්ල මකා ගන්න බැරි වුණා. දුවගෙ කසාදෙ කැඩෙන්න කියලා අම්මා කෙනෙක් ප්‍රාර්ථනය කරන්නෙ නැහැනෙ. ඒත් මනෝරම්‍යාට ඒ හිතුවිල්ලෙන් ගැලවෙන්න බැරි වුණා. මනෝරම්‍යා හිතේ තිබුණු රහස් සේරම ලියලා ඇඳ ළඟ කබඩ් එකේ තියා ගන්න පටන් ගත්තා. ඒක පිළිවෙලකට ලියපු දෙයක් නෙවෙයි. සැරින් සැරේ හිතට එන දේවල් ලිව්වා. ඒක කවද හරි පුච්චලා දන්න ඕන කියලත් නො හිතුණා නොවෙයි. ඒත් තමුන්ට

හෘදයාබාධයක් හැදුණෙ සේරම ආවේග හිතේ හිර කරගෙන ඉඳීමෙන්ය කියලයි මනෝරම්‍යා හිතුවෙ. ඒ නිසා එහෙම ලිවීම එක විදියක ප්‍රතිකාරයක් වගේ වුණා.

සාෂා මිරිහානෙන් ඉඩමක් අරගෙන ගේ ගැහුවා. ගෙට ගෙවදින උත්සවයට ලංකාවෙ ඉන්න තරං කලාකාරයන්ටයි දේශපාලනඥයන්ටයි ආරාධනා කළා කියලා පත්තරවල තිබුණා. මනෝරම්‍යාටත් එන්න කියලා වර්ණාසි කිව්වා.

"මං ඔය මිනිහා නැති දවසක ඔයාගෙ ගේ බලන්න එන්නං. හැබැයි ඕක හැදුවෙ ඔයාගෙ සල්ලිවලින් හින්ද ඕක ඔයාගෙ නමටයි තියෙන්න ඕන. නැත්තං කවදහරි ඔය මිනිහා ඔයාව පාරට දලා ඔය සේරම අයිති කර ගනියි."

"අම්මට මොකද වෙලා තියෙන්නෙ? දැං අපි බැඳලා සන්තෝසෙන් ඉන්නවා කියලා පේන්නෙ නැද්ද? බැන්දට පස්සෙ එයාගෙයි මගෙයි කියලා බෙදලා වෙන් කරන්නෙ මොකට ද? එයා මාව පාරට දැම්මත් කමක් නෑ. ඒ වගේ රත්තරං මිනිහෙක් මේ ලංකාවෙ කොහෙවත් නැතුව ඇති." වර්ණාසිගෙ ස්වරයෙ කවදවත් නැති විදියෙ කෝපයක් තැවරිලා තිබුණා. මනෝරම්‍යා හයියෙන් හිණා වුණා.

"රත්තරං මිනිහා කොයි වෙලාවෙ හරි පිත්තල වුණේ නැත්තං මගෙ කන කපන්න දෙනවා."

"හා.... මං දැම්මම සර්ජන්කෙනෙකුට අපොයින්ට්මන්ට් එකක් දලා තියන්නං."

දුව පළවෙනි වතාවට අම්මට කැපෙන උත්තර දීලා ආ පයින්ම පිටවෙලා ගියා.

මනෝරම්‍යා ටික වෙලාවක් ඇඬුවා. ඊට පස්ස කඳුළු වැටෙද්දිම හිනා වෙන්න ගත්තා. වර්ණාසිටත් එහෙම එකට එක කියන්න පුළුවන් එක තරක නෑ. ඒ කටින් කවද හරි සාෂාටත් එහෙම කතා කරන්න සිද්ධ වෙයිනෙ.

"මොකද රමණී මැණිකෙ මේකෙ තේරුම. දැං ඔයා ඔය පරණ කතා සේරම ඉවර කරලා මේ ළමයින්ගෙ ගෙදරට ගිහිං ඒ

සතුට බෙදු ගන්න ඕන නේද?" තැපැල් මාමයි සුදු මම්මයි ඇවිත් ගමේදි ගෙදරට කියපු නමින් ජිනවතී ඉස්කෝලෙ හාමිනේ කතා කරන විදියටම කතා කළා. තැපැල් මාමත් අම්මා වගේම කලුයි. කොටයි. ඥාති සහෝදරයා උනාට එක කුසේ උපන් කෙනෙක් වගේ ජිනවතී ඉස්කෝලෙ හාමිනේ වගේමයි. සුදු මම්මාටත් දරුවො නැති හින්ද මනෝරම්‍යා පොඩි කාලෙ ඉඳලා තමන්ගෙ දරුවෙක් වගේ හිතපු නිසා ඒ ජෝඩුවට වර්ණාසි තමන්ගෙ බිනිබිරි කියලයි හිතුණෙ.

"අපිට දරුවො නැතුව දුක් වෙනවා. ඔයාට දරුවෙක් ඉඳලත් ඒ දරුවගේ ජීවිතේ වැදගත් අවස්ථාවකට එකතු වෙන්න බැරි එක නං හරි නරකයි." සුදු මම්මා කිසිම දවසක මනෝරම්‍යාට හොඳ නරක කියලා දෙන්න ඉදිරිපත් වුණේ නැතත් වර්ණාසි වෙනුවෙන් කතා කළා.

"සුදු මම්මලා මං වෙනුවෙන් යන්න. මං පස්සෙ දවසක ගිහින් බලන්නං. කොහොමටත් ඔය පාටිවලට යන්න මං කැමති නෑනේ."

මනෝරම්‍යා ගෙවදීමේ උත්සවයට නොගියට ලිනට් සෑහෙන වාර්තාවක් සැපයුවා. තැපැල් මාමයි, සුදු මම්මයි පුදුම වෙලා තිබුණෙ චන්දිම ගිරිකුඹුරලගෙ ජන උරුමය පක්ෂයට විරුද්ධ ඇමතිවරු පවා සාෂාගෙ ගෙදරට ඇවිත් තිබුණටයි.

"මෙහෙම ගිහිං අපේ මෑනුත් කවද හරි පොලිටික්ස්වලටම නොගියොත් තමයි පුදුමෙ. මෙයා චන්දිමගෙ දකුණු අත කියලයි එද චන්දිමගෙ කතාවෙදි කිව්වෙ." උත්සවයෙන් දවස් දෙකකට පස්සෙ හැන්දෑවක මනෝරම්‍යා බලන්න ආ තැපැල් මාමා කිව්වා.

"මං හිතුවෙ පාටියක් කියලයි. පොලිටිකල් මීටින් එකක් කියලා කිව්වෙ නෑනේ." මනෝරම්‍යා උපහාසයෙන් කත කළා.

"ඒක නං ගිහිං බලන්න වටින ගෙයක්. සාෂාගෙ ඔළුව තමයි. අපේ හිටපු පෝස්ට් මාස්ටර් ජෙනරල්, ට්‍රෙෂරියෙ හිටපු සෙකට්ට්‍රි කෙනෙක්, හිටපු ඔඩිටර් ජෙනරල් හෙම පරණ මිනිස්සුත් හිටියා. චන්දිමලා පත්තරේකුයි, ටී.වී චැනල් එකකුයි පටන් ගන්නත් යනවද කොහෙද. මිනිහා පරණ මිනිස්සුන්ට තමයි වැදගත් තනතුරු

භාර දෙන්නෙ."

තැපැල් මාමා හිටියෙ එයාගෙ සම වයසෙ ලොකු ලොක්කො එක්ක එකට බීලා වර්ණාසි තමන්ගෙ මිනිබිරි කෙනෙක් කියා ගන්න ලැබුණු උද්දමයෙන්.

"බලමුකො......... බලමුකෝ......... මේ ලංකාවෙ අගමැතිකම විතර බල්ලට ගිය පුටුවක් නැති හින්ද කවද හරි ඔය චන්දිමයා ජනාධිපති උනොත් හෙම සාෂා අගමැති වෙන්නත් බැරි නෑ. එහෙම උනොත් චන්දිමගෙ බෙල්ල කපන්නෙත් සාෂා තමයි."

තැපැල් මාමයි සුදු මම්මයි කතා නැතුව නැගිටලා ගියා. ඒ ගොල්ලො තමන් ගැන ඉතාම නරකට හිතන්න ඇති කියලා මනෝරම්‍යාට දුකක් නොදැනුණා නෙවෙයි. ඒත් තිත්තයගෙ වාරය එනකල් බලා ඉන්නවා ඇර වෙන කරන්න දෙයක් නැහැනෙ. දුව අම්මගෙ කෑම පංගුව එවලා තිබුණා. අම්මා ඒවා මායාටයි, මිනිස්ටර්ටයි, රුවිරානිටයි දුන්නා. එයින් මාසෙකට පස්සෙ සාෂා ජපානෙට ගියාම දුව අම්මගෙ ගෙදරට ඇවිත් "රෑට තනියට එන්න" කිව්වා.

"බලමුකො" කිව්වා මිසක් මනෝරම්‍යා හරි උත්තරයක් දුන්නෙ නෑ.

ඒත් එද හවස ප්‍රවෘත්තිවලට නාවල පැත්තෙ ගෙදරක දරුවො දෙන්නෙක් එක්ක හිටිය තරුණ අම්මා කෙනෙක් මරලා අවුරුදු දහයෙ දුව දූෂණය කළ කතාවක් අහලා මනෝරම්‍යාගෙ ඇඟ සීතල වුණා.

"මං කෑම කාලා නිද ගන්න එන්නං" කියලා මනෝරම්‍යා දුවට ටෙලිෆෝන් කරලා කිව්වා.

ඒ වතාවෙ සතියක්ම දුවට තනි රැක්කා. ගේ කලාගාරයක් වගේ උනාට මනෝරම්‍යා ගෙයි ඇවිදලා බලන්නවත් උනන්දු වුණේ නැහැ. නිදන කාමර දෙකක් එක්ක මනෝරම්‍යා වෙනුවෙන් හදපු ගේ කැල්ල ප්‍රධාන නිවසෙන් වෙන්වුණේ ගෙයි සම්පූර්ණ දිගට තියෙන නොගැඹුරු පොකුණකින්. තමුත් එක් හදලා තිබුණෙ හතරැස් හැඩයට නෙවෙයි. ස්වභාවික පොකුණක් වගේ අවිදිමත් හැඩ තල වලින් මායිම් වෙච්ච පොකුණෙ වටේටම ස්වභාවික

ගල් රඳවලා තිබුණා. ඒවායෙ වාඩි වෙලා ඉන්න පුළුවන්. වඩු කුරුල්ලන්ගෙ කූඩුවකුත් එල්ලපු තාරං ගහකුත් වවලා මේ හදනකොටම ඒක එල දරන්නෙ කොහොම ද?

"මේ හැම ගලක්ම හැම පැලයක් ම ගේ හදන්න කලින් හිටන් ප්ලෑන් කරලා එකතු කරා" වර්ණාසි අම්මගෙ හිත සියවගෙන පැහැදිලි කරන්න හදපු කාරණා ගැන මනෝරම්‍යා වැඩිදුර ප්‍රශ්න ඇහුවෙ නැහැ.

"මේ ජේතවද ආතම්මගෙ එක දොරක්වත් ජනේලයක්වත් අහක දම්මෙ නෑ" වර්ණාසි සාලෙ මහ දොරත් අල්ලගෙන කිව්වා.

"අම්මා ආවත් නාවත් ඔය ඇනෙක්ස් එක අම්මා වෙනුවෙන් තියෙනවා කියලා එයා කිව්වා."

"අනේ මං වෙනුවෙන් කිසි දෙයක් තියන්න ඕන නෑ. ඕක සුද්දෙකුට කුලියට දීලා ඒ සල්ලි ඔයාගෙ පොතේ දා ගන්න."

වර්ණාසි හිනා වුණා.

"සාෂාගෙ ජීවිතේ ගැන අම්මට තේරෙන්නෙ නෑ. එයාට ඔය ගෙවල් කුලියක් නැතුවට මාව බලා ගන්න පුළුවන්. එයාට ඕන නිස්කලංක ගෙදරක්. පිටිපස්සෙ ගේ විකුණනවා නං ස්විමිංපූල් එකකුත් හදනවා කිව්වා."

"ඒ මිනිස්සු විකුණන්න ද ඉන්නෙ?"

"නෑ කබල් ගෙයක්නෙ. කවද හරි විකුණලා වෙන පැත්තකට යයි කියලා මේ ගේ හදපු බාස්ලත් කිව්වා."

දුවගෙ කතාවට අම්මා හිනා වුණා.

"ලොකු ගෙයක් හැදුවම අහල පහළ දුප්පත් මිනිස්සු සේරම පැනලා දුවයි කියලා හිතන්නෙ මොකට ද? බාස්ලා මොනවා කිව්වත් ඉගෙන ගත්තු මිනිස්සුත් අනුන්ගෙ ගෙවල් අයිති කර ගන්න හීන දකින එක එච්චර හොඳ දෙයක් නෙවෙයි. ඔය විශාල තණ්හාව විශාල පිළිකාවක් වගේ තමයි."

දුව මූණ නරක් කර ගත්තා. ඒ වතාවෙන් පස්සෙ වරින්වර අම්මා දුවට තනි රකින්න ගියත් කිසිම දවසක ගේ සම්පූර්ණයෙන්

නරඹන්න උඩ තට්ටුවටවත් නැග්ගෙ නැහැ.

"ආතම්මා හිටියා නං අපේ මුහුණෙට තමයි වැඩියම ආසා වෙන්නෙ" කියලා කිව්වම මුදු ගේ බලන්නවත් උවමනා වුණේ නැති එක ගැන වර්ණාසිටත් විශාල තරහාවක් ඇති වුණා. අන්තිමට ඒ ගේ තමන් නැරඹුවෙ නෑ කියන එකත් අවැදගත් සාධකයක් තරමින් භූමිකම්පාව ඒක පුපුරවලා දම්මෙන් කියන හිතුවිල්ලෙන් මනෝරම්‍යා ටික වෙලාවක් පාර දිහා බලාගෙන හිටියා. මිනිස්සු වැටුණු ගස් උඩින් ලයිට් කණු උඩින් පනිමින් වතුර බෝතල් උස්සගෙන ගියා.

ළිඳ නොනවත්වා උතුරමින් පුංචි දෙළ පාරක් හදමින් තිබුණත් මනෝරම්‍යාට නාගන්න හිතක් ආවෙ නැහැ. ගෙයි බොන වතුරත් ඉවරවෙලා නිසා බෙලෙක් ජෝග්ගුවක් අරගෙන පාර අයිනට ගිහින් හාඳුරණ කෙනෙක්ගෙන් වතුර ටිකක් ඉල්ලා ගත්තා. කොච්චර වතුර බිව්වත් මදි ගතියක් දනෙන පිපාසයක් තිබුණා.

ඒ වෙනකොට ගේ වේලිලා නිසා රෑට වැස්සෙ නැත්තං කරදරයක් නැතුව ගෙයි නිද ගන්න පුළුවන් වෙයි කියන හිතුවිල්ලෙන් කොස්ස අතට ගත්තත් ගේ අතුගාන්නත් බැරි ගතියක් දැනුණා.

මනෝරම්‍යා මායාගෙ පැත්තෙ රවුමක් ගහලා බැලුවා. ඒ පැත්තෙ වැසිකිළි දෙකම කඩා වැටිලා. ඒවා තනි ගඩොලින් අලුතෙන් හදපු බිත්තිනෙ. තමන්ට කෙසේ වෙතත් වර්ණාසිට මුවාවට පාවිච්චි කරන්න තැනක් හදවා ගන්න ලිනට්ගෙ මනුස්සයාවත් ආවොත් කියලා පාරක් අයිනක වැටිච්ච ටකරං කෑලි දෙක තුනක් ගෙනත් තිබ්බොත් හොඳයි කියලා මනෝරම්‍යාට හිතුණා. ඒත් රෑ නිදි මරලත් උදේ තිබුණු ජවය හිඳිලා ඇඟපත රිදුම් කෑවේ උණ ගතියෙන්.

මනෝරම්‍යාට උදේ වේලෙන්න දාපු මෙට්ටෙ උස්සලා ගෙට ගන්නවත් බැරි තරමට ඇඟ පණ නැති වෙන්න ගත්තා. ගැනී ඉස්තෝප්පු කැල්ලෙ බිම වැතිරුණෙ දඩිය දන්නත් ගත්තු නිසයි.

"ඇන්ටි අපි නාගන්නවෝ" කියලා කවුරු හරි ඉලන්දාරි කට්ටියක් ළිඳ වටේට හිටගෙන ප්ලාස්ටික් කෝප්පවලින් බාල්දි

කැලිවලින් නාන්න ගත්තෙ ටැංකියක් වටේට හිටගෙන නානවා වගෙයි.

"ඈන්ටි සබං පාරක් හෙම හොයා ගන්න නැති වෙයි ද?" එක ළමයෙක් ළඟට ඇවිත් ඇහුවා.

"ඔය ගෙයි තියෙනවා නං හොයා ගන්න." කියලා මනෝරම්‍යා හිස් බැල්මෙන් බලාගෙන හිටියා.

එච්චර දෙයක් වෙලා තියෙද්දි ගෙයි තියෙන දේවල් කවුරු ගත්තත් මොකද? තමන්ට තිබුණු වටිනාම වස්තුව සාෂා හොරකං කරගත්තට පස්සෙ වෙන මොනවා තිබුණත් වැඩක් නැහැනෙ. ඒක හොරකමක් ද? ඒක දූවගෙ ප්‍රථම ප්‍රේමය කියලා පිළිගන්න බැරි මොකද? ප්‍රථම ප්‍රේමය කියන එකට අනවශ්‍ය වැදගත්කමක් දෙන එක කොච්චර මෝඩ ද? පිරිමියෙක් කියන ඕනම සුරංගනා කතාවකට පහසුවෙන් රැවටෙන පරම පරිත්‍යාගශීලී හැඟීම් උතුරන ප්‍රථම ප්‍රේමය නොමේරු මනසක මායාවක්නෙ. ඒක ජය ගත්තාය කියලා හිතන කී දෙනෙක් ඒක ජයගෙන නෑ කියලා දන්නෙ නැතුව ඇති ද? සමහර විට දැනගෙන නොදැන වගේ ඉන්න වෙනවත් ඇතිනෙ.

ප්‍රියාට වුණෙත් ඒකනෙ. සමාජ පසුබිම, අධ්‍යාපනය, ධනය හැමදේම පැහෙන ප්‍රථම පෙම්වතා විදේශ සේවයට තේරුණාම එකට ඉගෙන ගත්තු හැමෝම හිතුවෙ ප්‍රියා ජීවිතය ජය ගත්තා කියලයි. ඔබරෝයි එකේ තිබ්බ මංගල උත්සවයෙදි වයින් වීදුරුව උස්සලා නව යුවළට සුභ පතපු අග්‍රාමාත්‍ය ලේකම් වින්ටන් වීරරත්න කිව්වෙත් අමරණීය ආදරය වෙනුවෙන් සුභ පතනවා කියලනෙ. ප්‍රියාගෙ අමරණීය ආදරයට මුලින්ම අභියෝගයක් වුණේ දකුණු අප්‍රිකාවෙ කොකෝ වත්තක් අයිතිකාර සුදු ගෑනියෙක්. ප්‍රියා කැමති වුණේ නෑ දරුවෙකුත් අරගෙන ලංකාවට එන්න. ඒ සුව පහසු ජීවිතේ විඳිමින් දැන නොදැන ඉන්න එයා තීරණය කළා. ලංකාවට සුනාමි එනකොට ප්‍රියාගෙ පුරුෂ රත්නයට එක්සත් ජාතීන්ගෙ සංවිධානයෙ ලොකු තනතුරක් හිමිවීම වෙනුවෙන් විශාල උත්සවයක් පවත්වලා ඒ ගොල්ලො නිදාගෙන හිටියෙ නිව්යෝර්ක්වලයි.

"මනෝ මට හිතෙන්නෙ පරණ චීනයෙ, ජපානයෙ, මුස්ලිම්

රටවල, අප්‍රිකාවෙ එහෙම මිනිහෙකුට තව ගෑනියක් ගන්න ඕන වුණාම පළවෙනි ගෑනිගෙ හිමිකම් ආරක්ෂා වෙන විදියෙ සම්මතයක් තිබුණනෙ. ඒක ඒ විදියටම ක්‍රියාත්මක වෙන නොවෙන එක ඒ ඒ මිනිස්සුන්ගෙ හැදියාව අනුව වෙන දෙයක් වෙන්නැති. ඒත් එහෙම සාම්ප්‍රදායික සමාජයක ජීවිතය ගෑනියෙකුට අමාරු වුණත් පිරිමියා පිළිගත් වගකීම් යුතුකම් කියලා කොටසකුත් තියෙනවානෙ. අඩු ගණනෙ ගෑනිට බොරු කියන්න ඕන නැතෙ.

"දැං අපේ තානාපති උතුමාණන්වහන්සේ මට බොරු කියනකොට මං එයාට හිත යටින් හොඳටම හිනා වෙනවා. මං ඔයා වගේ නෙවෙයි අලසයිනෙ. ඒ නිසා ඒ අලස සුවයට මේ බොරුකාරයා මට හොඳට ගැලපෙනවා. මේ මිනිහා මටත් බොරු කියමින් එයාගෙ අන්තඃපුරයටත් බොරු කියමින් ලංකාවෙ ආණ්ඩුවටත් බොරු කරමින් එක්සත් ජාතීන්ගෙ සංවිධානය ඇතුළෙ තියෙන විශාල බොරුව ඇතුළෙ බොහොම පහසුවෙන් රඟපාමින් ඉන්නවා."

එක දවසක් ප්‍රියාට හුඟාක් තරහා ගිය වෙලාවක එහෙම ඊමේල් එකක් එවලා තිබුණා. එහෙම නැත්නම් ගෑනි නිතරම විනෝදෙන් ඉන්නෙ. එයාගෙ හතර වරිගෙටම උදව් උපකාර කරනවා. ඉතාලියෙ ඉන්නකොට නං එහෙ කවුද සාමාන්‍ය මිනිහෙක් එක්ක සම්බන්ධයකුත් තිබුණා.

"කාට හරි, ආදරේ කරන්න. එතකොට ජීවිතේ සෞම්‍ය වෙනවා." කියලයි ඒ දවස්වල කිව්වෙ. ඒත් මනෝරම්‍යාට කිසිම පිරිමියෙක් විශ්වාස කරන්න බැරි ගතියක් තිබුණා. සාෂාගෙ සිද්ධියෙන් පස්සෙ මනෝරම්‍යා කිසිම සම්බන්ධයක් ඇති කර ගත්තෙ නෑ. ඒත් ප්‍රියා පවා ඒක විශ්වාස කරන්න අමාරුයි කිව්වා.

"අනේ මට මේ කෙල්ලට හොඳට උගන්නලා එයා අවංක මිනිහෙක් එක්ක හොඳ පවුල් ජීවිතයක් ගෙවනවා දැක්කොත් ඇති" කියලයි මනෝරම්‍යා රෝමෙට ගිය වෙලාවෙ කොලෝසියම් නටබුන් අතර ඇවිදිමින් ප්‍රියාට කිව්වෙ.

"මේ බලන්න මේ රෝම අධිරාජ්‍යයත් එක දවසකින් ගොඩ නැගුවෙ නැනේ. එක දවසකින් නෙවෙයිනෙ ඒක වැටුණෙත්. දැං මේ අපි ඉන්න තැන කොච්චර නරක දේවල් වෙලා ඇද්ද? ඒ

වගේම මෙතනදී ද දෙන්නෙක් ආදරවන්තයො වෙලා ඇද්ද? ආදරවන්තයො මූණ ගැහිලා ඇද්ද? ඒ වුණාට අද ඉතාලියෙ පියට් කොම්පැනියෙ ඉන්න මිනිහෙක් ඒ ඉතිහාසය ගැන හිත හිත ඉන්නෙ නැහැනේ. ඒ මිනිහා අලුත් කාර් එකක් සැලසුම් කරනකොට රෝම අධිරාජ්‍යයත් බිඳ වැටුණා කියලා හිතහන්න ගියොත් ඒ වැඩේ කර ගන්න බැරි වෙනවා."

"මට තේරෙන්නෙ නෑ. දූං ඔයා ඔය රවුමෙන් එන්න හදන්නෙ කොතැනට ද?" මනෝරමා ඇහුවා.

"ආයෙත් ජීවිතේ විඳින්න කියන්න."

"ඒකට මීට වැඩිය හොඳ තැනක් තෝර ගන්න වෙයි." මනෝරමා හිනා වුණා.

"පොම්පෙවලට ගියාම බිත්තිවල පිගන් ගඩොල් ඉතුරුවෙලා තියෙන ගණිකා නිවාසයක නටබුන් මැදදි කියන්නං." ප්‍රියා ඉංග්‍රීසියෙන් කතා කරේ අතරින් පතර ඉතාලි වචනයක් දෙකක් මුසු කරමින්.

"ඒ මොකද එහෙම තැනක් මට ගැලපෙන්නෙ නැහැනේ."

"ඒ මහ භූමිකම්පාවට කලින් ඒ තැන්වලට ගිය හැම මිනිහෙක්ම ඒ තැන්වල ආදරේ විකුණපු හැම ගෑනියෙක්ම දැනගෙන ඉන්න ඇති තමන්ට ඕන ඒක නෙවෙයි කියලා. ඒ පිරිමින්ට උනත් ඔයා කියන විදියෙ අවංක ද්වි පුද්ගල ආල, නුරා සම්බන්ධයක උවමනාව තියෙන්න ඇති."

"ප්‍රියා... ප්‍රියා..... ඒ උවමනාව පොම්පෙ භූමිකම්පාවට අහුවෙච්ච මිනිස්සුන්ටයි ලංකාවෙ මිනිස්සුන්ටයි කියලා වෙනසක් නෑ. මං තරුණ වයසෙදිත් ඒ උවමනාවයි මං දන්න මිනිස්සුන්ගෙ ජීවිත කඩා වැටීමයි දිහා හොඳට බලපු හින්ද තමයි සුජම්පතිව කසාද බඳින්න පරක්කු කරේ."

"ඒකෙත් ඔයා අර අහිංසක කෙල්ලට සාත්තෙක් නැතිකරේ නැද්ද?"

"ඔයා ඇත්ත කතාව දන්නෙ නෑ"

"ඔයා මට කියලා නෑ."

"අපි වෙන දෙයක් කතා කරමු" මනෝරමා ඒ කතාව නැවැත්තුවා.

සුජම්පතිගෙ සිද්ධියෙ සම්පූර්ණ සත්‍ය ප්‍රියාට කියන්න පුළුවන් වුණේ සාෂාගෙ සිද්ධියෙනුත් පස්සෙයි. එහෙම වුණත් වර්ණාසි සාෂාව බැන්ද කිච්චම ප්‍රියා කතා කළේ සාෂාට පක්ෂවයි.

"ජීවිතේට ඉඩ දෙන්න මනෝ..... සාෂා තරුණ කාලෙ මොනවා කරත් දූං එයාටත් අර ඔයා හිතන විදියෙ අවංක පවුල් ජීවිතයක උවමනාව ඇති."

"ඒකට මගේ දූව අල්ල ගත්තු එකයි ඉවසන්න බැරි."

"ඉතිහාසය පුරාම එහෙම දේවල් ඇති වෙලා තියෙනවනෙ. ඔයා දූවට තනියම ජීවිතේට මූණ දෙන්න ඉඩ ඇරලා ඈත් වෙලා ඉන්න. ඔයාට සාෂාව බෑනා හැටියට පිළිගන්න බැරි නං යාළුවෙක් හැටියටවත් හිතන්න ගන්න."

"මගේ පිහිටෙන් රස්සාවකුත් අරගෙන මාවත් කපා දන්න හදපු මට බොරු කරපු ඔය මිනිහා කොහොමද යාළුවෙක් වෙන්නෙ?"

"එහෙනං ඈත්වෙලා ඉන්න. නැත්තං ඔය තරහාවෙන් ඔයා තමයි පිච්චෙන්නෙ. ලෝකෙ නරකම මිනිහා සාෂා වෙන්න බැහැනෙ. ඊට වඩා නරක මිනිස්සු යූ. එන්. එකේ නං ඕන තරං ඉන්නවා."

"වර්ණාසි නෙවෙයි නං මට ඔය මිනිහා ගැන මෛත්‍රියෙන් හිතන්න පටන් ගන්නවත් තිබුණා."

"වර්ණාසි කියන්නෙ ඔයාගෙ තණ්හාව. මේ ලෝකෙ හැමෝම පිටස්තරයි ආත්මාර්ථකාමියි කියල හිතෙන අත්දැකීම් දෙක තුනකින් පස්සෙ ඔයාගෙමයි කියලා ඉතුරුවෙලා ඉන්නෙ වර්ණාසි විතරනෙ. ඒත් එයා ඔයාගෙ නෙවෙයි කියලා තාම පිළිගන්න බැරි එකනෙ ප්‍රශ්නෙ."

ප්‍රියා කියූ දේවල් ඇත්ත වුණත් මනෝරමා කරේ වර්ණාසිලා හදපු ගේ කිට්ටුව මායා සේනානායකගෙ ගේ කැල්ල කුලියට ගනිමින් ආරක්ෂ දූලක් අතේ තියාගෙන බලා හිඳීමයි. සාෂා රට

ගිය වෙලාවට දුවගෙ තනි රකිනවට වඩා රහසිගත වැඩකුත් මනෝරමාට තිබුණා.

සාෂා වැඩකළ ජාත්‍යන්තර සංවිධානයෙන් මානව හිමිකම් සුරැකීමේ කටයුතු, නඩු පැවරීම, විරෝධතා රැළි වගේ කටයුතුවලට වගේම සමීක්ෂණ, සම්මන්ත්‍රණවලටත් මූල්‍ය ප්‍රතිපාදන සැපයුවා, පත්තර, සඟරා ගහන වැඩත් කළා. ඒ හැම දෙයකින්ම චන්ද්‍රිම හිරිකුඹුරගෙ දේශපාලන න්‍යාය පත්‍රය ශක්තිමත් වෙන්නත් සල්ලි ලැබුණා. අහිංසක අවංක මිනිස්සු වගේම තම තමන්ගෙ න්‍යාය පත්‍ර තිබුණු එක එක ජාතියෙ මිනිස්සු ඔය කටයුතු වටේට රොක් වුණා. යටත් විජිත ආර්ථිකයෙන් සමහර සොක්කො ලොක්කො වුණා වගේම තමයි පශ්චාත් විවෘත ආර්ථිකයත් එක්ක ආ සිවිල් යුද්ධෙයි අනෙක් කැරලි කෝලාහලයි නිසා තවත් සොක්කො තොගයක් ලොක්කො වෙන්න ගත්තා. ඒ ලොක්කො අතර සාෂා කැපී පෙනුණා. මනෝරමා දැනගෙන හිටියා සාෂාට විරුද්ධව තමන් මොනවා කිව්වත් වැඩි දෙනෙක් පිළිගන්න එකක් නෑ කියලා.

සාෂා ළඟ වැඩ කරලා රස්සාව අහිමි වෙච්චි ගෑනියෙක් මනෝරමාට කිව්වා සාෂා වම් අතින් හොරකම් කරන විදිය සාෂාගෙ දකුණු අතවත් දන්නෙ නැහැ කියලා. ප්‍රියා ටෙලිෆෝන් කරපු වෙලාවක ඒක කිව්වම ප්‍රියා කිව්වෙ ඒ ගෑනි තරහට බොරු කරනවා ඇති කියලයි.

"ඉවා පත්තු වෙච්චි දවසකට මගෙ කෙල්ලට උසාවි ගානෙ රස්තියාදු වෙන්න වෙයි."

"ඔයා හිතන විදියෙ කිසි දෙයක් වෙන්නෙ නෑ. හැම තැනම එහෙම දේවල් වෙනවා. කවුරුත් අහක බලාගෙන ඉන්නවා. කවද හරි චන්ද්‍රිමලගෙ පරම හතුරෙක් ජනාධිපති වුණත් ඒගොල්ලෙ හතුරා එක්කත් තිල නොවෙන එකඟතාවකට යාවි."

"වැරදි කරන මිනිස්සුන්ට දඬුවම් නැද්ද?"

ප්‍රියා හයියෙන් හිනා වුණා.

"මිනිහෙක් වැරදි කරන්නෙ ඒකට පරිසරයකුත් හැදිලා තියෙන හින්දනේ. කව්ද ඒක හැදුවෙ? කොහොමද ඒක හැදුණෙ?"

"මට ඔය [illegible] තර්කවලින් වැඩක් නෑ. මගේ කෙල්ල හිතාගෙන ඉන්නෙ සාෂා දෙවියෙක් කියලා. කවද හරි එයාගෙ වෙස් මුහුණ හැලිච්ච දවසට මේ අහිංසක කෙල්ලට පිස්සු හැදෙයි."

වම් අත උස්ස ගන්නත් බැරුව දකුණු අත පපුවට තියාගෙන දාඩිය වැගිරෙමින් ඉන්න අතර මනෝරමාට ඒ කතා ඒ සිද්ධි මැවෙන්න ගත්තා. පපුවෙ වේදනාවයි දුව ගැන තියෙන වේදනාවයි දෙකක් නොවෙයි එකක් බවට පත්වෙලා තිබුණා.

"බබා ඔයා කොහෙද?" කියලා හිතෙන් කියවුණාට වචන පිට වුණේ නැති බවත් නොදැනී ගියා. ඒත් හිතේ අමාරුව දිය වෙන්න හැමදේම ලියපු පරණ දිනපොත් දෙකක් තියෙනවා නේද කියන කල්පනාව පපුව පසාරු කරගෙන ගියෙ විශාල බයකුත් එක්කයි.

"වර්ණාසිට එයාගෙ ජීවිතේ එයා කැමති විදියට ගෙවන්න ඉඩ ඇරලා ඔයා හිත හදාගෙන පැත්තකට වෙන්න. නැත්තං ඔයාට කවදාවත් සැනසිල්ලෙ මැරෙන්න බැරි වෙනවා."

ප්‍රියා කනට කරලා කියනවා වගේ ඇහුණාට ඒ මොහොතෙ ප්‍රියා එතන ඉන්න විදියක් නැති බවවත් හැඟීම් මාත්‍රයක් ඉතුරුවෙලා තිබුණා.

මනෝරමා කොච්චර වෙලා වැටිලා හිටිය ද කියලා දන්නෙ නැති උනාට නින්දකින් ඇහැරෙනවා වගේ අවට සියුම් ශබ්ද ඇහෙන්න පටන් ගන්න තත්ත්වෙකට පත් වෙලා තිබුණා. සියුම් ශබ්ද කිව්වට ඒවා පිටත ශබ්දත් නෙවෙයි. දකුණු කනට කව්ද පිඹිනවා වගේ දැනුණා. ඒ එක්කම හෙමින් හුස්ම වැටෙන බව හැඟුණා. බිත්තියකින් වැලි වැටෙනවා වගෙ ඇහුණා. සර සර ගාලා කොළ හෙලවෙන්න විදියක් නැතිවුණාට හුළඟ ඇගේ එතීගෙන එනවා තේරුණා. හඬක් නැති හඬකින් හුළඟ දැනෙනකොට තමන් මැරිලා නැතුව ඇති කියන සැනසීම ඇති වෙමින් නැතිවෙමින් තිබුණා. මරණය සැනසීමක් වෙන්න නං වර්ණාසිට ගෙයක්වත්, ආදායමක්වත්, වෘත්තිය පුහුණුවක්වත්, භාග්‍යා ඇර හරි හමන් යාළුවෙක්වත්, හොඳටම මහලු වෙලා වාරු නැතුව හිටි තැපැල් සීයයි එයාගෙ නෝනයි ඇර වෙන ළඟ නෑදෑයෙක්වත් නැති පසුබිමක ඒක සිද්ධ නො විය යුතු බව මනෝරමාට හිතෙන්න ගත්තෙ පුරුදු විදියට විනාඩියට විසි පාරක් විතර ආශ්වාස

ප්‍රාශ්වාස කරන තත්ත්වයට පත්වෙන අතරයි.

මනෝරම්‍යාට නැගිට ගන්න පුළුවන් වුණාම වතුර උගුරක උවමනාව දැනෙද්දිත් අර පරණ දින පොත් දෙක තිබුණු මේස පොඩ්ඩ ළඟට ගියා. ඒක බැලූ බැල්මට ලියන මේසයක් උනාට උඩ පියන විවෘත කරන්න පුළුවන්. භූමිකම්පා රාත්‍රියෙදි පියන ඇතුළ පැත්තෙ කණ්ණාඩිය බිඳිලා නිසා මූණුවල් ගොඩක් පෙනුණා. ඒක ඇතුළෙ තිබුණෙ වර්ණිගෙ පින්තූරයි. ජිනවති ඉස්කෝලෙ හාමිනේගෙ කණ්ණාඩි කුට්ටමයි, උන්දෑ ගෙදර දාපු තබක්ක වළලු දෙකකුයි, වර්ණාසිගෙ ළදරු ගවුමකුයි, වර්ණාසිගෙ පංචායුධෙයි, මනෝරම්‍යාගෙ බැංකු පොතුයි, වර්ණාසිගෙ නමට දාපු ස්ථාවර ගිණුමක ලියකියවිලියි, වර්ණාසිට මුලින්ම කන් විදලා දාපු පස්ලෝ කම්බි කොකු දෙකයි, මනෝරම්‍යා තරුණ කාලෙ පින්තූරයි, අර දුක දිය කළ දිනපොත් දෙකයි විතරයි. ඒ මේසෙ ඇතුළටත් වැහි වතුර කාන්දුවෙලා නිසා ඒවා වේලන්න ඉස්තෝප්පුවට ගේන්න හිතුවත් ඇඟට එච්චර ප්‍රාණවත් ගතියක් තිබුණෙ නෑ. හරියට ලොකු වැඩක් කළා වගේ හතියක් දැනෙමින් තිබුණා.

දුව ගේ කැඩිලා තියෙන හැටි බලන්න හරි පිට්ටනිය පැත්තට හරි යන්න ඇති කියලා මනෝරම්‍යාට හිතුණා. එයා එන්න කලින් දින පොත් දෙක පුච්චන්න බැරි වෙයි කියන එක එච්චර බය වෙන්න කාරණයක් නො වුණත් මනෝරම්‍යාගෙ පපුව වේගයෙන් ගැහෙන්න පටන් ගත්තා. ඉටිකවර දෙක ගලවලා ගෑස් ලිප උඩ තියලා පුච්චන්නෙ කොහොම ද? ආයෙත් ගෑස් ලැබෙන දවසක් හිතා ගන්නත් බැරුව ගෑස් නාස්ති කරන්නෙ කොහොම ද? ඒවා ළිඳට දැම්මොත් මොකද? එතකොට ළං පතුළට බහියිනෙ. කවද හරි ළිඳ ඉහින දවසකට ඒවා දිරලා තියෙයි. ඒ නැතත් මඩත් ගෑවිලා කාටවත් කියවන්න බැරි විදියට බොඳ වෙලා යයිනෙ.

මනෝරම්‍යා ඒකෙ අන්තිමට යොදලා තිබුණු සටහන කියෙව්වා.

"එස් කිලිනොච්චි යනවා කියලා වර්ණාසි මට එන්න කිව්වා. කිලිනොච්චි යනවා කියලා දෙවුන්දර යනවත් ඇති. ලිනට් නං කියන්නෙ දෙන්නා කුරුළු ජෝඩුව වගේ ඉන්නවා කියලයි. අපේ මෝඩි හැමදේටම ඔළුව පාත් කරනවා ඇතිනෙ. ඒත් ඇයි මං තව දුරටත් මේ ළමයා ගැන ඔච්චර බය වෙන්නෙ? මිනිහෙකුට වෙනස් වෙන්න බැරි ද? මිනිහා හොඳ අතට වෙනස් වෙන්න උත්සාහ කරනවා වෙන්න බැරි ද? බලු නකුටෙ ඇද අරින්නෙ කොහොම ද?

"මනුස්ස ප්‍රාණියෙක් කියන්නෙ බලු නකුටකට වඩා හුඟාක් වටින කෙනෙක්නෙ. එයාට නරක අත අරින්න බැරි වුණාට හොඳ නොදන්නවා නෙවෙයිනෙ. ඒත් නරක කියලා මම දකින දේ එයාට ඉතාම සාමාන්‍ය තත්ත්වයක් - ලෝක ස්වභාවයක් හැටියට දැනෙනවා ද දන්නව යැ. එහෙම මිනිස්සු වැඩි පසුබිමක හොඳ දේවල් නරක බවටත් මෝඩකම් බවටත් නරක දේවල් බුද්ධිමත් ප්‍රායෝගික කාරණා බවටත් පත් වෙනවා ඇතිනෙ. කවද හරි මගේ කෙල්ල අම්මා කෙනෙක් වුණොත් ඔය මිනිහා ඉන්නවා කියලා මං නොගිහින් ඉන්ඩ ද? මං කොහොම ද ඒ වගේ අවස්ථාවකට මූණ දෙන්නෙ? මේක දුවගෙ අනාගතය ගැන බයක් නෙවෙයි තමන්ගෙ අතීතය ගැන ප්‍රශ්නයක් කියලා එක දවසක් ප්‍රියා කිව්වා. ඒක ඇත්ත ද? හැම යුද්ධයක්ම දිගට ඇදෙන්නෙ අතීතය පිළිබඳ ප්‍රශ්නවලින් කියලා වතාවක් මං කාම්බෝජයෙදි දේශනයකුත් කළා. මේකත් යුද්ධයක් නෙවෙයි ද? මේක ද්වන්දව සටනක්. කණ්ඩායම් දෙකක සටනකදිත් මේ වගේම මතුපිටින් පෙනෙන ප්‍රශ්නයක් නොපෙනන ප්‍රශ්න - ඒ කියන්නෙ අතීත කතා, ආඩම්බරය, බලය, තණ්හාව වගේ වෙනත් කාරණා ගණනාවකුත් පැටලිලා තියෙනවානෙ.

මගේ දුවට එයාගෙ මිනිහත් එක්ක කැමති විදියට ඉන්න ඉඩ ඇරලා ඇයි මං ඈත් වෙන්නෙ නැත්තෙ? එහෙම වුණොත් වර්ණිට දුක හිතෙයි. අම්මා එයාට ආදරයක් නෑ කියලා හිතයි. එයා සතුටු වෙන්න නං මං සාෂා එක්ක කතා බස් කරන ඒ ගෙදර උත්සවවලට යන එන කෙනෙක් වෙන්න ඕන. අනේ මං ඔය මිනිහා එක්ක මොනවා කතා කරන්න ද?"

සාෂා හදපු ගෙදරත් කැඩුණට පස්සෙ, පුංචි ගුවන් විදුලි යන්ත්‍ර කනේ තියාගෙන අහන මිනිස්සු කියන විදියට ලංකාවෙ සිතියම පවා වෙනස් වුණාට පස්සෙ ඔය පරණ දිනපොත් දෙකේ ලියපු කතන්දර මොකට ද? බැරි වෙලාවත් ඒවා වර්ණිගෙ හරි වෙන කෙනෙක්ගෙ හරි අතට ගියොත් කාටවත් යහපතක් වෙන්නෙ

නෑ. අනිත් එක මෙච්චර විනාශයක් වෙලා තියෙන වෙලාවෙ සාෂා ආවොත් "මගේ ගෙදරට අඩිය තියන්නෙ නෑ. උඹ බොරුකාරයෙක්" කියලා කෑ ගහන්න යැ. ඒ දෙන්නට උළු බිඳුණු වහලෙ යට පුළුවන් විදියකට ඉන්න කියලා තමුන්ට ඉස්තෝප්පුවෙ හරි මායාගෙ ගෙදර සාලෙ හරි නිදා ගන්න වෙනවනෙ.

සාෂා කිලිනොච්චි යන්න කිට්ටුව දවසක සාෂා එක්ක ළඟ සම්බන්ධයක් තිබිලා පස්සෙ පරම වෛරකාරියක් බවට පත් වෙච්ච ගෑනියෙක් මනෝරම්‍යාට කිව්වා සාෂා නීති උපාධියක් තියෙන විදියට හදාගෙන තියෙන සහතිකේ බොරු එකක් කියලා.

"අනේ ඔය ඕන එකක් කර ගත්තාවෙ." කියලා මනෝරම්‍යා ඒ කතාව මඟ ඇරියා. නමුත් ඒක එහෙම වෙන්න බැරි නෑ කියලා හිතෙන්න ගත්තා. සාෂා කවදාවත් උසාවියක පෙනී හිටලාවත් නීතිඥයෙක් හැටියට රස්සාවක් කරලාවත් නෑ නේද කියන එක කල්පනා වුණාම මනෝරම්‍යා කොළඹ විශ්ව විද්‍යාලයෙන් තොරතුරු හොයලා බැලුවා. මිනිහට බාහිර උපාධියක් තිබුණා. ඒත් සමාජ විද්‍යාවට පශ්චාත් උපාධියක්වත්, නීති උපාධියක්වත් තිබුණෙ නැහැ. ඒත් මිනිහව නිරාවරණය කරලා වර්ණාසිව විශාල අවුලකට ඇද දන්න බැරිකම නිසා නිහඬ වුණා. මනෝරම්‍යා දන්න කීප දෙනෙක්ම ඒ විදියට බොරු ආචාර්ය උපාධි පාවිච්චි කරමින් රාජ්‍ය නොවන සංවිධානවල රස්සාවල් ලබාගෙන තිබුණා. එහෙම පසුබිමක ඒවා හෙළිදරව් කරනවා නං සාෂාට විතරක් අභියෝග කරලා වැඩක් නැහැනෙ. අනික් එක චණ්ඩින්ටත් ආචාර්ය උපාධි දෙන දේශපාලන පක්ෂ සබඳතා උඩ සාහිත්‍ය ශූරී, සාහිත්‍ය උපාධි දෙන දේශපාලන පක්ෂ සබඳතා උඩ සාහිත්‍ය ශූරී, සාහිත්‍ය

උපාධි දෙන දේශපාලන පක්ෂ සබඳතා උඩ සාහිත්‍ය ශූරී, සාහිත්‍ය උපාධි දෙන පට්ටම් දෙන පරිසරයක සාෂා හොර උපාධියක් හද රත්න වගේ පට්ටම් දෙන පරිසරයක සාෂා හොර උපාධියක් හද

ගන්න ඇත්තෙ හොඳ රස්සාවක් ගන්නනෙ. ඒත් එහෙමයි කියලා වර්ණාසිට කිව්වත් එයා විශ්වාස කරන්නෙ නැති බවත් සහතිකයිනෙ. සාෂා ගැන ඒ ආරංචිය කියපු අම්මණ්ඩිත් බොරු සංවිධානයක් හදාගෙන ජාත්‍යන්තර සංවිධානවලින් සල්ලි කඩා ගන්න බව කවුරුත් දනගෙන හිටියා.

භූමිකම්පාවට පැය හත අටකට කලිනුත් මනෝරම්‍යා හිතමින් හිටියෙ සාෂාගෙ බොරුව මහා බොරුවක් අතුළෙ ඇතිවන නිසඟ ප්‍රතිඵලයක් ද කියන එකයි.

ඉස්තෝප්පුවට වෙලා බලා ඉන්නෙ හැකුව අර පොත් දෙක විනාශ කරලා දන්න ඕන කියන හැඟීම තදින් දැනෙන්න ගත්තා. ඒ එක්කම ළිඳ උතුරලා යන විදියට බය හිතෙන්න ගත්තා. කලින් නොතිබ්බව උල්පතක් පැදිලා ද? නැත්තං පොළොව යටින් ගලන දිය පාරක මාර්ගය වෙනස්වෙලා ? එහෙම උනොත් භූමි කම්පාවෙන් බේරිච්ච පරණ ගල් බිත්ති පවා හිටිගමන් ගිලා බහින්න ඉඩ තියෙනවනෙ. ඒ ගෙදර රෑට නිදා ගන්න එක භයානකයිනෙ.

ළිඳට නාන්න ආපු ඉලන්දාරි "යන්තං ඇන්ටි" කියලා පාරට ගොඩ වුණා.

"ළමයිනේ අපේ දූව දැක්කොත් ඉක්මනට එන්න කියන්න." කියලා කියා ගන්න කට ඇරියට වචන පිට වුණේ නෑ.

මනෝරම්‍යා ගඩොල් පුපුරලා කපරාරුව ගැලවිලා තිබුණු රවුම් කුලුණක් අල්ල ගන්න අත දික් කරාට කුලුණු අහුවුණේ නෑ. පොළොවත් එක්කම තමන් ගිලා බැහැලා එක පාරට උඩ යනවා වගේ දැනුණා.

"පුතේ වර්ණාසි!" කියලා කෑ ගහන්න හැදුවට උගුර බැඳලා වාගෙ දැනුණා.

මනෝරම්‍යා බිම වැටුණා ද බිම දිගා වුණා ද දන්නෙ නෑ. එක අතක තිබුණ ලොකු දිනපොත් දෙක දියේ ගිල්ලුවද නැද්ද කියන එකත් මතක නැති වෙලා ගියා. මනෝරම්‍යා ඒවා තියෙනවද බලන්න අත ගාන්න හැදුවට අත තමන්ට අයිති නැති දෙයක් වගේ වුණා.

යටිපතුල් සීතල වෙමින් තිබුණා. ඒක බය හිතෙන සීතලක් නෙවෙයි. ජීවිත කාලයක මහන්සියයි, ප්‍රශ්නයි සේරම වෑහිලා යන සුවදයක සීතලක්. ඒ සීතල ගතියෙ ගිලෙන්න මිසක් ඒකෙන් මිදෙන්න උවමනාවක් නැති වෙමින් තිබුණා.

"වර්ණාසි මගේ පුතේ" කියන වචන පිට වුණේ යටිපතුල්වල ඉඳලම ඉහළට තල්ලු වෙලා ඇවිදින් ඉල ඇට තෙරපමින් ආ ශක්තියකුත් එක්කයි.

ළිඳෙන් නාන්න හිතාගෙන ආපු කර්නල් සුභාෂ් තමයි

වර්ණාසි ඉස්තෝප්පුවෙ හිටිය විදිය අමුතු නිසා ළඟට ඇවිත් බැලුවෙ.

"වර්ණාසි මගේ දුවනේ" කියලා දෙවන වතාවටත් කියනවා විතරයි ඇහුණෙ. මනෝරමාගෙ ඔළුව පැත්තකට කඩා වැටුණා. කර්නල් සුභාෂ් පාරෙ ගිය අයට කතා කරලා මනෝරමාව පිට්ටනියෙ වෛද්‍ය මධ්‍යස්ථානෙට ගෙනියන්න කටයුතු කළා. රතු කුරුසයෙ රෝගීන් ගෙනියන කැන්වස් මැස්සක් අරගෙන එනකොටත් මනෝරමාගෙ කකුල් දෙක සීතලවෙලා තිබුණා.

ඒ වෙනකොට වර්ණාසි හිටියෙත් වෛද්‍ය කඳවුරක. ඒත් මනෝරමාව එතනට ගෙනාවා කියලා කවුරුවත් එයාට කිව්වෙ නෑ. ඒ එයාගෙ අම්මා කියලා එතන හිටිය කාටවත් කල්පනා වෙන්නත් නැතුව ඇති.

වර්ණාසියි මායායි ගෙදර යනකොට මනෝරමා.ජේන්ත හිටියෙ නෑ. අම්මා පිට්ටනියට යන්න ඇති කියලා වර්ණාසිට හිතුණා. පිට්ටනියෙදි ලැබුණු පාර්සලේ තිබුණු ඉටි පන්දම පත්තු කරන්නත් කලින් ඉස්තෝප්පුවෙ තිබුණු පරණ දින පොත් දෙක වර්ණාසිගෙ පයේ වැදුණා.

වර්ණාසි ඉටි පන්දම පත්තු කරලා අම්මගෙ රිදී පාට ඉටි පන්දම් රැකක රඳවලා හුළඟට මුවා වෙන්න බිමින් තිබ්බා. ඉස්තෝප්පුවෙ තිබුණු පරණ දින පොත් දෙක සෝපාව උඩින් තියලා පිට්ටනියදි ලැබුණු බඩු මල්ල පරීක්ෂා කරන්න හදනකොට තමයි ලිනට් අඬාගෙන දුවගෙන ආවෙ.

"ඇයි ලිනට්?" වර්ණාසි හිතුවෙ ලිනට්ගෙ පවුලෙ කෙනෙකුට මොනවා හරි කරදරයක් වෙලා කියලයි.

"ලොකු මිසී"

"ලොකු මිසී නෑ ලිනට්. පිට්ටනිය පැත්තෙ හරි කොහෙ හරි යන්න ඇති."

ලිනට් වර්ණාසිව බදාගෙන අඬන්න ගත්තා.

වර්ණාසි ගේ චිත්ත සංඛාරය

මට මතක නෑ අම්මගෙ මරණය දැනගත්තෙ එයා තුලියට ගත්තු ගෙදරදි ද? පිට්ටනියට යනකොට ද නැත්තං වෛද්‍ය කඳවුරේදි ද කියලා. කලින් දවසෙ රෑ අපි පණ බේරගෙන ගිය හැටිත් උදේ පාන්දර අම්මා පදිංචි තැනට ආ හැටිත් මතකයි. ඊට පස්සෙ කට හඬවල් [illegible] හෙලිකොප්ටර් හඬවල්, රතු කුරුස ලාංඡනය, බෙහෙත් සුවඳවල් [illegible] ඇඳවල් අතර අම්මාගෙ ශරීරය බිම තණකොළ [illegible] ප්ලාස්ටික් පැදුරක තියෙනවා දැක්කා. කලබල අස්සෙ පොල්තෙල් පහන් හොයා ගත්තෙ කොහෙන්ද දන්නෙ නෑ. අම්මාගෙයි තව නාඳුරණ ළමයි දෙන්නෙක්ගෙයි සිරුරු එක ළඟ තිබුණා. ඒ තුන්දෙනාටම පහන් දෙකක් පත්තු කරලා තිබුණා. අම්මා නිදාගෙන ඉන්නවා වගේ හිටිය නිසා මං අම්මගෙ අතින් ඇල්ලුවා. අත සීතල වෙලා තිබුණා.

මට මා ගැන මතකයක් තියෙන්නෙ අවුරුදු තුනේ විතර කාලෙ ඉඳලා. කොණ්ඩෙ හැම තැනම පාට පාට රිබන් ගැට ගහලා සුදු පුළුසක් මහපු රතුපාට සත්සූට් එකක් ඇඳගෙන අම්මා ළඟට දුවනවා මතකයි. අම්මා අතේ තිබුණු බෑග් බිමට දාලා මාව උස්සලා අරගෙන වටයක් කරකවනවාත් අම්මගෙ හිනා හඬත් "මිය දරුවා වැටෙයි" කියන ආතම්මගෙ හඬත් මට ඕනම වෙලාවක ඇස් පියාගෙන අහන්න විඳින්න පුළුවන්. අම්මාගෙ පපුවට තුලි උනාම "ටික්... ටික්... ටික්..." ගාලා ඔරලෝසුවක් වගේ සද්දෙ අහගෙන මං උදේට ඇස් පියාගෙන ඉන්නවා.

"මේ හොර ගෑනියො දෙන්නා නැගිටින්නෙ නැද්ද?" කියලා

ආතම්මා දෙතුන් පාරක් අහනකල් අපි ගුලිවෙලා ඉන්නවා.

"අම්මා ආවම මාව ඕන් නෑ" කියලා ඒ කාලෙ ආතම්මා හෝක්කඩු කියනවා. ඒ වුණාට ආතම්මා මට වඩා අම්මට ආදරෙයි කියලා මට නිතරම හිතුණා. අම්මා සඳුද ඉඳලා සිකුරාද වෙනකල් ගෙදර නැහැනෙ. ආතම්මාට මොනව හරි ලැබුණොත් "රමණී මැණිකෙ ආහම කනවා." කියලා තියා ගන්නවා. ආතම්මා කැමති වුණේ නැහැ අම්මට මනෝරමා කියලා කතා කරන්න. ඒ නම ගමේ දුප්පත් මිනිස්සුන්ගෙ ළමයින්ගෙ උප්පැන්නෙට ලියයි කියන බයට එහෙම කළා කියලා මං දැන ගත්තෙත් හුඟක් ලොකු වුණාට පස්සෙයි.

මං වැඩියම ආදරේ ආතම්මට ද අම්මට ද කියලා කවුරු හරි ඇහුවම මට කවදාවත් බැරි වුණා හරි උත්තරේ හිතා ගන්න. ඇස් දෙක පියාගෙන උනත් අම්මගෙ සුවඳයි ආතම්මගෙ සුවඳයි නොදැනෙන්න නහයට ප්ලාස්ටර් අලවලා තිබුණත් ඒ දෙන්නාගෙ අත අල්ලලා ඒ කවුද කියන්න මං දැනගෙන හිටියා. ඒ ආතම්මගෙ අත රළු නිසාත් අම්මගෙ අත සිනිඳු නිසාත් නෙවෙයි. අම්මගෙ පිට ගැවුණත් කකුලක් ගැවුණත් ඒ අම්මා තමයි කියන්න දැනගෙන හිටියෙ කොහොමද කියන්න මං දන්නෙ නෑ.

අම්මගෙ ඇඟේ උණුසුමයි, පපුවෙ ගැස්මයි අම්මගෙ කකුලෙ දූවිම ඇඟිල්ලෙන් උනත් දැනගන්න පුළුවන්. මට අවුරුදු දහයක් විතර වෙනකල් අම්මා ගෙදර ආ දවසට මං එයාගෙ නියපොතු පාට කරනවා. අම්මා ඇස් පියාගෙන ඉන්නවා. මං ගාන්නෙ එක එක පාට.

"මේ මොකද මේ බිලියකට වාගෙ රතු, නැඹිලි, දම් හැම එකම ගාලා. මොනවා හරි එක පාටක් ගාන්න" කියලා ආතම්මා කියනවා.

"ඕන්න ඔහෙ ගාපුවාවෙ. එයාගෙ ආසාවනේ." කියලා අම්මා මට ඉඩ දෙනවා.

සිකුරාදට අම්මා ගෙදර එනකොට රෑ වෙන නිසා ආතම්මා මට වේලාසනින් බත් කවලා, දත් මද්දලා, උණු වතුරෙන් ඇඟ හෝදලා, ඇඟ පුරාම පෙයාර්ස් බේබී පියුරු ගාලා, රෝස පාට පිජාමා සූට් එක අන්දවලා නිදි කරවනවා.

මට නින්ද යනවා තමයි. ඒත් කොච්චර තද නින්දෙ හිටියත් අම්මා ඇවිත් කකුල ඉඹිනකොට මට දැනෙනවා. අම්මා කකුලෙ ඇඟිල්ලෙන් ඇඟිල්ල වෙන වෙනම ඉඹිනවා.

"මගෙ කිරි පැංචිට හාදු එකයි."

"මගෙ රන් කැටියට හාදු දෙකයි."

"මගෙ රෝස මලට හාදු තුනයි."

"මගෙ හා පැටියට හාදු හතරයි."

"මගෙ මුව පැටියට හාදු පහයි."

ඔය වගේ දේවල් කිය කියා අම්මා ඉඹිනකොට මගේ පපුව බැලූනක් වගේ පිම්බෙනවා. ඒ පිම්බෙන්නෙ ආදරෙන් කියලා කවුරුවත් කියලා දීලා නැති වුණාට ඒක ආදරේ තමයි කියන එක මං දැනගෙන හිටියා.

එදා [illegible] වෙලාවෙ මට දැනුණෙ එක පාරටම මං පොඩි ළමයෙක් වෙලා වගෙයි. පුංචි ළමයින්ට කරන්න පුළුවන් දේවල් ලොකු ගෑනියෙකුට කරන්න අමාරුයිනෙ. අම්මගෙ බෙල්ලෙ එල්ලිලා "මගෙ අම්මට අහස තරං ආදලෙයි ආදලෙයි" කියලා පුංචි කාලේ වගේම පුරතලේට කියා ගන්න මට අමාරු වුණා. ඒත් එදා රෑ ලංකාවෙ හැඩය වෙනස් වෙමින් තියෙද්දිත් අම්මාගෙ ආදරේ හැඩයවත් මගේ බැඳීමේ හැඩයවත් වෙනස් වෙලා නැති බව හොඳටම දැනුණා. ඒත් ඒක වචනවලින් කියන්න මං පසුබැවා.

"කලබල වෙන්න එපා. නරක ආරංචියක් තියෙනවා. ඔයාගෙ අම්මා නෑ." කියලා කවුද මට කිව්වෙ කියලා මතක නෑ. ඒත් කවුරුහරි ඒ අදහස කිව්වෙ ඉංග්‍රීසියෙන්. "යුවර් මදර් හැස් පාස්ඩ් අවේ. ඉට් මේ බී අ හාර්ට් අටෑක්" කියලා කියනවා ඇහුණා. ඒ මොහොත මට මාව පෙනුණෙ කඳුළු පුරවගෙන ඉන්න පුංචි ළමයෙක් වගෙයි. කවුරුවත් විශ්වාස නොකර අමුතු දෙයක් සිද්ධ වුණා. මට පෙනුණෙ නමක් නැති රූපයක් නැති කෙනෙක් විදියට මම වර්ණසී කියන කෙනා දිහා බලාගෙන ඉන්නවා වගෙයි. එයා තමුන්ගෙ අම්මාගෙ මළ සිරුරෙ අත අල්ලලා හොල්ලලා බලනවා. පපුවට අත තියලා බලනවා. ඊට පස්සෙ අඬන්නෙත් නැතුව නෑ

ගහන්නෙත් නැතුව කවුරු හරි ගෙනත් දීපු කොළපාට කැන්වස් රෙද්දක් දාපු අකුලන බංකුවක වාඩි වෙලා බලාගෙන හිටියා.

"මෙයාගෙ හස්බන්ඩ් කිලිනොච්චි ගිහින්" එහෙම කිව්වෙ අම්මාගෙ ගේ අයිති මායා ආන්ටි වෙන්න ඕන. කවුරු හරි ඒ කතා කළ කෙනා හිටියෙ අඳුරෙ. තවත් කීප දෙනෙක් අඳුරෙ හිටගෙන මගේ උරහිසට අත තියනවා දැනුණා. ලිනට් වෙන්න ඇති මාව එයාගෙ මහත ශරීරයට හේත්තු කර ගත්තෙ.

"කිලිනොච්චියෙ අර්ත් ක්වේක් එක හරි දරුණුයිලු. අපිට වඩා විනාඩි විසි එකකට කලින් වෙලා තියෙන්නෙ. මේක අමුතුම පැටර්න් එකකටනෙ සිද්ධ වුණේ."

ගොරෝසු පිරිමි කටහඬකින් ඒ කතා කළ කෙනා කිව්ව දේ මගේ ඔළුවට කිඳා බහින්න තව විනාඩි පහක් විතර යන්න ඇති.

"සාෂා" මං කෑ ගහලා අඬන්න කට ඇරියා. ඒත් වචන පිටවුණෙත් නෑ. ඇඬුණෙත් නෑ.

මට දැනුණා මං නැගිට්ලා අම්මගෙ මිනිය බදාගන්නවා. අර හොඳට දන්න පුරුදු උණුසුම හීනෙන් පවා අඳුරණ හර්ද ස්පන්දනය දැනුණෙ නෑ. අම්මා එහෙම නැති වෙන්න පුළුවන් ද? මං කියන්නෙ අම්මා කෙනෙක් මැරෙන්න බෑ කියන එක නෙවෙයි. මං කියන්නෙ මැරෙනවා කියන එක පිළිගන්න අමාරුයි කියලයි. අම්මා එතන ඉන්නවා වගේ මට දැනුණා. ඒ අප්‍රාණික සීතල මළ කඳ මගේ අම්මා නෙවෙයිනෙ. මගේ අම්මා බොහොම ප්‍රාණවත් කෙනෙක්නෙ. අම්මාගෙ ඒ ප්‍රාණවත් ගතිය, අම්මාගෙ හිනාව එතන තිබුණා. ඔය කතාව කටක් ඇරලා කියන්න පුළුවන් දෙයක් නෙවෙයි. මං කියන්නෙ අම්මා හොල්මනක් වෙලා හිටියා කියන එක නෙවෙයිනෙ. ආතම්මා වගේ දෛවයට හිස නවලා මැරෙන කෙනෙක් නෙවෙයි අම්මා.

මට දැනුණෙ මමයි අම්මයි දෙන්නම නාට්‍යයක් දිහා බලාගෙන ඉන්නවා වගෙයි. සාෂා මැරිලා නෑ කියලා මට දැනුණා. සාෂා ගැන බය හිතුණෙ නැහැ. එයා තනි කකුලෙන් හරි මං ඉන්න තැනකට එයි කියලා මං දැනගෙන හිටියා. ඒත් අම්මාගෙ මළ සිරුර පෙනි පෙනිත් අම්මා මැරෙන්නෙ නෑ කියලා හිතිච්ච එකේ

සාෂා ගැනත් හිතුණෙ ඒ සමාන දෙයක් වෙන්න පුළුවනිනෙ. නමුත් මගේ යටි හිත කිව්වා සාෂායි එයාගෙ සිරුරයි වෙන්වෙලා නෑ කියලා. නමුත් මමයි වර්ණාසියි වෙන්වෙලාද නැද්ද කියන එක නං දැනෙමින් නොදැනෙමින් තියෙන ස්වභාවයක් ඇති වුණා.

"හොඳ විදියකට මේක කරන්න." මං ඒක කිව්වෙ කිසි කෙනෙක් එල්ල කරලා නෙවෙයි. නිකම්ම අන්ධකාරයට කතා කළා.

පිට්ටනියෙ ඇතින් ගිනි ගොඩවල් කීපයක් පත්තු වෙන්න ගත්තා. මිනිස්සු අඳුරු ඡායාවල් වගේ එහාට මෙහාට ගියා.

"මහත්තයා එතකල් මිනිය තියා ගන්න එක තේරුමක් නෑ. කිලිනොච්චියෙ ඉඳලා එතකල් තියා ගන්න විදියකුත් නැති වෙයි." කවුද පිරිමි කෙනෙක් මගේ මූණට එබුණා.

"හොඳ විදියක් කරන්න. මට කිසි දෙයක් තේරෙන්නෙ නෑ."

"තව දැනුම දෙන්න කවුරු හරි ඉන්නව ද?"

"කවුරුත් නෑ. [illegible] නෑදෑ පවුලක් හිටියා. ඒගොල්ලො පහුගිය දවස්වල නුවර ගියා."

"නුවරට හානියක් නෑ. මිනිය නුවර ගෙනියන්න ඕන ද?"

"නෑ...... ඒ ගොල්ලො නිකං නෑගං ගියෙ. මං විතරයි වෙන කවුරුත් නෑ."

"බය වෙන්න එපා. මං කර්නල් සුභාෂ්. මං ඔයාගෙ මහත්තයාව අඳුරනවා. අද උදෙත් ඔයයි අම්මයි පිට්ටණියට එක්ක ආවා. බය වෙන්න එපා."

භූමිකම්පාවකින් තමන්ගෙ ගේ කඩා වැටුණටත් පස්සෙ ජීවිතේ බේරිලා තියෙද්දි මොනවට බය වෙන්ට ද? ඒ මනුස්සයා මට උදව් කරන්න හදපු නිසා ස්තූති කළ යුතු වුණත් මම ඔහේ බලා හිටියා.

"දැං කොර්නෙල් පරීක්ෂණේ ඉවර වුණාම අද රෑම උනත් කටයුතු ඉවර කරනවා නං හොඳයි. මොකද මේ වෙලාවෙ මේවා තියාගෙන ඉන්න එක තේරුමක් නෑ. ඒත් මේ මිස්ට කැමති විදියක්

කියන්න. හෙට සිකුරාද. එහෙම උනොත් අනිද්ද වෙනකල් තියා ගන්න වෙනවා."

"පුදුසු විදියක් කරන්න." කියලා මං ඇස් පියා ගත්තා.

අම්මා දවසක් මට කියලා තිබුණා "මං මැරුණාම පැය විසි හතරක්වත් තියා ගන්න එපා" කියලා.

"කවුරුවත් කරදර වෙන්න ඕන නෑ. මෙඩිකල් කොලේජ් එකට දෙන්න. මං පෙට්ටියට රේමන්ඩ්ස් එකට සල්ලි ගෙවලා තියෙන්නෙ." අම්මා එහෙම කිව්වෙ ආතම්මා මැරුණ අලුතමයි. ඒ දවස්වල නං අම්මා හිටියෙ තරහා ගතියෙන්. ඒ මට ගේ ලිව්වට නෙවෙයි කියලා මං දන්නවා. අම්මා කවදාවත් දේපළ වස්තුවට තණ්හාවක් තිබුණු කෙනෙක් නෙවෙයිනෙ. අම්මා හිතුවෙ සාෂා සේරම නැති නාස්ති කරල මාවත් අත අරියි කියලනෙ.

සාෂා තමන්ගෙ මරණයටවත් එනවට අම්මා කැමැති නැති බව මං දැනගෙන හිටියා. මරණය අම්මට ඕන විදියට අධ්‍යක්ෂණය කරන්න බැරි බව අම්මා හිතන්න නැතුව ඇති. භූමිකම්පාව වෙලාවෙ එයා ගෙදර හිටියා නං ඒ වෙනකොට ජාතික මට්ටමේ තීරණ ගන්න සහනාධාර සංවිධානය කරන්න එයාට වැඩ ගොඩක් තියෙනවනෙ. ඒත් එහෙමය කියලා තාත්තම්මගෙ මරණයෙ කටයුතු නොකර හිටියොත් මට හොඳ නැති නිසා එයා ඒ සේරම කරට ගන්නවා සිකුරුයි. ඒත් අම්මා ඉතුරුවෙලා එයා ගියා නං අම්මා මරණයට එන්නෙ නැති වෙයි ද?

මං මොනවද හිතන්නෙ? තමුන්ට පණ වගේ ආදරේ කරන මිනිහගෙ මරණය ගැන හිතන්නෙ මොකට ද? සාෂා කිය කියා හිටියෙ "කවද හරි මං ඔයාට කලින් මැරෙනවනෙ. එදාට අඬන්න එපා. මගේ සොහොන් කොතේ ලියන්න ප්‍රජාතන්ත්‍රවාදයත් යුක්තියත්, සාධාරණත්වයත්, සාමයත් වෙනුවෙන් ජීවත් වන්නට තැත් කළ සුන්දර මිනිසෙක් මෙහි නිදයි. ඔහුගේ දූ පුතුන් අවදියෙන් ලොව තනන්නට වෙර දරයි කියලා."

"දූ පුතුන් තියා තාම අපේ පළවෙනි දරුවාවත් ආවෙ නැනේ." කියලා මං කිව්වෙ පපුව පැලෙන තරමෙ අසරණ හැඟීමකින්.

"ඔයා දුක් ගන්න එපා රත්තරං. මං දූ පුතුන් කියන්නෙ අපි වගේ මේ යුද්දෙ නවත්තලා සාමයක් ඇති කරන්න වැඩ කරන තරුණ ළමයින්ට."

"ඒ උනාට ඔයා මරණෙ ගැන කතා කරනකොට මට දුකයි. මං කැමති කවද හරි ඔයාට කලින් මැරෙන්නයි."

"ඒක එහෙම වෙන්නෙ නෑ. එහෙම උනොත් මං ඔයා දිහා බලන්නෙ නෑ. මට ඕන මේ ඉන්න විදියට ඔයා මගේ ළඟ ඉන්නවා දකින්නයි. මට ඔයා පෙට්ටියක ඉන්නවා බලන්න බෑ."

"ඉතින් එහෙම නං මං කොහොමද එහෙම දේකට මූණ දෙන්නෙ. මට ඕන අර තුගේගොඩ හන්දියෙ බෝම්බෙදි එකටම මැරුණ කසාද බඳින්න හිටි දෙන්නා වගේ එකට මැරිලා එක තැන වැළලෙන්න."

"ඒ දෙන්නා බැඳලත් නැතුවනෙ එහෙම ගියෙ. අපි බැඳලා නිසා මං මැරුණොම ඔයාට පුළුවන් මං වෙනුවෙන් මොකක් හරි හදන්න. සාෂා අනුස්මරණ රඟහල වගේ දෙයක්" එද මං ලොකු ප්ලාස්ටර් එකක් කපාගෙන ඇවිත් සාෂාගෙ කටේ ඇලෙව්වා. ඊට ටිකකට පස්සෙ වත්දිම [illegible] ආවා. මං තුස්සිමය හිටියෙ. මේ මනුස්සයා ප්ලාස්ටර් එක පිටින් ඉස්සරහට ගිහින් එයා මැරෙණ කතා කියවන්න ගත්තා.

"මං විහිළුවට කළේ. දැං ඉතිං මැරෙනකල් ඕක කියයි." කියලා මං කිව්වා.

"නෑ........ ඔය වෙන ගෑනු ළමයි එක්ක කතා කරයි කියලා. මොනවා කරන්වද මං මේ ටී.වී. වලින් ස්ත්‍රී අයිතිවාසිකම් ගැන කතා කරනවා. ගෙදර ස්ත්‍රිය මගේ මූලික අයිතිවාසිකම් කප්පාදු කරනවා. මං මේ ගැනිට බයේ ඉන්නෙ."

හැමෝම දන්නවා සාෂා එහෙම කියන්නෙ විහිළුවට බව. එද ලීනට් ඇවිත් හිටියා. මං හිතන්නෙ ඒ කතාව අම්මට වාර්තා කරන්න ඇති. අම්මා සාෂා කෙනෙක් නෑ වගේ හැසිරෙන්න හැදුවට අපේ ගෙදර රණ්ඩු ඇති වෙනවද කියලා දැන ගන්න උවමනාවක් තිබුණු බව අපි දැනගෙන හිටියා.

"මිනිය වළදන්නෙ කොහෙද? ඕගොල්ලන්ගෙ පවුලෙ

සොහොනක් තියෙනවද?" කර්නල් සුහාෂ් මට ප්ලාස්ටික් කෝප්පෙකට නෙස් කැෆේ එකක් ගෙනත් දීලා කල්පනා කළ යුතු ප්‍රශ්නයක් දුන්නා.

ආතම්මගෙ සොහොන තියෙන්නෙ දෙහිඹිවිට වත්තෙ. ආතගෙත්, ඒ පවුලෙ අනිත් අයගෙත් සොහොන් එතන තියෙන නිසා වත්ත විකුණනකොට ඒ කොටස ඉතුරු කර ගත්තෙ "කවද හරි මටත් යන්න වෙන්නෙ ඔතනට තමා." කියලා තැපැල් සීයා කියූ නිසයි. වත්ත ගත්තු මිනිස්සු කිව්වෙ සොහොන්වලට හානියක් නොකරන පොරොන්දුව පිට ඒ පර්චස් දහයත් ලියන්න කියලයි. ඊත් ඒ වෙලාවෙ දෙහිඹිවිටට යන්න වාහනයක් හොයා ගන්නෙ කොහොම ද?

"අම්මා කියලා තිබුණෙ මෙඩිකල් කොලේජ් එකට දෙන්න කියලයි."

"දං මෙඩිකල් කොලේජ් එකෙත් බාර ගන්නෙ නෑ මේ දැඩ උඩේ පමුන මිනිවලවල් ගොඩක් තැලුවා." එතන හිටපු කවුද කෙනෙක් කිව්වා.

"එහෙනං අපේ ගෙදර වත්තෙ පාර අයිනට වෙන්න වළක් කපන්න." මට දැනුණෙ ඒ තීරණය ගත්තෙ මං නෙවෙයි වෙන කවුරුහරි වගෙයි. අපේ ගෙදර පඩිපෙළට එන්න අකමැති වෙච්ච අම්මා අපේ ගේ ළඟ සොහොනකට කැමති වෙයිද? ඒත් අම්මාගේ ජීවිතකාලෙ පස්සෙ කොච්චර දේවල් වෙනස් වෙන්න පුළුවන් ද? සාමා ආච්චි හා අම්මත් හිටියා නං දෙන්නා කතා නොකර ඉඳියි ද? අම්මා එයාට හෙට එන්න නොකියා ඉන්න එකක් නැහැනෙ.

"ආදාහනය කරන්න විදියක් නැතේ. නැත්තං එහෙම කරලා අළු ටික ගමේ ගෙනියන්න තිබුණා." මායා ආන්ටි මට කරුණු පැහැදිලි කරන්න හැදුවා.

වළ කපන්න හිතෙ කල්දී, ඒවා හිදිට වුණේ කොහොමද දන්නෙ නෑ. ඒත් ඒ, ඒ අම්මාගෙ සිරුර අපේ ගෙදර වත්තෙ තැන්පත් කළා. අපේ ගෙදර වහලෙ කැඩිලා, බිත්ති කැඩිලා තිබුණු බව දන්නෙ කවුරු හරි හිනි ගොඩක් ගෙනු නිසයි. හාමුදුරු කෙනෙක් ඇවිත් පංසකූලයකුත් දුන්නා. ඒත් හාමුදුරුවන්ට පිරිකරවත් පූජා

කරන්න විදියක් තිබුණෙ නෑ.

ඊ එළිවෙනකල් මං වෙදා කඳවුරේ හිටියා. මං හිතන්නෙ කවුරු හරි මට නින්ද යන්න බෙහෙත් විද්ද, පසුවෙනිදා මායා ආන්ටියි ලිනටුයි ඇවිත් මගේ අත්දෙක දෙපැත්තෙන් අල්ලගෙන ගෙදර එක්කන් ගියා. මං අම්මගෙ ඇඳේ වාඩි වෙලා මගේ බලාගෙන හිටියා. වහලෙ උළු බිඳිලා විසිරිලා නිසා තැන් තැන්වල ඉරු එළිය පදස වැටිලා තිබුණා.

"අනේ ඉතිං අන්තිමටත් අපේ පොඩි මිසිට කන්න බත් උයලා." කියමින් ලිනට් පිලුණු බත් එක ගෙනත් පෙන්නලා ඇඬුවා.

මං බලාගෙන හිටියෙ රතු කුරුසයෙන් සාමා ගැන ආරංචියක් ගෙනෙයි කියලයි. මං අම්මගෙ ඇඳ උඩ දවස් දෙකක් විතර මගේ බලා ගත්තු අතේ බලාගෙන හිටියා. ටී.බී.සී. එකේ පුද්ගලයෙක් ඇවිත් මොනවද ඇහුවා. මං ඉංග්‍රීසි තේරෙන්නෙ නැතු වගේ හිටියා. අම්මා නැති, වෙච්ච දේ කොච්චර විස්තර කරත් මොකට ද? අනිත් එක මට කියුණෙ ඇහැට පෙනුණෙ නැති වුණාට අම්මා මා ළඟ ඇඳ උඩ ඉඳගෙන "ඔයි අඬන්න එපා පුතේ" කියනවා ඇති කියලයි. කවුරු එහෙම කියපු විදියට ඇස් පල්වෙලා වගේ වුණාට හිතේ කඳුළු සාගරයක් තිබුණා.

"අම්මෙ අපි දැන් කොහෙටද ඉන්නෙ" කියලා කියනවා වෙනුවට මගේ අම්මට ඇහුම්කදෙන කිව්වෙ. ඇත්තටම ඒවා හිත මතා කළ දේවල් නෙවෙයි. මට විඳුණ නිසා මගේ හැඟුම අම්මට විඳන්නයි. අම්මත් ඒකමයි කරන්න ඇත්තෙ. සාමා ඒ කිසි දේකට මැද්දට පනින්නෙ නැතුව හිටියෙ කොහොමෙ ද?

අම්මගෙ හිතේ මොනවා තියෙන්න ඇද්ද? සමන්ගෙ මගෙ වැඩියි කියලා පිළිගන්න ලැජ්ජාවට තරහව දිගටම පවත්තගෙන ගියා ද?

මට තිබුණු ප්‍රශ්න ගැන කල්පනා කිරීම නිෂ්ඵල බව දැන දැනත් එහෙම නොකර ඉන්න බැරි වුණා. මෙතන මොනවා කරන්න ද? ලිනට් මට කෑම ගෙනත් දුන්නා. මිනිස්සු විවිදෙන් සාකච්ඡා ඇහුණා. මායා ආන්ටියි, ලිනටුයි, තව ගාන්තෙට දන්න අඳුනන අයයි අම්මගේ අවමංගල්‍යයේ එක එක විදියට කිව්වා. ඒ පුතාගේ දේවල්

නිකං භයානක චිත්‍රපටියක් වගෙයි.

"පාර්ලිමේන්තුව දිය වත්තාවෙ ගිලිලා. දිය වත්තාව පළල් වෙලා. එතනවද බලන්න යන්න." කියලා ලිනට් ඇහුවා.

"ඕගොල්ලො යන්න" කිව්වා මිසක් මට ඇවිදින්න හිතුණෙ නැහැ. කූඩාරම්වල ඉන් බැරි කීප දෙනෙක් ඇවිත් මං හිටිය තැන බිම නිද ගත්තා. දෙවෙනි දවසෙ කාගෙද කියලා දන්නෙ නැති පුංචි ගෑනු ළමයෙක්ගෙ අතින් අල්ලගෙන ආ කර්නල් සුභාෂ් "මෙයාවත් ඔය කොහෙ හරි නිදි කරව ගන්න" කිව්වා. දිග කොණ්ඩයකුත්, ලොකු ඇස් දෙකකුත් තිබුණු ගෑනු ළමයා කතා කළේ නැහැ.

"මෙයා බයවෙලා. කතා කරන්න බැරි ඒක වෙන්න ඇති. උදේට මෙඩිකල් කෑම්ප් එකට එක්කන් එන්න. දං නින්ද යන්න බෙත් දීලා තියෙන්න" කියලා මිනිහා ලී කකුලත් අද්දමින් ආපහු ගියා.

"බබාගෙ නම මොකක්ද?" මාත්, ඔයාල ආන්ටිත්, නිද ගන්න ආ උදවියත් ඇහුවා. දුරිය කතා නැතුව ලොකු ඇස්වලින් බලාගෙන හිටියෙ අපි එතන නෑ වගෙයි

"සමහර විට පවුලම විනාශ වෙන්න ඇති." ලිනට් මගෙ කණට කරලා කිව්වා.

අත්වලයි, කකුලෙයි තැන් තැන්වල ප්ලාස්ටර් දාලා තිබුණට ළමයට ලොකු තුවාල තිබුණෙ නෑ. ඔළුව අවුල්වෙලා නිසා මං ඇඳේ වාඩි කරවලා කොණ්ඩෙ පීරලා, තදට ගොතලා, අම්මා මට නිද ගන්න ආවරණයක් හදලා තිබුණු සාරිය කොණකින් පටියක් ඉරලා කොණ්ඩෙ ගැට ගැහුවා.

"ඔයා මෙතන දෙයිය ගන්න." කියලා මං ඇඳේ කිත්තිය පැත්ත පෙන්නුවා විතරයි ළමයා එතන වැටිලා හෙලවෙන්නෙවත් නැතුව ගැඹුරු නින්දකට වැටුණා.

"සමහරවිට තාම ලොකු ළමයෙක් වෙලාවත් නැතුව ඇති. ඇඟ හැදිලත් නැනේ." බිම රෙද්දක් එළාගෙන ඉඳගෙන හිටි ගෑනු කෙනෙක් කිව්වා.

ඉස්තෝප්පු කෑල්ල දිගට නිද ගන්න තව කට්ටියක් ආවා. සමහරු ළිඳ දකලා නාන්න ගියා. කවුරු හරි මිදුලෙ ගිනි ගොඩක් ගහලා තිබුණා. එන එන අය ඒක නිවෙන්න නොදී ඇවිලෙන්න මොන මොනවා හරි දැම්මා. කවුද ටයර් එකකුත් දාලා තිබුණා.

"මෙච්චර විනාසයක් වෙලත් මේ මදුරුවො විනාශ වුණේ නැනේ."

"නින්දක් නං වෙන්නෙ නෑ. එළිවෙනකල් මදුරුවො තලන්න තමයි වෙන්නෙ."

ගෑනු වට පට ගාලා මදුරුවන්ට ගහනවා ඇහුණා. ඉතුරුවෙච්චි ගෙවල්, කැඩිච්ච ගෙවල් ගැන කතාවකට හැමෝම වට වුණා. මට ඒ කතා ඇහුණට ඒවාට එකතු වෙන්න හිතුණෙ නැහැ.

"පුදුම වැඩේ කියන්නෙ පරණ පාර්ලිමන්ට් එක ඉතුරු වෙලාලු." කියලා කවුරු හරි කිව්වා.

එක ගෑනු කෙනෙක් කිව්වා සිලිනොව්වියට තුම්කම්පාවක් කියලා වච්නියාවෙන් පණිවිඩයක් ආවලු. "මේකෙන්වත් ඔය නැතිකරේ ඉවර වුණොත් ඇති" කියලා කට ගන්න හම්බ වුණේ නැලු යාන්තමට දෙදරීමක් දනෙනකොට. ටෙලිෆෝන් එකත් හඩක් නැතුව ගියාලු.

"මේකෙන් මං හිතා ගන්නෙ හතුරෙකුටවත් විපතක් වුණාම හොඳ වැඩේ කියන්න නරකයි කියන එක තමයි." ඒ ගෑනු මනුස්සයා බිඳුණු හඬින් කිව්වා.

කතාවල් දේශපාලනයයි, ධර්ම කාරණයි, පෞද්ගලික වැලපීම් අතරයි එහාට මෙහාට දෝලනය වුණා.

"හෙට රතු කුරුසෙට කියන්න තියෙන්නෙ මේ වගේ නිද ගන්න පුළුවන් මට්ටමේ ගෙවල්වල වහළවල්වලට ඉටි රෙදිවත් දම්මලා දෙන්න කියලා."

"කුරුණෑගල පැත්තට කරදරයක් නෑ කියනවනෙ. පොල් අතු ගෙන්නලා හරි හෙවණක් හදලා දුන්නොත් හරි."

කතාවල් අතරින් පතර ඇහෙන්නත් සමහරු ගොරවන්නත්

පටන් ගත්තා. ජනේල දොරවල් වහන්නෙ නැතුව උඩ බැලුවම පරාල රීප්ප අතරින් අඳුරු අහසෙ තරු පෙනෙන රාත්‍රියක ආතම්මාගෙ වියන් ඇඳේ නම ගම නොදත් දැරියක් එක්ක දිගාවෙලා ඉදීම සැබෑවක් ද කියන හැඟීම මතු වෙන්න ගත්තා. භූමිකම්පාවෙ ඉඳලා එක දිගටම වෙච්චි දේවල් චිත්‍රපටියක මිසක් හැබෑ ජීවිතේ දි වෙන්නෙ කොහොම ද? ඉස්තෝප්පුවෙ හිටිය ගෑනු කෙනෙක් හීන් ඇඬිල්ලක් පටන් ගත්තා. කවුරු හරි ළිඳෙන් නාන සද්දෙත් එක්ක ලොකු ටෝච් එළියකුත් ගේ ඇතුළට එල්ල වුණා. මං ඔහේ වැතිරිලා හිටියා. ඕන කෙනෙක් ඕනම දෙයක් උස්සන් ගියාවෙ කියලා හිතුණා.

"මේ සහෝදරියො අපිට සමාවෙන්න ඕන මේ සී.එන්.එන්. රිපෝටර් කෙනෙක් ආවා." පිරිමි කටහඬක් ඇහුණා.

මං නිදි වගේ හිටියා. අනිත් අය කැමැත්තෙන් කතා කරනවා ඇහුණා. මං හිතන්නෙ අපි නිදාගෙන ඉන්නවත් කැමරාවම අනුකර ගන්න ඇති.

තුන්වෙනි දවසෙ චන්දිමා ගිරිකුමුරයි නව කට්ටියකුයි ආවා. මාව බලන්නම නෙවෙයි. ඒක දේශපාලන සානුකම්පාව පළ කිරීමේ චාරිකාවක් වෙන්න ඇති.

"අනේ වර්ණාසි නංගි.... මං දැන ගත්තා ඔයා බේරිලා ඇති කියලා." චන්දිම මාව බද ගත්තා. කලින් දවසෙ රෑ ආපු ගෑනු ළමයාව බදගන්න හදනකොට ඒ ළමයා අඩන්න ගත්තා. බීම ගුලි වුණා.

"එයා ලොකු ෂොක් එකකින් ඉන්නෙ" කියලා කවුරු හරි කිව්වා.

"සාෂා ගැන ආරංචියක් නෑ. දං කිලිනොච්චියෙ බේරිලා ඉන්න අයි.එන්.ජී.ඕ. වල කට්ටියව හෙලිකොප්ටර්ස්වලින් ඉන්දියන් මෙඩිකල් ෂිප් එකකට ගෙනියනවා. නැව කොච්චින්වල්ට යනවලු. සාෂා ගැන මොනවා හරි දැන ගත්තු ගමන් මං පණිවිඩයක් එවන්නං."

එහෙම දැක බලන්න ආවම ස්තූතියි කියන්න ඕන ඇති. ඒත් මං "අපෙ අම්මාත් නැති වුණා" කියලාවත් නො කියා බලාගෙන

හිටියා.

"වර්ණාසි නංගි කොහොමටත් වැඩි කතා නැතේ. මෙයාව හොඳට බලාගන්න" කියලා චන්දිම වටේට හිටි අයට කිව්වා.

පහුවෙනිද උදේ ගෑනු ළමයා පිට්ටනියට යන්නෙ නැතුව බිත්තියට ගුලිවෙලා හිටියා. ලිනට් ගිහින් පෝලිමක ඉඳලා කර්තල් සුභාෂ්ට කියලා අපිට පානුයි වතුර බෝතලුයි ගෙනත් තිබුණා. සෑහෙන බඩගින්නක් තිබුණට මට කාපුවා සේරම වමනෙට ගියා. ගෑනු ළමයා කෑම කාලා ඇඳේ ගුලි වුණා.

"එන්න අපි නාමු" කිව්වම නැගිටලා ආවා.

ළිඳේ වතුර උතුරනවා දැක්කම ළමයාට හිනාවක් නාවත් වතුරට අත දාලා ඇඟිලි එහාට මෙහාට කරමින් හිටියා. සමහරු පාර්ලිමේන්තුව දියවන්නාවෙ ගිලිලා තියෙන හැටි බලන්න ගියා. මට එහෙම ගමනකට හිත තිබුණෙ නෑ.

ළිඳෙ වතුරවල බොර ගතිය නැතිවෙලා තිබුණා. ඒත් වතුරෙ හුරමක උණුසුමක් දැනුණා. අපි නාලා ඉවර වෙන්න කලින් තව හුගාක් දෙනා නාන්න ආවා.

"දං ඉතිං මේක බේරන්න බැරිවෙයි" කියලා මායා ආන්ටිට කිය වුණා.

භූමිකම්පාවකින් පස්සෙ ළිඳක් කෙළවෙයි කියලා අහලා තිබුණත් මගේ කියලා බද ගන්නෙ කොහොමද කියලා අහලා එයා අමනාප කර ගන්නෙ මොකට ද?

"ඔයාගෙ නම මොකද්ද පුතේ?" දැරියගෙ නෙත කොණ්වෙ පිහදන ගමන් මං අහපු ප්‍රශ්නෙ ඇහුණ බව පෙනුණා. එයා මගේ මූණ දිහා බලාගෙන හිටියෙ හරියට නම මතක් කර ගන්න හදනවා වගෙයි.

"ඔයාට නම මතක නැද්ද? එහෙනං අපි ඔයාගෙ නම දැනගන්නකල් ඔයාට වෙන ලස්සන නමක් කියමු. ඔයා කැමති නමක් කියන්න බලන්න."

දැරියගෙ ඇස්වලින් කතා කරන්න උවමනාව පෙනුණා. ඒ

වුණාට දූරිය කතා කළේ නෑ.

ඇමරිකානු ස්වේච්ඡා සේවිකා කණ්ඩායමක් ඇවිත් චොක්ලට්, රෙදි බෝනික්කෙක්, කතන්දර පොතක්, රෝස පාට පිජාමා කට්ටලයක්, දත් බුරුසු, දත් බෙහෙත්, පියරු, ඕඩිකොලොන් හෙම බෑග් එකක් දුන්නා. "නිකී" කියලා තමන්ව හඳුන්වා දීපු රත්වන් කෙස් තියෙන වෛද්‍ය ශිෂ්‍යාවක් කතා නොකරන දූරිය එක්ක සෙල්ලම් කරන්න නැවතුණා. එයා දූරිය උකුලෙ තියාගෙන සිංදු කිව්වා. දූරිය ඒ තමන් නෙවෙයි වගේ හිටියා.

මටත් දැනුණෙ ඒ මම නෙවෙයි වගෙයි. අම්මා ජේන්නෙ නැති උනාට අම්මා ඉන්නවා වගේ දැනෙන්නෙත් සාෂා ගැන ආරංචියක් නැති වුණාට එය මැරිලා නෑ කියලා දැනෙන්නෙත් වර්ණාසි කියන කෙනාට නෙවෙයි වෙන කාට හරි වගේ වුණා. අම්මා කතා නොකරන සාෂාගෙ පෙනී සිටීමකුත් නැති තැනක වර්ණාසි කෙනෙක් ඉන්න බැහැ වගේ අමුතු හැඟීමක්.

වෙන කරන්න දෙයක් නැති කමට ගෙයි දූවිලි පිහදලා අතු ගාන්න ගත්තාම මට අම්මගෙ පරණ දින පොත් දෙකක් හම්බ වුණා. ඒවා අදාළ වර්ෂවල ලියූ දිනපොත් නෙවෙයි. වරින්වර එයාගෙ හිතේ තියෙන දේවල් ලියපුවා.

"කිසියම් දිනක මගේ පුංචි කෙල්ල වර්ණාසිට මේ සියලු ප්‍රහේලිකා විසඳා ගත හැකි වන සේ සියල්ල ලියා තැබිය යුතුයයි සිතේ. ඇතැම් විට ඔහු දිනෙක මා මෙය විනාශ කර දමන්නට ද ඉඩ ඇත. මෙය ලියන්නේ හෘදයාබාධයෙන් පසු ගෙදර පැමිණ සතියකිනි. යන තැනක් දැනුම් දුන්නේ නැතැයි වර්ණාසි මට දෙස් කීවා ය. එහෙත් මම දඟ වැඩක් කළ ළමයෙකු මෙන් සිනාසෙමින් සිටියෙමි. රෝගීව අසරණව සිටින විට සාෂා මා බලන්නට ආවා නම් මගේ රෝගය උත්සන්න වන්නට තිබිණි. මා මගේ සිරියේ අත පය වාරු නැති වී කතා කරගන්නට බැරිව ගියහොත් වර්ණාසි මා ඇගේ ගෙදරට ගෙන යනු ඇතැයි කීයා ය. මේ සියල්ල හිතේ හිර කරගෙන නොසිට ලිවීමෙන් මට ද සහනයක් දැනෙනු ඇත. කොයි මොහොතේ හෝ මා මැරුණොත් වර්ණාසි සදාකාලිකව සාෂාගේ දාසිය ද සිරකාරිය ද වනු ඇත. ඔහු ගේ සැබෑ ස්වරූපය දැන ගත් දිනෙක මගේ දුප්පත් කෙල්ලගේ පපුව පැලී යනු ඇත.

මා සම්පූර්ණයෙන් වැරදි වන්නට ද ඉඩ තිබේ. ඕනෑම තරක මිනිසකුගේ යථා ස්වභාවයේ නාෂ්ටිය යහපත් විය යුතු ය. වර්ණාසිගේ විවාහයත් සමඟ මා වඩ වඩා දර්ශනික පොත් තුළ ගිලී යන්නට වූ නිසා තරක යනු බාහිරින් ඇලෙන කුණු දූවිලි පමණක් යයි ඉතා හොඳින් තර්ක කළ හැක. ඒ සඳහා උපනිෂද් සිට බුද්ධ ධර්මයත් එතැන් සිට ශංකරාචාර්ය පසුකොට අද දක්වා විවිධ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ උපුටා දක්වන්නට දනිමි. එහෙත් ඒ කිසිදු දැනුමකින් සාෂා කෙරෙහි ඇති අප්‍රසාදය හා අවිශ්වාසය මැකී යන්නේ නැත. එය එසේ වන්නේ නම් යහපත් ය. එහෙත් සාෂා සාෂාම ය. ඔහු අතීත කෝපයක වේදනාවක මතක මාත්‍රයක් පමණක්ව තිබිණ. පසුව මගේ දුව නිසා එය පසුව මැද විශාල වනයක් බවට පත් විය. මා මගේ සිත ජය ගත යුතු ය.

ප්‍රභාකරන් සිල් ගනු ඇතැයි දකුණේ සාම ක්‍රියාකාරියන් පවා සිහිනෙන්වත් සිතන්නේ නැත. යම් ප්‍රාතිහාර්යක් සිදු වී ඔහු මහණ වීම [illegible] වෙනත් හින්දු යෝගියකු වන්ට ඉඩ නැති ද? දරුණු අපරාධකාරයකු ධර්ම මාර්ගයකට වැටී සහමුලින් වෙනස් විය හැක. දකුණේ [illegible] කැරැල්ල මැඩලීමට දරුණු ලෙස රජකාරි කළ හමුදා නිලධාරියකු මහණ වූ බව මා අසා ඇත. එසේ නම් 2500 වසරක් බුද්ධ ධර්මය රැක ගත් රටේ සාෂාට අවංක වන්නට ද ඉඩ තිබේ. සාෂා ප්‍රභාකරන් තරම් දරුණු පුද්ගලයෙකු නො වේ."

අම්මා මැරෙන මොහොතෙ ඒ පොත් දෙක තමයි ළඟ තිබිලා තියෙන්නෙ. සමහර විට අම්මා ඒවා විනාශ කරන්න ගියා ද? නැත්නං අන්තිම මොහොතෙත් මොනවා හරි ලිව්ව ද? එහෙම නං පොත් දෙකම ළඟ තියෙන්න විදියක් නැහැනෙ. මං ඒ දෙකම කියෙව්වා. පළවෙනි වතාවෙ පපුව වේගයෙන් ගැහෙද්දී ඒ දෙක වේගයෙන් කියවගෙන ගියා.

"චොක්ලට් කන්න" ඇමරිකානු තරුණිය චොක්ලට් එකක් පෑවා.

'එපා' කියලා මං ඔළුව හෙල්ලුවා. එයා ඒක ඇඳ උඩ තියලා කතා නො කරන දූරියත් එක්ක පිට්ටනියට යනවා කියලා ගියා.

දෙවෙනි වතාවෙ මං දිනපොත් කියෙව්වෙ හෙමින්. කඳුළින් පිසුමින්.

ඊළඟට මං දිනපොත් දෙක කොට්ටෙට යටින් තියලා ඇඳේ දිගා වුණා. ලිනට් ඇවිත් මොනවා හරි ඇහුවා. ඒත් මං ඔහේ බලාගෙන හිටියා.

හරියට දීර්ඝ නින්දකට පස්සෙ අවදි වුණා වගේ වැඩක්නෙ. මට මුලින්ම ඇති වුණේ විශාල කෝපයක්. ඊට කලින් කිසිම දවසක මට එහෙම කෝපයක් දැනිලා නැහැ. මිනිස්සු තරහෙත් වෙව්ලනවා කියන දේ අහලා තිබුණට විඳලා තිබුණෙ නැහැනෙ. ඒ මොහොතෙ ඇත්තටම මගේ ඇඟ ගැහෙන්න ගත්තෙ මැලේරියා රෝගියෙකු වගෙයි. අම්මා හරි සාෂා හරි ඉදිරියට ආවා නං මං පැනලා කම්මුල්පාරක් ගහන්න ඉඩ තිබුණා. ඇඟ වෙව්ලනවා විතරක් නෙවෙයි පිට දිගට දැවිල්ලක් වගේ දෙයක් දැනුණා. ඒ විදියට පැය දෙකක්වත් ඉන්න ඇති.

"මේ මොකද සනීප නැද්ද? මූණත් අමුතුයි." ලිනට් නළලට අත තියලා බැලුවා.

මං නිහඬව නිසලව හිටියා.

"ඉන්න. මං මායා මිසීව කතා කරගෙන එන්නං. බලා ඉන්න හොඳ නෑ. මේ වගේ දේව කෝප ඇති වුණාම අමුතු ලෙඩ දුක් පැතිරෙනවා කියලා මිනිස්සු කතා වෙනවා. මේ ඇඟත් වෙව්ලනවා."

ඒ පාර මං නැගිට්ටෙ යකෙක් වැහිලා වගෙයි.

"පිං සිද්ධ වෙයි මට පාඩුවෙ ඉන්ඩ දීලා යන අතක් බලාගෙන යනවා. මට ඇති ලෙඩක් නෑ. මට ලෙඩක් නෑ....නෑ....නෑ...."

මං දන්නෙ නෑ ඒ තරම් හයියෙන් කෑ ගැහුවෙ ඇයි කියලා. ලිනට් බය වෙලා පස්සෙන් පස්සට ගියා. ආත්ම විශ්වාසය බිංදුවට ලිනට් විතරක් බැස්සම එහෙම කෑ ගහන්න පුළුවන් වෙනව ද? ලිනට් විතරක් නෙවෙයි මාත් මට බය වුණා. මට පිස්සු හැදීගෙන එනව ද?

ඒ වෙලාවෙ මට ඇඬෙන්න ගත්තා. කඳුළු උතුරන්න ගත්තෙ ළිඳ උතුරනවා වගෙයි. අඬන්න සුසුම් හෙළන්න පණ නැති උනාම කවුරු හරි මට උණු තේ ජෝගුවක් ගෙනත් දුන්නා.

"නැගිටින්න. තේ ටිකක් බොන්න. අම්මා නැති වුණාට

ඔයාගෙ මහත්තයා [illegible] ඇති." පිරිමි හඬකින් කියනවා ඇහුණා.

මං ඇඳේ ඉඳගෙන ඇස් පියාගෙන තේ බිව්වා. ඒ වෙලාවෙ ඒක බේතක් වගේ සනීපයක් ඇති වෙන විදිහෙ හැඟීමක් ඇති කළා.

"මරණෙ දැන ගත්තාමත් ගල්වෙලා වගේනේ හිටියෙ. දැං තමයි එයාගෙ දුක පිට වෙන්නෙ. ඇති තරං අඬන්න ඉඩ අරින්න. ඒක හොඳයි."

"අනේ සර් මට හරි බය හිතුණා. අපේ මිස් හරියට පොඩි දරුවෙක් වගේනෙ." ඒ ලිනට්ගෙ හඬ

"මොනවා හරි වෙනසක් තිබුණොත් කාව හරි මෙඩිකල් කෑම්ප් එක ළඟට එවන්න. මං පිට්ටනියෙ ඉන්නවා."

මං හිතන්නෙ ඒ කර්නල් සුභාෂ් වෙන්න ඇති.

"තනි කරන්න එපා. එයාව ජේන තැනක ඉන්න." කියනවත් ඇහුණා.

එදා දවසටම මට කතන්න බැරි වුණා. ඇඳ උඩ තිබුණු චොක්ලට් එකත් කතා නොකරන දරුවට දුන්නා. ඒ දරුවා ඇඳේ ඉඳගෙන මගේ මළුව අත ගෑවා. එයාගෙ පුංචි සිනිඳු අත්වලින් කඳුළු පිහදැම්මා. හරියට අම්මා පුංචි ළමයෙක් වෙලා ඇවිත් වගෙයි. අම්මා සාෂාට එච්චර අකමැති වෙච්ච හේතුව දැන ගැනීමෙන් මට දැනුණෙ එච්චර කල් මම කියලා හිතාගෙන හිටිය කෙනා එක පාරටම දුර්වල රෝගී ස්ත්‍රියක් වුණා වගෙයි.

සාෂායි අම්මයි අතර ගැනියෙකුයි මිනිහෙකුයි අතර ඇති වෙන විදිහෙ සම්බන්ධයක් ඇති නො වුණාට එහෙම පරිසරයක් ඇති වෙලා තිබුණා. ඉන්දියාවෙ ගිහින් හදිසියෙම නාවා නං ඊළඟ පියවර ඒක තමයි කියන හැඟීම බොහොම භයානක විදියට මගේ පපුව මැදට පිහියෙන් ඇන්නා. එහෙම දෙයක් සිද්ධ වෙලා තිබුණත් කොයි මොහොතක හරි දෙන්නා වෙන් වීමත් නො වැළැක්විය හැකි දෙයක්නෙ. සාෂා ඒ දවස්වලම පුද්දියෙක් එක්කත් සම්බන්ධයක් තිබුණා කියලා ලියලා තියෙනවනේ. එතකොට මේ මරේ කියන මිනිහා එක්ක තිබිච්ච යාළුකම ගැන ලියලා තියෙන

දේවල් ඇත්ත වෙන්න බැහැනෙ. සාෂා ඒ පරණ යාළු මිත්‍රයො ගැන කවදාවත් කියලා නැහැනෙ.

මං මනෝරමාගෙ දුව කියලා දැන ගත්තු දවසෙ එයාගෙ හැසිරීම අමුතු වුණානෙ. එයාගෙ නීති උපාධිය බොරුවක් කියන එක නං කවද හරි කොළඹ විශ්ව විද්‍යාලයෙන් දැන ගන්න පුළුවන්නෙ.

ඒත් ඒ දේවල් හාරා ඇවිස්සීමෙන් මට වැඩක් තියෙනව ද? අම්මා ලියලා තියෙන දේවල් සේරම ඇත්ත වෙන්න පුළුවන්. නමුත් ඒ සේරම සාෂා පිළිබඳ අම්මාගෙ අත්දැකීම් මිසක් මගේ අත්දැකීම් නෙවෙයිනෙ.

අම්මාගෙ පොතෙත් එක තැනක තියෙනවා "යමෙක් බොරුවක් කළ බව දැන ගත් විට ඒ ඔස්සෙ සම්පූර්ණ සත්‍ය දැන ගැනීමට යාමෙන් ද පිච්චෙන්නේ තමන්ම ය. බොරුකාරයෙකුට සමාජීය හෝ පෞද්ගලික සබඳතාවල වගකීමක් බරක් නැත."

දැන් අම්මා නැහැ. ඇස් පියා ගත්තම මැවිලා පෙනෙන ගමේ ගෙදරත් නැහැ. ඒ ගෙදර ලී දඬු, ජනෙල්, උළුවහු, වීදුරු පාවිච්චි කළ සාෂා හදවපු ගෙදරත් බාගෙට කඩා වැටිලා. මායා කිව්වා සමහරු එහෙම ගෙවල්වල සුන්බුන් අවුස්සලා අහුවෙන අහුවෙන දේවල් ගෙනියනවා කියලා. ඒත් එතන මුර කරගෙන ඉන්න යෑ. ඒ කියන්නෙ මම ස්ථානගතවෙලා තිබුණු ගෙවල් මගේ තරුණ වයසෙදිම නැති වුණා කියන එකනෙ. එතකොට ඉතුරුවෙලා තියෙන්නෙ සාෂාගෙ බිරිඳ කියන හැඳින්වීම විතරයි. ඒකත් එහෙමද කියන ප්‍රශ්නෙ විසඳ ගන්නවා මිසක් අම්මා මතු කරලා තියෙන දේවල් වලින් මං පිච්චෙන්න ගියොත් මටත් මැරෙනකල් පිච්චෙන්නයි වෙන්නෙ.

මේ තරම් දේවල් මට නො කියා හිටියෙ ඇයි? ඒ ප්‍රශ්නෙට උත්තර හොයා ගන්න අමාරු නැහැ. සාෂාට හැමදේම අමතක කරලා අලුත් ජීවිතයක් පටන් ගන්න උවමනාව තියෙන්න ඇති. මුලදිම අම්මා මට ඇත්ත කිව්වා නං මගේ තීරණය වෙනස් වෙන්න තිබුණා ද? ඒ දවස්වල සාෂා කිව්වා නං "ඔය සේරම ඕගොල්ලන්ගෙ අම්මගෙ බොරු කියලා" කියලා මං ඒක විශ්වාස කරන්න තිබුණා.

අම්මා ලියලා තියෙනවා සාෂා බැන්දට පස්සෙ වරින්වර සාෂාට වෙන සම්බන්ධකම් තිබුණා කියලා ආරංචි වුණා කියලා. ඒවා මටවත් සමහරවිට එයාටවත් තේරුම් ගන්න බැරි හේතුවක් නිසා ඇති වෙච්චි දේවල් වෙන්න බැරි ද? ඒකත් හරියට කතා නො කරන ළමයගෙ ප්‍රශ්නෙ වගේ වෙන්න බැරි ද?

අහම්බෙන් මා ළඟට ආපු කතා නො කරන දැරිය ගොළු ළමයෙක් වෙන්න බැහැ. එයාට කණ ඇහෙනවා. එයාට ඉංග්‍රීසියෙන් කතන්දර කියනකොට ඔළුව හොල්ලුවා. කල්පනාකාරී ඇස්වලින් බලා හිටියා. මේ ළමයා කතා නොකරන හේතුව භූමිකම්පාව කියලා හිතුවට ඒක වෙන දෙයක් වෙන්නත් බැරි නෑ.

මං නිශ්ශබ්දව ඉන්නකොට අඬනකොට හැමෝම හිතනවා ඇත්තෙ අම්මාගෙ මරණය, ගේ විනාශ වීම, සාෂා ගැන ආරංචියක් නැති වීම කියලනේ. ඒ මටත් කතා කරන්නම හිත නැතුව ගියේ ඒ වේදනාවල්වලට උඩින් මේ පොත් දෙකක බර පපුවට වැටීමනෙ.

අම්මා කිසි පිරිමියෙක් විශ්වාස කරන්න බැරි තැනට ආවෙ මගේ තාත්තා නිසා විතරක් නෙවෙයි සාෂාත් හින්දනෙ. ඒකෙන් පේන්නෙ මිනිස්සු හැම මොහොතකම යම් දුකක හරි සැපක හරි ප්‍රතිඵලයක් බවට පත් වෙනවා කියන එක ද? ඉස්සර ආතම්මා කියන්නෙ "මේ කෙස් පැහුණෙ අකලට නෙවෙයි. මාත් හොඳට තැම්බිලා ඉන්නෙ." කියලයි.

එතකොට සාෂා හැම සමාජ සබඳතාවක්ම වගකීමකින් තොරව තමන්ගෙ වාසියට යොදා ගන්නවා කියන එක ඇත්ත නං ඒකටත් හේතුවක් ඇතිනෙ. එයා අනුන් තම්බන්න හදන්නෙ කවුරු හරි එයාවත් තම්බපු හින්ද වෙන්න බැරි ද? එයාගෙ පුංචි කාලෙ පින්තූරයක්වත් නැහැනෙ.

එයා ලෝකෙ අනිත් හැමෝටම බොරු කියන්න ඇති. අම්මා කියන විදියට සාමයත් විකුණගෙන කැවා වෙන්නත් බැරි නෑ. කොයි තරම් ළඟින් ආශ්‍රය කළ කෙනෙක් ගැන උනත් එයාට එහෙම බැඳීමක් නැහැ කියලා මට කියලත් තියෙනවා. එයා ඉස්කෝලෙ යන කාලෙ යාළුවො කියලා කට්ටියක් ඇත්තෙත් නැති බව මට කල්පනා වුණේ අම්මගෙ පොත කියෙව්වට පස්සෙයි.

මං අම්මා [illegible] පැටලෙන්න සාමා කරලාවත්, උසාවියක කටයුතු සිද්ධවෙන විදියවත් දන්නෙ නැති සාමාන්‍ය ගෑනියෙක් වුණාට මේ ප්‍රශ්නය පටලවා ගත්තොත් මාත් අම්මා වගේ පැටලෙන බව දැනුණා.

පළවෙනි කාරණය සාෂා මට මොකක් හරි ආදරයක් තියෙනවද කියන එකයි. ඒක නැහැ කියන්න අම්මාටවත් බැරි වුණානෙ. එතකොට මං කරන්න ඕන මොනවද? ඇයි මට ඇත්ත කිව්වෙ නැත්තෙ කියලා අහන්න සුදුසු අවස්ථාවක් එන කල් බලා ඉන්නවා මිසක් ඊළඟ පියවර තීරණය කරන්නෙ කොහොම ද? කලබල උනොත් කොරොස් කටෙත් අත දන්න බැහැ කියලා ආතම්මා කිව්වෙ නිකමට නෙවෙයිනෙ.

වැදගත්ම දේ එන හැටියකට ජීවිතේට මූණ දීමයි. සාෂා කියන නැමදේම මළව තවාගෙන පිළිගන්න ගතිය නැති වෙයි කියලා දැනුණා. එයාට වෙන සම්බන්ධයක් තියෙනවා නං රණ්ඩු වෙන්නෙ නැතුව ඒ ගෑනි එක්ක හොඳින් ඉන්න කියලා මවත් වෙන්න බැරි ද? ඒක හිතෙනකොට මට කඳුළු නවත්තගන්න බැරි වුණා. ඒ කියන්නෙ මගේ හිතේ එයාට බැඳීමක් තියෙනවා.

අම්මා ලියලා තියෙන්නෙ ගේ හදලා තියෙන්නෙ එයාගෙ නමට නිසා කවද හරි දවසක මං සාෂාව ප්‍රශ්න කළොත් මට හිස් අතින් එළියට බහින්න වෙයි කියලයි. අම්මා ලියලා තියෙනවා මහ ගෙදර මගේ නමට තිබුණු බවත් ඒක විකුණපු බවත් ඔප්පු කරන සාක්ෂි එයාගෙ රත්තරං බඩුත් එක්ක බැංකුවෙ තැන්පත් කරලා තියෙනවලු. ඊට අමතරව ඒවයෙ පිටපත් ප්‍රියාටත් යැව්වලු. ඒත් භූමිකම්පාවකට මූණ දුන්නට පස්සෙ ඔය කිසි දේකට තණ්හාවක් ඉතුරු වෙනව ද?

කොයි මොහොතෙ හරි සාෂා ආවොත් මට කිසි අමුත්තක් නැතුව එයාට තුරුළු වෙලා නිදා ගන්න පුළුවන් ද? ඒ ප්‍රශ්නෙට උත්තර හිතා ගන්න බැරි වුණා. එක අතකට මට ඔය පොත් දෙක ලැබුණෙ නැත්නං ඔය කිසි දෙයක් නැහැනෙ. තැපැල් සීයලා මාව හොයාගෙන ආවෙ භූමිකම්පාවෙන් දවස් හතරකට පස්සෙ. හමුදාවෙත් පාරවල් වහලා තිබුණලු. ඒ දෙන්නම මගේ ළඟට ඇවිත් බද ගන්න කල් මං දන්නෙ නෑ. ඒ මොහොතෙත් අම්මගෙ

පොත් [illegible] මට ඔය හිතුණා තැපැල් සීයා ඒවා අතට අරගෙන බලයි කියලා. ඒවා කොච්චෙට යටින් තියන්නත් ඔය හිතුණෙ එතකොට ඒ ගැන අවධානයක් ඇති වෙන නිසයි.

"අනේ ඉතිං ඔයාවත් ඉතුරු වෙච්ච එක මදෑයි." කියලා ටික වෙලාවක් අඬලා "අපි රම්ෂි මැඩම්ගෙ සොහොන ළඟට යන්න ඕන" කිව්වා.

මං ලිනට් දිහා බැලුවා.

"මං සේරම කිව්වා මිස්. මං මේ සර්ට කිය කියා ආවෙ දැ කවුරු හරි එතන නවත්තන්න වෙයි කියලයි. කොයි තරං දෙවල් තියෙන ගෙයක් ද?"

ඒ වෙලාවෙ මට කතා කරන්නම බැරුව ගියා. මට සොහොන ළඟට යන්නවත් ගෙයි බඩු ගැන හිත කරදර කර ගන්නවත් ඕන වුණේ නැහැ.

"මුව ඔහේ නෑ. ඊගොල්ලො යන්න." කියලා කොළේක ඔතලා තිබ්බ තැපැල් සීයා පොත්තුවෙන් පැන ගලවලා අරගෙනයි.

"මං කිව්වෙ ඕකනෙ සර්. පොඩි මිස් කැම පෙලිමටවත් යන්නෙ නෑ. කැම කොහොවත් මං බල කරලා උතුලෙන් තියෙන කල් අල්ලන්නෙවත් නෑ."

"අනේ ලිනට් මෙයාව බලා ගන්න. අපි ගිහින් අපේ ගේත් බලලා එන්නං." කියලා පුංචි මම්මා කිව්වා.

ඊගොල්ලො එද ආපහු ආවෙ නැහැ.

භූමිකම්පාවෙන් දවස් පහකට පස්සෙ රතු කුරුස සංවිධානෙන් පණිවිඩයක් ආවා සාෂා ඉන්නවා කියලා. එයාට තුවාල නිසා ඉන්දියානු නැවකට ගෙනියලා එතනින් බැංගලෝරුවලට ගෙනිච්චා කියලා ලියලා තිබුණා. වන්දිම ඊට පහුවෙනිද ඒ ආරංචිය අරගෙන ආවෙ බී.බී.සී. වාර්තාකාරයෙකුත් එක්කයි. මං කිසි දෙයක් නො කියා වීදුරු ඇස්වලින් බලා ඉන්නවා වගේ හිටියා. ඇත්තටම මට කියන්න දෙයක් තිබුණෙ නෑ.

"ඉඩක් ලැබුණු ගමන් ඔයාව එයා ළඟට යන්න ලෑස්ති කරනවා" කියලා කිව්වම මට ඔළුව හොල්ලන්නවත් බැරි වුණා.

එයිනුත් දවස් දෙකකට පස්සෙ මට වමනෙයි කලන්තෙයි නිසා තැපැල් සීයා ඇමරිකානු දොස්තර කෙනෙක් එක්කන් ආවා.

ඊකෙන් පස්සෙ මගේ ලේ, මුත්‍රා පරීක්ෂා කළා. මං එයා එක්කත් කටින් කතා කරේ නැහැ. එයා අහන දේවල්වලට කෙටි උත්තර ලියලා පෙන්නුවා. දිගට දිගට කතා කරනවට වඩා ඒක සහනයක් වුණා. දොස්තර නෝනා එක්ක කතා කරා නං අනිත් අය එක්කත් කතා කරන්න වෙනවනෙ.

එවෙලෙම උත්තරය ලැබුණා.

"කන්ග්‍රැජුලේෂන්ස් යූ ආ ප්‍රෙග්නන්ට්"

වෛද්‍යවරිය අත දිගු කළේ හිනාවකින්. ඒත් මට අත හොලවන්නවත් බැරි වුණා. මං ගල් පිළිමයක් වුණා.

අර පොත් දෙක කියවන්න කලින් ඒක දැන ගත්තා නං ඒ වගේ අවස්ථාවක අත් වෙන ප්‍රීතිය මොකක වගේ ද කියලා දැන ගන්න තිබුණා. හුම්කම්පාවට කලින් සාමා කිලිනොච්චියට යන්න මොහොතකට හරි ඉස්සර ඒක දැන ගත්තා නං එයා "මගේ සිද්ධෙව්වී" කියලා දණ ගහලා මගේ කුසය ඉඹිනවා සිකුරුයි.

ඒ සිතුවිල්ලත් එක්ක නිකං අඳුරු විතුයක් ඒකාලෝක වුණා වගේ මං එයාට එච්චරම කැමති වුණේ ඒ නාට්‍යමය ගතිවලට නේද කියන එක දනෙනන්න පෙනෙන්න ගත්තා.

තැපැල් සීයා, ලිනට්, සුදු මම්මා, වෛද්‍යවරියත් එයා එක්ක ආ ස්වේච්ඡා කණ්ඩායමේ කෙනෙකුත් මොන මොනවා හරි කියන බව පෙනුණට මට ඒ කිසි දෙයක් ඇහෙන්නෙ නැතුව ගියා. මං බඩට ඇවිත් ඉන්දැද්දි මගේ අම්මා මූණ දෙන්න ඇත්තෙත් ඊට සමාන අවස්ථාවකටනෙ. එහෙක් වෙලා ජීවිතේට මූණ දෙන්න හිත හිතා හිටියත් ඒ මොහොතෙ මගේ දරුවගෙ තාත්තාට ඒ ආරංචිය දැනුම් දීමේ උවමනාව නැත්තටම නැති වුණා. ඒක කියන්න තරම් ගරු කටයුතු මිනිහෙක් නැතිකොට ගැහියෙකුට ඒක හංගගෙන ඉන්න පුළුවන් කියන එක තේරුම් ගන්න හුම්කම්පාවක්ම සිද්ධ වෙන්න වුණානෙ.

එද රෑ වෙනකොට ස්වේච්ඡා කණ්ඩායමක් ඇවිත් මායාගෙයි මගෙයි වැසිකිලි බිත්ති හදලා, ඒ හරියෙ සුන්බුන් අස් කරලා

දුන්නා. නිදා ගන්න කාමරේට ලී රාමුවක් හයි කරලා ඉටි රෙදි ආවරණයකුත් හැදුවා.

"එක එක රටවලින් ආධාර නැව් එනවා." කියලා ලිනට් කිව්වා.

කෑම, බෙහෙත්, ඇඳුම් ලැබුණා. ඒත් මමයි නිශ්ශබ්ද දරියයි ඒවා ගන්න ගියේ නැහැ. කර්නල් සුහාෂ් අපිට උවමනා දේවල් එව්වා. ඒත් ඒ මනුස්සයා ආ වෙලාවටත් මං නිශ්ශබ්දව බිම බලා ගත්තා.

මගේ දරුවාට තාත්තෙක් ඉන්න ඕනනෙ. මට කොයි තරම් ප්‍රහේලිකාවක් වෙන මිනිහෙක් හරි තාත්තා කියලා පෙන්නගන්න ඉන්න එපා යැ. නැත්තං මං වගේම මගේ දරුවත් තාත්තගේ ප්‍රශ්නෙට මා එක්ක තරහක් ඇති කර ගනියි. මගේ අම්මා වගේම මටත් එයාගෙ තාත්තාගෙන් වෙන්වීමට හේතුවක් කියා ගන්න බැරි වෙනවා.

ඒ දවස්වල මගේ වටේට නොයෙකුත් දේවල් සිද්ධ වුණා. කැඩුණු ගෙවල් හදන්න එක එක රටවල සුදු ඇඳුම් මිනිස්සු ආවා. මායා ආන්ටිගෙ පැත්ත සූලියට ගන්න ජර්මන් සංවිධානයක් ඉදිරිපත් වුණා. ඒ පැත්ත හදන්න කලින් මං හිටිය පැත්ත හැදුවා. මායා ආන්ටිත් මං හිටිය පැත්තට ආවා.

"මයාගෙ ගේ හදලා ඒක පාවිච්චි කරන්න කැමති ඇමරිකන් මාර්තාපිශේෂන් එකක් ඉන්නවා. මොකද කියන්නෙ?." එක දවසක් කර්නල් සුහාෂ් තව කීප දෙනෙක් එක්ක ඇවිත් වෙන ආගිය තොරතුරු නැතුව ඉදිරිපත් කළ යෝජනාවට උත්තර දීගන්න බැරුව මං බලාගෙන හිටියා.

"කැමති වෙන්න ළමයො. දන් මයාගෙ සාමා කවද මෙහාට එයිද මයාට කවද එයා බලන්න යන්න වෙයිද දන්නෙ නැහැනෙ." මායා ආන්ටි මගේ උරහිස අල්ලලා කඳ කළා.

"බය වෙන්න එපා. ඒ ගොල්ලො තව ගෙවල් දහයක් විතර හැදුවා. මිගොල්ලන්ගෙ ගෙදර බිත්තිවල කළු ගල් ආයෙත් පාවිච්චි කරන්න පුළුවන් කිව්වා. ලීත් හුඟ හරියක් ගන්න පුළුවන්. සමහර තැන් ගිලා බැහැලා. බිත්ති හරස් අතට පුපුරලා තියෙන තැන්වලට කොන්ක්‍රීට් බීම්ස් දලා හදන්න පුළුවන්ලු. වහලෙට උළු දමන්නෙ

නෑ. කහඩු තමයි. හැබැයි මේ වැඩෙන් ඔයාටයි සාෂාටයි ඉන්න ඇනෙක්ස් එකත් හැදෙනවා. කුලියක් ලැබෙන්නෙ නෑ අවුරුද්දකට ඊට වැඩිය ඉන්නවා නං කුලියක් ගෙවනවා."

මං කිසිම දවසක ඒ තරම් විශාල වැඩක් ගැන තීරණයක් අරගෙන නෑ කියන්නෙ මොකට ද? සාෂාගෙන් අහලා කියන්න යෑ.

"හොඳයි මං කැමතියි" කියලා මම අම්මගෙ පරණ පොතක ලියලා පෙන්නුවා.

ඒ කට්ටිය ඊට පහුවෙනිදම ඇවිත් ගිවිසුමක් අත්සන් කළා.

පාර්ලිමේන්තුව පරණ ගොඩනැගිල්ලෙම රැස් වෙනවා කියලා ආරංචි වුණා. සමහර මන්ත්‍රීවරු ඇමතිවරු තුවාල ලබලා බේරිලා තිබුණා. සමහරු නැතිවෙලා කියලා මායා ආන්ටි කිව්වා. ඒත් මට ඒ කාරණා ගැන හොයන්න උවමනාවක් තිබුණෙ නෑ.

කතා නොකරන දුරිය මගේ පස්සෙන්ම වැටිලා හිටියා. එක දවසක් චන්දිම ඇවිත් මට සාෂා ඉන්න තැනට යන්න කටයුතු ලෑස්ති කරනවා කිව්වා.

"අනිද්දා වීතර යන්න ලැබෙයි. දැං එයාර් පෝට් එක වැඩ කරනවා." කිව්වට මට ඒ ගමනට උනන්දුවක් ඇති වුණේ නෑ. මායා ආන්ටි චන්දිමගෙ අතින් අල්ලගෙන එළියට ගියා.

සාෂාට යවන්න ලියුමක් ලියලා දෙන්න කියලා චන්දිම කිව්වා. මට යන්න හොඳ නැති නිසා ඒ වෙනුවට එයා යනවා කියලා කිව්වම මට සැනසීමක් දැනුණා. ඒත් ලියුමක මොනවා ලියන්න ද? ඔයා ගැන නොකියූ දේවල් දනිමි කියන්නයැ. ඒත් කකුලකුත් කැඩිලා තව තුවාල වෙලා ඉන්න මිනිහට ලියුමක් ලියන්න බැහැ කියන්නෙ කොහොම ද?

ආදර සාෂා කියලා පටන් අරගෙන මේ සඳදර වර්ණාසි කියලා ඉවර කරන්න අමාරු ගතියක් දැනුණා. ඒ හැඟීම විස්තර කරන්න අමාරුයි. අම්මා විරුද්ධ වෙද්දි මං කසාද බැඳපු මිනිහා ගැන ආදරය නැත්තටම නැති කරන්න ඒ පොත් දෙකේ කොරුතුරුවලට බැරි වුණා. ඒත් මට එයා එක්ක කතා කරන්නවත් එයාට මූණ දෙන්නවත් බැරි ගතියකුත් තිබුණා.

"සෝ මං යන්න කලින් ලියලා දෙන්න." කියලා චන්දිම අපේ ගෙදර හදන තැන බලන්න ගියා.

"මට කරදරයක් නෑ. අම්මා නැතිවීම නිසා විශාල හිස්තැනක් ඇති වෙලා වගෙයි. අම්මා අන්තිම මොහොතෙත් මගේ නම කියල කතා කළ බව කර්නල් සුහාෂ් කිව්වා. අනේ අම්මගෙ හිතේ මොනවා තිබුණ ද කියා ගන්න බැරි දුකක් තිබුණ ද කියලා හිතෙනවා. ඔයාට ඉක්මන් සුවය පතනවා. මේ වර්ණාසි."

මට ඊට වැඩි දෙයක් හිතට ආවෙ නැහැ. චන්දිම ලියුම ගෙනින්න වෙන කෙනෙක් එවල තිබුණා.

මං අම්මාගෙ පොත් අතර තව මොනවා හරි ලියලා තියෙනව ද කියලා හෙව්වා. ඒත් ටෙලිෆෝන් නොම්මර, රට රටවල යාළුවන්ගෙ ලිපිනයන් ලියූ පොත් විතරයි ලැබුණෙ.

"පුතේ දිගටම ඔහොම කල්පනා කර කර ඉන්නෙ නැතුව ඔය අම්මා එකතු කරලා තියෙන පොතක්වත් කියවන්න." හැපැල් එයා දෙතුන් පාරක් කිව්වා.

මං එක එක පොත් එහාට මෙහාට පෙරළමින් කියවන්න හැදුවා. වැඩි හරියක් තිබුණෙ දාර්ශනික පොත්. හැම පොතකම ගත්තු දිනයක් ස්ථානයක් සඳහන් කරලා තිබුණු නිසා අන්තිම කාලෙ ගත්තු පොත් සේරම වාගෙ ජීවිතය තේරුම් ගන්න, කෝපය තණ්හාව නැති කර ගන්න දරපු උත්සාහයන් කියලා පෙනුණා.

කතා නොකරන දුරිය ඒ පොත් ඇඳ උඩ එක එක තැනයට තියමින් සෙල්ලම් කළා. අම්මා නිකාය සංග්‍රහයත්, භික්ෂු බෝධිගෙ පොතුත්, අටුවාව සහිත ධම්ම පදයකුත්, ධර්මය විග්‍රහ කරන මහායාන පොතුත්, සෙන් ගුරුවරුන්ගෙ පොතුත්, හින්දු යෝගීන්ගෙ පොතුත් එකතු කරගෙන තිබුණා. ඒත් එයාට මැරෙනකල්ම ඒ පොත් පහුරක් කරගෙන, ශෝකයෙනුත්, සැකසංකාවලින් මා ගැන තියෙන අසීමිත ආදරයෙනුත්, අතීත මතකයන් ගැන කෝපයෙනුත් එතෙර වෙන්න බැරි වුණානෙ. ඉතින් ඒ පොත් කන්දරාව දිය කරලා තිබ්බත් මටත් වැඩක් වෙයි ද කියන හිතක් පහළ වුණා. අනේ මගේ අම්මා සුවපත් වෙන්න කොයි තරම් උත්සාහයක් ගන්න ඇද්ද කියලත් හිතෙන්න ගත්තා. ඒ පොත්වලින් අම්මා

යමක් දන ගන්න ඇති. ආතම්මා හිටියා නං අම්මට ඒවා ගැන කතා කරන්න තිබුණා.

"අනේ ඔයයි මායි දන්න බණ කතා." කියලා ආතම්මා මුලදි කියයි. ඊට පස්සෙ අම්මා කියවන පොත්වල තියෙන කාරණා අහගෙන ඉඳියි. ඉස්සර අම්මා ඒ ඒ කාලෙට කියවන නවකතා පොත්වල තිබුණු කතා අපිට කියනවා. සාෂා මගේ ජීවිතේට එනකල්ම අපේ ගෙදර එහෙම පරිසරයක් තිබුණා. ඒ දවස්වල අම්මා පිට පිට සති දෙක තුනක් ගමේ ගියේ නැති දවස්වලට මට තරහක් දනුණා. එහෙම ඉඳලා ඇවිත් එයා ගිය රටක විස්තරයක් කතා පොතක තොරතුරක් කියන්න හදනකොට මං නැගිටලා ගිය වෙලාවලුත් තිබුණා.

"අයි රත්තරං පුතේ ඔයා තරහෙන් ඉන්නෙ. මං මේවා සේරම කරන්නෙ ඔයාව හොඳ යුනිවර්සිටි එකකට යවන්නනෙ." එහෙම වෙලාවට අම්මා ඒ වගේ දෙයක් කියන්නෙ පපුවෙ විශාල දුකකින් කියලා මට නො තේරුණා නෙවෙයි. ඒත් මං ඒවා තේරෙන බව පෙන්නන්නෙ නැහැ.

"මං තරහෙන් ඉන්නවා කියලා කොහොම ද කියන්නෙ? දං මං වචනයක්වත් කිව්ව ද?"

"පුංචි කාලෙ පූස් පැටියා වගේ ගුලිවෙලා කතන්දර අහනවා. ඔයා ඔය නැගිටලා යන්නෙ මං කියන ඒවා අහන්න උවමනාව නැතුව නෙවෙයි. මට ගෙදර එන්න බැරි වුණාට තරහට."

"මං නැගිටලා ගියෙ නුළං වදින්න." මාත් මුරණ්ඩුකමට කියනවා.

"මේ අම්මටයි දූටයි රණ්ඩු වෙන්න දේවල් නැතුවට කාරණා හද ගන්නවා." කියලා ආතම්මා අපි දෙන්නාගෙම ඔළුගෙඩි ඉඹිනවා.

මට තරහක් දනුණත් නිශ්ශබ්දව විතරක් නෙවෙයි නිශ්චලව ඉන්නත් පුරුදු වුණේ අම්මට එහෙම කරන එක පව් කියන එකත් හිතුණු නිසයි. ඒත් මං බැන්දට පස්සෙ අම්මා එහෙම විස්තර කියන එක සම්පූර්ණයෙන්ම නැවතුණා. මාත් කවදාවත් අම්මගෙ ගමන් බිමන්, කියවන පොත්, බලන චිත්‍රපටි, වෘත්තීය ජීවිතේ ගැන කිසිම දෙයක් ඇහුවෙ නැහැ. ඒත් අම්මෙකුයි දුවෙකුයි අතර

ඉතුරු වෙන්න පුළුවන් අසීමිත ආදරය මගේ පැත්තෙනුත් ඉතුරුවෙලා තිබුණා.

"ලිනට් අම්මා මොනවද කන්නෙ. ඔයා යනකොට අම්මට මැල්ලුම් ටිකක්, පොලොස් ටිකක් හෙම ගෙනියන්න." කියලා මං කියනවා.

"දං ලොකු මිස් කන්නෙ හරි ටිකයි." කිව්වම මට අම්මා ගැන බය හිතුණා.

"මේ මං ජෙන්ටින් එකක් විකුණලා ගත්තු සල්ලිවලින් ගෙනාපු දේවල්" කියලා අම්මට චීස්, බටර්, කිරි, කේක්, බිස්කෝතු, රැලං, සව්, ඇපල් එහෙම අරගෙන යනවා. ඒත් ඒවා වැඩි හරියක් වෙන අයට දෙනවා කියලා දවසක් සුපර් මාර්කට් එකකදි මායා ආන්ටි මුණ ගැහිච්ච වෙලාවක කිව්වා. ඒත් ටික දවසක් කිසි දෙයක් දෙන්නෙ නැතුව ඉඳලා මං ආයෙත් පොඩි ප්‍රමාණවලින් දවස ගානේ මේවා හදි යවන්න ගත්තා. ඒවා ලිනට්ට දෙන්නත් ඇති. ඒ වුණත් ඒක එයාගෙ කැමැත්තනෙ. මං මගේ යුතුකම් ඉටු කරන්න ඕනි කියලයි හිතුවෙ.

අම්මා එක්ක ඊට වැඩිය කතා කරන්න තිබුණානෙ. වතාවක් දෙකක් අම්මා මට රෝමයට යන්න, ඉන්දියාවට යන්න කතා කළා.

"සාෂා නැතුව දිව්‍ය ලෝකෙටවත් යන්නෙ නෑ." කියලා මං කිව්වම අම්මා කිසි දෙයක් කිව්වෙ නැහැ.

මට තිබුණෙ සාෂාගෙයි අම්මාගෙයි ප්‍රශ්නය විසඳන්න කාලයට ඉඩ දීලා අම්මා එක්ක එහෙම ගමන් බිමන් යන්නයි. එහෙම වුණා නං ඉස්සර වගේම කතා කරන තත්ත්වයක් ඇති වෙන්න තිබුණා. සාෂා කියන තහනම් මාතෘකාව අත ඇරලා කොයි තරම් දේවල් කතා කරන්න තිබුණ ද? එහෙම කතා කරලා තිබුණා නං අම්මා එකතු කළ පොත් කියවන්නත් මොකක් හරි නැඹුරුවක් ඇති වෙන්නත් තිබුණා.

කතා නැති දරියගෙ මූණ කට හෝදනවනකොට, කොණ්ඩෙ ගොතනකොට මට ඒ මමයි අම්මයි වගේ පෙනෙන්න ගත්තා. දරිය මා එක්ක හිනා වුණා. මාව බදාගෙන හිටියා. සමහර වෙලාවට දරියගෙ පපුව වේගයෙන් ගැහුණා.

"මේක අස්සට වෙලා ඉන්නෙ නැතුව ඔය ළමයත් අල්ලගෙන ටිකක් එහෙ මෙහෙ ඇවිද්දෙ නං හොඳයි නේද?" මායා ආන්ටි වරින්වර එහෙම කිව්වා. ඒත් මට ඒකට හිතක් තිබුණෙ නැහැ.

අම්මාගෙ පොත් අතර සංස්කෘත, හින්දි, දෙමළ, බෙංගාලි, නේපාලි, ප්‍රංශ, ජර්මන්, ශබ්දකෝෂ තිබුණා. එයා ඒවා දැනගෙන හිටියෙ නැතුව ඇති. නමුත් හැමදේම ඉගෙනීමේ තණ්හාවෙන් ටික ටික උත්සාහ කරාද දන්නෙත් නැහැ. මං බඳින්න කලින් දෙමළ ඉගෙන ගන්න පන්තියකට යන්න ඕන කියමින් හිටියා. මොකද වුණේ කියලාවත් අහන්න බැරි වුණා.

මං ශබ්දකෝෂවල මඩ පැල්ලම් යන්න තෙත රෙදි කඩකින් පිහදලා ඒවා වේලෙන්න මිදුලෙ තිබ්බා. කවුරු හරි ප්‍රයෝජනයක් ගන්න කෙනෙකුට දෙන්න පුළුවනිනෙ. කතා නැති දූරිය ඒවා බලමින් අව්වෙ ඉන්නවා දැක්කෙ ඇඳ උඩට වෙලා සැහෙන වෙලාවක් ඉඳලා නිකමට ජනේලෙන් පිටත බලනකොටයි. එයාව උදේ නාවපු නිසා මං හිතුවෙ හොඳ නාකට වෙලා ඇති කියලයි. මං එයා ළඟට ගිහින් ඔළුව අත ගාලා බලනකොට අව්වට රත් වෙලා.

"බබා අව්වෙ ඉන්න එපා. දැන් ඔය පොතුත් වේලිලා ඇතිනෙ. එන්න ගෙට ඇවිත් පොත් සෙල්ලම් කරන්න" කියලා මං එයාව ගේ ඇතුළට එක්කන් ආවා.

ඊට කලින් දවසෙ අපේ ගේ ප්‍රතිසංස්කරණය කරන සුදු ජෝඩුවක් ඇවිත් දෙඩම් කැන් දෙළහක් දීලා තිබුණා. මං එයින් එකක් කඩලා කෝප්පෙකට දාලා දූරියටත් දීලා ඉතුරු ටික බිව්වා. දූරිය හිනා වුණා. එයාගෙ ඇස්වල තිබුණෙ වැඩිහිටි කෙනෙක්ගෙ වගේ කල්පනාකාරී බවක්. කටින් කතා නොකරට හිත ඇතුළෙ විශාල කතාවක් තියෙනවා වගෙයි.

"ඔයයි මායි දෙන්නම එක වගෙයි පැටියො. ඔයා හින්ද තමයි මටත් මෙහෙම කතා නැතුව ඉන්න පුළුවන් කියලා කල්පනා වුණේ."

දූරිය යමක් කියන්න හදනවා වගේ පෙනුණා. ඒත් එක පාරට හිත වෙනස් කර ගත්තා වගේ කට තද කර ගත්තා.

සාෂාට තවත් ශල්‍යකර්මයක් කරන්න දින නියම කළ වග රතු කුරුසයෙන් දැනුම් දුන්නා. ඒ වෙනකොට ටෙලිෆෝන් පද්ධතිය සකස් කරගෙන යමින් තිබුණා. පොදු ටෙලිෆෝන් පහසුකම් සකස් කරලා තිබුණා. ජංගම දුරකථනත් වැඩ කළා. සාෂා තැපැල් සීයාට, මායා ආන්ටිට කතා කරමින් මට කෙටි පණිවිඩ එව්වා. ඒවායෙ සුසිරි, මීපැණි වචන එච්චර ඉක්මනට අරුත්සුන් වුණේ කොහොම ද?"

"මගේ සිද්ධේශ්වරී මං මෙහෙ හිටියට මගේ පණ තියෙන්නෙ ඔයා ළඟ. මං මැරුණෙ නැත්තෙ ඒක වෙන්නැති." කියලා ලියලා තිබුණු එක බලලා මං ඒක මකලා ටෙලිෆෝන් එක වන්දිමට දුන්නෙ උත්තරයක් ලියන්නෙ නැතුවයි. එයා විතරක් වෙන්නැති ගැනියෙකුට ඔය තරම් ආදර කතා ඔය විදියට කියන එකම පුරුෂයා. මාව සිද්ධේශ්වරී කරා වගේ මගෙ අම්මාට සරස්වතී දේවි, පාර්වතී දේවි විතරක් නෙවෙයි විෂ්ණු දෙවියො, ශිව දෙවියො කියලත් කියන්න ඇති. සුද්දියන්ට මොන මොන විදියට ආමන්ත්‍රණය කරාද දන්නෙ නෑ. "මයි මූන් ගොඩ්", "මය සන් ගොඩ්", "මයි ගොඩ් ඔෆ් ගොඩ්" කියන්නත් ඇති. ඒ අමුතු කතා කිව්වම ගැනු පිස්සු වැටෙනවනෙ. අනේ මං මොකට ද මගේ අම්මා වගේ සාෂාගෙ වැරදි හොයන්නෙ. එයා ඔය හැම ගැනියෙකුටම එයාට තේරෙන විදියට ආදරය කරන්නත් ඇති. එයා මට බොරුවක් කරා නෙවෙයිනෙ. එහෙම නං එයාට මාව කසාද බඳින්නෙ නැතුව ඉන්න තිබුණානෙ.

"මට ඔයාගෙ අහිංසකකමයි අවංකකමයි උගන්නන්න මගේ සිද්ධේශ්වරී" කියලා එයා අපි බැඳපු දවසෙ මාව තුරුළු කරගෙන හිටියනේ. ඒක රඟපෑමක් වෙන්න බැහැ. අම්මා සොහොනෙන් නැගිටලා ආවත් මං කියනවා ඒවා රඟපෑම් නෙවෙයි කියලා. එහෙමනං මට මේ පිළිකුලක් වගේ දෙයකුත් දැනෙන්නෙ ඇයි? ඒ හා සමානම ආදර කරුණාවකුත් නැතුවම නෙවෙයිනෙ.

මට තියෙන්නෙ එයාගෙ තරහ නැතුව හොඳ විතරක් හිතන්නයි. මං හිටියෙ එයාව සම්පූර්ණයෙන් අත්හැරීමටවත් එතෙක් පවුල් කෑ විදියට එයාට දෙවියෙක් වගේ නත්තියෙන් ඉන්නවත් බැරි තත්ත්වෙකයි.

ඒ දවස්වල විපතට පත් වෙච්ච අය වෙනුවෙන් මනෝවිද්‍යා උපදේශ සායන, භාවනා වැඩ සටහන්, ධර්ම දේශනා, බෝධි පූජා, සර්ව ආගමික ශාන්ති වැඩසටහන් වගේ නොයෙකුත් දේවල් නිතරම තිබුණා.

"මම වෛර නැත්තෙක් වෙම්වා." කියල පුන පුනා කියන්න කවුද ධර්මදේශකයෙක් මායා ආන්ටිලට උගන්නල තිබුණා. රෑට නිදා ගන්න එන ගෑනු රවුමට වාඩි වෙලා ශාන්ති ප්‍රාර්ථනා ගණනාවක් කියනවා. මාත් ඒවා හිතෙන් කියන්න උත්සාහ කළා. ඒත් මගේ හිතේ කෝපයවත්, ශෝකයවත් සම්පූර්ණයෙන් තුනී වුණේ නැහැ. කතා නොකරන දූරියත් ගෑනු කට්ටිය ළඟ වාඩිවෙලා ඉන්නවා. සමහර විට එයත් ඒවා හිතෙන් කියන්න ඇති.

ගෑනු කට්ටියගෙ විස්තර අහන්න උනන්දු නොවුණත් ඒ උදවිය එකිනෙකාට කතා කරන නම් මට ඇහුණා. මිසිස් මායාදුන්න, මිසිස් රන්වල, මිසිස් පෙරේරා, මිසිස් නාකන්දල, මිසිස් බණ්ඩාර වගේ නම්වලින් එකිනෙකාට කතා කර ගනිමින් හිටිය කට්ටිය නන්ද, රාණි, සුභද්‍රා, නයනා, ගීතා වගේ නම්වලින් කතා කරන්න පටන්ගෙන තිබුණා.

රාණි රන්වල කොණ්ඩෙ යාන්තමට පැහුණු වයසට ගියත් ක්‍රීඩා උපදේශිකාවක් වගේ උරහිස් කෙළින් තියාගෙන ඇවිදින තරුණ කාලයෙ හැඩට හුරුබුහුටියට හිටි මාව පෙනෙන ගෑනියෙක්. භාවනාවක් කියලා හඳුන්වන ශාන්ති ප්‍රාර්ථනා ලියපු කොළ බෙදුවෙත් එයා තමයි. ඒ වුණාට හැමදම එයා නිදා ගත්තු මගේ අම්මගේ සෝපාවෙ සුභද්‍රා පෙරේරා වැතිරිලා හිටි දවසක එයා තරමක් නොසන්සුන් වුණා.

"මේ මං නිදා ගන්න තැන" දෙතුන් පාරක් එහාට මෙහාට ඇවිදලා එයා සුභද්‍රා පෙරේරාට කිව්වා.

සුභද්‍රා අවුරුදු හතළිහක විතර කෙනෙක්. එයාගෙ දරුවො දෙන්නා ගෙට යටවෙලා නැති වුණු බවත් මහත්තයාගෙ කකුල කැපිලා, රතු කුරුස හමුදා වෛද්‍ය කඳවුරේ ඉඳලා, ඒ වෙනකොට ප්‍රතිසංස්කරණ කරලා තිබුණු කළුබෝවිල ඉස්පිරිතාලෙට යවලා බව මට ඇහිලා තිබුණා.

"මං හරි වුවත් ඉඳලා දෙන්නං, ඇඟ සීතලවෙලා උණ වගේ. හරි අමාරුයි" සුභද්‍රා කිව්වා.

ලිනට් කතා නැති දූරියත් එක්ක පෝලිමක ඉඳලා ගෙනාපු කොත්තමල්ලි පැකට් එකක් තිබුණු නිසා එයාට කොත්තමල්ලි ටිකක් තම්බලා දෙන්න ඕන කියල මට හිතුණා.

ඒ වෙනකොටත් ගෑස් බෙදාහැරීම ක්‍රමවත්වෙලා තිබුණෙ නැති නිසා මං ගෑස් පාවිච්චි කළේ බොහොම පරිස්සමින්. භූමි කම්පාවෙදි ටැංකියක් පුපුරලා විශාල හානියක් වෙලා තිබුණා. හුග දෙනෙක් කොතනක හරි දර කෑල්ලක් දැක්කොත් උස්සගෙන ආවා. මිනිස්සු කැඩුණු ගෙවල්වල පරාල, උළුවහු පවා හොරකම් කරනවා කියල කර්නල් සුහාෂ් මායා ආන්ටිට කියලා තිබුණා. මං ගෙදරටම වෙලා හිටිය නිසා පිටත තිබුණු නොසන්සුන් ගතිය දැක්කෙ නැහැ.

ඒත් එද රාණි රන්වල සෝපාව අහිමිවෙයි කියන බයත් එක්ක සියුම් කෝපයක් ඇති වෙච්ච විදිය ප්‍රකාශ වුණේ එයා කුස්සියට ඇවිත් "මට අවුස්ටර් කියලා තියෙන්නෙ සිමෙන්තියෙ ඉඳ ගන්නවත් එපා කියලනෙ. සුභද්‍රලා නාම තරුණයිනෙ. මේ නාකි මට මේ වෙච්ච දෙයින් පස්සෙ හැම වෙලාවෙම පොළොව පැළෙයි කියලා බය හිතෙනවා" කියූ ස්වරයෙ තිබුණු වියළි රළු ගතියෙන්.

මං කතා නොකරන බව දන දනත් එයා මට ඇහෙන්න එයාගෙ කැඩුණු ගෙදර විශාලත්වයත් එයාගෙ ඇඳ මැලේසියාවෙන් ගෙන්නපු විස්තරෙත් කිව්වා. සමහර විට එයා මගේ ගෙයි ප්‍රමාණයවත් අනිත් විස්තරවත් දන්නෙ නැතුවත් ඇති. එයාට සෝපාව දීලා ලෙඩාට මගේ ඇඳේ නිදා ගන්න දිය යුතුයි කියලා හිතුණත් කතා නැති පොඩි එකීව බිම නිදි කරවලා හෙම්බිරිස්සාවත් හැදෙයි ද කියලත් කල්පනා වුණා. ඒ එක්කම එයා සෝපාවේම නිදා ගන්න උත්සාහ කිරීම ගැන සියුම් නොරිස්සුමකුත් දනෙන්න ගත්තා. ලෙඩාට කොත්තමල්ලි හදලා දෙන්න කාරුණික වුණත් ඇඳ දෙන්න ඉදිරිපත් නොවීමේ වරදකාරී හැඟීමෙන්ම මං ඇදට වැටුණා. මගේ අභ්‍යන්තරයත් ඒ තරම් සංකීර්ණ එකේ රාණිගෙ ආත්මාර්ථකාමී ගතිය ගැන අප්‍රසාදයක් ඇති කර ගන්නෙ මොකට ද?

විපතකදී ක්ෂණයකින් මතුවෙන පරාර්ථය වැඩි වෙලාවක් පවතින්නෙ නැත්තෙ ඇයි? ඒවා කතා කරන්න අම්මයි ආතම්මයි හිටියා නං කියන හැඟීමෙන් උපන් හීල්ලීමත් එක්ක මට ඇඬුණා.

පොඩි එකී මල් පෙති වගේ ඇඟිලිවලින් මගේ මූණ අත ගාලා ජාත්‍යන්තර සංවිධානයකින් එයාට ලැබිලා තිබුණු ෆ්ලැනල් පිජාමා කමිසෙන් මගේ මූණ පිහදැම්මා. අපේ රටේ රාත්‍රී උෂ්ණත්වයට ගැලපෙන්නෙ නැති නිසා අඳින්න බැරි උනත් රෝස පාට පසුබිමේ චූටි සැටින් කහ රෝස මල් මතුවෙලා තිබ්බ්න්න මහපු ඒක එයා ඊට කොට්ටෙට යට තියාගෙන නින්ද යනකල් එක කොණක් පිටතට ඇදගෙන අතගාමින් ඉන්නවා. ඒ ඉතින් කෙල්ල මට උපරිම ආදරේ පෙන්නපු විදිය තමයි. ෆ්ලැනල් කමිස පොඩ්ඩ පෙඟෙනකල් මං ඇඬුවා. කිම නිදගෙන හිටිය සුභද්‍රා කෙඳිරි ගෑවා. මගේ ඉකිගැසුම් තද කරගෙන ඉන්න හැඩූවට පිට වුණා. රාණි රත්වලත් නිදි නැතුව හිටියා. එයා සැරින් සැරේ නැගිටලා වතුර බිව්වා.

"දුක් වෙන්න එපා ළමයො. ඒත් අඬන එක හොඳයි. මිට නං දුං අඬලා වැඩිකමට අඬන්නත් බයයි. එතකොට මගේ පපුව ගැහෙන්න ගන්නවා. කාත් කවුරුවත් නැතුව ලෙඩ වෙන්නෙ කොහොම ද? මනුස්සයෙකුට ලෙඩ වෙන්න උනත් ආදරයක් කරුණාවක් තියෙන්න ඕන."

රාණි තනියම කියෙව්වා. සමහර විට එයා කියවන බව එයාට දැනෙන්නත් නැතුව ඇති. හැඬුම් කෙඳිරිම ඇහුණ නිසා නිදි නැතුව හිටි අනික් අයගෙත් හීන් ඉකිගැසුම් වරින්වර ඇහුණා. පාන්දර යාමයෙ මහ වැස්සක් කඩා හැලුණෙ ඒ ගේ ඇතුළෙත් අවට පරිසරයෙත් මිනිස්සුන්ගෙ දුකට අහස කම්පාවෙලා වගෙයි කියලයි මට මුලින්ම හිතුණෙ. ඒත් ඊළඟට හිතෙන්න ගත්තා අහස කම්පා වෙනවා කියන්නෙ මම ස්වභාවික සිද්ධියකට දීපු අර්ථයක් විතරයි නේද කියලා.

මං දන්නෙ නෑ මට මොනවා වෙනවද කියලා. භූමිකම්පාවට පෙර හිටිය මම භූමිකම්පාවෙන් පස්සෙ සම්පූර්ණයෙන්ම හිටියෙ නැහැනෙ. මගේ අංගුමාත්‍ර වෙනසක් තිබුණානෙ. අම්මාගෙ මරණයෙන් පස්සෙ "මම" වෙනත් "මම" කෙනෙක් වුණානෙ.

ඒත් සුළු වෙනසක් විතරයි. අම්මාට තිබුණු ආදරය පපුව පළාගෙන මතුවීමක් වගේ දෙයක්නෙ. පොත් දෙක කියෙව්වට පස්සෙ ඒ "මමත්" වෙනත් "මම" කෙනෙක් වුණා.

මේ නිදි නැතිව කඳුළු හලමින් හිටි "මම" අර පොත් කියවපු මමමත් නොවෙයිනෙ. එකම රාත්‍රියක හිත් කීයක් ද? ඒ මොහොතෙ මං දන්නෙම නැතුව ප්‍රශ්න කරමින් හිටියෙ ඒ වෙනස්වෙන මම කවුද කියලයි.

කඳුළුත් වැස්සත් ශෝක සංකේත හැටියට ගන්නෙ නැතුව ප්‍රීති සංකේත හැටියට ගත්තු වෙලාවල් සිහි වුණා. එක දවසක් මහ වැස්සෙ සාෂාට පිස්සුවක් හැදුණා මාත් එක්ක තෙමෙන්න. අපි මිදුලෙ ඇවිද්දා, වැස්සෙ තුරුළුවෙලා හිටියා. සාෂා මාව උස්සගෙන වටයක් දෙකක් කැරකෙව්වා.

"මහ වැස්සයි හාදු වැස්සයි" කියලා මගෙ ඔළුවෙ ඉඳන් කකුල් දෙකටම ඉම්බා.

එවෙලේ කඳුළු වැළෙනකොට "මහ වැස්සයි - හාදු වැස්සයි - පපුව පළාගෙන එන ආදරේ කඳුළු උල්පතයි" කියලා හයියෙන් කිව්වා. "මං මේ හයියෙන් කියන්නෙ අහසට ඇහෙන්න" කියලා කිව්වා.

එද තෙමුණට අපිට හෙම්බිරිස්සාවක්වත් හැදුණෙ නැහැ. ගෙට ඇවිත් ඇඳුම් මාරු කරලා මුත්වී දාපු උණු කෝපි ජෝගු දෙකකුත් අරගෙන අපේ ඇඳ උඩ ඉන්නකොට අපිට මහා ප්‍රීතියක් ජීවිතය දීනුවා කියන හැඟීමක් මිසක් අම්මා නරකයි කියන ශෝකයවත් දැනුණෙ නැහැනෙ. අපි එහෙම ඉන්නකොට සාෂාගෙ ජංගමයට කවුද කතා කළා.

"මං මේ කොළඹින් පිට ඉන්නෙ" කියලා එක පාරට කියලා ඊළඟට "එහෙමයි හාමුදුරුවනේ" කියන්න ගත්තා. "මයා ඇයි හාමුදුරුවරුන්ට බොරු කියන්නෙ. ගෙදර ඉන්නෙ කියලා කියන්න තිබුණානෙ" ඒ කතාව ඉවර උනාම මං කිව්වා.

"ගෙදර ඉන්නවා කිව්වොත් මට එන්න කියනවනෙ. මේක මියාගෙ මොහොත. හාමුදුරුවන්ගෙ මොහොත නෙවෙයි."

එද ඒ උත්තරේට හිනා වෙව්ව් මට මේ වර්ෂාවත් දුකට

එකතු වෙනවා වගේ දැනිච්ච රාත්‍රියෙ හිටි ගමන් " ඒ කතා කළේ හාමුදුරු කෙනෙක් ද කවුරු හරි ගෑනියෙක් ද" කියලා හිතෙන්න ගත්තා. ඒ හිතත් ශෝකයක් ගෙනාවා. මේ විදියට ශෝකය එවා ගන්නෙ ඇයි? සැක සංකා මතු කරන වැස්සයි කඳුළටයි ශෝක සංඥ හරි ප්‍රීති සංඥ හරි හැටියට අර්ථ දෙන "මම" කවුද කියලා හිතෙන්න ගත්තා. දුක් වෙන සතුටු වෙන මම ඇර ඒ ආතතිත් ප්‍රශ්න කරන "මම" කෙනෙක් ඉන්නෙ කොහොමද? ඒ "මම" කව්ද?

එළිය වැටීගෙන එනකොට මට නින්ද ගියා. මට ඇහැරුණේ භාගභාගෙයි ප්‍රියා ආන්ටිගෙයි කට හඬවල් ඇහෙද්දියි. මං හිතුවෙ හීනයක් කියලයි.

"ඊයෙ රෑ අඬ අඬා හිටියෙ. ඔය හිටියට පපුවෙ මහ ගින්දරක්නෙ ඇත්තෙ." රාණි රන්වල කියනවා ඇහුණා.

මං හෙමින් ඇස් ඇරියා. භාගභා මාව බදාගෙන ඇඬුවා. ප්‍රියා ආන්ටිත් මගේ අත අල්ලගෙන හිටියෙ කඳුළින්. ඒත් මට එවෙලෙ කඳුළු ආවෙ නැහැ. මං වෙන ලෝකෙකිත් ආවා වගේ බලා හිටියා.

"මං කිව්වෙ ඕක තමයි. එක පාරට කතා කරන්නෙම නැතුව ගියා." මායා ආන්ටිත් ආවා.

"ඇයි ඔයා මෙහෙ ඉන්නෙ? ඇයි නුවර ගිහින් හෝටලේක හරි ඉන්න තිබුණානෙ. නුවරට මුකුත් වෙලා නැහැනෙ. අනේ වත්දිමට තිබුණානෙ ඔයාව වෙන පැත්තකට එක්කන් යන්න." ආන්ටි ප්‍රියා කියපු දේ මට ඊට කලින් කල්පනා වෙලා තිබුණෙත් නැහැ. වෙන පැතිවල නෑදෑයො යාළුවො හිටි අය පවුලෙ පිරිමි ටික කැඩුණු බිඳුණු ගෙවල්වල තියලා එහෙම යනවා කියලා දවසක් මායා ආන්ටි කියලා තිබුණා.

"මං මූණ හෝදගෙන එන්නං." කියලා කොළ කැල්ලක ලියලා ළිඳ ළඟට යනකොට එතන පිරිමි කට්ටියක් නානවා. ඒ පාර මං වතුර බාල්දියක් ඉල්ලගෙන ගේ පිටි පස්සට ගිහින් මූණ කට හෝද ගත්තා. මං දැක්කා භාගභා බොහොම දුකෙන් ජනේලෙන් බලාගෙන ඉන්නවා.

ඒගොල්ලන්ට එන්න පුළුවන් වුණා කියන්නෙ සාෂාටත් එන්න පුළුවන් වෙයි ද? මගේ හිත නැවතුණා. මං කොහොමද එයා එක්ක කරදසිවල ලියමින් හරි කතා කරන්නෙ? එයා කෙටි පණිවිඩ එවන්නෙ කවුරු හරි බලන්න ආවම විතරයි. ඒ වෙනකොටත් අත එල්ලගෙන ඉන්නෙ. කකුලත් එල්ලලා ඒත් බය වෙන්න දෙයක් නෑ කියලා එවලා තිබුණානෙ. ඒ තත්ත්වය යටතේ එයාව එවන්නෙ නැති වෙයි. කතා නොකරන පැවිස්සිත් ආවා. එයා තනියම මූණ හෝදලා ඇඳුම් මාරු කරලා තිබුණා. ඒත් කොණ්ඩෙ පීරලා නෑ.

"ඇඳුමක් දාගෙන එන්න. අපි නුවර යං. මෙහෙම ඉන්න එක පිස්සුවක්නෙ." භාගභා මගේ අතින් ඇදගෙන ගෙට ගිහින් එයා ගෙනාපු ඇඳුම් බෑග් එකක් ඇරියා.

මං ඇඳුම් තෝරන්නෙ නැතුව පොඩි එසීගෙ කොණ්ඩෙ පීරන්න ගත්තා. "මේ බබා කාගෙද?" කියලා ආන්ටි ප්‍රියා ඇහුවා. අහිත් අයි විස්තර සපයන්න ඉදිරිපත් වුණා.

"මෙයා දාලා ගියොත් එයාට අසනීප වෙයි. එයා හැම වෙලාවෙම මගේ පස්සෙනමයි." මං කරදසියෙ ලිව්වා.

"මං රතුකුරුසෙටයි අහිත් නැන්වලටයි කතා කරන්නං. අපි මෙයාවත් අරගෙන යමු" කියලා ආන්ටි ප්‍රියා ඒ මොහොතෙම පිට වුණා.

"එයා යූ. එන් සෙකට්‍රිට හරි කතා කරලා ඔය දරුවා එක්කම නුවර යන්න ලෑස්ති කරයි" කියලා භාගභා එතන හිටි අයට එයා ගෙනාපු කෑම ජාති බෙදුවා.

පොඩී එසීට ලොකු චොක්ලට් එකකුයි දුඹුරු පාට වලස් පැටියෙකුයි ලැබුණා. කෙල්ල හිනා වුණා. එද අපි අම්මගෙ සොහොන ළඟටත් ගියා. අපේ ගෙදර සුදු ඉංජිනේරුවොයි සුදු ගෑනුයි, ලංකාවෙ ස්වේච්ඡා කණ්ඩායමකුයි වැඩ කරමින් හිටියා. කැඩුණු බිඳුණු බඩු එක ගොඩකටත්, හොඳ තත්ත්වයේ තිබුණු ඒවා එක ගොඩකටත් වෙන් කරමින් හිටියෙ නැපැල් සීයායි බාල දක්ෂයො දෙන්නුත් දෙන්නෙකුයි.

ආන්ටි ප්‍රියා කොහෙන් හරි අරලිය මල් ටිකක් හොයාගෙන

ඇවිත් අම්මාගෙ [illegible] මට [illegible] ඒ ගමේ මහ ගෙදර වගේ පරණ මිහිරි සිහින මතකයක් විතරයි වගෙයි. ගෙදරත් ඒකෙ ගෘහිණියවෙලා හිටිය වර්ණාසි මගේ කවුරුවත් නෙවෙයි වගෙයි.

එහෙම නං ඒ වර්ණාසියි මේ කතා නැති දූරියක් අතින් අල්ලගෙන ඒ දූරියගෙ ආරක්ෂාවෙ වගකීම භාරගෙන දවසින් දවස ඒ දූරියට ටික ටික බැඳෙමින් හිටි වර්ණාසියි කව්ද?

"මෙහෙම ඉඳලා හරියනවද ඩොක්ටර් කෙනෙක් බලන්න ඕන. ඔය කතා කරන්න බැරි ශොක් එකට" නුවර යන අතර ආන්ටි ප්‍රියා කිව්වා. එයා දූරිය ගෙනියන්න අවසර ගත්තෙ කොහොමද කාගෙන් ද කියල දැන ගන්න මං උනන්දු වුණේ නැහැ.

එද රෑ නුවර පරණ වලව්වක විශාල කාමරයක විශාල ඇඳක සනීපෙට නිද ගත්තට මොකද මට ටික ටික ලේ යන්න ගත්තා. පාන්දර වෙනකොට ඒක වැඩි වුණා. බඩ රිදෙන්න ගත්තා. උණත් වෙව්ලීමත් ආවා. භාගයයි ප්‍රියා ආන්ටියි මාව ඉස්පිරිතාලෙට ගෙනිච්චා. ඒ රාත්‍රියෙම මගේ කුසේ කලලය වැටුණා. පසුවෙනිදා බඩ සේදුවා. තව පැය විසි හතරක් මාව තියා ගත්තෙ ප්‍රියා ආන්ටිගෙ සබඳතා නිසා වෙන්නැති.

භාගයා ආයෙමත් ඇඬුවා.

"බය වෙන්න එපා. ඔයාට තව දරුවෝ ලැබෙයි. මෙච්චර කල් ඔයා බයෙ හිටියෙ දරුවෙක් ලැබෙන්න බැරුව ඇති කියලනෙ. දැන් ඒක එහෙම නෙවෙයි කියන එකවත් දන්නවනෙ." භාගයා සැනසිලි බස් කියන්න ගත්තා.

එච්චර කාලයක් දරුවෙක් ලබන්න පෙරුම් පුරපු මට දරුවා නැති වුණාම දුකක් දැනුණෙ නැත්තෙ ඇයි? එක කඳුළක් ඉනුවෙ නැහැනෙ. හරියට චිත්‍රපටියක චරිතයක් දිහා බලාගෙන ඉන්නවා වගේ මං හැම දෙයක් දිහාම බලා ඉන්නවා මිසක් ප්‍රධාන චරිතය රඟපානවා වගේවත් දැනුණෙ නැහැ.

"මේක සාෂාට කියන්න එපා." කියලා ලිව්වෙ වහාම ඉන්දියාවෙ යන්න වෙයි කියන බයට මිසක් එයාට ඒ දුක දෙන්න ප්‍රමාද කරන්න නෙවෙයි. ඒත් භාගයලා හිතුවෙ එහෙමයි.

"ඔයා සුවපත් වෙන්න. අපි එකිනෙකා දකින දවසට ඔයාගෙ කටින් මගේ සාෂා මට කොච්චර ආදරේද කියලා අහනවා මට ඇහෙන්න ඕන." කියලා සාෂා කෙටි පණිවිඩයක් එව්වා.

"මෙයාට උත්තර යවන්නෙ නැද්ද?" ඒක බලපු භාගයා ඇහුවා.

මං කතා නැතුව ඇස් පියා ගත්තා.

භාගයා අඬන්න ඇති. භාගයාගෙ අත අල්ලගෙන බයෙන් බලා හිටි පොඩි එකී මගෙ ඔළුව අත ගෑවා. තළල ඉම්බා. අනේ කෙල්ලට මං එයාගෙ අම්මා වගේ දැනෙනවා ඇති.

නුවර වලව්වෙ පැත්තක් ප්‍රියා ආන්ටිට නොමිලේම දීලා තිබුණෙ නිව්යෝර්ක්වල හිටි කෙනෙක්. අනිත් පැත්තෙ හිටියෙත් වයසක මැණිකෙ කෙනෙක් විතරයි. ඒ ප්‍රියා ආන්ටිගෙ යළුවගෙ අම්මා. එයා හිමින් ඇවිදින, හිමින් කතා කරන, දවසම බණ භාවනා කරන කෙනෙක්.

"ඔය විතුලතා [illegible] තිලමේ හරිම තරක විදියටයි එයාට සලකලා තියෙන්නෙ. මගේ යාළුවා පොඩි කාලෙ හැමදම [illegible] පිගන් පොළොවෙ ගහනවලු. එයා තව නුහාස් තරක වැඩ කරපු කෙනෙක්ලු. එහෙම මිනිහා වෙන ගෑනියෙක් එක්ක යනකොට ඇක්සිඩන්ට් උනාම මේ ගෑනු මනුස්සයා ඒ දෙන්නටම සාත්තු කරා. ගෑනු කෙනා ඉකුරු වුණා. තිලමේ මැරුණා. ගෑනු කෙනාට තිලමේගෙන් ගෑනු ළමයි දෙන්නෙක් ලැබිලා තිබුණ හින්ද අරයා සනීප වෙනකල්ම ඒ දරුවෝ මෙහෙ තියා ගත්තලු." දැන් ඊගොල්ලො සැප දුක් බලන්නවත් එන්නෙ නැති වුණාට මෙයා ඉඩකඩම් හෙමත් දීලා තියෙනවා." ආන්ටි ප්‍රියා කියපු කතාවෙන් පස්සෙ මට හිතුණා මට නං ඒ තරම් කරුණාවක් ඇති වෙන එකක් නැහැ කියලා.

"ඉතිං මෙයාගෙ දරුවන්ට ඒකට කරන ඇතිනෙ."

"නෑ. ඔය ටික කිව්වෙ පුතා තමයි. ඒ කාලෙ අප්පච්චිගෙ අත කැඩුවම ළමයින්ට කිව්වෙ ලිස්සලා වැටුණා කියලලු. එයාලා කවුරුවත් ලංකාවෙ පදිංචියට එන්නෙ නැති වෙයි. මෙයත් තැරිත් ඇමේ දරුවෝ බලන්න යන එනවා. ඒත් දැන් මෙයා කියනවලු

දරුවන්ට තියෙන ඇල්මත් නැති කර ගන්නවා කියලා."

භාග්‍යා මා එක්ක නැවතුණා. ආන්ටි ප්‍රියා විපතට පත් වෙච්ච අයට උදව් කරන්න ගියා. මුහුදුකරයෙ අර තරම් විනාශයක් වුණේ නෑ වගේ මහනුවර කඳු ශාන්තව වැතිරිලා හිටියා. ඒත් කොයි වෙලාවෙ හරි ඒවා පොළොවට පාත් වෙයි වගේ හැඟීමක් මගේ හිතේ හොල්මන් කළා.

ඉදිරියට නෙරපු විශාල ඉස්තෝප්පුවෙ බාග බිත්ති බැඳලා ලී ගේට්ටු දලා තිබුණෙ ඒ වලව්ව අවුරුදු සියයකටත් එපිට මුලින් ම හදපු විදියටමයි. විශාල සාලයකුත් ලොකු කාමර දෙකකුත්, පුංචි කාමරයකුත්, කෑම කාමර දෙකකුත්, පිටිපස්සෙ ඉස්තෝප්පුවකුත් සහිත ඒ වලව්වෙ පරණ දඬුකදකුත් ඉතුරු වෙලා තිබුණා. එල් හැඩයෙ ඉස්තෝප්පුවක් එක්ක කුස්සියක්, ගබඩා කාමරයක්, කෑම කාමරයක්, ආයුධ තියෙන කාමරයක් ප්‍රධාන නිවසට යා වුණෙත් ලෙකු කුලුණු තියෙන පටු බරාඳයකින්.

අපිට ලැබුණෙ සම්පූර්ණයෙන්ම නවීකරණය කළ විශාල කාමරයකුයි, පුංචි කුස්සි තීරුවකුයි පිටතින් ඇතුළු වෙන්න හදපු අලුත් ඉස්තෝප්පු පොඩ්ඩකුයි සහිත කොටසයි. ඒකෙ කලින් ඉඳලා තියෙන්නෙ නුවර වැඩ කළ පුද්දෙක්.

ඒ වත්ත අක්කරයකට වැඩි ඇති. පලතුරු ගස් එක පැත්තක. ඉස්සරහා වට රවුමෙ සීමාව වටේටම සුදු මල් පිරුණු ගාඩිනියා ගස්. වත්ත බෑවුම් වෙන තැන්වල ගල්වැටි බැඳලා. කාකි කොට කලිසමක් ඇඳපු වයසක මිනිහෙක් දවස පුරාම වත්තෙ වැඩ කළා. ඒ නිසා වල් ගස් තිබුණෙ නැහැ. ගල් වැටි අද්දර එක එක වර්ගවල මල් පැල තිබුණු නිසා එක එක මට්ටම්වලින් පාට පාට මල් පිපිලා තිබුණා.

"හරියට පින්තූර පොතක වගේ මෙච්චර ලස්සනට මේ වත්ත හද ගත්තෙ කොහොම ද?" භාග්‍යා ඇහුවා.

විද්‍යුලතා මැණිකෙ ඇස්වලින් හිනාවෙමින් බලා ඉඳලා ඇහෙන නෑහෙන හඬින් උත්තර දුන්නා.

"මං මල් ඇට එකතු කරලා ඔය තැන්වලට නිකං විසි කරනවා. වැස්ස නැති කාලෙටයි කරන්නෙ. නැත්තං ඒවා පහළට

ගෙඳිලා යනවා. ඒකට ඔහොම ඉතින් හැදුණා වගේ ලස්සනට තියෙන්නෙ."

"මේ යාළුවා එක්ක වත්තෙ ඇවිදින්න. ඕන දෙයක් කඩාගෙන කන්න. හවසට දළඳ මාළිගාවට හරි නාථ දේවාලෙට හරි වෙන පන්සලකට හරි ගිහින් එන්න. මෙහෙම විවේකීව ඉන්නකොට මේගොල්ලො කතා කරයි." විද්‍යුලතා මැණිකෙ මට ධර්ම දේශනා කරන්න උත්සාහ කළේ නැති එක සහනයක් වුණා.

වත්තෙ දකුණු පැත්තෙ ගල්තලාවක් තියෙනවා. ඒකෙ පුංචි ගල් පඩි කපලා තියෙන්නෙ විද්‍යුලතා මැණිකෙගෙ අප්පච්චිලු. ගල් තලාවෙ පුංචි බුදු මැදුරක් හදලා තියෙන්නෙත් මහ නිලමේගෙ අතින්මයි කියලා වත්ත බලාගන්න මනුස්සයා භාග්‍යාට කිව්වා. බුදු මැදුරට පහළින් ගල හොඳට සිනිඳුවට හිටින්න හදපු තැනක තමයි මහ නිලමේ අන්තිම කාලෙ වැඩිපුරම ඉඳල තියෙන්නෙ. විද්‍යුලතා මැණිකෙ එතනට ගියේ උදේට විතරයි. ඒත් මල් අරගෙන ගියේ නෑ. එක දවසක් අපිත් එයාගෙ පස්සෙන් ගියා. රවුම් හැඩයට සුදු හුනු ගාලා හදපු ඒ කුටියෙ වීදුරු දෙරස් තිබුණා. මං හිතුවෙ අතුළෙ ලොකු බුද්ධ රූපයක් ඇති කියලයි. ඒත් අතුළෙ බිත්ති වැහෙන්න පුංචි බුද්ධ රූප ගණනාවක් සිතුවම් කරලා තිබුණා. කුටියෙ මැදට ආලෝකය වැටෙන්න වහලෙ වීදුරු උළු යොදලා. කුටිය රවුම් නිසා රවුමෙන් බාගයක් රවුම් වීදුරු කවුළු. ඒවායින් හන්තාන කඳු වැටිය පෙනුණා.

"අප්පච්චි අන්තිම කාලෙ රෑට නිද ගන්න විතරයි ගෙට ආවෙ. මේ බුද්ධ රූප ඇන්දෙ අප්පච්චිමයි. ඔය සිත්තර තයිදෙ කියලා වයසක මනුස්සයෙක් හිටියා. ඒ මිනිහා අල්ලගෙන ඔය සායම් සේරම හද ගත්තා."

"ඇයි ආන්ටි මේකෙ බුදු පිළිමයක් නැත්තෙ?" භාග්‍යා ඇහුවා. පොඩි එකී බුද්ධ රූප අතගාලා බැලුවා.

"අප්පච්චි ලොකු පළිඟුවක් තියාගෙන හිටියා ඉරළිය වැටෙන තැන හරි මැදින්. දං කාලෙ වෙනස් හින්ද මං ඒක ටික කලක් ගෙයි තියාගෙන ඉඳලා පස්සෙ පන්සලක කොතකට පළිඟුවක් හොයනකොට ගැලපෙන විදියට කපලා ගන්න කියලා දුන්නා."

"ඒ කියන්න [illegible]"

"ඔය නිකං සේනුවක හැඩේට කපලා තිබුණෙ. අප්පච්චි අන්තිම අවුරුදු පහක හයක කාලෙ කතා කරේ උවමනාම දේකට විතරයි. ඒ කාලෙ අපේ දරුවොත් පොඩියිනෙ. ඉතිං මටත් වෙලාවක් තිබුණෙ නෑ මෙතන මොනවද කරේ කියලා හොයලා බලන්න. මේක හදන්න කලින් මට කියලා තිබුණා නාථ දෙවියන්ට ඉක්මනට මෛත්‍රී බුදුන්වෙලා වඩින්න කියලා ප්‍රාර්ථනා කරනවා කියලා. අප්පච්චි මල් පූජා කරේ නෑ. හැබැයි හාමුදුරු කෙනෙකුට වැඩිය හොඳට බණ දහම් දන්නවා. අපි පුංචි කාලෙ ඕනම දේකට ගැලපෙන ශ්ලෝකයක් කියනවා. කවි හදනවා. හුඟාක් පුස්කොළ පොතුත් තිබුණා. ඒවා ඔය පුතාලා ගෙනිච්චා. ඒගොල්ලො ඒවායින් ප්‍රයෝජනයක් ගන්නවද දන්නෙ නෑ.

"හරි පුදුමයිනෙ. ඉතිං මොනවා හරි ලියලා තියලා ඇතිනෙ."

"ලිව්වා. අපේ නිලමෙ ඒවා කාටද දීල නැති වුණා. අන්තිමට මා එක්ක කතා කරෙත් නෑ. වැන්දඹුම ඔච්චර අත තියනවා විතරයි. හෙම්බිරිස්සාවක් හැදුණත් ඉඟුරු කොත්තමල්ලි හදලා දෙන්න කියලාවත් කියන්නෙ නෑ. මට තේරිලා හදලා දුන්නම බොනවා."

චිත්‍රලතා මැණිකෙ කුටිය ඇතුළතත් පිටතත් අතුගාන්න ගත්තම මං කොස්ස ඉල්ලගෙන ඒක කළා. එයා කුටිය [illegible] වැඳලා හෙමින් ආපහු ගියෙ "ඕගොල්ලා ඕන තරං වෙලා ඉඳලා දොර වහගෙන එන්න. නැත්තං වවුලො රිංගනවා" කියාගෙනයි.

භාග්‍යා ටික වෙලාවක් ගල් තලාවෙ ඇවිද්ද, කඳු දිහා බලා හිටියා. පොඩි එකී වතුර එකතුවෙලා තිබුණු ගල් කෙම්යකට එබීගෙන එයාගෙ මූණ බලන්න හැදුවා. මං පුංචි විහාරෙ පඩිය උඩ ඉඳගෙන හිතුවෙ චිත්‍රලතා මැණිකෙත් අප්පච්චි කතා කළ කාලෙදී දැන ගන්න තිබුණු දේවල් අතුරුණා කියලා දුක්වෙනවද දන්නෙ නෑ කියන එකයි.

භාග්‍යා හෙමින් හෙමින් මා ළඟට ඇවිත් වාඩි වෙලා මගේ අත් දෙක අල්ලගෙන ඇස් දිහා බලාගෙන හිටියා.

"[illegible] ඔයා කතා කරන්නෙ නැත්තෙ කතා කරන්න බැරිකමට නෙවෙයි. පුංචි කාලෙ ඉඳලා මං ඔයාගෙ ඇස් හොඳට

[illegible] ඔයා අපි වගේ [illegible] වෙලාවෙම කියව්වෙ කෑගැහුවෙ උගුලුවෙ නැති උනාට ඔයාගෙ ඇස් හැමවෙලාවෙම කතා කරා. ඇස්වල අපේ දුකය එහෙමම තිබුණා. මේ දවස් ටිකේම මං ඔයා දිහා හොඳට බලාගෙන හිටියෙ. ඇයි මෙච්චර ළඟින් ඉන්න මට කතා කරන්නෙ නැත්තෙ? මං හිතාගෙන ඉන්නෙ ඔයාට අම්මයි, ආතම්මයි, සාඳායි ඇරෙන්න ළඟම නෑයන් යාළුවන් මං කියලයි. දැං අම්මයි ආත්තම්මයි නැති හින්ද ඒ දෙන්නත් මං වෙන්න ඕන. මට දිගටම ඉන්න විදියක් නැහැනෙ. ලබන සුමානෙ ආපහු යන්න ඕන. මට සැනසීමෙන් යන්න නං ඔයා කතා කරන්න ඕන."

භාග්‍යා කතා කළේ ඉංග්‍රීසියෙන්. පොඩි එකිත් ඇවිත් මගේ උකුලෙ වාඩි වුණා. ඒ වෙලාවෙ මට හොඳටම ඕන වුණා මොනවා හරි කතා කරන්න. ඒත් කතා නොකර ඉඳීමට කොච්චර පුරුදු වෙලා හිටිය ද කිව්වොත් උගුරෙ හුස්ම හිරවෙලා වචන වළකනවා වගේ දැනුණා. ඒක නිකං හුස්ම හිරවෙනවා වගේ අමාරු දෙයක් නෙවෙයි. මං දැන ගත්තු දේවල් මට හිතෙන දේවල් භාග්‍යාටවත් [illegible] වැඩක් නැති කියන හැඟීමත් එක්කම ආ පපුවෙ තෙරපීමක් වගේ දෙයක්.

"ඇයි ඔයා සාඳා බලන්න යන්නෙ නැත්තෙ? දැං එහෙ [illegible] ඔයාට එයා දැක්කම කතා කරන්න පුළුවන් වෙයි. ඔයා [illegible] හංගන දෙයක් තියෙනවා. භූමිකම්පාවට කලින් ඔයයි සාඳායි අතර මොකක් හරි ප්‍රශ්නයක් තිබුණ ද?"

මං නෑ කියන්න ඔළුව වැනුවා.

"භූමිකම්පාවෙන් පස්සෙත් ආච්චි [illegible] මැරුණත් පස්සෙත් ඔයා කතා කරා කියලා මායා ආච්චි කිව්වනෙ. එහෙනං ඊට පස්සෙ එක පාරටම මොකද වුණේ? මේ වගේ වෙලාවල්වල ඇතුළට වෙන කරදර ඇති වෙනවනෙ. මේ දවස්වල එහෙම කතා හරියට ආරංචි වෙනවා. අපි මෙහාට එන්න කලිනුත් එහෙම දේවල් වෙබ් සයිට්ස්වල තිබුණා. අනේ ඔයාට මට කියන්න බැරි දෙයක් නැහැනේ. සාඳාට කියන්න බැරි දෙයක් උනත් මට කියන්න පුළුවන්නෙ."

එයා [illegible] අහපු දේ මට තේරුණා භූමිකම්පාවෙන් පස්සෙ [illegible] පුංචි ළමයි පවා අතවරවලට අහුවෙලා තිබුණා. [illegible]

ආපු අය ඒවා කියනවා ඇහුණට පස්සෙ [illegible] මං [illegible] ගැන හුඟාක් [illegible] ඉන්න ගත්තෙත්. ළිඳෙන් නාන්න එකී එක විදිශෙය උදව්ය ආවෙත. භාගයා හිතන්න ඇත්තෙ මට එහෙම කරදරයක් වෙලා නිසා කාටවත් කියන්නත් බැරුව සාෂාගෙ මූණ බලන්නවත් බැරුව දුකයි, ලැජ්ජාවයි, තරහාවයි ඉවසගෙන ඉන්නවා කියලා වෙන්න ඇති. එහෙම දෙයක් නැති බව ඇස්වලින් පළ කරමින් මං ඔළුව වැනුවා.

"අද දවසම හිතන්න මං කොහොම හරි භාගයා එක්ක කතා කරනවාමයි කියලා. සමහරවිට ඔයා කතා කරන්න ගත්තොත් මෙ පැංචිත් කතා කරයි. මට වෙලාවකට හිතෙනවා මේ දරුවත් මෙහෙම කතා නැතුව ඉන්නෙ ඔයා ළඟට එන්න කලින් මොනවා හරි කරදරයක් වෙලාද කියලා."

මං පොඩි එකීව තදින් තුරුළු කර ගත්තා.

"මෙයාට නං ඉතිං පවුලෙ කවුරුවත් නාම හම්බවුණේ නැති හින්දයි කොහේ හරි හිටපු තැන කඩා වැටිච්ච එකෙයි මොක් එක වෙන්නැති. මං පුදුම වුණා එද ඔයා තමුන්ගෙ ගේ ඇතුළෙ ඇවිදලා බලන්නෙවත් නැතුව පිට කෙනෙක් වගේ බලා හිටිය විදියට. ඔයයි සාෂායි කොච්චර සන්තෝෂෙන් ද ඒ ගෙයි ප්ලෑන් එක මට පෙන්නුවෙ. මං මුලින්ම අලුත් ගෙට ආපු දවසෙ ඔයා මගේ අත අල්ලගෙන හැම තැනම ගියෙ රජනක් තමුන්ගෙ මාළිගාව පෙන්නනවා වගේනෙ. ඒ ගෙයි ඉතුරුවෙලා තියෙන බඩු ගැන බලන්නවත් ඔයා උනන්දු නැත්තෙ ඇයි? මේ මං දන්න වර්ණාසි නෙවෙයි."

ඒ ගෙදර හිටිය වර්ණාසි භූමිකම්පාවෙන් බේරුණාට අම්මගෙ මරණෙන් දවස් දෙකකට පස්සෙ මැරුණා කියන්න යැ. ඒ ගෙදර තිබුණු කිසි දෙයක් නුවරට ගේන්න උනන්දුවක් නොතිබුණාට අර දිනපොත් දෙක ගේන්න ඕන නිසා තව පොත් ටිකකුත් අම්මගෙ ඇඳුම් ටිකකුත් අරගෙන ආවා. ඒ පොත් දෙක ඇඳුම් අතරට තියලා අනිත් පොත් විතරක් ජනෙල් පඩියක තිබ්බා. ඒ දිනපොත් දෙක කියවන්න දුන්නා නං භාගයා මගේ නිශ්ශබ්දතාව තේරුම් ගන්නවා. එතකොට ඒ තුවාලෙ පාරන්නෙ නැතුව කතා කරන්නත් එයාට තේරෙන බව මං හොඳින්ම දැනගෙන හිටියා. ඒත් එයා මට වඩා ඒ ගැන කලබල වෙන බවත් මං දන්නවා.

"තමුසෙ මහ බල්ලෙක්" [illegible] මූණටම කියන්නත් බැරි නැහැ.

ඒක භාගයාට කීමෙන් එයාටත් අනවශ්‍ය තරහාවක් පිළිබඳ ඇති කරන්නෙ මොකට ද? සාෂා බොරු උපාධියක් ගත්තා වගේ මටත් වෙන අයටත් බොරු කියලා ඇති. ඒත් එයා කොච්චර නරක මිනිහෙක් උනත් මට ආදරේ කරන්නෙ බොරුවටම නොවෙයි කියන එකත් මගේ යටි හිතේ තිබුණා. සමහරවිට මුලදී බොරුවට රඟපාන්නත් ඇති. ඒත් පස්සෙ එයාට මගෙ ආදරේ විශාලකම ඉස්සරහා ආදරේ නොකර ඉන්නත් බැරි වෙන්න ඇතිනෙ. මිනිහෙකුට අවුරුදු හතක්ම රඟපාන්න පුළුවන් ද? එයා අනන්තවත් රඟපෑම් කරන්නත් ඇති. ඒවා සිද්ධ වෙන්න ඇත්තෙ අපේ අම්මටවත් හොයා ගන්න බැරි වෙච්චි මොකක් හරි හේතුවක් නිසා වෙන්න බැරි ද?

මං භාගයාගෙ අත් දෙක අරගෙන මගේ මූණෙ තියා ගත්තා. පුංචි කාලෙ ඉඳලා අපි දෙන්නා එකට ඉන්නකොට තීරණ ගත්තෙත් මගේ ආරක්ෂිකාව වුණේත් එයා තමයි. පෙනුමෙනුත් එයා වස මහතයි. ඒත් [illegible] මට හිතුණෙ මගේ දුක එයාට දීලා එයාවත් අසතුටට පත්කරන්නෙ නෑ කියන එකයි.

සාෂා එක්ක ජීවත් වෙන්නෙ කොයි විදියට ද කියන එකට උත්තර හොයා ගන්නත් පුළුවන් මට විතරනෙ. එයා අත් අරින්න තරම් හිතුණත් ඊට යටින් එයා නැතුව ජීවත් වෙන්න බැරි විදියෙ ආදරයකුත් තියෙන බව ඒ වෙනකොට මට හොඳටම තේරිලා තිබුණා. ඒත් එයාගෙන් ඒ පරණ කතාවත්, ඒක මට නොකීවෙ ඇයි කියන එකත් අහලා වෙන ගැනු පැටලිලි තියෙනවා නං තරහාවක් නැතුව ඒ ඕනම කෙනෙක් එක්ක ජීවත් වෙන්න ඉඩ ඇරලා මට අයින් වෙන්න ඉඩ දෙන්න කියන්නත් ඕනකම තිබුණා.

"ඔයා අයින් වෙන්නෙ මොකට ද? ඒවා නිකං පාරෙ තියෙන පයිප්ප විතරයි. තිබහටවත් නෙවෙයි නිකං කොල්ලකමට වතුර බීපුවානෙ." කියලා මිනිහා හිනා වෙන්නත් ඉඩ තියෙනවා.

මං හිතන්නෙ මට උවමනා වෙලා තිබුණෙත් ඒ විදියෙ උත්තරයක් වෙන්න ඇති. සමහර වීට එහෙම ලිස්සලා ගිහින්

බොහොම ආදර්ශණීය විදියට ඒක විසඳ ගන්නෙ නැතුව තමන්ගෙ ලැජ්ජාව මකා ගන්න විශාල තරහාවක් ඇති කර ගන්නත් බැරි නැහැ. එයා මගේ අම්මට ප්‍රතිචාර දක්වලා තියෙන්නෙ එහෙමනෙ. මාත් එක්ක තරහා ගන්නෙ නැතුවට පුංචි දේකට හරි එයාගෙ අදහසට විරුද්ධ දෙයක් කිව්වම ඒක පාරට එයා උච්ච ස්වරයෙන් කතා කරන වෙලාවලුත් තිබුණා. එතකොට හිනාවෙලා නිශ්ශබ්ද වෙන්න මට පුළුවන්කම තිබුණෙ එයාට තිබුණු අසීමිත ආදරය නිසානෙ. එයා වෙන අයට ටෙලිෆෝන් එකෙනුත් මුරාගෙන පනින වෙලාවට මං පිට අත ගාලා "කූල් වෙන්න" කියනවා.

"මියාට තේරෙන්න නෑ මේකොල්ලා මං කියන දේ අහන්නෙ නැතුව මාත් එක්ක වාද කරන්න එනවා." කියලා ටික වෙලාවක් පුපුර පුපුරා ඉන්නවා. එතකොටම පපුව අතගාලා පපුව මැද ඉඹලා එයාව හිනස්සනවා.

ඒ කඩා පනින ගතිය කොයි වෙලාවෙ හරි මට [illegible] වෙන්න බැරි ද? කවද හරි මං එයාගෙ [illegible] ප්‍රතික්ෂේප කරොත් [illegible] වෙන්න බැරි නැහැනෙ. එතකොට [illegible] පිට අතගාලා කූල් වෙන්න කියන්නෙ කොහොම ද? පපුව ඉඹින්නත් බැරි වෙයි. ඒක අහන්නෙ නැතුව ප්‍රියා ආන්ටි වගෙ මුළු ජීවිතේම රඟපාමින් ඉන්න මට අමාරු වෙයි. ඇත්ත නැත්ත අහලා එයාගෙ අදහස කියන්නත් අවස්ථාවක් දෙන්න එපා යැ. මං මොකටද අම්මා වගේ වෙන්නෙ? එයාගෙ ප්‍රතිචාරය මොනවා උනත් ඒකටත් මූණ දෙන්න හිත ශක්තිමත් කර ගන්න ඕනනෙ. ඒත් මිනිහෙක් අසරණවෙලා අත් කකුල් කැඩිලා ඉන්නකොට ඒවා අහන්න බැහැනෙ. ඒවා අහන්න වෙන්නෙ කවද හරි සනීප වෙලා සාමාන්‍ය ජීවිතය පටන් ගත්තාමනෙ. ඒ වෙනකොට ඒක අහන්න උවමනාව නැති වෙන්නත් බැරි නැහැනෙ. ඒක මොහොතක තදබල උවමනාවක් වෙන දේ සතියකින් දෙකකින් දෙවෙනි තුන්වෙනි වැදගත්කමක් තියෙන දෙයක් බවට පත් වෙන්න පුළුවනිනෙ.

මං කතා නැති නිසා භාගයා පොඩි එකීගෙ අතින් අල්ලගෙන වත්තෙ ඈතට ඇවිද්ද. මං බුදු පිළිමයක් නැති විහාරෙට ගිහින් බිත්තිවල බුද්ධ රූප බැලුවා. එතකොට තමයි යටම පේළියෙ ඉන්නෙ බුදුවරු නෙවෙයි එක එක වැඩ කරන ගිහියො කියලා

පෙනුනෙ. [illegible] බැරිගෙන බලන්න ඇත්තෙ ඒකයි. මාත් ඒම ඉඳ ගත්තා. යටම පේළියෙ ඉන්න කොටියා දෙවෙනි පේළියට එනකොට උපාසකයෙක්. සිල් රෙද්ද ඇඳලා වාඩිවෙලා හිටියට එයා ශ්‍රේෂ්ඨ වෙලා ඉන්නෙ ලොකු උද්දලකට. ඊළඟ පේළියේදි ඒ මූණම තිබුණොට උපාසකයගෙ ඉරියව්ව සන්සුන්. මූණත් නිවිලා. ඊළඟ පේළියේදි එයා පද්මාසනයෙන් ඉන්නවා. ඇස් පියවිලා. එයා වටේට බුටි නෙළුම්මල් රවුමක්. මය විදියට ඒක ඒක චක්‍රීන් නියෝජනය වෙලා සමහරු පස් මුදුවරු වෙන්නෙ පස්වෙනි පේළියෙදි. එතනින් එහාට බුදුවරු ඉන්න තැනුත් නැති තැනුත් තියෙනවා. නැති තැන්වල එක එක පාලක වතු, නෙළුම් මල්, පිච්ච මල් එහෙම ඇඳලා. බලු බැල්මට පේන්නෙ බුටි බුද්ධ රූප ගොඩක් වගේ උනාට පරීක්ෂාවෙන් බලනකොට පැය දෙක තුනක් හරි බලන්න දේවල් තියෙනවා. හැම කෙනෙක්ගෙම මූණ එකිනෙකාට වෙනස්. හැම තලයකදිම හැම කෙනෙක්ගෙම මූණ පහළම පේළියෙ හිටිය කෙනා බව අඳුනගන්න පුළුවන් [illegible] වෙනසකුත් තියෙනවා. ඒවා නං නිකම්ම [illegible] බිත්තියෙන් [illegible] පුළුවන් දේවල් නෙවෙයි. ඒක රූපික [illegible] නැහැ. ඒ උනාට ඒවා දිහා බලාගෙන ඉන්නකොට පණ තියෙන කෙනෙක් වගේ පෙනෙන්න ගන්නවා. විතුලතා මැණිකෙට ඒක කල්පනා වෙලා නැති වෙන්න බැහැනෙ. එයා ඒක කිව්වෙ නැත්තෙ උවමනාවෙන් ද? එහෙම දෙයක් කෙනෙක් ඇඟිල්ලෙන් ඇනලා පෙන්නන්නෙ නැතුව තමන්ම තේරුම් ගැනීමනෙ වටින්නෙ.

මං පැය තුනක් විතර බුදු කුටියෙ හිටියා. ඉර එළිය රවුමක් කුටිය මැද ස්වාභාවික ගල් ඔප මට්ටම් කළ පොළොවට වැටුණා. එතන පලිඟුවක් තිබ්බොත් දේදුණු වර්ණ හැදෙයි ද? මහ නිලමෙ පලිඟුව තියාගන්න ඇත්තෙ මොකක් හරි තේරුමක් ඇතුවනෙ.

සාගොත් අම්මං දන්න මිනිහාවත් මං දන්න මිනිහාවත් නොවෙන වෙන කෙනෙක් බවට පත් වෙන්න ඉඩ තියෙනවනේ. මිස් ආතම්මයි අම්මයි දකාගෙන හිටි දුවවත් සාගො දන්න සිරිදුවක්. භාගයා දන්න යාළුවාවත් නොවන කෙනෙක් බවට පත් වෙන්න පුළුවනිනෙ.

ඒ කුටියෙ මොකක් හරි අධ්‍යාත්මික බලයක් ක්‍රියාත්මක වෙනවා කියලා හිතන්න නං මං කැමති නැහැ. ඒ වුණාට බුද්ධ ප්‍රතිමාවක් හැටියට අල්ලන්න, මල් පූජා කරන්න, ගිලන්පස තියන්න යමක් නැති වුණාට බුදු ගුණ කියන්නෙ මොකද්ද කියලා හිතන්න පෙළඹෙන ගතියක් තියෙනවා.

"මෙයා මෙච්චර වෙලා මෙතන. එන්නකො අතින් ගන්න පුළුවන් ළිඳක් තියෙනවා. කලෙකින් එහෙම ළිඳකින් නැවෙ නැතෙ. අපි නාමුකො."

මගේ හිතේ තෙරපිලා තිබණු විෂ වායුවක් පිච්චිලා ගියා වගේ වෙලා උගුරෙ හිර ගතිය පපුවෙ තද ගතිය නැති වෙලා මං හිනා වුණා.

"හා අපි ළිඳෙන් නාමු" කියන එක පිටවෙනකල්ම මං දන්නෙ නෑ.

භාග්‍යාගෙ ඇස්වල කඳුළු බේරුණා. ඒළඟ මොහොතෙ එයා මාවත් ඇදගෙන ගල පහළට දිව්වෙ ඉස්කෝලෙ යන කාලෙ වගේම දඟ ගතියෙන්.

"දෙර වැනුවෙත් නෑ" කියලා මතක් කරාම ගෑනි ආයෙමත් ගලට නැග්ගෙ ඒ සෙල්ලම් ලීලාවෙන්මයි.

එච්චර දවස් කතා නොකර හිටියෙ ඇයි කියලාවත් සාෂා බලන්න යන්නෙ කවදද කියන එකවත් ඇහුවෙ නෑ.

අපි ගෙට යනකොට පොඩි එකී පාට කූරු පෙට්ටියක් තියාගෙන ලොකු සුදු කොළේක චිත්‍ර අඳිනවා. එච්චර දවස් එයාට ඒවා දුන්නට එයා ඇන්දෙ දුඹුරු පාට, කලුපාට ගෙවල් විතරයි. ඒත් එද එයා ළමයෙක් ඇඳලා දෙමළෙන් නමක් ලියලා ඊට උඩින් රතුපාට ගාමින් හිටියා. ඒත් භාග්‍යයි මායි දෙන්නම නමේ අකුරු දෙකක් දැක්කා. භාග්‍යා දෙමළ දන්නවා කියන එකවත් මට මතක් වුණේ නැහැ. "නීංග පේරු එන්නෙයි?" කියලා භාග්‍යා ඇහුවම පොඩි එකී ඉක්මනට රතුපාට ගාලා අකුරු වැහුවා.

අපි පොඩි එකීව තුරුළු කරගෙන ඔළුව ඉම්බා.

"මෙයා දෙමළ ළමයෙක්. ඒකයි බයටම කතා නොකර ඉන්න

ඇත්තෙ. අද හොඳ දවසක්. ඔයාව කතා කෙරෙව්වා වගේ මෙයාවත් කතා කරවන්න ඕන." කියලා දූරියට දෙමළෙන් කතා කරන්න ගත්තා.

භාග්‍යා පොඩි එකීට කියපු දේවල් මට සිංහලෙන් කිව්වා.

"ඔයා බයවෙන්න එපා රත්තරනෙ. අපිට දෙමළ යාළුවො ඉන්නවා. මට නං දෙමළ නෑයොත් ඉන්නවා. මගේ අඩියා කෙනෙක් බැන්දෙ යාපනේ විශ්ව විද්‍යාලෙ උගන්නපු දෙමළ කෙනෙක්වයි. ඔයා මෙච්චර දවස් කතා කරේ නැත්තෙ සිංහල දන්නෙ නැති හින්ද ද? බලන්න අපි ඔයාට කොච්චර ආදරේ ද? මේ ආන්ටිගෙ නම වර්ණාසි. මගේ නම භාග්‍යා. පුංචි කාලෙ ඉඳලා යාළුවො. මෙයා කොළඹ ආවෙත් ඔයාගෙ වයසෙදි විතර. ඊට කලින් මගේ පුංචි අම්මයි වර්ණාසිගෙ පුංචි අම්මයි හොඳම යාළුවො හින්දා මං නිවාඩු කාලෙට මේගොල්ලන්ගෙ ගෙදර යනවා. අපි සෙල්ලම් ගෙවල් දනවා. ඔංචිලි පදිනවා. ඉන්ඩකො අර වත්තෙ වැඩ කරන මාමාට කියලා ඔයාටත් ඔංචිල්ලාවක් බැඳලා දෙන්නංකො."

දූරිය කතා නැතුව බලා හිටියාට මූණෙ තිබුණෙ වැඩිහිටියෙකුගෙ කල්පනාකාරී පෙනුමක්.

"ඔයාගෙ ගේ තිබුණෙ කොහෙද? අපි ඔයාගෙ නෑයන්ගෙ නං දන්නවා නං ඒගොල්ලො කවුරු හරි ඉන්න තැනක් හොයා ගන්න පුළුවන්නෙ. ඔයාගෙ නමයි, අම්මා තාත්තාගෙ නමයි කිව්වොත් අපිට ඒ කවුරු හරි ගැන දැන ගන්න බැරිවෙන එකක් නෑ." භාග්‍යා මට පරිවර්තනය කරමින් දිගටම කතා කරා.

දූරිය අඬන්න ගත්තා. මං එයාව තුරුළු කරගෙන කඳුළු පිහදැම්මා.

"එහෙම නෙවෙයි භාග්‍යා මෙයාට කියන්න නෑයො මුණ ගැහුණත් මං එයාව මගේ දුව කියලා හිතාගෙන බලාගන්නං කියලා. එයාට ඒ කවුරු හරි හොයා ගන්න ඕන නැත්තං හොයන්නෙ නැතුව ඉන්නත් පුළුවන් කියන්න. එයා එක්ක කතා කරන්න ඕන හින්ද මං දෙමළ ඉගෙන ගන්නං කියන්න."

භාග්‍යා ඒ ටිකත් කියලා "බලන්න මේ ආන්ටි වර්ණාසිගෙ අම්මත් භූමිකම්පාවෙන් නැති වෙච්චි දුකට එයා මෙච්චර දවස්

කතා කරන්න [illegible] වුණාගෙන. ඒ සිත්ද අද මයත් කතා කරොත් ආන්ටි වර්ජිනියගෙ සිතේ දුක නොදුටම නැති වෙයි. මලන්න එයා මයාව මමගෙ ගේන්න අවසර ගන්නා වගේ එයා යන යන තැන මයාව එක්කන් යයි."

දූරිය ඇවිත් නැවැත්තුවා. ඊත් කතා කළේ නැහැ.

"එයාට කියන්න මයා ඉන්නෙ ඇමරිකාවෙ කියලා. එයා කතා කරොත් තවද නම් මටයි එයාටයි ඇමරිකාවටත් යන්න පුළුවන් කියන්න. අපිට ඉන්දියාවට යන්නත් ලේසියි කියන්න."

නාගයා ඒ පේරමත් තව දෙවලුත් සිව්වා. දූරිය මිම දිගාවෙලා මිම වාඩිවෙලා හිටිය මගෙ උකුලෙ මයව තියාගෙන ඇස් පියා ගත්තා.

"එයාට කරදර කරන්න එපා. තොටිමෙලාවෙ නම් එයා කතා කරයි." කියලා මං එයාගෙ මයව අතගාමින් හිටියා.

ඒ සිද්ධිය චිත්‍රලතා මැණිකෙට [illegible] අපි තීරණය කළා. අපි දෙන්නම උයන්න කම්මැලි [illegible] හිටිය නිසා [illegible] කිසිත් නාලා. දලදා මාලිගාවටත් ගිහින්, [illegible] කියලා නාගයා යෝජනා කළා.

"ඇයි ළිඳේ නාන්නෙ නැද්ද?"

"ඒක ගොට මැරිලා. කවුරුවත් ළිඳ උස්සන් යනවා. ඇ... නොදට නාලා [illegible] එකතුත් මලලා මේ දරුවගෙ සිත සන්තෝස වෙන දෙයක් කරලා එමු."

"මට එතනම ඇවිදින්න සිත නෑ. මය දෙන්නා සිහිං මටත් [illegible] නම් අරගෙන එන්න. උඩට [illegible] ඉදිරාපත් නම් [illegible]. මං ඒවා නාලා ඉන්නං. [illegible] මය හරං වෙලාවත් අරගෙන එන්න."

"සිත්න සිව්වා. මේ දරුවා වෙනුවෙන් එන්නගෙනෙ." සිව්වම මං සිහින් නාළේ දිගා වුණා. ඒක පුරාණ පරණ ඇඳක්. ඇඳ පිටිටමේ [illegible] ලීයෙක් [illegible] හිල්ලවලා තියෙනවා. චිත්‍රලතා මැණිකෙ [illegible] කියලා සිහිවුණා ඒක එයාගෙ [illegible] ඇඳ කියලා.

නාගයා පොඩි එකිව [illegible] එයා කතා කරල [illegible] මස්, අතිප්‍රීති, [illegible] කාලා එන්න යන්න පුළුවන් කියලා. දූරිය [illegible] මං ළඟ ලෑලි වුණා.

"නොදු මිනි වගේ මේ ආන්ටි වර්ජිනියගෙ දුක නැති වෙන්න එයාව වලුමට තොතියන්න උදව්කරන්න. මයා කතා කරොත් මං එයා එනවාමයි" කියලා නාගයා [illegible] මිට ඇත සතින් හිටියා.

"මේ දරුවට මගෙනම අමාරු නැතිවෙන් දන්නෙ නැතුව අපි නවතට එයා එක්ක ඇවිදින්න යන්න බලමු."

මගේ යෝජනාවට නාගයා එකඟ වුණා. නාගයා [illegible] සෝමලේකට ගිහින් [illegible] කොටට [illegible] මගේ කළුව උඩ මයව තියාගෙන හිටියා.

"දැං මිත්තං [illegible] තාමු." කියල මං නැගිට්ටා.

[illegible]

"අම්මයා සිත යන්නෙ මයා [illegible] වෙන්නැති"

"[illegible] නම් නැතුව ඇති. ඊත් මට [illegible] කතා කරන්න [illegible] තොටෙයි [illegible] දන්නවා. [illegible] වෙන්න මෙත් කරලා මං [illegible] අපි [illegible]."

"මටත් දෙමළ ඉගෙන ගන්න කියලා [illegible] පමණ කියා සිත්දම වෙන්නැති මං ඉගෙන ගන්න නැත්තෙ."

"අම්මාත් නම් නාගයත් ඉගෙන ගන්න එක අමාරු [illegible] [illegible] විතර ඉගෙන ගන්නකල් විතරයි. [illegible]"

කැඩෙන නැමෙන හැටි තේරෙන්න ගන්නවා. වචන මූල අඳුන ගන්නවා. ඒවාට අගින් මුලින් කෑලි එකතු වෙන රටාව අඳුන ගන්නවා. මට ඔයාට කියන්න බැරි වුණානෙ. භාෂා තිස් ගණනක් දන්න ප්‍රොෆෙසර් කෙනෙක් ඉන්නවා."

"එච්චර ගොඩක් ඉගෙනගෙන තියෙන්නෙ කොහොම ද?"

"එයා මුලන්ම කැතලික් ෆාදර් කෙනෙක්. සෙමනේරියෙන් පිටවෙනකොට ග්‍රීක, ලතින්, ඉංග්‍රීසි, ප්‍රංශ දැන ගත්තලු. එයාගෙ අම්මා වෙනිසියුලාවල. ඒ හින්ද පොඩි කාලෙ ඉඳලා ස්පාඤ්ඤ භාෂාව කතා කරාලු. තාත්තා පෘතුගීසි ඒ නිසා ඒකත් දන්නවා. පස්සෙ සමකාලීන ආගම් ඉගෙන ගන්න ගිහින් බෞද්ධ දර්ශනය ඉගෙන ගත්තලු. හවායිවල බෞද්ධ දර්ශනයට ඩොක්ටරේට් එකක් ගන්න නං ජර්මන් ඉගෙන ගන්නත් වෙනවා. ඒ පාර සංස්කෘත, පාලි, ජර්මන් ඉගෙන ගත්තලු. ඊට පස්සෙ ඉන්දියාවට ගිහින් හින්දි ඉගෙන ගෙන තියෙනවා. එතනින් පකිස්ථානෙ පල්ලියකට යන්න හදුගෙන උර්දු ඉගෙන ගත්තලු. හින්දි සංස්කෘත අහක් කරාම උර්දූවල තියෙන්නෙ පර්සියන්, පුෂ්තු වචනනෙ. ඒ නිසා පර්සියන් ඉගෙන ගත්තෙ තනියමලු. ඊට පස්සෙ ආයෙත් ඉන්දියාවට ගිහින් අනිත් ඉන්දියානු භාෂා, ගෝත්‍රික භාෂා ඉගෙන ගන්න හරිම ලේසි වුණාලු."

භාග්‍යා කිව්වා ඒ මනුස්සයා කතෝලික පූජකත්වය අත ඇරලා හින්දු දර්ශනය ඉගෙනගෙන ඉන්දියාවෙම පදිංචි වුණාලු. හැම අවුරුද්දෙම හය මාසයක් ඇමරිකාවෙ උගන්නනවලු.

"ඔයත් දෙමළ ඉගෙන ගන්න. මනෝ ආන්ටිගෙ ආසාව එයා මරුණට පස්සෙ හරි ඉටු කරන්න. ඒකෙන් ඔයාට ප්‍රයෝජනයක් වෙයි"

භූමිකම්පාවට කලින් නං මං එයාට කියන්නෙ "මට ඔය මොනම දෙයක්වත් ඉගෙන ගන්න බෑ. ඒවා සේරම සාෂා ඉගෙන ගත්තාවෙ. මගේ නිලය සාෂාගෙ වයිෆ් කියන එක විතරයි." කියලයි. ඒත් එද මං කිව්වෙ "ඒකත් නරක නෑ" කියන එකයි. ඉබේම එහෙම උත්තරයක් පිට වුණේ සාෂාගෙ බිරිඳ කියන නිලයට වැඩි යමක් කාටවත් ගන්න බැරි නැති කරන්න බැරි මොකක් හරි දෙයක් උවමනා වෙලා තිබුණු හින්ද ද?

අපි නාලා එනකොට චිත්‍රලතා මැණිකෙ තම්බපු කොස් දිසියක් දුන්නා. සාෂා, භූමිකම්පාව සේරම වෙන කාට හරි වෙච්ච දෙයක් ද? හරියට මං පුංචි කාලෙ ඉඳලා එහෙ හිටියා වගේ දැනෙන්න ගත්තා. කොස් දිසියක් කොහොම ද එච්චර දෙයක් කරන්නෙ? ඒක ආතම්මගෙ සංකේතයක් ද? එහෙම නං කොස් ගස් අර නිලට නිලේ වතුර උතුරලා යන ළිඳ, ඒ වත්ත පුරා පිපුණු මල්වලින් සංකේත වෙන්නෙ මොනව ද?

එතකොට මම?

සාෂා?

කතා නැති දූරිය?

චිත්‍රලතා මැණිකෙ?

භාග්‍යා?

වත්තෙ වැඩ කරන මනුස්සයා?

චිත්‍රලතා මැණිකගෙ වලව්වෙ කුස්සිය පැත්තෙම ඉන්නවා වගේ පෙනෙන වයසක අම්මා?

ගේ සුද්ද කරන්න, රෙදි හෝදන්න යන එන මැදිවියේ ගෑනු?

ඒ නම් දන්න අයත් නම් නොදත් අයත් මට තේරුම් ගන්න බැරි දෙයක සංකේත නං ඒ නම් වලින් හැඟවෙන්නෙ මොනව ද? ඒවා රෝස මලකට නිදිකුම්බා මල නැත්තං කොස්ගහකට දෙල් ගහ කියන විදියට සම්මත කරලා ගැසට් නිවේදනයකින් නීතිගත කරොත් ඒක එහෙම වෙන්න පුළුවන් වගේ දෙයක් ද? සාෂාට ඒ නම දීලා තියෙන්නෙ මගේ අම්මානෙ. ගේල් එයාට දීපු නම වෙන එකක් වෙන්න ඇතිනෙ. මං එයාට ආදරේට කතා කරන්නෙ සා කියලයි. මගේ සා කියන ස්වරය සංකේත කරන්නෙ විශාල ආදරයක්නෙ. එහෙම නං වචන සංකේත කරන්නෙ හැඟීම් ද? හැම වචනෙම එහෙම වෙන්නෙ කොහොම ද? මේ දන්න නම් අහක් කරාම ඒවා අයිති අය කවුද?

නම නැතුවත් ශරීර තියෙනවනෙ. ඒ ශරීර කවුරු කවුරුද?

මං මේ මොනවද හිතන්නෙ? මේවා භාග්‍යාට කිව්වොත් එයා බය වෙයි ද? අම්මාගෙ පාපොච්චාරණයෙ ලියලා තියෙන්නෙ:

"වර්ණාසිට තමා ප්‍රශ්න කරන්නට නො හැකිව තිබෙන්නේ ඇගේ අහිංසක අවංකකම නිසා විය යුතු ය. ඇයට කිසිවක් ප්‍රශ්න කරන්නට දන්නේ නැත. ඒ මගේ වරද ද? මාත් අම්මාත් ඇය ලොකු මහත් කළ ආකාරයේ වරදක් ද?"

අම්මා කියන දේ ඇත්ත. මං කිසිම කෙනෙක් ගැන සැක කරන්න දනගෙන හිටියෙ නැහැ. මං හිතුවෙ හැම කෙනෙක්ම මං වගේම කියලනේ. ඒත් දූත් මේ මොකද වෙලා තියෙන්නෙ? පමණ ඉක්මවා ප්‍රශ්න කරනව ද?

ගස් අතරින් ගැරඬියෙක් ඇදීගෙන ගියා. පොඩි එකී මගේ ඇඟේ එල්ලුණා.

"බයවෙන්න එපා පුතේ. ගැරඬියා අහිංසකයි."

මං කියපු දේ භාග්‍යාට දෙමළෙන් කියන්න බැරි වුණේ ගැරඬියට කියන නම මතක නැති වෙච්චි හින්දයි.

"මේක හරියන්නෙ නෑ. අපි මෙයාට ඉංග්‍රීසියි සිංහලයි එකටම උගන්නන්න ඕන. එයා කතා නොකරත් අපි හැමදේටම වචන කියලා දෙන්න ඕන." භාග්‍යා එහෙම කියලා එවෙලෙම වැඩේ පටන් ගත්තා.

"අර ගැරඬියා."

"මේ ඇන්තූරියම් මල්"

"මම භාග්‍යා නැන්දා. මේ වර්ණාසි නැන්දා. අර පඩි නගින්නෙ චිත්‍රලතා අම්මා."

භාග්‍යා දිගටම කියාගෙන ගියා. මං බලාගෙන හිටියෙ පොඩි එකීගෙ මූණ දිහා. ඒක හිස් කරදාසියක් වගේ නෙවෙයි. යමක් ග්‍රහණය කර ගන්න බව ඇස් දෙකෙනුත් මූණෙනුත් පෙනුණා. එද හවස භාග්‍යා පොඩි එකී එක්ක දළදා මාළිගාවට ගියා.

"අපි වැව රවුමෙ ඇවිදලා, මාළුන්ට පොරි දලා, කොහෙන් හරි චොක්ලට් කේක්, අයිස්ක්‍රීම් කාලා හෙමින් ඇවිදගෙන එන්නෙ. හිත වෙනස් වුණොත් ඒ පැත්තෙ එන්න. මෙහෙම ගෙට වැදිලා ඉන්නෙ මොකට ද?"

භාග්‍යා පිටවෙන්න ගිහින් ආයෙ ඇවිත් අවසාන වතාවටත් මාව ඇදගෙන යන්න උත්සාහ කළා. ඒත් මං කිසි උත්තරයක් නො බැඳ ජනේල ළඟට වෙලා පිටත රෝසමල් පඳුරු අතර දලක් වියන මකුළුවෙක් දිහා බලාගෙන හිටියා. ඔච්චර මහන්සිවෙලා දලක් වියන්නෙ එද දවසෙ කෑම ටික හොයා ගන්නනෙ. ඌට අවශ්‍ය ප්‍රමාණයට වඩා සත්තු පැටලුණොත් පහුවෙනිදට කන්න තියා ගන්නවද දන්නෙ නෑ.

මිනිස්සුත් කොච්චර පොහොසත් උනත් කන්න බොන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවනෙ. ඒ ප්‍රමාණයෙ රසය, ගුණය වැඩි කර ගන්න උත්සාහ කරනකොට වෙනත් දේවල් නිෂ්පාදනය කර ගන්න වෙනවා. ඒවායෙ විවිධත්වයක් ඇතිකරගන්න හිතෙනවා. අවශ්‍යතා සරල සන්තර්පනයෙන් එහාට යනකොට අපි දන්නෙම නැතුව අපේ දැල් වියන්න ගන්නවා. ඒවායෙ පැටලෙන ප්‍රධාන ගොදුරත් අපිමයි.

මං හිතමින් හිටියෙ වෙන කෙනෙක් වගේනේ. ඒ වගේ අදහස් කියන්නෙ ඒ දෙන්නාමනෙ. ඒත් අම්මා හැමදේම කොච්චර හොඳට විග්‍රහ කරත් දැලෙන් බේරෙන්න දනගෙන හිටියෙ නෑ. අම්මාගෙ දැල අතිරික්ත ධනය නෙවීම වුණේ මට තියෙන ආදරය හින්දනෙ. අපි දරුවෙකුට හරි ආදරෙයි කියන්නෙ තම තමන්ට තියෙන ආදරේම පිළිබිඹුවක් ද? නැත්තං ඒ ආදරේ මත්තෙ නැහෙන්න හදන්නෙ මොකට ද?

මම අම්මගෙ දුව නොවී එයාගෙ අම්මා වුණා නං මට මනෝරම්‍යා වගේම සාක්ෂාත් දරුවෙක් වගේ දැනෙනවනෙ. එහෙම වුණා නං මේ වගේ වෙලාවක මට සාෂා ළඟ ඉඳන් සාත්තු කරන්නත් තිබුණා. භාර්යාවයි, පෙම්වතියයි කියන තනතුරු දෙකෙන් මිදුණාම තරක මිනිහෙක් උනත් දරුවෙක් වගේ බාර ගන්න පුළුවන් වෙන්න ඉඩ තියෙනව ද?

මං බිම ඉඳගෙන පොඩි එකීට තෑගි ලැබිලා තිබුණු කාර්වලින් සෙල්ලම් කළා. පොඩි කාලෙවත් කාර් සෙල්ලම් නො කළ මං ඒ වැඩෙන් සතුටක් ලැබුවා. චිත්‍රලතා මැණිකෙ හෙම ආවා නං බයවෙනවා. කොළපාට ඩිංකි කාර් දෙකකුයි රතු පාට කාර් එකකුයි

එක්ක පෙල්ලම් කරන්න මඟ ගෑනියෙකුට හිතෙන්නෙ මානසික රෝගී ගතියකින් ද?

රෝගී ගතියක් නෙවෙයි. ළමයෙක් වගේ වීමේ අහිංසක සතුට එක විදියක ප්‍රතිකාරයක් වගේනෙ. තරක තාත්තෙකුට උනත් ආදරය කිරීමේ උවමනාව ළමයෙකුට දැනෙනවා. තරක පුතෙකුට උනත් අම්මෙක් ආදරය කරනවා. තරක ස්වාමි පුරුෂයෙක් එක්ක ජීවත් වෙන්න තං ගෑනියෙකුට වෙලාවකට ළමයෙක් වෙන්නත් අම්මෙක් වෙන්නත් සිද්ධ වෙනව ද?

ඒ දවස්ල සාෂා කෙටි පණිවිඩ කීපයක්ම එවලා තිබුණා. හැම එකකම තිබුණෙ "ආදරෙයි. පරෙස්සම් වෙන්න" හාගෑ හිතාගෙන හිටියෙ මං ඒවාට උත්තර යවනවා ඇති කියලයි.

"ඔයා පරෙස්සම් වෙන්න. නුවර ආවට පස්සෙ මට බයක් නෑ" කියලා ලියන්නවත් හිත හදගන්න බැරි වුණා. රතු ඩිංකි කාර් එක පඩියෙන් පෙරළිලා පිටට වැටුණා. එවෙලෙ සාෂා කෙටි පණිවිඩයක් එව්වා.

"මගේ සිද්ධේශ්වරි පරෙස්සම් වෙලා අපේ ඊශ්වරයාත් පරෙස්සම් කර ගන්න."

අපේ ඊශ්වරයා මගේ කුසය අත ඇරලා ගියා. එතකොට මට අඬන්නවත් බැරි වුණා කියලා ලියන්නෙ කොහොම ද? මං දොර වහන්නෙත් නැතුව මිදුලට බැහැලා ගල උඩ විහාර කුටියට ගියා. අඹ අත්තක හිටිය ගිරව් තුන් දෙනෙක් මං හෙමින් ගල් පඩි නගින හැටි බලා හිටියා.

මගේ පණයි ගිරවුන්ගෙ පණයි කියලා වෙනසක් නැහැනෙ. ගිරවුන්ටයි මටයි පොදු සාධක කීයක් තියෙනව ද? ඒ පොදු සාධකවල මහා පොදු සාධකය මොකද්ද? ආතම්මා ගණන් උගන්නනකොට වගේ ගණිත චක්‍රයක් නැති උණාට ප්‍රාණය කියන්නෙ ඒ මහා සාධකයට තේද කියන එක හිතෙන්න ගත්තා.

විහාර කුටියට පහළ සිනිඳු කළු ගල් ආසනයෙ ඉඳගෙන හැන්දෑ අහසෙ රෝස පාට රන්වන් පාට වළාකුළු දිහා බලාගෙන ඉන්නකොට ගිරවුන්ගෙ කල්පනාවත් මැකිලා ගියා. මං ප්‍රාණය කියලා හිතපු දේ අහසෙත් තියෙනවා වගේ දැනුණා. වළාකුළුවලින්

මිනිස්සු, අස්සයො, බැටළුවො, කරත්ත වගේ එක එක දේවල් මැවිලා ඒවා ඉක්මනින් වෙනත් හැඩ ගත්තා. අස්සයො මිනිස්සු වෙන හැටිත් මිනිස්සු අස්සයො වෙන හැටිත් මහේ බලා ඉන්න පුළුවන්. පුංචි කාලෙ අම්මා ගෙනත් දීපු සිබිල් හැන්දගෙ පොතක එයාගෙ ගමේ ගෙදර මිදුල ඇඳලා තිබුණා. ළමයෙකුට ඒ මිදුල දිහා හුඟාක්වෙලා බලා ඉන්න පුළුවන්. එතකොට ඒ පොල්ගස්, කොස් ගස්, මල් ගස් ළඟ ඉන්නෙ තමන් වගේ දැනෙනවා. ඒ හැන්දෑවෙ මට දැනුණෙ මං අහසෙ වළාකුළු අතර ඉන්න පුංචි ළමයෙක් වගෙයි. එවෙලෙ සාෂා ගැනවත්, අම්මා ගැනවත්, භූමිකම්පාව වෙච්චි හැටිවත් හිතට ආවෙ නැහැ. අහසයි මමයි එකට හුස්ම ගන්නවා වගේ වුණා. රෝස පාට, රන්වන් පාට වළා කැටිති විසිරෙන්නෙ අහසයි මමයි හුස්ම ගන්නකොට වගේ දැනෙන්න ගත්තා.

අපේ අම්මා වගේ විභාග පාස් නොකරපු හින්ද විශාල සමාජ ජීවිතයකට නිරාවරණය නො වුණු හින්ද වෙන්නත් ඇති මට එච්චර ලේසියෙන් ළමයෙක් වෙන්න පුළුවන් වුණේ. සුරංගනා කතාවල ඉන්න මායාකාරියෙක් වගේ නහය දිග රූපයක් මවාගත්තු වළාකුලක් රෝස පාට අත ඇරලා රතු පාට වුණා. ඒත් තිම්බයකින් නහය දියවෙලා තාපස රූපයක් මැවුණෙ දිග රැවුලකුත් එක්කමයි. මගේ හුස්ම අහසෙ පින්තූර අඳිනවා වගේ දැනෙන්න ගත්තා.

අහසයි මමයි හුළඟයි එකට එකතුවෙමින් තිබුණා. මං දන්නෙ නෑ එතන කොච්චර වෙලා හිටිය ද කියලා. අහසෙ චිත්‍ර මැකිලා අඳුරු තීන්ත හැලුණා. මගේ හුස්ම ඒකටත් දයක වුණා. ඊළඟට තරු කැට දිළිසෙන්න ගත්තෙ එක පාරටම අහස් වියන මාරු වුණා වගෙයි.

දවල්ටත් තරු තියෙනවා. ඒත් අපට පේන්නෙ නෑ කියලා දවසක් සාෂා කියලා තිබුණා. එහෙම තං අහස වෙනස් වෙන්නෙ නෑ. තරු පෙනීමයි නොපෙනීමයි ඇති කරන්නෙ පෑථිවියේ භ්‍රමණය ද? එතකොට පෙනීම ඇති කරන්නෙ කොතනින් ද? ඇස් තිබුණත් අපිට කොච්චර දේවල් පෙනෙන්නෙ නැද්ද? දැනෙන්නෙ නැද්ද? ඇස්වලට පෙනීමත් හිතට තීක්ෂණ නුවණත් එන්නෙ කොහොම ද?

මදුරුවෝ කැරකෙන්න ගත්තා. එක මදුරුවෙක් කණ ළඟ කැරකෙමින් ඉඳලා නහයටත් රිංගන්න හැදුවා. මං එහෙම හිතුවට ඇතුළට ගත්තු හුස්මත් එක්ක මදුරුවත් ඇදිලා ආවා වෙන්න ඇති. ඒත් මදුරුවෝ මාව විහාර කුටියට තල්ලු කළා.

බිත්තිය අත ගාලා විදුලි බොත්තම් හොයා ගත්තා. බිත්තියට හයි කරලා තිබුණු විදුලි පංකා දෙකක් ක්‍රියාත්මක කරලා ආයෙමත් විදුලි ආලෝකය නිවලා දැම්මා. බිත්තියෙ එක කොණක තිබුණු ගලෙන් බැඳපු ආසනය උඩ වාඩිවෙලා පිටත හුළඟෙ හඬ අහගෙන හිටියා. හුළඟට සංගීතයක් තියෙනවා කියලා ඉස්සර අම්මා කියනවනෙ. මහ ගෙදරදි අපි රෑට ඒ සංගීතය අහගෙන ඉන්නවා.

"හුළඟ රබර් ගස් එක්ක සිංදු කියනවා." අම්මා ජනේලේ ළඟට ගිහින් අන්ධකාරය දිහා බලාගන කියන හැටි මට ඇහෙනවා වගේ දැනුණා.

නුවර වත්තෙ රබර් ගස්වත් එතන අම්මාවත් නැති උනාට හුළඟ ඇත්තටම සිංදු කිව්වා. හිතේ වෙන කිසිම දෙයක් නැතුව හුළඟ ගැන විතරක්ම හුළඟ-හුළඟ කියලා හිතමින් ඉන්න පටන් ගත්තෙ ඇයි කියල දන්නෙ නෑ. ඒත් මට ඕන වුණා හුළඟ තේරුම් ගන්න. හුළඟේ බස අඳුනා ගන්න. ඒවා මගේ අදහස් නෙවෙයි. අම්මා කාලයක් කියූ දේවල්වලට ප්‍රමාදවෙලා ප්‍රතිචාර දැක්වීමක් විතරයි.

චිත්‍රලතා මැණිකෙගෙ අප්පච්චිත් ඒ කුටියට වෙලා ඒ වගේ දේවල් කරන්න ඇති. ඒක ඇතුළෙ හරියට මොකද්දෙ අමුතු ශක්තියක් කැරකෙනවා වගේ දැනුණා. සමහර විට ඒ ගොඩනැගිල්ල හදලා තියෙන තාක්ෂණය අනුව එහෙම දැනෙනවා ඇති.

තනිකම ශෝකයක් නෙවෙයි සුවයක් වෙමින් තිබුණා.

"අනේ මේ මොකද මෙතන තනියම? මං හිතුවෙ දොර වහන්නත් මතක නැතුව ටවුම පැත්තට යන්න ඇති කියලයි."

භාග්‍යාගෙ හඬ වෙන ලෝකයකින් වගේ ඇහුණා. විදුලි ආලෝකය විසිරෙනවා දැනුණා. ඇස් වහගෙන හිටි නිසා එක පාරට ඇස් අරින්න බැරුව මං ඇඟිලිවලින් ඇස් වහගත්තා. පොඩි එකී උකුලට පැනලා මාව බදාගෙන ඇඬුවා. මගේ ඇඟිලි ඇස්වලින්

අහකට ඇද්දෙත් පොඩි එකී තමයි.

"මේකෙ ලයිට් එක පත්තුවෙලා තිවෙනවා දැක්කෙ නැත්තං අපි බයේ ඉන්නවා. චිත්‍රලතා මැණිකෙට කියන්නත් බෑ. එයා බය වෙනවනේ."

පොඩි එකී එක පාරට දෙමළෙන් මොනවද කිව්වා. ඒ කොහෙත්ම බලාපොරොත්තු නොවෙච්චි දෙයක් නිසා භාග්‍යාටත් එක පාරට තේරුණේ නෑ.

"ඇයි පුතේ ඔයා මොකද්ද කිව්වෙ?"

එයා ආයෙමත් කතා කළා.

"එයා අහනවා එයා කතා කරන්නෙ නැති නිසා තරහාවෙලා එයාගෙ රතු කාර් එකත් එළියට විසි කරලා ආවාද කියලා. එයා හිතුවලු ඔයා බෝම්බෙකට අහුවෙලා මැරිලා කියලා."

භාග්‍යාටත් කඳුළු වැටුණා. අපි තුන්දෙනාම මොහොතක් කතා නැතුව හිටියා. භාග්‍යාත් මා ළඟින් ඉඳ ගත්තා.

"නම මොකද්ද පැටියො?" භාග්‍යා සිංහලෙනුත් ඉංග්‍රීසියෙනුත් දෙමළෙනුත් ඇහුවා.

"පරමේශ්වරී"

"එයාට කියන්න කිසි දේකට බය වෙන්න එපා අපි එයාට පණ වගේ ආදරෙයි කියලා."

පොඩි එකී මාව බදාගෙන අඬමින් එයාගෙ කතාව කිව්වා.

"අපි හිටියෙ කිලිනොච්චියෙ. මගේ අයියලා තුන්දෙනාම මැරුණා. ලොකු අයියා එල්.ටී.ටී.ඊ එකෙන් පැනලා ගියා කියලා දෙවෙනි අයියාව ගත්තා. ලොකු අයියාව මරලා තිබුණා. හමුදාවෙන් මැරුවා කියලයි කිව්වෙ. දෙවෙනි අයියට බෝම්බ වැදුණා. තුන්වෙනි අයියා බෝම්බ වලලපුවා ගොඩ ගන්න රස්සාවට ගියා. එයා ආවෙ නෑ. නයෙක් ගහලා. මගෙ අම්මා මට කිව්වා පුංචි අම්මා එක්ක කොළඹ ගිහින් ඉන්දියාවට යන්න කියලා. පුංචි අම්මා සිංහල ඉගෙනගෙන තිබුණා. ඉංග්‍රීසිත් දන්නවා. පුංචි අම්මයි මමයි හිටියෙ වැල්ලවත්ත කියන පැත්තෙ. පුංචි අම්මා කොම්පියුටර්

පන්නි ගියා. මාව කාමරේ තියලා දොරවහලා යනවා. ඒ ගෙදර තව හුඟක් කට්ටිය හිටියා. මාව ඉස්කෝලෙකට දන්නයි හිටියෙ. ඉන්දියාවට යන්න සීල් ගහන්න ගියා. පෝලිමේ හිටියා. සීල් ගැහුවෙ නෑ. ගෙවල් කැඩුණ දවසෙ පුංචි අම්මාගෙ අඳුරණ සෙල්වන් හිටිය දිහාවට ආවා. එහෙ නිදගෙන ඉන්නකොට තමයි ගේ කැඩුණෙ. මං නැගිටලා හිටියෙ. බංකර් එකට ගෙනියන්න කියලා මං කෑ ගැහුවා. පුංචි අම්මයි සෙල්වනුයි පේන්න හිටියෙත් නෑ. බිත්තියක් කැඩිලා වැටුණාම මං එළියට පැන්නා. උදේ මිනිස්සු එනකොට මට බය හිතුණා. දෙමළ කියලා දැන ගත්තම මරයි කියලා හිතුවා. මං හිතුවෙ රෑ ලොකු යුද්ධයක් වෙලා සෙල්වනුයි පුංචි අම්මායි ඒකට ගියා කියලයි. මං ඒ ගේ ළඟ ඉන්නෙ නැතුව වෙන ගෙයක් ළඟ ඉඳගෙන හිටියා. කතා කරන්න බැරි ළමෙක් වගේ හිටියෙ නැත්තං මරයි කියලා හිතුවා"

"පස්සෙ ඇවිදගෙන ගියා. එතකොට කව්ද වතුර දුන්නා. තවත් ඇවිද්ද. දවල් කවුරු හරි ඉන්න තැනකට ගියාම කන්න ලැබුණා. පෝලිමක ඉඳලා හාල් ගත්තා. මං හිතුවා අමු හාල් කැඩුණ ගෙයක හංගලා තියලා බඩගිනි උනාම කන්න පුළුවන් කියලා. එතකොට තමයි කර්නල් සුභාෂ් මාමාට හම්බ වුණේ. එයා දෙමළෙනුත් කතා කරා. මං දන්නෙ නෑ වගේ හිටිය හින්ද තමයි වර්ණාසි නැන්ද ළඟට එක්කන් ආවෙ."

පරමේශ්වරී ඒ කතාව කිව්වෙ ඔය විදියට එක දිගට නෙවෙයි. භාග්‍යා බොහොම ආදරෙන් ප්‍රශ්න අහලා දැන ගත්තු කතාව ඕකයි.

"අපි ඔයාට ආදරෙයි" කියලා අපි දෙන්නම පුන පුනා කිව්වා.

"අනේ මාව කාටවත් දෙන්න එපා." කියලා කෙල්ල මාව බදගෙන හිටියා.

"කිලිනොච්චියෙ ඉන්න අම්මා තාත්තා ළඟට යන්න ආසා නැද්ද?" භාග්‍යා ඇහුවා.

"ඒ අම්මා මගේ අම්මගෙ නෑදෑ කෙනෙක්. මගේ අම්මා මං පුංචි කාලෙ කොළඹ ඇවිත් මැරිලා."

අපි පොඩ්ඩිට කිව්වා සිංහල ඉගෙන ගන්නකල් ඒ විදියටම කතා කරන්න බැරි විදියට ඉන්න කියලා.

"අපි ඔයාට නමක් දෙන්නං." භාග්‍යා කිව්වා.

"ඔයාට මෙත්තා කියලා කියන්නං. මීට පස්සෙ ඔයා මෙත්තා පෙරේරා."

මං දීපු වාසගමට භාග්‍යා කැමති වුණේ නෑ. මං කිව්වා පෙරේරා වඩාත් ආරක්ෂිතයි කියලා. අන්තිමට එයා එකඟ වුණා. ඒත් එයා කතා කරන්න පුරුදු වෙනකල් ඒ නම පාවිච්චි කරන්න වෙන්නෙ නැහැනෙ.

"අප එයාට හෝඩිය උගන්නත් ඉස්සෙල්ලා මෙත්තා පෙරේරා කියලා ලියන්න උගන්නමු" කියලා භාග්‍යා ඒ රාත්‍රියෙම ඒ නම ලියලා ඒක පුරුදු කළා. කෙල්ල නින්දට වැටුණෙ මෙත්තා කියලා ලියපු සුදු කරදාසියක් කොට්ටෙ යට තියාගෙනයි.

මෙත්තා නිද ගත්තට පස්සෙ අපි දෙන්නා සෑහෙන වෙලාවක් කතා නැතුව බලා හිටියා. මේ දරුවා අරගෙන කොළඹ ආවෙත් එයාගෙම පුංචි අම්මා නෙවෙයිනෙ. දරුවා බෝම්බෙකට පාවිච්චි කරන්න ද? යුධ පරිසරයක හැදෙන ළමයි ඉක්මණට මුහුකුරා යනවනේ. ඒ හින්ද අපිට නො කියපු කොටසකුත් හංගගෙන ඉන්නවා වෙන්න පුළුවන්. ඒත් කවද හරි එයා වෙනස් වෙන්න බැරි නැද්ද? අනිත් එක එහෙම දරුවෙක්ගෙ ඇත්ත කතාව වසන් කිරීම බොහොම බරපතල කාරණයක්නෙ.

"මාව දලා යන්න එපා." දරුවා නින්දට යනකොටත් කිව්වෙ එහෙමයි.

එයාට ඒ කතාව කියවුණේ එයාට ආදරේ දීපු මාත් නැති වෙයි කියන බයටනෙ. දරුවා පොලීසියකට හමුදවට බාර දෙන්න යෑ. රතු කුරුසෙට, යුනිසෙෆ් එකට කිව්වත් වෙන්නෙ අනාථ නිවාසෙකට යැවෙන එකයි. දරුවා තියා ගන්න හිතන එක වරදක් ද?

අපි දෙන්නම දැනගෙන හිටියා දෙන්නගෙම හිත්වල තිබුණෙ එකම අදහස කියලා. පුංචි කාලෙ භාග්‍යා අපේ ගෙදර ආවම ආත්තම්මයි, මමයි, එයායි තුන්දෙනාම ඉස්තෝප්පුවෙ ඉඳගෙන හිතේ තියෙන දේ කියන සෙල්ලම කළේ එකිනෙකාගෙ ඇස්වලට එබීගෙන ඉඳලයි. එද මූණවල් බිමට හරවගෙනම අපි එකම දේ

හිතුවා.

"පුංචිකමට මෙයාට තියන කල්පනාවෙ හැටියට ලොකු උනාම මොනවා කරයි ද කියලා කව්ද දන්නෙ?" අන්තිමට භාග්‍යා හරි අමාරුවෙන් ප්‍රශ්නයක් මතු කළා.

"එයා ලොකු වෙනකල්ම මේ යුද්දෙ නවතින්නෙ නැති වෙයි ද? දැන් මේ සටන් විරාමෙයි සාම කථායි දිගට දිගට යන්න පුළුවන් දෙයකුත් වෙලා තියෙද්දි මේ පාර ඔය ප්‍රශ්න ඉවර වෙයිනෙ."

"සුනාමියෙදිත් මිනිස්සු ඔහොම හිතුවනෙ."

"මේ පාර යුද්දෙ නැතුවත් දෙගොල්ලොම වැටුණානෙ. මේකවත් මදි ද?"

"මාත් කැමතියි ඒක එහෙමම වෙනවානං. එහෙම වෙයි කියලා සුභවාදිව හිතමු."

"අපි මෙයාව ළමයෙක් කරමු. එයා බෝම්බයක් වෙන්න නියම වෙලා හිටියා නං එයා ආත්මෙන්ම ළමයෙක් කරන්න හුඟක් ආදරේ දෙන්න වෙයි. අපේ ආච්චම්මයි අම්මයි දෙන්නම මට ආදරේ කරා වගේ ආදරේ දෙන්න මට බැරි වෙන එකක් නෑ."

ඊද ඊ. සාෂා තව කෙටි පණිවිඩයක් එවලා තිබුණා එයාට හුඟක් සනීප නෑ භාග්‍යාට කතා කරන්න ඕන කියලා. ඒත් මං ඒක භාග්‍යාට පෙන්නුවෙ නැහැ.

"ඇයි ඔයා එයාට කතා කරන්නෙ නැත්තෙ?" කියලා අහන්න විතරක් නෙවෙයි "වචන කතා කරන්න ගන්න එකම ලොකු දෙයක්" කියලත් කියයිනෙ.

මං සාෂාට උත්තර බැන්ද,

"මොකද්ද අසනීපෙ?"

"ඇති යන්තං ඔයාගෙන් උත්තර ලැබුණා. මං ඔයා ගැන බයේ හිටියෙ. ඔය විදියටම කතා කරන්නත් පුළුවන් වෙයි. මගේ වකුගඩු දෙකම අහක් කරන්න වෙලා. සල්ලිවලට හරි එකක් හොයා ගන්න වෙයි. භාග්‍යාටයි ප්‍රියාටයි කියන්න. චන්දිමටත් කිව්වා. එයත් කාව හරි හොයනවා. ඔයා බය වෙන්න එපා. මං මැරෙන්නෙ නෑ."

ඒක භාග්‍යාට නොදී ඉන්නෙ කොහොමද? ඒක එවෙලෙ දුන්නායි කියලා එයා ඒ මොහොතෙම වකුගඩුවක් හොයා ගන්න යෑ. ඒක දෙන එක උදේට කල් දාලා මම ඇඳේ දිගාවෙලා හිටියා.

සාෂා හොඳටම අසරණ වෙලා ඉන්නකොට පිටුපාන්නෙ කොහොමද? අනික් එක පරමේශ්වරීව මෙන්නා පෙරේරා බවට පත් කරගෙන රැක බලා ගන්න හිතනවා නං ඒ ආදර කරුණාව සාෂාට දෙන්න බැරි මොකද?

ස්වාමිපුරුෂයා, පෙම්වතා, මිත්‍රයා විතරක් නෙවෙයි සහෝදරයා කියලා හිතුවත් කාටත් ඉතුරු වෙනවා. ඒත් අම්මා මට ආදරේ කරා වගේ කාට හරි ආදරේ කරනවා නං කාටත් නැතුව පරණ තාඩුවලින් මිඳුව පුරව ගන්නෙ නැතුව සජීවනය පවත්ත ගන්න බැරි ද?

මෙන්නාට වගේම සාෂාටත් දරුවෙක් හැටියට සලකන්න බැරි ද?

එයා එක්ක මැරෙනකල් එකට ඉන්න බලාපොරොත්තුවක් නැතුව උනත් ඇයි එයාට වකුගඩුවක් දෙන්න බැරි? චන්දිමත් අපි ලේ පරිත්‍යාග කළ වෙලාවක එයා කිව්වා අපි දෙන්නාම ඕ පොසිටිව් කියලා. එන්නතක් විදිනවටත් බය මං කොහොමද ගැලපීම බලන මූලික පරීක්ෂණ වලට මූණ දෙන්නෙ?

වේදනාවට බය වෙන්නෙ මොකට ද? සුනාමියෙන් පස්සෙ කොච්චර නං වේදනාවල් විඳින මිනිස්සු දැක්ක ද? විශාල ආදරයකින් යමක් පරිත්‍යාග කරනකොට වේදනාව දරා ගන්නත් අමුතු ශක්තියක් එන්න ඕනනෙ.

අම්මගෙ පොත් කියෙව්වට පස්සෙ මාව මෙච්චර වෙනස් කළේ වඩාත් නිශ්ශබ්ද කළේ වේදනාව කියන දෙයමනේ. ඒක එක පාරට මට මහලු වියේ මුහුකුරා යාමක් දෙන්න පටන් ගත්තානෙ.

එහෙම බලනකොට වේදනාව කියන්නෙ තමන්ගෙ හිත ජය ගන්න මාර්ගයක් පාදන ආතතියක්නෙ.

ආතතිය? ඒ වචනෙත් අම්මගෙ පොත්වලින් තමයි අහුල

ගත්තෙ. ඒක නොදන හිටියා නෙවෙයි. නමුත් ඒ ජාතියෙ වචනවලින් හිතන්න ගත්තෙ ඊට පස්සෙයි.

සාෂා මගේ ස්වාමි පුරුෂයා වෙන්නෙ මට එයාට ගරු කරන්න පුළුවන් තාක් විතරනෙ. ගෞරවය නැති වුණාම ගැහියෙකුට මිනිහෙක් එක්ක බුදිය ගන්න අමාරුයි. හුරතල් වෙන්න දුෂ්කරයි. ඒත් ඒ එක්කම ආදරය සම්පූර්ණයෙන් නැති වුණේ නැතත් ඒක අර කලින් තිබුණු තොදොල් ආදරය නෙවෙයිනෙ.

"මං වකුගඩුවක් දෙන්නං" කියන පණිවිඩය එයාට යවන තරමට ආදරයක් තිබුණෙ කොහොම ද කියන්න මං දන්නෙ නැහැ. මේ බොරුකාරයාට පුරුෂයෙකුට වගේ නෙවෙයි දරුවෙකුට වගේ ආදරය කරන්න පුළුවන් කියන එක මට දැනෙන්න ගත්තා.

ඒ මාතෘ හැඟීම ගෑනියෙක්ව එක පාරට විශාල කරනවා. ශක්තිමත් කරනවා මගේ ඇඟ පුරාම විදුලියක් දුවනවා වගේ දැනෙන්න ගත්තා.

මගේ අම්මා දැනගෙන හිටිය නැති දෙයක් ඒ පාන්දර යාමයේ මං දැන ගත්තා. නරක මිනිහෙකුට බොරු කාරයෙකුට වඩා ඉහළින් ඉඳගෙන කරුණාවෙන් හිත පුරව ගන්න නං නපුරට දයාවත් බොරුවට සත්‍යයත් තණ්හාවට පරිත්‍යාගයත් කියන සූත්‍රය හද ගන්න වෙයි.

මගේ අම්මා වෛරයෙන් කෝපයෙන් මැරුණෙ සාෂා වගේ කෙනෙකුට ප්‍රතිචාර දක්වන්න ඕන හොඳම විදිය දැනගෙන හිටියෙ නැති නිසයි.

මට එහෙම මැරෙන්න ඕනැත් නැහැ. ප්‍රියා ආන්ටි වගේ විශාල බොරුවක් ඇතුළෙ මායාවක රඟපාන්නත් බැහැ. ඒත් මං ආදරය කළ මිනිහාට වකුගඩුවක් දෙන්න මට පුළුවන්. හැබැයි භාර්යාවක් වෙන්න බැරි වෙයි.

භාර්යාවො නං දුසිමක් හොයා ගන්නෙ නැතැයි.

"අනේ ! අනේ ! වර්ණාසි උඹ ඔය වකුගඩුවක් පරිත්‍යාග කරන්න හිතන්නෙ සාෂාට ආදරේට නෙවෙයි. උඹේ හර්දයාබාධය සනීප කර ගන්න උඹ ඔය මෝඩ බෙහෙතක් තෝර ගත්තෙ."

කවුරු හරි අන්ධකාරයෙ ඉඳලා එහෙම කියනවා වගේ ඇහුණා.

භූමිකම්පාවෙන් පස්සෙ සාෂාත් වෙනස් වෙලා වෙන්න බැරි ද? මරණයට මූණ දුන්නම මිනිස්සු වෙනස් වෙනවනෙ. අර මෛත්‍රී විහාර කුටියෙ බිතු සිතුවම් වගේ මිනිස්සු වෙනස් වෙන්න පුළුවන්නෙ.

මම පෙරේද හිටිය මමත් ඊයේ හිටිය මමත් සාෂා එක්ක කසාද බැඳපු අහිංසක මෝඩ කෙල්ලත් නෙවෙයිනෙ. එදා උදේ හිටි කෙනාත් දවල් හිටි කෙනාත් සාෂාට ශරීර ඉන්ද්‍රියයක් දෙන්න තරම් දයාර්ද්‍ර වෙලා හිටියෙ නැහැනෙ.

මෙත්තා දලා යන්නෙ කොහොම ද? එයාව ඉන්දියාවට ගෙනියන්න ක්‍රමයක් හදලා දෙන්න ප්‍රියා ආන්ටිට පුළුවන් වෙයි. කරුණා අම්මාන්ට රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයකින් ලන්ඩන් යන්න පුළුවන් නං මට ඔය පුංචි කෙල්ල ගෙනියන්න ක්‍රමයක් හද ගන්න බැරි මොකද? භූමිකම්පාව නිසා සියලු ලියකියවිලි නැතිවීම හොඳ හේතුවක් කර ගන්න පුළුවන්නෙ.

කවදා හරි සාෂා හොඳට සනීප වුණාම අර දිනපොත් දෙක එයාට කියවන්න දෙන්න ඕන. මට දන්නා බව නො දන්න ගෑනියෙක් වෙන්න බෑ කියනවා.

පුංචි කාලෙ ඉඳලම හැමෝම කිව්වෙ මං අම්මට වඩා වෙනස් කියලනේ. ඒත් එවෙලෙ මට දැනුණා මම අම්මාගෙ දුව බව. තීරණයක් ගන්න සත්‍යයට මූණ දෙන්න බයක් නැතුව ගියා. ඒ එක්කම මං අම්මගෙ දුව නිසාම අම්මාට වඩා ඉහළින් ඉඳගෙන ජීවිතය දිහා බලන්න පුළුවන් වෙලා තිබුණා.

උදේ භාග්‍යා නැගිටිනකොටත් මං මූණකට හෝදගෙන ඇඳ පැළඳගෙන ඉවරයි.

"මේ බලන්න සාෂාගෙ එස්.එම්.එස්." මං ජංගමයා භාග්‍යාට දීලා පොඩි එකීට කිරි හදන්න ගියා. රාත්‍රිය පුරා නිදිමරපු වෙහෙස දැනුණෙ නැහැ.

"දැං මොකද කරන්නෙ?" භාග්‍යා කුස්සි තීරුවට එබුණා.

"මං දෙනවා. ආයෙත් ඕකට එක එකා හොයන්න ඕන නෑ.

"ඔයා එයාට කිව්ව ද?"

"නෑ"

"ඇයි?"

"මං හංගලා තිබුණු දිනපොත් දෙක ගෙනත් දීලා සාෂාට කෙටි පණිවිඩයක් යැව්වා. "හැකි ඉක්මනින් එනවා" කියලා.

භාග්‍යා ඒ පොත් දෙක කියවන කල් මං මෛත්‍රී විහාර කුටියට වෙලා හිටියා. පොඩි එකීට ලියවලි හදලා දෙන්න කියලා ආන්ටි ප්‍රියාට කිව්වා. එයාට ඇත්ත කතාව කිව්වෙ නැහැ. මොකද එයාගෙ ජාති ආලය මට වඩා ප්‍රබලයි.

පොඩි එකිත් නාලා, කාලා, බීලා, මා ළඟට ආවෙ පෑනකුයි කොළයි අරගෙන. මං එයාට ලියාලා දුන්නා "අම්මා" කියලා. මගෙ පපුවට අත තියලා "මම අම්මා" කිව්වා.

"මම මෙත්තා" පොඩි එකිත් පපුවට අත තියලා කිව්වා.

මම ඒකත් ලිව්වා.

කෙල්ල වාක්‍ය දෙකම ලිව්වා.

"මයි නේම් ඉස් මෙත්තා" කියලා ඉංග්‍රීසියෙන් කිව්වෙ උගන්නන්නෙ නැතුවමයි. සමහරවිට අර පුංචි අම්මා ඒවා උගන්නන්නත් ඇති. සමහර විට ඒ ගෑනි බෝම්බකාරියක් නෙවෙයි පණ බේරගෙන රටින් පැන ගන්න ආ කෙනෙක් වෙන්නත් බැරි නැහැනෙ. ළමයෙක් ඉදීම ආරක්ෂාවක්නෙ. තනි ගෑනියෙක් දිහා වගේ සැකෙන් බලන්නෙ නැහැනෙ.

දවල් වෙනකොට මං මෙත්තා එක්ක ටවුමට ගිහින් දළඳ මාළිගාවට මලුත් පූජා කරලා කෑමත් අරගෙන ආවා. භාග්‍යාට කතා නොකරම කෑම කාලා නිද ගත්තා. දළඳ මලිගාවෙදි අපි වැඩිහිටි හාමුදුරුනමක් දකලා වැන්ද. මෙත්තාගෙ ඇස්වලින් කඳුළු බේරෙන්න ගත්තෙ හාමුදුරුවො සුවපත් වේවා කියලා මෙත්තාගෙ ඔලුව අතගාපු හින්ද වෙන්නැති. ඒ වචනෙ තේරුම දන්නෙ නැති උනාට හාමුදුරුවන්ගෙ කරුණාව දැනෙන්න ඇතිනෙ.

"ඇයි මේ දරුවා අඬන්නෙ?" උන්වහන්සෙ ඇහුවා.

"එයාට කතා කරන්න බෑ සාධු. භූමිකම්පාවෙන් පස්සෙ එහෙම තමයි. අඬනවා."

හාමුදුරුවො පිරිත් නූලක් දුන්නා. මං ඒක මෙත්තාගෙ අතේ ගැට ගැහුවා. ගෙදර එන ගමන් මෙත්තාට මල් පූජා කරන ගාථාවක් කියලා දුන්නා.

ගෙදර ආ ගමන් අපි ඇඳට වැටුණා. මං නැගිට්ටෙ අඳුරත් වැටුණාට පස්සෙයි. භාග්‍යා ඇඳ උඩ ඉඳගෙන මා දිහා අනුකම්පාවෙන් බලා හිටියා.

"තේ හදාගෙන එන්න ද?"

"එපා. මා දිහා ඔහොම බලන්න එපා. හරියට මං මැරිලා වගේනේ බලන්නෙ."

ටික වෙලාවක් කතා නැතුව හිටි භාග්‍යා පුංචි කාලේ නපුරු ළමයි මට රිද්දපු වෙලාවට "ඔයා බය වෙන්න එපා" කියන විදියටම මගේ දෑතින් අල්ල ගත්තා.

"මොනවද කරන්න ඕන. මං ලබන සුමානෙ යන්නෙ නෑ. ඔයා පිළිවෙලක් වෙනකං ඉන්නවා."

"මං සාෂාට උදව් වෙනවා. එයාගෙ ජීවිතේ බේර ගන්නවා."

"මට නං එහෙම දෙයක් කරන්න බැරි වෙයි. ඔයා කොහොමද හිත හදා ගත්තෙ?"

"තාම හිත හැදිලා නෑ. හොඳටම රිදෙනවා. ඒ වුණාට මට ඒ රිදිල්ල නැති වෙන්න නං එයාට මේ වගේ කාටවත් දෙන්න බැරි තෑග්ගක් දීලා ඊට පස්සෙ හිතන්න ඕන මොනවද කරන්නෙ කියලා. මෙච්චර දවස් මං එයාට කතා කරේ නෑ. භාග්‍යා. ඔයා හිතන්න ඇත්තෙ මං කතා කරනවා කියලනෙ."

එයා කිසි දෙයක් නොකියා බලා හිටියා.

"එහාට ගිහිනුත් කතා කරන්න බෑ වගේ ඉන්නවා. මටයි මෙත්තාටයි දෙන්නාටම ගොළුවෙලා ඉන්න වෙනවා. හැබැයි මං මේ දෙන්න හිතපු දේ දෙනවා."

"ඊට පස්සෙ?"

"ඒක එතකොට හිතනවා."

"ඔය වගේ මිනිහෙකුට එහෙම දෙයක් දුන්නත් එයාගෙ ගති වෙනස් වෙන්නෙ නැතිවෙයි. බලු නකුටෙ ඇද අරින්න බෑ."

"ඒක මගේ ප්‍රශ්නයක් නෙවෙයි. මං එයාගෙන් කිසි දෙයක් බලාපොරොත්තු වෙන්නෙ නෑ. මේ තෑග්ග දීලා කතා නැතුවම එනවා. එතකොට මගේ හිතටත් කොයි අතට හරි වෙනස් වෙන්න ඉඩ තියෙනවා. එයාගෙ හිතටත් වෙනස් වෙන්න ඉඩ ලැබෙනවා."

"ඒ කියනෙන ඔයාගෙ යටි හිතේ එයා එක්ක පවුල් කෑමෙ උවමනාව තියෙනවා."

"මං දන්නෙ නෑ. අංගුලිමාලත් රහත් වුණානෙ කියන එක කව කට්ටකින් පපුවෙ ලියවෙනවා වගෙ දැනෙන වෙලාවල් තියෙනවා. මං වෙනුවෙන් නෙවෙයි එයා තමන් වෙනුවෙන්ම වෙනස් වෙන්න බැරි නැහැනෙ."

"ඒක ඔයාට බලෙන් ඇති කරන්න බෑ කියලා තේරෙන්නෙ නැද්ද?"

"මං දන්නවා. කටින් කියලාවත් පොරොන්දු වෙන්න කියලාවත් වැඩක් නෑ. ඒක එයාගෙ පපුවෙන්ම එන්න ඕන."

"ඉතිං එයාගෙ කුරුසෙ එයාට කර තියාගෙන යන්න දෙන්න. ඔයා වකුගඩුවක් දුන්නට එයාගෙ පපුව වස්ති වෙන්නෙ නෑ."

"ඔහොම කිව්වටම මං මේක කරන්නෙ එයා වෙනුවෙන් නෙවෙයි. මං වෙනුවෙන්ම වෙන්න බැරි ද?"

"ඔච්චර ලොකු දෙයක් දෙන්නෙ ආත්මාර්ථයෙන් කියලා ඒක හෑල්ලු කරන්න එපා. ඕකෙ අමාරුව තාම ඔයාට තේරෙන්නෙ නෑ. ඔයා ඉස්පිරිතාලෙක ඉඳලා නෑ. මං වගේ දඟ වැඩ කරන්න ගිහින්වත් වැටිලා තුවාල වෙලා මැහුමක් දාලා නෑ. ඕක ළමයෙක් හම්බ වෙනවට වඩා අමාරු වැඩක්."

"මට වෛර නැති කෙනෙක් වෙන්න අමාරුයි. ඒකට මේක හොඳ උපක්‍රමයක්. මේක මගේ අම්මට හරි ආත්තම්මට හරි දෙන්න

වුණා නං ඒකෙ විශේෂයක් නෑ. අමාරුවක් නෑ. තමුන්ව රැවැට්ටුවා බොරු කිව්වා කියලා වෛර කරන්නෙ නැතුව මෙහෙම දේකට හිත හදා ගත්තම සහනයක් දැනෙන්න ගන්නවා."

"වම් කම්මුලට ගැහුවම දකුණත් හරවනවා කියන්නෙ ඔය වගේ දේවල්වලට වෙන්නැති."

"මං දන්නෙ නෑ. මට මේකෙත් උද්දම වෙන්න බෑ. මොකද තාම තුවාලෙ තියෙනවා. ඒකෙ වේදනාව නහරක් නහරක් ගානෙ දැනෙනවා."

"ඔය වැඩේට ගියොත් එක කාමරේ ඉන්න වෙයි."

"නෑ මං කොළේක ලියලා දෙනවා මටයි මෙත්තාටයි වෙනම කාමරයක් ඕන කියලා. එහාට යනකොට මගේ හිත තව වෙනස්වෙලා තියෙයි. සාෂාටත් දරුවෙකුට වගේ ආදරේ කරන්න ඉගෙන ගනියි."

"මට නං එච්චර හොඳ වෙන්න බෑ. එහෙම වෙන්න ඕනැත් නෑ. ඒ වුණාට මේ ප්‍රශ්නෙදි මං ඔයා එක්ක ඉන්නවා.

"මගේ ඇති හොඳක් නෑ හාගයා. මේක මාත් එක්ක සාම ගිවිසුමක් ඇති කර ගැනීමක්."

"ඔයා සෑහෙන්න වෙනස් වෙලා. හරියට මහෝ ආන්ටි වගේ කතා කරන්න පටන් අරගෙන."

"අම්මා කතාවෙන් විතරයි. මං දුෂ්කර ක්‍රියාවෙන්ම ඒක කරන්නයි යන්නෙ."

අපර කතා වස්තුව

ශ්‍රී ලංකාවේ මේ සා භයානක භූමි කම්පාවක් සිදු වුණේ නැහැනෙ. ඒ නිසා පාර්ලිමේන්තුව හිලාබැස්සෙත් නැහැ. සාෂාගෙ කකුල් දෙකත් තාම යහතින් තියෙනවා. මගේ අම්මා මනෝරමායයි ආතම්මා ජීනවතී ඉස්කෝලෙ හාමිනෙයි දෙන්නාත් යහතින් ඉන්නවා. වාතයක් සෙම් කෝපයක් හැර වෙන ලෙඩක් නෑ. ඒත් දෙන්නටම දුකක් බයක් තියෙනවා. ඒ මං සාෂාට රැවටෙයි කියලයි.

මේ කතාවෙ සඳහන් අනිත් දේවල් වගේම තමයි සාෂාගෙයි මගෙයි කසාදෙ සිද්ධ වුණෙත් නෑ. අම්මා භූමිකම්පා කතාව ලියලා දුන්නෙ එයාගෙ චරිතෙත් මරලයි. මං අවසාන කොටස ලිව්වෙ සාෂාගෙ අතීත කතා, උපාධි කතා, දේශපාලන කතා ගැන සැහෙන්න හොයලා බලලයි. ඒ නිසා මං මේ කතාවෙ ඉන්න තරුණ භාර්යාව වගේ වුණේ නැහැ. අධ්‍යාපනය සම්පූර්ණ කළා. රස්සාවකට ගියා. එතනින් කිලිනොච්චියට ගිය අවස්ථාවක මං මේ කතාවට නව ආරම්භයක් දුන්නා. අපේ අම්මා වගේ නෙවෙයි මං සාෂා එක්ක තරහම තරහා වුණේ නැති නිසා එයා ගැනත් කරුණාවක් ඉතුරුයි. ඔයින් මෙයින් මගේ වකුගඩු දෙකත් තාම මගේ ශරීරයෙම තියෙනවා.

මට අඬන්න, නිද ගන්න, හුරතල් වෙන්න දුවලා දුවලා යන්න අපේ මහ ගෙදරත් තාම තියෙනවා. ආතම්මා අම්මා ලියූ කොටස මුලින්ම කියෙව්වා. පස්සෙ මං එකතු කළ කොටස් ටිකත් කීප සැරයක් කියවලා කඳුළුත් එක්කම හිනා වුණා.

"මොනවා උනත් මට සාෂා ගැනත් දුකයි පුතේ." ආතම්මා

එහෙම කියූ වෙලාවක අම්මා තරහෙන් පිපිරුණා.

"අම්මා හදන්නෙ මේ ළමයගෙ හිත ආයෙමත් අවුල් කරන්නනෙ."

"නෑ... නෑ.... උඹලා දෙන්නගෙ ගති කොච්චර වෙනස් උනත් දෙන්නම එකම අච්චුවෙ. දැං ඉතිං මට මුනුබුරෝ නොබලම මැරෙන්න වෙනවා."

"නෑ ආතම්ම ඕක නං මං සාෂාට කියලා පුතෙක් හදලා දෙන්නං. කිසිම වගකීමක් බැඳීමක් නැතුව ඒක කරන්න එයා කැමති වෙයි." මං ඒක කිව්වෙ නෑ. ඒත් මට කියවෙන්න ආවෙ එහෙම දෙයක් කියලා ඒ දෙන්නම මගෙ මූණෙන් කියව ගන්න ඇති.

අම්මගෙ හිත රිදවන්න මං කැමති නෑ. අම්මා මං වෙනුවෙන් ඒ කතාව ලියන්න හිත හද ගන්න ඇත්තෙ හුඟාක් අමාරුවෙන්. අවවාද අනුශාසනා දුක් අඳෝනා සහිත ලිපියක් ලිව්වා නං මං ඒක නො කියා ඉන්නත් තිබුණා.

මං මේ කතාව සාෂාට කියවන්න දුන්නා. එයා කියනවා එයා එක්ක තිබුණු සම්බන්ධය අම්මා සෑහෙන්න සංස්කරණය කරලා ලියලා නිසා එයාට ඕන නං අඩු තැන් පුරවන්න පුළුවනිලු. ඒකෙ ඇත්තකුත් ඇති. ද්වේෂයකුත් ඇති. මං කිව්වා මට ඒවා දැන ගන්න ඕන නැහැ කියලා. ද්වේෂය අම්මා එක්ක නෙවෙයි මා එක්කයි. ඒ එයා පිරිවෙනට එන්න කලින් වැල්ලෙ කොල්ලෙක් වෙලා ස්විස් මිනිහෙක් එක්ක හිටිය වග හොයා ගන්න ඇතියි කියන එක මං එයාට ඇගෙව්වෙ නෑ. ඒකට එයාට වරදක් කියන්න බැහැ. එතකොට බාල වයස්කාරයෙක්. සංචාරක ව්‍යාපාරයට අහුවුණු අහිංසක ගොදුරක්.

එතනින් තමයි ප්‍රසිද්ධ කලාකාරයෙකුට අහුවෙලා එයාගෙ ගෙදරට ගිහින් තියෙන්නෙ. ටිකක් කර දඬු උස් වෙනකොට කලාකාරයගෙ කෙල්ලො ගැන බිරිඳට කේලම් කිව්වා කියලා එයාව එහෙන් එළවා ගත්තා කියලා චිත්‍රපටි නිෂ්පාදකයෙක් කිව්වා. පත්තර කර්තෘ කෙනෙක් නං කිව්වෙ අර කලා "ඇන්ටි" එක්ක ප්‍රේමයක පැටලිලා එහෙන් පැන්නුවා කියලයි. අනේ මං ඒ කතාව

දන්නවා කියලා එයාට ඇගෙව්වෙත් නෑ. එතකොටත් බාල වයසනෙ. ඔයා නැත්දයි මාමයි කියන්නෙ ඒ දෙන්නාටයි.

ඊත් කසාද නොබැඳ මං එක්ක එක ගෙදරක ඉන්න අතර වෙන ගෑනු එක්ක තිබුණු සම්බන්ධකම් දන්නවා කියලා නං මූණටම කිව්වා. මිනිහට ඒ ගැන හරි තරහයි. එයාගෙ වෙස්මූණ ගැලෙව්වට කැමති නැහැ. අපි කතා නොකරන තත්වෙකට පත් වෙලා නැහැ. එයා පාර්ලිමේන්තුවට යන්නෙ නැතුව එයාට ප්‍රයෝජන ගන්න පාලනය කරන්න පුළුවන් මිනිස්සු පාර්ලිමේන්තුව යවන ප්‍රයෝජ්‍ය ක්‍රියාධරයකු වෙලා යහතින් ඉන්නවා.

හරි නං මේ වෙනකොට මං එයා ගැන සියලු බලාපොරොත්තු අත අරින්න ඕනනෙ. නමුත් මං තාමත් හිතනවා වගකීමෙන් යුක්ත අවංක මිනිහෙක් වෙන්න කැමැත්තක් එයාගෙ යටි හිතේ හරි ඇති කියලා.

එයා තුළ ඉන්න ස්වභාවික මිනිහා වල් බල්ලෙක් වෙන්න බැහැනෙ. ඉතිං ඒ මිනිහා මතු වෙන්න ඉඩ තියෙනවා. සංසාරේ කවද හරි එහෙම වෙනවා තමයි. නමුත් කාට හරි සැබෑ උවමනාවක් ඇති වෙලා තමන් කවද තමන් අනුන්ට කරන දුෂ්ටකම් කවුරු හරි තමන්ටත් කරනවාට කැමති ද කියලා ප්‍රශ්න කරන්න ගත්තොත් මේ ආත්මෙදිම විශාල වෙනසක් වෙන්න පුළුවනි. ඊකට උවමනා ඥානය එයාට තියෙනවා. අපේ පාර්ලිමේන්තුවෙ ඉන්න පොදු පුරුෂයන් නුග දෙනෙකුටත් ඒ ඥානය නැත්තෙම නෑ. ඊත් සාෂා වගේම තමයි පොදු පුරුෂයො සේරම වල්මත්වෙලානෙ.

ඉතිං මගේ වකුගඩුව?

කවදවත් අර වගේ භූමිකම්පාවක් එන්න එපා. එයාටත් එහෙම ලෙඩක් දුකක් වෙන්න එපා. ඊත් සාෂාගෙන් කිසිම දෙයක් බලාපොරොත්තු නොවී වකුගඩුවක් නං පරිත්‍යාග කරන්න මට පුළුවන්. අම්මයි ආතම්මයි බයේ ඉන්නෙ ඒකටයි.

මට තාම වෙන කා ගැනවත් ආලවන්ත හිතක් නං පහළ වුණේ නෑ. එහෙම භූමිකම්පාවක් වගේ අත්දැකීමකට පස්සෙ ජීවිතේ අතින් පැත්ත හැරෙනවනෙ. කණපිට හැරෙනවා කියන්න මං කැමති නැහැ. මට දැනෙන්නෙ හොඳ පිට හැරුණා කියලයි.

එතකොට මෙත්තා?

අනේ එහෙම කෙලි පොඩිත්තියක් නං මගේ ජීවිතේට එනවට කැමැත්තක් තිබුණා. සමහර විට ඒ හින්දම වෙන්න ඇති එහෙම චරිතයක් කතාවට එකතු වුණේ. මං හිතන්නෙ ගෑනු හිතක සහජ මාතෘ භාවයක් තියෙනවා. ඒකයි මට සාෂාටත් දරුවෙකුට වගේ ආදරේ කරන්න පුළුවන්කම ලැබෙන්න ඇත්තෙ.

මට දැනෙන්නෙ මේ හෘද කම්පාවෙන් පස්සෙ මං ඉතාම කෙටි කාලයකින් මගෙ අම්මාටයි ආතම්මාටයි වඩා වයසක කෙනෙක් වුණා කියලයි. කවුරු හරි මගෙන් වයස ඇහුවොත් මං කියන්නෙ අවුරුදු දෙසිය එක හමාරයි කියලයි. ඉතිං සියලු ස්ත්‍රී පුරුෂයො අම්මයි ආතම්මයි පවා මගේ දරුවො වෙන්න එපා යැ.

මගේ පපුව පිරෙනවා. මෛත්‍රිය උතුරනවා.

හොඳ මිනිස්සුන්ට වගේම නරක මිනිස්සුන්ටත් ආදරෙන් පපුව ගැහෙනවා.

පෙම්වතකු වෙනුවෙන් නොවෙයි මේ නොදමුණ සෙල්ලක්කාර දරුවො වෙනුවෙන්, මේ මිනීමරණ දරුවො වෙනුවෙන්, බැංකු බිඳිනවා වගේම හෘද වස්තු බිඳින දරුවො වෙනුවෙන් කඳුළු බේරෙනවා.

කුසයෙන් දරුවෙක් හැල්ලූ නොකළට මං අම්මෙක් වෙලා අහවරයි. මෙත්තා වගේ දූරියක් හද ගත්තෙ නැතුවට ප්‍රභාකරන් පවා මගේ දරුවෙක් වෙලා අහවරයි. ඊත් මෙහෙම ආදරයක් තේරුම් ගන්න දියවන්නාව අසබඩ ළමයින්ට නං කොහෙත්ම බෑ කියලා හිතන්න දුකයි. පේරාදෙනියෙ, කොළඹ, කැළණියෙ, ජයවර්ධනපුර, රජරට, සබරගමුවෙ ළමයින්ට මෙහෙම ආදර කතා තුහුරුයි නුපුරුදුයි. ඒ හින්ද ඒ ළමයින්ටත් නොතේරෙන්න ඉඩ තියෙනවා. ඊත් මං උඹලා ඔක්කොටම ආදරෙයි. භූමිකම්පාවකින් පස්සෙ මේ මාතෘ ප්‍රේමය ඕනම පිරිමියෙකුගෙ හිතක උනත් උපදින්න පුළුවනි. පොදු පුරුෂයො මච්චරු වෙන්න ගත්තොත් සුනාමි, භූමිකම්පා, ගංවතුර, කුණාටු වෙනුවට අපිට මල් වැහි වැටේවි!